මහා-සී

විපස්සනා භාවනා ක්‍රමය

විපසසනා නයපපකරණය

බුරුමයේ අති පූජ්‍ය මහා-සී සයාඩෝ ස්වාමීන් වහන්සේ

ධර්මදානය වශයෙන්

නොමිළයේ බෙදා හැරීම පිණිසයි

© අමාදම් සංගමය

ප්‍රථම මුද්‍රණය
ශ්‍රී. බු. ව. 2547 ව්‍ය. ව. 2004

මුද්‍රණය
ලිතිර
306, ඇඹුල්දෙණිය, නුගේගොඩ.

ශ්‍රී ඥානාරාම ස්වාමීන්ද්‍ර අනුස්මරණ ග්‍රන්ථ මාලා -අංක 12

මහා-සී විපසසනා භාවනා ක්‍රමය

බුරුම ජාතික
අතිපූජ්‍ය මහා-සී සයාඩෝ
ස්වාමීන් වහන්සේ විසින්
බුරුම බසින් රචනා කරන ලද

විපසසනා නයපපකරණය

නම් භාවනා ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

ප්‍රථම භාගය

දෙවන කොටස (පරිච්ඡේද අංක 3 සහ 4)

පරිවර්තනය
පූජ්‍ය උඩඊරියගම ධමමජීව ස්වාමීන් වහන්සේ

පරිවර්තන සහාය
බුරුම ජාතික පූජ්‍ය උ අගගඤඤ ස්වාමීන් වහන්සේ

ප්‍රකාශනය
අමාදම් සංගමය

අපවත් වී වදාළ,
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්ය,
මීතිරිගල නිස්සරණ වන ආරණ්‍යයේ ප්‍රථම සේනාසනාධිපති,
කර්මස්ථානාචාර්ය, මහෝපාධ්‍යාය, අතිපූජ්‍ය
මාතර ශ්‍රී ඥානාරාමාභිධාන මාහිමිපාණන් වහන්සේට
සහ
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ
ගරු සමුත්පාදක හා ප්‍රධාන අනුශාසක,
ගල්දූවේ ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානාධිපති,
රාජකීය පණ්ඩිත, අතිපූජ්‍ය
කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මාහිමිපාණන් වහන්සේට
ප්‍රාප්තිදාන පිණිස

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක,
ත්‍රිපිටකාචාර්ය, කම්මට්ඨානාචාර්ය
අතිපූජ්‍ය නා උයනේ අරිය ධම්ම ස්වාමීන් වහන්සේට

"මහා-සී විපස්සනා භාවනා ක්‍රමය"
(විපස්සනා නයප්පකරණය)

නම් වූ මෙම ග්‍රන්ථය
සාතිශය ගෞරවයෙන් පිළිගැන්වෙයි.



ဗုဒ္ဓသာသနာနုဂ္ဂဟအဖွဲ့ချုပ်
မဟာစည်သာသနာ့ရိပ်သာ
အမှတ်-၁၆၊ သာသနာ့ရိပ်သာလမ်း၊ ဗဟန်းမြို့နယ်၊ ရန်ကုန်မြို့။

ဖုန်း - ၅၄၅၉၁၈
၅၄၁၉၇၁
ဖက်စ် - ၂၈၉၉၆၀
၂၈၉၉၆၁
သံကြိုးလိပ်စာ၊ မဟာစည်

Buddha Sāsana Nuggaha Organization
MAHASI SĀSANA YEIKTHA
16, Sāsana Yeiktha Road, Yangon.(MYANMAR)

Phone: 545918
541971
Fax-No. 289960
289961
Cable: MAHĀSI

Email - Mahasi-ygn@mptmail.net.mm

Date August, 2002

To Whom it may concern

Mahāsi Meditation Centre Yangon, Myanmar, has no objection to the publication of the late Venerable Mahāsi Sayādaw's book intitled Vipassanā Shuni Kyan (The Method of Vipassanā Meditation) translated by the Venerable Dhammajiva of Sri Lanka to be published in the Sinhalese Version.

(U Tin Wan)
The President
Buddha Sāsana Nuggaha Organization
Mahāsi Sāsana Yeiktha
Yangon Myanmar.

ග්‍රන්ථ සංකේත නිරූපණය

ම. නි.	-	මජ්ඣිම නිකාය	-	බු. ජ.
ස. නි.	-	සංයුත්ත නිකාය	-	"
අං. නි.	-	අංගුත්තර නිකාය	-	"
ඛු. නි.	-	ඛුද්දක නිකාය	-	"
ප. ම.	-	පටිසම්භිදා මග්ග	-	"
පු. ප.	-	පුග්ගල පඤ්ඤත්ති	-	"
දී. අ.	-	දීඝ නිකාය අට්ඨකථා	-	ස. හේ.
ම. අ.	-	මජ්ඣිම නිකාය අට්ඨකථා	-	"
ස. අ.	-	සංයුක්තනිකාය අට්ඨකථා	-	"
ධ. ස. අ.	-	ධම්ම සංගනි අට්ඨකථා	-	"
පු. ප. අ.	-	පුග්ගල පඤ්ඤත්ති අට්ඨකථා	-	"
ධ. අ.	-	ධම්මපද අට්ඨකථා	-	"
වි. ම.	-	විසුද්ධි මග්ග	-	"
දී. ටී.	-	දීඝනිකාය ටීකා	-	"
මහා ටී. (සි)	-	මහා ටීකා සිංහල අකුරු	-	සි. අ.
ම. ටී. (බු)	-	මජ්ජිම නිකාය ටීකා බුරුම	-	බු. අ.
මහා ටී. (බු)	-	මහා ටීකා බුරුම අකුරු	-	"
මූල ටී. (බු)	-	මූල ටීකා බුරුම අකුරු	-	"
අනු ටී. (බු)	-	අනු ටීකා බුරුම අකුරු	-	"

බු. ජ.	-	බුද්ධ ජයන්ති මුද්‍රණය
ස. හේ.	-	සයිමන් හේවාවිතාරණ මුද්‍රණය
සි. අ.	-	සිංහල අකුරු
බු. අ.	-	ඡට්ඨ සංගීති බුරුම අකුරු මුද්‍රණය

මූලාශ්‍ර දැක්වීමට මෙම ග්‍රන්ථයෙහි යොදා ඇති කෙටි ක්‍රමය මෙසේය:
[ග්‍රන්ථ සංකේතය / ග්‍රන්ථ කාණ්ඩය / පිටු අංකය]

උදා: [සං. නි. 4/32] යනුවෙන් දැක්වෙන්නේ, සංයුක්ත නිකායෙහි 4 වන කාණ්ඩයෙහි 32 වන පිටුවය.

අදාළ ග්‍රන්ථය කාණ්ඩවලට බෙදා නැත්නම්, *[ග්‍රන්ථ සංකේතය/පිටු අංකය]* වශයෙන් දැක්වෙනු ඇත.

උදා: [වි. ම. 331]= [විසුද්ධි මග්ග : 331 පිට]

පටුන

1. භාවනා කළ යුතු ධර්මයන් *පරිච්ඡේද අංක 3* 1
පරමාර්ථ හා ප්‍රඥප්ති 1
ඇස් පනාපිට දුටුදේම පරමාර්ථයෝය 7
- පරම්පරා 8
- ඉතිකිරා 8
- පිටක සම්පදාන 8
- තක්ක හෙතු 8
- නය හෙතු 8
- ආකාර පරිවිතක්ක 8
- දිට්ඨි නිජ්ඣානක්ඛන්ති 9
අනුස්සවන ආදියෙන් පරමාර්ථය දැනගත නොහැකි බව 9
පරමාර්ථය ඇස්පනා පිට දැනගන්නා සැටි 10
ප්‍රත්‍යක්ෂය හා සූත්‍රය සම්බන්ධ කොට දැන ගැනීම 13
පරමත්ථ පදයේ නියම අර්ථය 15
සාමාන්‍ය පුද්ගලයන් දැන ගන්නා ආකාරය 21
විපස්සනා යෝගීන් දැන ගන්නා ආකාරය 22
විපස්සනාවේ අරමුණ 25
නාම රූපයන් ප්‍රකටවන ආකාරය 29
ශ්‍රාවකයන්ගේ සම්මසන විධිය 31
ප්‍රත්‍යුත්පන්නය පමණක් භාවනා කළයුතු බව 34
ගතවූ අතීතය නැවත මතක් නොකරනු 39
අනාගතය අපේක්ෂා නොකළයුතු 40
වර්තමානය පමණක් අත නොහැර මෙනෙහි කරන්න. 41
සම්මසන ඤාණය පච්චක්ඛ ඤාණයක් නොවන බව 50
අනුමාන විපස්සනාවට නමී 51
භාවනා ක්‍රමය සාධනය කිරීම 53
අනාපානය මත විපස්සනා කරන ආකාරය 59

ධාතු හතර පවා සම්පූර්ණයෙන් නොදැන රහත් බවට
පත්විය හැකි ආකාරය 62
ප්‍රථම රහතන් වහන්සේගේ උත්තරය 63
දෙවන රහතන් වහන්සේගේ උත්තරය 63
තුන්වන රහතන් වහන්සේගේ උත්තරය 64
හතරවන රහතන් වහන්සේ වනාහි 64
සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ විපස්සනාව 65
අනුපද විපස්සනාව සිදුවන ආකාරය 69

2. භාවනා ක්‍රමය හා දේශනාව ගැළපීම ***පරිච්ඡේද අංක*** 4 79
සුතමය ඥාණය නොමැතිව ලක්ඛණාදිය දැනගත හැකි ආකාරය 83
මහා ටීකා අර්ථය 85
ටීකා ජො (අභිධම්මත්ථ විභාවිනී ටීකා) හා
මහා ටීකාව සම වන ආකාරය 85
චක්ඛු ප්‍රසාදය වටහා ගැනීම 88
රූපායතනය 89
අට්ඨ කථා අර්ථය 89
චක්ඛු විඤ්ඤාණ 89
චක්ඛු සම්ඵස්ස 90
සුඛ 90
දුක්ඛ 90
උපෙක්ඛා 90
විශේෂයෙන් සිත්හි දරාගත යුත්තක් 91
සුතමය, චින්තාමය යන මේවා විපස්සනාව නොවේ 93
විපස්සනා ක්‍රමය හුවා දක්වන ප්‍රශ්න උත්තර 97
බුදුරජාණන් වහන්සේගේ ප්‍රශ්නය 97
මාලුක්‍ය පුත්‍ර ස්වාමීන් වහන්සේගේ උත්තරය 97
විපස්සනා භාවනා ක්‍රමය කෙටියෙන් 100
කෙලෙස් මෙනෙහිකොට දුරු කිරීම 111
පඤ්ච ද්වාරයන් හි ජවන් සිත් නැතිවන ආකාරය 114
පොඨිල තෙරුන්ගේ පුවත 118
ප්‍රශංසනීය ගුණයක් 118

කෙළින්ම දක්වන සාධක 121
සළකා ගතයුතු අදහස 125
නොගත යුතු අර්ථ 126
අසනවිට ආදියෙහි මෙනෙහි කරන ආකාරය 130
සොත පසාදය 131
සද්දායතනය 131
සොත විඤ්ඤාණය 131
ඝාන පසාදය 132
ගන්ධායතනය 132
ඝාන විඤ්ඤාණය 132
ජිව්හා පසාදය 133
රසායතනය 133
ජිව්හා විඤ්ඤාණය 133
හැපීම (ංපහස) මෙනෙහි කරන ආකාරය 134
කාය පසාදය 135
සාමඤ්ඤ පොට්ඨබ්බායතනය 135
විශේෂ පොට්ඨබ්බායතනය 136
කාය විඤ්ඤාණය 137
කායික දුක්ඛ 138
කායික සුඛ 138
ආනාපානය මෙනෙහි කරන ආකාරය 138
සතර මහා ධාතූන් මෙනෙහි කරන ආකාරය 141
සිතීම මෙනෙහි කරන ආකාරය 142
මනො ද්වාරය දැනගන්නා හැටි 143
උපරිම මනොද්වාරය 144
ධම්මායතනය දැන ගන්නා ආකාරය 144
මනො විඤ්ඤාණය 146
මනො සම්ඵස්ස 146
සොමනස්ස වෙදනා 146
දොමනස්ස වෙදනා 146
උපෙක්ඛා වෙදනා 147
සඤ්ඤාක්ඛන්ධය 147
සංඛාරක්ඛන්ධා 147

ඉරියාපථ අනුව මෙනෙහි කිරීම 148

අට්ඨ කථා විවරණයේ අර්ථය 148

බල්ලන් හෝ සාමාන්‍ය මිනිසුන් දැනගන්නාකාරයට නොවේ 149

කමටහන හා සතිපට්ඨාන භාවනාව එකට ලැබීම 151

සම්පජඤ්ඤ මෙනෙහි කරන ආකාරය 158

ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති 158

සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරි හොති 160

සංඝාටි, පත්ත, චීවර ධාරණෙ සම්පජානකාරී හොති 162

අසිතෙ, පීතෙ, ඛායිතෙ, සායිතෙ සම්පජානකාරි හොති 162

උච්චාර පස්සාව කම්මෙ සම්පජානකාරි හොති 163

බහිද්ධාව භාවනා කරන ආකාරය 164

අජ්ඣත්ත බහිද්ධා භාවනා කරන ආකාරය 165

සමුදය හා වය භාවනා කරන ආකාරය 165

නියමාකාරයෙන් සතිය පහළ වීම 165

වේදනානුපස්සනා 167

- සුඛ වේදනා 167
- දුක්ඛ වේදනා 169
- උපෙක්ඛා වේදනා 170
- නිදසුනකට අනුව දැන ගැනීම 172
- සාමිස සුඛ 173
- නිරාමිස සුඛ 174
- සාමිස දුක්ඛ 176
- නිරාමිස දුක්ඛ 176

මහාසිව ථෙර වස්තුව 177

සාමිස අදුක්ඛම - සුඛ 180

නිරාමිස අදුක්ඛම - සුඛ 180

සමුදය හා වය දැන ගැනීම 180

සති පච්චුපට්ඨිතා හොති 181

චිත්තානුපස්සනාව 182

සිත ලක්ෂණාදිය වශයෙන් දැනගැනීම 184

සමුදය-වය දැනගැනීම 184

තත්ත්වාකාරයෙන් සතිය පහළ වන ආකාරය 184

ධම්මානුපස්සනා 186
නීවරණයන් දැන ගැනීම 186
නීවරණ ඇතිවීමට නැතිවීමට හේතු දැනගන්නා ආකාරය 187
යොනිසෝමනසිකාරය 187
අයෝනිසෝමනසිකාරය 190
ස්කන්ධ වශයෙන් වටහා ගන්නා ආකාරය 193
රූපයන්ගේ සමුදය-වය වටහාගන්නා ආකාරය 194
වේදනාවේ සමුදය-වය වටහාගන්නා ආකාරය 196
විඤ්ඤාණයේ සමුදය - වය වටහා ගන්නා ආකාරය 196
ආයතන-ධාතු, නාම-රූප වටහා ගන්නා ආකාරය 197
සංයෝජන වටහා ගන්නා ආකාරය 199
දන් පිණිස නොදෙන වාරයක් පාසා මසුරුකම නොයෙදේ 201
බොජ්ඣංගයන් වටහා ගන්නා ආකාරය 202
ආර්ය සත්‍යය සතර 208
- දුක්ඛ සත්‍යය 208
- දුක්ඛ හත 208
- සමුදය සත්‍යය 212
- නිරෝධ සත්‍යය 213
- මාර්ග සත්‍යය 213
ඌතමය ඥාණ අඩු පුද්ගලයාට 213
සත්‍ය සතර මෙනෙහිකරන ආකාරය 214
දුක වටහා ගන්නා ආකාරය 220
අනින්ද්‍රිය බද්ධ රූප දුක්ඛ සත්‍යය නොවේ 221
ආධ්‍යාත්මික සත්‍යය පමණක් දතයුතුවේ. 222
විනිශ්චය 226
සමුදය වටහා ගැනීම 226
පහළ වූ නමුදූ දැනගැනීම දුෂ්කරය 228
නිරොධ - මග්ග දැන ගැනීම 230
මග්ග ඥාණයෙන් සත්‍යය සතර වටහා ගන්නා ආකාරය 234
පෘථග්ජන හා ආර්ය පුද්ගලයාගේ අවබෝධයේ වෙනස 235
මාර්ගාංග අට වඩන ආකාරය 238
මාර්ගාංග භාවනාව 241
විරාග නිස්සිත විවේක නිස්සිත ආදිය සිද්ධවන ආකාරය 244

වොසගග පරිණාමී වන ආකාරය 245
විදර්ශනාවෙහිලා ශීල මාර්ගංගය ඇතුළත් වන බව 246
චතුසච්ච කම්මට්ඨානං 249
දුක දැනගන්නා ආකාරය 256
සමුදය දැන ගන්නා ආකාරය 256
නිරොධ - මග්ග දැන ගන්නා ආකාරය 256
ඉරියාපථ පබ්බයෙහි 257
සතිපට්ඨාන ගුණ 259
සඟතිකය 263
පධානියංග පහ 265

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ වසර දෙදහසකට පමණ ඉහතදී සම්බුද්ධ සසුන බැබළුනේ අනෙකුත් බෞද්ධ රටවලටත් ආදර්ශවත් වෙමිනි. 'මේ භික්ෂූන් වහන්සේ පමණක් මග - පල අධිගම ලබා නැතැ'යි ඇඟිල්ල දික් කොට කිව නොහැකි තරම් මග - පල අධිගම ලාභීන්ගෙන් ශ්‍රී ලංකාව ඉතිරී පැතිරී පැවතී ඇත. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ ත්‍රිවිධ ශාසනයම බැබලෙමින් පැවති නිසාම ශ්‍රී ලංකාව ධර්ම ද්වීපය නමින් ලෝකයේම ගෞරව සම්මානයට පාත්‍රවී ඇත.

කෝට්ටේ රාජධානි සමයේ ශ්‍රී ලංකාවෙන් බුරුම රටටත්, එරටින් තායිලන්තයටත් බුදු සසුන ගෙනයන ලදී. ඒ දෙරටේම දූනටත් මාර්ගඵල ලාභී ආර්යයන් වහන්සේලා වැඩ සිටිති, ගිහි පැවිදි දෙපිරිසේම බෞද්ධයෝ ඉතාමත් ගෞරවයෙන් ප්‍රතිපත්ති පිරීමෙහි අප්‍රමාදීව යෙදී සිටිති.

අර්ධ ශත වර්ෂයක සිට ශ්‍රී ලංකාවේත් ගිහි පැවිදි බොහෝ දෙනා මේ භවයේදීම අධිගම අපේක්ෂාවෙන් භාවනාභිලාෂීව ප්‍රතිපත්ති පිරීමට යොමු වූයේ බුරුම රටින් මෙරටට කර්මස්ථානාචාර්යයන් වහන්සේලා වැඩම කරවා විදර්ශනා භාවනා පුහුණු කරවීම ආරම්භ කළ බැවිනි.

සම්බුද්ධ ජයන්තිය නිමිත්තෙන් බුරුම රටේ පැවති ඡට්ඨ සංගායනාවේදී මුල් තැනක් ගෙන කටයුතු කළ අතිපූජ්‍ය අග්ගමහා පණ්ඩිත භදන්ත මහා-සී සයාඩෝ මාහිමියන් වහන්සේ විසින් ආරම්භ කොට

පවත්වාගෙන එන විදර්ශනා භාවනා පුහුණු කරවන මධ්‍යස්ථාන දහසකට ආසන්නය. එරටේම බාල - තරුණ - මහළු ගිහි පැවිදි කෝටි සංඛ්‍යාත ජනතාවක් දැනට භාවනා පුහුණු වෙමින් දහම් රස විඳගන්නා බව අසන්නට ලැබීමත් වාසනාවකි.

පූජනීය මහා-සී සෙයාඩෝ මාහිමියන්ගේ කර්මස්ථාන ආචාර්යන් වහන්සේ පූජනීය ජේතවන සෙයාඩෝ වෙති. එතුමන් වහන්සේගේ ආචාර්යයන් වහන්සේ බේමින්ද සෙයාඩෝ. එතුමන් වහන්සේගේ ආචාර්යයන් වහන්සේ පූජනීය තීලූං සෙයාඩෝ සහ කෙන්යෙත් සෙයාඩෝ දෙනම අභිඥාලාභී රහතන් වහන්සේලා දෙනමකි. එම ගුරු සිසු පරපුරේ මහා-සී සෙයාඩෝ මාහිමියෝ එම භාවනා මාර්ගය මේසා විශාල ජනතාව අතරට බෙදා දීමෙන් දේශීය විදේශීය රටවල් රාශියකට ශාසන දායාදය ලබා දුන්හ. ඒ මාහිමියන් වහන්සේට අපේ ගෞරවාදර නමස්කාරය වේවා.

යථොක්ත මාහිමියන් අතින් සම්පාදිත වූ විපස්සනා භාවනා ක්‍රමය නම් වූ බුරුම බසින් මුද්‍රිත මහා ග්‍රන්ථ රත්නය, මීතිරිගල නිස්සරණ වන සේනාසන වාසී පූජ්‍ය උඩර්රියගම ධම්මජීව ස්ථවිරයන් වහන්සේ විසින්, බුරුම ජාතික පූජ්‍ය උ අග්ගඤ්ඤ සෙයාඩෝ හිමියනගේ ද සහායෙන් සිංහළ බසට නංවා පරිච්ඡේද හතක් වශයෙන් කොටස් කොට මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කිරීම සිංහළ බෞද්ධයනට ඉමහත් ධර්මානුග්‍රහයකි.

ප්‍රථම කොටසෙහි, 1- අවවාද කථා සහ සීලවිශුද්ධිය ද, 2- චිත්ත විශුද්ධියත් යන පරිච්ඡේද දෙකකින් යුක්තය, ප්‍රථම ග්‍රන්ථය වශයෙන් එය මුද්‍රිතයි. මේ දෙවන ග්‍රන්ථයෙහි පරිච්ඡේද දෙකක් ඇතුළත් වෙති. 1- ප්‍රඥප්ති - පරමාර්ථ දෙක වෙන්කිරීම - සමථයානිකයාගේ භාවනා මාර්ගය විදහා දැක්වීම. 2- මනසිකාර ක්‍රමය තත්වාකාරයෙන් කල්පනා කොට බැලීම හා දැනගැනීමට දේශනා මාර්ගයෙන් විස්තර කිරීම ද ඇතුළත් වී ඇත.

ඉතිරි පරිච්ඡේද තුනක් ඉදිරියේදී මුද්‍රණය කරනු ලැබේවා. විපස්සනා යානික යෝගාවචරයන් හට අර්හත්වය දක්වා යා හැකි භාවනා මාර්ගය අනුපිළිවෙළින් සිංහළ බසට නැංවීම අතිශයින් ප්‍රයෝජනවත් බැවිනි.

පූජ්‍ය උඩඊරියගම ධම්මජීව ස්ථවිරයන් වහන්සේ නිලඹේ භාවනා මධ්‍යස්ථානයේ දී ද, මීතිරිගල නිස්සරණ වන සෙනාසනාධිපති ප්‍රධාන කර්මස්ථානාචාර්ය අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේ වෙතින් ද, බුරුම රට රැන්ගුන් අගනුවර පණ්ඩිතාරාම භාවනා මධ්‍යස්ථානයේදී තෙවසරක් ද විපස්සනා භාවනාවත් බුරුම බසත් ප්‍රගුණ කරගත් බැවින් නිවැරැදිවත් පැහැදිළිවත් ලෙස මෙම විපස්සනා භාවනා මාර්ගය සිංහළ බසට නංවාලීම සැම දෙනාගේ චිත්ත ප්‍රසාදයට විශේෂ හේතුවකි.

බුරුම ජාතික පූජ්‍ය ඌ අග්ගඤ්ඤ ස්ථවිරයන් වහන්සේ ද බුරුම රටේදී මහා -සී විපස්සනා භාවනාවත්, මෝලමියෙන් ථා-අවුක් චිත්තලපබ්බත භාවනා මධ්‍යස්ථානාධිපති අතිගරු පූජනීය අග්ගමහා කම්මට්ඨානාචරිය සෙයාඩෝ යූ. ආචිණ්ණ මාහිමියන් වහන්සේ වෙත සමථ විදර්ශනා උභය භාවනා මාර්ගයත් සර්වාකාරයෙන් ප්‍රගුණ කරගෙන එහිම උප ප්‍රධාන කර්මස්ථානාචාර්ය වශයෙන් කටයුතු කරන සම්භාවනීය ස්ථවිරයන් වහන්සේ නමක් බැවින් මෙය බුරුම බසින් සිංහළට පරිවර්තන කිරීම විශේෂයෙන්ම ප්‍රසංසනීය වේ.

සුද්ධ විපස්සනා යානිකයාට ද සමථාභියෝගය පහසුවකි, සමථයානිකයාට ද විපස්සනාව සුවසේම වැඩෙයි, මේ දෙකම ඒකාබද්ධව, එකිනෙකට පිහිටවන බැවිනි. පූජනීය මහා-සී සෙයාඩෝ මාහිමියන් වහන්සේගේ ප්‍රාචාර්යවර තීලුං සෙයාඩෝ-කෙත්යෙන් සෙයාඩෝ දෙදෙනා වහන්සේ අභිඥාලාභී රහතන් වහන්සේලා බැවින් එය පැහැදිලි වේ. වර්තමානයේ සුප්‍රසිද්ධ ථා-ඕ සෙයාඩෝ මාහිමියෝ ද පළමුවෙන් මහා - සී විපස්සනාව සපුරා පුහුණු වී, ඉන් අනතුරු සමථ විපස්සනාව ප්‍රගුණ කොටගෙන ඒ අනුව විශාල ජනතාවකට සමථ පූර්වාංගම විපස්සනා භාවනා පුහුණු කරවන බැවින් ද සමථ විදර්ශනා භාවනා මාර්ග දෙකම එකට අත්වැල් බැඳගෙන පවත්නා බව ඉතා පැහැදිළිය.

ධම්මපදයේ භික්ඛු වග්ගයෙහි ඒ බව මෙසේ දැක්වේ.

නත්ථි ඣානං අපඤ්ඤස්ස - පඤ්ඤා නත්ථි අඣායතො
යම්හි ඣානඤ්ච පඤ්ඤාච - ස වේ නිබ්බාන සන්තිකෙ

තේරුම:-

"විදර්ශනා ප්‍රඥාව නැත්තාට ධ්‍යානයක් නොමැත. ධ්‍යානයක් නැත්තාට විදර්ශනා ප්‍රඥාවත් නැත, ධ්‍යානයත් විදර්ශනා ප්‍රඥාවත් ඇත්තා නිවන සමීපයේමය"

ශාසනාභිවෘද්ධිය පතා ඉමහත් ගෞරවයෙන් ග්‍රන්ථය පරිවර්තනය කොට එළි දක්වන පූජ්‍ය උඩඊරියගම ධම්මජීව ස්වාමීන් වහන්සේටත්, පූජ්‍ය බුරුම ජාතික උ අගගඤැ ස්වාමීන් වහන්සේටත් රත්නත්‍රයානුභාව බලයෙන් නිදුක් නිරෝගී සුවපත් භාවයෙන් විංශත් ශත වර්ෂාධික කාලයක් දීර්ඝායුෂ අත්වේවා. සංකල්පනා සියල්ල සමෘද්ධ වේවා.

ඉතාමත් ගෞරවයෙන් මෙය මුද්‍රණය කරන ලිතිර මුද්‍රණාලාධිපති පින්වත් කමල් ඇඹුල්දෙණිය මහතා ප්‍රධාන සැමටත්, ධර්මදානය පිරිනමන පරිත්‍යාගශීලී සැමටත්, කියවන භාවිතා කරන සැමටත් ආයුරාරෝග්‍ය සැපතත් ධර්මඥානය හා භාවනා ඥානයත් මුදුන්පත් වේවා.

චිරං තිට්ඨතු සද්ධම්මො
ධම්මෙ හොන්තු සගාරවා
සබ්බෙපි සත්තා කාලෙන,
සම්මා දෙවො පවස්සතු [අත්ථසාලිනී]

අරියධම්ම භික්ෂුව
ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය
ගල්දූව, කහව.
80312

පෙරවදන

අතිපූජනීය බුරුම ජාතික මහා - සී සයාඩෝ ස්වාමීන් වහන්සේගේ ප්‍රධානතම කෘත්‍යය ලෙස සැලකෙන මෙම විපස්සනා ග්‍රන්ථයේ මුල් පරිච්ඡේද දෙක මීට පෙර එළිදක්වන ලද්දේ ශ්‍රී ඥානාරාම ස්වාමීන්ද්‍ර අනුස්මරණ ග්‍රන්ථ මාලා අංක 11 වශයෙනි. එය මෙම පොත් පෙළේ ප්‍රථම භාගය විය. මෙතෙක් කල් අප විසින් පරිවර්තනය කරන ලද භාවනා පොත් ඉතාමත් සැළකිල්ලෙන් කියවන්නට යෙදුනු වැදගත් පාඨකයන් කිහිප දෙනෙක් විසින්ම එම ප්‍රථම කොටස කියවා ඒ ගැන විශේෂයෙන් ප්‍රශංසා කරන්නට යෙදුනු බව මෙහි ලා සඳහන් කරන්නේ සතුටිනි. මෙම දෙවන කොටසින් උක්ත බුරුම පොතෙහි ඇති තුන් වන හා හතරවන පරිච්ඡේද ඔබ වෙත ඉදිරිපත් කරමු. තවත් පරිච්ඡේද තුනක් මෙලෙසටම එළිදැක්වීමට පෙළ ගැසී තිබේ.

මෙහිදී ද විශේෂයෙන් විස්තර වන්නේ ප්‍රවීන යෝගාවචරයන්ට හා උපදෙශකයන්ට වඩාත් උචිත මූල ධර්ම කොටස්ය. මෙහි අන්තර්ගතය නොකියවා හෝ වටහා නොගෙන කටයුතු කරන උපදේශකයන්ට වඩා කියවා තේරුම් ගෙන කටයුතු කරන උපදේශකයන්ට හෝ ප්‍රවීන යෝගාවචරයන්ට මෙහි ඇති ප්‍රායෝගික වටිනාකම විශේෂයෙන් කැපී පෙනෙනු ඇත.

මෙහි මුල් කොටසෙහි ලා දක්වනට යෙදුනු ග්‍රන්ථාරම්භ කථා හා මූලික අවවාද ආදියෙන් දක්වන්නට යෙදුනු ආකාරයටම මෙහි ආකෘතියත්

සකස් වී ඇත. පරිවර්තනයේදීද, පළමු කොටසේදී මෙන්ම බුරුම ජාතික පූජ්‍ය උ අග්ගඤාණ ස්වාමීන් වහන්සේගේ ගෞරවණීය උපකාරය ඇතිව පරිවර්තනයත්, අත් අකුරු පිටපත් සකස් කිරීමේදී පූජ්‍ය විලානගම පියරතන ස්වාමීන් වහන්සේත් චම්පා ඇඹුල්දෙණිය මහත්මියත් දැක්වූ සහය කෘතඥ පූර්වකව සිහිපත් කරමු. සෝදුපත් බැලීමේදී පූජ්‍ය කිතුල්හිටියාවේ ධම්ම ගුත්ත ස්වාමීන්වහන්සේද පූජ්‍ය පාතේගම ධම්ම සුමන ස්වාමීන් වහන්සේද මේ මහඟු පිංකමට සහාය විය.

මෙහිලා විශේෂ හැඳින්වීමක් සපයමින් පොතට විශේෂ අගයක් එක් කළ අතිපූජනීය නා උයනේ අරිය ධම්ම ස්වාමීන් වහන්සේ, අපගේ අමාදම් සංගමයේ ප්‍රධාන අනුශාසක වශයෙන් වෙන කිසිවෙකුටත් කළ නොහැකි ආකාරයේ දායකත්වයක් ලබාදීම අපට විශේෂ ධෛර්‍යයක් වූ බව සඳහන් කරන්නේ ශාසනික ගෞරවයෙනි. මේ අනුග්‍රහය අපට දිගටම වාසනා වේවායි පතමු. ස්වාමීන් වහන්සේගේ ලෞකික ලෝකෝත්තර පැතුම් සමෘධ වීම පිණිස මේ අප රැස් කරන සියලු කුසල් පාදක වේවා!

මෙම ධර්ම පුස්තකය මුද්‍රණය සඳහා බරපැන ඇරවූ පිංවත් බෝධිපාල මහත්මයා ඇතුලු සියලුම දෙනාත්. පී. එච්. හෙයියන්තුඩුව මාතාව ඇතුලු ඥාති පිරිසත්, තිලක් රුදිගු මහත්මයා සහ අනුර නාරංගම්මන මහත්මයා සහ නිර්මලා වැලිකල මෙනවිය, ඩී ප්‍රේමදාස මහත්මිය යන මහත්ම මහත්මීන් නිසා මෙවරද මේ මහඟු දායාදය ඔබ අතට ධර්ම ගෞරවයෙන් යුක්තව නොමිළයේම පත්කිරීමේ හැකියාව ලැබුණු බව පිංදීමෙන් යුක්තව මතක් කරමු. දායක වූ සියලුම දෙනාට විපස්සනා භාවනාව විශිෂ්ඨ ලෙස සමෘධ වේවා. මෙලොව වශයෙන් උතුම් සද්ධර්මය සාක්ෂාත් කරගැනීමට මෙම මහඟු කුශලය හේතු වේවා. කමල් ඇඹුල්දෙණිය මහතා නොවිදිනා දුක් විඳිමින් මුද්‍රණයත්, සෝදුපත් බැලීමත්, අරමුදල් සම්පාදනය කරගැනීමත් අතින් කටයුතු කිරීමට දැන් දැන් ශක්තිමත් වී ඇති බව පෙනෙන්නට තිබීම මෙහිදි සඳහන් කරන්නේ මුදිතාවෙන් යුක්තවය. එතුමාගේ 'ලිතිර' හි කාර්‍ය මණ්ඩලයේ අනුග්‍රහයත් පැසසිය යුත්තකි. තන් අයුරින් අනුග්‍රහය ලබාදෙන මීතිරිගල නිස්සරණ වනයේ ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු සියලුම සබ්‍රහ්මචාරීන් වහන්සේලාත්, නව පාලක සභාවත්, දායක කාරක භවත්හුත් මෙම කුසලයට දක්වන දායකත්වය කෘතගුණයෙන් යුක්තව සිහිපත් කරන්නේ ගෞරවයෙනි.

වසර ගණනාවක් පුරා. මෙම භාරදූර කටයුත්තෙහි ලා ටිකෙන් ටික වශයෙන් අප රැස් කළ යම් කුසලයක් වේ නම් එය මුලින්ම අම්මා - අප්පච්චී ඇතුළු සියලුම අභාවප්‍රාප්තඥාතීන් අනුමෝදන් වේවායි ආරාධනා කරන අතරම සියළුම ගුරු ආචාර්ය - උපාධයාදී උතුමන් වහන්සේලා වෙත ගුරු පඬුරක් වේවායි ඉතාමත් යටහත්ව පූජා කරමු. සියළුම හිතවත් - මැදහත්- අහිතවත් පෙනෙන නොපෙනෙන සත්ත්වයන්ද මෙපින් අනුමෝදන්ව ලක්දිව බුදු සසුන නගා සිටුවීමේ කටයුත්තට උත්සුක වේවා. තම තමන්ගේ ශීල ශාසනය, සමාධි ශාසනය හා ප්‍රඥා ශාසනය නඟාලීම තුළින් ලක් බුදු සසුනත් බැබළවීමට පෙළ ගැසෙත්වායි පතන්නේ මෛත්‍රියෙනි.

උ. ධම්මජීව භික්ෂුව,
නිස්සරණ වනය,
මීතිරිගල.
2547ක්වූ වෙසක් මාසයේදීයැ.

මහා-සී විපසසනා භාවනා ක්‍රමය

ප්‍රථම භාගය

දෙවන කොටස

පරිච්ඡේද අංක 3

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

භාවනා කළ යුතු ධර්මයන්

මෙම පරිච්ඡේදයෙහිලා පරමාර්ථ හා ප්‍රඥප්තීන් වෙන්කොට දක්වන්නෙමු. විපස්සනා (භාවනා) කළ යුතු ධර්මයන් විශේෂයෙන් වෙන්කොට උදෘත කොට දක්වන්නෙමු. සමථයානිකයා භාවනා කරන ආකාරයෙන්ද වෙන් කොට දක්වන්නෙමු.

පරමාර්ථ හා ප්‍රඥප්ති

පරමො උතතමො අවිපරිතො අතථො පරමතථො

[අභිධර්මාර්ථ සංග්‍රහ ටීකාවක් (ටීකා ජො)]

පරමො උතතමො = පරම වූ උතුම් වූ

අවිපරිතො = විපරීත නොවන්නා වූ, නියම වූ

අතථො = අර්ථයයි

පරමතථො = උතුම් වූ නියම අර්ථ යයි.

අදහස වනාහි

වැරදි අර්ථයට - අදහසට උතුම් යැයි හොඳ යැයි කිව නොහැක්කේය. නිවැරදි අර්ථයට හෝ අදහසට හෝ උතුම් යැයි - හොඳ යැයි කිව හැක්කේය. එම නිසා චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යන අර්ථ සතර නිවැරදි වූද විකාරයට වෙනස් වීමකට පත්නොවූ ද, සත්‍යය පමණක් ඇත්තා වූ ද උතුම් සාරාර්ථයම වන නිසා ඒවාට "පරමාර්ථ ධර්ම" යැයි කියනු ලැබේ. **පරමො උත්තමො අත්තපච්චක්ඛො අත්ථො පරමත්ථො** (අට්ඨ කථා අනුව)

පරමො උත්තමො = තමා වශයෙන් දතයුතු, ප්‍රත්‍යක්ෂ කළ යුතු

අත්ථො = අර්ථයයි

පරමත්ථො = උතුම් වූ ස්වකීය වශයෙන්ම දතයුතු අර්ථයයි.

තේරුම:

අසා-අනුශ්‍රැතියෙන් දැනගත් දේ සමහර විටෙක ඇත්තය. සමහර විටෙක ඇත්ත නොවේ. මේ නිසා එවැනි අර්ථ උතුම් අර්ථ යැයි, පරමාර්ථ යැයි කිව නොහැක්කේය. තමා වශයෙන් වර්තමානව දැනගත හැකි අර්ථය වනාහි වැරදි විය නොහැක. නිවැරදිම වන්නේය. එම නිසා තමා වශයෙන් දැක, වර්තමානව දතයුතු චිත්ත-චෛතසික-රූප-නිබ්බාන, යන ස්වභාව හතර උතුම් වූ අර්ථ-පරමාර්ථ ධර්ම යැයි කියනු ලැබේ. එම නිසා කථා වත්ථු අට්ඨ කථාහි පහත සඳහන් ලෙසට අනුශාසනා කළ සේක.

සච්චිකට්ඨොති **මායා මරිචි ආදයො විය අභූතාකාරෙන අග්ගහෙතබ්බො භූතත්ථො,** ***පරමත්ථොති*** **අනුස්සවාදි වසෙන අග්ගහෙතබ්බො උත්තමත්ථො**

[අභි. අ. 3/85]

අත්තනො පන භූතතාය එව සච්චිකට්ඨො, අත්තපච්චක්ඛතාය පරමත්ථො, තං සන්ධාය ආහ.

[අභි. අ. 3/85]

සච්චි කට්ඨොති = *සච්චි කට්ඨ යනු*

මායා මරිචි ආදයො විය = මායා කාරී වස්තු, මිරිගුව ආදිය මෙන්

අභූතාකාරෙන අග්ගහෙතබ්බො = වැරදි ලෙස නොගත යුතු

භූතත්ථො = නිවැරදි අර්ථ ස්වභාවයයි

පරමත්ථො = පරමාර්ථ යන්න වනාහි

අනුස්සවාදි වසෙන = වෙන කෙනෙකුන් කීදෙයක් අසා දැනගැනීම ආදියෙන්

අගගහෙතබෙබා	=	නොගත යුතු
උතතමො	=	උතුම් අර්ථ යයි
පන	=	ඇත්ත වශයෙන්ම
සො	=	එම 57 ආකාර ධම්යන්
අතතනො භූතතාය	=	ස්වකීයව ඇති බව වශයෙන්ම
සච්චි කටෙඨා	=	සච්චි කට්ඨ නම් වේ
අතත පච්චකඛතාය	=	ඇස්පනාපිට පහළ වන බැවින්
පරමතෙථා	=	පරමාර්ථ නම් වේ.
තං	=	පඤ්චස්කන්ධය, ආයතන දොළස, ධාතු දහ අට, ඉන්ද්‍රිය 22 යන මෙම 57 ක් වූ, ධම්යන්
සනධාය	=	සඳහා
ආහ	=	දේශනා කළ සේක.

අට්ඨ කථාහි මෙම **සච්ඡිකට්ඨ** යන ස්ථානයෙහිලා 57 ක් වූ ධම්යෝ දැක්වෙත්. පරමාර්ථ යන ස්ථානයේදී ද මෙම 57 ක් වූ ධම්යෝම වෙත්. කෙටියෙන් දක්වතොත් මෙය චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යන හතරයි. එයටත් වඩා කෙටියෙන් දක්වතොත් රූප, නාම යන දෙකයි. එම නිසා පහසු වැටහීම සඳහා මෙහිලා රූප, නාම යන දෙක පමණක් දක්වන්නෙමු. මායා කාරයා ගඩොල්, කඩදාසි, ගල්කැට ආදිය මන්ත්‍ර-බෙහෙත් මගින් රත්රන්, රිදී, මැණික් කොට දක්වන කල්හි බලන්නෝ ඒවා ඇත්තම රත්‍රන්, රිදී, මැණික් යැයි සිතන නමුත් සත්‍ය නොවන ස්වභාව නිසා ***අභූතත්ථ = අසච්ඡිකට්ඨ***= සත්‍ය නොවන අර්ථය වේ. ග්‍රීෂ්ම ඍතුවේ දිය සොයන මුවන් ඇත පෙනෙණ මිරිඟුව ජලය යැයි සිතා ගනී. මෙලෙස සිතා ගැනීමද 'ජලය ලෙස ගන්නා බව' ප්‍රත්‍යක්‍ෂ වශයෙන් නැති ස්වභාවයෙන් ගත් නිසා ***අභූතත්ථ = අසච්ඡිකට්ඨම*** වේ. එසේම ඇත්ත වශයෙන් නැත්තේ මුත්, ඇති ලෙස සිතා ගන්නා ඤාණ, ප්‍රඥප්ති ඤාණ වේ. ස්ත්‍රී, පුරුෂ, අත්, පා ආදිය විවිධ නාම ප්‍රඥප්ති වගී ***අභූතත්ථ = අසච්ඡිකට්ඨ*** අර්ථ සඳහා වේ. නියම රූප- නාමයන් එසේම "නැත්තේ නමුදු, ඇත්තා සේ ගත් ධම්යන්" නොවෙත්. ඇත්ත වශයෙන්ම පැහැදිළිවම ඇත්ත ඇති ආකාරයට, ඇතිවන-නැතිවන ආකාරයටම ගතයුතු, දැන ගතයුතු අර්ථයෝය. එම නිසා එම නියම රූප- නාමයන් ***භූතත්ථ = සච්ඡිකට්ඨ*** නම් වේ. අවිපරීත වූ, සත්‍ය වූ ධම්යන් යැයි කියනු ලැබේ.

ඇත්ත වශයෙන්ම...

ඇසෙන් රූප දක්නා පුද්ගලයා "රූපයක් දැක්කේ යැ"යිද "දැකිය හැකි රූපයක් ඇත්තේ යැ"යිද දනී. මෙලෙස දක්නා වණ්ණ රූපය රත්රන්, රිදී, මුතු මැණික් යයි සළකාගන්නා මායාකාරී වස්තු සේ, ජලය යැයි වරදවා සිතා ගත් මිරිඟුවක් සේ, වැරැද්දක් නොවේ. දක්නා ලෙසටම ඇත්තය. ඇත්තටම ඇත්තේය. මක්නිසාදයත් දැකීමට රූපයක් නැත්නම් දැකීම සිදුවිය නොහැකි බැවිනි. එම නිසා ඇසින් දැකිය යුතු වණ්ණ රූප **භූතත්ථ = සච්චිකට්ඨ** නම් වේ. **සච්චිකට්ඨ** වන බැවින් පරමාර්ථ නම් ද වේ. දැකීමෙන් පසු අවස්ථාවන්හිද සටහන් විවිධ කරන ලෙසට මනෝ ද්වාරය මගින් කල්පනා කොට තීරණය කරයි. "ඈත දුටිමි- ලඟ දුටිමි- හෙල්ලයක් දුටිමි- කඩුවක් දුටිමි- චතුරශ්‍රයක් දුටිමි- වෘතයක් දුටිමි- ස්ත්‍රියක් දුටිමි- පුරුෂයකු දුටිමි- මුහුණු දුටිමි- අත දුටිමි" යනාදි විවිධ ලෙස කල්පනා කොට තීරණය කරයි. මේ කල්පනා කොට සිතා ගැනීමේදී, පෙර නොදුටු විරූ මතකයේ නැති අරමුණු වස්තූන් විනිශ්චය කිරීමට බොහෝ කල් කල්පනා කළ යුතු බව ප්‍රකටය. දුටු මතකයේ ඇති අරමුණු වස්තු විෂයෙහි දිගින් දිගට කල්පනා නොකරන නිසා එහිලා එම කල්පනාවන් ප්‍රකට නැත. ප්‍රකට නැති නිසා එම රූ සටහන පමණක් දුටිමි යැයි ගනියි. පෙර සිත හා පසු සිත වෙන් කොට නොදන්නා ගතිය සාමාන්‍ය පෘථග්ජනයන් ගේ ස්වභාව යයි. එම නිසා මූල ටීකාහි පහත සඳහන් ලෙසට අනුශාසනා කරයි.

චක්ඛු විඤ්ඤාණස්ස හි රූපෙ අභිනිපාතමත්තං කිච්චං, න අධිප්පාය සහභුනො චලන විකාරස්ස ගහණං, චිත්තස්ස පන ලහු පරිවත්තිතාය චක්ඛු විඤ්ඤාණ වීථියා අනන්තරං මනො විඤ්ඤාණෙන විඤ්ඤාතම්පි චලනං චක්ඛුනා දිට්ඨං විය මඤ්ඤන්ති අවිසෙස විදුනො. [මූල ටී. (බු.) 1/71]

රූපෙ අභිනිපාත මත්තං = රූපයට අභිමුඛව වැටීම හෝ හුදු රූපය දැකීම,

චක්ඛු විඤ්ඤාණස්ස කිච්චං = දකින සිතේ කෘත්‍යයයි

අධිප්පාය සහභුනො චලන විකාරස්ස = කැමැත්ත සමඟ පහළ වන විශේෂ චලන හැසිරීම්

ගහණං = ගැනීම, දැනීම,

න = දකින සිතේ කෘත්‍යය නොවේ

පෙ - පන- = නුමුදු

චිතතසස ලහු පරිවතතිතාය	=	සිතේ ඇති ඉක්මනින් පෙරෙලෙන බව නිසා
චකඛු විඤඤාණ විථියා අනනතරං	=	චක්ඛු විඥ්ඥාණ වීථියට අනතුරුවම, අතරක් නොතබා,
මනො විඤඤාණෙන විඤඤාතමපි		
චලනං	=	කල්පනා කොට මනො විඥ්ඥාණයෙන්ම ගත් චලන ද,
චකඛුනා දිටඨං විය	=	ඇසින් දුටුවාක් සේ,
අවිසෙස විදුනො	=	පෙර සිත පසු සිත වෙනස නොදන්නා පෘථග්ජන පුද්ගලයන්,
මඤඤනති	=	සිතත්

අත සෙලවීම ආදිය දකින අවස්ථා ඇති වේ. දක්නා සිතින් සටහන පමණක් දකී. අත යැයි ද, චලනයත් යැයි ද නොදනී. නමුදු සිත ඉතා ඉක්මනින් පෙරළේ. එම නිසා දකින සිතම, පසුව කල්පනා කොට, සිතා දත යුතු චලනය ද ඇසින්ම දකින්නේ යැයි (පෙර සිත පසු සිත වෙන් කොට ගත නොහැකි සාමාන්‍ය පෘථජ්ජනයා සළකා ගනී) යනු අදහසයි විපස්සනාවෙහි සූර වූ පුද්ගලයා වනාහි රූප සටහන දකින සිත එකකි. අත යැයි දැන ගන්නා සිත තව එකකි, චලනය යැයි දන්නා සිත තවත් එකකි, යැයි වෙන වෙනම පහළ වන ආකාරයට අනුවම එම සිත් තම ඥාණයෙන්ම දනී.

නමුත් මෙහිලා සාමාන්‍ය කාහටත් පිළිගෙන සිත තබාගැනීමට හැකි උපමාවක් දක්වන්නෙමු. රාත්‍රී අන්ධකාරයේ ගිනි පෙනෙල්ලක් කරකවා දක්වතොත් දකින පුද්ගලයා ගිනි වළල්ලක් සේ දකින්නා සේ සිතයි. දිගට හෝ ත්‍රිකෝණාකාර ලෙසට සොලවන්නේ නම් ඉරක් දුටිමි. ත්‍රිකෝණයක් දුටිමි යි යනාදි ලෙසට සළකාගනී. ඇත්ත වශයෙන් නම් අඛණ්ඩ ගිනිවළලු සටහන් ආදියක් නොමැති බැවින් එම සටහන් එසේ එකවැර සියල්ල නොදැකිය හැකි ඒවාමය. ගින්නෙහි දිදුලන බව ස්ථාන කිහිපයක පවතින්නේය. එම සටහන් සියල්ල ස්ථාන බොහෝමයක අනුක්‍රමිකව දකී. එම දැකීම් සියල්ල එකතු කොට කල්පනා කරන පසු සිත් වලින්ම එම එම සටහන් ප්‍රකට විය. මේ උපමාව වනාහි කාරණය කෙළින්ම ප්‍රකට කොට දක්වන උපමාවක් වේ.

වෙනත් ආකාරයකටත් වනාහි: අකුරු හොඳින් කියවිය නොහැකි පුද්ගලයාට අකුරු දුටු පසුව අකුරක් අකුරක් පාසා කල්පනාවෙන් බැලූ පසු පමණක් වචන වශයෙන් කියවිය හැක්කේය. එවැන්නකු දිගින් දිගට කල්පනා කරන නිසා කල්පනා කිරීම ප්‍රකටය. හොඳින් කියවිය හැකි තැනැත්තාගේ කල්පනාව මෙසේ ප්‍රකට නැත. දුටු සැණින් කියවිය හැකි බවට නිසැකය. නමුදු යුහුසුලුව කල්පනා කිරීම ඇත්තේමය. එසේම නොදත්-නොදුටු අරමුණු මත දැකීමත් කල්පනා කිරීමත් ප්‍රකටය. දුටු පුරුදු අරමුණු මත දිගු කලක් කල්පනා කර කර සිටීමක් නොමැති නිසා කල්පනාව අප්‍රකටය. එම නිසා දුටු සැනින් ස්ත්‍රී, පුරුෂ යන ලෙසට සියල්ල වටහා ගනී. ස්ත්‍රියක් හෝ පුරුෂයකු ආදිය දුටුවේ යැයි සිතා ගනියි. පිළිගනියි. නමුදු දුටු පසු ඉක්මණින් කල්පනා කිරීම නම් ඇත්තේමය. එසේ කල්පනාවෙන්ම ස්ත්‍රී පුරුෂ ආදී වැටහීම තීරණය කළ හැක්කේය. මෙලෙස දුටු සැණින් නොහඳුනා කල්පනා කොට ගන්නා ස්ත්‍රී-පුරුෂ ආදී වැටහීම් සිතින් ගත් ගිනි වළල්ල සේ ඇත්ත ඇති සැටියෙන් නොපෙණේ. එම නිසා *භූතත්ථ, සච්චිකට්ඨ පරමත්ථ* නම් නොවන්නේය. සාමාන්‍යයෙන් දතයුතු, සම්මුති වශයෙන් එලැඹී, සම්මුති ප්‍රඥප්තීන් පමණක්ම වන්නේය. මෙම ප්‍රඥප්තීන් ප්‍රකටව නොපවතින බව, මෙලෙස නුවණින් සළකා බලන්නේ නම් අවබෝධ කළ හැක්කේය. එසේ බලන ක්‍රමය වනාහි, ස්ත්‍රී-පුරුෂ ආදී ලෙසට හඳුනා ගන්නා ද්‍රව්‍ය එකින් එක සළකා බැලුව හොත් දැක ගත හැකි ස්ත්‍රී-පුරුෂ භාවයක් ඒවායේ කැලම නොමැත්තේය. එම දකින ද්‍රව්‍යයන්හි වර්ණ සණ්ඨාන පමණක් ඇත්තේය. ස්ත්‍රී-පුරුෂ ආදියක් නැත. එම වර්ණ සණ්ඨාන සමූහය පමණක් දක්නේය. ස්ත්‍රී-පුරුෂ ආදිය නොදැකිය හැක්කේය. දුටුවේ යයි භාර ගන්නා ස්ත්‍රී-පුරුෂ ආදී ප්‍රඥප්ති ධර්ම වනාහි දුටුවේ යැයි පිළිගන්නා වාරයක් වාරයක් පාසා එසේ ඇත්තටම නොමැති බව වටහා ගත යුතුය. මෙහිලා මෙසේ නොදුටුව ද ස්පර්ශ කොට අතගා බැලිය හැකි ස්ත්‍රීන්-පුරුෂයින් ආදිය ඇත්තේ නොවන්නේ දැයි ප්‍රශ්න කරන්නේ නම්, එම ස්පර්ශ කොට ලත් ස්වභාවයන් ඇත්තටම ස්ත්‍රීන්-පුරුෂයන් නොවේ. දුටු වර්ණ සණ්ඨානය මෙන්ම ස්පර්ශ කොට ලත් ස්වභාවයන් ද ඇත්තටම ස්ත්‍රීන්-පුරුෂයන් නොවේ. දුටු වර්ණ සණ්ඨානය මෙන්ම ස්පර්ශ කරන පොට්ඨබ්බ අරමුණ පමණක් වන්නේය. එම පොට්ඨබ්බ අරමුණම ස්පර්ශ කරමින් සිටිය හැක්කේය. මක්නිසාද යත්; ස්පර්ශ කළ හැකි එම **පොට්ඨබ්බාරම්මණයන්** සියල්ල උගුලා දැමුවහොත් වෙනම ස්පර්ශ කළ හැකි ස්ත්‍රී භාවයන් හෝ පුරුෂ භාවයන් හමුවිය නොහැක්කේය. එම

නිසා ස්ත්‍රී-පුරුෂ ආදී වූ ප්‍රඥප්තීන් *අභූථත්‍ථ-අසච්චිකට්ඨ* වන්නේය. ස්ත්‍රී-පුරුෂ ආදින් දිටිමි, ස්පර්ශ කළෙමි යි ආදී ලෙසින් පිළිගන්නා තාක් දේ වරදවාගත් ධම් යැයි අදහස් කෙරේ. *අසච්චිකට්ඨ* වන නිසා *අපරමත්‍ථ* යෝය. පරමාත්‍ථ ධම් නොවේ යන්න එහි අර්ථයයි.

චක්ඛු ප්‍රසාද නම් වූ ඇසේ ඔපය නම් සත්‍ය ලෙසටම ඇත්තේය. එම නිසා එම ඇස් ඔපය තුළ වර්ණ සණ්ඨානය පහළ වී දැකීමේ කෘත්‍යය පහළ විය හැක්කේය. ඇසේ ඔපය නොමැති නම් වර්ණ රූපය හෝ ප්‍රකට නොවේ. කෙසේ දැක ගන්නද? උපමාවක්:- මූණ බලන පැහැදිළි කණ්නාඩියක් ඇත්නම් එම කණ්නාඩියේ ප්‍රකාශ වන ප්‍රතිබිම්බ රූප දැක ගත හැක්කේය. පැහැදිළි කණ්නාඩියක් නැත්නම් වර්ණ රූප ප්‍රකාශ නොවන නිසා, අපිරිසිදු කණ්නාඩියේ රූප දැකගත නොහැක්කා සේය. එම නිසා "දැකිය හැකි ඔපයක් වූ චක්ඛු ප්‍රසාදයක් ඇත්තේ යැ"යි මෙනෙහි කොට දැක-දැන ගත යුතු ප්‍රසාද රූපය ද *භූතත්‍ථ-සච්ඡිකට්ඨ පරමත්‍ථ* නම් වේ. දැකීමේ කෘත්‍යය ද ඇත්තටම ඇත්තේය. ඇති නිසාම විවිධ සටහන් දැක ගත හැක්කේය. නැත්නම් යමක් දුටුවේ දැයි දැනගත නොහැක්කේය. කිව නොහැක්කේය. එම නිසා චක්ඛු විඤ්ඤාණය යැයි කියා දකින ස්වභාවයද *භූතත්‍ථ - සච්චිකට්ඨ පරමත්‍ථ* නම් වේ. ඇසිය යුතු ශබ්ද රූප, ඇසීම සඳහා ඔපවත් වූ සොත ප්‍රසාදය, අසන සොත විඤ්ඤාණය ආදියද පිළිගෙන මනසිකාරය පවත්වා දැක දැන ගත් ආකාරයට ඇත්තටම පවතින නිසා *භූතත්‍ථ - සච්චිකට්ඨ පරමත්‍ථ* නම් වන බව පෙර දක්වූ ක්‍රමයටම වටහා ගන්න.

ඇස් පනාපිට දුටුදේම පරමාර්ථයෝය

අනෙකෙකුගේ කථාවක් ඇසීම මගින් පිළිගත්-සිතටගත් අර්ථය නිවැරදිවීම ද වැරදි වීමද විය හැක්කකි. සෑම විටම සත්‍යයම වීම විය නොහැක්කකි. එම නිසා එවැනි අර්ථ උත්තමත්‍ථ පරමත්‍ථ නොවන්නාහ. වටිනා, උතුම් අර්ථය නොවේ යැයි අදහස් කෙරේ. තමා ඇස්පනාපිටම දැක-හමුවී දැනගත් අර්ථය වනාහි දැක දැනගත් අයුරින් සත්‍යයම වේ. එම නිසා තමා වශයෙන් ඇස් පනාපිට දැක-දැනගත් අර්ථයම පමණක් *උත්තමත්‍ථ, පරමත්‍ථ* නම් වේ. උතුම් පරම අර්ථයක් යැයි අදහස් කෙරේ."**අනුස්සවාදි වසෙන**" යන අට්ඨ කථාවෙහි **ආදි** ශබ්දයෙන් දක්වන **පරම්පරා, ඉතිකිරා, පිටක සම්පදාන, තක්කහෙතු, නය හෙතු, ආකාර පරිවිතක්ක, දිට්ඨි නිජ්ඣානක්ඛන්ති**

වශයෙන් ගත් අර්ථයෝ පරමාර්ථ නොවේ. ඇස් පනාපිට දැනගත් අර්ථය පමණක් පරමාර්ථ යැයි දක්වයි.

පරම්පරා

ගුරුවරයන්ගේ-මුතුන් මිත්තන්ගේ-දෙමාපියන්ගේ පරපුරින් පැවත එන සම්ප්‍රදායානුකූල කථා පරමාර්ථ නොවේ.

ඉතිකිරා

එසේලු-මෙසේ ලූ, යැයි තමා වශයෙන් නොදැන ඇසූදෙය කියන දූෂමාන කථා. මේ කතා වර්ග දෙක අනුව පිළිගන්නා අර්ථයන් ද ඇත්ත, නැත්ත, යන දෙපැත්තටම වැටේ. එම නිසා පරමාර්ථ නොවේ.

පිටක සම්පදාන

තමාගේ අත්පොත, ගුරුපොත, ශුද්ධ ලියවිලි වැනි වූ ලිඛිත ග්‍රන්ථයන් හා ගැළපෙන නිසා භාරගත් පිළිගත් අර්ථයන් ද එම ග්‍රන්ථ ඇත්ත නම් පමණක් ඇත්ත වේ. ග්‍රන්ථය නම් ඇත්ත වුවද ගන්නා ක්‍රමය නිවැරදි විට පමණක් නිවැරදි විය හැක්කේය. එම නිසා එම අර්ථය ද පරමාර්ථය නොවේ.

තක්ක හෙතු

සිතා බලා කල්පනා කොට, තර්ක කොට පිළිගත් අර්ථය ද ඇත්ත නැත්ත යන දෙකටම වැටෙන නිසා පරමාර්ථය නොවේ.

නය හෙතු

නෛතික ක්‍රමයන් මත පිහිටා පිළිගත් අර්ථය ද න්‍යාය මූල ධර්ම නිවැරදි තාක් ඇත්තය, න්‍යාය වැරදි විට, අර්ථය වැරදිය. එම නිසා පරමාර්ථ ගණයට නොවැටේ.

ආකාර පරිවිතක්ක

ගැළපෙන්නා වූ හේතු දැක්වීමේ අනුව කල්පනා කොට, සිතාබලා පිළිගත් අර්ථය පරමාර්ථ නොවේ.

දිට්ඨි නිජ්ඣානකඛනති

කල්පනා කොට මනාප භාවයන්ට, ප්‍රිය සංකල්පයන්ට අනුව යන බැවින් ඇත්ත යැයි පිළිගන්නා අර්ථය.

මේ අර්ථ දෙකම සත්‍ය පමණක්ම විය නොහැක්කේය. එම නිසා පරමාර්ථ නොවේ.

මෙම අනුන්ගෙන් අසා, සම්ප්‍රදායෙන් ලබා ගත්, දැනගත්, ලබාගත හැකි, දැන ගත හැකි කථා ආදිය අනුව පිළිගත් අර්ථය ඒකාන්ත ඇත්තම නොවන නිසාම කාලාම සූත්‍රය ආදියෙහි "අනුස්සව වශයෙන් (කනට ඇසුන පමණින්) " ආදියෙන් නොපිළිගත යුතු යැයි වදාළ අතර තමා ස්වකීයව දැනගැනීම සඳහා භාවනා වඩා ස්වකීයව වශයෙන් දැනගත් අර්ථයන් පමණක් ඇත්ත ලෙස පිළිගත යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

නියම රූප-නාමයන් අනුන්ගෙන් අසා දැන ගැනීම් ආදිය මඟින් පිළිගත යුතු-දතයුතු, පිළිගැනීමට සුදුසු දැනගැනීමට සුදුසු ධර්ම නොවෙත්. තමා වශයෙන්ම ඇස් පනාපිටම දැක පිළිගත යුතු-දත යුතු දෑ පමණක් එයට සුදුසු ධර්ම වෙත්. "**අනුසසවාදී වසෙන අගගහෙ තබෙබා**" යන අට්ඨ කථාහි **අරහ-සකක** අර්ථය ප්‍රකාශ කළ "**තබබ**" ප්‍රත්‍යය යොදා අනුශාසනා කළ බව විශේෂයෙන් සිතට ගත යුතුය. මේ අර්ථය පසුව විස්තර කරන අනුටීකා මඟින් ප්‍රකට වනු ඇත.

අනුස්සවන ආදියෙන් පරමාර්ථය දැනගත නොහැකි බව

මවු කුස තුළදී ම ඇස් නොමැතිව (අන්ධව) උපන් ජාති අන්ධයා සුදු-රතු- කහ- නිල් ආදී වර්ණ අනුන් කොයි ආකාරයකට දක්වුව ද තත්ත්වාකාරයෙන් දැන ගැනීමට සමත් නොවන්නේය. දැකීම් ස්වභාවය වශයෙන් අනුන් මොන ක්‍රමයට කීවද තත්ත්වාකාරයෙන් දැන ගත නොහැක්කේය. ඇත්තාවූ ගඳ සුවඳ ආඝ්‍රානය වශයෙන් අනුන් කෙසේ දක්වුව ද ඝාන ප්‍රසාදය නොමැත්තාට තත්ත්වාකාරය විඳිය නොහැක්කේය. නොවැළඳූ රසකැවිල්ලක හෝ පළතුරක රසය ද අනුන් කෙලෙස ගෙනහැර දක්වුව ද තත්ත්වාකාරයෙන් විඳිය නොහැක්කේය. හිස කැක්කුම, දත් කැක්කුම, බඩ කැක්කුම ආදිය තමා වශයෙන් අත්නොවිඳි තැනැත්තාට ද

අනුන් කෙසේ විස්තර කළ ද තත්ත්වාකාරයෙන් එම රෝග වේදනා නොදත හැක්කේය. විපස්සනා ඥාණ-ධ්‍යාන-මාර්ග-ඵලයන්ට නොපත් තැනැත්තාට පොත්-පත්වලින් මොන මොන ආකාරයට ගෙන හැර පෑවත් ඒවා තත්ත්වාකාරයෙන් නොදත හැක්කේය. නොවිඳිය හැක්කේය. මෙහිලා අනුස්සව වශයෙන් (කණට ඇසුන ලෙසින්), අනුමාන වශයෙන් දැන ගැනීම් තත්ත්වාකාරයෙන් දැනීම් නොවේ යැයි ද විපස්සනා යෝගීන් හා ධ්‍යාන ලාභි ආර්යයන් වහන්සේලාගේ දැනීම නියම ඇත්ත දැනීම යැයි ද කියනු ලැබේ. එම නිසා කණට ඇසුනු පමණින් හෝ කල්පනා කොට දැන ගත් පමණින් හෝ එම අර්ථයන් සියල්ල නියම රූප-නාම පරමාර්ථ නොවේ. ප්‍රඥප්ති යැයි සළකා ගත යුතු.

පරමාර්ථය ඇස්පනා පිට දැනගන්නා සැටි

වර්ණ රූපය තමා වශයෙන් දැක ඇස් පනා පිට දත හැක්කේය. දැකිය හැකි ඕපය නම් වූ චක්ඛු ප්‍රසාද රූපය හා දකින්නා වූ විඥාණය හෙවත් සිත ආදිය ද තම සන්තානයේ ප්‍රසිද්ධව ඇති නිසා ඇස් පනා පිටම දත හැක්කේය. ශබ්ද රූපය-කණේ ඕපය, සෝත ප්‍රසාද රූපය-සෝත විඥ්ඥාණය ආදී රූප-නාමයන්ද ඇස්පනා පිට දැනගත හැකි බව මේ ක්‍රමයට සළකා ගන්න. එම රූප- නාමයන් මනසිකාරයට නංවා විපස්සනා ඥාණයෙන් දත හැක්කේය. මාර්ග ඥාණ - ඵල ඥාණ - ප්‍රත්‍යවේක්ෂා ඥාණ ආදිය ද ඇස්පනා පිට දැක-දැන ගත හැක්කේය. මෙලෙස ඇස් පනා පිට දැක දැන ගත හැකි නිසා එම නියම රූප - නාම ධර්මයන් ***පච්චක්ඛත්ථා* - *උත්තමත්ථා* - පරමත්ථා** නම් වේ. අභිමුඛයේ-ඇස්පනාපිට දැකගත යුතු එම ධර්මයන් ඇති සැටියෙන්ම දතයුතු බැවින් සත්‍ය ධර්මයන්ම වෙත්. කණින් ඇසු පමණින් හෝ පොතේ ලියා ඇති අයුරින් ආදියෙන් කල්පනා කොට එළඹි අර්ථයක් නොවන නිසා නිවැරදි ධර්මයන්ම වෙත්. එම නිසා **භූතත්ථ-සච්ඡිකට්ඨ** යැයිද කියනු ලැබේ. පහත දැක්වෙන්නේ (මූල ටීකා 3/90) හි විවරණයයි.

අනුස්සවාදි වසෙන ගය්හමානො තථාපි හොති අඤ්ඤථාපීති තාදිසො භෙදයො න පරමත්ථො. අත්තපච්චක්ඛො පන පරමත්ථොති දස්සෙන්තො ආහ "අනුස්සවාදි වසෙන අග්ගහෙතබ්බා උත්තමත්ථො"ති

අනුස්සවාදි වසෙන = කණින් ඇසු දේ වශයෙන්, අනුශ්‍රැති වශයෙන්

ගය්හමානො = ගන්නා කල්හී, දැනගන්නා වූ අර්ථය

තථාපි හොති = එම දැන ගත්, සළකා ගත් අයුරින් ද විය හැක්කේය.

අඤ්ඤථාපි = වෙනත් අයුරකින් ද විය හැක්කේය.

ඉති = මෙලෙස හරි වැරදි යන දෙකම විය හැකි බැවින්

තාදිසො = එවැනි

ඤෙය්‍යො = දතයුතු ස්වභාවය

න පරමත්ථො = පරමාර්ථ නොවේ.

පන = ඇත්ත වශයෙන්ම වනාහි

අත්තපච්චක්ඛො = තමා ඇස්පනාපිට පහළ වූ ධර්මයම (පරමාර්ථ වේත්)

ඉති දස්සෙන්තො = මෙලෙස දැක්වීම සඳහා

අනුස්සවාදි වසෙන අග්ගහෙතබ්බො උත්තමත්ථොති ආහ = "**අනුස්සවාදි වසෙන අග්ගහෙතබ්බො උත්තමත්ථො**" යැයි අර්ථ කථාචාර්යයෝ අනුශාසනා කරති.

අවිපරීත භාවතො එව පරමො පධානො අත්ථොති පරමත්ථො, ඤාණස්ස පච්චක්ඛභූතො ධම්මානං අනිද්දිසිතබ්බසභාවො තෙන වුත්තං "උත්තමත්ථො"ති

[අනු ටීකා 3/60]

අවිපරීත භාවතො එව = අවිපරිත භාවයෙන්, නිත්‍ය භාවයෙන් යුතු වූවක්ම

පරමො පධානො = උතුම් වූ ප්‍රධාන වූ

අත්ථො = අර්ථ යයි

ඉති = එම නිසා

පරමත්ථො = පරමාර්ථ නම් වේ

ඤාණස්ස = ඤාණයට

පච්චක්ඛභූතො = ප්‍රත්‍යක්ෂ වන්නා වූ

ධම්මානං = රූප- නාම ධර්මයන්ගේ

අනිද්දිසිතබ්බ සභාවො = මෙය මෙසේ යැයි හුවා දැක්විය නොහැකි වූ ස්වභාවයයි

තෙන = එම නිසා

උත්තමත්ථොති = උත්තමාර්ථ යැයි

වුත්තං = අටුවා කථා හි කියනු ලැබේ.

අර්ථය

නියම රූප- නාම ස්වභාවය වනාහි මෙනෙහි කරන, වටහා ගන්නා අරයුරින්ම නිවැරදි වශයෙන්ම, අවිපරිතව තත්ත්වාකාරය වන බැවින් පරම

අර්ථයක් වන්නේය. එම නිසා පරමාර්ථ නම් වේ. එම පරමාර්ථ ධර්මය යන්න පටිසංඛාන ඤාණ-විපස්සනා ඤාණ ආදී වශයෙන් ඇස් පනාපිට ප්‍රකට ධර්මයන්ය. අනුශ්‍රැති ආදියෙන් "මෙලෙස වූ ධර්මයකැ" යි දැක්විය නොහැකි බව රූප-නාම ධර්මයන්හි ස්වභාවයම වෙත්. රූප-නාම ධර්මයන් ගේ නියම ස්වභාව ලක්ෂණයන්ම වෙත් යැයි අදහස් කෙරේ.

මෙම ටීකාවෙහි **අනිද්දිසිතබ්බ සභාවො** යන පදය **අනුස්සවාදි වසෙන අග්ගහෙතබ්බා** යන එම අර්ථ කථා දැක්වීම සමඟ අර්ථය වශයෙන් සැසඳේ. "තමාම නොදැක, කණින් ඇසූ පමණින් ආදියෙන් නියම පරමාර්ථ වටහාගත නොහැක්කේය. අනෙකෙකුට ඒත්තු යන ලෙසට දැක්විය නොහැක්කේ යැ"යි ටීකා හි දැක්වේ. වෙනසකට ඇත්තේ මේ දක්වන ක්‍රමයේ පමණකි. තමාම ඇස්පනා පිට දැකගෙන වටහාගත යුතුය යන්න අර්ථය වශයෙන් දෙකෙහිම සමානය. තමාම නමුදු **අනිද්දිසිතබ්බ සභාවො** යන පදයේ අර්ථය ද වටහා ගැනීමට දුෂ්කරය. එම නිසා විවේචනාත්මකව තුලනාත්මකව පැහැදිළි කරන්නෙමු.

"පඨවි ධාතුව කක්ඛල ලක්ෂණයෙන් යුක්තය. සිත යනු අරමුණ දැන ගන්නා ස්වභාවයයි. ඵස්සය අරමුණේ වදින හැපෙන ස්වභාවයයි" මේ ආකාරයේ රූප-නාමයන්හී ස්වභාව ලක්ෂණයන් දක්වන්නට හැක්කේ නොවේද? එසේ වී **අනිද්දිසිතබ්බ සභාවො**-දැක්විය නොහැකි ස්වභාව යයි කුමක් නිසා කියන ලද්දේද?: රූප-නාමයන්ගේ ස්වභාවය දැක්විය හැකි බව සත්‍යය. එම නිසාම පාළි කථා ටීකාහි එසේ දක්වා ඇත්තේය. නමුදු එම දැක්වීම් මගින් දැන ගන්නා ධර්ම නියම ප්‍රත්‍යක්ෂ වශයෙන්, ඇස් පනා පිට දතයුතු නියම පරමාර්ථයන් නොවන්නාහ. පඨවි, සිත, ඵස්ස යන ලෙසට නම් වශයෙන් පමණක් දනී නම් එය හුදු නාම ප්‍රඥප්තීන් පමණක්ම වන්නාහ. **කක්ඛල** = ගොරෝසු ස්වභාවය, අරමුණ දැන ගන්නා ස්වභාවය, හැපෙන ස්වභාවය, යනාදී හැසිරීම් ස්වභාවයන් දන්නේ නම් *ආකාර පඤ්ඤත්ති* පමණක් දැනගත්තා වන්නේය. සුණු-ඝන, ගොලයන් ලෙසට සටහන් ඇති ආකාරයෙන් වැටහෙන්නේ නම්, **සණ්ඨාන පඤ්ඤත්ති** වශයෙන් පමණක් දැනගත්තා වන්නේය. උපමාවක්:- පොත් වල ලියා දක්වා ඇති අකාරයට නිර්වාණයේ කුමන ස්වභාවයක් ඇත්තේ දැයි බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තා දැනගනී. අනුන්ට ද කියාදෙයි. දේශනා ද කරයි. නමුදු අන්ධ පෘථග්ජනයනට නියම මාර්ග-ඵල-නිබ්බාන යන අරමුණු කිසි කලෙකත් තත්ත්වාකාරයෙන් දැන ගත නොහෙන්නේය. නියම නිවනද ගොත්‍රභූ

ඥාණය තෙක් නොගිය තාක් කිසිවිටකත් අරමුණු කොට දත නොහැක්කේය. එම නිසා පෘථග්ජනයන් දැන ගත්තා යැයි සළකාගන්නා මාර්ග-ඵල-නිවන ඇස්පනාපිට දැක ප්‍රත්‍යක්ෂයෙන් දැන ගන්නවා නොවේ. නියම පරමාර්ථද නොවේ. **අනුසසව** කණින් ඇසූ දේ, **පරම්පරා**=සම්ප්‍රයානුකූල කථා, **පිටක සම්පදාන**=ලිඛිත පොත් වලින්, ශුද්ධ ලියැවිලි වලින් ගත් දේ, **නය හේතු**=න්‍යායට අනුව වශයෙන් දත් අර්ථය යනාදී ක්‍රමයට *නාම ප්‍රඥප්ති, ආකාර ප්‍රඥප්ති, සණ්ඨාන ප්‍රඥප්තීත්* පමණක්ම වන්නාහ. ඍජුවම ප්‍රකට වන මෙම සාධක උපමා මෙන් ලෞකිය නාම- රූප තුළද ඇස් පනා පිට නොදැක, අනුන් දක්වූ ක්‍රමයන්ට අනුව වටහා ගත් සියල්ල නියම පරමාර්ථ නොවේ. නාම ප්‍රඥප්ති, ,ආකාර ප්‍රඥප්ති, සණ්ඨාන ප්‍රඥප්ති පමණක් යැයි ද සළකා ගතයුතු.

ප්‍රත්‍යක්ෂය හා සූතය සම්බන්ධ කොට දැන ගැනීම

පෘථග්ජනයන්ට වනාහි කාමාවචර-රූප-නාමයන් තමාගේ සන්තානයේ ප්‍රකටව පැනෙන නිසා, තම ඇස් පනාපිට දැක ගත හැක්කේය. ද්වාර හයෙහි ප්‍රකට වන නිසා තම ඇස් පනා පිටම දැකගත හැක්කේය. විපස්සනා භාවනා වැඩීමෙන් ද තම ඇස් පනාපිට දැනගත හැක්කේය. ධ්‍යාන ලාභි ඇත්තන්ට වනාහි මහග්ගත ධර්මයෝ ද තම ඇස් පනාපිට දැක ගත හැක්කේය. මෙලෙස දැනගත් විට පොත්වල දක්වා ඇති පඨවි, සිත, ඵසස ආදිය මේ මේ ස්වභාවයෝ යැයිද, මේ ස්වභාවයෝම යැයිද, ධර්ම දේශකයාණන් වහන්සේලා දේශනා කරන පඨවි, සිත, ඵස්සය ආදිය මේ ස්වභාවයෝම යැයිද වශයෙන් සූතය සමඟ සම්බන්ධකොට ඇති සැටියෙන් දැන ගන්නේය. උපමාවක් ලෙස මිදි ඵල නොදන්නා පුද්ගලයෙකුට අනුන් කීදෙයක් ඇසීමෙන්ම මිදි ඵල රසය ඇති සැටියෙන් වටහා ගැනීමට නොහැක්කේය. තමා වශයෙන් වැළඳීමෙන්ම අනුන් කී ලෙසට මිදි ඵල රස මෙසේ යැයි ඇස් පනාපිට තත්වාකාරයෙන් දැන ගන්නාසේය. මෙහිලා ලෝකුත්තර ධර්මයන් වනාහි ඉතා ගම්භීර නිසා පෘථග්ජනයාට දැන ගත නොහැක්කේය. ලෞකික ධර්මයන් ඇතිතාක් සියල්ලම වනාහි කාට නමුත් දැනගත හැක්කේ යැයි සළකා ගනී. නමුත් මෙලෙස නොසැළකිය යුතු බව වටහා දීමට මෙම මිදි ඵල රස උපමාව දැක්වීය. ප්‍රතිසන්ධියේ පටන් අඩා වූ තැනැත්තා වර්ණ සම්බන්ධයෙන් තත්වාකාරය නොදන්නා බව කලින් දැක්විය.

මෙලෙස ඇස් පනාපිට නොදන්නා තැනැත්තාට රූප- නාමයන්හි ස්වභාව ලක්‍ෂණයන් තත්ත්වාකාරයෙන් වටහා දීම හුවා දැක්වීමෙන් හෝ දේශනා කිරීම මගින් සිදුනොවන බව දැක්වීමට අනු ටීකාචාර්‍යයින් වහන්සේලා **"ධම්මානං අනිද්දිසිතබ්බ සභාවො"** යි දක්වයි. රූප-නාමයන්ගේ නියම ස්වභාව ලක්‍ෂණයන් ගෙනහැර දැක්වීමක් කළ නොහැක්කේය. දැක්වුවත් දැනගත නොහැකි වන අතර ඇස් පනාපිට දැකීමෙන්ම තත්ත්වාකාරය දැන ගත හැක්කේය. එලෙස දතයුතු ස්වභාවය නියම පරමාර්ථ ධර්ම යැයි කියනු ලැබේ. මෙය අවබොධ කර ගැනීමට දුෂ්කරය, ගාම්භීරය, එනිසා නැවත නැවතත් සළකා බැලිය යුතුවේ.

යට දැක්වූ **"පරමො උත්තමො අවිපරීතො අත්ථො"** යන්න ටීකා පෝ හි දැක්වෙන වචනාර්ථයෝය. මේ කථා වස්තු පාළි-අට්ඨ කථා-ටීකාවල දැක්වෙන වචනාර්ථයන්ට සමානය.

දක්වන ආකාරය

"පරමො" පදය **"උත්තමො"** යැයි දැක්වීම වනාහි ව්‍යාකරණාර්ථ වශයෙන් සමාන කොට දැක්වීමකි. **"උත්තමට්ඨෙනා"** යන අට්ඨ කථා දැක්වීමට සමානය. **අවිපරීතො** යැයි දැක්වීම වනාහි **"අවිපරීත භාවතො එව පරමො පධානො අත්ථො"** යන අනුටීකා දැක්වීමට කෙළින්ම සමානය. ගැළපේ. **"පරමො"** යන පදය හා අභිධෙය්‍යාර්ථ වශයෙන් සමාන බැවින් ද මෙසේ දක්වන බව සිතට ගත යුතුය. සමාන වන අකාරය වනාහිඃ **සච්චිකට්ඨ** පදය හා **පරමත්ථ** පදය ව්‍යාකරණානුකූලව පමණක් බෙදේ. වෙනස් වේ. අභිධෙය්‍යාර්ථ දේශනා වශයෙන් වනාහි සමාන අර්ථ වේ. මේ පද දෙකම ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය යන 57ක් වූ ධර්මයන්ම විස්තර කරයි. මේවා **සච්චික + අත්ථ, පරම+ අත්ථ** යැයි බෙදා බැලුවහොත් අර්ථ වශයෙන් පද සමාන බැවින් විශේෂයෙන් විස්තර කළ යුත්තක් නැත. **"සච්චික"** හා **"පරම"** යන පද දෙක අභිධෙය්‍ය වශයෙන් සමාන බව දැක්වීම පමණක් වැදගත් කාරණය වේ. සත්‍යයෙ ධර්මයන් යනු ද 57 ක් වූ ධර්මයෝමය. පරම යන උතුම් ධර්මයෝ යනු ද 57 ක් වූ ධර්මයෝමය. එම නිසා ප්‍රධාන වශයෙන් එම පද දෙක සමාන වේ.

මෙලෙස කිවයුතු (අභිධෙය්‍ය) අර්ථ වශයෙන් සමාන නිස **"පරමො"** පදය **"සච්චිකො"** යැයි ද දැක්විය හැක්කේය. **"සච්ච මෙව සච්චිකං"** යන අනුටීකා අදහසට අනුව **සච්චික** පදය හා **සච්ච** පදය අර්ථ වශයෙන් සමාන නිසා

සච්චා යන ලෙසට ද දක්විය හැක්කේය. තව දුරටත් සත්‍යය යන අර්ථය දේශනා කරන නිසා **සච්චික-සච්ච** පද දෙකම අර්ථය අතින් **සමානභූත, යථාභූතත්ථ, තච්ඡ, අවිතථ, අවිපරිත** ආදී කොට ඇති පද මාර්ගයෙන්ද දක්විය හැක්කේමය. එම නිසා **සච්චික** ශබ්දය හා අර්ථය අතින් සමාන **අවිපරිත** ශබ්දය යෙදීමෙන් **පරමො** පද අර්ථයම වක්‍රව ටීකා ආචාර්යයන් වහන්සේ දක්විය.

පරමත්ථ පදයේ නියම අර්ථය

දක්වන ලද අටුවා කථා, ටීකා යන සියල්ල සම්පිණ්ඩනය කළහොත් පරමත්ථ යන පදයේ අර්ථය මෙසේ දතයුතුය. වර්තමාන වශයෙන් දතයුතු චිත්ත-චෛතසික-රූප-නිබ්බාන යන අර්ථ සතර අවිපරිතව, ඇති සැටියෙන්, සත්‍යය බැවින් පරම ස්වභාවය නම් වේ. **පරමත්ථ** නම් වේ. අර්ථය මෙසේ නිරවුල්ව තම සිතේ තහවුරුව නිදන් කොට ගතයුතුය.

මෙම **පරමත්ථ** පදය කියන තැන "*පරමත්ථ* යන්නෙහි අවිපරිත-නොපෙරලෙන- විනාශ නොවන අදහස ඇති බවත්, *පඤ්ඤත්ති* යන්නෙහි විපරිත-පෙරලෙන-විනාශවන-අදහස ඇති බවත් ඇත්තේය" යන්න පදනම් කොට, *පරමාර්ථයන්* වනාහි ලක්ඛණ වශයෙන් අවිපරිත යැයි ද, ආනිශංස වශයෙන් ද අවිපරිත යැයි ද, රූපයන් "**රුප්පතීති රූපං**" යන කියමනට අනුව විපරිත වන බව දක්වුව ද ලක්ෂණ වශයෙන් අවිපරිත යැයි ද ආදී ක්‍රමයන්ට බොහෝ ආචාර්යයන් විවිධ මත හා කල්පනා පහළ කරමින් දක්වා ඇත. ලියා ඇත. මෙසේ දක්වීම් හා ලිවීම් කථා වනුයේ අටුවා කථා හා ටීකාවන් සමඟ නොගැළපෙන බව දැක්වීම යුතුය. "**අවිපරිත**" පදය හා "**අවිපරිණත**" පදයෙහි අර්ථ සමාන වන ආකාරය පිළිබඳව සැළකිලිමත් නොවූ නිසාත්, අවිපරිත වචනයේ අර්ථය (බුරුම භාෂාවට අනුව) සාවද්‍ය යන අර්ථය ද දෙන බව නොසැළකීම නිසාත් මහා ටීකා හි අදහස වටහා ගැනීමට අපොහොසත් වීම අනුව තමාට හිතෙන ලෙසට කල්පනා කොට සුදුසු යැයි ලියා දක්වූ අදහස්ම යැයි මේවා සළකා ගත යුතුය.

තවදුරටත් ටිකක් විස්තර කළහොත්. **විපරිත** යන (බුරුම) වචනයට "වෙනස්වන, විනාශ වන" යන අදහසද "වැරදි ලෙස වටහාගත් " යන අදහස දැයි අර්ථ දෙකක් ඇත. එලෙසටම **අවිපරිත** යන වචනයේද " නොවෙනස් වන. විනාශ නොවන" යන අර්ථයද "නිවැරදි - සත්‍යය

ලෙස වටහා ගත්" යන අර්ථය ද යන අර්ථ දෙකක් දෙයි. *සම්මා සම්බුද්ධො* පදයද (බුරුම බසින්) කියවා බලන්න. **සම්මා** = අවිපරිත, **සං** = ස්වකීයව-ප්‍රත්‍යක්‍ෂ වශයෙන් **බුද්ධො** = දන්නා තැනැත්තා **සම්මා සම්බුද්ධො** = අවිපරිත ලෙස ප්‍රත්‍යක්‍ෂ ලෙස දන්නා තැනැත්තා යන ලෙසටම සවිස්තර ලෙස බැලුව හොත්, අවිපරිත ලෙස දන්නා වූ තැනැත්තා හෙවත් ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දන්නා තැනැත්තා යන අර්ථ දෙයි. නමුදු අවිපරිත ලෙස දන්නා යැයි කී කළ කුමක් කියවෙයිද? ආචාර්‍ය්‍යවරයකුගෙන් දැන උගෙන නොව තමාම දන්නා නමුදු වැරැද්දක් දැනගත්තා නොවේ. නිවැරදිව, තත්ත්වාකාරයෙන්ම දැනගන්නා යන්න සත්‍යය නොවන්නේද?. එම නිසා මෙහිලා පාළි භාෂාවෙහි **අවිපරිත** යන්න නිවැරදිව = වැරදි නැතිව යැයි දත යුතුවේ.

විපරිත=වරදවා ගත්, විපර්‍ය්‍යාස වූ, මුල් තිබූ තත්ත්වයෙන් විකෘති වන්නා වූ යැයි මෙලෙස අර්ථයන්හි සම-විසම බව වේ. මෙම පද දෙකෙහි විරුද්ධ අර් වන **අවිපරිණත, අවිපරිත** යන දෙපදයන් **අවිපරිත** යන එකම පදයෙන් බුරුම බසට පෙරළේ. නමුදු අර්ථය වශයෙන් නම්:

අවිපරිණත = වෙනස් නොවන, නොපෙරෙලෙන, මූලික ස්වභාවයෙන්ම දිගට පවතින

අවිපරිත - වෙනස් නොවන, වරද්දා නොගත් විපරිත නොවන, මූල තිබූ හැටියටම ඇති, අන්‍යාකාර නොවේ යන්නය.

මෙලෙස සම-විසම වෙත්. එම නිසා ටීකා ජෝ හි දැක්වෙන **අවිපරිත-** වෙනස් නොවන, විපරිත නොවන (ඇති සැටියටම) යන මෙම නිවැරදි අර්ථය හොඳින් සිතට ගන්න. සිත තබා ගන්න.

මෙ පමණකින් සතුටට පත් නොවේ නම් සංඥා විපල්ලාස ආදී, පදයන්ගේ අර්ථය ද ටීකා ජෝ හි සමුච්චය පදයේ **"සම්මා අවිපරිතතො පසසතීති සම්මා දිට්ඨි"** යයි කියන තැන **සම්මා** පදය **අවිපරිතතො** යි අර්ථ දැක්වීමද, අට්ඨ කථා-ටීකා ස්ථාන බොහොමයක මේ **විපරිත** පදය භාවිතා කිරිමද සැළකිල්ලට ගන්න. දැක්වූ ආචාර්‍ය්‍ය මතයන්ට අනුව "ප්‍රඥප්තියම වෙනස් වන, පෙරෙලෙන, විනාශ වන බව" යන කථාව ද සම්පූර්ණයෙන් වැරදි කථාවකි. මක් නිසාද යත් ප්‍රඥප්ති කියන තැන උප්පාද, ඨිති, භංගයෝද නැත. ඇත්ත වශයෙන්ම ප්‍රකටව නොමැති අතර එම නිසාම එහි

නොපෙරළෙන විනාශ නොවන තත්ත්වයක් නොපැනේ. තව දුරටත් පැහැදිළි කරන්නේ නම්, ඇති තාක් නාම ප්‍රඥප්ති, අර්ථ ප්‍රඥප්ති, වල පහළ වීමක් නැත. පැවැත්මක් ඇත්තේද නැත. නැති වෙන්නේද නැත. ඇත්තටම, නිසැකවම හුදු අරමුණක්ම වන්නේය. මනුෂ්‍යයකුගේ නම ගැන සිතන්න. එම නම කොයි අවස්ථාවේ පහළ වේද? හිසෙහි පිහිටා සිටීද, ශරීරයේ පිහිටා සිටීද කුමන ස්ථානයක පිහිටා කොයි අවස්ථාවේ අභාවයට ගියේද?. සත්‍යය නම් එම නම ඇති වුයේද නැත. කොයි තැනැකවත් පිහිටා සිටිනවා ද නොවේ. අභාවයට පත්වන්නේ ද නොවේ. සිතින් විමසා බලන- කල්පනා කරන- සිතේ පහළ වන අරමුණක් පමණක් නොවන්නේද?. මනුෂ්‍යයන් සියලු දෙනාම සිතට නොගනී නම්, අමතක කරන්නේ නම්, එම නම අභාවයට ගියා සේ වන්නේය. නමුදු විනාශ වී ගියා නොවේ. එම නිසාම සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර පැවති සුමේද තාපස යන නම අද තාක් මනුෂ්‍යයන්ගේ සිත්වල ප්‍රකටව රැඳී පවතී. මෙලෙස ස්ත්‍රී, පුරුෂ, වළඳ, සරම ආදී නාම ප්‍රඥප්ති ඇති තාක්ද මනුෂ්‍ය නාම හා සමානම වෙත්.

ස්ත්‍රී, පුරුෂ, වළඳ, සරම ආදී වශයෙන් ව්‍යවහාර කරන පුද්ගල ප්‍රඥප්ති සණ්ඨාන ප්‍රඥප්තින්ට ද, මනුෂ්‍ය නම් මෙන් උත්පාදයත්, ඨිතියත්, භංගයත් නොමැත්තේය. ඇත්ත වශයෙන්ම කොතැනකවත් ප්‍රකටව නොමැත්තේය. නමුදු දකින වර්ණ රූප සියල්ල, අසන ශබ්ද රූප සියල්ල, දැනෙන පොට්ඨබ්බ රූප ආදි සියල්ලද සළකා ස්ත්‍රී, පුරුෂ, ආදී ව්‍යවහාර කරන ද්‍රව්‍ය වස්තු මෙන් ඇත්තටම පවතින්නා සේ පැනේ. දකින සිත්. අහන සිත්, ස්පර්ෂ කරන සිත් ආදියෙන් ඒ ඒ සණ්ඨාන පහළ වනු පිණිස කල්පනා කරන පසු සිත් වෙන් කොට ගත නොහැකි නිසා එලෙස ප්‍රකටව පැනෙන ආකාරය පෙර දක්වන ලදි. නමුත් ඒවා එසේ ප්‍රකට නොමැති බවද සංක්ෂේපයෙන් පෙරද දක්වීය. මෙහිලා උපමාවක් දක්වන්නෙමි.

කරත්තය කියන වස්තුව තුළ ඇති රෝද, අලවංගු දණ්ඩ, බෝං ලීය, විය දණ්ඩ, ඇතිරිල්ල, ගරාදි යනාදී කොටස් ගලවා දමුව හොත් කරත්තය යැයි කිව හැකි වස්තුවක් කැළම නොමැත්තේය. එසේම ස්ත්‍රී පුරුෂ ආදී වශයෙන් ව්‍යවහාර කරන රූප- නාම සන්තතියෙන් එම රූප- නාම, සියල්ල ඉවත් කළ හොත් ස්ත්‍රී- පුරුෂ- පුද්ගල ප්‍රඥප්තිය හා සණ්ඨාන

ප්‍රඥප්තීන් කැළම දැකිය නොහැක්කේය. කොතැනක ඇත්තේදැයි කිව නොහැක්කේය. එලෙසමැ වේ පාරක්, වැලි පාරක්, කොහු ලනුවක්, දිය පාරක්, ගසක් ආදී උපමාවන්ද සමග ගළපා සළකා බැලිය යුතුය

වේ පාරක් යැයි පැනෙන තැන වේයන් රාශියක් පමණක් ඇත්තේය. පාරක්, වැලක් වශයෙන් සටහනක් නොමැත්තේය. වේයන් සියල්ල ඉවත් කළ හොත් පාර, වැල දැක ගත නොහැක්කේය. එලෙසටම රූප- නාම රාශි, සන්තති පමණක්ම ඇත්තාහ. පුද්ගලයා යැයි නිත්‍ය රූප සන්ධානයක් නම් නොමැත්තේය. ඇතිතාක් රූප- නාම ඉවත් කළ හොත් ඒ ඒ සණ්ඨානයන් දැකිය නොහැකි බැවිනි. පසුව දක්වන උපමා අනුවද ගැළපෙනසේ සසඳා බලන්න.

වැලි මල්ලක් උඩින් එල්ලා එහි යටි පැත්තේ සිදුරක් කළහොත් වැලි ධාරාවක් වැටෙන සැටි දැකගත හැක්කේය. වැලි මල්ල නැගෙනහිරට ඇද්දහොත් වැලි ධාරාව නැගෙනහිරට ඇදී යයි. නමුත් වැලි ධාරාවක් ඇත්ත වශයෙන් නොපෙනේ. වැලි ඇට පමණක් පවතින්නේය. වැලි ධාරාව නැගෙනහිරට ඇදී ගියා නොවේ. වැලිමල්ල, නැගෙන හිරට යමින්, යමින් වැලි කැට වැටුනා පමණි. එම වැලි අවසන්වීමෙන් හෝ මල්ලේ සිදුර වසා දැමීමෙන් හෝ වැලි ධාරාව නොපැනී ගියාද එම වැලි ධාරාව විනාශ වී යැයි නැතිව ගියා යැයි නොකිය හැක්කේය. මක්නිසාදයත් පෙළට වැටෙන වැලි ඇට මිස පැවතියා වූ වැලි ධාරාවක් වෙනමම නොතිබුන නිසාය. ඇත්ත වශයෙන් නම්, මෙම වැලි ධාරාව නැතිවී යාම වනාහි අලුතින් වැලි ඇට නොවැටීමම වන්නේය. මේ උපමාවට අනුව රූප- නාම රාශි හැර පුද්ගල ආදීන් වෙනමම, වෙන්- වෙන්ව නොපවතින බවත්, වෙනස් වෙමින් වෙනස් වෙමින් අලුතින්- අලුතින් පහළ වන රූපයන් හැර, චලනය වන අත- පය ආදියක් වෙනමම නැති බවත් රූප- නාමයන් අලුතින් පහළ වීමේ නතර වීමක් හැර, මිය යා හැකි පුද්ගලයන් වෙනමම නැති බවත් විමසුම් නුවණ යොදා බලන්න.

කොහු ලණුවක් යැයි කියන තැන කොහු කෙඳි පමණක්ම ඇත්තේය. ලණු සටහනක් වෙනම නොමැත්තේය. ලණුව කෙඳි වශයෙන් ලිහා දැමුව හොත් එම ලණු සටහන නොලද හැක්කේය. නමුදු ගොණු වූ කෙඳි මිටිය ගෙන අගලක් දෙකක් මහත ප්‍රමාණ ලණුවක් ඇතැයි භාර ගනි. බඹ දහයක්, රියන් දහයක් දිග යැයි ආදී ලෙසට භාරගනී. ඇත්ත නම් ඉතා සියුම්, කෙටි කොහු කෙඳි පමණක් ඇත්තේය. මෙපමණක් මහත මෙපමණ

දිග ලණු සටහනක් වෙනම නොමැත්තේය. මේ උපමාව මගින්ද සාරයක් නොමැති රූප -නාමයන් හමුවූ පැයක්, දිනයක්, මාසයක්, වසරක් වශයෙන් කල් පවතින වයස්ගත පුද්ගලයෙක් නොමැති බවද සංසන්දනාත්මකව වටහා ගන්න.

ගඟෙහි යම් ප්‍රමාණයක තිබුණ ජලය පහළට ගලා යයි. එම ස්ථානයට අලුතින් අලුතින් ජලය එමින් පවතී. එම නිසා එම ගඟ දිය ප්‍රවාහය සදාකාලිකව පවතින්නාක් මෙන් පෙනේ. නමුදු යම් එක තැනකට අවධානය යොමු කොට බැලුවහොත් ප්‍රථමයෙන් දකිනලද ගඟ දිය එකකි. දෙවනුව දකින දිය වෙන එකකි. එලෙසටම වෙන වෙනම පෙනේ. මේ උපමාවට අනුව "එක් ස්ත්‍රියක්ම, පුරුෂයෙක්ම සැමකල්හි දකිමින් සිටි, සැම කල්හි ඇසුරු කරමින් සිටින්නේයැයි" හැඟෙන සන්තති ප්‍රඥප්තිය ප්‍රකට ලෙස ඇත්තටම නොමැති බව නුවණින් සළකා බලන්න.

ගසේ උපමාවෙහි කඳ, මහ අතු, කුඩා අතු ඉති, පත්‍ර ආදිය වෙන වෙනම පැනේ. මහා ගසක සටහණක් වෙනම නොමැත්තේය. එසේම කඳ ආදිය, වෙන් කළහොත් ගසක සටහණක් වෙනමම දැක ගත නොහැක්කේය. තව දුරටත් සදා හරිත ගස් වල අලුත් කොළ පරණ කොළ මාරුවීම අප්‍රකට ය, අලුත් කොළ පහළවීමක් ක්‍රමයෙන් පරණ වීමක් සැම කල්හි සිදුවේ. එවැනි ගස්වල හරිත වර්ණ පත්‍ර සැමදා පවතින ලෙස පෙනේ. නමුත් පැරණි කොළ හැලීයාම ද අලුත් දළු දැමීම ද සළකා බලා එම හරිත පත්‍ර රාශිය සැමදා එලෙස පැවතීමත් නොමැති බව දැනගතහැක. මේ උපමාව මගින් සමූහ, සණ්ඨාන, සන්තති යන ප්‍රඥප්තීන් නිසැකවම නොමැති බව සළකා බලා වටහාගන්න.

දක්වන ලද විවිධ උපමාවන් මඟින් නැවත නැවතත් ගළපමින් සළකා බලන්නේ නම් "ස්ත්‍රී- පුරුෂ ආදී ද්‍රව්‍ය රූප ප්‍රඥප්තීන් ද පුද්ගල නම් මෙන්ම පහළ වන කාලයකුදු නැති, නැතිවීමකුදු නැති, කොයි තැන හෝ ප්‍රකටවම වෙනමම පැවතීමක් ද නැති බවත්, කල්පනා වෙන සිතේ පැන නගින හුදු අරමුණක්ම වන බවත් " කාටත් හොඳට වැටහී යනු ඇත. එම නිසා ප්‍රඥප්ති යන්න "විපරිත භාවයට පත්වීමකුදු නැති ප්‍රකටව නොපැනෙන බවම ඇති" දෙයක් යැයි හොඳට සිතට ගතයුතු වේ.

සාරය කෙටියෙන්:- නියම රූප- නාම ආදි වන්නා වූ පරමාර්ථ ධර්මයන් අතුරින් නිවන වනාහි අසංඛත පරමාර්ථය වේ. කිසියම් හේතු ධර්මයකින්

පහළ නොකරන, පහළ කළ නොහැකි ධර්මයක් යැයි මෙයින් අදහස් කරනු ලැබේ. එම නිසාම ඇතිවීම්-නැති වීම් දෙකෙන් තොර සදාකාලික ස්ථිර, නිච්ච, ධුව, ධර්මයක්ම වේ. ඉතිරි පරමාර්ථ ධර්මයන් සියල්ල සංඛත පරමාර්ථයෝය. අදාළ හේතු ධර්මයන්ගෙන් ඇති කරන පහළ කරවන ධර්මයන් යැයි කියනු ලැබේ. එම නිසාම ඇත්තටම ඇතිවන-නැතිවන බව ඇති නිසා අනිච්ච ධර්ම, අධුව ධර්මයන් ම වෙත්. එම සංඛත පරමාර්ථයන් *අජ්ඣත්තික-බහිද්ධා* සන්තාන දෙකෙහිම *උප්පාද, ඨිති, භංග* වශයෙන් ඇත්තටම පහළ වූනා ද වන්නේය. පහළ වෙමින් ද පවතින්නේය. අනාගතයේ පහළ වීමද වන්නේය. එම නිසා 'සන්තාන දෙකක් හි ඇත්තටම පහළ වූද, පහළ වෙමින් පවතින්නා වූද, මත්තට පහළ වන්නා වූද, යන ගණයට ද නොවැටෙන, තිවන ද නොවන, සිතේම පහළ වන අරමුණු සියල්ලම ප්‍රඥප්ති ධර්මයන්ම වන්නාහ. විවිධ මනුෂයන්ට ආමන්ත්‍රණය කරන, නම් කරන, ප්‍රඥප්ති- *නාම ප්‍රඥප්ති* නම් වේ. එම නම් මගින් දැනගන්නා විවිධ ද්‍රව්‍යයන්, වස්තූන් *අතත පඤ්ඤත්ති* නම් වේ.

පැහැදිලි කිරීමක්

රූපාරම්මණ යන පාළි නම ව්‍යවහාර සිංහලයෙහි රූප අරමුණු ලෙස ගැනේ. ඇතිතාක් එම රූප අරමුණු වනාහි සිතන කල්පනා කරන සිතුවිලි වලට ප්‍රකට වන අරමුණු වෙත්. අජ්ඣත්තික සහ බහිද්ධා සන්තානයන්හි පහළ වූයේ ද නොවේ. පහළ වෙමින් පවතින්නේ ද නොවේ. මතු පහළ වන්නේ ද නොවේ. තවදුරටත් කොයිම ස්ථානයකවත් ප්‍රකටවම පිහිටා සිටින්නේදැයි ඇස් පනාපිට දැක නොහැක්කේය. එම නිසා නාම ප්‍රඥප්ති නම් වේ. පරමාර්ථ නොවේ.

එම නාම ප්‍රඥප්තීන් මගින් දැක්වෙන, ගම්‍යවන වස්තූන්හි වනාහි ඇසින් දැක ගත හැකි ස්වභාවය ඇත්තේය. එම ස්වභාවයම දකිමින් පවතින කාලය, දැක විපස්සනා භාවනා කරන කාලය, දුටුදේ නැවත සිහියට නඟින කාලය, කල්පනා කරන කාලය යන කාලයන් ඇස් පනාපිට දත හැක්කේය. මෙලෙස ඇස් පනාපිට දැකිය හැකි එම රූප නියම පරමාර්ථ ධර්මයෝය. මෙලෙස ඇත්තටම නොදැක්කා වූ දැක අරමුණු නොකළා වූ, හුදෙක් මනඃ කල්පිත වූ සිතීම් මාත්‍රයක් වූ වර්ණ-රූප වනාහි නාම ප්‍රඥප්ති, ආකාර ප්‍රඥප්ති, සණ්ඨාන ප්‍රඥප්ති, යන ප්‍රඥප්තීන් අතරින් එක ප්‍රඥප්තියක්ම වේ. ශුද්ධ පරමාර්ථ නොවන්නාහ. මක්නිසාද යත්, එවැනි අරමුණු *අජ්ඣත්ත-*

බහිද්ධා යන සන්තාන දෙකේහි ඇත්තටම සිදුවූ, සිදුවෙමින් පවතින, සිදුවිය හැකි දේවල් නොවේ, " කොතැනක ප්‍රකටව පවතින්නේ දැයි" ඇස් පනාපිට දත නොහැකිය. උපමාවක් ලෙස, හොල්මන් වලට බිය පුද්ගලයෙකු ඇත්තටම එවන්නක් නැති නමුදු ආසන්නයේ ලඟ පාත බියජනක හොල්මනක් ඇති සේ හඟී. නින්දේදී සිහින දකින්නාට කිසිදාක හමු නොවුන අරමුණක්, ඇත්තටම ඇත්තා සේ පෙනී යා හැක්කේය. නමුදු එවැනි පුද්ගලයන්ට ප්‍රකට වූ එම අරමුණු ඇත්තටම නොමැති වූ, මනඃ කල්පිත දේවල්ම වන්නාහ. මනස්කාර පමණක් වන්නේය. එම නිසා මෙසේ සිතෙන්ම නිර්මානයවී පහළ වන සියලු අරමුණු ප්‍රඥප්ති කොටසට ලා සළකා ගත යුතුවේ.

චක්ඛු ප්‍රසාද නම් වූ ඇසේ ඔපය- චක්ඛු විඤ්ඤාණය- දැකීම, සද්ද ආරම්මණය- සද්දය- සෝත ප්‍රසාදය නම් වූ කනේ ඔපය- සෝත විඤ්ඤාණය- ඇසීම යනාදී ඇතිතාක් නම් ද ප්‍රඥප්තීන් ය. ඇස් පනාපිට දතයුතු ස්වභාවය සියල්ලම **නිබ්බත්තිත පරමත්ථ** හෙවත් නියම පරමාර්ථයන්ය. සිතෙහි පහළ වූ දේවල් සියල්ලම යම් ආකාරයක ප්‍රඥප්තියක් යැයි සළකා ගන්න. යෑම, සිටීම, හිඳීම, හෙවීම, නැවීම, දිගහැරීම, යනාදී ඉරියව්- ක්‍රියා වල නම් ද ප්‍රඥප්තීන්ම වන්නාහ. එම නම් මගින් යෑමට කැමති සිත, හා එම සිත් නිසා පහළ වන්නා වූ රූපයන් දක්වන බැවින් **විජ්ජමාන පඤ්ඤත්ති, තජ්ජා පඤ්ඤත්ති** නම් වේ. මෙහිලා ධාතුවත්ථ ක්‍රියා යන න්‍යායනයට අනුව චිත්ත චෛතසික, රූප ධර්ම පමණක් ගැනෙන බව ඥාණවන්තයන් විසින් සළකා ගනිත්වා. නමුදු එම ප්‍රඥප්තීන් මාර්ගයන් දත යුතු අර්ථය වනාහි සාමාන්‍ය පුද්ගලයන් දැනගන්නා අර්ථය හා විපස්සනා යෝගාවචරයන් විසින් දතයුතු අර්ථය ද වශයෙන් දෙකකට බෙදේ.

සාමාන්‍ය පුද්ගලයන් දැනගන්නා ආකාරය

සාමාන්‍ය පුද්ගලයා "මම යමි, මම සිටිමි, මම හිඳිමි, මම හොවිමි, මම නැවෙමි, අත- පය නවමි"යි යන ලෙසට විඳින මමෙක් , අත්- පා වල රූ සටහන්ද සහිතව දැනගන්නේය. මෙලෙස දැනගන්නා අර්ථය වනාහි හුදු පුද්ගල ප්‍රඥප්ති, සණ්ඨාන ප්‍රඥප්තීන්ම වෙත්. පරමාර්ථ නොවේ. මක්නිසාද යත් යෑමට කැමති සිත හා යන රූප ආදියත් හැර, මමෙක්, රූ සටහනක් වශයෙන් වෙන් වෙන්ව නොපැණෙන බැවින් විපස්සනා ඥාණ ආදියෙන්

ඇස් පනා පිට නොදැකිය හැක්කේය. මේ වනාහි නිසැක නොවන්නාවූද, ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදත හැකි ධර්මයක් වන බැවිනි. මෙහිලා **විජ්ජමාන පඤ්ඤත්ති, තජ්ජා පඤ්ඤත්ති** මඟින් දත යුතු වූ අර්ථයම පරමාර්ථ වන්නේ නම් කුමක් නිසා ප්‍රඥප්ති නම් වන්නේද යත්: ඒවායේ දැනීම යන්න මනසිකාර ශක්ති ප්‍රමාණය අනුව සිදුවන නිසාය. රූප- වේදනා- පඨවි ආදී විද්‍යමාන ප්‍රඥප්තීන් බුදුරජාණන් වහන්සේ පහළ වීමට කලින්ද ව්‍යවහාරයේ පැවතින. එම කාලයේ එම ප්‍රඥප්තීන් මඟින් සියුම් වූ පරමාර්ථයන් දත හැකි වූවා නොවේ. වැඩි වශයෙන් සණ්ඨාන ප්‍රඥප්තීන් පමණක් දත හැකි විය. අද කාලයේද බෞද්ධ ඥාණවන්තයන් එම ප්‍රඥප්තීන් මඟින් තම මනසිකාර ශක්තියේ හැටියට සණ්ඨාන ප්‍රඥප්තීන් ආදිය පමණක්ම දැනගන්නාහ. එම නිසා "විද්‍යමාන ප්‍රඥප්ති මඟින් පරමාර්ථ පමණක්ම දැන ගත හැක්කේ" යැයි ඒකාන්ත කොට දැක්විය යුතු නොවේ.

විපස්සනා යෝගීන් දැනගන්නා ආකාරය

පහළ වන මොහොතේහිම රූප-නාමයන් අඛණ්ඩව මෙනෙහි කරන යෝගී තෙම ඥාණය මුහුකුරා ගිය විට යාමට කැමති සිත, (චේතනාව) ද දැනගනී. එම සිත නිසා පියවරෙන් පියවර අතරක් නැර වෙනස් වන රූපයන්ද දැන ගනී. පෙර පෙර වෙනස් වීම් පසු පසු වෙනස් වීම් තෙක් නොඑළඹ බිඳි බිඳි සන්තතියක් ලෙස යන අයුරු දැන ගනී. එම නිසා "මම යමි" යන්න කථා ව්‍යවහාර මාත්‍රයක් පමණි. යන්නාවූ 'මමෙක' නොමැත්තේය. යෑමට කැමති සිත හා වෙනස් වන රූප සන්තතිය පමනක් ඇත්තේ යැයි" ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් විනිවිඳ දැනගනී. නවතින විට නැවතීමට කැමැති සිත දැනගනී. මෙහොතකින් අනෙක් මොහොතකට නොයන එම රූප බිඳී බිඳී යන ආකාරයද දැනගනී. එම නිසා 'මම නවතිමි' යන කථාව හුදු ව්‍යවහාර මාත්‍රයක් පමණි. නවතින 'මමෙක්' නොමැත්තේය. නතර වීමට කැමැත්ත හා නරතවී සිටින ඉරියව්ව යන සන්තති ස්වභාවයක් පවතී" යයි ස්වකීය ඥාණයෙන් නිසැකව දැන ගනී. නවන විට නැවීම කැමති සිතද දැනගනී. එම සිත නිසා ඇතුළට පියවරෙන් පියවර නැවී එන අකාරය විනිවිඳ දැනගනී. පියවරකින් තව පියවරකට නොපැමිණ බිඳී බිඳී යන බව දැනගනී. එම නිසා 'අත නැවීම, පා නැවීම, මගේ නැවීම' යන කථාව ව්‍යවහාර මාත්‍ර පමණි. නැවිය හැකි අතක්, පයක්, මමෙක් නොමැත්තේය. නැවීමේ කැමැත්ත හා නැවීම වනාහි පියවරෙන් පියවරට සම්බන්ධ වන සන්තතියක් පමණකි..." යැයි ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් තහවුරු ලෙස දැනගැනීම වන්නේය.

හිඳගන්නා අවස්ථාවේදීද, හොවින, දිග හරින අවස්ථාවන්හිදීද දැනගන්නා ආකාරය ද පෙර දැක්වූ ආකාරයටම යැයි වටහා ගනිත්වා. **මෙලෙස දත යුතු අර්ථය වනාහි නියම රූප- නියම නාම- *නිබ්බත්තිත පරමත්ථ* නියම පරමාර්ථයෝම වන්නාහ. මක්නිසාද යත් *පච්චක්ඛ විපස්සනා ඤාණය* මගින් මේවා ඇති සැටියෙන් ඇස් පනා පිට දතයුතු අර්ථ ස්වභාවයෝම වන බැවින්ය. මෙය වනාහි *තජ්ජා පඤ්ඤත්ති* යන තැන පරමාර්ථ හා ප්‍රඥප්ති බෙදා දක්වන ආකාරයයි.**

ඉත්ථි, පුරුෂ, හත්ථ, පාද, ඝට, පට යනාදී පාළි නාමයන්ද, ස්ත්‍රී, පුරුෂ, අත් පා, කලය, සරම යන සිංහල නම් ද, යන මේ සියල්ල හුදු නාම ප්‍රඥප්තීන්ම වෙත්. ඇත්ත වශයෙන්ම නොපවත්නා වූ ප්‍රකට නැති, ස්ත්‍රී ආදී වූ සණ්ඨාන ආදියම හුවා දක්වන බැවින් *අවිජ්ජමාන පඤ්ඤත්ති* නම් වේ. මෙම ප්‍රඥප්ති මගින් දතයුතු ස්ත්‍රිය- පුරුෂයා යන සවිඤ්ඤාණ දේවල් අත්, පා, කළ, රෙදි යන ද්‍රව්‍යය සටහන් යනාදිය ද ප්‍රත්‍යක්ෂ කළ නොහැකි ධර්මයෝම වන්නාහ. නොදත හැකි අර්ථයෝය. එම නිසා *අත්ථ පඤ්ඤත්ති* ස්වභාවයෝම වේ. ඇස්පනා පිට ප්‍රත්‍යක්ෂ කළ නොහැකි ධර්මයෝම වන්නාහ. නොදැකිය හැකි අර්ථයෝය. එසේ වන්නේ ස්ත්‍රිය, පුරුෂයා, ආදි ලෙස හඟින එම වස්තූන් නියම රූප- නාමයන්ගේම රාශියක්- ඝනයක් වන නිසාය. එම රූප නාමයන් විනිවිද දක්නා අවස්ථාවේදී එහි වර්ණ-රූපයම දැක ප්‍රත්‍යක්ෂ කළ හැක්කේය. ස්ත්‍රිය, පුරුෂයා ආදිය, ඇස් පනාපිට දැකිය නොහැක්කේය. එසේම අසන අවස්ථා ආදියේදී ශබ්ද රූපය පමණක් අසා, ගන්ධ රූපය පමණක් ආඝ්‍රාණය කොට, රස රූපය පමණක් විඳ, ඇස් පනා පිට ප්‍රත්‍යක්ෂව දත හැක්කේය. හැපෙන අවස්ථාවේහි කර්කශ වූ හෝ මෘදු වූ පඨවි රූපය, උණුසුම්- සිසිල් බව නම් වූ තේජෝ රූපය, තදවන- චලනය වන වායෝ ධාතු රූපය යන මේවා පමණක් පහස ලැබ ඇස් පනාපිට දැන ගත හැක්කේය. මෙලෙස දැනගත්තද ප්‍රත්‍යක්ෂව දැනගත්තා නොවේ. කලින් දුටු මතකයෙන් හා සිතින් පමණක් ආදියෙන් දැනගන්නවා පමණි. මෙයට අමතරව ස්ව සන්තානයේ පහළ වන්නා වූත්, පහළ වුනා, වූත් රූප නාමයෝ කත්වූ ආකාරයෙන් ප්‍රත්‍යවේක්ෂා කරන *පටිසංඛාන ඤාණය* මගින්ද ඇස් පනාපිට දත හැක්කේය. මනසිකාරය පවත්වන විපස්සනා ඤාණයෙන්ද ඇස් පනාපිට දත හැක්කේය. මනසිකාරය පවත්වන විපස්සනා ඤාණයෙන්ද ඇස් පනාපිට දැන ගත හැක්කේය. එම *පටිසංඛාන ඤාණ, විපස්සනා ඤාණ* මගින් ස්ත්‍රිය, ආදී අර්ථ ඇස් පනාපිට

නොලබන බැවින්, නොදකින බැවින් එම ධර්ම නිසැකවම නොවන බව තීරණය කළ හැක්කේය. එම නිසා බලව විපස්සනා ඥාණය සහිත පුද්ගලයන්ගේ "පරමාර්ථ මතුවී නම් ප්‍රඥප්ති යට යැයි" යන ඥාණ වන්තයන්ගේ ආප්තෝපදේශයට අනුව නියම පරමාර්ථ රූප- නාමයන්ම ප්‍රකටව දැනගනී. ප්‍රඥප්තීන් වනාහී සත්‍ය වශයෙන් ප්‍රකට නොමැති ධර්ම වශයෙන්ම දකී, දනී. "මෙවැනි විපස්සනා ඥාණ තවමත් පහළ නොවූ පුද්ගලයන්ට ප්‍රඥප්තීන් මතුවී නම් පරමාර්ථ සැඟවී ගනී" යන එම ඥාණ වන්තයන්ගේ ආප්තෝපදේශයට අනුව ප්‍රඥප්තීන්ම ප්‍රකටවම පැනේ. නියම පරමාර්ථ රූප- නාමයන් සැඟවී ගනී. එම නිසා සාමාන්‍ය පුද්ගලයෝ ස්ත්‍රී, පුරුෂයා, ආදී වස්තූන්- ද්‍රව්‍යයන් ප්‍රකටව ඇත්තේම යැයි ගෙන ඇස් පනාපිට දැනගන්නා ශේද- වර්ණ දැකීම ආදීයෙන් රූපාකාරයන් සිතින් සිතාගෙන, නාමයන් විශේෂයෙන් අදහා ගෙන දැන ගන්නා දේ එලෙසටම පිළිගනී. පෙර සිත පසු සිත වශයෙන් වෙන් කොට නොදන්නා නිසා මෙසේ අදහා ගන්නා බව පෙර විස්තර කරන ලදී. මෙය වනාහි අවිජ්ජමාන විෂයෙහි පරමාර්ථ හා ප්‍රඥප්ති වෙන් කොට දක්වන ආකාරයයි.

පරමාර්ථ හා ප්‍රඥප්ති බෙදා දැක්වීම නිමියේ යැ.

විපස්සනාවේ අරමුණු

මෙතැන් පටන් විපස්සනා කළ යුතු ධර්මයන් වෙන්කොට දක්වන්නෙමු. නාම- රූප පරිච්ඡේදය ආදියෙන් පටන්ගෙන නියම විපස්සනා ඤාණ පහළ කරගැනීමට, යෝගාවචර තෙමේ, පෙන්වන ලද පරමාර්ථ හා ප්‍රඥප්ති යන දෙක අතරින් නියම පරමාර්ථ රූප- නාම මත පමණක් භාවනා කළ යුතුවේ. ප්‍රඥප්තීන් කිසිවක් මත භාවනා නොකල යුතුය. පරමාර්ථ රූප-නාමයන් තුළින්ද ලෞකික ධර්මයන් මත පමණක්ම භාවනා කළ යුතුයි. ලෝකෝත්තර ධර්ම මත භාවනා නොකළ යුතුය. හේතුව වනාහී, තවම නොපැමිණි - නොලද ධර්මයන් නිසා ලෝකෝත්තර ධර්මයන් පෘථග්ජනයනට ස්වභාව ලක්ෂණාදිය ඇති සැටියෙන් ප්‍රකට නොවන නිසාත්, ආර්ය පුද්ගලයන් වනාහි තත්ත්වාකාරයෙන් දන්නා නමුත් ලෝකෝත්තර ධර්ම මත භාවනා කිරීම මහත් ප්‍රයෝජනයක් නොදෙන නිසාත්ය. තවදුරටත් විස්තර කළහොත් ලෞකීය ධර්මයන් මත භාවනා කිරීම, එම ධර්මයන් මත පහළවන නිච්ච- සුඛ- අත්ත යැයි වරදවා ගන්නා කෙළෙස් බැහැරකිරීමට හැකි වීමේ ප්‍රයෝජනයයි. ලෝකෝත්තර ධර්ම මත මෙලෙස වරදවා වටහා ගන්නා සුළු කෙළෙස් පවා නොමැත්තේය. එම නිසා ඒවා මත භාවනා කළේ වී නමුත් කෙළෙස් දුරු කිරීම වැනි ප්‍රයෝජනයක් නොලැබේ. උපමාවක් ලෙස පොළොව සමතළා කරන්නකු උස්තැනින් පහත් තැනට පස් දැමීමෙන් පොළොව සම කිරීමේ ප්‍රයෝජනය ලබයි. ප්‍රකෘතියෙන්ම සමතලා වූ පොළොවක් මත එසේ කිරීමෙන් ප්‍රයෝජනයක් ලැබිය නොහැක්කේය. මේ නිසා විශුද්ධි මාර්ගයේ (223) **අනධිගතත්තා** යැයි හේතු දක්වයි. එහි, තවමත් අවබෝධ නොකළ නිසා භාවනා නොකල යුතු යැයි අර්ථය ගෙන දේ. ඒ පෘථග්ජනයන් සළකා දක්වන ලද කථාවකි. දීඝ නිකාය ටීකා (530) හි **අවිසයත්තා, විසයත්තෙපි ච පයොජනාභාවතො** යැයි ආර්යන් වහන්සේලාත් ඇතුළත් කොට සම්පූර්ණ ලෙස අර්ථය දක්වයි. ලෝකෝත්තර ධර්මයන් වනාහි අරමුණු කිරීමට සුදුසු ධර්මයන් නොවන නිසා ඒ මත පෘථග්ජනයන් භාවනා නොකළ යුතු අතර ආර්යයන් වහන්සේට අරමුණු කළ හැකි නමුත් එල ප්‍රයෝජනයක් නොමැති නිසා නැවත භාවනා නොකළ යුතුයි යන්න අදහසයි.

විපස්සනාව **පච්චක්ඛ, අනුමාන** වශයෙන් දෙයාකාරය. ඒ තුළ පහළ වූ රූප- නාමයන් අතින් ගෙන බලන්නා සේ මෙනෙහි කොට ඇස් පනාපිට දත හැකි ඥාණය **පච්චක්ඛ විපස්සනා** නම්වේ. මේ **පච්චක්ඛ විපස්සනාව** මගින් ඇත්තටම පහළ වන- බිඳෙන නියම නාම- රූපයන්හි ස්වභාව ලක්‍ෂණයන් ආදිය ඇති සැටියෙන් දකගනී. ඇතිවන- නැතිවන *අනිච්ච* ලක්‍ෂණයන් ආදියද ඇති සැටියෙන් දනී. එම නිසා විපස්සනා යෝගීන් භාවනාවේ ආරම්භයේ සිටම අනුලෝම ඥාණය තෙක් මේ **පච්චක්ඛ විපස්සනාව**ම අඛණ්ඩව අතරක් නොතබා වැඩිය යුතුය. නාම- රූප පරිච්ඡේද ඥාණය ආදී උසස් උසස් ඥාණයන් පාසා **පච්චක්ඛ විපස්සනාව** බලවත්ව සම්පූර්ණ වන කල්හි පෙර ඇස් පනාපිට දත නොහැකි වූ රූප- නාමයන්ද, ඇස් පනාපිට දැනගත් රූප- නාම සමග ගළපමින් සිතා ගැනීමේ හෝ තීරණය කිරීමේ ඥාණයන් පහළ වෙත්. මෙය **අනුමාන විපස්සනා** නම් වේ. මෙම **අනුමාන විපස්සනාවට අජ්ඣත්ත**-*බහිද්ධා, අතීත-අනාගත-පච්චුප්පන්න* වන්නාවූ ලෞකිය ධර්ම සියල්ල අරමුණු කළ හැක්කේය. නමුදු **පච්චක්ඛ විපස්සනාවේ**දී මෙන් රූප-නාමයන්ගේ ස්වභාව ලක්‍ෂණාදිය ඇත්තටම ඇති- නැති වන ආකාරය අරමුණු කොට දැන ගන්නවා නොවේ. විශේෂ ව්‍යාපාර කොට වැඩිය හැකි ඥාණයන් නොවේ. **පච්චක්ඛ** ඥාණයන් මුහුකුරා ගිය විට ඉබේම ස්වයං සිද්ධව පහළ වන ඥාණයන් වන්නාහ. එම නිසා මින් මතු **පච්චක්ඛ විපස්සනාවේ** අරමුණු පමණක් විග්‍රහකොට දක්වන්නෙමු.

ලෞකිය ධර්මයන් අතරින් *නෙවසඤ්ඤා-නාසඤ්ඤා* ධ්‍යානය මත, ආදිකම්මිකයාට විපස්සනා කළ නොහැක්කේය. එම ධ්‍යානය ඉතා සූක්‍ෂම නිසා සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේටද හොඳින් ප්‍රකට නොවුනු බව අනුපද සූත්‍රයෙහිලා දැක ගත හැක. *මහග්ගත* ධර්ම මත ධ්‍යානලාභී පුද්ගලයන්ට පමණක් ප්‍රත්‍යක්‍ෂ ලෙස භාවනා කළ හැක්කේය. ධ්‍යානලාභී නොවන්නන්ට විපස්සනා කළ නොහැක්කේය. මනසිකාරයට නැංවිය නොහැක්කේය. මක්නිසාද යත් තම සන්තානයේ පහළ නුවූ ධර්මයන්ගේ ස්වභාව ලක්‍ෂණාදිය පහළ වූ ධර්මයන්ගේ මෙන් හොඳින් ප්‍රකට නොවන නිසාය. මෙහිලා **අනධිගතත්තා** = සාක්‍ෂාත් නොකළ බැවින් ලෝකුත්තර ධර්මයන් මනසිකාරයට ලක්කළ නොයුතු යැයි යන අට්ඨකථා විවරණය සමාන වේ. එම නිසා මහා ටී. බූ (2/353) හි **ලාභිනො එව මහග්ගතචිත්තානි සුපාකටානි හොන්ති** යැයි දක්වයි.

මහග්ගත චිත්තානි = මහග්ගත සිත්

ලාභිනො එව = සාක්ෂාත් කළ තැනැත්තාටම, ලැබූ වනටම

සුපාකටානි = පච්චක්ඛ ඤාණ භාවනා කළ හැකි ලෙසට හොදින් ප්‍රකට බව

හොන්ති = වෙත්

මෙම ටීකාවෙහි අවධාරණාර්ථය ඇති **"එව"** පදය හා **"සුපාකටානි"** යන පදය මඟින් ධ්‍යාන ලාභී පුද්ගලයනට පමණක් *මහග්ගත* සිත් හොදින් ප්‍රකටවේ යන අර්ථය දක්වයි. මෙලෙස දක්වීමේදී "හොදින් ප්‍රකට වේ" යන අර්ථය ධ්‍යාන ධර්මයන්හි ස්වභාව ලක්ෂණයන් ආදිය ඇති සැටියෙන්ම *පච්චක්ඛ ඤාණයෙන්* දැන ගත හැකි ලෙසට ප්‍රකට වේ යන්න අදහසයි. 'හොදින් ප්‍රකට නොවේ' යන තැනද පච්චක්ඛ ඤාණය මගින් දැනගත හැකි ලෙසට ප්‍රකට නොවේ, අනුමාන ඤාණ මගින් දැනගත හැකි තරමට පමණක් ප්‍රකට වේ යනුයි. එම නිසා ධ්‍යාන නොලැබූ තැනැත්තාට *මහග්ගත* ධර්ම භාවනා කළ නොහේ. *කාමාවචර* ධර්ම මත පමණක් භාවනා කළ යුතුවේ. නමුදු කාමාවචර ධර්මයන් මත **පච්චක්ඛ ඤාණයන්** මුහුකුරා ගිය කල මහග්ගත ධර්මයන් මතද අනුමාන ඤාණයන් පහළ වේ. එම නිසා "මනසිකාරය පැවැත්විය යුතු සංස්කාර ධර්ම සමහරක් අතහැරේ" යැයි යන්න සත්‍ය නොවේ. කාමාවචර ධර්මයන් තුළින් ප්‍රකට රූප- නාම යන මත පමණක් මනසිකාරය පැවැත්විය යුතුවේ. අප්‍රකට ඉතිරි රූප- නාමයන් වනාහි පොත පත දැනුම- සුතමය ඤාණය අනුව අනුමාන කොට භාවනා නොකළ යුතුය. පහත සඳහන් පාළිය විසුද්ධි මග්ග (457) දක්වීමයි.

යෙපිච සම්මසනූපගා තෙසු යෙ යස්ස පාකටා හොන්ති සුඛෙන පරිග්ගහං ගච්ඡන්ති, තෙසු තෙන සම්මසනං ආරභිතබ්බං

ච = ලොකුත්තර පමණක් භාවනා නොකළ යුතු ධර්ම මත නොව

යෙ සම්මසනූපගා = සම්මස්සනයට ගැලපෙන්නා වූ යම් ලොකී ධර්මයෙන්

සන්ති = ඇත්තේද,

තෙසුපි = එකී ලෝකී ධර්මයන් තුළින් ද

යෙ = යම් රූප නාමයන්

යස්ස = යම් කෙනෙකුට

පාකටා හොනති = ප්‍රකට වේද
සුඛෙන පරිගගහං = කල්පනා නොකරම පහසුවෙන් පරිග්ගහ කරන තැනට
ගචඡති = පත්වේද
තෙසු = නිසැකව පහසුවෙන් පරිග්‍රහ කළ හැකි එම නාම-රූප මත
තෙන = එම පුද්ගලයා
සමමසනං = සම්මර්ශනය
ආරභිතබබං = ආරම්භය කළ යුතුවේ

රූප 28 තුළින් නියම පරමාර්ථ රූප වන රූප- රූප යන්නද කම්ම, චිත්ත, උතු, ආහාරයන්ගෙන් කෙළින්ම පහළ කරන්නාවූ *නිප්ඵන්න රූපයද,* උප්පාද- ඨිති- භංග ලක්‍ෂණ සංඛ්‍යාත *සලක්ඛණ රූපද* විපස්සනා භාවනාවට සාධාරණ *සමමසන රූපද* යන මේ රූප 18 පමණක් මත භාවනා කළ යුතුය. එයින් පිට *අනිප්ඵන්න රූප* දහය ප්‍රධාන කොට භාවනා කිරීම අවශ්‍ය නොවේ. එම නිසා මහා ටීකා හි.

රූපරූපානෙව හි ඉධ පරිගගයහනති. න රූප පරිචෙඡද විකාර ලකඛණානි යයි දක්වයි. [මහා ටී. (බු.) 2/353]

ඉධ = මෙහිලා
රූපරූපානි එව = නිපඵනන, සලලකඛණ, සමමසන රූප යැයි කිවයුතු රූප 18 පමණක්
පරිගගයහනති = පරිග්‍රහ කොට භාවනා කළ යුතුවේ.
රූප පරිචෙඡද
විකාර ලකඛණානි = රූපයන් පරිච්ඡේද කරන්නා වූ ආකාශ ධාතුව කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති, රූප ලහුතා, රූප මුදුතා, රූප කම්මඤ්ඤතා යන විකාර රූප පහ සහ උපචය, සනතති, ජරතා, අනිච්චතා යන ලක්ඛණ රූප හතර
න පරිගගයහනති = පරිග්‍රහ නොකළ යුතු, භාවනා නොකළ යුතු

චිත්ත, චෛතසිකයන් තුළද රහතන් වහන්සේලාගේ සන්තානයේ පහළ වන ක්‍රියා ජවනයෝ *පුථුජ්ජන- සෙක්ඛ* පුද්ගලයනට භාවනා කළ නොහැක. එම නිසා විපස්සනායාතික වන්නා වූ *පුථුජ්ජන- සෙක්ඛයන්ගේ*

පච්චක්ඛ විපස්සනාව හා සම්බන්ධ අරමුණු ධර්මයන් පහත සඳහන් ලෙසට වෙන් වෙන්ව ගෙන සිතට ගතයුතුය.

ප්‍රසාද රූප 5, විෂය රූප 7, භාව රූප 2, ආපො ධාතු 1, හදය රූප 1, ආහාර රූප 1, ජීවිත රූප 1, යන මේ නිප්ඵන්න රූප 18, අකුසල සිත් 12, හසිතුප්පාද සිත හැර ඉතිරි අහේතුක සිත් 17, මහා කුසල මහා විපාක සිත් 16 යන මේ කාම සිත් 45 හා යෙදෙන චෛතසික 52, මෙම රූප- චිත්ත- චෛතසික ධර්මයන් තුළින් ඇස්පනා පිට ප්‍රකට ධර්මයන් එක එකක් පමණක් ප්‍රධාන කොට මනසිකාරය පැවැත් විය යුතුවේ.

නාම රූපයන් ප්‍රකට වන ආකාරය

චක්ඛු ප්‍රසාදය නම් වූ ඔපවත් වූ චක්ෂු රූපය *රූපාරම්මණය* නම් වූ දකින වර්ණ රූපය *චක්ඛු විඤ්ඤාණය* නම් වූ දකින සිත සමඟ එකට යන චිත්ත සන්තතිය හා එහි යෙදෙන චෛතසික යන මේ රූප නාමයන් දකින මොහොතේදී ඇස් පනාපිට ප්‍රකට වේ. නමුදු මෙම රූප- නාමයන් තුළින් වරකට එකක් එකක්ම ස්වභාව ලක්ෂණ ආදිය මෙනෙහි කිරීමේදී, දැන ගැනීමේදී වඩා ප්‍රකට විය හැක්කේය. එම සිත් සන්තතියෙහි *පඤ්චද්වාරාවජ්ජන 1, සම්පටිච්ඡන 2 සන්තීරන 3, වොත්ථපන 1, කාම කුසල- අකුසල ජවන 20, තදාරම්මණ 11, චක්ඛු ද්වාරයට* පදනම වශයෙන් පහළ වන්නේ මේ සිත් 38යි. *අගගහිත ගහන* ක්‍රමයට 35 ක්ම වේ. අසන අවස්ථාව ආදියෙහි මෙහිලා සංක්ෂේපයෙන්ම දක්වන්නෙමු. මේ ඉහත දැක් වූ දකින අවස්ථාවේදී මෙන් සම්පූර්ණයෙන් වටහා ගන්න.

සොතපසාදය = කණේ ඔපය

සද්දාරම්මණ රූප = ශබ්ද රූපය

සොත විඤ්ඤාණය = අසන සිත හා එකට යෙදෙන චිත්ත - චෛතසික සන්තතිය කියන මේ රූප- නාම අසන අවස්ථාවේ ප්‍රකටව පැනේ

ඝාන පසාදය = නාසයේ ඔපය

ගන්ධාරම්මණ රූප = ගඳ සුවඳ, ගෙනදෙන රූප

ඝාන විඤ්ඤාණය = ආඝ්‍රාණ කරන සිත හා යෙදෙන චිත්ත- චෛතසික සන්තතිය යන මේ රූප-නාම ආඝ්‍රාණය කරන විට ප්‍රකට වේ.

ජිව්හා පසාදය = දිවේ ඔපය

රසාරම්මණ රූප	=	රස ගෙන දෙන රූප
ජිව්හා විඤ්ඤාණය	=	රස දන්නා සිත හා යෙදෙන චිත්ත-චෛතසික සන්තතිය යන මේ රූප-නාමයෙන් රස බැලීමේදී ප්‍රකට වේ.
කාය පසාදය	=	කයේ ඔපය
පොට්ඨබ්බාරම්මණ රූප	=	ඝන, තද, බර, මෘදු, සිනිඳු, සැහැල්ලු වන පඨවි රූපය, උණුසුම- සිසිල වූ තේජෝ රූපය, චලනය තෙරපීම සහිත වායෝ රූපය.
කාය විඤ්ඤාණය	=	හැපීම දන්නා සිත හා යෙදෙන චිත්ත-චෛතසික සන්තතීන් යන මේ රූප නාමයන් පොට්ඨබ්බය සිදුවන අවස්ථාවේ ප්‍රකටය.

ස්ත්‍රී- පුරුෂයන්ගේ ඉත්ථි ලීලාව, චිත්ත සභාව පවතින කාලෙ, පුරිස ගති චිත්ත සභාව පවතින කාලෙ (ස්ත්‍රී සිත ඒ ස්වභාවයෙන්ම පැණෙන කාලයේ හා පුරුෂ සිත ඒ ස්වභාවයෙන්ම පැණෙන කාලයෙ) **ඉත්ථිභාව සඞ්ඛාත ඉත්ථි** බීජ රූපද , පුං භාව සඞ්ඛ්‍යාත පුරුෂ බීජ රූපද ඇස්පනාපිටම ප්‍රකට වෙත්. කෙළ ගිලින අවස්ථාවේ, කෙළ ගසන අවස්ථාවේ, කඳුළු, සොටු, දහඩිය ගලන අවස්ථාව ආදී අවස්ථාවන්හි ආපෝ ධාතුව වර්තමානව ඇස් පනාපිට ප්‍රකටවේ.

කල්පනා කරන- සිතන අවස්ථාවල, මෙනෙහි කරන අවස්ථාවල සිතන- මෙනෙහි කරන සිතද සහිතව හදය වස්තුව යැයි කියන එම සිත් ඇසුර ලබන *හදය රූපය* ඇස් පනාපිට ප්‍රකට වේ. කල්පනා කරන සිත යන්න *මනොද්වාරාවජ්ජන* 1 *කාම කුසල ජවන* 20, *තදාලම්බන* 11, යන මේ 32ය. මෙනෙහි කරන සිත යනු *මනොද්වාරාවජ්ජන* 1, *මහා කුසල ජවන* 8 *තදාලම්බන* 11, යන මේ 20ය, මෙහිලා "**භාවෙනෙතාපි තෙසංයෙව අඤ්ඤතරෙන භාවෙති**" යන අත්ථසාලිනි (155-156 පිට) "**කදාචි පරිචයබලෙන ඤාණ විප්පයුත්ත චිත්තෙහිපි සම්මසනං**" යන ටීකා ජෝ (බු.) 102 පිට (*චෛතසික පරිච්ඡේද අප්පමඤ්ඤා සම්පයොග* විස්තරය)" ***"පගුණං සමථ විපස්සනා භාවනං අනුයුඤ්ජන්තස්ස අන්තරන්තරා ඤාණ විප්පයුත්ත චිත්තෙනාපි මනසිකාරො පවත්තති"*** යන ඉතිවුත්තක අට්ඨ කථා (162 පිට) යන මේවාට අනුව වරින් වර ඤාණ විප්පයුක්ත විපස්සනා ජවනයන්ද පහළ විය හැක්කේ යැයි සළකාගන්න. තව දුරටත් "**අනිච්චතො, දුක්ඛතො, අනත්තතො**

විපසසනති. කුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා උපපජ්ජති" යන පට්ඨාන පාළි (1/222 පිට) අනුව තරුණ විපස්සනා ජවනයට අනතුරුව *තදාලම්බන* ද වැටේ යැයි ද සළකා ගත යුතුය.

කෑම- බීම ගෙන ශරීරය ශක්තිමත් වූ කල්හි හෝ නොකා නොබී දුබලව ගිය කල්හි හෝ ආහාර කියන රස ඕජා රූප ඇස්පනා පිට ප්‍රකට වේ. ප්‍රසාද, භාව, හදය රූපයන් අඛණ්ඩව යළි යළිත් පහළ වීම ප්‍රකට කල්හි එම රූපයන්හි ශක්තිය කඩනොවී මිලාන නොවී පවත්වන ජීවිත රූපය ඇස් පනාපිට ප්‍රකට වේ. දැක්වූ ලෙසට ඒ ඒ අවස්ථාවල ඇස් පනාපිට ප්‍රකට වන ධර්මයන් තුළින් විශේෂයෙන් ඉබේම තමාට ප්‍රකට වූ ධර්මයම ප්‍රධාන කොට මෙනෙහි කළ යුතුවේ. අජ්ඣත්ත-බහිද්ධා යන දෙක තුළින් කුමක් මෙනෙහි කොට භාවනා කළ යුතුද යත්ඃ මේ දෙකම භාවනා කළ යුතු වේ. නමුත් අජ්ඣත්ත ධර්මයන් පාරමී ඥාණානුභාවයේ ප්‍රමාණයට අනුව මතුවන ආකාරයටම *පච්චක්ඛ* ඥාණයෙන් භාවනා කිරීම, එම ඥාණ ප්‍රකට විට බහිද්ධා ධර්ම සන්තාන වශයෙන් නොබෙදා පොදුවේ බහිද්ධා ධර්මයන් මත අනුමාන වශයෙන් (සිතින් විමසා බලා තීරණය කර) භාවනා කිරීම යන මේ භාවනා ක්‍රම දෙක වනාහි ශ්‍රාවකයන්ගේ විෂය ක්ෂෙත්‍රයන් වෙත්. එම නිසා තම සන්තානයේ ඇති අජ්ඣත්ත ධර්මයන් මත පමණක් ප්‍රධාන කොට මෙනෙහි කළ යුතුය. භාවනා කළයුතුය.

පහත සඳහන් පාළියේ දැක්වෙන්නේ ශ්‍රාවකයන් වශයෙන් සම්මර්ෂනය කළ යුතු ධර්මයන්ගෙන් එක අංශයක් පමණක් භාවනා කොට, එක් ප්‍රදේශයක් පමණක් භාවනා කොට මොග්ගල්ලාන ස්වාමීන් වහන්සේ අර්හත් භාවයට පත්වූ අයුරු දක්වන අනුපද සූත්‍ර අර්ථ කථාව තවදුරටත් පැහැදිලි කරන ටීකා විවරණයයි.

ශ්‍රාවකයන්ගේ සම්මසන විධිය

එකදෙසමෙවාති සකඅත්තභාවෙ සංඛාරෙ අනවසෙසතො පරිග්ගහෙතුඤ්ච සම්මසිතුඤ්ච අසක්කොන්තං අත්තනො අභිනිහාර සමුදාගත ඤාණබලානුරූපං එකදෙසමෙව පරිග්ගහෙත්වා සම්මසනෙතා -පෙ තස්මා සසන්තානගතෙ සබ්බ ධම්මෙ පරසන්තානගතෙ ච තෙසං සන්තාන විභාගං අකත්වා බහිද්ධාභාව සාමඤ්ඤතො සම්මසනං. අයං සාවකානං සම්මසන චාරො [ම. ටී. (බු.) 275]

එකදෙසමෙවාති = *එක දෙස මෙව යනු*

සකඅත්තභාවෙ	=	තම ආත්ම භාවයේ
සංඛාරෙ	=	සංකාරයන්
අනවසෙසතො පරිග්ගහෙතුං		ඉතිරියක් නොතබා පරිග්‍රහ කිරීමට
අසක්කොන්තං	=	නොහැකිවූ මොග්ගල්ලාන ස්වාමීන්වහන්සේ
අත්තනො අභිනිහාර සමුදාගත		
ඤාණබලානුරූපං	=	තම පාරමිතා ඤාණානුභාවයෙන්
එක දෙස මෙව	=	එක දේශයක්ම,
පරිග්ගහිත්වා	=	පරිග්‍රහකොට,
සම්මසන්තා	=	සම්මර්ශනය කරන්නාහු, -පෙ-
තස්මා	=	එම නිසා
සකසන්තානගතෙ	=	ස්වකීය සන්තානයේ පහළ වූ,
සබ්බධම්මෙ	=	සියලු ධර්මයන්
සම්මසති	=	සම්මර්ශණය කරයි.
පරසන්තානගතෙ ච	=	අනුන්ගේ සන්තානයේ ඇති ධර්මයන් වනාහි
තෙසං	=	එම එක් එක්කෙනාගේ
සන්තාන විභාගං	=	සණ්ඨාන වශයෙන් බෙදා ගැනීම
අකත්වා	=	නොකර
බහිද්ධා භාව සාමඤ්ඤතො	=	බහිද්ධා වශයෙන් සියල්ල පොදු
අයං	=	මෙලෙස වූ අජ්ඣත්ත බහිද්ධා ධර්මයන්
සාවකානං	=	සාවකයනට
සම්මසන චාරො	=	සම්මශීනයට විෂය ක්‍ෂෙත්‍රයයි.

එමනිසා බාහිර ධර්මයන් සොයා- බලා කල්පනා කොට, හෝ සිතා- බලා හෝ මනසිකාරයට නොනැංවිය යුතුය. බාහිර රූපාරම්මණ, ශබ්දාරම්මණ ආදිය, විශේෂයෙන් සොයා බලමින් මනසිකාරය පවත්වන්නන්ට සිත විසිරි යෑම බහුල වන්නේය. එම සිත විසිරී යෑම මෙනෙහි කළ නොහැකි නිසා සමාධි- ප්‍රඥාවෝ බලවත් නොවන්නේය.

එම නිසා දින 15ක්, මාසයක් කල්ගියද කිසිම ගුණ විශේෂයක් නොලබා පසුවන්නේය. සූත්‍රානුභාවයට අනුව කල්පනා කොට සිතා බාල මනසිකාරය පවත්වන්නාටද ප්‍රත්‍යක්ෂ ඥානය පහළ නොවන නිසා සමාධි-ප්‍රඥාවෝ මේරීමට නොපැමිණෙත්. එම නිසා බාහිර(*බහිද්ධා*) ධර්මයන් ද්වාර හයෙහි ඉබේම ප්‍රකටව පැමිණි විට පමණක් මෙනෙහි කළ යුතුය. අනෙක් සෑමවිට *අජ්ඣත්ත* ධර්මයන් පමණක් මෙනෙහි කළ හැකිවන ලෙසට උත්සාහ ගතයුතුය. එම අජ්ඣත්ත (ආධ්‍යාත්මය) මෙනෙහි කිරීමෙන් පමණක් රූප-නාම වටහා ගත හැක්කේය.

අජ්ඣත්තං වා හි විපස්සනාභිනිවේසො හොතු බහිද්ධා වා, අජ්ඣත්ත සිද්ධියං පන ලක්ඛණතොසබ්බම්පි නාම- රූපං අනවසෙසතො පරිග්ගහිතමෙව හොති.

[මහා. ටී. (බු.) 2:360]

විපස්සනාභිනිවේසො	=	විපස්සනා මනසිකාර ආරම්භයේදී
අජ්ඣත්තංවා හොතු	=	තම සන්තානයේම හෝ වේවා
බහිද්ධාවා	=	බාහිර සන්තානයන්හි හෝ වේවා
පන	=	විශේෂයෙන්
අජ්ඣත්ත සිද්ධිං	=	තම සන්තානය මත මනසිකාරය සම්පූර්ණ කළ කල්හි
ලක්ඛණතො	=	ස්වභාව ලක්‍ෂණ, සාමඤ්ඤලක්‍ෂණ වශයෙන්
සබ්බම්පි නාම-රූපං	=	නාම- රූප සියල්ල
අනවසෙසතො පරිග්ගහිත මෙව	=	ඉතිරි නොවන ලෙසට භාවනා කළා පරිග්‍රහ කළා
හොති	=	වේ.

විපස්සනා භාවනාවේ ආරම්භයේ දී *අජ්ඣත්තයෙහි* මනසිකාරය පැවැත්වීම වේවා, *බහිද්ධායෙහි* මනසිකාරය පැවැත්වීම වේවා, අජ්ඣත්ත රූප- නාමයන් මතුවන මතුවන වාරයේ අතරක් නොතබා මෙනෙහි කළ හැකිනම් රූප- නාම සියල්ල ලක්ඛණ වශයෙන් ඉතිරියක් නොකොට පරිග්‍රහ කළාම වන්නේය. ඉතිරියක් නොතබා මනසිකාරය පැවැත්වී යැයි යන්න මෙහි අදහසයි.

ප්‍රත්‍යුත්පන්නය පමණක් භාවනා කළයුතු බව

අතීත- අනාගත- **ප්‍රත්‍යුත්පන්න** ධර්මයන් තුළින් කුමක් භාවනා කළ යුතුද යත්: *අද්ධා, සන්තති, ඛණ පච්චුප්පන්න* වන්නාවූ ධර්මයන් ප්‍රත්‍යක්ෂ ඥානයෙන් භාවනා කළ යුතුවේ. **ප්‍රත්‍යුත්පන්න** ඥාණය බලවත් වූ විට අතීත- අනාගත ධර්මයන් ද නය ක්‍රමය වශයෙන් සලකා බලා භාවනා කරන අනුමාන ඥාණය ඉබේම පහළ වන්නේය. එම නිසා අතීත- අනාගත ධර්මයන් වනාහි විශේෂ ආයාසයකින් භාවනා නොකළ යුතු, මක් නිසාද යත්: යෝගී පුද්ගලයාට අතීත- අනාගත ධර්මයන් ස්වභාව ලක්ෂණ ආදී වශයෙන් තත්ත්වාකාරය නොදත හැක්කේය. සිතා බලන්න. ගතවූ භවයෙහි රූප- නාමයන් එදා සිදුවූ ආකාරයෙන් සත්‍ය ලෙස දත හැක්කේද? කළු පාට වීද, සුදු පාට වීද චක්ඛු ප්‍රසාද- සෝත ප්‍රසාද ආදියෙන් සම්පූර්ණ වීද, අසම්පූර්ණ වීද, ඉත්ථි භාවයෙන් සම්පූර්ණ වීද, පුං භාවයෙන් සම්පූර්ණ වීද, යනාදී ලෙසට ගත වූ රූපයන් තත්ත්වාකාරයෙන් තුබූ සැටියෙන් දත හැක්කේද? කුමන *චිත්ත චෛතසිකයන්* තිබියේද කුමන කුමන සිතකට පසු කුමන කුමන සිතක් පහළ වීද යන ලෙසට සිදුවූ නාම ධර්මයන් ඒ සිදුවූ සැටියෙන් දත හැක්කේද? ගතවූ භවය යන්න ඉතා ඈතය. අද මේ භවයද වනාහි සලකා බලන්න. පසුගිය වසර, මාස, දින තුළ පහළ වූ රූප නාමයන් දූන් සලකා බැලුව හොත් ඒ සිදුවූ සැටියටම නියමාකාරයෙන් දත හැක්කේද? ගත වූ පැයේදී, විනාඩි 10 දී විනාඩි 05 දී පහළ වූ රූප-නාමයන් පවා සියල්ල ප්‍රමාණවත් ලෙස ස්වභාව ලක්ෂණ ආදී වශයෙන් තත්ත්වාකාරයෙන් දත නොහැකි වන්නේමය. මෙලෙස නොදත හැකි බව දූන් පිළි නොගන්නවා විය හැකි නමුත් පහළ වන පහළ වන ක්ෂණයෙහි රූප- නාමයන් අතනෑර මෙනෙහි කරමින් භාවනා කරන අවස්ථාවේ සත්‍යයක් බව තීරණාත්මකව පිළිගනු ඇත, අදහාගනු ඇත.

තවදුරටත් අනාගත ධර්මයන් කැළම දූන ගත නොහැක්කේය. දකුණු පය යැවීම කරන අවස්ථාවේදී මත්තේහි "එම පියවර ගමන් කරන අවස්ථාවේ, කුමන නාම- රූපයන් පහළ වනු ඇති දැයි" සහතික ලෙස නොදත හැක්කේය. කුසල් සිදුවනු ඇතැයි සිතන්නේ නමුත් එම අවස්ථාවේ අකුසල්ද සිදුවිය හැක්කේය. සතුටු වනු ඇතැයි සිතන්නේ නමුත් දුක් කරදරද සිදුවිය හැක්කේය. එම නිසා අනාගතය කිසිසේත්ම නොදත හැක්කේ යයි කියනු ලැබේ. නොදත හැකි නිසාම ආයුධ වලින් පහර

ලැබීම්, ගෙවල් කඩා වැටී ඒවාට යටවීම්, වහලෙන් වැටීම්. ගිනි ගැනීම්, ජලයේ ගිලීම්- සර්ප ආදී සතුන්ගේ දෂ්ඨ කිරීම්, උල්, ගල්- මුල් වල හැපීම් ආදියට හදිසියේම පත්වන ඇත්තන් එලෙස දුකට පත්වන මොහොත දක්වා හොඳින් සැපසේ සිතමින් කල් ගත කරන්නාහ. සමහරෙක් මරණාසන්නය තෙක් දිගුකලක් ජීවත්වනු ඇතැයි සිතමින් සැප බලාපොරොත්තු ඇතිව වාසය කරයි. ඉදින් අනාගතය ඇත්තටම දැනගත හැක්කේ නම් පේන කියන්නවුන්ගේ වෘත්තිය ඔවුනට නැතිව යා හැක්කේය. නමුදු අනාගත ධර්මයන් සිතන පරිදි ද අනාවැකි වලින් ප්‍රකාශ කරන පරිදිද සිදුවන අවස්ථා නැත්තේ නොවේ. අනාවැකිද සම්භාවිතාව අනුව අනුමාන කොට ගන්නා අහඹුවක් පමණක් වේ. සහතික ලෙස දැනගත් කාරණයක් හෝ නිසැක සත්‍යයක් නොවේ.

ප්‍රත්‍යුත්පන්න ධර්මය වනාහි දැන් තම සන්තානයේ සිදුවෙමින් පවතී. ද්වාර සයෙහි ප්‍රකටව පවතී. ප්‍රකාශව පවතී. එම නිසා සති- ප්‍රඥාවෙන් යුක්තව මෙනෙහි කරමින් භාවනා කරන්නේ නම් ඉතාමත් ප්‍රකට වූ යම් රූප- නාම ධර්මයක් ස්වභාව ලක්ෂණාදිය වශයෙන් තත්ත්වාකාරයෙන් ඇස් පනාපිට දත හැක්කේය.

උපමාවක් ලෙස අකුණු විදුලි කොටන අවස්ථාව හොඳින් නිරීක්ෂණය කරන්නේ නම් එම අකුණු කොටන ස්ථානය, සටහන සහිතව විදුලිය රේඛාව තත්ත්වාකාරයෙන් දැක ගත හැක්කේය. එසේ නොමැතිව විදුලිය කෙටූ පසු බලන්නේ නම් එම විදුලිය කෙටූ ස්ථානය නිසැක ලෙස නොදත හැක්කේය. විදුලිය රේඛා සටහන(*විජ්ජු ලතාව*) දැකගත නොහැකි බව විශේෂයෙන් කියයුතු නොවේ. එලෙසටම විදුලිය කෙටීමට පෙරාතුව කොතැන, කෙලෙස විදුලිය රේඛා දකීවිදැයි සිතා බලා, ඇති ආකාරයටම දැනගැනීමට නොහැක්කේය. මේ උපමාවේ ලෙසටද අතීත-අනාගතයන් ඇති සැටියෙන් දත නොහැක්කේය. ප්‍රත්‍යුත්පන්නය පමණක් තත්ත්වාකාරයෙන් ඇස් පනාපිට දත හැක්කේය. එම නිසා අතීත- අනාගත ධර්මයන් වෙත අවධානය කොට භාවනා නොකළ යුතු වේ. ප්‍රත්‍යුත්පන්නය පමණක් *පච්චක්ඛ ඤාණයෙන්* භාවනා කළ යුතුය, මෙනෙහි කළ යුතුය.

තවදුරටත් කිවයුතු කරුණක් වන්නේ, විපස්සනා නොකළ ප්‍රත්‍යුත්පන්න ධර්මය මත **ආරම්මණාධිගගහිත- ආරම්මණානුසය** යැයි කියනු ලබන කෙලෙස් තැන්පත් වන බවයි. නිදන්ගත වන බවයි. ප්‍රත්‍යුත්පන්න ධර්මය මත විපස්සනා කරන්නේ නම් එසේ කෙලෙස් නිදන්ගත නොවේ.

එම නිසා ප්‍රත්‍යුත්පන්නය භාවනා කරන විපස්සනාවට තදංග ප්‍රහාන වශයෙන් එම කෙලෙස් දුරුකළ හැක්කේය. බැහැර කළ හැක්කේය. එම කෙලෙස් වලට සම්බන්ධ වී පහළ වියහැකි කර්ම විපාක ස්කන්ධයෝ බැහැර කළ හැක්කේය. දුරු කළ හැක්කේය. මෙම කෙලෙස් බැහැර කිරීම හා නිදන් ගත වීම සම්බන්ධයෙන් සත්වන පරිච්ඡේදයෙහි *අනිච්චානු පස්සනා* යටතේ වඩාත් ප්‍රකට වනු ඇත්තේය. පහළ වන මොහොතෙහි විපස්සනා නොකළා වූ අතීත ධර්මයන් මත *ආරම්මණානුසය* නිදන් වූයේය. එම අතීත ධර්මයන් අල්ලාගෙන පහළ වූ ඝන ප්‍රඥප්ති සේයා පටයක, සටහන් වන ඡායා රූපයන් තැන්පත් වන්නාසේ එම අවස්ථාවේ පටන් චිත්ත සන්තානයේ තැන්පත්ව පවතී. එම නිසා දුටු, ඇසූ, ආඝ්‍රාණය කළ, අනුභව කළ, ස්පර්ශය කළ, පහස ලැබූ, කල්පනා කළ, එම අතීත රූප-නාමයන් නැවත සිහිපත් කරන අවස්ථාවක් පාසා ඝන ප්‍රඥප්ති වශයෙන් ඉදිරිපත් වී නිච්ච- සුඛ- අත්ත වශයෙන් වරදවා ගැනීම සිදුවේ. හුදු රූප- නාම පමණක් ය, අනිච්ච, දුක්ඛ, අනාත්ම පමණක් යැයි නැවත නැවත කල්පනා කළද මුලින් මුලින් රූප ගත කළ ඡායා සේ සිතට වැදී ඇත්තාවූ එම ඝන ප්‍රඥප්ති සමූහයන් බිඳීමට කිසිසේත්ම නොහැක්කේය. නිච්ච- සුඛ- අත්ත යැයි වරදවාගත් කෙලෙස් ද නැවතත් උගුලාලිය නොහැක්කේය. උපමාවක් ලෙස සමහර ගොත්‍රික ගුරු- දෙමාපියෝ ළමා ළපැටියන්ට වීරත්වය පිණිස පුහුණුකරවයි. අමනුෂ්‍යයන්- භූතයන් සම්බන්ධව අමුතු- ගුප්ත දර්ශණ පෙන්වති. එම නිසා එම ළමෝ ළමා කාලයේ සිට ඒවාට බිය නොදනිත්, බිය නොගනිත්. වයසට පත් වූ විටද අමුනුෂ්‍ය- භූතාදීන් හමුවුවද බිය නොවෙත්. අමුතු දර්ශණයන් දුටුවේ යැයි භාරගනී. මේ උපමාවට අනුව පහළ වන අවස්ථාවේම මෙනෙහි කිරීමෙන් ඝන ප්‍රඥප්ති ස්වරූපයෙන් නොපැනෙන නිසා වරදවා වටහා නොගත යුතු රූප- නාමයන් මත, නැවත සිහිකොට බැලු නමුදු කෙලෙස් මතුවිය නොහැකි බව දත නොහැක්කේය. බුරුම- සිංහල ආදී මනුෂ්‍ය ජාතීන්හි සමහර ගුරු- දෙමාපියෝ ළමා ළපැටියනට අමනුෂ්‍ය භූතාදීන් සම්බන්ධව අස්ථාන බියක් උපදවති. එම නිසා එම දරුවන් ළමා කාලයේ පටන් අමනුෂ්‍ය- භූතාදීන් බිය ජනක දේවල් යැයි වරදවා වටහා ගනී. නොදක්කේ නමුදු අස්ථානයේ අහේතුකවම බිය වේ. සත්පුරුෂ ගුරුවරයන් විසින් බිය වීම නරක දේකැයි නැවත නැවතත් පැහැදිලිකර දුන්නද බිය සම්පූර්ණයෙන් සිතින් පහ නොවේ. මේ උපමාවට අනුව, පහළ වන මොහොතෙහි ඇති සැටියෙන් මෙනෙහි

නොකළහොත් ඝන ප්‍රඥප්තිය නැවත ප්‍රකට වීම, වදරවා වටහා ගන්නා සුළු බව කිසිසේත්ම දුරු විය නොහැක්කේ යැයි සිතට ගතයුතුය. එම නිසා අතීත ධර්මයන් නැවත සිහිපත්කර විපස්සනා කිරීමෙන් ස්වභාවය, තත්ත්වාකාරයෙන් දත නොහැකිවා පමණක් නොව කෙළෙස් දුරුකිරීම නම් වූ ආනිසංසයද නොලද හැක්කේය.

අනාගත ධර්මයන් තවම පහළ නොවී ඇත. එම ධර්මයන් පහළ වීමට පෙරාතුවම විචාරා භාවනා කරන්නේ නමුත්, පසුව ඇත්තටම සිද්ධවන අවස්ථාවේ භාවනා නොකරන්නේ නම් ඝන ප්‍රඥප්තිය පහළ වී නිච්ච- සුඛ- අත්ත යැයි වරදවා ගෙන ඒ මතින් කෙළෙස් පහළ වීම වන්නේමය. මෙලෙස අනාගත ධර්මයන් පහළවීමට පෙරාතුව විචාර භාවනා කිරීම නිසා කෙළෙස් දුරුවනවා නොවේ. එම නිසා අනාගතය අනුව භාවනා කිරීම මගින් ස්වභාවය තත්ත්වාකාරයෙන් නොදැන ගත හැකිවා පමණක් නොව කෙළෙස් දුරුකිරීම නම් වූ ආනිසංසය ද නොලද හැක්කේය. එම නිසා අතීත- අනාගත ධර්මයන් බලවත් සැළකිල්ලකින් යුතුව භාවනා නොකළ යුතුය. *පච්චක්ඛ ඤාණ* බලවත් වූ විට *පච්චුප්පන්න* ධර්මයන් හා සසඳමින් අනුමාන ඤාණයෙන්ම භාවනා කළ යුතු වේ.

පච්චුප්පන්න ධර්මයන් මත භාවනා කිරීමෙන් වනාහි දක්වන ලද ආකාරයටම ඇත්තටම ඇතිවන- නැතිවන රූප-නාම ධර්මයන්ගේ තත්ත්වාකාරයද දත හැක්කේය. කෙළෙස් ද දුරුකළ හැක්කේය. එම නිසා *පච්චුප්පන්න* ධර්මයෝ පමණක්ම නිසි අවධාරණයෙන් යුතුව භාවනා කළ යුතු වේ. මේ වනාහි *පච්චුප්පන්නය* මත පමණක් මෙනෙහි කරමින් භාවනා කළ යුතු බවට හේතු කරුණු දක්වීමයි. මෙහිලා සැක නැතිව විනිශ්චය කළ හැකි වන්නාවූ *ධම්මට්ඨිති ඤාණ* තහවුරු ලෙස පහළ වීම සඳහා සිත තබාගත යුතු සාධක පාළිද උපුටා දක්වන්නෙමු.

අතීතං නානවා ගමෙයය- නපපටිකඩෙඛ අනාගතං
යදතීතං පහීනං තං -අපපතතඤච අනාගතං

පචචුපපනනඤච යො ධමමං- තතථ තතථ විපසසති
අසංහීරං අසංකුපපං - තං විදවා අනුබෲහයෙ

අජෙජව කිචචං මාතපපං - කො ජඤඤා මරණං සුවෙ
න හි නො සංගරං තෙන - මහා සෙනෙන මචචුනා

එවං විහාරිං අතාපිං - අහොරතතමතනදිතං
තං වෙ භදෙදකරතෙතාති - සනෙතා ආචිකඛතෙ මුණි [ම. නි.3/399]

අතීතං	=	අතීත වූ
යං ඛනධ පඤචකං	=	යම් වූ සකනධපඤචකයක්
අත්ථි	=	ඇත්තේද
තං	=	එම පඤචසකනධය
පහීනං	=	ප්‍රහීනයය (නිරුද්ධයැ, අස්ථංගතයැ යි අටඨ කථා විවරණයයි)
තසමා	=	එලෙස ප්‍රහීන (නිරුද්ධ, අස්ථංගත) බැවින්
අතීතං	=	අතීත පඤචස්කනධය
න- අනු ආගමෙයය	=	නැවත නොපැමිණෙන්නේය. තණ්හා- දිටඨි වශයෙන් නැවත කල්පනා නොකළ යුතු.
අනාගතඤච	=	අනාගත පඤ්චස්කනධයද
අපපතතං	=	පාවම නොපැමිණියේය, පහළ නොවීය. (අජාතං, අනිබබතතං යි අටඨකථා විවරණයයි)
තසමා	=	එලෙස, තවම පහළ නොවූ බැවින්
අනාගතං	=	අනාගත පඤ්චස්කන්ධයෝ
න, පපටිකඞෙඛ	=	තණ්හා දිට්ඨි වශයෙන් අපෙක්ෂා නොකළ යුතු ලැබීමට කැමති නොවිය යුතු ධර්මයන්ය
පචචුපපනනං	=	පත්‍යුත්පන්නවූ
ධමමඤච	=	පඤ්චස්කනධ ධර්මයන්ද
තතථ, තතථ	=	ඒ ඒ පහළවන මොහොතෙහිම
යං විපසසති	=	සත් අනුපස්සනා මගින් මනසිකාරය පවත්වයි
අසංහීරං	=	තණ්හා- දිටඨි වශයෙන් නොගැනීම පිණිස
අසංකුපපං	=	තණ්හා- දිටඨි මඟින් කෝප්‍ය නොවූ හෝ නොවීම පිණිස
තං විපසසනා	=	පචචුපපනන සකනධයන් මතුවන මතුවන ක්ෂණයෙහි විපස්සනා කරන එම විපස්සනා ඤාණය
විදවා	=	ප්‍රඥාව ඇත්තා
අනුබෲහයෙ	=	භාවනා වශයෙන් වඩයි, භාවනා කරයි.

(පැරණි නෙත්ති ග්‍රන්ථයෙහි **යං ධමමං** යැයි දැක්වේ.
[ම.නි.] උපරි පණ්ණාසයෙහි **යෙ ධමමං** යයි දැක්වේ. ඒ අනුව 'යම්

ප්‍රඥාවන්තයෙක් විපස්සනා කරයිද, එම ප්‍රඥාවන්තයා වඩන්නේ යැ'යි අර්ථය දක්වේ "**තං**" පදයට අනුව ගළපා බලන්නේ නම් "**යං**" පදය වඩාත් අර්ථාන්විතය)

අජ්ජෙව... යනාදී ගාථාවේ අර්ථය පළමු වන පරිච්ඡේදයේ දක්විය. නැවත කියවා බලන්න.

අහොරත්තං = දිවා රාත්‍රි නොසිඳ

අතන්දිතං = කුසිත නොවී

ආතාපී = කෙලෙස් දවන වැර ඇතිව

එවං විහාරිං = මේ දක්වන ලද ක්‍රමයට භාවනා කරමින් සිටින

තං = ප්‍රඥාවන්තයාට

භද්දෙක රත්තොති = සම්‍යක්වූ දිවාරාත්‍රි කාලය ඇත්තා යයි.

සන්තො = කෙලෙස් ගින්න නිවාලූ

මුනි = බුදුරජාණන් වහන්සේ

අචික්ඛතෙ = දේශනා කරන සේක.

මේ සූත්‍රය සවිස්තරව විස්තර කරන විට **එවං රූපො අහොසිං අතීත මද්ධානනති තත්ථ නන්දිං සමන්වානෙති** ආදී වශයෙන් අතීතය දිගේ ගමන් කිරීම දේශනා කරයි. අටඨකථාහි ද **කාලොපි සමනො ඉන්දනීල මණිවණ්ණො අහොසිනති, එවං මනුඤ්ඤඤවසෙනෙව** = කලුපාට වූ කෙනෙක් දැක "නිල්මැණිකක වණීය ලැබී යැ"යි, මෙලෙස 'තමන් මනාප වූ ලෙසට එම වණී රූපය සිහි කරයි' යන ලෙසට එය විවරණය කොට දක්වයි. එම නිසා සාමාන්‍ය අතීත කාලය වුවද ගතහොත් එය පෙර භවයන් සිහිකළ හැකි අභිඥා ලාභියකුට පමණක්ම ගැළපෙන්නකි. නමුදු මෙම සූත්‍රය වනාහි අභිඥා නොලැබූ තැනැත්තන් අරභයා දේශනා කරන ලද්දකි. එම නිසා සාමාන්‍යයෙන් සියලු දෙනාම බොහෝ කොට කරන අතීත, අනාගත වශයෙන් අනුගමනය කිරීම සළකා මෙසේ දක්වන්නෙමු.

ගතවූ අතීතය නැවත මතක් නොකරනු

ගතවූ කාලයේ පැහැදිළි ඔපයක් වූ චක්ඛු රූපය, දුටු මුහුණු, අත්- පා ආදී වණ්ණ රූප, දුටු ස්වභාවය වැනිවූ පඤ්චස්කන්ධ ධර්මයන් නිරුද්ධ වීය. දැන් නොමැත්තේය. එම නිසා නොපෙනී ගියාවූ එම ධර්මයන් තණ්හා- දිට්ඨි වශයෙන් වරදවා ගෙන කල්පනා කරමින් සිහිකරමින් නොසිටිය

මනාය. තණ්හා වශයෙන් වරදවා ගැනීම් ආකාරය වනාහි මගේ ඇස් කුඩා කල හොඳින් පෙනුනි, පැහැදිලිය මගේ ඇස් හොඳය. ඉතා කුඩා දේ පවා පෙනුනි. මුහුණ ලස්සන විය. ඇස්, ඇස් බැම අත- පය ලස්සනය. ඇඳුම් ආයිත්තම් වලින් ආඪ්‍යය විය. එකල කවරෙකු දුටු වේද, ඔහු දුටුවා හරි හොඳය... යනාදී ලෙසට පෙර දුටු දෙයක් අල්ලාගෙන සතුටුව කල්පනා කරයි. සිහිකරයි. දිට්ඨි වශයෙන් වරදවා ගන්නා ආකාරය වනාහී, මම (සත්‍වයා) දකිමි. මම (සත්‍වයා) අනුන් විසින් දකිනු ලැබී යැයි ගෙන, දුටු අවස්ථාවේ සිට මේ අවස්ථාව දක්වා අඛණ්ඩව පැවතීම් වශයෙන්ද, මිය ගියේනම් අනෙක් භවයට මාරු වන්නාවූ සත්ත්වයකු වශයෙන්ද කල්පනා කරයි. සිහිකරයි. මෙලෙස කලින් දුටු දෙයක් අල්ලාගෙන තණ්හා- දිට්ඨි වශයෙන් කල්පනා කරමින් නොසිටිය යුතුය. එසේ ඇසූ, ආඝ්‍රාණය කළ, අනුභව කළ, පහස ලැබූ දේවල් සම්බන්ධයෙන් ද පෙර හමුවූ අරමුණු වස්තූන් කල්පනා කරමින් සිහිකරමින් නොසිටිය යුතුය. එසේ ඇසූ, ආඝ්‍රාණය කළ, අනුභවකළ, පහස ලැබූ දේවල් සම්බන්ධයෙන් ද පෙර හමුවූ අරමුණු වස්තූන් ඒ අයුරින් කල්පනා කරමින් සිහිකරමින් නොසිටිය යුතුය. විශේෂයෙන් වනාහි කල්පනා කරන්නේ පෙර පෙර භාවනා කොට හරිගියේය, එසේ නොමැති නම් හරි නොගියේය, යන්න ගැන හෝ නැවත කල්පනා කරමින් සිටිය යුතු නොවේ.

අනාගතය අපේක්ෂා නොකළයුතු

ඉදිරියට පහළ වියහැකි ධර්මයන් තවම පහළ නොවීය. දැනට නොමැත්තේය. ඒවා ගැන අපේක්ෂා කිරීම "ලොතරැයියක් දිනුවහොත් කෙසේ කරන්නෙමිද, කෙසේ පාවිච්චි කරන්නේ දැයි" කල්පනා කරමින් කාලය නාස්ති කිරීමකට සමානය. එම නිසා මගේ ඇස් පෙනීම හොඳට පවතීවා, සම- සිව්වර්ණය තරුණ නාඹර වර්ණයෙන්ම පවතීවා, ලස්සන දේවල් පමණක් දකින්නට ලැබේවා, එවන් දර්ශනයන් දුරු නොවේවා යනාදී ලෙසට විය හැකි දැකීම් සම්බන්ධයෙන් අපේක්ෂා කිරීම් කල් බලමින් සිටීම නොකළ යුතුය. වියහැකි ඇසීම් ආදිය සම්බන්ධයෙන්ද මෙලෙසටමය. විශේෂයෙන් වනාහි සිතින් සළකා බැලීමේදී මනසිකාරය හොඳ වීමට, අරමුණු විශේෂයෙන් ප්‍රකට වීමට, විශේෂ ඥාණ පහළ වීමට පවා අපේක්ෂා නොකළ යුතු. කල් බලමින් නොසිටිය යුතුය.

වර්තමානය පමණක් අත නොහැර මෙනෙහි කරන්න

දක්නා අවස්ථාවේ වේවා, අසන අවස්ථාවේ , ආඝ්‍රානය කරන අවස්ථාවේ. ආහාර ගන්නා අවස්ථාවේ, පහස ලබන අවස්ථාවේ, යන අවස්ථාවේ, සිටින අවස්ථාවේ, හිඳින, හොවින, නවන, දිගහරින, කල්පනා කරන අවස්ථාවේ වේවා පහළ වෙමින් පවත්නා වූ වර්තමාන ධර්මයන්, රූප-නාම, අනිච්ච- දුක්ඛ- අනත්ත යැයි වැටහී යනු පිණිස මෙනෙහි කළ යුතු වේ. ඉදින් මෙනෙහි නොකරන්නේ නම්, මනසිකාරය නොපවත් වන්නේ නම් එම ධර්මයම නිත්‍යයැයි, සුඛ යැයි, සුභ යැයි, කැමති පරිදි පැවැත්විය හැකි ආත්මයකැයි භාරගෙන- පිළිගෙන, මනාප බව, රුචි බව නම් වූ ඇලෙන-බැඳෙන තණ්හාව පහළ වනු ඇත. වරදවා වටහා ගන්නා වූ දිට්ඨියට පත්වන්නේය. එම අවස්ථාවෙහි සිත තණ්හා-දිට්ඨීන්ගේ මෙහෙයීම පරිදි කාම විතක්ක ආදිය පහළ කරන්නේය. පහළ වන ආකාරය වනාහි, දක්නා අවස්ථාවේ මෙනෙහි නොකරන්නේ නම්ඃ "කවරෙක් දුටුවේද? ස්ත්‍රියක දුටුවේය, ඈ අසවලාගේ දරුවාය, අසවලාගේ මවයි, පියායි, කුමක් සඳහා පැමිණියේද, ඔහුගේ සිත සවභාවය කෙසේද? භාෂා ව්‍යවහාරය කෙසේ ද"යි ආදී ලෙස කල්පනාවට පත්විය හැක්කේය. එපමණකුදු නොවී රුචි- මනාප කෙනකු දුටුවහොත් "ඔහුගේ ස්වරූපය කඩවසම්ය, කථා ස්වරූපයද ඉතාමත් මෘදුය, ගමන-බිමන- හැසිරීම්ද සුමුදුය, ඔහු සමග කථා කරන්නට ඇත්නම් හොඳය, මෙවැන්නෙකු මිත්‍ර වන්නේ නම් හොඳය" යනාදි ලෙස කාම විතක්ක පහළ වීමෙහි කෙළවරක් නොවන්නේය. එසේම අප්‍රිය-අමනාප කෙනෙක් හමුවුවහොත් "ඔහු එතරම්ම ජුගුප්සාජනකය, සිත ස්වභාවය හැසිරීම් මෙලෙසය. මගේ දුක පිණිස ඔහු කටයුතු කරන්නේය. ඔහු මිය යන්නේ නම් මැනවයි. කෙසේ ඔහු මැරිය හැකිද? ඔහු වනාහි දුකට පත්වේවා! බොහෝ දුකට පත්වේවා! කෙසේ ඔහු තලා- පෙළා දැමිය හැක්කේද" යනාදි ලෙසට ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක පහළ වීම නිමක් නොමැතිව සිදු විය හැක්කේය.

එවැනි සිත් සංභීර- තණ්හා දිට්ඨි, අනුව ගමන් කිරීම යැයි කියනු ලැබේ. සංකුප්ප - තණ්හා දිට්ඨි නිසා කිපීමට පත් වීම යැයි කියනු ලැබේ. අසන අවස්ථා ආදියෙහිද මෙනෙහි නොකරන්නේ නම් තණ්හා -දිට්ඨි අනුව යමින් නොමගට පත්වීමද මේ ආකාරයටම සිදුවන බව වටහා ගන්න. (**රූපං අතථතො සමනුපසසති** යනාදි පාළි දැක්වීම හා මෙම දැක්වූ

අර්ථය ගළපා සසඳා බලන්න). මෙනෙහි කළ හැකි විට එසේ මෙනෙහි කරන විපස්සනා සිත තණ්හා- දිට්ඨීන්ගේ රුචිය පරිදි කාම විතක්කාදියට යට නොවන්නේය. එම නිසා මෙනෙහි කරන විපස්සනාව **අසහීර-අසංකුප්ප** නම්වේ. පහළ වන අවස්ථාවේම රූප- නාම මෙනෙහි කරන මෙවන් විපස්සනාව **පටිනිස්සග්ගානුපස්සනාව** නම් වූ *සංඛාර උපෙක්ඛා ඤාණ* කෙළවර කොට ඇති *අනුලොම- ගොත්‍රභූ- මග්ග- ඵල ඤාණයන්* තෙක් අතරක් නොතබා වැඩිය යුත්තේ යැයි කියනු ලැබේ. මෙම සූත්‍රයෙහි මහා කච්චායන තෙරුන් වහන්සේ විසින් විග්‍රහ කරන කොටස උද්ධෘත කොට විශුද්ධි මග්ගයෙහි **අද්ධා පච්චුප්පන්නයයි** දක්වන්නේ දැයි ප්‍රශ්නයක් විය හැක්කේය. ඇත්තය. නමුදු **සංහීර, සංකුප්ප** සිත් පහළ වන අවස්ථාවන්හි පමණක් **අද්ධා පච්චුප්පන්නය** සාකල්‍යයෙන්ම සම්බන්ධය. විපස්සනා කියන තැන *අද්ධා පච්චුප්පන්නය* සියල්ලම හා සම්බන්ධයක් නොමැත. එම නිසා පටිසන්ධි- චුති මගින් වෙන්කරන්නා වූ ධර්ම- සියල්ල සමස්ථයක් ලෙස ගෙන භාවනා කිරීමද නොවේ. අනුමාන කොටද නොවේ. සිදුනොවුනු දෑ අනුමාන ලෙස ගෙන භාවනා කරනවා(බලනවා) ද නොවේ. සිදුවූ පසු එම අත් දුටු දේ පසුව සිහිපත් කොට භාවනා කරනවාද නොවේ ඇත්තටම නම් ඒ ඒ මොහොතෙහි පහළවන්නාවූ රූප-නාම එම මොහොතේම ක්‍ෂණ වශයෙන් භාවනා කළ යුතුවේ. එම අදහස හොඳින් වටහා දීම පිණිස උද්දේස පාළියෙහි **තත්ථ තත්ථ** යන ආධාර විශේෂණයද ඇතුළත් කොට දේශනා කළසේක. අටඨකථා දක්වීම පහත දැක්වේ.

තත්ථ තත්ථාති පච්චුප්පන්නම්පි ධම්මං "යත්ථ යත්ථෙව සො උප්පන්නො" තත්ථ තත්ථෙව අනිච්චානුපස්සනාදීහි සත්තහි අනුපස්සනාහි විපස්සති. [නෙ. ප. අ. 202]

[නෙත්තියෙ හි ඇති ලෙසට මේ දක්වා ඇත්තේ මුල් පෙලයි. මෙය (ම.නි. උපරිපණ්ණාස) පාළියෙහි වනාහි **යත්ථ යත්ථෙව උප්පන්නං තත්ථ තත්ථෙව වචනං** යන ලෙසටද **සො විපස්සති** යැයි දැක්වෙන්නා වූ කොටසට පද වශයෙන් අසමානය.)]

තත්ථ තත්ථාති	=	**තත්ථ තත්ථ** යන්න වනාහි
පච්චුප්පන්නම්පි	=	ප්‍රත්‍යුත්පන්නයම වන්නේවී නමුදු,
ධම්මං	=	(විපස්සනාවට අදාළ) පඤ්චස්කන්ධ ධර්මය
යත්ථ යත්ථෙ	=	ඒ ඒ ක්‍ෂණයෙහිම
සො	=	එම ප්‍රත්‍යුත්පන්න ධර්මය

උපපජ්ජන්තා	=	පහළ වේ.
තත්ථ තත්ථ එව	=	එසේ පහළ වන ක්ෂණයෙහිම
අනිච්චානුපස්සනාදීහි	=	අනිච්චානුපස්සනා ව ආදී කොට ඇති
සත්තහි අනුපස්සනාහි	=	සත් ආකාර අනුපස්සනා වශයෙන්
විපස්සති	=	බලයි (භාවනා කරයි).

මේ අට්ඨ කථාවෙහි **පච්චුප්පන්නම්පි** කියන තැන සම්භාවනා ජෝතක 'පි' ශබ්දය මගින් "පටිසන්ධියත් චුතියත් යන දෙකින් සීමාවූ මෙම භවයේ ඇතිතාක් ධර්ම *අද්ධා පච්චුප්පන්න* බව සැබෑය. නමුදු එම ධර්ම සියල්ලද පිඬු කොට භාවනා නොකළ යුතුය. එක එකක් අනුමාන කොට භාවනා කිරීමද නොකළ යුතුයි. මේ මොහොතෙහි පහළ වන ධර්ම පමණක් භාවනා කළ යුතු වේ යැයි" දක්වේ. **තත්ථ තත්ථේව** යන තැන *අවධාරණ ජෝතක* **'එව'** ශබ්දයෙන් ද" එම *පච්චුප්පන්න* ධර්මය ද, පහළ වීමට පෙරාතුව භාවනා නොකළ යුතු, පහළ වී කල්ගත වූ පසුද භාවනා නොකළ යුතු, පහළ වන පහළ වන ක්‍ෂණයෙහි පමණක් භාවනා කළ යුතු යැයි" දක්වයි. අනුපස්සනා හත යන්න *අනිච්චානු, දුක්ඛානු, අනත්තානු, නිබ්බිදානු, විරාගානු, නිරෝධානු, පටිනිස්සග්ගානුපස්සනා* යන මේවාය. මේවා පිළිබඳව සත්වන පරිච්ඡේදයෙන් තවදුරටත් පැහැදිළි වනු ඇත.

මේ සූත්‍ර පාළි අට්ඨ කථා මගින් වර්තමාන වශයෙන් පහළ වන පහළ වන මොහොතෙහිම භාවනා කළ යුතු යැයි දක්වන බැවින් *අද්ධා පච්චුප්පන්න* යැයි දැක්වූව ද විපස්සනාවෙහි අරමුණ වනාහි සන්තති පච්චුප්පන්න, ඛණ පච්චුප්පන්න යන දෙආකාරයන් පමණක් වේ. පටිසන්ධියත් චුතියත් හා සීමා කොට ඇති *අද්ධා පච්චුප්පන්නය* මුළුමනින් නොවේ. මෙතැන්හි පමණක් නොවේ. විපස්සනාවේ මෙන්ම අනුන්ගේ සිත් ප්‍රත්‍යක්‍ෂ ලෙස දන්නා *චේතොපරිය අභිඤ්ඤාව* කියන තැනද "*අද්ධා පච්චුප්පන්නය* ජවන වාර වශයෙන් විශේෂයෙන් වෙන් කොට ගත යුතු යැයි" විශුද්ධි මාර්ගයෙහි දැක්වේ. පහත සඳහන් ලෙසටමයි.

අද්ධා පච්චුප්පන්නං පන ජවන වාරෙන දීපෙතබ්බන්ති සංයුත්ත අට්ඨ කථායං වුත්තං, තං සුට්ඨුවුත්තං [වි. ම. 324]

අද්ධා පච්චුප්පන්නං පන	=	අද්ධා පච්චුප්පන්නය වනාහි
ජවන වාරෙන	=	ජවන මගින්
වා	=	එක වීථියක් මගින්

දීපෙ තබ්බන්ති = දැක්විය යුතු යැයි කියා

සංයුත්ත අට්ඨ කථායං = සංයුත්ත අට්ඨ කථාහි

වුත්තං = කියන ලදී.

තං = එම කථාව

සුට්ඨු වුත්තං = මනාකොට කියන ලද කථාවකි.

අද්ධා පච්චුප්පන්නං ජවන වාරෙන දීපෙ තබ්බං, න සකලෙන පච්චුප්පන්නනාති අධිප්පායො [මහා. ටී. (සී) 2/424]

අද්ධා පච්චුප්පන්නං = අද්ධා පච්චුප්පන්නය

ජවන වාරෙන = ජවන වාර වශයෙන්

දීපෙතබ්බං = දැක්විය යුතුය.

සකලෙන පච්චුප්පන්නද්ධුනා = අද්ධා පච්චුප්පන්නය සාකල්‍යයෙන්

න දීපෙතබ්බං = දැක්විය යුතු නොවේ.

ඉති අධිප්පායො = මේ අට්ඨ කථාහි අදහස වේ.

මේ පාළි- අට්ඨ කථා- ටීකා මගින් "අනුන්ගේ සිත් විශේෂ වශයෙන් ඇස් පනාපිට වෙන් කොට දන්නා **චෙතොපරියාය අභිඤ්ඤාව** දක්වන ස්ථානයේ ද එයටත් වඩා පිරිසිදු ලෙස වෙන්කොට රූප-නාමයන් දැනගන්නා *පච්චක්ඛ විපස්සනා* කියන තැනද *අද්ධා පච්චුප්පන්න* යැයි දැක්වුව ද භාවය සම්පූර්ණයෙන්ම ගත යුතු නොවේ. ජවන වාර මගින් වෙන් කොට ගත් වර්තමානව සිදුවෙමින් පවතින *පච්චුප්පන්න* ධර්මයන් පමණක් ගතයුතුවේ." යන මේ අර්ථය ප්‍රකටය. අනුමාන විපස්සනා කියන තැන වනාහි *අද්ධා පච්චුප්පන්නය* සම්පූර්ණයෙන් ගත යුතුවේ. එම නිසා මෙම භද්දේකරත්ත සූත්‍ර පාළි අට්ඨ කථාවන්ට අනුව මෙම මොහොතේ පහළවන ධර්මයන් පමණක් *පච්චක්ඛ විපස්සනාවේ* අරමුණ වන්නේ යැයි නිසැක ලෙස සිතට ගතයුතු වේ.

සතිපට්ඨාන සූත්‍ර පාළි සහ අට්ඨ කථා හිද වර්තමාන මොහොතෙහි පහළ වන ධර්මයන් පමණක් භාවනාවට නැංවිය යුතු බව කෙළින්ම දේශනා කොට ඇත. දක්වන ආකාරයට වනාහි **ගච්ඡන්තො වා ගච්ඡාමීති පජානාති** යන ලෙසට මුල් කායානුපස්සනා පර්වයෙහි "ගමන් කරමින් සිටින විට ගමන් කරන තැනැත්තා ගමන් කරනනේ යැයි දැන ගනී" මෙලෙසට ප්‍රත්‍යුත්පන්න කාලය වශයෙන්ම දේශනා කළ සේක. ගමන් කළා වූ

තැනැත්තා දන්නේය. ගමන් කළා යැයි දනී. ගමන් කරන්නා මතුවට ගමන් කරන්නේ යැයි දනී" යනාදී ලෙසට අතීත- අනාගත කාල වශයෙන් දේශනා නොකළසේක.

"සුඛං වා වේදනං වේදියමා නො සුඛං වෙදනං වේදියාමීති පජානාති" යන ලෙසට මූල පුරණ *වේදනානුපස්සනා* පර්වයේදීද 'සුඛ වේදනාව විඳිමින් සිටින පුද්ගලයා සුඛ වේදනාව විඳින්නේ යැයි දනී' යන ලෙසට ප්‍රත්‍යුත්පන්න කාලයේම ලා දේශනා කළසේක. 'සුඛ වේදනාව විඳි පුද්ගලයා, සුඛ වේදනාව (මත්තට) විඳින්නාවූ පුද්ගලයා විඳින්නේ යැයි දනී' යන ලෙසට අතීත- අනාගත කාල වලින් දේශනා කළා නොවේ.

"සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං අත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති"යන ලෙසට ආරම්භ කරන *ධම්මානුපස්සනා* පර්වයේදීද පවතින්නාවූ- තිබෙන්නාවූ කාමච්ඡන්ද පිළිබඳව "මට දැන් කාමච්ඡන්දය ඇත්තේ යැයි" දනී යන ආකාරයට ප්‍රත්‍යුත්පන්න කාලයෙහිම ලා දේශනා කළසේක. ගතවූ කාමච්ඡන්දයන් දනී, මතුවට වන්නාවූ කාමච්ඡන්දයන් දනී, මට කාමච්ඡන්දය පහළ වී යයි දනී, මතුවට පහළ වන්නේයැයි දනී... යනාදී ලෙසට අතීත- අනාගත කාල වශයෙන් දැන ගැනීමක් දේශනා නොකළ සේක.

"සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති" යනාදියෙන් අරඹන *චිත්තානුපස්සනා* කොටසේදී පාළියෙහි නම් කුමන කාලයෙහිදැයි අප්‍රකටය. එබැවින් අප්‍රකට දෑ ප්‍රකට වණු පිණිස පැහැදිළි කරන අට්ඨකථාචාර්යයන් වහන්සේලා පහත සඳහන් ලෙසට දක්වති. එම කථාවට අනුවද *චිත්තානුපස්සනාවද* ඉතිරි *අනුපස්සනාවන්* හී මෙන් වර්‍තමාන වශයෙන් පහළ වන සිත පමණක් දත යුතු බැව්, බුදුරජාණන් වහන්සේගේ අදහස වූ බව ප්‍රකටය.

යස්මිං යස්මිං ඛණෙ යං යං චිත්තං පවත්තති, තං තං සල්ලක්ඛෙන්තො අත්තනො වා චිත්තෙ, පරස්සවා චිත්තෙ කාලෙන වා අත්තනො, කාලෙන වා පරස්ස චිත්තෙ චිත්තානුපස්සී විහරති. [දී. ටී. 2/560]

යස්මිං යස්මිං ඛණෙ	=	යම් යම් ක්ෂණයක
යං යං චිත්තං	=	යම් යම් සිතක් තෙමේ
පවත්තති	=	පහළ වෙයිද

තස්මිං තස්මිං ඛණෙ	=	ඒ ඒ පහළ වන ක්‍ෂණයෙහි, (පෙරදී අනියත ලෙස ඇත්තේ නම්, පසුව නියත නොවී නොහැකි බැවින් මෙසේ දක්වනු ලැබේ.)
තං	=	ඒ ඒ පහළ වමින් පවතින සිත්
සල්ලක්ඛෙනතො	=	මෙනෙහි කරන්නා
අත්තනොවා චිත්තෙ	=	තමාගේ සිත වේවා
පරස්සවා චිත්තෙ	=	අනුන්ගේ සිත වේවා
කාලෙනවා අත්තනො, කාලෙනවා පරස්ස චිත්තෙ	=	වරෙක තම සිතේ වරෙක අනුන්ගේ සිතේ
චිත්තානුපස්සී	=	සිත අනුව බලමින්
විහරති	=	වාසය කරයි.

මෙහි සාමාන්‍ය අර්ථය

පහළ වන අවස්ථාවේම එම පහළ වන සිත මෙනෙහි කරන්නේ නම් සිත අනුව බලනවා යැයි කියනු ලැබේ. *චිත්තානුපස්සනාව* වඩමින් සිටිනවා යැයි කියනු ලැබේ. මේ අට්ඨකථා හි **සල්ලක්ඛෙනතො** යන පදයෙහි හුදු සෘජු පරිවර්ථනයයි. 'මෙනෙහි කරන්නා යන' මෙම පරිවර්තනය තම කැමැත්තට අනුව කියන අර්ථයක් නොවේ. එම නිසා බලනවා, මෙනෙහි කරනවා, මනසිකාරය යොදනවා යන මේ පදයන්, යථාර්ථ වශයෙන් සමාන පදයන්ම යැයි සිතට ගතයුතු.

සමහරෙක් වනාහි *චිත්තානුපස්සනා* භාවනා ක්‍රමය දක්වන ඉහත සඳහන් අට්ඨකථාව කෙරෙහි සැළකිල්ල නොදැක්වීම නිසා එහි සරාග සිත් ආදියෙහි ස්වරූපයන් භාවනා කරන ක්‍රමය දක්වන කථාවක් යයි සළකා "ලෝභ මූල සිත් අට සරාග සිත් යැයිද" යනාදී වශයෙන් ගෙන ඒ මත මනසිකාරය පවත්වන්නාහු, එය චිත්තානුපස්සනාව වේ යැයි කියත්. මෙලෙස පිළිගැනීම, හේතු දැක්වීම වනාහි යට දැක්වූ අට්ඨ කථා වාක්‍යයට සැළකිල්ල නොදැක්වීම, **සරාගනති අට්ඨ විධං ලොභ සහගතං** ආදී දැක්වීම් මගින් ස්වරූපය පමණක් විදහා දැක්වීමට උත්සහා කරන අටඨකථාචාර්‍යයන් වහන්සේලාගේ අදහස වටහා නොගැනීම, විපස්සනා ක්‍ෂෙත්‍රයේ නය

ක්‍රමය තත්ත්වාකාරයෙන් නොවටහා ගැනීම, විපස්සනාවෙහි නියම ස්වභාවය නොවැටහීම යන කරුණු නිසා වන්නාවූ වරදවා සිතාගැනීම්, වැරදි කතාම වන්නාහ. හේතුව වනාහි යට දැක්වූ අට්ඨකථා වාක්‍යයන් මගින් "ඇත්තටම පහළ වන අවස්ථාවේදීම ඒ අනුව මෙනෙහි කිරීමෙන්ම චිත්තානුපස්සනාව සිදුවන බව ප්‍රකටවම දැක්වෙන බැවිනි. නමුත් "ලොභ මූල සිත් අට සරාග සිත් වේ. ලෞකික කුසල- අව්‍යාකත සිත් වනාහි වීතරාග සිත් නම් වේ" යනාදි ලෙසට නොමගින් සළකා බලන්නේ නම් එම තැනැත්තා තම සන්තානයෙහි හෝ අනුන්ගේ සන්තානයන්හි ඇත්තටම පහළ වන සිත්, පහළ වූ සිත්, මතුවට පහළ වන්නාවූ සිත් කෙරෙහි ඇත්තටම මනසිකාරය පවත්වන්නේද? සන්තාන දෙකෙහි, තුන් කාලයෙහි ඇත්කටම පහළ වන සිත් අනුව මනසිකාරය පවත්වන්නේ නැතිනම් කුමන ධර්මයක් මත මනසිකාරය පවත්වනවා වන්නේද? ලෝභ මූල සිත්, *සරාග* සිත් යනාදී නාම ප්‍රඥප්තීන් සහ *ආටාකාර* ආදී සංඛ්‍යා ප්‍රඥප්තීන් මත පමණක් මනසිකාරය පවත්වනවා නොවේද? මෙලෙස ප්‍රඥප්තීන් අනුව යමින් පමණක් සිත යොදන නිසා, සමහර ආචාර්‍යයන් වහන්සේලා දක්වන ලෙසට මනසිකාරය පැවැත්වීම යට කී අට්ඨකථා ආචාර්‍යයන්ට අනුව *චිත්තානුපස්සනා* නම් වූ නියම විපස්සනාව නොවන්නේමය. එම නිසා සමහර ආචාර්‍යයන් වහන්සේලාගේ මෙවන් මත ප්‍රකාශ කිරීම් " වරදවා සිතීම්, වරදවා කීම් පමණක් යැයි" කිව හැක්කේය.

මෙපමණක් නොව වරදට හේතුද ප්‍රකටය. මක්නිසාදයත්: *චෙතොපරියාය අභිඤ්ඤා* දක්වන තැනද **සරාගංවා චිත්තං සරාගං චිත්තන්ති පජානති** ආදී වශයෙන් මේ *චිත්තානුපස්සනා* පාළියට සමානව දේශනා කොට ඇත්තේය. අට්ඨකථාහිදු මෙලෙසටම අර්ථ කථනය කරයි. එම නිසා සමහර ආචාර්‍යයන් වහන්ස්ලාගේ වාද අනුව පිළිගතහොත් "ලෝභ මූල සිත් අට සරාග සිත් නම් වේ. මෙලෙසට මනසිකාරය පැවැත්වීම හෙවත් සළකා බැලීම කළ හැක්කේ නම් *චෙතොපරියාය අභිඤ්ඤාව* පහළ වේ යැයි" කියැවෙනු ඇත. කැලම එසේ නොකියන ලද්දේය. එම නිසා එම අභිඤ්ඤා දැක්වීමෙහිලා "සරාග සිත් ආදියෙහි ස්වරූප පමණක් අට්ඨකථා ආචාර්‍යවරු දක්වත්. *චෙතොපරියාය අභිඤ්ඤාව* වනාහි අනුන්ගේ සිත් පහළ වන ආකාරය ඇතිසැටියෙන් දැනගැනීම යැයි" පිළිගත් බව ප්‍රකටය. එලෙසටම මේ *චිත්තානුපස්සනාව* දැක්වෙන තැනද "**සරාගන්ති අට්ඨ විධං ලොභ සහගතං** ආදී වශයෙන් ස්වරූපයන් පමණක් දක්වයි.

චිත්තානුපස්සනා භාවනා ක්‍රමය වනාහි **යස්මිං යස්මිං ඛණෙ** ආදී වාක්‍යයන් මගින් දක්වයි" යැයි ප්‍රකටය. එම නිසා සතිපට්ඨාන සූත්‍ර පාළි අට්ඨකථා අනුවද වර්තමානව පහළ වන ධර්මයන් පමණක් *පච්චක්ඛ විපස්සනාවෙහි* අරමුණ වන්නේ යයි අවිශ්වාසයෙකින් තොරව සිතට ගතයුතුය.

මේ තාක් දැක්වූ පාළි- අට්ඨකථා- ටීකාවනට අනුවමත්, වර්තමානව පහළවන පහළවන ධර්මයන් මත පමණක් භාවනා කිරීමෙන්ම *පච්චක්ඛ විපස්සනා* කුසලය සිදුවන්නේ යයි *තීරණය* කරන *ධම්මවවත්ථාන ඤාණය* තහවුරු ලෙස පහළ විය හැක්කේය. එසේ නමුත් ඉදින් මෙපමණකින් පිළිගැනීම, වැටහීම අසම්පූර්ණ නම් භාවනා ක්‍රමය උපුටා දක්වනු ලබන පාළි- අට්ඨකථා- ටීකා මගින් එම සැක දුරුවනු ඇත. තවමත් දුරු නොවේ නම්, හයවන පරිච්ඡේදයේ *උදයබ්බයඤාණ භංග ඤාණාදිය* දක්වන්නාවූ පාළි, අට්ඨකථා- ටීකා මඟින් එම සැකයන් දුරු කර ගත හැක්කේය. එම ග්‍රන්ථයන්හි වනාහි *ඛණ පච්චුප්පන්න ධර්ම* මෙනෙහි කරන ඤාණයෙන්ම *පච්චක්ඛ උදයබ්බය ඤාණ, පච්චක්ඛ භංග ඤාණ*යෝ පහළ වන්නේ යැයිද, එම *පච්චක්ඛ ඤාණ* බලවත්වූ විටම අතීත- අනාගත කාලයන් සම්බන්ධයෙන් කරුණු සහිතව සිතා බලන්නාවූ අනුමාන ඤාණය පහළ වන්නේ යැයි කෙළින්ම දක්වා ඇත්තේය. එම ග්‍රන්ථයන් මඟින් සැක දුරුකරගත නොහැක්කේ නම් "*ධම්මවවත්ථාන ඤාණය* නම් වූ ආර්යන්ගේ නිය්‍යානය, සැකය හෙවත් *විචිකිච්ඡා* නම් වන නිය්‍යානාවරණ ධර්මය මඟින් මෙම භවයේදීම මාර්ග- ඵල නිවන් නොලැබිය හැකි ලෙසට වළකාලමින් වසාලමින් පවතින්නේයැයි" කනගාටුව පමණක් ඉතිරි වනු ඇත.

යං කිඤ්චි රූපං අතීත ආනාගත, පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඕළාරිකංවා සුඛුමං වා, හීනංවා පණීතං වා යං දූරේ, සන්තිකේ වා සබ්බං රූපං අනිච්චතො වවත්ථෙති, එකං සම්මසනං [ප.ස 100]

මෙලෙස වූ පටිසම්භිදා මාර්ග පාළියට අනුව අතීත ධර්මයන් ප්‍රථමයෙන් මනසිකාරයට පැවැත් විය යුතු නොවන්නේ දැයි ප්‍රශ්ණයක් විය හැක්කේය. ඒවා වනාහි භාවනා කළ නොයුතු (මෙනෙහි නොකළ යුතු) වන්නේමය. හේතුව වනාහිඃ එම පාළිය සූත්‍ර- අභිධර්මයන්හි දේශනා කොට ඇති ආකාරයට *දෙසනාක්කම* වශයෙන්ම දක්වන ලද පාළිය වෙයි. *පටිපත්තික්කම* වශයෙන් දේශනා කරන ලද පාළි නොවේ. තව දුරටත් එම පාළියෙන් දක්වනු ලබන

සම්මසසන ඤාණයද පච්චක්ඛ විපස්සනාව නොවන්නේය. *අනුමාන විපස්සනාව* වේ. එම නිසා අදාල පාළිය අනුගමනය කරමින් අතීතයෙන් පටන්ගෙන භාවනා කොට බැලිය යුතු යැයි නොකිය යුතු වන්නේමය. මෙය වඩා ප්‍රකට කර දක්වන්නේ නම්, විපස්සනා යනු ද්වාර හයෙහි පහළ වන තාක් ධර්මයන් ඇති සැටියෙන්ම, පහළ වන මොහොතෙහිම අතරක් නොතබා භාවනා කොට බැලීමයි. එලෙස වැඩිය යුතු ධර්මයක් වෙයි. එලෙස බැලීමෙන් පමණක් රූප- නාමයන්ගේ ස්වභාව ලක්ෂණාදිය ඇති සැටියෙන්ම දැකිය හැක්කේය. එම නිසා එම පාළියෙහි ආ ක්‍රමයට අනුවම භාවනා කළ හොත් පහළ වන මොහොතමත සිදුවේද, නැද්ද යන්න කල්පනා කොට බැලිය යුතුය. අතීතය ගත විය, අනාගතය තවමත් පහළ නොවී නම් *පච්චුප්පන්නය* පමණක් පවතින්නේය. පවතින්නේ *පච්චුප්පන්නය* පමණක්ය. පළමුව අනාගතය හමාර කොට *පච්චුප්පන්නයට* එනවා නොවේ. අලුතින්ම පහළවෙනවා වන්නේය. *අජ්ඣත්තය, ඔලාරිකය* ආදිය පහළ වූ පසුව *බහිද්ධා, සුඛුම* ආදිය පහල වනවා නොවේ. එම නිසා අතීත ධර්ම මෙනෙහි කොට බැලූ පසු, අනාගතය ධර්ම බැලුව හොත් මධ්‍යයෙහි ඇති *පච්චුප්පන්නය* නොබැලීම වෙයි. අනාගතය බලා හමාර කළ විටම *පච්චුප්පන්නය* බලන්නේ නම් පෙර- පසු මාරු වුවා මෙන් වන්නේය. උපමාව වශයෙන් දකුණු පියවර යවමින් සිටින විට අනාගතයේ ඊලගට සිදුවෙන වම් පයේ යැවීම මත භාවනා කිරීමෙන් පසුව, නැවතත් යමින් පවතින දකුණු පය භාවනාවෙන් බැලිය යුතු යයි කියන්නේ නම් එය කළහැක්කක් නොවේ. ඉදින් මෙය සිදුවිය හැක්කක් නම් *පච්චුප්පන්නය* බලන *උදයබ්බය ඤාණය, භංග ඤාණය* ආදිය ස්වාභාවික නොවන්නේය. නොගැළපෙන්නේය. ප්‍රථමයෙන් බාහිරය ආදිය භාවනාකළ පසුව *අජ්ඣත්ත* *ය* ආදිය බලන්නේ නම් එය විය හැක්කකි. එම නිසාම අට්ඨකථාහි **බහිද්ධා අභිනිවිසිත්වා අජ්ඣත්තං වුට්ඨාති** යයි දක්වා ඇත. ප්‍රථමයෙන් *බහිද්ධාහි* භාවනා කොට බලා *අනතුරුව අජ්ඣත්තය* භාවනා කිරීමෙන් මාර්ගයට සැපත්වන්නේ යයි කියනු ලැබේ. තවදුරටත් නිරුද්ධ වූ, දැනට අප්‍රකට වූ අතීත ධර්ම, තවම පහළ නොවූ අනාගත ධර්ම මත මනසිකාරය යොදා සළකා බැලීමෙන් වර්තමානව ප්‍රකටව ඇති *පච්චුප්පන්න* ධර්මයන් මත මෙන් ස්වභාව ලක්ෂණාදියක් තත්ත්වාකාරයෙන් ඇස්පනා පිට දැකගත නොහැකි බව කලින් දක්වන ලදි. ස්වභාව ලක්ෂණාදිය තත්ත්වාකාරයෙන් නොදන්නේ අතීත- අනාගතය ආදියෙන් පටන් ගෙන භාවනා කිරීමෙන් *උප්පාද- ඨිති- භංග* යන *සංඛත ලක්ඛණ* තත්ත්වාකාරයෙන් නොදන්නා තැනැත්තාට සන්තති

සනය පවා නොබිඳිය හැකි බැවින්, නියම අනිච්ච, දුක්ඛ, අනත්ත ලක්‍ෂණයන් ඇති සැටියෙන් දන්නා ප්‍රත්‍යක්‍ෂ ඤාණය ඒකාන්තයෙන්ම පහළ විය නොහැක්කේය. එම නිසා දක්වූ පටිසම්භිදා මග්ග පාළිය "කට පාඩම් කොට ඒ පිළිවෙලට භාවනා කළ යුතු යයි" **පටිපත්තිකම** හුවා දක්වන දේශනා පාළියක් නොවේ. සූත්‍ර- අභිධර්ම කටපාඩම් කොට මතක තබාගැනීම පහසුවන ක්‍රමයට දේශනා කරන ලද, දේශනා ආකාරයෙන්ම ගෙනහැර දක්වන ලද පාළියකි.

සම්මසන ඤාණය පච්චක්ඛ ඤාණයක් නොවන බව

එම පාළියෙහි *සම්මසන ඤාණයෙහි* අරමුණු දක්වන *සබ්බං රූපං* ආදියට විශේෂ අවධානය යොමු කොට සළකා බලන්න. එමගින් වරකට එක බැගින් එක් එක් වර්ගයක් එක එකක් වශයෙන් වෙන් කොට ගෙන භාවනා කොට බැලිය යුතු යැයි අදහස් නොකරේ. ඇතිතාක් සියල්ලම පිඩුකොට සමස්ථයක් ලෙස භාවනා කොට බැලීම ම අදහස් කෙරේ. උපමාවක් ලෙස වේදනාවක් බලන විට වරින් වර පහළ වන වේදනා එක එකක් වෙන වෙනම භාවනා කොට බැලීමක් නොව ඇතිතාක් වේදනා සියල්ල පිඬුකොට ගෙන, සමස්ථයක් ලෙස ගෙන භාවනා කොට බැලීමේදී එම ධර්මයන්ගේ ස්වභාව ආදිය වෙන් වෙන් ලක්‍ෂණයන් මත මොහොතකට පහළ වන ඤාණයකින් කෙසේ නම් ඇස් පනාපිට, ප්‍රත්‍යක්‍ෂව දැනගත හැක්කේද? එම නිසා එය *පච්චක්ඛ ඤාණයක්* නොවේ. ඇත්ත වශයෙන් නම් *පච්චක්ඛ ඤාණය* බලවත් වූ විට, මෝරා ආ විට වර්තමාන ලෙස ඇස් පනාපිට දුටු නාම රූපයන් සමඟ අනුමාන වශයෙන් ගළපමින් රූප-වේදනාදිය සමස්ථයක් ලෙස පිඩුකොට ගෙන සිතින් සළකා බලන *අනුමාන ඤාණයක්ම* වේ. මේ '*අනුමාන ඤාණ*'යකි යන තැන වනාහි කුමන " ලෞකික ධර්මයන් භාවනාවෙන් බැලිය යුතුද? කුමන ධර්මයකින් පටන්ගෙන භාවනා කොට බැලිය යුතුදැයි" විශේෂයක් නොමැත්තේය. සහජයෙන්ම ඤාණවන්ත පුද්ගලයන්ට, *සුතමය ඤාන* බලවත් බහුශ්‍රැත පුද්ගලයන්ට වනාහි මේ අවස්ථාවේ පුළුල් ලෙස සම්මර්ශණය කරමින් සිටීම විය හැක්කේය. එම නිසාම පටිසම්භිදා මග්ග, විශුද්ධි මග්ග යන ග්‍රන්ථ වල මෙම ඤාණයන්හි ක්‍රියා ශක්තිය සවිස්තරව දක්වා ඇත්තේය. මෙම *අනුමාන සම්මසන ඤාණය උදයබ්බය ඤාණයේ* මුල් භාගයේ (තරුණ අවස්ථාවේ) පමණක් පහළ වනවා නොවේ. *උදයබ්බ ඤාණ, භංග ඤාණ* මේවා සම්පූර්ණයෙන් බලවත්වූ

අවස්ථායන් හිදීද ස්වකීය සූතමය ඤාණයෙන් පිරිසිඳ ගත හැකිතාක් ප්‍රමාණය සිතින් සළකා බලමින් පහළවිය හැක්කේමය. උදයබ්බය ඤාණ වලට අදාළ වූ සාධක පාළි මත්තෙහි ලියා දක්වන්නෙමු.

අනුමාන විපස්සනාවට නම්

එම *අනුමාන ඤාණය* අවස්ථාවේ රූප- නාම එක එකක්ම වෙන්ව ගෙන භාවනාවෙන් බලනවා නොවේ. සියල්ලම පිඩුකොට සමස්ථයක් ලෙස බැලීමයි. එම නිසා **කලාප සම්මසනය** යැයිද කියනු ලැබේ. වර්තමානව ඇස් පනා පිට දත් රූප- නාමයන් මත න්‍යායානුකූලව මනසිකාරය යොදා බැලීම **නය විපස්සනා, නය දස්සන, නය මනසිකාර** යැයිද කියනු ලැබේ. මෙය **නය දස්සන නය මනසිකාර** නම් වන බව පහත සඳහන් *කථා වත්ථු අට්ඨකථාව* මගින් දත හැක්කේය.

එක සංඛාරස්සාපි අනිච්චතාය දිට්ඨාය සබ්බ සංඛාරා අනිච්චාති අවසෙසු නයතො මනසිකාරො හොති- පෙ- සබ්බෙ සංඛාරා අනිච්චාති ආදි වචනං නයතො දස්සනං සන්ධාය වුත්තං. න එකක්ඛණෙ ආරම්මණතො [අභි. 3/193]

එක සංඛාරස්සාපි	=	එක් සංඛාරයක් මුත්
අනිච්චතාය	=	නිත්‍ය නොවන බව- අනිත්‍ය ලක්‍ෂණය
දිට්ඨාය	=	ඇස්පනාපිට, ප්‍රත්‍යක්ෂ ඤාණයෙන් දුටුවේ නම්
සබ්බෙ සංඛාරා	=	සියලු සංස්කාරයන්
අනිච්චාති	=	නිත්‍ය නොවන්නේයයි
අවසෙසෙසු	=	ඉතිරි සංඛාරයන් මත
වා	=	ඇස්පනාපිට නොදුටු සංස්කාරයන් මත
නයතො	=	න්‍යායානුකූල මනසිකාරය පැතිරීම
හොති	=	විය හැක්කේය
සබ්බෙ සංඛාරා		
අනිච්චාති ආදි වචනං	=	**'සබ්බෙ සංඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති'** ආදි වූ දේශනාව
නයතො දස්සනං සන්ධාන	=	න්‍යායානුකූලව භාවනාකොට බැලීම අදහස් කොට
වුත්තං	=	දේශනා කළ සේක.
එකක්ඛණෙ	=	එකම චිත්ත ක්ෂණයකදී

ආරම්මණතො = ඇස්පනාපිට අරමුණු කිරීම් වශයෙන්
දස්සනං සන්ධාය = බැලීම සඳහා
න වුත්තං = දේශනාකළා නොවේ.

මෙම අට්ඨකථාවෙහි එක **සංඛාරස්සපි** යන තැන **ගරහ ජොතක 'අපි'** ශබ්දය මගින් "එකක් වූ සංඛාරයක අනිච්ච ලක්‍ෂණය දැකීමෙන් පමණකුදු සංඛාර සියල්ලෙහි අනිච්චතාව දක්නාම වේ. බොහෝ වූ සංඛාරයන්ගේ අනිච්ච ලක්‍ෂණය බොහෝ වාර ගණනක් ඇස් පනා පිට දුටුකල්හි වනාහි අනුමාන යැයි කියන නය මනසිකාරය පහළ වන බව අමුතුවෙන් කිව යුත්තක් නැත්තේයැයි" දක්වයි. **අනිච්චතාය දිට්ඨාය** යන දැක්වීමෙන් *පච්චක්ඛ විපස්සනා* මාර්ගයෙන් දැකීම කියයි. **අවසෙසෙසු වය තො මනසිකාරො** යන දැක්වීමෙන් වර්තමානව ඇස් පනාපිට නොදුටු - සංඛාරයන් මත *නය මනසිකාර, නය දස්සන, නය විපස්සනා* නම් වූ අනුමාන ඥාණය පහළ වියහැකි බව දක්වයි. මේවා සමස්ථයක් ලෙස ගොනුකොට සම්මර්ශනය කරන නිසා *කලාප සම්මස්සන* යැයිද විශුද්ධි මාර්ගයේ දක්වේ. **නයතො දස්සනං සන්ධාය වුත්තං** ආදිය මගින්

සබ්බෙ සංඛාරා අනිච්චා
සබ්බෙ සංඛාරා දුක්ඛාති
සබ්බෙ ධම්මා අනත්තාති
යදා පඤ්ඤාය පස්සති

ආදි දේශනා යම් තාක්ද ඒ සියල්ල "*පච්චක්ඛ ඥාණය* මගින් පමණක් භාවනා කිරීම අදහස් නොකරයි. *පච්චක්ඛ ඥාණයෙන්* භාවනා කොට බලා පසුව සංඛාර සියල්ල පිඬුකොටගෙන නය ක්‍රමයට අනුව භාවනා කොට බැලීමම දක්වයි" යැයි දතයුතුය. මෙවැනි දේශනාවන් '*අනුමාන ඥාණයෙන්* භාවනා කොට බැලීම අදහස්කොට පවත්වන ලද දේශනාවෝය. වැලිත් පච්චක්ඛ ඥාණයෙන් භාවනා කිරීමම අදහස් කොට පවත්වන ලද දේශනා නොවන්නේය' යන්න අදහසයි. මේ *අට්ඨකථා* අනුව *අනුමාන විපස්සනාව* වනාහි ප්‍රථමයෙන් පටන්ගෙන අනුක්‍රමයෙන් වැඩිය යුතු වූ ඥාණයක් නොවේ. එකම සංස්කාරයක හෝ බොහෝ සංස්කාරයන්හි *අනිච්ච ලක්‍ෂණය* ආදිය *පච්චක්ඛ ඥාණයෙන්* දැක- දැනගත් පසුව ඉබේ පහළ වන ඥාණයක් වේ. මෙවන් වූ *සම්මසන ඥාණ* පෙරාතුව ගමන් කරන, පූර්වංගම ඥානයන් නොවේ. පසුව, අනුව යන *අනුමාන ඥාණයක්ම* වන බැවින්ද සම්මස්සන ඥාණ කොටසට අදාල පාළිය

ආශ්‍රය කොට "අතීතයෙන් පටන් ගෙන භාවනා කළ යුතු යැ" යි නොගත යුතු වෙන්නේමය. මෙහිලා විශේෂයෙන් කිවයුත්ත නම් *විශුද්ධි මග්ගයෙහි පාළි මුතතක අට්ඨකථා* හි දක්වන *සම්මසන* භාවනා ක්‍රමයන් තුළ *රූප සතතකයෙහි වයො වුද්ධංගම* නම් වන අවසාන කොටස හා *ආහාර, උතු, කම්ම, චිත්ත සමුට්ඨාන* ක්‍රමයන්ද *අරූප සතතකයෙහි යමක* ආදී ක්‍රම හය ද *පච්චකඛ විපසසනාවට* ඇතුළත් වේ. එම ක්‍රමයන්හි රූප- නාම අරමුණු බොහො සේ ප්‍රත්‍යුත්පන්න වේ.

භාවනා ක්‍රමය සාධනය කිරීම

දැන් සමථ යානිකයන්ගේ විපසසනා භාවනා ක්‍රමය අනුගත සාධක මාර්ගයෙන් (සුද්ධ විපස්සනා) ක්‍රමයගෙනහැර දක්වන්නෙමු. අරමුණ :මෙම ග්‍රන්ථයේ පෙන්වන සුද්ධ විපස්සනා භාවනා ක්‍රමයන් සතිපට්ඨාන පාළියෙහි කෙළින්ම දේශනා කරන ලද ක්‍රමයම වේ. අනෙකුත් පාළි දේශනා වලටද අනුකූලය. නමුදු මෙම ක්‍රම සාධනය(**නයගගාහ**) තත්ත්වාකාරයෙන් නොදකින සමහරෙක් මෙම (සුදධ විපසසනායානික) සතිපට්ඨාන භාවනා ක්‍රමය මත උපදවාගත් වැරදි හැඟීම් තවමත් නොසිඳ පැවැත්වීමට ඉඩ ඇත්තේය. එවැනි හැඟීම් හෝ වරදවා වටහා ගැනීම් මෙම සාධනය මගින් දුරුකොට ධම්මවවත්ථාන ඤාණය තිරලෙස පිහිටුවීම මෙහි අරමුණයි.

ඉධ භිකඛවේ භිකඛු විවචෙචව කාමෙහි විවචෙචව අකුසලෙහි ධමෙමහි සවිතකකං සවිචාරං විවේකජං පීති සුඛං පඨමජඣානං උපසමපජ්ජ විහරති, " සො යදෙව තතථ හොති රූප ගතං වේදනා ගතං සඤඤා ගතං සංඛාර ගතං විඤඤාණ ගතං "තෙ ධමෙම අනිචචතො දුකඛතො රොගතො ගණඩතො සලලතො අඝතො, ආබාධතො පරතො පලොකතො සුඤඤතො අනතතතො සමනුපසසති

[අං. නි. 5/488]

භිකඛවෙ	=	මහණෙනි
ඉධ	=	මෙම උතුම් සාසනයෙහි
භිකඛු	=	මහණ තෙම
විවචෙචව කාමෙහි	=	කාමයන්ගෙන් වෙන්ව
විවචෙචව අකුසලෙහි ධමෙමහි	=	අකුසල ධර්මයන්ගෙන් වෙන්ව
සවිතකකං සවිචාරං	=	විතක්ක- විචාර සහිත
විවේකජං පීති සුඛං	=	නීවරණ දුරුවීම නිසා වූ ප්‍රීති- සුඛ සහිතවූ

පඨමං ඣානං = ප්‍රථම ධ්‍යානයට

උපසම්පජ්ජ = පත්වී, සමවැදී

විහරති = වාසය කරයි.

තත්ථ = එම ප්‍රථම ධ්‍යානය පවතින ක්ෂණයෙහි

යදෙව රූපගතං,

වේදනාගතං, සඤ්ඤාගතං,

සංඛාරගතං විඤ්ඤාණගතං= එම රූප, වේදනා, සඤ්ඤා සංඛාර විඤ්ඤාණ පමණක්

හොති = වෙයි

සො = එම භික්ෂුව

තෙ ධම්මෙ = එම රූප, වේදනා සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ ධර්මයන්

අනිච්චතො සමනුපස්සති = අනිත්‍ය යැයි භාවනාවෙන් බලයි.

දුක්ඛතො සමනුපස්සති = දුකක්යැයි භාවනාවෙන් බලයි.

රොගතො සමනුපස්සති = උණ ආදී රෝගයකැයි භාවනාවෙන් බලයි.

ගණ්ඩතො සමනුපස්සති = ගඩුවක් සේ යැයි භාවනාවෙන් බලයි.

සල්ලතො සමනුපස්සති = උලක් සේ යැයි භාවනාවෙන් බලයි.

අඝතො සමනුපස්සති = පීඩාවක් යැයි, විපතක් යැයි භාවනාවෙන් බලයි.

ආබාධතො සමනුපස්සති = ආබාධයක්සේ යැයි භාවනාවෙන් බලයි.

පරතො සමනුපස්සති = අනෙකෙකුගේ සේ යැයි භාවනාවෙන් බලයි.

පලොකතො සමනුපස්සති = භංගුර- බිඳෙනසුළු යැයි බලයි.

සුඤ්ඤතො සමනුපස්සති = ශුන්‍ය වූවක් සේ යැයි භාවනාවෙන් බලයි.

අනත්තතො සමනුපස්සති = තමාගේ වශයෙහි පැවැත්විය නොහැක්කක් සේ යැයි භාවනාවෙන් බලයි.

ඉහත දක්වූ පාළියෙහි ධ්‍යාන ලාභී භික්ෂුව විපස්සනාවට බැසීමට කලින්, ප්‍රථමයෙන් පාදක ධ්‍යානය ලෙස ප්‍රථම ධ්‍යානයට සමවැදී එයින් නැගී සිටි වහාම ඒ මත විපස්සනා කරයි. භාවනා කරන්නේ අනෙකක් ගැන සිතමින් නොවේ. එම ප්‍රථම ධ්‍යානය පැවති අවස්ථාවේ ප්‍රකටව තිබූ ස්කන්ධයන්ම යැයි දක්වේ. තවදුරටත් ඉතිරි රූප-අරූප ධ්‍යානයන්ටද පළමුව සමවැදී පසුව එයින් නැගී ඒ මත භාවනා කිරීමද මෙම සූත්‍රයේ දක්වා ඇත්තේය. එම නිසා 'ධ්‍යානයකට ප්‍රථමයෙන් සමවැදී එම ධ්‍යානයෙන් නැගී, ධ්‍යාන සමාපත්තිය පැවති විට ප්‍රකටව තිබූ රූප-නාමයන් මත

භාවනා කරයි' යැයි පමණක් පාළි දේශනාවෙහි ඇත්තේය. "පොතේ දැනුමෙන්, සුතමය ඥාණ ආශ්‍රයෙන්, අනුමාන කොට භාවනා කරයි" යැයි දක්වන දේශනාපාළි වනාහි නොමැත්තේය. මේ කාරණය භාවනා ක්‍රමය වටහා ගැනීමේදී සැලකිල්ලෙන් වටහා ගතයුතු.

මේ ඉහත දැක්වූ සූත්‍රයෙහි **අනිච්චතො** ආදී ලෙසින් දේශනාකොට ඇති නිසා "අනිච්චානුපසසනා ආදී අවස්ථාවන්හිදී එලෙස බැලිය යුතු නමුත්, නාම- රූප පරිච්ඡේද, පච්චය පරිග්ගහ යන ඥාණ අවස්ථාවන්හි එලෙස රූප- නාමයන් නුවණින් සළකා බැලිය යුතු" යැයි යන ලෙසට මේ කාරණය වරදවා ගතයුතු නැත. ප්‍රධාන වූ **අනිච්චාදී** විපස්සනා දැක්වීමේදී අප්‍රධාන වූ අනෙකුත් ඥාණයන් දෙකද ඇතුළත් බව භාවනා ක්‍රම දෙක වෙන්කොට දක්වන තැන (පළමු කොටසේ 88 පිටුවෙහි) දැක්වීය. එම නිසාම මෙම පාළිය ආශ්‍රය කොට විශුද්ධි මාර්ගයෙහි පහත දැක්වෙන ලෙසට අනුශාසනා කරයි.

නාම-රූපානං යාථාව දසසනං දිටඨි විසුදධි නාම, තං සමපාදෙතු-කාමේන සමථ යානිකෙන තාව ඨපෙත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං අවසෙස රූපාරූපාවචරජ්ඣානානං අඤ්ඤතරතො වුට්ඨාය විතක්කාදීනි ඣානංගානි, තං සමපයුත්තකා ච ධම්මා ලක්ඛණ රසාදි වසෙන පරිග්ගහෙ තබ්බා. [වි. මා. 441]

නාම-රූපානං = නාම රූපයන්
යාථාව දසසනං = තතුසේ දැකීම
දිටඨි විසුදධි නාම = දිට්ඨි විශුද්ධිය නම් වේ.
තං = එම දිට්ඨි විශුද්ධිය
සමපාදෙතු කාමෙන = සම්පාදනයට කැමති
සමථ යානිකෙන = සමථයානික පුද්ගලයා විසින්
තාව = ප්‍රථමයෙන්
නෙවසඤ්ඤානාසඤ්ඤායතනං
ඨපෙත්වා = නෙවසඤ්ඤානාසඤ්ඤායතනය හැර
අවසෙස රූපාරූපාවචරජ්ඣානානං = ඉතිරි රූප- අරූප ධ්‍යාන අතරින්
අඤ්ඤතරතො = කිසියම් ධ්‍යානයකින්
වුට්ඨාය = නැගීසිට
විතක්කාදීනි ඣානාංගානි ච = විතක්ක ආදී ධ්‍යානංගයන්ද
තං සමපයුත්තකා ච ධම්මා = එම ධ්‍යානය හා යෙදෙන සඤ්ඤා, චෙතනා, සිත ආදී ධර්මයන්ද

ලකඛණ රසාදි වසෙන = සභාව ලක්ෂණ රස ආදී වශයෙන්
පරිගගහෙතබබා = පරිග්‍රහ කරමින් භාවනා කළ යුතුය.

අර්ථය සංක්ෂෙපයෙන්

නාම- රූපයන් තතුවූ පරිද්දෙන් දැනගන්නා ඤාණය දිට්ඨි විශුද්ධිය නම් වේ. එම විශුද්ධිය අතින් අංග සම්පූර්ණ වූ විට සමථයානික පුද්ගලයා වනාහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනය හැර ඉතිරි කැමති රූප- අරූප ධ්‍යානයකට ප්‍රථමයෙන් සමවැදී ඉන් නැගීසිටිය යුතු වේ. එම ධ්‍යානයෙන් නැගී සිටි විට එම ධ්‍යාන චිත්තුප්පාදයන්හි යෙදෙන, ප්‍රකටව පැනෙන *විතක්ක, විචාර, පීති, සුඛ, උපෙක්ඛා, එකග්ගතා* යන ධ්‍යාන අංගයන් අනුව විපස්සනා කළයුතු වේ. එම ධ්‍යානය හා සම්ප්‍රයුක්ත වන්නාවූ *ඵස්ස, සඤ්ඤා, චේතනා, චිත්ත, ඡන්ද* ආදී වූ නාම ධර්මයන්ද විපස්සනා කළයුතු වේ.

මෙහිලා ලකඛණ රසාදි වසෙන යන පදයෙන් 'ධ්‍යානාංග ධර්ම, සම්ප්‍රයුක්ත චිත්ත- චෛතසික ධර්ම පරිග්‍රහ කොට භාවනා කළයුතුයි' යනු එම ධර්මයන්ගේ ස්වභාව ලක්‍ෂණ රසාදිය, පරිග්‍රහ කොට භාවනා කිරීම, භාවනා කොට දැක- දැන ගැනීමයි. 'එම ධර්මයන්හි නම්, සටහන්, සංඛ්‍යාව ආදිය, පරිග්‍රහ කිරීම, භාවනා කිරීම දැනගැනීම නොවේ' යන අර්ථය දක්වයි. උපමාවක් ලෙස **අභිධම්මං එකදෙසවසෙන ජානාමි** - අභිධර්මය එක ප්‍රදේශයක් වශයෙන් දන්නේ යයි කියන තැන- අභිධර්මය දන්නේ යයි කියන නමුත් සියල්ලම දන්නවා නොවේ. එක කොටසක් පමණක් දන්නේයයි කියන්නාසේද, **චන්දං හෙට්ඨිමතලවසෙන පස්සාමි** = සඳ යට තලය වශයෙන් පමණක් දකින්නෙමියි කියන තැන- සඳ දකින්නෙමියි කියන නමුදු සඳ හාත්පසින්ම දකිනවා නොවේ. සඳේ යට තලය පමණක් දකින්නේමියි කියන්නා සේද ලක්ඛණ රසාදී වශයෙන් පරිග්‍රහ කළයුතු යැයි දක්වන මේ අවස්ථාවේහිදී එම ධ්‍යාන ධර්ම, සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ගේ ලක්‍ෂණ රස, ආදිය පමණක් පරිග්‍රහ කොට භාවනා කළ යුතු යැයි කියැවේ. නමුදු පරමාර්ථ වශයෙන් වනාහි ලක්‍ෂණාදිය පමණක් නියම පරමාර්ථ වන්නාහ. ලකෂණාදියත් හැර 'පරමාර්ථ ධර්මය'යි දෙයක් වෙනම නැත්තේය. එම නිසා ලක්‍ෂණාදිය දැනගැනීම පරමාර්ථ ධර්මයන්ගේ කොටසක් පමණක් දැනගන්නවා නොවේ. පරමාර්ථ සියල්ල අංග සම්පූර්ණ ලෙස දැන ගැනීම වන්නේමය. උපමාවක් ලෙස සිත හා අරමුණ හැපීම නම් වූ **ඵුසන ලකඛණය** දැනගැනීම

යනු එස්සයේ එක දේශයක් දැනගැනීම නොවේ. එසසය සම්පූර්ණයෙන්ම දැනගැනීම වන්නා සේය. **එසෙන** යන පදයෙන් දක්වන අර්ථය මේ ක්‍රමයට ගන්නා අවස්ථා බොහෝ විට යෙදෙන්නේමය. ප්‍රඥාවන්තයන් මෙය සැලකිල්ලට ගනිත්වා.

ආදිකම්මික යෝගාවචරයාට භාවනා කොට බැලිය නොහැකි නිසා *නෙවසඤ්ඤානාසඤ්ඤායතන* ධ්‍යානය අතහැර දමන්න යැයි ටීකාවෙහි කරුණු දක්වයි. අනුපද සූත්‍රයෙහිලා විශේෂයෙන් විස්තර පසුව දක්වන්නෙමු. තවදුරටත් පරිග්‍රහ කළ යුතු ධර්ම දක්වන තැන පාළියෙහි මෙන් රූප නොදැක්වීමට හේතුව වනාහි සමථ යානිකයනට බහුල වශයෙන් *ධ්‍යාන චිත්තුප්පාද* නාම ධර්ම ප්‍රථමයෙන් ප්‍රකටවන නිසාය. එම නිසා එම නාමයන්ගෙන් පටන්ගෙන භාවනා කිරීම බොහෝ සේ සිදුවේ. රූපයන් ප්‍රථමයෙන් ප්‍රකට කරගෙන, එයින් පටන්ගෙන භාවනා කිරීමේ අවස්ථා අල්පය, එම අල්පය වූ භාවනා ක්‍රමයද විපස්සනායානිකයාගේ භාවනා ක්‍රමය හා සම්බන්ධ කොට මෙහි පසුව දක්වන්නේමු. එම නිසා, මෙහිලා බහුල ක්‍රමය දක්වන බැවින් රූප ධර්ම නොදක්වා බැහැර කිරීම කෙරේ. එසේම තවදුරටත් නාම ධර්ම ප්‍රධාන කොට භාවනා කරන ක්‍රමය දක්වන නිසාද රූපය නොදක්වා බැහැර කිරීම සිදුවේ. එසේම රූප- නාම දෙකම එකවර භාවනා කළ නොහැකි බැවින්ද රූපයන් නොදක්වා හැර දැමීම සිදුවේ. එම නිසාම එම ධ්‍යානයක් ඇසුරු කරන හෘදය රූපය භාවනා කරන ආකාරය වෙනමම දැක්වේ. එම නිසා මෙය විශුද්ධි මාර්ග කථාව යට දැක්වූ අංගුත්තර පාළිය හා ගැළපෙන්නේමය. *නෙවසඤ්ඤානාසඤ්ඤායතන* ධ්‍යානයද, රූපයන්ද පරිග්‍රහ කරන ක්‍රමය නොදැක්වූ බැවින් පාළියෙහි මෙන් නොව මෙහි අසම්පූර්ණ යැයි නොසිතිය යුතුය. මේ සඳහා සාධක තුනක් ඇසුරු කොට ගෙන හේතු දක්වන්නෙමු.

අරූපෙ විපස්සනාභිනිවේසො යෙභුය්‍යෙන සමථ යානිකස්ස හොති

[මහා ටී. (බු.) 2/270]

අරූපෙ	=	නාමයන් කෙරෙහි
විපස්සනාභිනිවේසො	=	විපස්සනා ප්‍රවේශය
යෙභුය්‍යෙන	=	බොහෝ සේ
සමථයානිකස්ස	=	සමථයානිකයාට
හොති	=	වන්නේය.

(රූපයන් ගෙන් පටන්ගෙන භාවනා කිරීම විරල යයි නැවත සිහිකර ගනු වටී. මෙය පළමුවෙනි සාධකයයි.)

විපස්සනායානිකයකු වන්නේ නම් රූපයෙන් පටන් ගෙන භාවනා කිරීම අධිකය. නාමයන්ගෙන් පටන් ගෙන භාවනා කිරීම අල්පය. එම නිසා එම ටීකාහිම "**රූපෙ විපස්සනාභිනිවේසො යෙභුය්‍යෙන විපස්සනා යානිකස්ස හොති**" යි දැක්වේ. එම ටීකාවට අනුව රූපයන්ගෙන් පටන්ගෙන භාවනා කරන ක්‍රමය මෙහි පස්වන පරිච්ඡේදයේදී හමුවනු ඇත.

ඣානංගානි පරිග්ගණ්හාති අරූපමුඛෙන විපස්සනං අභිනිවිස්සනෙතා

[දී. ටී. 200]

අරූප මුඛෙන = නාමය මුල් කරගත් බැවින්, නාමය ප්‍රධාන කරගත් බැවින්,

විපස්සනං = විපස්සනාවට

අභිනිවිස්සනෙතා = පිවිසෙන පුද්ගලයා

ඣානංගානි = ධ්‍යානාංගයන්

පරිග්ගණ්හාති = පරිග්‍රහ කරයි. (මෙය දෙවෙනි සාධකයයි)

මේ ටීකාහි **අරූප මුඛෙන** යන පදයෙන් "එකට පැනනැගුණු නාම-රූපයන් අතරින් ප්‍රකට වූ නාමයන්ගෙන් පටන්ගෙන භාවනා කරයි. රූපයන් මත වනාහී වෙනමම භාවනා නොකරයි. නමුදු එම නාමයන් ප්‍රධාන කොට භාවනා කිරීමෙන්ම නාම- රූප යන දෙකම භාවනා කිරීමේ කෘත්‍යය සම්පූර්ණ වේ යැයි" යන්න දක්වයි. එලෙසටම ප්‍රකට වූ රූප ප්‍රධාන කොට භාවනා කිරීමෙන්ම, නාමයන් විශේෂයෙන් ගෙන භාවනා නොකරම, රූප- නාම භාවනා කිරීමේ කෘත්‍යය සම්පූර්ණ වේයයි සළකා ගතයුතු වේ. එම නිසා එම ටීකාවෙහිම **අස්සාස පස්සාසෙ පරිග්ගණ්හාති රූප මුඛෙන විපස්සනං අභිනිවිස්සනෙතා** යි දක්වයි.

රූප මුඛෙන = රූපය මුඛයෙන්

වා = රූප ප්‍රධාන කොට

විපස්සනං = විපස්සනාවට

අභිනිවිස්සනෙතා = පිවිසෙන ආනාපාන ධ්‍යානලාභි පුද්ගලයා

අස්සාස පස්සාසෙ = හුස්ම ගැනීම-හෙළීම

පරිග්ගණ්හාති = පරිග්‍රහ කරයි.

ආනාපානය මත විපස්සනා කරන ආකාරය.

ඉහත දැක්වූ ටීකාව ආනාපාන ධ්‍යානය ලැබූ පුද්ගලයාට විපස්සනාව පිවිසෙන ආකාරය දක්වන **"සො ඣානා වුට්ඨහිත්වා අසසාස පසසාසෙ වා පරිගගණ්හාති ඣානංගානි වා"** යන ලෙසට අට්ඨකථාවෙහි දැක්වෙන නිසාම *'අසසාස පසසාසය* අනුව භාවනා කරයි' යන්න පමණක්ම දක්වයි. එම නිසා රූපය ප්‍රධාන කොට විපස්සනාව පටන් ගන්නා සමථ යානික පුද්ගලයා අනෙක් රූපයන් ද භාවනා කළ යුතු යැයි සළකා ගත යුතුය. විශේෂයෙන් සැළකිය යුත්ත නම්, "*අසසාස- පසසාස* අනුව භාවනා කිරීම සමථයම වේ. විපස්සනා නොවන්නේ යැයි" වරදවා සිතීම, වරදවා වටහා ගැනීම සිදු නොවීම පිණිස මෙම අට්ඨකථා- ටීකාවන්ට විශේෂ අවධානය යොමු කළ යුතුය. මෙහිලා "ධ්‍යානයෙන් නැගිට පරිග්‍රහ කරයි" යැයි දක්වන නිසා ධ්‍යානලාභීනට පමණක් විපස්සනාව ගෝචර වේ යැයිද *අයොනිසොමනසිකාරයෙන් දුගගහිතගාහීව* (-වැරදි ලෙස ගෙන) කල්පනා නොකළ යුතුය. හේතුව වනාහි ඇස් පනාපිට ප්‍රකට කාමාවචර ධර්ම අතරින් අසවල් ධර්මය මත පමණක් සමථයානිකයා භාවනා කළ යුතුය. විපස්සනා යානිකයකු වන්නේ නම් වනාහි භාවනා නොකළ යුතු යැයි කියන කථා කුමන පාළි- අට්ඨකථා- ටීකාවකවත් නොමැත්තේය. ඇත්තවශයෙන් නම් කිසියම් කාමාවචර ධර්මයන් මත භාවනා කොට සමථයානිකයනට විපස්සනාව සිදුවිය හැකි නම් වර්තමානව ඇස්පනා පිට ප්‍රකට එවන් ඕනෑම කාමාවචර ධර්මයක් මත භාවනා කිරීමෙන් විපස්සනායානිකයාටද සුද්ධ විපස්සනාව සිදුවන්නේමය. නොවීමට හේතු කිසිත් නැත. මෙහිලා විශේෂය නම්, ධ්‍යාන ලාභි වේවා- ලාභි නොවේවා *අසසාස - පසසාස* සටහණ - නිමිත්ත අනුමාන කොට භාවනා කරන්නේ සමථයම වේ. *විපසසනාව* නොවේ. හැපීම්, චලනාදියට ප්‍රධාන තැන දී භාවනා කරන්නේ නම් විපස්සනාවම වේ. ධ්‍යාන මාර්ගයේ සමථය සිදුනොවේ. එම නිසාම (ම. නි.) උපරිපණ්ණාස ආනාපානසති සූත්‍රයෙහි ලා **කායෙසු කායඤ්ඤතරායං භික්ඛවේ එවං වදාමි යදිදං අසසාස පසසාසා** යැයි දේශනා කොට ඇත්තේය.

භික්ඛවෙ	=	මහණෙනි
යදිදං යෙ ඉමෙ අසසාස පසසාසා	=	යම් වූ ආශ්වාස- ප්‍රශ්වාසයෝ
සන්ති	=	ඇත්තාහුද
තෙ	=	එම ආශ්වාස- ප්‍රශ්වාසයන්
කායෙසු	=	පඨවි ආපො තෙජො වායො යන සතර කයෙහි

අඤ්ඤතරං කායං = එකක්වූ, වායො කය ගෙන (වෙනත් ආකාරයකට දක්වතොත්)

කායෙසු = 25 ආකාර රූප කායයන්ගෙන්

කායඤ්ඤතරං = පොට්ඨබ්බායතනයට අයත් වායෝ ධාතුව පමණක්

අහං = මම

එවං වදාමි = මෙසේ දේශනා කරමි.

කායඤ්ඤතරන්ති පඨවි කායාදීසු චතුසු කායෙසු අඤ්ඤතරං වදාමි, වායො කායං වදාමීති අත්ථො, අථවා චක්ඛායතන නං -පෙ-කබළීකාරො ආහාරොති පඤ්චවීසති රූප කොට්ඨාසා රූපකායො නාම, තෙසු ආනාපානං ඵොට්ඨබ්බායතනෙ සංගහිතත්තා කායඤ්ඤතරං හොති, තස්මාපි එවමාහ" යන අට්ඨකථාවට අනුව අර්ථ දෙකක් දෙයි. රූප 25 යනු *ධම්මසංගණී* හි කෙළින්ම දේශනා කරන ලද රූප 25 ම වෙත්. (ම.නි.)*මූල පණ්ණාස මහා ගොපාල* සූත්‍ර හා අංගුත්තර නිකායේ *ගොපාල* සූත්‍ර යන අටුවාවන්හි එම 25 ම දක්වා ඇත්තේය.

රූපාරූප ධම්මානං අච්චන්ත විධුරතාය එකජ්ඣං අසම්මසිතබ්බතා

[මහා ටී. 1/7]

රූපාරූප ධම්මානං = රූප ධර්ම - නාම ධර්මයන්හි

අච්චන්ත විධුරතා = කෙළින්ම එකිනෙකට ප්‍රතිවිරුද්ධ බැවින්

එකජ්ඣං = එකතුව

අසම්මසිතබ්බතා = සම්මස්සනය නොකළ යුතු.

(මෙය තුන්වන සාධකයයි. රූපයට අරමුණ නොදත හැකි බව හා නාමයට අරමුණ දත හැකි බව යන ලෙසට කෙළින්ම එකිනෙක ප්‍රතිවිරුද්ධ වන නිසා ප්‍රත්‍යක්ෂ ඥාණ විෂයෙහි රූප සහ නාම දෙක එකට අරමුණු කළ නොහැක්කේය. ලැබිය නොහැක්කේය යනු අර්ථයි.)

මේ තාක් දක්වන ලද කරුණු වලට අනුව "සමථයානිකයා තම සන්තානයේ වර්තමාන වශයෙන් පහල වන ධ්‍යාන චිත්තුප්පාද නාම ධර්ම හෝ එම සිත ඇසුරු කරන රූප ධර්ම හෝ ප්‍රකට වන්නාවූ වෙනත් යම්කිසි රූප ධර්මයක් යන මේවා අතරින් ප්‍රකට වූ යම් ධර්මයක් ප්‍රධාන කොට භාවනා කරන බැවින් දක්වන ලද අංගුත්තර නිකාය පාළිය සමග විසුද්ධි මාර්ගය සම බවක් දක්වයි" යන්න ප්‍රකටය. එම නිසා සමථයානිකයාගේ භාවනා ක්‍රමය ආදර්ශ සාධකයක් ලෙස ගන්නේ නම් "විපස්සනායානිකයාද

තම සන්තානයේ වර්තමානයේ පවතින රූප- නාමයන් තුළින් එකක්ම ප්‍රධාන කොට ගෙන භාවනා කළ යුතු යැයි" ඒ අනුව දත යුතුය. සැළකිය යුතු විශේෂය වනාහී සමථයානිකයාට සමවැදිය හැකි ධ්‍යානයක් ඇති අතර එම ධ්‍යානාදී ධර්මයන් මත භාවනා කළයුතුවේ. විපස්සනායානිකයාට වනාහී ධ්‍යාන නොමැති බැවින් තමා තුල ඇති දුකීම කරන සිත ආදිය මතම භාවනා කළ යුතුය. වෙනසකට වටහා ගත යුත්තේ එපමණකි. භාවනා ක්‍රමයේ නම් වෙනසක් නොමැත.

එම නිසා විපස්සනායානික පුද්ගලයා දකින ක්‍ෂණයේ දී දකින *චිත්ත-චෛතසික* සංඛ්‍යාත නාමයන් වේවා, එම නාම ධර්ම ඇසුරු කරන රූපයන් වේවා, දකින වර්ණ රූපයන් හෝ වේවා භාවනා කොට බැලිය යුතුය. අසන- ආඝ්‍රාහනය කරන- රස බලන- පහස විඳින ක්‍ෂණයෙහිදීද, මේ දැක්වූ ලෙසටම බව දත යුතුය. සිතන අවස්ථාවේහි, කල්පනා කරන, සළකා බැලීම් කරන, මෙනෙහි කරන අවස්ථාවෙහි *චිත්ත- චෛතසික* නාම ධර්ම වේවා, එම නාමයන් ඇසුර ලබන රූපයන් හෝ වේවා, අරමුණු කරන ලද නාම- රූප වේවා, සිත නිසා පහළ වූ රූපයන් හෝ වේවා, ඉදිරිපත් කර ගෙන භාවනා කළ යුතුවේ. මෙලෙස භාවනා කරන්නාවූ අවස්ථාවේ එක චිත්තක්ෂණයක් තුල ඇතිතාක් නාම- රූප, අභිධර්ම පොත් වල ගොණු කොට, ලැයිස්තු කොට දක්වා ඇති ලෙසට ඒවා සම්පූර්ණ කිරීම සඳහා කල්පනා කරමින්, සොයා යමින් භාවනා කරනවා නොවේ. විශේෂයෙන් ප්‍රකට ධර්මයක් ප්‍රධාන කොට භාවනා කළ යුතුයි. "**අත්තනො අභිනිහාර සමුදාගත ඤාණබලානුරූපං එකදෙසමෙව පරිග්ගහිත්වා සම්මසන්තො - රූප මුඛෙන, අරූප මුඛෙන විපස්සනං අභිනිවිසතෙතා**" යන ටීකා දැක්වීම සළකා බලන්න. රූප දෙක තුනක් හෝ නාම දෙක තුනක් යන ආකාරයට ප්‍රත්‍යක්ෂ වශයෙන් එක වර භාවනා වෙන් නොබැලිය හැක්කේය. හේතුව වනාහී *පඨවි, ඵස්ස* ආදී රූප- නාම එකක් සහ *ආපො, වේදනාදී* අනෙකුත් රූප- නාමයන් ස්වභාව ලක්‍ෂණාදිය වශයෙන් සමාන නොවන බැවිනි. එකිනෙකට වෙනස් වූ එම ස්වභාව ලක්ෂණාදිය සමූහ වශයෙන් ඇස්පනා පිට අරමුණු කළ නොහැකි බවයි. වටහා ගත නොහැකි බවයි. නමුදු ප්‍රකට වූ රූප- නාම එකක් මත භාවනා කොට වටහා ගන්නේ නම්, ඒ සමග එකට පහළ වන රූප- නාම විපස්සනා කිරීමේ කෘත්‍යය, දනගැනීමේ කෘත්‍යය සම්‍පූර්ණ වේමය.

ධාතු හතර පවා සම්පූර්ණයෙන් නොදැන රහත් බවට පත්විය හැකි ආකාරය.

මාර්ග- ඵලයන්ට පත්වූ තාක් උතුමන් වහන්සේලා රූප-නාමයන් දැන ගැනීම අතින් සමාන යැයි ද, පාළි- අට්ඨකථා හී විස්ථාර වශයෙන් දක්වන ලෙසට සියල්ල දැනගත් විටම මාර්ග ඵලයන්ට පත්විය හැකි ද යැයි ද සිතිය හැකිය. නමුත් මෙය මෙලෙසටම සිතිය යුතු නොවේ. මක්නිසාද යත්ඃ තමාගේ පාරමී ඤාණ ශක්ති ප්‍රමාණය අනුව දැන ගැනීම සිදුවන බැවිනි. තවදුරටත් විස්තර වශයෙන් දක්වතොත්, උසස් තීක්ෂණ භව්‍ය පුද්ගලයකු වන්නේ නම් ශ්‍රාවක ක්ෂේත්‍රයේ අංග සම්පූර්ණ ලෙසත් විස්ථාර ලෙසත් දැනීමක් ලද හැක්කේය. නමුත් අභිධර්ම දේශනාවට අනුව වනාහී දැනගත නොහැක්කේය. අනුපද සූත්‍රයේලා වඩාත් විස්තර කරන්නෙමු. දුර්වල වූ මන්ද භව්‍ය පුද්ගලයකු වන්නේ නම් මාර්ග- ඵලයන්ට පත්වීමට ප්‍රමාණවත් තරම් දැනුමක් පමණක් ලබන්නේය. එම නිසා මූල පණ්ණාස, මූල පරියාය සූත්‍ර අට්ඨකථා හි "**සාවකා හි චතුන්නං ධාතුනං එකදෙසමෙව සම්මසිත්වා නිබ්බානං පාපුණන්ති**"යි දක්වා ඇත්තේය. [ම. අ. 1/48]

සාවකා = ශ්‍රාවකයන්

චතුන්නං ධාතුනං = පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා ධාතූන්ගෙන්

එක දෙසමෙව = සමහරක්, ප්‍රදේශයක් පමණක්

සම්මසිත්වා = සම්මර්ශණය කොට

නිබ්බානං = නිවනට

පාපුණන්ති = පත්වෙත්

මෙම අට්ඨකථාහි පමණක් නොව සළායතන සංයුක්ත පාළියෙහි (සං.නි. 4/469)ද මෙලෙසවූ අදහසක් දක්වා ඇත්තේය. දක්වන අවස්ථාව වනාහිඃ කොපමණක් දැන ගැනීමෙන් ඤාණය පිරිසිදු වේද?, රහත් බවට පත්වන්නේද? යනලෙස භික්ෂූන් වහන්සේ නමක් විසින් ප්‍රශ්ණ කරනු ලැබීම අනුව රහතුන් වහන්සේලා හතර නමක් තමා ස්වකීය වශයෙන් භාවනා කොට දැක දැනගත් ආකාරයට අනුව වෙනස් වෙනස් උත්තර හතරක් සැපයූ සේක.

ප්‍රථම රහතන් වහන්සේගේ උත්තරය

"යතො ඛො ආවුසො ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච යථා භූතං පජානාති එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොති"

[සං. නි. 4/368]

"ඇවැත්නි එම අවස්ථාවේ ස්පර්ශය පහළවීම පිණිස ආධ්‍යාත්මිකායතන හයෙහි ඇතිවීම, නැතිවීම තත්ත්වාකාරයෙන් දැනගනී. ඇවැත්නි මෙපමණක් දැනගැනීමෙන් එම භික්ෂුවගේ උතුම් ඤාණය මනාකොට සුපිරිසිදුවේ." රහත් බවට පත්වී යැයි කියවේ.

මේ උත්තරය වනාහි **අජ්ඣත්තිකායතන** හය මත පමණක් භාවනා කොට රහත් වූ මහා තෙරුන් වහන්සේගේ උත්තරයයි. මෙම රහතන්වහන්සේගේ භාවනා ආකාරය සළකා බැලුවහොත් බහිද්ධා ධර්ම කිසිවක් මත භාවනා කොට නොබැලූ බව පෙනේ. *අජ්ඣත්තික චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය* යන රූප පහ මත පමණක් භාවනා කොට බලන්නේය. ඉතිරි රූපයන් මත භාවනා නොකළ බව පෙනේ. නාම ධර්මයන් වශයෙන් සිත පමණක් භාවනා කොට බැලූ බව පෙනේ. චෛතසිකයන් භාවනා කොට බැලූ බවක් නොපෙනේ. නමුදු මෙලෙස මේ ක්‍රමයට භාවනා කොට එම මහා තෙරුන් වහන්සේද රහත් බවට පත්වූ සේක. මේ ක්‍රමය නුසුදුසු යැයි කාට නම් කිව හැක්කේද? ඇත්ත වශයෙන් නම් විස්තර ලෙස දක්වූ පාළි- අට්ඨකථාවන්ට අනුව ගැළපෙන බවම කිව හැක්කේය. මක්නිසාදයත්: ප්‍රකට වූ *අජ්ඣත්තිකායතනයන්* ප්‍රධාන කොට භාවනා කිරීමෙන් ඒවා සමග එකට පහළ වන බහිද්ධා ආයතන හයද භාවනා කිරීමේ කෘත්‍යය, වටහා ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වන්නේමය. සිද්ධ වන්නේමය. එම නිසා රූප- නාම සියල්ලම භාවනා කරයි, දැනගනියි යන්න විස්තර කොට දක්වන ලද පාළි- අට්ඨකථාවන් හා ගැළපෙන්නේය.

දෙවන රහතන් වහන්සේගේ උත්තරය

ඒ අනුව උපාදානස්කන්ධයන් පසෙහි ඇතිවීම- නැතිවීම වටහාගන්නේ නම් උතුම් රහත් භාවයට පත් වන්නේයැයි කියැවේ. මෙය වනාහි සියල්ලෙන් සම්පූර්ණ උත්තරයකි.

තුන්වන රහතන් වහන්සේගේ උත්තරය

යථො ඛො ආවුසො චතුන්නං මහා භූතානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච යථා භූතං පජානාති, එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොති,

ඇවැත්නි, යම් විටක මහා භූත හතරෙහි ඇතිවීම- නැතිවීම තත්ත්වාකාරයෙන් දැනගනී. ඇවැත්නි මෙපමණක් දැනගැනීමෙන් රහතන් වහන්සේලා උතුම් ඥාණය මනා කොට පිරිසිදුවේ. රහත් බවට පත්වේ යැයි කියැවේ.

මේ උතුම් රහතන් වහන්සේගේ භාවනා ක්‍රමයට අනුව මහා භූත හතර හැර ඉතිරි සියලු නාම- රූප මත භාවනා නොකළ බව පෙනේ. එසේ නමුත් මෙමගින් රහත් බවට පත්විය හැකි නියම භාවනා ක්‍රමයක් වේමය. එම නිසා මහා භූත හතර ප්‍රධාන කොට භාවනා කිරීමෙන් එම මහා භූතයන් හා එකට පහළ වූ රූප- නාමයන්ද භාවනා කිරීමේ වටහා ගැනීමේ කෘත්‍ය සම්පූර්ණ වන බැවින් ඉහළ විස්තර කරන ලද පාළි- අට්ඨකථා වලට විරුද්ධ නොවන බව සිතට ගතයුතු වේ. මක්නිසාදයත්: එම පාළි- අට්ඨකථා වනාහි විවිධ පුද්ගලයන්ගේ සංක්ෂිප්ත- විස්තාර භාවනා ක්‍රම වටහා ගන්නා ක්‍රම සියල්ල සම්පිණ්ඩණය කොට දක්වන සංග්‍රහයක් බැවිනි. ඒ සියල්ල සෑම පුද්ගලයකු විසින්ම ප්‍රධාන කොට, අත නොහැර භාවනා කළ යුතුයැයි, වටහා ගතයුතුයැයි අදහස් නොකෙරෙන්නේමය.

හතරවන රහතන් වහන්සේ වනාහි

"යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති යථාභූතං පජානාති.

"පහළ වන ස්වභාව ඇති ධර්ම යම්තාක් ඇත්ද ඒ සියල්ල නිරුද්ධ වන ස්වභාවය ඇත්තේයැයි තත්ත්වාකාරයෙන් දනී නම්, උතුම් ඥාණය පිරිසිදුවේ. රහත් බවට පත්වේ යැයි" පිළිතුරු දුන්සේක. මේ ක්‍රමයද සර්ව සම්පූර්ණ උත්තරයක් සපයයි.

ප්‍රශ්ණය නගන භික්ෂුව වනාහි "රහතන්වහන්සේ නමක් පාසා රූප- නාම සියල්ලම දත යුතුයි. ඔවුන්ගේ දැනගන්නා ක්‍රමයද සමාන විය යුතු

යැයි" ඇදහීමක්, පිළිගැනීමක් ඇත්තෙකි. එම නිසා සමහර උත්තර වල රූප- නාම වශයෙන්ද අසම්පූර්ණ වන්නාසේම ක්‍රමයන් වශයෙන්ද එකිනෙකට අසමාන නිසා ඒවා පිළිබඳව සතුටට පත් නොවී බුදුරජාණන් වහන්සේ වෙත එළඹ ඒ බව සැළ කර සිටි සේක. එම අවස්ථාවෙහි බුදු පියාණන් වහන්සේ "**යථා යථා අධිමුත්තානං තෙසං සප්පුරිසානං සුවිසුද්ධං හොති, තථා තථා ඛො තෙහි සප්පුරිසෙහි බ්‍යාකතං**" "ඒ ඒ අධිමුක්තීන්ට අනුව සත්පුරුෂයන් සතර දෙනාගේ උතුම් ඤාණය සුවිසුද්ධ විය. එම අධිමුක්තීන්ට අනුවම එම සත්පුරුෂයන් සතර දෙනා උත්තර දී ඇත්තේ යැයි" අනුශාසනා කළ සේක. "තම තමා රහත් වන තෙක් භාවනා කළ ආකාරය වෙන වෙනම උත්තර දුන්සේක. උත්තර සතරම රහත් බවට පත්වීම සඳහා වලංගු නියම ක්‍රමයැ"යි මින් අදහස් කෙරේ.

දක්වූ පාළි- අට්ඨකථා අනුව එකට පහළ වන රූප- නාමයන් අභිධර්ම ග්‍රන්ථයන්හි විස්තර කොට දක්වා ඇති ලෙසට අතට පත් නෙල්ලි ගෙඩියක්සේ අංග සම්පූර්ණ ලෙස, ඉතිරියක් නොතබා භාවනා නොකළේ වී නමුත් "දකින්නාවූ ආදී අවස්ථාවේදී වඩාත් ප්‍රකට රූප- නාම පමණක් මත භාවනා කොට බැලීමෙන්, දැනගැනීමෙන් එකට , සාමූහිකව පහළවන නාම- රූප සියල්ලම බැලීම හෙවත් වටහා ගැනීම සම්පූර්ණ වී අරහත් ඵලයටම පත්වියහැකි බව" ප්‍රකටවම දත හැක්කේය. නමුදු මෙහිලා සිත තබා ගැනීමට මහා සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ ඉතා වටිනා භාවනා ක්‍රමය දක්වන අනුපද සූත්‍රයෙන් උපුටා කරුණු දක්වන්නෙමි.

සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ විපස්සනාව

සාරිපුතෙතා භිකඛවේ අඩ්ඪමාසං අනුපද ධමම විපසසනං විපසසති, තත්‍රිදං භිකඛවෙ සාරිපුතතසස අනුපද ධමම විපසසනාය හොති. ඉධ භිකඛවෙ සාරිපුතෙතා විවිචෙචව කාමෙහි විවිචෙචව අකුසලෙහි ධමෙමහි සවිතකකං සවිචාරං විවෙකජං පීති සුඛං පඨමං ඣානං උපසමපජ්ජ විහරති, යෙ ච පඨමෙ ඣානෙ ධමමා විතකෙකා විචාරො ච පීතිච සුඛංච චිතෙතකගගතාච ඵසෙසා, වෙදනා, සඤ්ඤා, චෙතනා චිතතං ඡන්දො අධිමොකෙඛා විරියං සති උපෙකඛා මනසිකාරො. ත්‍යසස ධමමා අනුපද වවතථිතා හොනති, ත්‍යසස ධමමා විදිතා උපපජ්ජනති, විදිතා, උපටඨහනති විදිතා අබභතථං ගචජනති. සො එවං පජානාති "එවං කිරමෙ ධමමා අහුතවා සමෙභානති හුතවා පටිවෙදෙනතිති. [ම. නි. 3/134]

තේරුම

මහණෙනි, සාරිපුත්ත තෙමේ අර්ධ මාසයක් (පක්ෂයක් පුරා) *අනුපද ධම්ම විපස්සනා* භාවනා කරයි. මහණෙනි, දැන් දේශනා කරන පිළිවෙල සාරිපුත්‍රයන්ගේ එම *අනුපද ධම්ම විපස්සනා* පිළිවෙල වේ. මහණෙනි, මෙම ශාසනයෙහි සාරිපුත්‍ර තෙමේ කාමයන්ගෙන් වෙන්ව, නීවරණ අකුසලයන්ගෙන්ද වෙන්ව විතක්, විචාර, සහිත විවේකජ වූ ප්‍රීතිය, සුඛය, ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. *විතක්ක, විචාර, පීති, සුඛ, චිත්තේකග්ගතා, ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, චිත්ත, ඡන්ද අධිමොක්ඛ, විරිය, සති, උපෙක්ඛා, මනසිකාර* යනාදි වූ එම ධර්ම දහසය (16) සමවැදී සිටින ප්‍රථම ධ්‍යානයෙහි ඇතුළත් වේ. එම දහසයාකාර ධර්මයන් අනුපිළිවෙලින් බෙදා වෙන් වෙන් කොට ගත්තේය. එම ධර්මයන් ඔහුට පැහැදිළිවම උපදී, පැහැදිළිවම පවතියි. පැහැදිළිවම නිරෝධ වේ. හෙතෙමේ මෙලෙස වටහා ගනී. මේ ධර්මයන්ට මෙලෙස ස්වභාවය තිබීම ඇත්තය. සත්‍යය. මුලින් නොතිබී පහළ වීම ඇත්තේය. පහළ වුව හොත් නැවත නැවතත් ඒවායේ නැති වීම සිදු වේ.

අර්ථය සැකවින්

සාරිපුත්ත ස්වාමීන් වහන්සේ *අනුපද ධම්ම විපස්සනාව* දින 15ක්ම භාවනා කළ පසුව රහත් බවට පත් වූ සේක. භාවනා කරන පිළිවෙල වනාහිඃ ප්‍රථමයෙන් ප්‍රථම ධ්‍යානයට සමවදී. ධ්‍යානයෙන් නැගී සිට එම ධ්‍යාන චිත්තුත්පාදයන් හි ඇතුළත් ධර්ම 16 එක එකක් වශයෙන් වෙන් කොට ගත හැක්කේය. සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේට එම ධර්මයන්හි මූල හෙවත් ඇතිවීම ප්‍රකටය. මැද හෙවත් පවතින ආකාරයද ප්‍රකටය, අවසානය හෙවත් භංගයද ප්‍රකටය. එම නිසා සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ මෙසේ වටහා ගත්තේය. මේ ධර්මයන් ධ්‍යානයන්ට සමවැදීමට පෙරාතුව නොතිබී දැන් පමණක් පහළ විය. පහළ වී නැවත ද නැතිවී යන්නේයැයි දනී- දකී. ආකිඤ්චඤ්ඤායතනය තෙක්ම ඇති ඉතිරි රූප ධ්‍යානයන්ට හා අරූප ධ්‍යානයන්ට අනුපිළිවෙලින් සමවදිමින් මෙම ක්‍රමයටම දිගට භාවනා කළ සේක. එලෙස භාවනා කළ යුතු ධ්‍යාන ධර්මවල *විතක්ක* ආදී ධ්‍යානංග සමහරක් ධ්‍යාන වල නැති වීම- මාරුවීමද, *සම්පසාද* ආදී නව ධර්ම සමහරක් ඇතුළත් වීමද පමණක් වෙනසිය.

ප්‍රථම ධ්‍යානයට සමවැදී එම ධ්‍යානයම භාවනා කොට බැලිය යුතුය. අනතුරුව ද්විතීය ධ්‍යානයට සමවැදී නැවත එයද භාවනා කොට බැලිය යුතුය. මෙලෙස ක්‍රමයෙන් සමාපත්ති අටට අනුපිළිවෙලින් සමවැදී ක්‍රමානුකූලව විපස්සනා භාවනා කිරීම *අනුපද ධම්ම විපස්සනා* නම් වේ. "අනුපිළිවෙලින් සමවැදිය යුතු සමාපත්ති ධර්මයන් භාවනා කරන විපස්සනාව යැයි" කියනු ලැබේ. ධ්‍යාන එක එකකට සමවැදී එම ධ්‍යාන චිත්තුප්පාදයන්හි ඇතුළත් ධ්‍යානාංගයන් *ඵස්ස පඤ්චමක* ධර්මයන් ආදිය පාළියෙහි දක්වන පිළිවෙලට අනුව භාවනා කිරීමද *අනුපද ධම්ම විපස්සනා* යයි කියනු ලැබේ. ධ්‍යාන චිත්තුත්පාදයන්හි ඇතුළත් ධර්මයන් අනුපිළිවෙලින් භාවනා කරන විපස්සනාව යයි කියනු ලැබේ. (**සමාපත්ති වසෙනවා ඣානංග වසෙනවා අනුපටිපාටියා ධම්ම විපස්සනං** - අට්ඨකථා දැක්වීමයි.)

මේ ක්‍රම දෙකින් දෙවැනි ක්‍රමයට අනුව භාවනා කිරීමේදී ධ්‍යානයට වරක් සමවැදී 16 වරක් බැගින් අඛණ්ඩව භාවනා කොට බලන්නාසේ වේ. නමුදු භංග ඤාණය විස්තර කරන පටිසම්භිදා මග්ගයෙහි අරමුණු එකක බිඳීම බලන කල්හී එම බිඳීම බලන සිතද අතරක් නොතබා නැවතත් *විපස්සනා* කොට බැලිය යුතු යැයි දක්වා ඇත. *විසුද්ධි මග්ග නාම සත්තක* ක්‍රමයෙහිද ප්‍රථම සිත දෙවැනි සිතින් *සම්මසනය* කොට බලයි. එසේම දෙවැනි සිත තුන් වන සිතින් සම්මසනය කොට බලයි. මේ ක්‍රමයට සිත් එක එකක් ඊළඟ සිතින් වරක් බැගින් භාවනා කොට බැලීම දක්වයි. මේ නිසා ධ්‍යානයට ප්‍රථමයෙන් වරක් සමවැදී, *විතක්කය* භාවනා කොට බලයි. දෙවැනි වතාවට සමවැදී *විචාරය* බලයි. මේ ක්‍රමයටම දහසය වතාවක් සමවැදී දහසය වතාවක් අනුපිළිවලින් බැලීම කළයුතු යැයි වටහාගැනීම වටී. මහා සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ මේ අනුපද භාවනා ක්‍රම දෙක මගින් දින 15ක්ම භාවනා කොට රහත් බවට පත්වූ සේක. මහා මොග්ගල්ලාන ස්වාමීන් වහන්සේ වනාහි දින හතකින් රහත් වූ සේක. මෙහි ලා මහා සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ මහා මොග්ගල්ලාන ස්වාමීන් වහන්සේට වඩා ප්‍රඥාවන්ත වී නමුත් කුමක් නිසා වැඩි කලක් මෙලෙස භාවනා කළයුතු වීද යත්, අනුපද භාවනා ක්‍රමයෙන් බොහෝ විස්තර ලෙස භාවනා කළ නිසාය. වැඩිපුර හදාරා දැනගත් බැවිනි. මහා මොග්ගල්ලාන ස්වාමීන් වහන්සේ එලෙස විස්තාර ක්‍රමයට භාවනා නොකළ නිසා දින හතකින්ම

කෘත්‍යය නිම කළේ යැයි අට්ඨකථාහි දක්වයි. පහත සඳහන් ලෙසට එය දැක්වේ:

මහා මොගගලලාන ථෙරො හි සාවකානං සම්මසනචාරං යට්ඨිකොටියා උපපීළෙනෙතා විය එක දෙසමෙව සම්මසනෙතා සතත දිවසෙ වායමිත්වා අරහතතං පතෙතා, සාරිපුතතථෙරො "ඨපෙත්වා බුද්ධානං පච්චෙක බුද්ධානඤච සම්මසනචාරං" සාවකානං සම්මසනචාරං නිපපදෙසං සම්මසි, එවං සම්මසනෙතා අඩ්ඪමාසං වායමිත්වා අරහතතඤච කිර පතවා අඤඤසාසි. -පෙ- අඤෙඤසා සාවකො නාම පඤඤාය මයා පතතබබං පතතුං සමතෙථා නාම න භවිස්සතීති [ම. අ. 4/59]

තේරුම:

මහා මොග්ගල්ලාන තෙරුන් වහන්සේ ශ්‍රාවකයන් වහන්සේලා සම්මර්ෂණය කරන ධර්මයන්ම අතරින්, යෂ්ටියක් ඇන ඇන යන්නාසේ එක දේශයක් පමණක් සම්මර්ෂණය කරමින්ම සත් දිනක් ඇතුළත අර්හත් ඵලයට පත්වූ සේක. සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ වනාහි සම්මා සම්බුද්ධ, පච්චෙක බුද්ධ යන උත්තමයන් වහන්සේලාගේ සම්මර්ෂණය ක්‍රමය හැර, ශ්‍රාවකයන් වහන්සේලාගේ සම්මර්ෂණ ක්ෂේත්‍රය ඉතිරි නොකොට සම්මර්ෂණය කළසේක. මෙලෙස සම්මර්ෂණය කරමින් අඩ මාසයක් භාවනා කොට අර්හත් ඵලයට පත්වූ සේක. (**අරහතතං පතෙතා** හා සම්බන්ධය) අරහත්ත ඵලයට පත්වූ අවස්ථාවේදීද 'ප්‍රඥාවෙන් මවිසින් සාක්ෂාත් කරගත් ප්‍රදේශය සාක්ෂාත් කළ හැකි අනෙකුත් කිසිම ශ්‍රාවකයෙකු නොවන්නේ යැ'යි වටහා ගත්තේය.

සම්මසනං චරති එතථාති සම්මසන චාරො, විපසසනාය භූමි යන ටීකාවට අනුව විපස්සනාවේ ක්ෂෙත්‍රය- අරමුණ, විපස්සනා කළ යුතු අරමුණ **සම්මසනචාර** - සම්මර්ෂණ වශයෙන් හැසිරිය යුතු ධර්ම නම් වේ. එහි ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් භාවනා කළ යුතු ආධ්‍යාත්මික ධර්මය, අන්වය ඥාණයෙන් සම්මර්ෂණ කළ යුතු බහිද්ධා ධර්ම යන මේ ධර්ම සියල්ල ශ්‍රාවකයන්ගේ සම්මසන චාරයයි. අදාල ටීකා දැක්වීම විපස්සනාහි අරමුණ දක්වන අවස්ථාවේ (20 පිටෙහි) දැක්වීය. මහා මොග්ගල්ලාන ස්වාමීන් වහන්සේ තැනින් තැනින් කළ භාවනා ක්‍රමය දක්වන "**යට්ඨිකොටියා උපපීළෙනෙතා විය**"යන උපමා කථාව ගැඹුරු ලෙස සිතා බලන්න. හැරමිටියක කොණින් ඇන, ඇන යන්නේ නම් ඇනෙන ප්‍රදේශය ටිකය. අඩුය. නොඇනෙන

ප්‍රදේශය බොහෝ වන්නා සේ ශ්‍රාවකයනගේ සම්මර්ෂණ ධර්මයන් අතර භාවනා කොට නොබලන ධර්මකොටස් බොහෝය. භාවනා කොට බලන ධර්ම කොටඨාශයෝ ටිකක් මෙන්ම ඒවා එකිනෙකට දුරස්ථයැයිද මින් අදහස් වේ. දෙවැනි අග්‍ර ශ්‍රාවකයන් වහන්සේගේ භාවනා ක්‍රමයද හැරමිටි කොණින් ඇන-ඇන යන්නාක් සේ තැනින් - තැනින් වන්නේ නම් මහා ශ්‍රාවකයන් වහන්සෙලාගේ භාවනා ක්‍රමය ඊටත් වඩා ඈතින් ඈතින් වන්නේය. සාමාන්‍ය රහතන් වහන්සේගේ- අනාගාමී- සකෘදාගාමී- සෝවාන් උතුමන්ගේ- පෘතග්ජනයන්ගේ ආදීන්ගේ භාවනා ක්‍රමයද ක්‍රම ක්‍රමයෙන් ඈතින් ඈතට, දුරස්ථ ලෙසට වන බව සංසන්දනාත්මකව වටහා ගන්න. එම නිසාම(ම.නි)*මජ්ඣිම පණ්ණාසක කණ්ණකත්ථල සුත්ත අට්ඨ කථාහි* දැක්වෙන පරිදි පුථුජ්ජන ආදී පහළ, පහළ, යෝගීන්ගේ භාවනා විධිය සොතාපන්න ආදී ඉහළ, ඉහළ ආර්ය පුද්ගලයන්ගේ භාවනා විධියට සම නොවේ (පත්නොවේ).

අනුපද විපස්සනාව සිදුවන ආකාරය

මහා සාරිපුත්ත ස්වාමීන් වහන්සේද ප්‍රථම ධ්‍යානය ආදියට අනුපිළිවෙලින් සමවැදී සමවැදුණු ධ්‍යානයෙන් නැගීමත් සමගම *විතක්ක* ආදිය මත භාවනා කොට බලා එහි ස්වභාව ලක්ෂණ වශයෙන් දැන ගනී. දැනගන්නා ආකාරය "**අභිනිරොපන ලක්ඛණො විතක්කො වත්තතීති ජානාති**" යනාදී අට්ඨකථාවන්ට අනුව *විතක්කය මත විපස්සනා* කොට බලන්නේ අරමුණ වෙතට නැංවීම ස්වභාවය ඇති නාම ධර්මයක් වන්නේ යයි දැනගනී. විතර්කනය පහළ වන්නේය යන ලෙස දැනගැනීමෙන්ම අරමුණට නැංවීම සවභාවය වශයෙන් විතක්කය විශේෂයෙන් වෙන්කොට දැනගැනීම නම්වේ. *විචාර* ආදිය කෙරෙහිද ස්වභාව ලක්ෂණාදිය විශේෂයෙන් වෙන්කොට දැනගැනීම මෙලෙසටම යයි දතයුතුය. *විචාරය* විපස්සනා කොට බැලූ විට අරමුණ පිරිමදින- නැවත නැවත සළකා බලන ස්වභාවය ඇත්තාවූ විමසා බැලීමක් වන්නේ යැයි දැනගනී. *පීතිය* විපස්සනා කොට බලන්නේ ශරීරය පුරා පැතිර පවත්නාවූ ප්‍රීතිය= පිනායන ස්වභාවය ඇත්තේ යයි දනී. සුඛය භාවනා කොට බලන්නේ නම් සුව ගතියක් වන්නේ යයි දැනගනී. *ඒකග්ගතාව* මත විපස්සනා කොට බලන්නේ නම් විසිර නොයන ස්වභාවය ඇති සිතේ තැන්පත් බව වන්නේ යයි දැනගනී. *ඵස්සය* භාවනාකොට බලන්නේ අරමුණ පිරිමදින ස්වභාවය ඇති පහසක් බව දනී, වේදනාව විපස්සනා

කොට බලන්නේ විඳින්නාවූ ස්වභාව ඇති වින්දනයක් බව දනගනී. *සඤ්ඤාව* බලන්නේ සලකුණු ගන්නා සවභාවය ඇති හැඳිනීම් යැයි දනගනී. *චේතනාව* බලන්නේ උනන්දු කරවන සවභාවය ඇත්තාවූ අරමුණ හා සම්බන්ධතාවය යැයි දනගනී. සිත භාවනා කොට බලන්නේ අරමුණ දන ගන්නා සවභාව ඇති දනීම වන්නේ යැයි දනී. *ඡන්දය* බලන්නේ යමක් කිරීමට ඕනෑකම නම් වූ ස්වභාවය ඇති කැමැත්ත යයි දනගනී. *අධිමොක්ඛය* භාවනා කොට බලන්නේ නිශ්චය කරන ස්වභාවය ඇති සිතේ තහවුරු බව යයි දනගනී. *විරිය* භාවනා කොට බලන්නේ උත්සාහවත් කරවන ස්වභාව ඇති ඔසවා තබන බව යයි දනගනී. *සතිය* භාවනා කොට බලන්නේ අරමුණට එළඹ සිටින ස්වභාවයෙන් නිපන් අමතක නොවන බව යැයි දනගනී. *තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව* බලන්නේ ඌනාධික නොවුන ස්වභාවය ඇති සමබර දක්ම ඇත්තේ යයි දනගනී. *මනසිකාරය* භාවනා කොට බලන්නේ අරමුණ වෙත යොමු කරවන, ගමන්කරවන, ස්වභාවය ඇති සිතයෙදීම බව දනගනී. මෙලෙස තත්වාකාරයෙන්ම දහසයාකාර ධර්මයන් දන්නා නිසා "**ත්‍යාස්ස ධම්මා අනුපද වවත්තිතා හොන්ති**" යයි දේශනා කළසේක. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මෙම ධර්මයන් දහසය පිළිබඳව අනුපිළිවෙලින් වෙන් වෙන්ව දක දන ගන්නේ යයි අදහස් කෙරේ.

මෙම ධර්මයන් සාරිපුත්ත ස්වාමීන් වහන්සේට ප්‍රකටව පැන නගී. ප්‍රකටව පවතියි, ප්‍රකටව නිරොධ වී යයි කියන තැන "එම ධ්‍යාන සිත ස්වකීය උප්පාදය- ඨිතිය- භංගය දනගනී" යයි නොගත යුතු. එම නිසා *අට්ඨකථාහි* මෙය පහත සඳහන් ලෙසට දක්වයි.

යථාහි තෙනෙව අංගුලග්ගෙන තං අංගුලග්ගං න සක්කං ඵුසිතුං, එව මෙව තනෙව චිත්තෙන තස්ස උප්පාදො වා ඨිති වා භංගො වා න සක්කා ජානිතුන්ති එවං තාව තං ඤාණතා මොචෙතබ්බා. යදි පන ද්වෙ චිත්තානි එකතො උප්පජ්ජෙයුං, එකෙන චිත්තෙන එකස්ස උප්පාදො වා ඨිති වා භංගො වා සක්කා භවෙය්‍ය ජානිතුං, ද්වෙ පන ඵස්සා වා වෙදනා වා සඤ්ඤා වා චෙතනා වා චිත්තානි වා එකතො උප්පජ්ජනකානි නාම නත්ථි, එක මෙක මෙව උප්පජ්ජති, එවං ඤාණ බහුතා මොචෙතබ්බා

[ම. අ. 4/61]

තේරුම

යම් ඇඟිලිතුඩකින් එම ඇඟිලි තුඩම ස්පර්ශ කල නොහැකි සේම යම් සිතකින් එම සිතේම *උප්පාද, ඨිති, භංග* අවස්ථා නොදත හැක්කේය.

මෙලෙස එම ධ්‍යාන සිත එම ධ්‍යාන සිතින්ම දැනගන්නා ස්වභාවය බැහැර කෙරෙයි. තවදුරටත් ඉදින් සිත් දෙකක් එකවැර පහළ වන්නේ නම්, ඒ එක සිතකින් අනෙක් සිතේ *උප්පාද, ඨිති, භංග* අවස්ථා දැනගත හැක්කේය. නමුදු *ඵස්ස* දෙකක් *වේදනා* දෙකක්, *සඤ්ඤා* දෙකක් *චේතනා* දෙකක් *සිත්* දෙකක් එකට පහළ වීමක් නොමැත්තේය. වරකට එකක් ලෙසටම පහළ වෙත්. මෙලෙස එක චිත්තක්ෂණයක ඤාණ බහුලව පහළ වීමද භාර නොගනී.

නමුදු සාරිපුත්ත ස්වාමීන් වහන්සේ එම ධර්ම දහසයේ ආශ්‍රය වස්තුව හා අරමුණ ද වෙන් වෙන් වශයෙන් දත් බැවින්, ධ්‍යානයෙන් නැගී සිට බැලුවේ නමුත් එම ධර්මයන්ගේ පහළවීම වර්තමානව පහළ වන ලෙසට ප්‍රකට විය. ඨිති කාලය ද වර්තමාන ලෙසට ප්‍රකට විය. භංගය ද වර්තමානව වන්නාසේ ප්‍රකට විය. මෙලෙස ප්‍රකට ධර්ම බැලීම, දැනගැනීම, *උදයබ්බය ඤාණ, භංග ඤාණ* යන අවස්ථාවල *බිණ පච්චුප්පන්න* ධර්මයන් බැලීම හා දැනගැනීම යයි කියනු ලැබේ. එම නිසා '**විදිතා උපපජ්ජන්ති**' ආදිය දේශනා කළ සේක. මුළින් නොතිබී- නොදැන අළුතින් ඇති වී- මතු වී පැමිණීම දැන ගන්නා ඤාණය '**උදය**' = ඇතිවීම දැනගන්නා හෙවත් පහළවීම දැක ගන්නා ඤාණය නම් වේ. පහළ වුනු දෙයක් නැවත නැතිවී නැතිවී යන්නේ යයි දැනගැනීම '**වය**' = වියෝව දැක දැනගන්නා ඤාණය නම් වේ. මෙය වනාහි *අට්ඨකථා* වලට අනුව දක්වන අදහස් විස්තරයයි.

සැළකිල්ලමත් විය යුත්තක්

ශ්‍රාවකයන් විසින් *සම්මර්ශණ* කළ යුතු ධර්ම සියල්ල ඉතිරි නොකර භාවනා කළ මහා සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ විපස්සනා විෂය ක්ෂේත්‍රය දක්වන තැන සිත් එකක් එකක් මඟින් භාවනා කොට බැලිය යුතු ධර්මයන් උපරිම වශයෙන් දහසයක්ම බව *පාලි-අට්ඨකථාහි* ප්‍රසිද්ධය. ඒ තුළද *සුඛ* හා *වෙදනා* යන චෛතසික දෙකම මූල ධර්ම වශයෙන් එකක්ම වන නිසා චෛත්‍යය පසළොසක්ම වන්නේය. අභිධර්ම ග්‍රන්ථයන්ගේ ප්‍රථම ධ්‍යාන සිත්හි චෛතසික 35ක් යැයි දක්වයි. ඒ තුළ සමහර විටකදී පමණක් යෙදෙන (කදාචි චෛතසික) කරුණා, මුදිතා, ඉවත් කල විට 33ක්ම ඉතිරිවේ. එම නිසා ධ්‍යාන සිතක යෙදෙන ප්‍රමාණ දක්වන්නේ නම්, ප්‍රථම ධ්‍යානයේ චිත්තුප්පාද ධර්මයන් 34ක්ම වේ යැයි දත යුතු. එම 34 තුළින් 15ක් පමණක් භාවනා කොට බලන්න යැයි මේ සූත්‍ර *පාලි- අට්ඨකථාහි* ප්‍රකටය. ඉතිරි

19ක් වූ චෛතසිකයෝ *විපස්සනා* කොට බැලිය යුතු යැයි ප්‍රකට නැත. ටීකාවෙහි දක්වන වාද දෙක තුළින් *ආචරිය වාදයෙහි* "එම 16 පමණක් ප්‍රකට නිසා ඒවා පමණක් භාවනා කොට බැලිය යුතු යැයි" කියනු ලැබේ. *අපරෙවාදයෙහි* ඉතිරි ධර්මයන්ද ප්‍රකට නැතැයි කීම නොකිය යුතු බැව් දක්වයි. මෙහිලා 16 ආකාර ධර්මයන් පමණක් භාවනා කොට බලන ලදයි කීවද චිත්තුප්පාදයක යෙදෙන ධර්ම දහසය තම ඥාණයෙන් ප්‍රකට ලෙස වරකට එකක් බැගින් පිරිසිඳ ගෙන විපස්සනා වශයෙන් බැලිය හැකි සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ උතුම් ප්‍රඥාව ප්‍රශංසාකටයුතු තරම් ශ්‍රේෂ්ඨය. ක්‍රමානුකූලව විපස්සනා භාවනා කළ උතුමන්ගේ ප්‍රසාද ජනක සිත් වලට පවා අදහාගත නොහැකි තරම් ආශ්චර්ය ජනක උතුම් තත්වයකි. නමුදු නියම විපස්සනා ඥාණයන්ටවත් තවම පත් නොවූ *චිත්ත - චෛතසික* සම්ප්‍රයුක්ත ධර්මයන් සම්බන්ධව හුදු පරියත්ති දැනුමින් ස්වරූපයන් වෙන්කොට දැනගන්නා පුද්ගලයාට වනාහී යටකී ධර්ම දහසය මත පමණක් භාවනා කොට බැලීම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කළේ නමුත් ප්‍රමාණවත් නැතැයිද ,ඒවා සියල්ල සම්පූර්ණ කිරීම දුෂ්කර නොමැති යැයිද කල්පනා කරනු ඇති. එලෙස සැහැල්ලු කොට කල්පනා නොකිරීමට විශේෂයෙන් සැලකිලිමත් වෙත්වා!. සතිමත් වෙත්වා!.

සමහර අය "*රූප කලාප බන්ධන , චිත්ත චෛතසික යොග, ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන, චිත්ත පරම්පරා වීථි* ආදි ස්වරූපයන් කටපාඩම් කොට සිත තබාගෙන, එසේ තමා කටපාඩම් කළ ස්වරූපයන්ට අනුව හුදු සළකා බැලීමෙන් නාම- රූප පරිග්‍රහ කිරීම, විපස්සනා භාවනා කිරීම සමෘධ වේ යයි, සම්පූර්ණ වේ යැයි" කල්පනා කරති. එම සළකා බැලීම කලින් දැක්වූ *පාළි- අට්ඨකථා- ටීකා* සමග ගළපා බලන්න. තම සන්තාන, පර සන්තාන යන දෙක්හි ප්‍රත්‍යක්ෂ ලෙස පහළ වෙමින් පවතින රූප- නාමයන් එම පහළ වන ආකාරයටම භාවනා කොට බැලූ කල්හිම විපස්සනාව සිදුවන බව එම ග්‍රන්ථයන්හි දැක්වේ. සූතය අනුව හුදු ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් පමණක් විපස්සනාව සිද්ධ වීම එම ග්‍රන්ථවල නොදැක්වේ. මෙසේ සිතින් ගත් රූප- නාමයන් යනු සන්තාන දෙකෙහි ඇත්ත වශයෙන් පහළ නොවන්නක් නිසා නියම පරමාර්ථ නොවන බවත්, සිතේම කල්පනා කිරීම් වශයෙන් මතුවන හුදු ප්‍රඥප්තීන් පමණක් වන බවත් මීට කලින් කීප වතාවක්ම දැක්විය. එම නිසාම සුතමය ඥාණයට අනුව පරිකල්පනය කරන්නේ නම් ඕනෑම ධර්මයක් ප්‍රකටව වැටහී ගියේ

යයි සිතා ගත හැක්කේය. තොලද ධ්‍යාන- මාර්‍ග- ඵල- නිවන ආදියක් වුවද ප්‍රකටවම දනී යයි සිතට වැටහී යා හැකි අතර මෙම ක්‍රමයේදී "කුමන ධර්‍මයක් මදක් ප්‍රකට වීද, කුමන ධර්‍මයක් හොඳින් ප්‍රකට වීද යි" වෙන්කොටලීමත් දුෂ්කරවිය හැක. ඇත්ත වශයෙන් නම් නොඇසූ කරවි කුරුල්ලන්ගේ (ඉන්දියානු කොවුලාගේ) කට හඬ තමා අසා පුරුදු කුරුලු හඬ අනුව සිතා ගැනීමට පහසු නොවේ. එලෙසටම තමා තුළ නොමැති ධ්‍යාන- මාර්‍ග- ඵල- ධර්‍මයන් තමා දැක ඇති වර්‍ණ- රූප ආදිය මෙන් ප්‍රකට නැත්තේමය. සූක්‍ෂම වූ *ධ්‍යාන* ධර්‍ම ඕලාරික *කාම* ධර්‍ම මෙන් ප්‍රකට නැත්තේමය. එසේ නම් ප්‍රත්‍යවේක්‍ෂා කිරීමක් පාසා සමානව ප්‍රකට වන්නේ කුමක් නිසාද? සූත්‍රය අනුව කල්පනා කොට ඉදිරිපත් කරගත් අරමුණ ඇස්පනා පිට ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දතයුතු පරමාර්‍ථ නොවේ. හුදු ප්‍රඥප්තීන්ම වන අතර එම ප්‍රත්‍යවේක්‍ෂාවන්ද නියම විපස්සනාව නොවන නිසාම නොවන්නේද?. නියම විපස්සනාවේදී වනාහි 'ප්‍රකට භාවයෙන් යුක්ත ධර්‍ම ප්‍රකට වන්නේය.ප්‍රකට භාවයෙන් නොයුක්ත ධර්‍ම ප්‍රකට නොවන්නේය'. ඉතාමත් සියුම් *නෙවසඤ්ඤානාසඤ්ඤායතනය* අනෙකුත් ධ්‍යාන මෙන් සාරිපුත්ත ස්වාමීන් වහන්සේට පවා ප්‍රකට නොවීය. එම නිසාම එම ධ්‍යානය අනුපද නය ක්‍රමයට භාවනා කොට බැලිය නොහැක්කේය. අනෙකුත් ධ්‍යානයන්හි නය ක්‍රමයටම කලාප සම්මර්‍ශණ වශයෙන් බලයි. එසේ බලන ආකාරය දක්වන පාළිය මෙසේය:

පුනච පරං භික්ඛවේ සාරිපුත්තො සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සො තාය සමාපත්තියා සතො වුට්ඨහති, සො තාය සමාපත්තියා සතො වුට්ඨහිත්වා යෙ ධම්මා අතීතා නිරුද්ධා විපරිණතා, තෙ ධම්මෙ සමනුපස්සති "එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තීති [ම. නි. 3/138]

තේරුම

මහණෙනි, නැවත සාරිපුත්‍රයෝ *ආකිඤ්චඤ්ඤායතන* ධ්‍යානය හාත්පසින් සමති ක්‍රමනය කොට *නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට* සපැමිණ වාසය කරයි. හෙතෙම එම සමාපත්තියෙන් සිහියෙන් යුක්තව නැගී සිටියේය. නැගී සිට යම් ධර්‍මයක් අතීතයේ නිරුද්ධ වීද, විපරිණාමයට පත්වීද එම ධර්‍මය *සමනුපස්සනය* කරයි. *සමනුපස්සනය* කොට බලන

ආකාරය වනාහී "මෙම ධර්මය මෙම ස්වභාවය ඇති බව ඇත්තය, මුලින් නොතිබී පහළ වීය, පහළ වී නැවත නැතිවී ගියේයැ"යි කියායි.

අනෙකුත් ධ්‍යානයන් හි *විතක්ක විචාර* ආදිය අනුපිළිවෙලින් එක එකක් වෙන් වෙන්ව භාවනා කොට බලන ආකාරය හා එම ධර්මයන්හි *උප්පාද - ඨිති - භංගයන්* හි පැහැදිළි බව විශේෂයෙන් දක්වමින් කෙළින්ම දේශනා කළ සේක. නමුත් මෙම ධ්‍යානයෙහිදී එසේ නොවී "**යෙ ධම්මා අතීතා නිරුද්ධා විපරිණතා, තෙ ධම්මෙ සමනුපස්සති**"යැයි සාමාන්‍ය ලෙස දේශනා කිරීම කුමන විශේෂ අර්ථයන් ඇත්දැයි? ප්‍රශ්ණයක් වන නිසා *අට්ඨකථාහී* පහත සඳහන් ලෙසට එය විවරණය කොට දක්වයි.

තෙ ධම්මෙ සමනුපස්සතීති යස්මා නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ බුද්ධානංයෙව අනුපද ධම්ම විපස්සනා හොති, න සාවකානං, තස්මා එත්ථ කලාප විපස්සනං දස්සෙන්තො එවමාහ. [ම. අ. 62]

තෙ ධම්මෙ සමනුපස්සතීති = තෙ ධම්මෙ සමනුපස්සති යනු
නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ = නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය
බුද්ධානං යෙව = බුදුරජාණන් වහන්සේලාටම පමණක්
අනුපද ධම්ම විපස්සනා = පදයක් පාසා ධර්මයන් භාවනා කොට බැලීම
යස්මා = යම් හෙයකින්
හොති = වේ.
සාවකානං = ශ්‍රාවකයනට
සංඛාරාවසෙස සුඛුම
භාවප්පත්තියා = ඕලාරික සංඛාරයන් ගෙවාලමින් සුඛුම සංඛාරයන් බවට පත්වූ බැවින්
දුබ්බිඤ්ඤෙය්‍යතා = දැන ගැනීමට දුෂ්කර බැවින්
විනිබ්භුජ්ජිත්වා ගහෙතුං = බෙදා වෙන් කොට ගැනීමට හෝ භාවනා කොට බැලීමට
අසක්කුණෙය්‍ය භාවතො = නොහැකි වන බැවින් (හේතු දක්වන ටීකාපද පහක් පැහැදිලි කිරීම සඳහා අමුතුවෙන් මෙහි ඇතුළත් කරන ලදි)

අනුපද ධම්ම විපස්සනා	=	පදයන් අනුව ධ්‍යාන චිත්තුප්පාද ධර්මයන් විපස්සනා කොට බැලීම
න හොති	=	සිද්ධ නොවේ.
තස්මා	=	එම නිසා
එත්ථ	=	එම නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයෙහි
කලාප විපස්සනං	=	කලාප වශයෙන් භාවනා කිරීම
දස්සෙතො	=	දැක්වීම පිණිස
එවං	=	මෙලෙස **තෙ ධම්මෙ සමනුපස්සති** යැයි, දේශනා කළසේක.

අර්ථය

නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයේ *සඤ්ඤා, ඒකග්ගතා, ඵස්ස, වේදනා* ආදී ධර්ම බුදුරජාණන් වහන්සේලාට පමණක් අනු පිළිවෙලින් වෙන් වෙන්ව එකිනෙක භාවනා කොට බැලිය හැක්කේය. සාරිපුත්ත ආදී ශ්‍රාවකයනට වෙන් වෙන්ව භාවනාවෙන් බැලිය නොහැක්කේය. හේතුව වනාහි *නෙවසඤ්ඤානාසඤ්ඤායතන* ධ්‍යානයේ ඖලාරික සංඛාරයන්ගෙන් ඉතා ස්වල්පයක් පමණක් ඉතිරිව ඇති නිසාය. ඉතාමත් සුඛුමය. නින්දකට වැටීමට ආසන්නයේ අවසාන සිත, සිහිමූර්ඡාවන අවස්ථාවේ අවසාන සිත ආදී මේ සිත් සමඟ සසඳා එහි සුඛුම භාවය වටහා ගතයුතුය. එලෙස සුඛුම වන නිසා මෙම ධ්‍යානය ශ්‍රාවකයනට එලෙස ප්‍රකට නොවේ. එම නිසාම මෙම ධ්‍යානයේ යෙදෙන ධර්ම වෙන් වෙන් වශයෙන් භාවනා කොට බලා ස්වභාව ලක්ෂණාදිය වශයෙන් වෙන් කොට ගැනීමට නොහැක්කේය. එම නිසා සාරිපුත්ත ස්වාමීන් වහන්සේ *නෙවසඤ්ඤා නාසඤ්ඤායතන* ධ්‍යානයෙන් නැගී සිට එම ධ්‍යානය කලාප වශයෙන් පමණක් භාවනා කොට බැලීය. පෙර ධ්‍යානයන් හා සමානව මෙම ධ්‍යාන ධර්මයන් 'පෙර නොතිබී අලුතෙන් පහළ වී පසුව නැතිවී ගියේ යැ' යන ක්‍රමය මත පිහිටා **අනුමාන නය** ක්‍රමයට කලාප භාවනා ක්‍රමයෙන් පමණක් භාවනා කළ සේක. එම කලාප විපස්සනා ක්‍රමය දැක්වීමට එම ධ්‍යානයේ "**තෙ ධම්මෙ සමනුපස්සති** "යි සාමාන්‍ය ලෙස දේශනා කළේ යැයි අදහස් වේ. *කලාප විපස්සනා, කලාප සම්මසන, නය විපස්සනා නය මනසිකාරය* යන මේ ව්‍යවහාර නාමයන් අර්ථය වශයෙන් සමානය.

කල්පනා කොට බලන්න

සුතමය ඤාණ ශක්ති ආනුභාවයෙන් අනුමාන වශයෙන් බලන්නේ නම් යට ධ්‍යානයන්හි ප්‍රකට බව හා *නෙවසඤ්ඤානාසඤ්ඤායතනයේ* ප්‍රකට බව සමානද, නැද්ද? සමාන නැත්තේමය. "එසේ නම් සාරිපුත්ත ස්වාමීන් වහන්සේට ප්‍රකට වූ යට යට ධ්‍යානයන් පමණක් *අනුපද විපස්සනා* කොට එසේ අප්‍රකට වූ *නෙවසඤ්ඤානාසඤ්ඤායතනය අනුපද විපස්සනා* නොකොට *කලාප විපස්සනාව* පමණක් කළේ" යැ යන මේ කියමන කුමක් නිසා වැදගත් වන්නේද? සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ භාවනාව සුතමය හෝ චින්තාමය නොවූයේය. තම සන්තානයේ ඇත්තටම පහළ වූ ධම් මත පහළ වූ ආකාරයට භාවනා කොට නියම භාවනාමය *පච්චක්ඛවිපස්සනාව* සිදුවු බැවින් ප්‍රකට විය යුතු ධම් පමණක් ප්‍රකටවද, අප්‍රකට විය යුතු ධම් අප්‍රකටවද වීම නිසා නොවන්නේද? ඉදින් සූතයට අනුව කල්පනා කොට භාවනා කිරීම නියම විපස්සනාව වන්නේ නම් සාරිපුත්ත ස්වාමීන් වහන්සේට නෙවසඤ්ඤානාසඤ්ඤාතන චිත්තුප්පාද ධම්යෝද සුතමය ශක්තියෙන් වෙන්, වෙන් වශයෙන් සළකා බලා භාවනා කළේ නම් අනුපද ධම්ම විපස්සනා ක්‍රමයටද භාවනා කිරීමට හැකි වීමට ඉඩ තිබුනි. මේ අනුව එසේ භාවනා කළ නොහැකි වීම සුතමය ශක්තිය අනුව අනුමාන කොට සළකාබැලීම නියම විපස්සනාව නොවන බැවින් නොවන්නේද? එම නිසා ඇත්තටම ඇතිවන- නැතිවන නියම රූප-නාමයන් භාවනා වෙන් දැක, දැන නොගෙන චින්තාමය වන්නාවූ හුදු ප්‍රඥප්ති පමණක් වන රූප- නාම සුතමය ඤාණයට අනුව අනුමාන කිරීමෙන් විපස්සනාව වන්නේ යැයි පිළිගෙන කරන කථා බැහැර කරන්නට. ඉවත ලන්නට හැකිවේවා!

පරෙ සන්දිට්ඨිපරමාසි ආධානගගාහි- දුප්පටිනිස්සග්ගී භවිස්සන්ති මයමෙත්ථ අසන්දිට්ඨි පරමාසි අනාධානගගාහී සුප්පටිනිස්සග්ගී භවිස්සාමාති සල්ලෙඛො කරණීයො-පෙ- චිත්තං උප්පාදෙතබ්බං [ම. නි. 1/1102]

පරෙ	=	අනුන්
සන්දිට්ඨිපරමාසි	=	තම මතයට පමණක් නැවත නැවතත් නැංවීම, වරදවා සිත යෙදීම,

ආධානගගාහි = තම මතය තදින් අල්ලා ගැනීම
දුපපටිනිසසගගි = සුදුසු නියම මාර්ගය, ග්‍රන්ථ යුක්ති අනුව දැක, දැන මුත් තම වැරදිමතය අත නොහැරීම, ඉවත නොදැමීම.
භවිසසනති = වන්නාහුය
එතථ = මෙහිලා
මයං = අපි
අසනදිටඨි පරමාසි = තම මතයටම නැවත නැවතත් වැරදි ලෙසට සිත නොයෙදීම
අනාධානගගාහි = වැරදි මතය තදින් අල්ලා නොගැණීම
සුපපටිනිසසගගි = නියම සුදුසු මාර්ගය ග්‍රන්ථ යුක්තින් දැක දැන ගත් විට (තම වැරදි මතය) පහසුවෙන් බැහැර කිරීම, ඉවත දැමීම යනාදිය කළ හැකි
භවිසසාම = වන්නෙමු
ඉති සලෙලඛො = මෙලෙස කෙලෙස් කපාහැරීම
කරණීයො = කළයුතු වේ.
ඉති චිතතං = මෙලෙස සළකා බලන සිත්
උපපාදෙතබබං = පහළ කළ යුත්තේය.

මේ පරිච්ඡේදයෙහි දැක්වූ අංගුත්තර පාලි හා අනුපද සූත්‍රය සමථයානිකයාගේ විපස්සනා භාවනා ක්‍රමය සෘජුවම දක්වන්නාවූ පාළි වන්නේය. අනෙකුත් පාළි සූත්‍රයන්හිද මේ ක්‍රමයටම දේශනා කොට ඇත්තේය. එම නිසා එම සමථයානික භාවනා ක්‍රමය අනුකරණය කරමින් විපස්සනායානිකයා වර්තමානව පහළ වන රූප- නාමයන් භාවනා කර බලන්නාසේ විපස්සනායානිකයාද තම සන්තානයේ වර්තමානව පහළ වන රූප- නාමයන් වේවා තම ද්වාර හයෙහි වර්තමාන ධර්මයක් පමණක් අනුපද විපස්සනාවේ ක්‍ෂෙත්‍රය වන්නාසේ ස්වභාව ලක්‍ෂණයන් ආදිය වෙන් වෙන් කොට භාවනා කිරීම පිණිස ප්‍රකට වූ ධර්මයක්ම පච්චක්ඛ විපස්සනාවට ක්‍ෂෙත්‍රය වේ. සමථයානිකයාට නෙවසඤ්ඤානා-සඤ්ඤායතන ධ්‍යානය *කලාප විපස්සනාවට* ක්‍ෂේත්‍රය වන්නාසේ *විපස්සනායානිකයාට* තම සන්තානයේ නොමැති ධර්ම, සුඛුම වූ- සවභාව ලක්‍ෂණයන් ආදිය දක

නොහැකි ධර්ම වනාහි *අනුමාන කලාප විපස්සනාවට* ක්ෂේත්‍රයයි. එම නිසා අප්‍රකට එම ධර්මයන් විශේෂයෙන් කල්පනා කොට, සිතා බලා භාවනා කළයුතු නොවේ. සිතාබලා භාවනා කළේ වී නමුත් ආධුණික යෝගාවචරයාට ප්‍රකට නොවන්නේමය. එම නිසා *නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන* ධ්‍යානය මත ආධුණික යෝගාවචරයා විපස්සනා නොකළ යුතුය. ප්‍රකට ධර්මයන් භාවනා කොට බලා වර්තමානව- ඇස්පනාපිට දක්නා-දන්නා *පච්චක්ඛ විපස්සනා ඤාණය* බලවත් වූ කල්හි වනාහි එම අප්‍රකට ධර්මයන් විපස්සනා කළ හැක්කේය. එම නිසාම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකට වූ යට ධ්‍යානයන් භාවනා කොට *පච්චක්ඛ ඤාණ* පිරිසිඳු වූ කල්හිම *නෙවසඤ්ඤානාසඤ්ඤායතන* ධ්‍යානය *කලාප විපස්සනා* වශයෙන් භාවනා කළසේක.

භාවනා ක්‍රමය සාධනය කිරීම නිමියේ යැ.

පරිච්ඡේද අංක තුන නිමියේ යැ.

පරිච්ඡේද අංක 4

භාවනා ක්‍රමය හා දේශනාව ගැළපීම

මේ පරිච්ඡේදයෙහි භාවනා ක්‍රමයත්, නිසියාකාරව එය යෝගාවචරයනට ප්‍රකට වන ආකාරය හෙවත් වැටහෙන ආකාරයත්, *පාළි- අට්ඨකථා- ටීකාවන්* සමඟ සංසන්දනය කොට දක්වන්නෙමු.

සමථයානිකයා වර්තමානව සමවැදුන ධ්‍යාන චිත්තුප්පාදයන්ද, අදාල නිශ්‍රය රූප ධර්මයන්ද, එම නිසා පහළවන (සමුට්ඨාන) රූපයන්ද භාවනාකොට බැලිය යුතු වන්නා සේ විපස්සනායානිකයාද වර්තමානව දකින, අසන, ආඝ්‍රාණය කරන, රස බලන, පහස ලබන, කල්පනා කරන සිත් හා ඒවායේ නිශ්‍රය රූප, එම සිත් නිසා පහළ (සමුට්ඨාන) වන රූප, එම සිත්වල අරමුණු වන්නා වූ රූප යනාදිය මත මනසිකාරය පැවැත්විය යුතු බව <u>භාවනා ක්‍රමය සාධනය කිරීම</u> නම් වූ යට පරිච්ඡේදයෙහිලා දැක්විය (53 පිට). ඒ තුළ 'දක්නා සිත' යන තැන ආවර්ජනයෙහි පටන් තදාලම්බන කෙළවර කොට ඇති *චක්ඛුද්වාර වීථිය* සම්පූර්ණයෙන් යැයි අදහස් කෙරේ. *විපස්සනා* කරන විටදී *චිත්තුප්පාදයන්* වෙන් වෙන් කොට මනසිකාරය පැවැත්විය නොහැක්කේය. වීථිය සම්පූර්ණයෙන්ම වෙන් කොට ගෙන මනසිකාරය පැවැත්විය හැකි බව *පාළි- අට්ඨකථා- ටීකාවන්* මගින්ද ප්‍රකට වේ. විශේෂයෙන් මෙය සයවන පරිච්ඡේදයේ *භංග ඤාණ* අවස්ථාවේදී විස්තර කරන්නෙමු. කෙසේ භාවනා කළයුතුද යත්: දක්නා අවස්ථාවේ දක්නා වාරයක් පාසා "දකිනවා-දකිනවා" යැයි මෙනෙහි කළ යුතු වේ. අසන අවස්ථාවේද "අසනවා-අසනවා" යැයිද මෙනෙහි කළ යුතු වේ.

දක්නා අවස්ථාවේදී "දකිනවා" යැයි මෙනෙහි කරන්නේ නම් කුමන ධර්මයක් මෙනෙහිකර දැනගන්නේද? *චක්ඛු ප්‍රසාදය, රූපායතන, චක්ඛු විඤ්ඤාණ, ඵස්ස, වේදනා* යන මේ ධර්මයන් පස්දෙන දැනගන්නේය. මේ ධර්මයන් පහ මෙනෙහි කොට දැනගන්නේ යැයි කෙටියෙන් සිතට ගත යුතුවේ. දැන ගන්නා ආකාරය වනාහිඃ පැහැදිළිවූ චක්ඛු රූපය ප්‍රකට වන්නේ නම් *චක්ඛු ප්‍රසාදය* යැයි කියන එම ඇසේ ඔපය ප්‍රධාන කොට වටහා ගන්නේය. දකින වර්ණ රූපය ප්‍රකට නම් *රූපායතනය* යැයි කියන එම වර්ණ රූපය ප්‍රධාන කොට දැනගනී, දකිනා සිත ප්‍රකට නම් *චක්ඛු විඤ්ඤාණය* යැයි කියන එම දකින සිත ප්‍රධාන කොට දැන ගනී.

රූපයත් දැකීමත් දෙක එකට ප්‍රකට වී නම් *චක්ඛු සම්ඵස්ස* යැයි කියන්නාවූ *ඵස්සය* ප්‍රධාන කොට දැනගනී. හොඳ දැකීමත්, නරක දැකීමත්, හොඳ- නරක නැති දැකීමක් ආදිය ප්‍රකට නම් *චක්ඛුසම්ඵස්සජා වේදනා* යැයි කියන *වේදනා* ප්‍රධාන කොට දැනගනී

එම නිසා අර්ථය හා ව්‍යාකරණ යන දෙකම ගැළපී යනු සඳහා *චක්ඛු ප්‍රසාදය* ප්‍රකට නම් "ඇසේ ඔපය" යැයිද, වර්ණ රූපය ප්‍රකට නම් "දකිනවා" යැයිද, *චක්ඛු විඤ්ඤාණය* ප්‍රකට වී "දැක දැන ගනී" යැයිද, ඵස්සය ප්‍රකට නම් දැකීමේ "ස්පර්ශය" යැයිද, වේදනාව ප්‍රකට නම් "දැකීමේ වින්දනය" යන ආකාරයට මෙනෙහි කරන්නේ නම් නරකදැයි ප්‍රශ්ණයක් වන්නේ නම්,එයට උත්තර වශයෙන්, මෙසේ මනසිකාරය පැවැත්වීම, මෙනෙහි කිරීම අර්ථයත් ව්‍යාකරණයත් අතින් නම් ගැළපේ. නමුත් මෙලෙස මනසිකාරය පවත්වන්නේ නම් දකින්නාවූ අවස්ථාවක කුමන ධර්මයක් වඩා ප්‍රකටද? කුමක් මෙනෙහි කළ යුතුද? ආදී ලෙස කල්පනා බහුල විය හැක්කේය. එවිට පෙර මෙනහි කිරීම හා පසු මෙනෙහි කිරීම නොගැළපී යා හැක්කේය. වර්තමානයේ සිදුවන්නේ නමුදු නිරවුල්ව මෙනෙහි කළ නොහැකි වන්නේය. දැකීම කරන සිතද මෙනෙහි කළ නොහැක්කේය. එමනිසා සති- සමාධි- ප්‍රඥාවෝ ශීඝ්‍රයෙන් මේරීමට පත් විය නොහැක්කේය. එමනිසා අර්ථයත් ව්‍යාකරණයත් ගැළපෙනසේ, සමවනසේ කල්පනා කරමින් මෙනෙහි නොකළ යුතුය. දකින වතාවේ "දකින්නේය - දකින්නේය" යැයි සාමාන්‍ය ක්‍රමයටම මෙනෙහි කළ යුතුය. මෙලෙස මෙනෙහි කරන්නේ නම් ඉහත දැක්වූ වැරදි මග හැරවිය හැක්කේය. දක්නා අවස්ථාවේ ප්‍රකට ධර්මයක් ප්‍රධාන කොටද, දැන ගත හැක්කේය. මෙලෙස දැනගතහැකි වන

බැවින් "දැකීම" යන ක්‍රියානාමය පහළ වන මොහොතේ රූප- නාම දැනගනු රිසියෙන්ම මෙනෙහි කරන විපස්සනා යෝගාවචරයාට *විජ්ජමාන පඤ්ඤත්ති- තජ්ජා පඤ්ඤත්ති* ප්‍රකට වන්නේය.

විද්‍යමාන ප්‍රඥප්ති යනු ප්‍රකට වූ පරමාර්ථ ධර්මයනට නමකි. එම නාමම **"තස්ස පරමත්ථ සභාවස්ස අනුරූපං ජායතීති තජ්ජා. සා එව පඤ්ඤාපෙතබ්බං පරමත්ථ සභාවං පඤ්ඤාපෙතීති තජ්ජා පඤ්ඤත්ති"** යන වචනාර්ථයන්ට අනුව පරමාර්ථ ධර්මානුරූපව පහළවන පරමාර්ථ ධර්මයන් දැනගත හැකිවන බැවින් *තජ්ජා පඤ්ඤත්ති* නම් වේ. මේ ක්‍රමයටම පරමාර්ථ ධර්මය දක්වන *පඨවි, ඵස්ස* ආදී පාළි නම් ඇති තාක් සියල්ලමද පොළොව, ගොරෝසු බව, රළු බව, සුමුදුබව, දැකීම, ඇසීම, යෑම යනාදී වූ සිංහල නම් ඇති තාක් සියල්ලමද, *තජ්ජා පඤ්ඤත්තිම* වන්නාහ. පරමාර්ථ හා ප්‍රඥප්ති බෙදා වෙන් කොට දක්වන ස්ථානයේ ද මෙය පැහැදිළි කරන්නට යෙදුනි.

දැකීම ආදී *තජ්ජා පඤ්ඤත්ති* වශයෙන් මෙනෙහි කරන්නේ නම් එම ප්‍රඥප්තියම අරමුණු කරනවා නොවන්නේද? යැයි ප්‍රශ්නයක් වන්නේ නම්, භාවනා ප්‍රගුණ වීමට කලින් නම් එය ඇත්ත බවට පිළිගත යුතුය. නමුදු භාවනාරම්භයේදී නම් වශයෙන් වෙන් වෙන් කොට මෙනෙහි කළහොත් පමණක් වහාම සිත තැන්පත් වී නියම පරමාර්ථ රූප- නාම ධර්මයන් දැක ගත හැකිවන්නේය. පෙර හා පසු රූප නාම සන්තතිය නම් වූ *සන්තති ඝනය* විනාශ කොට අනිත්‍ය ලක්ෂණය ආදිය තත්ත්වාකාරයෙන්ම දැකගත හැක්කේය. භාවනාව ප්‍රගුණ වූ තැන් පටන් මෙනෙහිකරන සිත එම නාම ප්‍රඥප්තීන් අරමුණු නොකරයි. ඇතිවන- නැතිවන නියම පරමාර්ථ රූප- නාමයන්ම දැන ගනිමින්- දැක ගනිමින් පවත්නේය. මේ දක්වා භාවනා කොට නුපුරුදු ඇත්තන් පහත සඳහන් ටීකා පාඨයන් අනුව සළකා එහි දක්වන්නා වූ ආකාරයක් පිළිගත යුතුයි.

නනු ච තජ්ජා පඤ්ඤත්ති වසෙන සභාව ධම්මා ගය්හන්තීති? සච්චං ගය්හන්ති. පුබ්බභාගෙ, භාවනාය පන වඩ්ඪමානාය පඤ්ඤත්තිං සමතික්කමිත්වා සභාවෙ යෙව චිත්තං තිට්ඨති. [මහා ටී. (සී.) 1/218]

නනු ච = නොවන්නේද? (චෝදනාවකි)

සභාව ධම්මා = පරමාර්ථ ස්වභාවධර්මය

තජ්ජා පඤ්ඤත්ති වසෙන = තජ්ජා පඤ්ඤත්ති වශයෙන්

ගය්හති	=	මනසිකාරය පැවැත්විය යුතු
ඉති	=	මේ (චෝදනාව)
පුබ්බ භාගෙ	=	භාවනාරම්භයෙහි
සචෙවං ගය්හති	=	මනසිකාරය මෙසේ පැවැත්වීම ඇත්තය.
පන	=	ප්‍රඥප්ති වශයෙන් මනසිකාරය පැවැත්වුවද
භාවනාය	=	භාවනාව
වඩ්ඪමානාය	=	වෘද්ධියට පත් වූ විට
පඤ්ඤත්තිං	=	නාම ප්‍රඥප්තීන්
සමතික්කමිත්වා	=	සමතික්‍රමණය කොට, ඉක්මවා
වා	=	බැහැරකොට
චිත්තං	=	මනසිකාරය පවත්වන සිත
සභාවෙ යෙව	=	පරමාර්ථ සවභාවයේම
තිට්ඨති	=	පිහිටයි.

බුද්ධානුස්සති භාවනාව විස්තර කරන අවස්ථාවේ දක්වන විස්තරයකි මේ. එසේ වතුදු මේ ටීකාව විපස්සනා ක්ෂේත්‍රයේදීද ආධාරක සාධකයක් කොට ගත හැක්කේය. *උදයබ්බය ඤාණය* ආදී පහළවන අවස්ථාවේ, විස්තර කළ නොහැකි තරම් රූප- නාම ප්‍රමාණයක් ප්‍රකට වන බැවින් නම් වශයෙන් මෙනෙහිකළ නොහැකි වී හුදු "ඇතිවීම-නැතිවීම" ස්වභාවය දැන ගැනීම මත පමණක් සළකමින් සිටින බව පස්වන පරිච්ඡේදයෙහිදී ප්‍රකට වනු ඇත. භාවනා කොට උක්ත ඤාණයන්ට පත්වූ විට තමාටමද මෙය ප්‍රකටවනු ඇත. එම නිසා කුමන ධර්මයක් මෙනෙහි කළ යුතු දැයි කල්පනා කරමින් සිටිය යුතු නොවේ. දක්නා අවස්ථාවක් පාසාම "දකිනවා-දකිනවා" යැයි මෙනෙහිකළ යුතුය. එලෙස මෙනෙහි කරන්නාට ප්‍රකට ධර්මය භාවනාරම්භයේදී *ලක්ඛණ- රස- පච්චුපට්ඨාන- පදට්ඨාන* යන මේවා අතරින් එකක්ම පමණක් ප්‍රකට වන්නේය. එම ධර්මය ප්‍රකට තාවය අනුව ඇති සැටිය දැන ගන්න. මෙලෙස ඇති සැටිය ප්‍රකට වනු පිණිසම දැන ගැනීම පිණිසම බැලීම අදහස්කොට විසුද්ධි මාර්ගයෙහි "**ලක්ඛණ රසාදිවසෙන පරිග්ගහෙතබ්බා**" යැයි ප්‍රකාශ කර ඇත. අර්ථය වනාහී "භාවනා ක්‍රම සාධණය කිරීම (53 පිටෙහි)ලා විස්තර කළේය.

සුතමය ඤාණය නොමැතිව ලක්ඛණාදිය දැනගත හැකි ආකාරය

සුතමය ඤාණය නොමැත්තාට ලක්ඛණාදිය දැනගත හැක්කේද? යන ප්‍රශ්නයට උත්තරය නම්: "දත හැකිය" යන්නයි. හේතුව වනාහි වර්තමානව පහළවන රූප- නාමයන් වහාම සමෘති- ප්‍රඥා යොදා හොඳින් මෙනෙහි කරන නිසාය. තවත් පැහැදිළිකොට දක්වතොත් ස්වභාව *ලක්ඛණය* යන්න රූප- නාමයන්ගේ, කය යනාදී වශයෙන් ව්‍යවහාර කරන්නාවූ ලක්ෂණයයි. *රස* යන්න නාම රූපයන්ගේ හැකියාව- කෘත්‍යයි. *පච්චුපට්ඨාන* යන්න මෙනෙහි කරන්නාගේ ඤාණයෙහි මෙම රූප-නාමයන් වඩාත් ප්‍රකටව හැසිරෙන ආකාරයයි. *පදට්ඨානය* යන්න මෙම රූප- නාමයන්ට ආසන්න කාරණයයි, හේතුවයි. එම නිසා නියම රූප- නාමයන් මෙනෙහි කරන්නහුගේ ඤාණයෙහි ඒවායේ ස්වභාවයන්ට අනුව ප්‍රකට වන්නේ නම් මේ දැක්වූ ලක්ෂණාදිය අතරින් එකක් වශයෙන්ම ප්‍රකට වේ. එම නියම රූප- නාමයන් තත්ත්වාකාරයෙන් දැනගනී නම් මෙම ලක්ෂණාදිය තුළින් එකක් වශයෙන්ම දැන ගනී. ඒ හැර අනිකුත් ස්වරූප වශයෙන් වනාහි ප්‍රකට වීමක් නොවන්නේය. දැන ගැනීමටද නොහැක්කේය. ඉදින් ඉබේ ප්‍රකට වූ ලක්ෂණාදිය තිබියදී අනිකුත් ස්වරූප ප්‍රකට නම්, වැටහේ නම් එසේ ප්‍රකට වූ දැනගත් දේවල්- ධර්ම නියම රූප- නාම ධර්ම විය නොහැක්කේය. *නාම පඤ්ඤත්ති, කිච්ච පඤ්ඤත්ති, උපනික්ඛිත්ත- උපනිධා පඤ්ඤත්ති(සංඛ්‍යාපඤ්ඤත්ති), සණ්ඨාන පඤ්ඤත්ති,* යන ආදීන්ගෙන් එක ආකාරයක *පඤ්ඤත්තියක්ම* වේ.

වර්තමානයේ පහළ වෙමින් පවතින්නා වූ රූප- නාම පහළවන පහළවන මොහොතේම මෙනෙහි කරමින් දැන ගන්නා තැනැත්තා දත යුතු රූප- නාමම දැන ගන්නවාක් මිස අනුමානයෙන් දැන ගන්නවා නොවේ. "මේ ධර්මය රූපයයි- මේ ධර්මය නාමයයි" කටපාඩම් කළ ආකාරයට අනුව කල්පනාකොට සිතා බලා දැන ගන්නවාද නොවේ. ඇත්ත වශයෙන්ම වනාහි ඒ ඒ ක්ෂණයෙහි පහළ වෙමින් පවතින ධර්මයන් පහළවන ආකාරයටම දැන ගනී.

එම නිසා ස්වභාව ලක්ෂණය ප්‍රකට නම් එම ලක්ෂණය දැන ගනී. *රසය* ප්‍රකට නම් එය දැන ගනී. *පච්චුපට්ඨාන- පදට්ඨාන* ප්‍රකට නම් ඒ අනුව දැන ගනී. උපමාවක් ලෙස අහසෙහි විදුලිය කොටන අවස්ථාවේ

එය නිරීක්‍ෂණය කරන්නා (විදුලි රේඛාවේ ලක්‍ෂණය වන) ප්‍රභාෂ්වර වර්‍ණයද ඇති ආකාරයට දනී (විදුලි රේඛාවේ රසය වන) අඳුර දුරු කරන කෘත්‍යයද ඇති සැටියෙන් දනී. විදුලි රේඛාව (පච්චුපපට්ඨානය වන) චාපයක්, රේඛාවක්, රේඛා සටහනක් වශයෙන් ඇති සැටියෙන් සටහන් දනී දකී. විදුලියට පදනම් වන (පදට්ඨානය වන) වැහි වලාකුළු ද ඇති සැටියෙන් දකී- දනී. විදුලිය කොටන ක්‍ෂණයෙහි නොබලා සිතා බලා කල්පනාකොට ඇත්තටම විදුලිය කෙටී යන ආකාරය තත්ත්වාකාරයෙන් දත නොහැක්කේය. දැකගත නොහැක්කේය. මේ ක්‍රමයටම පහළවන පහළවන, ක්‍ෂණයෙහි මෙනෙහි කරන්නේ නම් පෙර ඇසූ ඥාණයක් නැති නමුත් ඇත්තටම පහළවන රූප- නාම ආදියේ තත්ත්වාකාරය දත හැක්කේය. පහළවන පහළවන ක්‍ෂණයෙහි මෙනෙහි නොකර සිතා බැලීම්, කල්පනා කිරීම් මඟින් ,ඇත්තටම පහළවන රූප- නාම ආදියේ ලක්‍ෂණාදිය සුතමය වශයෙන් දැනගත්තත්, තත්ත්වාකාරය නම් නොදන්නවාම වන්නේය. අත්දෙක දෙස බලන්න. පරීක්‍ෂණය කර බලන්න. තම ශරීරයේ පහළවෙමින් පවතින්නාවූ වෙහෙස, වේදනා, රිදුම ආදී වින්දනයන්ට හොඳින් අවධානය යොමුකොට වරින් වර "වෙහෙස" යැයි මෙනෙහි කර බලන්න. නරක පහසක් විඳීම ලක්‍ෂණය ලෙස හෝ වේවා, සිත මිලාන වීමේ කෘත්‍යය හෝ වේවා, තමාට නොඉවසිය හැකි වේදනාවක් ලෙසට පච්චුපට්ඨාණය හෝ වේවා, අප්‍රිය පහස හමුවීම නම් වූ පදට්ඨානය හෝ වේවා සුතමය වශයෙන් ඥාණය දැනගෙන ඇතත්- නැතත් ප්‍රත්‍යක්‍ෂ ඥාණයෙන්ම තත්ත්වා-කාරයෙන්ම දැනගත හැකි බව ප්‍රකට වනු ඇත.

නමුදු මෙම *පදට්ඨානය* වනාහි කෙළින්ම භාවනා කරන රූප- නාම ධර්‍මයන්ගෙන් වෙන්වූ ස්වාධීන ධර්‍මයක් වන්නේය. එම නිසා භාවනාරම්භයේදී, නාම - රූප පරිච්ඡේද අවස්ථාවේදී, මෙම පදට්ඨානය වැදගත් නොවන්නේය. එසේ වැදගත් නොවන නිසාම **"ලක්ඛන-රස-පච්චුපට්ඨාන පදට්ඨාන වසෙන නාම- රූප පරිග්ගහො දිට්ඨි විසුද්ධිනාම"** යන අභිධර්‍මාර්ථ සංග්‍රහ ග්‍රන්ථයේ පාඨයට විස්තර දක්වන ප්‍රසිද්ධ බුරුම ටීකා (ටීකා ජෝ) ග්‍රන්ථයෙහි පදට්ඨාන වශයෙන් පරිග්‍රහ කිරීම අතහැර *ලක්ඛණ, රස, පච්චුපට්ඨාන* යන මේ තුන වශයෙන් පමණක් පරිග්‍රහ කරන ඥාණය *දිට්ඨි විසුද්ධිය* යැයි දක්වයි. එම දැක්වීම **"පදට්ඨානං පනෙතථ අඤ්ඤධම්මතාය න උද්ධටං"** යන [මහා ටී (බු.)1/449] හා සමානුපාතික බැවින් ගැළපේ.

මහා ටීකා අර්ථය

අඤ්ඤසද්ධම්මතාය	=	මනසිකාරය පැවැත්විය යුතු ධර්මය නොව අනෙකුත් බාහිර ධර්මයක් වන බැවින්
"පදට්ඨානං"	=	පාදස්ථානය.
එතථ	=	මෙම ධාතු හතර මත මනසිකාරය පවත්වන අවස්ථාවෙහි,
න උද්ධටං	=	නොදක්වයි [මහා ටී (බු.) 1/449]

අර්ථ වනාහී

ධාතු වවත්ථාන කර්මස්ථානය භාවනා කරන්නා *පඨවි ධාතුව* බලන්නේ නම් එම *පඨවි ධාතුව* කෙළින්ම බැලිය යුතුයි. මෙහි *පදට්ඨානය* වන්නා වූ ඉතිරි ධාතු තුන බැලීම අවශය නොවේ. *ආපො ධාතු* ආදීය භාවනාකොට බලන්නේ නම් එහිදීද මේ ක්‍රමයටමැයි. එම නිසා *පඨවි ධාතු* ආදිය වෙන් වෙන්ව භාවනාකොට බලන්න. මේවායේ *පදට්ඨාන ධාතුන්ට* මනසිකාරය යොදන්නේ නම් අනෙකුත් ධාතුන් වෙතට අවධානය විසිරී යයි. අරමුණු කරන ධාතුවට මනසිකාරය කෙළින්ම නොයයි. එම නිසා ධාතු වවත්ථාන අවස්ථාවේ *පදට්ඨාන* වශයෙන් මනසිකාරය පැවැත්වීම අට්ඨකථා හී ප්‍රකාශ නොවේ යන්න අදහසයි.

ටීකා ජෝ (අභිධම්මත්ථ විභාවිනී ටීකා) හා මහා ටීකාව සම වන ආකාරය.

ධාතු වවතථාන අවස්ථාවේදී මෙන් *නාම- රූප පරිච්ඡේද* අවස්ථාවෙහි ද පහළ වන්නා වූ රූප-නාමයන්ම වෙන් වෙන් කොට වටහා ගැනීම අවශ්‍ය වේ. මේවාට හේතුවන *පදට්ඨාන* ධර්මයන් දැන ගැනීම අවශ්‍ය නොවේ. මක්නිසාද යත් මෙම පදට්ඨානයෝ නාම- රූපම වන්නේ නමුදු කෙළින්ම මෙනෙහි කොට දතයුතු නාම- රූපයන්ගෙන් වෙන් වූ බාහිර ධර්ම වන බැවිනි. ඉදින් *පදට්ඨාන* වශයෙන් භාවනාකොට බලන්නේ නම් පඨවි ධාතුව ප්‍රකටව ආ අවස්ථාවකදී එය මෙනෙහි නොකොට ඉතිරි ධාතු තුන ප්‍රථමයෙන් මෙනෙහි කරමින් සිටිනවා විය හැක්කේය. *චක්ඛු පසාදය* ප්‍රකට අවස්ථාවේ එය මෙනෙහි නොකොට නිශ්‍රය ලබන භූත

රූපයන් ප්‍රථමයෙන් මෙනෙහි කරනවා විය හැක්කේය. වේදනාව ප්‍රකට අවස්ථාවෙහි ප්‍රථමයෙන් *ඵස්සයට* මනසිකාරය යොදනවා විය හැක්කේය. *ඵස්සය* ප්‍රකට අවස්ථාවේ ප්‍රථමයෙන් අදාල අරමුණට ගොස් මෙනෙහි කරනවා විය හැක්කේය. මේ ආදී ලෙසට ප්‍රකට වූ, වර්තමානව මෙනෙහි කළ යුතු ධර්‍මය මෙනෙහි නොකොට අප්‍රකට, සම්බන්ධයක් නැති වෙනත් ධර්‍මයක් ප්‍රථමයෙන් ප්‍රත්‍යාවෙක්‍ෂාකොට මෙනෙහි කරනවා වන්නේය. අනතුරුව ප්‍රකට අරමුණ නැවත මෙනෙහි කරනවා වන්නේය.

මෙලෙස භාවනාකොට බලන්නේ නම් හේතු ධර්‍මයද දැනගනිමින් සිටින බැවින් *පච්චය පරිග්ගහ ඤාණය* පහළවනු ඇත. *නාම- රූප පරිච්ඡේද ඤාණය* නොවනු ඇති. එම නිසා *නාම- රූප පරිච්ඡේද* අවස්ථාවෙහිදී *පදට්ඨාන* වශයෙන් මනසිකාරය නොපැවැත්වීමේ "ටීකා ජෝ" අදහස, දැක්වූ මහා ටීකාව හා තවත් සමීපව සම්පාත වේ. ගැළපේ. අභිධමාර්ථ සංග්‍රහ ග්‍රන්ථයේ *පදට්ඨානය* ඇතුලත්කොට දැක්වීම වනාහී *පච්චය පරිග්ගහ ඤාණය* ආසන්නයෙහි *දිට්ඨි විසුද්ධි* අවසානයෙහි *පදට්ඨාන* ප්‍රකටවීම අනුව එසේ භාවනාකොට බැලීම සිදුවිය හැකි බැවින් ඒ අදහසින් දක්වන දැක්වීමක් වන්නේය. ලක්‍ෂණාදිය තුළින් එකක්ම පමණක් වටහාගත හැක්කේය. රූප- නාම වලින් එකක් වරින් වර මෙනෙහි කරන අවස්ථාවෙහි *ලක්ඛණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන* යන මේවායින් එකක් පමණක් එක වරකට ප්‍රකට වේ. එකක්ම මෙනෙහිකොට දත හැක්කේය. දෙකක්- තුනක්- හතරක් එකට නොවේ. එලෙස මේවා සියල්ල එකවර නොදත හැක්කේය. මේවා එකවර මෙනෙහි කොට දත හැකි වූ විටදීත් පචා කෘත්‍ය සම්පූර්ණ නොවේ. නැවත නැවත මෙනෙහි කරන්නාහු විසින් එකක් එකක් වශයෙන් වටහා ගැනීමෙන්ම කෘත්‍ය සිදුකර ගනී.

එමනිසා (මහා ටී. (බු.) 1/433) පහත සඳහන් ලෙසට පැහැදිළි කරයි.

කස්මා පනෙත්ථ උභයග්ගහණං, පුග්ගලජ්ඣාසයතො, එකච්චස්ස හි ධාතුයො මනසිකරොන්තස්ස තා සභාගතො ගහෙතබ්බතං ගච්ඡන්ති, එකච්චස්ස සකිච්චක-රණතො, යො රසොති වුච්චති.

පන	= චෝදනා අර්ථයෙහි නිපාතයකි
එත්ථ	= මේ චතු ධාතු විෂයෙහි මනසිකාරය යෙදවීමේදී
උභයග්ගහණං	= ලක්ඛණ- රස දෙකම ගැනීම, බැලීම
කස්මා	= කුමක් නිසාද යත්:

පුගගලජඣාසයතො = පුද්ගලයන්ගේ විවිධ අදහස් උදහස් නිසා

හොති = වන්නේය.

හි = විස්තරකොට දක්වුවහොත්

ධාතුයො = ධාතු සතර

මනසිකරොනතසස = මනසිකාරය පවත්වන්නාවූ

එකචචසස = සමහර පුද්ගලයෙකුට

තා = එම ධාතූන්

සභාව තො = ස්වභාව ලක්‍ෂණය වශයෙන්

ගහෙතබබතං = ගත යුතු, මනසිකාරය පැවැත් විය යුතු බවට

ගචඡනති = යෙත්

එකචචසස = සමහර පුද්ගලයනට

ස කිචචකරණතො = ස්වකීය කෘත්‍යය කිරීම වශයෙන්

ගහෙතබබතං = ගත යුතු මනසිකාරය පැවැත්විය යුතු බවට

ගචඡති = යේ

යො = එම ස්වකීය කෘත්‍යය කිරීම

රසොති = රසය යැයි

වුචචති = කියනු ලැබේ.

තේරුම වනාහි

සතර මහා ධාතු අනුව මනසිකාරය පවත්වන්නා වූ තැනැත්තා *ලක්ඛණ* වශයෙන් පමණක් භාවනා කොට බලන්නේද කෘත්‍යය සම්පූර්ණ වේ. *රස* වශයෙන් පමණක් භාවනා කොට බලන්නේද කෘත්‍යය සිද්ධවේ. *ලකඛණ- රස* යන දෙකම වශයෙන් එකට මනසිකාරය නොපැවැත්විය යුතුය. එසේ භාවනා කොට බැලීමට ද නොහැකි වන්නේය. එසේ වතුදු **ලකඛණ - රස** යන දෙකම වශයෙන් බලන ආකාරය කුමක් නිසා මෙසේ දක්වත්ද යත්: විවිධ පුද්ගලයන්ගේ විවිධ අදහස් වලට සමගාමී වීම අවශ්‍ය නිසාය. විග්‍රහකොට දක්වතොත්, සතර මහා ධාතූන්ට අනුව මනසිකාරය පවත්වන්නේ සමහරෙකුට මේ සතර මහා ධාතූන් සභාව ලක්‍ෂණ වශයෙන් ප්‍රකට වේ. ඔවුන්ට මේ ධාතූන් සභාව ලක්‍ෂණ වශයෙන්ම ගත හැක්කේය.

දත හැක්කේය. සමහරෙකුට ඒවායේ කෘත්‍යය සම්පූර්ණ වීම් වශයෙන් ප්‍රකට වේ. එවැන්නන්ට කෘත්‍යය සම්පූර්ණ වීම් වශයෙන් බැලිය හැකිය. දත හැකිය. එම කෘත්‍යය සම්පූර්ණ වීම යනු *රස* යැයි කියන දෙයම වේ.

කිච්චයුත්ත සංක්ෂේපයෙන්

සමහරෙකුට ලක්ෂණය පමණක් ප්‍රකට වී ඒ මතම මනසිකාරය පවත්වා වටහා ගත හැකි වන්නේය. සමහරකුට රසයම ප්‍රකට වී ඒ මතම මනසිකාරය පවත්වා වටහා ගත හැක්කේය. එම නිසා විවිධ පුද්ගලයන්ගේ ප්‍රකටවීම්- වටහා ගැනීම්- සමෘධ වීම් සලකා අට්ඨකතා හි *ලක්ඛණ - රස* යන දෙකම දක්වා ඇත්තේය. එක පුද්ගලයකුට නමුත් *ලක්ඛණ- රස* යන දෙකම වශයෙන් සමෘධවීනම් දක්වනවා නොවේ.

දැකීම මෙනෙහි කරන්නාට දක්නා අවස්ථාවේ ප්‍රකටව ඇති ධර්ම තුළින් එකක් පමණක්, ලක්ෂණ ආදී එකක්ම වශයෙන් ප්‍රකට වේ. මෙනෙහි කරන්නාද එම ප්‍රකට ධර්මය ප්‍රකට වන ආකාරයටම තත්ත්වාකාරයෙන් දනී. එසේ වටහා ගන්නා ආකාරය අනු පිළිවෙලින් දක්වන්නෙමු.

චක්ඛු ප්‍රසාදය වටහා ගැනීම

වර්ණ රූපය ප්‍රකට වනු පිණිස "ඇසේ ඔපය" යැයි හෝ වේවා ඇසේ පෙනීම හොඳය යැයි කියා හෝ වේවා වටහා ගැනීම *ලක්ඛණ* වශයෙන් තත්ත්වාකාරයෙන් වටහා ගැනීම වන්නේය. "ඔපවත් වූ චක්ෂු රූපයේ ස්වභාව ලක්ෂණය වටහා ගැනීම " යැයි කියැවේ. ඉදිරියටද මෙම ක්‍රමයටමැයි. වර්ණ රූපය දෙසට යොමුකිරීම් වශයෙන් වේවා දකින්නට සැලැස්වීම වශයෙන් වේවා වටහා ගැනීම *රසය* තත්ත්වාකාරයෙන් වටහා ගැනීම නම් වේ. "**රූපෙසු ආවිඤ්ඡන** = වර්ණ රූපය දෙසට ඇදී යන්නාවූ- යොමු කරවන්නාවූ- දැකීමට සලස්වන්නාවූ" යන මේ යෙදුම් අර්ථය වශයෙන් සමානමැයි. එමනිසා පහසුවෙන් වටහා ගැනීම පිණිස "වර්ණ රූපය දෙසට යැවීම්, දකින්නට සැලැස්වීම්" යැයි දක්වන්නට යෙදුනි. ව්‍යාකරණාර්ථ වශයෙන් මෙලෙස සම්පූර්ණ එකඟත්වයක් නොදක්වමින් නමුත් ව්‍යවහාරය අනුව කියනා බව ඉදිරියටත් හමුවන වාරයක් පාසා සළකා ගත යුතුයි. දැකීමේ පදනම යැයි හෝ වේවා " මෙතැන සිට දකිනවා යැයි" කියා හෝ වේවා වටහා ගැනීම *පච්චුපට්ඨානය*

තත්ත්වාකාරයෙන් වටහා ගැනීම නම් වේ. **කම්මජ භූත රූපං** කර්මය නිසා පහළ වූ ප්‍රකට වූ ඕලාරික රූපය යැයි කියනු ලබන ඇස් ගෝලය ගෙන ඇසේ ඔපය යැයි වටහා ගැනීම *පදට්ඨානය* තත්ත්වාකාරයෙන් වටහා ගැනීමයි.

රූපායතනය

වර්ණ රූපය තත්ත්වාකාරයෙන් වටහා ගන්නේ නම්, ඇසට ප්‍රකට වී යැයි හෝ වේවා (*ලක්ඛණ*), දැක්කේ යැයි හෝ වේවා (*රස*), දැකීමට ගොචර යැයි හෝ වේවා, දැකීම මෙයට ලඟාවී යැයි කියා හෝ වේවා (*පච්චුපට්ඨානය*), භූත රූප යැයි කියනු ලබන රූපය ඇසුර ලබන්නේ යැයි කියා හෝ වේවා (*පදට්ඨානය*) වටහා ගනී.

ඉහත සඳහන් ලෙසට චක්ෂු රූපය- වර්ණ රූපයන් ලක්‍ෂණාදීන් අතරින් එකක් මගින් වටහා ගැනීම **"චක්ඛුඤ්ච පජානාති - රූපෙ ච පජානාති"** යන එම පාළියෙහි අට්ඨකථා දැක්වීමට අනුවයැ.

අට්ඨ කථා අර්ථය

චක්ඛු පසාදං	=	ඇසේ ඔපයද,
රූපං ච	=	වර්ණ රූපයද,
යාථාවසරස ලක්ඛණ වසෙන	=	නියම රසය ලක්ෂණය වශයෙන්
පජානාති	=	දැන ගනී.

සමහරෙක් *ධාතු වවත්ථාන* සමථ අවස්ථාවෙහි දැක්වූ *චූර්ණ මනසිකාර* ක්‍රමයෙන් ක්‍රමය උපුටාගෙන විපස්සනා අවස්ථාවෙහිද රූපයන් අංශු අංශු ලෙස ප්‍රකට වන ලෙසට මනසිකාරය පැවැත්වීම, සළකා බැලීම කරයි. එලෙස සළකා බැලීම මඟින් ලක්‍ෂණාදිය වශයෙන් තත්ත්වාකාරයෙන් වටහාගැනීම සිදුවිය නොහැකි නිසා මෙහිලා එය නොගැළපෙන්නකි.

චක්ඛු විඤ්ඤාණ

දැකීම පිළිබඳව ඇති සැටියෙන් දැනගත්තේ නම් දැකීම ඇසෙහි සිදුවේ. රූපයක් දකී යන ලෙසට වේවා (*ලක්ඛණ*), රූපයක්ම අරමුණු කිරීම සිදුවේයැයි හෝ වේවා හුදු දැකීම යැයි හෝ වේවා (*රස*), රූපය දෙසට

ඇස යොමු කරවීම වශයෙන් හෝ වේවා (*පච්චුපට්ඨානය*), මනසිකාරය යොමුකොට දකීයැයි හෝ වේවා ඇස හා දැකිය යුතු රූපයක් ඇති විටම දකීයයි හෝ වේවා, පෙර කළ හොඳ කර්මයක් නිසා දක ගන්නේය. කර්මය නරක නිසා නරකක් දකින්නට වී යැයි හෝ වේවා (*පදට්ඨානය*) දැන ගනී. (**රූපාරම්මණාය, කිරියා මනොධාතුයා අපගම පදට්ඨානං** = (ඛන්ධ නිද්දේස) **සංඛාර පදට්ඨානං වත්ථාරම්මණ පදට්ඨානං වා** (පටිච්ච සමුප්පාද විවරණය)

චක්ඛු සම්ඵස්ස

මෙය තත්වාකාරයෙන් දන්නේ නම් *රූපාරම්මණයක* මුණ ගැසීමක් කියා හෝ වේවා (*ලක්ඛණ*), *රූපාරම්මණය* හා හැපීම (*රස*), ඇසත්, රූපයත්, දකීමත් යන මේ තුන එකට ගමන් කිරීම කියා හෝ වේවා (*පච්චුපට්ඨානය*) *රූපාරම්මණය* පැහැදිළිව හමුවීම හෝ දකීම ලෙසට වේවා (*පදට්ඨානය*) දක ගනී

සුඛ

දකීමට ප්‍රියමනාප රූපයක් තත්වාකාරයෙන් දක ගන්නේ නම් " දකීමට හොඳයැ" යි හෝ වේවා (*ලක්ඛණ*), ඉෂ්ඨ ස්වභාවය වශයෙන් විඳින්නේ හෝ වේවා (*රස*), සිත් හී ආශ්වාදජනක භාවයක් යැයි හෝ වේවා (*පච්චුපට්ඨාන*), ප්‍රිය මනාප රූපයක් දුටුවා හොඳ යැයි හෝ වේවා, රුචිදෙයක් දුටුවා හොඳ යැයි හෝ වේවා (*පදට්ඨානය*) දැනගනී.

දුක්ඛ

දකීමට අප්‍රිය- අමනාප රූපයක්, නරක දෙයක් තත්වාකාරයෙන් දකී නම් දකීමට අප්‍රිය, දකීමට නරක දෙයක්, නොහෙබිනා දෙයක් යැයි හෝ වේවා (*ලක්ඛණ*), අනිෂ්ඨ ස්වභාව වශයෙන් විඳීමක් යැයි හෝ වේවා (*රස*), සිතට දුෂ්කර වින්දනයක් යැයි හෝ වේවා (*පච්චුපට්ඨාන*), ආශ්‍රය රූපය ලැබීම නරකක් වී යැයි, අනිෂ්ඨ රූපයක් දක්මෙන් දුකට පත්වී යැයි, නොදකිය යුතු රූපයක් දකීමෙන් දුකට පත්වී යැයි කියා හෝ (*පදට්ඨානය*) දැන ගනී.

උපෙක්ඛා

අදුක්ඛම සුඛ යැයි කියන *සුඛ- දුක්ඛ* ගණයට නොවැටෙන වින්දනයක් දකගෙන, දකීමට නරකත් නැති හොඳත් නැති යැයි හෝ වේවා (*ලක්ඛණ*),

ප්‍රබෝධමත්ද නොවන මිලානත් නොවන දෙයක් යැයි හෝ වේවා (*රස*), ශාන්ත භාවයක් ලෙස හෝ වේවා (*පච්චුපට්ඨානය*), ප්‍රීතිය නොයෙදී, හොඳ- නොහොඳ සම සමවී පවතී යැයි හෝ *අදුක්ඛම සුඛ රූපයන්* දැකීමෙන් සම දැක්මක් වන්නේ යැයි හෝ වේවා (*පදට්ඨානය*) දැන ගනී. **(නිප්පීතික චිත්ත පදට්ඨානා, උපෙක්ඛා එස්ස පදට්ඨානා වේදනා)**

සුඛ දුක්ඛ වේදනාවෝ *චක්ඛු විඤ්ඤාණ* හා නොයෙදෙන නමුත් විපස්සනාව සම්බන්ධ ග්‍රන්ථයන්හි ද්වාර හයෙහිම වේදනා තුනම දක්වන ආකාරයන්ට අනුව "දකිනවා මෙනෙහි කොට වටහාගන්නා අවස්ථාවෙහි *සන්තීරණ, ජවන, තදාලම්බනයන්* හා යෙදෙන වේදනාවන් ගෙන වේදනාවන් තුන් ආකාරයන්ම, සම්පූර්ණයෙන් දක්වත්. අභිඤ්ඤෙය්‍ය සූත්‍රය හා පරිඤ්ඤෙය්‍ය සූත්‍රයන් සම්බන්ධ කොට ඉදිරියේදී පැහැදිලි වනු ඇත.

විශේෂයෙන් සිත්හි දරාගත යුත්තක්

මෙහිලා බහුශ්‍රැත භාවයට අදාළව කාරණයක් ගෙන හැර දක්වන්නෙමු. **උපෙක්ඛා පන අකුසල විපාකභූතා අනිට්ඨත්තා දුක්ඛෙ අවරොධෙතබ්බා, ඉතරා ඉට්ඨත්තා සුඛෙ** යන මූල ටීකා (බු.) 2/121 පිටුවෙහි හා මහා ටීකා 2/326 පිටුවෙහි දැක්වෙන ආකාරයට අනිෂ්ඨාරම්මණයක් දකින *චක්ඛු විඤ්ඤාණ* හා යෙදෙන උපේක්ෂාව දුකක් යැයිද ඉෂ්ඨාරම්මණයක් දකින *චක්ඛු විඤ්ඤාණය* හා යෙදෙන උපේක්ෂාව සුඛ යැයිද කියනු ලැබේ. තවදුරටත් *අනිට්ඨත්තා ඉට්ඨත්තා* යන හේතු සළකා බලා *ඉට්ඨානිට්ඨ* නොවූ සාමාන්‍ය රූපාරම්මණයන් දකින සිත් හා යෙදෙන උපේක්ෂාව වනාහී 'උපෙක්ඛා' යයි කියනු වටී. *චක්ඛු විඤ්ඤාණ* ආදියෙහි උපෙක්ඛාව පමණක්ම යෙදුනද ඉතා හොඳ රූපයක්, ශබ්දයක්, ගන්ධයක්, රසයක් හමුවී එය විඳගන්නා විට සුඛ වින්දනය ප්‍රකටය. ඉතා නරක (අති අනිශ්ඨවූ) රූප, ශබ්ද, ගන්ධ, රසයන් හමුවී විඳගන්නා අවස්ථාවේ දුක්ඛ වේදනාව ප්‍රකටය. ගන්ධයන් රසයන් විෂයෙහිද මේ ලෙසට විශේෂයෙන් ප්‍රකටය, සුගන්ධ දියර, මල් සුවඳ ආඝ්‍රාණය කරනවිට හොඳ බොජුන් බත්, ව්‍යංජන, රසකැවිලි පැණි බීම, අනුභව කරන විට සුඛ වින්දනය ප්‍රකට යැ. අප්‍රිය- කුණු ගඳක්, කර ගඳක් ආඝ්‍රාණය කරන විට, අම්හිරි- කටුක බේත් වළඳන අවස්ථාවන්හි නරක දුක් වේදනාවෝ ප්‍රකටයැ. තවදුරටත් *කාය විඤ්ඤාණයෙහි සුඛ-දුක්ඛයන්ම* යෙදෙන නමුත් පහස ලබන වාරයක් වාරයක් පාසා *සුඛ-දුක්ඛයන්ම* පමණක්ම ප්‍රකට වනවා නොවේ. *අදුක්ඛම සුඛ* වූ සාමාන්‍ය

පොට්ඨබ්බයන් පහස විඳින අවස්ථාවේ මධ්‍යස්ථ වින්දනයක්ද ප්‍රකට වන්නේය. නමුදු එම මධ්‍යස්ථ වින්දනය *ඉට්ඨ මජ්ඣත්ත පොට්ඨබ්බයට* අනුව වන්නාවූ 'මඳ සුඛ වේදනා යැයි'ම මෙනෙහි කළ යුතු වේ. මෙය වනාහි ටීකාවන්ට අනුව බහුශ්‍රැත භාවය සඳහා ගෙනහැර දක්වන ලද කථාවක් යැයි සිත තබාගත යුතුය.

දැකීමේ කෘත්‍යය සමෘධ කළ හැකි වූ ඇස, වර්ණ රූප, දකින *චක්ඛු විඤ්ඤාණය* පහස ලබන *ඵස්සය*, විඳින වේදනාව යන මේ ධර්මයෝ පස්දෙන දකින දකින අවස්ථාවෙහි "දකිනවා - දකිනවා" යැයි මෙනෙහි කොට දැක්වූ ආකාරයට *ලක්ඛණ-රස- පච්චුපට්ඨාන* වශයෙන් *අජ්ඣාසයට* අනුව දැන ගත යුතු වේ. *දිට්ඨි විසුද්ධිය* සම්පූර්ණ වන අවස්ථාවෙහි *පදට්ඨාන* වශයෙන් ද යොග්‍ය ක්‍රමයට දත යුතු යැයි යන අදහස් *සළායතන සංයුත්තයේ* හා *පටිසම්භිදා මග්ගයෙහි* පහත දැක්වෙන ලෙසට දේශනා කර ඇති සේක.

චක්ඛුං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යං, රූපා අභිඤ්ඤෙය්‍යා, චක්ඛු විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, චක්ඛු සම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛංවා දුක්ඛං වා අදුක්ඛම සුඛං වා තම්පි අභිඤ්ඤෙය්‍යං.

[සං. නි. 2/462 ප. ම. 12]

භික්ඛවෙ = මහණෙනි,

චක්ඛුං = ඇස

අභිඤ්ඤෙය්‍යං = සෘජුවම දත යුතුයි

වා = මෙනෙහිකොට දැන ගන්නා විශිෂ්ඨ
ඥාණයෙන් දැනගත යුතුය.

රූපං = වර්ණ රූපය

අභිඤ්ඤෙය්‍යං = සෘජුවම දත යුතුය,

වා = මෙනෙහිකොට දැන ගන්නා විශිෂ්ඨ
ඥාණයෙන් දැනගත යුතුය.

චක්ඛු විඤ්ඤාණං = දකින සිත

අභිඤ්ඤෙය්‍යං = දත යුතුයි

චක්ඛු සම්ඵස්සො = දැකීම හෙවත් චක්ඛුපසාදයේ පවතින සම්ඵස්සය

චක්ඛුං සම්ඵස්ස පච්චයා = දැකීම ප්‍රත්‍යකොට ගෙන

සුඛං වා = සුඛ හෝ වේවා

දුක්ඛං වා = දුක් හෝ වේවා

අදුක්ඛම සුඛං වා = අදුක්ඛම සුඛ හෝ වේවා

යං ඉදං වේදයිතං = යම් ඒ වේදනාවක්, වින්දනයක්

උපසජ්ජති = උපදීද

තමපි = එම තුන් ආකාර වින්දනයන්ද

අභිඤෙය්‍යං = සෘජුවම දැනගත යුතුය.

වා = මෙනෙහි කොට දැන ගන්නා විශිෂ්ට ඤාණයෙන් දත යුතුය

සුතමය, චින්තාමය යන මේවා විපස්සනාව නොවේ

මතුවන මතුවන රූප- නාමයන්ගේ සවභාව ලක්‍ෂණයන් ආදිය මෙනෙහි කරමින් දැන ගැනීම වනාහි දැන ගැනීමට සුදුසු ඤෙය්‍ය ධර්මයන්ට මනසිකාරය යොමුකොට සෘජුවම දැන ගැනීමක් වේ. මෙය සුතමය- චින්තාමය හෝ සමථ භාවනාමය දැනීමට වඩා විශේෂ වූ දැනීමක් වන්නේය. එම නිසා **අභිඤෙය්‍යං** = සෘජු ලෙසම දත යුතුයි, විශේෂ ඤාණයෙන් දත යුතයි යන අර්ථ දෙක මෙහිදී 'මෙනෙහි කොට දත යුතුයි' යන්න හා අර්ථ වශයෙන් සමවේ. එම නිසා **අභිඤෙය්‍යං** යන්න මෙනෙහිකොට දත යුතු යැයි අර්ථය ගත යුතුවේ. මහාටීකා විවරණය ආධාර කරගෙන මෙය මෙසේ පැහැදිළි කරන්නෙමු.

සභාව ධම්මානං ලක්ඛණ සල්ලක්ඛණතො ඤෙය්‍යං අභිමුඛා පඤ්ඤා අභිඤ්ඤා පඤ්ඤා [මහා ටී. (බු) 2/387]

අපි ච සුතමයාය චින්තාමයාය එකච්ච භාවනාමයාය ච අභිවිසිට්ඨාය පඤ්ඤාය ඤාතා අභිඤ්ඤාතා [මහා ටී. (බු.) 2/507]

සභාව ධම්මානං = රූප- නාම ස්වභාව ධර්මයන්ගේ,

ලක්ඛණ සල්ලක්ඛණතො = ස්වභාව ලක්‍ෂණය මෙනෙහි කරන බැවින් (ප්‍රධාන නය ක්‍රමයට මෙහි දක්වන නමුත් රස ආදිය මෙනෙහි කිරීමද මෙහිලා ඇතුළත්ය)

ඤෙය්‍ය අභිමුඛා = දත යුතු රූප- නාමයන්ට අභිමුඛ වූ,

පඤ්ඤා = *ඤාත පරිඤ්ඤා* යැයි කියන **අභිඤ්ඤා පඤ්ඤා** නම් වේ.
(කෙළින්ම දක්වතොත් *නාම- රූප පරිච්ඡෙද, පච්චය පරිග්ගහ* යන ඤාණයන් දෙක වෙත්)

අපි ච = වෙනත් ආකාරයකටද

සුතමයාය ච = පෙර ඇසූ විරූ-සුතමය ඤාණයෙන්ද

චින්තාමයාය ච = චින්තාමය ඤාණයෙන්ද

එකච්ච භාවනාමයාය ච = සමහරක් භාවනාමය ඤාණයන්ගෙන්ද *(ඣාන සම්පයුත්ත පඤ්ඤා හා අභිඤ්ඤා පඤ්ඤා* මෙහිලා ගැනේ)

අභිවිසිට්ඨාය = අති විශිෂ්ඨවූ

පඤ්ඤාය = *නාම- රූප පරිච්ඡෙද, පච්චය පරිග්ගහ* යන ප්‍රඥාවන් ගෙන්

ඤාතා = දත යුතු රූප- නාමයන්

අභිඤ්ඤතා = *'අභිඤ්ඤාණ ධම්'* යැයි කියනු ලැබේ.

මෙ ටීකා දැක්වීම් දෙක තුළින් ප්‍රථම දැක්වීම වනාහි *'ඤාත පරිඤ්ඤා''* යැයි කියන *අභිඤ්ඤා* පදයේ විවරණයයි. එම විවරණය මගින් "රූප-නාමයන්ගේ ස්වභාව ලක්‍ෂණාදිය මෙනෙහි කොට එයට මනසිකාරය යොමුකරමින් අභිමුඛව දැන ගැනීම *ඤාත පරිඤ්ඤා* සංඛ්‍යාත *අභිඤ්ඤා පඤ්ඤා*" නම් වේ යැයි දක්වයි. දෙවැනි දැක්වීම *ඤාත පරිඤ්ඤාව* මගින් දත යුතු රූප - නාමයන් දක්වන *අභිඤ්ඤා* පදයෙහි විවරණයයි. මේ විවරණය අනුව "පෙර දැක්වූ ආකාරයට ලක්‍ෂණාදිය මෙනෙහිකොට දැන ගැනීම වනාහී සුතමය චින්තාමය හා සමහර භාවනාමය ඤාණයන්ටත් වඩා විශේෂ වන බැවින් *අභිඤ්ඤා පඤ්ඤා* නම් වේ. එම ඤාණයෙන් දත යුතු රූප -නාමයන් *අභිඤ්ඤා* නම් වේ යැයි දක්වයි" එම නිසා *සුතමය-චින්තාමය ඤාණයන්* වනාහි අභිඤ්ඤා ඤාණ පහළ කරවීමට සමත් නොවන නිසා ඒවා නාම-රූප පරිච්ඡේද ඤාණ මට්ටමටවත් නොවේ. ඊටත් වඩා උතුම් විපස්සනා ඤාණ වලට වඩා පහළ බවට විශේෂයෙන් කිව යුත්තක් නැතැයි නිගමනයකළ හැක.

මෙම *අභිඤ්ඤෙය්‍ය* සූත්‍රයෙහි 'ඇස මෙනෙහි කරමින් සෑහුවම දත යුතුයි. වර්ණ රූප ආරම්මණ මෙනෙහි කරමින් සෑහුවම දත යුතුයි' යන ලෙසට පිළිවෙලින් එක එකක් වශයෙන් දේශනා කිරීම වනාහි දේශනා විලාශයයි. ඒ අනුව දකින දකින වතාවෙහි පස් ආකාරයට මෙනෙහි කිරීම කළ යුතු යැයි වරදවා ගත යුතු නැත. හේතුව වනාහි පස් වතාවකට මෙනෙහි කරමින් සිටින්නේ නම් එලෙස මෙනෙහි කරන අතර වාරයේදීම දැකීමේ කෘත්‍ය බොහෝ වාරයක් දිගට සිදුවී හමාරවනු ඇත්තේය. එම අවස්ථාවෙහි දැකීමක් පාසා පස් ආකාරයකට ලුහුබැඳ මෙනෙහි කිරීම අපහසුය. ඉදින් හැකි වන්නේ නම්, අරමුණේ බිඳීම දැන ගත් පසු එසේ දැන ගන්නා සිතේ බිඳීමත්, අතරමැද වීථි වලට ඉඩ නොතබා දැන ගත හැකි විටම *භංග ඤාණය* පහලවේයැයි පටිසම්භිදා මග්ගයේ දක්වෙන කතා ආදිය හා නොගැළපේ. එම නිසා දකින දකින අවස්ථාවෙහි දක්වූ ක්‍රමයට අනුව වරක් වරක් බැගින් මෙනෙහි කළ යුතු වේ. මෙලෙස මෙනෙහි කොට විශේෂයෙන් ප්‍රකට ධර්මය ප්‍රධාන කොට දැනගැනීම මගින් ධර්ම කොටස් පහම මෙනෙහි කිරීමේ කෘත්‍යය, දැන ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වේ. සම්පූර්ණ වන ආකාරය *අභිඤ්ඤෙය්‍ය* සූත්‍රයෙහිලා දක්වන්නෙමු. මෙලෙස මෙනෙහි කරමින් දැන ගනිමින් *ඤාත පරිඤ්ඤා* යැයි කියන *නාම-රූප පරිච්ඡේද ඤාණය* හා *පච්චය පරිග්ගහ ඤාණයෙන්* පිරිසිදු වූ කල්හි 'දකිනවා' යැයි මෙනෙහි කරන කරන වාරයක් පාසා " මෙම දැකීම පෙර නොතිබී දැන්ම පහළ වී ආයේ යැයි මෙම ධර්මයන් පහ පහළ වීමද දනී. පහළ වූ සැනින් බිඳී විනාශ වන්නේ යැයි බිඳීමද දැන ගනී". ඤාණය වඩාත් ශක්තිමත්ව ආ කළ "වහ-වහා බිඳි බිඳී යන්නේ යයි" දැන ගනී. ඇතිවීම - නැතිවීම දැක දැන ගන්නා අවස්ථාවේ පටන් පහළ වී වහාම බිඳී යන බව දැක ගත් බැවින් "නිත්‍ය නොවන්නේ " යැයි නියම අනිච්ච ලක්ෂණය දැන ගනී. ඇතිවීම-නැතිවීම අතරක් නොතබා-ඉස්පාසුවක් නොතබා සිදු වන බව දැන ගන්නා නිසා "දුකක් යැයි- නරකක් යැයි" නියම දුක්ඛ ලක්ෂණය තත්ත්වාකාරයෙන් දැන ගනී. තමාගේ අභිමතය ඇතත් නැතත් ඒ අනුව නොපිහිටා ඒවාට ආවේණික ලෙසට ඇතිවෙමින්-නැතිවෙමින් යන බව දැන ගන්නා නිසා කැමැත්ත පරිදි පැවැත්විය හැකි වශීභාවයක් නැතැයිද, ආත්මයක් නොමැත්තේ යැයිද නියම අනත්ත ලක්ෂණයද තත්ත්වාකාරයෙන් දැන ගනී. මෙලෙස දැන ගැනීම වනාහී දකින අවස්ථාවෙහි ඇති ධර්ම ඇතිවීම -නැතිවීම හෙවත් අනිච්ච ලක්ෂණාදිය

වශයෙන් වෙන් වෙන්ව පවතින ත්‍යත්ත්වාකාරයෙන් දැන ගැනීම නම් වේ. දකින දකින අවස්ථාවේ මෙලෙස මෙනෙහි කොට දැන ගැනීමේ වටිනාකම දැක්වීමේ අදහසින් සංයුක්ත නිකාය සහ පටිසම්භිදා මග්ග යන ග්‍රන්ථවල පහත සඳහන් *පරිඤ්ඤෙය්‍ය* සූත්‍රය දේශනා කොට ඇති සේක.

චක්ඛුං භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යං රූපං පරිඤ්ඤෙය්‍යා චක්ඛු විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං චක්ඛු සම්ඵස්සො පරිඤ්ඤෙය්‍යො යදම්දං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛම සුඛං වා තම්පි පරිඤ්ඤෙය්‍යං (**පරිඤ්ඤෙය්‍යං** ඇතිවීම් නැතිවීම් අනිච්ච ලක්ෂණාදිය වශයෙන් වෙන් වෙන් වශයෙන් දැන ගත යුතු යැයි යන අර්ථය දෙයි. සෙස්ස සමානය. මේ **අභිඤ්ඤෙය්‍ය පරිඤ්ඤෙය්‍ය** සූත්‍රයෙන්හි ද්වාර හයම දක්වා මෙලෙසටම දේශනා කොට ඇති සේක. **සොතං අභිඤ්ඤෙය්‍යං සද්දා අභිඤ්ඤෙය්‍යා** ආදී ලෙසට සූත්‍රය බහුල ඇත්තවුන්ට තම ඥාණය විහිදුවා දත හැක්කේය. එම නිසා මෙම සූත්‍රයන්ගේ පසු භාගය මෙහිලා නොදක්වනු ලැබේ.)

මේ *පරිඤ්ඤෙය්‍ය* සූත්‍රයෙහිද දකින දකින අවස්ථාවේ එක් වරක් පමණක් මෙනෙහි කොට එක් එක් ධර්මයක ඇතිවීම, නැතිවීම නම් වූ අනිත්‍ය ලක්ෂණාදිය ප්‍රධානකොට වටහාගන්නේ නම් ඒ ඒ දක්නා අවස්ථාවේ ඇති ධර්ම පස්දෙනම වෙන් වෙන් වශයෙන් දැනගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වේ. එම ධර්මයන් මත නිච්ච- සුභ- අත්ත යැයි වරදවා ගන්නා වූ කෙළෙස් ගති පහළ නොවනු පිණිස දැනගැනීම සම්පූර්ණ වේ යන්න මෙහි අදහසයි. ප්‍රකටව දක්වතොත්: දැකීම සම්බන්ධව කෙළෙස් පහළවීම වනාහි දකින අවස්ථාවේ ප්‍රකට වූ ධර්මයක් හේතු කොට ගෙනම සිදු විය හැක්කේය. අප්‍රකට හෝ නොදන්නා ධර්මයන් මුල් කොට ගෙන, හේතු කොට ගෙන කෙළෙස් පහළ නොවිය හැක්කේය. උපමාවක් ලෙස මනුෂ්‍යයෙක් පිළිබඳව මනාප බව එම පුද්ගලයා දකින හමුවන නිසාමත් සිදුවිය හැකි අතර අනුන් කියන්නක් ඇසීම නිසා ඔහු ගැන, වහාම කිපීමද විය හැක්කේය. ඉදින් මනුෂ්‍යයෙක් හමුනොවී ඔහු ගැන නොඇසූ විරූ නම් එම මනුෂ්‍යයා ගැන කැමැත්තක් හෝ අකමැත්තක් පහළ විය නොහැක්කේය. මක්නිසාද යත්: එම මනුෂ්‍යයා තම සිතෙහි අප්‍රකට නිසා හෝ කිසිවක් නොදන්නා නිසා නොවන්නේද? මේ ලෙසට මැයි. මේ උපමාවට අනුවද රූපාරම්මණයක් පෙර නුදුටු විරූ නම්, දැන්ද දකිමින් සිටිනවා නොවේ නම්, මෙවැන්නක් දැකිය හැක්කේ යැයි සිතට අදහසක් පහළ නොවේ නම්

එම *රූපාරම්මණය* වනාහි ළඟා නොවූ, අසා නොමැති, නොදන්නා වූ ප්‍රදේශයක්, ගමක්, නගරයක්, දේව ලෝකයක්, අනෙකුත් බාහිර සක්වලවල් වල ඇත්තාවූ ස්ත්‍රී- පුරුෂයන්ගේ රූප සටහන් මෙන් වේ. එවැනි රූප සම්බන්ධයෙන් ලෝභ- දෝෂ ආදී කෙළෙස් පහළ විය නොහැක්කේමය. මක්නිසාද යත්, එම රූපයන් තම සිතෙහි ප්‍රකට නොමැති නිසාමය.

විපස්සනා ක්‍රමය හුවා දක්වන ප්‍රශ්න-උත්තර

මේ නිසාම කමටහන් ඉල්ලන මාලුක්‍ය පුත්‍ර නම් භික්‍ෂුවට බුදුරජාණන් වහන්සේ කටමහන් දීමට ආසන්නව පහත සඳහන් ප්‍රශ්න මගින් කෙළෙස් වල ස්වභාවය හා විපස්සනා භාවනාවේ සවභාවය ප්‍රකට කර දුන් සේක.

බුදුරජාණන් වහන්සේගේ ප්‍රශ්නය

තං කිං මඤ්ඤසි මාලුක්‍ය පුත්තයෙ තෙ චක්ඛු විඤ්ඤෙය්‍යා රූපා අදිට්ඨා අදිට්ඨපුබ්බා නච පස්සසි නච තෙ හොන්ති පස්සෙයන්ති අත්ථි තෙ තත්ථ ඡන්දෙ වා රාගො වා පෙමං වා?

මාලුක්‍ය පුත්‍රය ඒ කාරණය කෙසේ තොපට ප්‍රකට වෙත්ද? ඇසින් දැකිය හැකි *රූපාරම්මණයක්* නුඹ නොදන්නා ලද්දේ වෙයි. අතීතයේද නොදුටු විරූ වෙයිද, දකිමින් සිටිනවාද නොවේ. අනාගතයේදී දැකිය හැක්කේ යැයිද නොයෙදේ. එවැනි *රූපාරම්මණ* මත කැමති වන, බැඳෙන, ප්‍රේම කරන බවක් තොපට වෙයිද?

මාලුක්‍ය පුත්‍ර ස්වාමීන් වහන්සේගේ උත්තරය

නො හෙතං භන්තෙ. = එවැන්නක් නොපැනෙන්නේය භාග්‍යවතුන් වහන්ස!.

මේ ප්‍රථම ප්‍රශ්නයෙහි ලා සිතෙහි කැළම ප්‍රකට නොවූ නොබැලූ, සිතින් සළකා නොබැලූ, නොසිතූ *රූපාරම්මණයක්* මත ඉබේම කෙළෙස් සංසිඳී යන බව කෙළින්ම දේශනා කරන ලද සේක. එවැනි කාරණයක් සම්බන්ධයෙන් විපස්සනා කොට කෙළෙස් දුරු කිරීමක් අවශ්‍ය නොවේ. ස්වභාවයෙන්ම කෙළෙස් පහළ නොවී යන්නේයැ, සංසිඳී යන්නේයැයි කියැවේ.දකින සිතෙහි ප්‍රකට *රූපාරම්මණ* මත පමණක් සළකා බැලීමෙන් කල්පනා කිරීමෙන්, කෙළෙස් පහළවිය හැකි බව *බ්‍යාතිරේක නය* =

ප්‍රතිපක්ෂය දැන ගැන්මේ න්‍යාය ක්‍රමයට අනුව දැක්වූ සේක. අප්‍රකට *රූපාරම්මණයන්* මෙන් කැමැත්ත- අකමැත්ත පහළ නොවීම පිණිස විපස්සනාවට නගා, මෙනෙහි කොට, වළක්වා ලිය හැක්කේ නම් ප්‍රකට රූපාරම්මණ මතද එසේම කෙළෙස් පහළ විය නොහැක්කේය. එම නිසා අප්‍රකට වූ *රූපාරම්මණයන්* මෙන් වනු පිණිස ප්‍රකට වූ අරමුනු මතද විපස්සනා කොට කෙළෙස් දුරුකල යුතු යැයි යන මේ අර්ථයද *නෙය්‍යත්ත නය* - අධ්‍යාහාරයෙන් ගෙන දත යුතු නය ක්‍රමය වූ *අත්තසිද්ධි නය*= කෙළින්ම නොකියා හමාර කරන ක්‍රමය, *අත්ථාපත්ති නය* = කෙළින්ම නොකියා අර්ථයට පත්කරවන ක්‍රමය යනාදී න්‍යාය ක්‍රම මගින් දැක්වූ සේක.

මනුෂ්‍යයෙකු දැක කැමැත්ත- අකමැත්ත පහළ වූ විට කුමන ධර්මයක් ප්‍රකට වී කැමති- අකමැති වීද? සම මත ඇති වර්ණ රූපය ප්‍රකට වන බැවින්ය. එම රූපයන්ගෙන් පටන්ගෙන කල්පනා කරනවිට ඇතුළත කොටස්ද අතනොහැර සම්පූර්ණ කයම මත කැමැත්ත- අකමැත්ත පහළ වී සිතෙහි ප්‍රකට වේ. ඉදින් මතුපිට-පොත්තේ එම වර්ණ රූපය නොදැක්කේ නම් ඇතුළත ඇති කොටස්ද සහිත මුළු සන්තානයම සිතාගත නොහැක්කේය. කැමැත්තක්- අකමැත්තක් ප්‍රකට විය නොහැක්කේය. කැමැත්ත- අකමැත්ත පහළ විය නොහැක්කේය. එම නිසා දකින අවස්ථාවේම ප්‍රකට නොවුන සිතෙහි බැඳී නොගත් ධර්ම මත කෙළෙස් පහල නොවී නිවීයෑම ඉබේම සිදුවේ. මේ ලෙස ප්‍රකට නොවූ ධර්මයන් සිතා බලා භාවනාකොට කෙළෙස් දුරු කිරීමක් අවශ්‍ය නොවේ. දකින අවස්ථාවේ ප්‍රකට වී ඒ අනුව සිත ඇදී යා හැකි ධර්ම මත නැවත කල්පනා කරන වාරයක් වාරයක් පාසාද කෙළෙස් පහළ විය හැක්කේය. එම කෙළෙස් පෙර පරිදි ඉබේම සංසිදෙන්නේත් නොවේ. එම නිසා එසේ ප්‍රකට වූ ධර්ම මත 'අප්‍රකට ධර්ම මත මෙන් ' කැමැත්ත - අකමැත්ත පහළ නොවනු පිණිස මෙනෙහි කරමින් භාවනා කළ යුතු යැයි යන මේ අර්ථය ප්‍රකටයැ.

ප්‍රශ්නය

මාලුක්‍ය පුත්‍රය! කණෙන් අසා දැනගත යුතු යම්කිසි ශබ්දයක් තොප තවම නොඇසූවේය. අතීතයේ දීද නොඇසූ විරූය. අසමින් සිටිනවාද

නොවේ. මත්තට අසනු ඇතැයි කියන කල්පනා හෝ නොකරයි. එලෙස වූ කිසියම් ශබ්දයක් මත කැමැත්ත, ආසාව, ප්‍රේමය තොපට වන්නේද? ඇතිවිය හැක්කේද?

උත්තරය

එවැන්නක් වීමට ඉඩක් නැත්තේය. භාග්‍යවතුන් වහන්ස!

ප්‍රශ්නය

මාලුක්‍ය පුත්‍රය!, දිවෙන් විඳ දැනගත යුතු යම් කිසි රසයක් තොප තවම විඳ නොමැත්තේ නම්, අතීතයේ දීද විඳ නැත්තේ නම්, දැනට විඳිමින් සිටිනවාද නොවේ නම්, රස විඳිනු ඇතැයි කියා අනාගත කල්පනා හෝ කරනවා නොවේ නම්, එසේ වූ රසයක් මත කැමැත්තක්, අසාවක් ප්‍රේමයක් තොපට වන්නේද? විය හැක්කේද?

උත්තරය

එවැන්නක් වීමට ඉඩක් නොමැත්තේය. භාග්‍යවතුන් වහන්ස !

ප්‍රශ්නය

සිතෙන් සිතා දත හැකි යම්කිසි කල්පනාවක් තවම කල්පනා නොකළේ නම්, අතීතයේදීද කල්පනා නොකළ විරූනම්, කල්පනා කරමින් සිටිනවාද නොවේ නම්, මතුවට කල්පනා කරාවි යැයිද නොවේ නම් එවැනි ස්වභාවයක් මත කැමැත්තක්, ආසාවක්, ප්‍රේමයක් තොපට ඇත්තේද? විය හැක්කේද.

උත්තරය

එවැන්නක් වීමට ඉඩක් නොමැත්තේය. භාග්‍යවතුන් වහන්ස !

මේ ආකාර ප්‍රශ්න හයක් මඟින් ද්වාර හයෙහි ප්‍රකට වූ ධර්මයන් හා බැඳී කෙළෙස් පහළ වේ. අප්‍රකට දේ හා බැඳී පහළ නොවේ. එම නිසා ප්‍රකට ධර්ම මත පමණක්, අප්‍රකට ධර්මයන් මත' මෙන් කැමැත්ත-අකමැත්ත පහළ නොවනු පිණිස විපස්සනා කළ යුතු බව දක්වන ලද සේක.

මේ නිසාම මාලුක්‍ය පුත්‍ර ස්වාමීන් වහන්සේට පහත සඳහන් ලෙසට කර්මස්ථාන ධර්මය දේශනා කළ සේක.

විපස්සනා භාවනා ක්‍රමය කෙටියෙන්

එත්ථ ච තෙ මාලුක්‍ය පුත්ත දිට්ඨ සුත මුත විඤ්ඤාතෙසු ධම්මෙසු දිට්ඨෙ දිට්ඨ මත්තං භවිස්සති, සුතෙ සුත මත්තං භවිස්සති මුතෙ මුත මත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාත මත්තං භවිස්සති. යතො ඛො තෙ මාලුක්‍ය පුත්ත දිට්ඨ සුත මුත විඤ්ඤාතෙසු ධම්මෙසු දිට්ඨෙ දිට්ඨ මත්තං භවිස්සති සුතෙ සුත මත්තං භවිස්සති, මුතෙ මුත මත්තං භවිස්සති විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති තතො ත්වං මාලුක්‍ය පුත්ත නතෙන, යතො ත්වං මාලුක්‍ය පුත්ත නතෙන, තතො ත්වං මාලුක්‍ය පුත්ත න තත්ථ, යතො ත්වං මාලුක්‍ය පුත්ත න තත්ථ තතො ත්වං මාලුක්‍ය පුත්ත නෙවිධ, න හුරං, න උභයමන්තරෙන, එසෙවන්තො දුක්ඛස්ස [සං නි. 4/158]

මාලුක්‍ය පුත්ත = මාලුක්‍ය පුත්‍රය!

එත්ථච දිට්ඨ, සුත මුත
විඤ්ඤාතෙසු ධම්මෙසු = දකින- අසන- විඳින- දැනගන්නා මේ ධර්මයන් කෙරෙහි

තෙ = තොපට

දිට්ඨෙ = දුටුවෙහි

දිට්ඨ මත්තං = හුදු දැකීම් මාත්‍රය පමණක්

භවිස්සති = වන්නේය.

සුතෙ = ඇසුවෙහි

සුත මත්තං = හුදු ඇසීම් මාත්‍රය පමණක්

භවිස්සති = වන්නේය

මුතෙ = ඉදිරි පත්වූ ගන්ධ- රස- ස්පර්ශයන්මත

මුත මත්තං = හුදු විඳීම්, හැපීම් මාත්‍රයම පමණක්

භවිස්සති = වන්නේය

විඤ්ඤාතෙ = දත යුතු ධර්ම මත

විඤ්ඤාත මත්තං = හුදු දැනීම පමණක්

භවිස්සති	=	වන්නේය *
මාලුක්‍ය පුත්ත	=	මාලුක්‍ය පුත්‍රය!
යතො ඛො	=	යම් විටක
තෙ	=	තොපට
දිට්ඨ සුත මුත		
විඤ්ඤාතෙසු ධම්මෙසු	=	දකිනු- අසනු- විඳිනු-දැනගනු ලබන ධර්මයන් කෙරෙහි
දිට්ඨෙ දිට්ඨ මත්තං භවිස්සති	=	දැකීමෙහි හුදු දැකීම පමණක් වේ.
සුතෙ සුත මත්තං භවිස්සති	=	ඇසීමෙහි හුදු ඇසීම පමණක් වේ.
මුතෙ මුත මත්තං භවිස්සති	=	විඳීමෙහි හුදු විඳීමක් පමණක් වේ
විඤ්ඤාතෙ විඤ්ඤාත		
මත්තං භවිස්සති	=	දැන ගැනීමෙහි හුදු දැන ගැනීම පමණක් වේ.
මාලුක්‍ය පුත්ත	=	මාලුක්‍ය පුත්‍රය!
තතො	=	එම අවස්ථාවන්හිදී
ත්වං	=	තොප
තෙන	=	එම දකින රූපය, අසන සද්දය, විඳින ආඝ්‍රාණය, විඳින රස, දැන ගන්නා ධර්මයන්ද ඒ හා සම්බන්ධ කෙළෙස්ද සහිතව
න භවිස්සති	=	නොවන්නේය
තතො ත්වං මාලුක්‍ය		
පුත්ත නතෙන	=	මාලුක්‍ය පුත්‍රය! එම අවස්ථාවේ තොප එම දකින රූපය ආදිය හා බැඳෙන කෙළෙස් හා සමගම නොවන්නේය.

---

* මෙපමණකින් විපස්සනා භාවනා නයක්‍රමය දක්වයි. උදාන පාලි බාහිය සූත්‍රයෙහි මේ තැන **එවඤ්හි තෙ බාහිය සික්ඛිතබ්බං** - බාහිය! තොප දක්වූ මේ ක්‍රමයටම පිළිපැදිය යුතු වේ." යැයි කෙළින්ම උපදෙස් දීමක් ඇත්තේය. එම අට්ඨකථාවෙහිද **සික්ඛිතබ්බන්ති = අධිසීල සික්ඛාදීනං තිස්සන්නම්පි සික්ඛානං වසේන සික්ඛනං කාතබ්බං**- ශික්ෂණය කළ යුතුයි කියන තැන අධිසීල ශික්ෂාව මුල්කොට ඇති ශික්ෂා තුනම අභ්‍යාස කළයුතු යැයිද, **එවං ඉමාය පටිපදාය තයා බාහිය තිස්සන්නං සික්ඛානං අනුපවත්තන වසෙන සික්ඛිතබ්බං** - බාහිය! තොප මේ දක්වූ සික්ෂාවන්ට අනුව තුනක් වූ ශික්ෂාවන් අඛණ්ඩව පැවැත්වීම වශයෙන් හික්මීම කළ යුතු යැයි කියැවේ යන ලෙස විස්තර දක්වේ.

මාලුක්‍ය පුත්ත = මාලුක්‍ය පුත්‍රය!

තතො ත්වං මාලුක්‍ය පුත්ත න තත්ථ = මාලුක්‍ය පුත්‍රය! එම අවස්ථාවෙහි තොප එම දකින රූපය ආදියෙහි කෙලෙස් වශයෙන් නොපිහිටන්නේය.

යතො ත්වං මාලුක්‍ය පුත්ත න තත්ථ = මාලුක්‍ය පුත්‍රය! එම අවස්ථාවෙහි තොප එම දකින රූපය ආදියෙහි කෙලෙස් වශයෙන් නොපිහිටන්නේ නම්.

මාලුක්‍ය පුත්ත = මා ලුක්‍ය පුත්‍රය!

තතො = කෙලෙස් වශයෙන් නොපිහිටන එම අවස්ථාහි

ත්වං = තොප

නෙව ඉධ = මේ ලෝකයෙහිද නැත්තේය.

න හුරං = වෙනත් ලෝකයකද නොමැත්තේය.

න උභයමන්තරෙ = මෙලොව පරලොව යන ලෝක දෙකෙහිම නොමැත්තේය.

එසො එව = මෙම ලෝක දෙකේහිම කෙලෙස් වශයෙන් බැඳීගන්නා තොප නොමැති නිසාම

දුක්ඛස්ස = කෙලෙස් දුකෙහි, වට්ට දුකෙහි

අන්තො = කෙළවර වන්නේය, නිවන වන්නේය

උදාන අට්ඨකථාහි දක්වන *අඤ්ඤවාද* වශයෙන් දක්වෙන විශේෂ අර්ථය නම්

තතො = කෙලෙස් වශයෙන් නොපිහිටන අවස්ථාවෙහි

ත්වං = තොප

නෙව ඉධ = ඇස, කණ, නාසය, දිව, ශරීරය, සිත යන මේ අධ්‍යාත්මික ආයතනයන්හි ද නොමැත්තේය.

න හුරං = වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ධම්ම යන එම බාහිර ආයතනයන්හිද නොමැත්තේය.

උභයං අන්තරෙන = අධ්‍යාත්මික බාහිර යන ආයතන දෙකෙහි අතරමැද පිහිටන්නා වූ විඤ්ඤාණ හයෙහිද

වා = ආයතන දෙකම ඉවතලා ගන්නා ලද විඤ්ඤාණ භයෙහිද

න = නැත්තේය.

එසො එව = මේ ද්වාර- ආරම්මණ- විඤ්ඤාණ යන යන තුනෙහි නොපනොමැකි බවම, ද්වාර- ආරම්මණ- විඤ්ඤාණ යන තුනෙහිම අප්‍රකට බවම

දුක්ඛස්ස = කෙළෙස් දුකෙහි, වට්ට දුකෙහි

අන්තො = අවසානයයි, නිවනයි.

අර්ථය වනාහි

රූපාරම්මණයන් දකින අවස්ථාවෙහි හුදු දැකීමෙන්ම නතර විය යුතුයි. එසේ කළහොත් දකින රූපය අනුව දිගට නොසිතන, නොසළකන බැවින් කෙළෙස් පහළ නොවේ. එසේ කෙළෙස් සඳහා අවස්ථාවක් නොදීම පිණිස මෙලෙස මෙනෙහි කරමින් මනසිකාරය පැවැත්වීම මගින් වර්ණ රූපයේ ස්වභාවය තත්ත්වාකාරයෙන් දැනගනී. දැනගන්නා ආකාරයː දකින රූපය හුදු ධම් ස්වභාවයන් ලෙසටද, ඇතිව- නැතිව යන ලෙසටද, මෙනෙහි කරන අතර වාරයේදීම ඇතිව- නැතිව යන බවද දැන ගනී. එම නිසා *අනිච්ච, දුක්ඛ, අනත්ත* බවට පැහැදිළි තීරණයකට එළඹිය හැක්කේය. එම වර්ණ රූපය ඇස් පනාපිට ප්‍රකටව දැක ගන්නේ නමුත් නුදුටු රූපයක් මෙන් වන්නේය. සිතෙහි ආසාවක්, තරහවක් හෝ දෙයක් වශයෙන් අල්ලා ගැනීමක් නැත. නැවත හැරී ප්‍රත්‍යවේක්ෂා කළද මතකයෙහි ප්‍රකට වූ ලෙසටම තත්ත්වාකාරය මතුවේ. බිඳී යන ස්වභාවය- *අනිච්ච* - *දුක්ඛ* - *අනත්ත* ස්වභාව වශයෙන්ම ප්‍රකට වේ. එම නිසා යමෙක් දුටුවේද ඔහු ප්‍රිය ජනකයැ, ජුගුප්සා ජනකයැ යනාදී ලෙසට එම රූපය මත කල්පනා කරන- සළකා බලන ආකාරයන් අනුව මතුවන කෙළෙස් පහළ විය නොහැක්කේය. මෙලෙස කෙළෙස් පහළ නොවනු පිණිස දකින දකින වාරයේ මෙනෙහි කළ යුතුය. මනසිකාරය පැවැත්විය යුතුය යන්න මෙහි අදහසයි. සද්දයක් අසන අවස්ථාවේ මෙන්ම ගන්ධයක් ආඝ්‍රාණය කොට, රසයක් විඳ, ස්පර්ශයක පහස ලැබ, ආපාත ගත වූ විවිධ ධම්මාරම්මණ කල්පනා කරන අවස්ථාවෙහිද ඒවා මත දිගින් දිගට කල්පනා කරන, සළකා බලන කෙළෙස්

වලට ඉඩ නොතබා මෙනෙහි කරමින් භාවනා කොට හුදු ඇසීම් මාත්‍රය ආදියෙන් නතර විය යුතු යැයි යන්න අදහසයි. මෙලෙස හුදු දැකීම් ආදියෙහි නතර වනු පිණිස අඛණ්ඩව මෙනෙහි කොට භාවනා කිරීම් වශයෙන් විපස්සනාව හා යෙදෙන ශීල, සමාධි, ප්‍රඥාවන් පියවරෙන් පියවර වර්ධනය කිරීමෙන්ම මාර්ගය හා සම්බන්ධ ශීල, සමාධි, ප්‍රඥාවෝ පහළ විය යුතු යැයි යන්න අදහසයි.

"**විපසසනාය විසයං දිට්ඨාදිහි චතූහි කොට්ඨාසෙහි විභජිත්වා තත්ථසස ඤාණතිරණපරිඤ්ඤදං දසෙසති**" යැයිද, "**හෙට්ඨිමාහි විසුද්ධීහි සද්ධිං සංඛෙපෙනෙව විපසසනා කථිතා**" යැයිද විවරණය කරන උදාන අට්ඨකථාවට අනුව මේ සූත්‍රයෙහි **එතතථ ච - පෙ- විපසසති** යන කථාව මගින් විපස්සනා භාවනා කරන ආකාරය දක්වයි. "**යතො තවං-පෙ- න තතථ** යන්න මගින් ඵලය දක්වයි," අනුව මේ සූත්‍රයෙහි **එතථ ච -පෙ- විපසසති.** "**තතො තවං - පෙ - එසෙවනතො දුකඛසස** යන්න මගින් නිවන දක්වයි යැයිද එම අටඨකථාවෙහිම කියයි. මේ දැක්වීමට අනුව "**යථො ඛො**" ආදියෙහි අර්ථය දක්වන්නෙමු.

දකින- දකින රූපය ආදිය "දකිනවා - දකිනවා" යන ලෙසට අඛණ්ඩව දිගටම මෙනෙහි කරන්නේ නම් එම අවස්ථාවෙහි සිත හුදු දැකීම්-එසේම ඇසීම් මාත්‍රය පමණකින් නතර වන්නේය. දකින රූපය ආදියද හුදු දැකීමේ ස්වභාවය, එසේම හුදු ඇසීමේ ස්වභාවය ආදී වශයෙන් ප්‍රකට වේ. මනාප- අමනාප හෝ දේවල්- වස්තු ආදිය වශයෙන් ප්‍රකට නොවේ. එම අවස්ථාවෙහි මෙනෙහි කොට භාවනා කරන එම අරමුණු අප්‍රකට වී නොදක්ක, නොඇසුව, සිදුනොවුනු නොදනගත් අරමුණු මෙන් වන්නේය. කෙළෙස්වලට අරමුණක් විය නොහැක්කේය. එම අරමුණු මත තවදුරටත් කෙළෙස් පහළ විය නොහැක්කේය. මෙලෙස කෙළෙස් පහළවිය නොහැකි බවට "මෙම අරමුණු මත *ආරම්මණානුසය* නිදන් ගතවී නැතැයි"ද විපස්සනාවෙන් වනාහි කෙළෙස් තදංග පහාන වශයෙන් දුරු කරයි" යැයිද "*තදංග* වශයෙන් *විවේක, විරාග, නිරොධ, වොසසගග*, නම් වේ යැයිද පාලි- අටඨකථා- ටීකා හි දැක්වේ. එවැනි පුද්ගලයෙකුට "*තදංග නිබ්බුත* = භාවනා මනසිකාරය නම් වූ හේතු කාරකයෙන් කෙළෙස් නිවාදමූ පුද්ගලයා යැයිද *ඛනධ වගග සංයුකතයෙහි* දේශනා කොට ඇත. එම පුද්ගලයනට දකින රූප ආදියෙහි ඒවාට අදාළ කෙළෙස්ද පහළ නොවේ. දකින රූපය ආදියටද බැඳී නොසිටී, අමනාපද පහළ නොකරයි. සුඛයක්

ආත්මයක්. සාරයක් ඇතැයි යනාදී වශයෙන්ද වරදවාගෙන නොසිටී. අවිද්‍යාවෙන්ද ගතනොකරයි" යැයි කියනු ලැබේ. එම පුද්ගලයාගේ ඤාණයට *නිච්ච සංඥාදිය* දුරු කළ හැකි නිසා එය **පහාන පරිඤ්ඤා** නම් වේ. දකින රූප ආදියෙහි බිඳී යෑම පිළිබඳව දැනීම පහළ වන්නේ නම් එය **විපස්සනා පහාන පරිඤ්ඤා**වයි. මාර්ගයට අනතුරුව එය නිවනම අරමුණු කොට ඵල සිත පහළ වේ. එම ඵල සිතට පත්වූ පුද්ගලයන් වනාහි දකින රූප ආදිය මත කෙලෙස් වශයෙන් නොපිහිටයි. දකින රූප ආදිය මත *තණ්හා, මාන, දිට්ඨි* පහළ නොකරයි යන්න අදහසයි. මාර්ග- ඵල යන තැන උත්කෘෂ්ඨ නය වශයෙන් අට්ඨකථාචාර්යයන් වහන්සේ දක්වන අදහස වනාහි අරහත්ත ඵලයට පත් වූ රහතන් වහන්සේගේ කිසිදු රූප නාමයක් මත බැඳීමක් නැති නිසා මේ භවයෙහි මේ ලෝකයෙහි පිහිටා සිටීමක් කිසිත් නැත්තේය. පරිනිබ්බාන චුතියට පසු රූප- නාම අළුතින් පහළවීමක් නැති නිසා වෙනත් භවයකද, පර ලෝකයකද නොපිහිටන්නේය. මෙලෙස ලෝක දෙකෙහිම නොමැති බව, බැඳීම් නිම වීම හා රූප- නාම අළුතින් පහල නොවීමම කෙලෙස් වට්ට දුකෙහි සම්පූර්ණ නිරෝධය නම් වූ *අනුපාදිසෙස නිබ්බාණය* යැයි කියනු ලැබේ.

*අඤ්ඤවාදයන්*හි අර්ථය වනාහි මාර්ග ඵලයන්ට පත් වූ ක්ෂණයෙහි ඇස, කණ, නාසය, දිව ශරීරය, සිත යන මේ හයාකාර *අජ්ඣත්තිකායතන ද්වාරද* අප්‍රකටයැ. ඒවාද අරමුණු නොගනී. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම යන මේ හයාකාර *බාහිරායතන* නම් වූ ලෝකී අරමුණු ද අප්‍රකට යැ. ඒවාද අරමුණු නොවෙයි. දකින සිත, අසන සිත, ආඝ්‍රාණය කරන සිත, රස බලන සිත, පහස ලබන සිත, සිතන- මෙනෙහි කරන සිත යන මේ *විඤ්ඤාණ* හයද අප්‍රකටයැ. ඒවාද අරමුණු නොගනී. මේ *ද්වාර - ආරම්මණ- විඤ්ඤාණයන්*ගේ නිරෝධයම අරමුණු කොට මාර්ග- ඵල සිත් පහළ වේ. මේ මාර්ග- ඵලයන් මගින් දත යුතු (*ද්වාර, ආරම්මණ, විඤ්ඤාණයන්* නිරෝධ වන ස්වභාවයම දුකෙහි සම්පූර්ණ නිරෝධය හෙවත්) නිවන නම් වේ යැයි අදහස් කරයි.

සංක්ෂේපයෙන් දේශනා කළ විපස්සනා භාවනා ක්‍රමයට මාලුක්‍ය පුත්ත මහා තෙරුන් වහන්සේ, ඇහුම්කන් දීමෙන් පසු තමා විසින් අවබෝධකරගත් අර්ථය, තේරුම පහත සඳහන් ලෙසට දේශනා කළ සේක.

රූපං දිස්වා සති මුට්ඨා- පියං නිමිත්තං මනසිකරොතො
සාරත්ත චිත්තො වෙදෙති - තඤ්ච අජ්ඣොසා තිට්ඨති
තස්ස වඩ්ඪන්ති වෙදනා - අනෙකා රූප සම්භවා
අභිජ්ඣාච විහෙසාච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං - ආරානිබ්බාන වුච්චති [සං නි. 4/158]

රූපං = රූපාරම්මණයක්

දිස්වා = දැක

පියං නිමිත්තං = ප්‍රිය නිමිත්ත

මනසිකරොතො = මනසිකාරය පවත්වන්නා (විපස්සනාවට නංවන්නෙමි යැයි මෙනෙහි කිරීම නම් වූ යෝනිසොමනසිකාරය නොවන නිසා අයෝනිසොමනසිකාරය පහළවීම ආකාරය මෙහි දක්වේ)

සති = ස්මෘතිය

මුට්ඨා = මුළා වේ.

(එම අවස්ථාවෙහි හුදු දැකීම, දැක ගැනීම පමණක් ප්‍රකටව ඇත්තේ නමුත්, දැකීම- දකිනු ලබු රූපය යන මේවා *අනිච්ච*, *දුක්ඛ*, *අනත්ත* යැයි දැන ගැනීමට තරම් හැකියාවක් නොලබන්නේ යැයි කියනු ලැබේ.)

සො = සතිය නොඑළඹි එම පුද්ගලයා

සාරත්ත චිත්තො = රාගයෙන් රත්වූ සිතින් යුතුව

වෙදෙති = විඳියි

(*අමනාප නිමිත්තකට* සිත යොදා *පදුට්ඨ* සිතින් විඳීම, *මජ්ඣත්ත නිමිත්තකට* සිතයොදා සම්මුළ්හ සිතින් විඳීමද යන්න මේ කියන ලද නිදර්ශන කථා වලින්ම දැනවෙන්නේ යැයි පිළිගත යුතුයි)

තඤ්ච = එම අරමුණද

අජ්ඣොසා = නිදහස් කළ නොහැකි ලෙස යටපත් කර ගෙන (වසඟකරගෙන)

තිට්ඨති = සිටි

තස්ස = ඔහුට

රූප සම්භවා = රූපයෙන් හටගත්

අනෙකා = නොයෙක්

වෙදනා = විවිධාකාර හොඳ නරක වින්දනයන් ද

අභිජ්ඣා ච = දැඩි ලෝභයද

විහෙසා ච = හිංසක වූ දෝෂයද

වඩ්ඪන්ති = වැඩෙත්

අස්ස = ඔහුගේ

චිත්තං = සිත

උපහඤ්ඤති = ලෝභ දෝෂ වලින් පෙළෙයි

එවං = මේ ක්‍රමයට

දුක්ඛං = කෙලෙස් දුක්, වට්ට දුක්

ආචිනතො = රැස් කරන්නහුට

නිබ්බානං = දුක් කෙළවර කරන නිවන යන්න

ආරා = දුර යැයි

වුච්චති = කියනු ලැබේ.

(දකින අවස්ථාවේ මෙනෙහි කර වටහා ගැනීම නැතිනම් නිවනට ළඟාවිය නොහැකි යන්න මෙහි අදහසයි)

න සො රජ්ජති රූපෙසු - රූපං දිස්වා පටිස්සතො

විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති

යථා-ස පස්සතො රූපං, සෙවතො චාපි වෙදනං

ඛීයති නො පචීයති, එවං සො චරතිස්සතො

එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බාන වුච්චති [සං නි. 4/158]

යො = යම් විපස්සනා යෝගී කෙනෙක්

රූපං = රූපාරම්මණයක්

දිස්වා = දැක

වා	=	දකින කල් හි
පතිස්සතො	=	දකිනවා යැයි වහාම සතිමත්
හොති	=	වේ
සො	=	එසේ සතිමත් වූ පුද්ගලයා
රූපෙසු	=	දකින ලද රූප කෙරෙහි
න රජ්ජති	=	නො ඇලෙයි
විරත්ත චිත්තො	=	නොඇලුනු සිත් ඇතිව
වෙදෙති	=	විඳියි
තඤ්ච	=	එම අරමුණද
න අජ්ඣොස තිට්ඨති	=	ඉක්මවා නොසිටී
වා	=	යටපත් නොකරයි
යථා	=	මෙනෙහි කොට දැනගැනීමක් හා සමගම සිද්ධවන එම කාරණය වශයෙන්
රූපාරම්මණය	=	එම රූපය
පස්සතො චාපි	=	බලන්නේ නමුත්, බලා දැනගත්තේ නමුත්
වෙදනං	=	විඳනය
සෙවතො චාපි	=	සේවනය කරන්නේ නමුදු ("**ච**" ශබ්දය සමුච්චයාර්ථ, "**අපි**" - ශබ්දය සම්භාවනාර්ථ)
අස්ස	=	ඔහුට
දුක්ඛං	=	රූපය හා බැඳී පහළවන කෙළෙස් දුක, වට්ට දුක
ඛීයති	=	ක්‍ෂය වෙයි
න උපචීයති	=	රැස්වෙනවා නොවේ
තථා	=	මෙනෙහි කිරීම හා සමග වන එම සංසිද්ධිය මගින්
සතො	=	දකින දකින වාරයේ සතිමත් වී
සො	=	ඔහු
චරති	=	පුහුණු කරයි
එවං	=	එම ක්‍රමයෙන්

දුක්ඛං	=	කෙළෙස් දුක්, වට්ට දුක්
අපවිනයො	=	විනාශ කරන්නට
නිබ්බාණං	=	දුක් කෙලවර නිවන යන්න
සන්තිකෙ	=	ආසන්නයේ යැයි
වුච්චති	=	කියනු ලැබේ (දකින විටම මෙනෙහි කොට නිවනට යා හැකි බව දක්වයි)

ශබ්දයක් අසන ආදී අවස්ථාවල නිවනට දුර - ළංවන ආකාරය දක්වන ඉතිරි ගාථාවන්ද මේ ලෙසටමයැ. කැමති නම් *සළායතන සංයුත්තයේ සළායතන වග්ගයෙහි* බලත්වා. මේ ගාථා මගින් අදහස් ප්‍රකාශ කළ විට බුදුපියාණන් වහන්සේ මාලුංක පුත්ත මහතෙරුන්ට "සාදු" කියා ප්‍රශංසා කොට සංක්ෂේපයෙන් දේශනාකළ යුතු විපස්සනා භාවනා ක්‍රමයේ විස්තර අර්ථය සුදුසු ආකාරයට සිත තබාගත යුතු යැයි අනුශාසනා කොට එම ගාථාවන් නැවතත් දේශනා කළ සේක. මාලුක්‍ය පුත්ත මහා තෙරුන් වහන්සේ එම විපස්සනා ක්‍රමයට භාවනා කොට නොබෝ කලෙකින් මහා ශ්‍රාවක රහතන් වහන්සේ නමක් වූ බව අදාල පාළියෙහි දැක්වෙයි.

වැදගත් කාරණයක්

මේ මාලුක්‍ය පුත්ත සූත්‍රයෙන් මේ අර්ථය ප්‍රකට වේ. එනම් විඤ්ඤාණ හයෙන් නොදත හැකි, අප්‍රකට ධර්ම මත ඉබේම කෙළෙස් සංසිඳේ. එම නිසා එවැනි ධර්මයන් ගැන විශේෂයෙන් සොයා බලා භාවනා නොකළ යුතු යැයි යන මේ කාරණය ප්‍රකටයැ. විඤ්ඤාණ හයෙන් දැනගත් ප්‍රකට ධර්මයන් මෙනෙහි නොකරන්නේ නම් කෙළෙස් මතුවිය හැක්කේය. එම නිසා එම ප්‍රකට ධර්මයන් මතම භාවනා කොට බලා (එසේ නොබැලුවොත් පහළ විය හැකි) කෙළෙස් බැහැර කළයුතු යැයි යන මේ කාරණයද ප්‍රකටයැ. ප්‍රකට ධර්මයන් භාවනා කොට බලන්නේ නම් ප්‍රකට- අප්‍රකට සියළු ධර්මයන් මත කෙළෙස් පහළවිය නොහැක්කේය. එම නිසා "ප්‍රකට ධර්ම භාවනා කොට බැලීමෙන් සියළු ධර්මයන් මත භාවනා කොට බැලීමේ කෘත්‍යය, දැනගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වේ." යන මේ කාරණයද ප්‍රකටයැ. එම නිසා දකින දකින වාරයේ වරක් බැගින් මෙනෙහි කරමින් එක ධර්මයක ඇති වීම- නැතිවීම අනිත්‍ය ලක්ෂණය ආදිය ප්‍රධාන කොට දැනගන්නේ නම් එසේ දක්නා අවස්ථාවේ පවතින ධර්මයන් පහම වෙන වෙනම භාවනා කොට බලන කෘත්‍යය සම්පූර්ණ වේ යැයි කියනු ලැබේ.

දකින දකින වාරයේ "දකිනවා - දකිනවා" යැයි අඛණ්ඩව මෙනෙහි කළද ඤාණය තරුණ අවස්ථාවෙහි කෙළෙස් ජවනයෝ වරින් වර ඇතුළත් වෙමින් පහළ විය හැක්කේය. එලෙස වීම නිසා සිත නරක් කර නොගත යුතුය, මෙනෙහි කිරීම සැහැල්ලු නොකළ යුතුය. එසේ වරින් වර මතුවන කෙළෙස් සිත් මෙනෙහි කරමින් දුරු කළ යුතු වේ. උපමාවක් ලෙස - ඇඳුමක් සේදීම සඳහා වරක් දෙවරක් පොඩිකොට- ගලේ ගසා- අතුල්ලා පිරිසිදු නොවේ නම් සේදීම අත නොහැර නැවත නැවතත් ගලේ ගසමින්- අතුල්ලමින් ඇඳුම පිරිසිදු කරන්නාසේය. වෙනස නම් ඇඳුම සෝදන විට මෙපමන පිරිසිදු විය, මෙපමණ කුණු ඉතිරි වී යැයි දැන ගත හැක්කේය. විපස්සනා භාවනා කරන විට එසේ, අද මෙපමණ කෙළෙස් ගෙවීගියේය, මෙපමණ ඉතිරි වී යැයි දැනගත නොහැක්කේය. ක්‍රමානුකූලව මෙනෙහි කරමින් භාවනා කොට මාර්‍ග- ඵලයන්ට පත් වූ විටම කෙළෙස් කොපමණ දුරු වීදැයි නිශ්චිතව දැනගත හැක්කේය. මෙසේ නොදන්නා ආකාරයත්- දැනගන්නා ආකාරයත් වාසූපමාව හා ගළපමින් ඛන්ධ වග්ග සංයුත්තයෙහි ලා දේශනා කොට ඇත්තේය. එහි එන උපමා ගැළපීම් ආකාරය වනාහිඃ අත්පොරෝ මිටේ අල්ලාගන්නා තැන වැඩ කරන විට දිනපතාම පිරිමැදී ගෙවීගියද අද මෙපමණ ප්‍රමාණයක් ගෙවී ගියේ යැයි වඩුරාළට දත නොහැකි වන්නාසේ මෙනෙහි කරන වාරයේ කෙළෙස් සංසිඳීමක් ලැබුවද විපස්සනා යෝගීහට ගෙවී ගිය ප්‍රමාණය මෙපමණයැයි දැනගත නොහැක්කේය. දින, මාස, වසර ගණනාවක් ගතවූ පසු අත්පොරෝ මිටේ අත් සලකුණු හොඳින් ප්‍රකටව ආ කල අත්පොරෝ මිට ගෙවී මැදී ගොස් යැයි දැන ගත හැක්කාසේ විපස්සනා යෝගීටද මාර්‍ග- ඵලයට ලඟා වූ අවස්ථාවේදී පමණක් මේතාක් කොපමණ කෙළෙස් ගෙවී ගොස් ඇත්තේ දැයි දැනගත හැක්කේය. නමුදු *විපස්සනා ඤාණ* මුහුකුරාගිය විට කෙළෙස් ජවන පහළ වන්නේ කලාතුරකින්ම වේ. පහළ වූයේ නමුත් මෙනෙහි කරනවාත් සමඟම වහාම නොපෙනී යයි. නැවතත් ඉක්මණින් මතු නොවේ. බොහෝ විට මෙනෙහි කරන සිතත් සමඟම නොපෙනී යයි. *විපස්සනා ඤාණ* විශේෂයෙන් ශක්තිමත් වී ආ විට මනාප රූපයක් දකිමින් සිටින විට පවා *චක්ඛු ද්වාර වීථි* ඇතුළත ද කෙළෙස් ජවන පහළ නොවී, කුසල් ජවනයෝත් *වොත්ථපනත්* පමණක් ම පහළ වීම විය හැක්කේය. එම දකින විථි සිත් ද අතරක් නොතබා මෙනෙහි නොකොට, මූල ස්වභාවය වෙනස් නොවී විපස්සනා සිත් පමණක් අඛණ්ඩව දිවිය හැක්කේය. එවැනි පුද්ගලයෙකුට

විපස්සනා භාවනා කරමින් සිටින විටද කෙලෙස් වලින් දුරස් බව, බැහැර බව ප්‍රකට වේ. මෙලෙස ප්‍රකටවන අකාරය සළායතන සංයුක්ත *ආසිවිස වග්ගයේ* සත්තම (7) සූත්‍රය විග්‍රහ කරන *අට්ඨ කථා* මගින්ද දැනගත හැක්කේය.

කෙලෙස් මෙනෙහි කොට දුරු කිරීම

දන්ධො භික්ඛවේ සතුප්පාදොති සතියා උප්පාදොයෙව දන්ධො උප්පන්නතාය පන තාය කෙචි කිලෙසා නිග්ගහිතාව හොන්ති, න සණ්ඨාතුං සක්කොන්ති, චක්ඛු ද්වාරස්මිං හි රාගාදීසු උප්පන්නෙසු දුතිය ජවනවාරෙ "කිලෙසා මෙ උප්පන්නා" ති ඤත්වා තතියෙ ජවන වාරෙ සංවර ජවනං යෙව ජවති, අනච්ඡරියඤ්චෙතං, යං විපස්සකො තතිය ජවන වාරෙ කිලෙසෙ නිග්ගණ්හෙය්‍ය, චක්ඛු ද්වාරෙ පන ඉට්ඨාරම්මණෙ ආපාථගතෙ භවංගං අවට්ඨෙත්වා ආවජ්ජනාදීසු උප්පන්නෙසු පොට්ඨබ්බනානන්තරං සම්පත්ත කිලෙස ජවනවාරං නිවත්තෙත්වා කුසල මෙව උප්පාදෙති. අරද්ධ විපස්සකානං හි අයමානිසංසො භාවනා පටිසංඛාරෙ පතිට්ඨිත භාවස්ස

[සං. අ.3/69]

දන්ධො භික්ඛවේ සතුප්පාදොති	=	දන්ධො භික්ඛවෙ සතුප්පාදො යනු
සතියා	=	කෙලෙස් පහළ වී යැයි සිහිගන්වන සතිය
උප්පාදොයෙව	=	පහළවීමම
දන්ධො	=	පමාවේ
පන	=	කෙළෙස් සන්සිදීම හෙමිහිට නොවේ නම්
තාය	=	සිහිපත් කරවන එම සතිය
උප්පන්නමත්තාය	=	පහළ වූ සැනින්
කෙචි කිළෙසා	=	සමහර කෙළෙස්
නිග්ගහිතාව	=	ඔබා දැමීම, නිගැන්ම
හොන්ති	=	වෙත්
සණ්ඨාතුං	=	මනාකොට පිහිටීමට
නසක්කොන්ති	=	නොහැකි වෙත්
හි	=	විස්තර කොට දක්වතොත්
චක්ඛු ද්වාරස්මිං	=	චක්ඛු ද්වාරයෙහි

රාගාදීසු උප්පන්නෙසු	=	රාගාදිය උපන් කල්හි
දුතිය ජවන වාරේ	=	ද්විතීය ජවන වාරයෙහි
මෙ	=	මට
කිලෙසා	=	කෙළෙස්
උප්පන්නාති	=	පහළවීයැ"යි
ඤත්වා	=	දැන
වා	=	දැනගත් නිසා
තතිය ජවන වාරේ	=	තෘතිය ජවන වාරයේ
සංවර ජවනං යෙව	=	සංවර විපස්සනා ජවනයම
ජවති	=	දුවයි
ච	=	දිගට දක්වතොත්
විපස්සකො	=	විපස්සනා භාවනා කරන්නා
තතිය ජවන වාරෙ	=	තෘතිය ජවන වාරයේ
කිලෙසෙ	=	කෙළෙස්
යං නිග්ගණ්හාය	=	යම් නිගැනිය හැකි වීමක් වේද
එතං	=	එලෙස නිගැනිය හැකිවීම
අනච්ඡරියං	=	ආශ්චර්‍ය්‍යයක් නොවේ
පන	=	නියම ආශ්චර්‍ය්‍යය
චක්ඛු ද්වාරෙ	=	චක්ඛු ද්වාරයෙහි
ඉට්ඨාරම්මණෙ ආපාතගතෙ	=	ඉෂ්ඨාරම්මණයක් ආපාතගත වූ කල්හි
භවංගං අවට්ටෙත්වා		
ආවජ්ජනාදීසු උප්පන්නෙසු	=	භවාංගයට ඉඩ නොතබා අවාර්ජනාදිය උපදනා කල්හි
වොට්ඨබ්බනානන්තරං	=	වොෂ්ඨාපනයන් අතරවාරයේ
සම්පත්ත කිලෙසජවනවාරං	=	පත් වූ කෙළෙස් ජවන වාරය
නිවත්තෙත්වා	=	ඔබාදමා (යටපත් කොට)
කුසලමෙව	=	කුසලයම

උපපාදති = පහළ කරවයි

අයං = කෙළෙස් අතරවාරයේ කුසල් පහළ කරවිය හැකි මේ ඵලය

ආරද්ධ විපස්සකානං = විපස්සනා ආරම්භ කරනරලද, උදයබ්බය ඤාණය ආදියෙන් පූර්ණවූ විපස්සනා යෝගීන්ගේ

ආරම්මණං පරිග්ගහිත මෙව = අරමුණ පරිග්‍රහ කොට භාවනා කළ යුතු වේ.

(ජවනාවසානයේ භාවනා කොට බැලිය යුතු යැයි කියවෙන නමුදු භවාංගයට පත් කල්හි භාවනා කොට බැලීම මින් අදහස් කෙරේ.)

පුන වාරං = නැවත දෙවන වීථි වාරයේදී

තථා න ජවති = එසේ රාගාදි වශයෙන් දිවීම සිදු නොවේ.

අපරස්ස = තවත් (මෙසේ විපස්සනා භාවනාව කරන නවක පුද්ගලයකුට

එවං = මේ දැක්වූ ආකාරයට

එක වරං ආවජ්ජතොපි = වරක් පමණ ආවර්ජනය කරන්නේ නමුදු

දුතිය වාරං = දෙවන වාරයේදී

වා = දෙවෙනි වාරයේ

රාගාදි වසෙන ජවනං = රාගාදි වශයෙන් ජවනය

පුන ජවති යෙව = නැවතත් දුවන්නේමය

දුතිය වාරාවසානෙ පන = දෙවැනි වාරය අවසානයේ

මෙ = මට

ජවනං = ජවනය

වා = දිවයන්නාවූ සිත

ඒවං ජවනති = මෙසේ පහළ වීයැ"යි

ආවජ්ජතො = ආවර්ජනය කොට

ආරම්මණං පරිග්ගහිත මෙව = අරමුණ පරිග්‍රහ කළ යුතුම

හොති = වේ

භාවනා පටිසංඛාරෙ පතිට්ඨිත

භාවසස = ප්‍රතිසංස්කරණ හේතුවෙන් සිත භාවනාවෙහි පිහිටා සිටීමේ

ආනිසංසො = ආනිසංශයයි (ඵලයයි)

මේ *පාළි අට්ඨකථා* මගින් මධ්‍යම ප්‍රමාණයට විපස්සනා ඥාණයන් අතින් සම්පූර්ණ පුද්ගලයනට වනාහි දකින අවස්ථාවේ *චක්ඛු ද්වාර වීථි* දූවන අතර වරෙක කෙළෙස් ජවන පහළ වීම සිදු වන්නේ නමුදු, එය මෙනෙහි කොට වටහා ගත හැකි නම් තෘතිය විථිය ආදියෙහි යළිත් කුසල *විපස්සනා ජවනයෝම* පහළ වීම වන්නේ යැයි දක්වයි. **අනච්ඡරියං** ආදි *අට්ඨකථාවන්ට* අනුව බලව විපස්සනා ඥාණයන් ගෙන් සම්පූර්ණ පුද්ගලයනට "අකුසල් සිත් පහළ නොවී තත්ත්වාකාරය මෙනෙහි කොට දැන ගැනීමම දිගටම වේවා"යි යන අධිෂ්ඨාන ශක්තියෙන් දකින *චක්ඛු ද්වාර වීථීන්* ආදීන්හිද කෙළෙස් ජවන පහළ නොවී කුසල් ජවන පමණක්ම පහළ වන්නේ නම් එම ප්‍රථම චිත්ත වීථිය දෙවැනි චිත්ත වීථිය මගින් බලාගත හැක්කේ යැයි දක්වේ. වොත්ථපන පමණකින් නතරවන ආකාරය වනාහි මූල පණ්ණාස (ම. නි.) *මහාහත්ථිපදොපම* සූත්‍ර *අට්ඨකථා* දැක්වීම මගින් වටහා ගත යුතුවේ.

පඤ්චද්වාරයන් හි ජවන් සිත් නැතිවන අකාරය

බලව විපස්සකස්ස සචෙපි චක්ඛු දවාරාදිසු ආරම්මණෙ ආපාථගතෙ අයොනිසො අවජ්ජනං උප්පජ්ජති, වොත්ථපනං පත්වා එකං දෙව වාරෙ ආසෙවනං ලභිත්වා චිත්තං භංගමෙව ඔතරති. න රාගාදිවසෙන උප්පජ්ජති. අයං කොටිප්පත්තො තික්ඛ විපස්සකො. අපරස්ස රාගාදි වසෙන එකං වාරං ජවනං ජවති,ජවනපරියොසානෙ පන "රාගාදි වසෙන එවං මෙ ජවනං ජවිත"න්ති ආවජ්ජතො ආරම්මණං පරිග්ගහිත මෙව හොති. පුන වාරං තථා න ජවති. අපරස්ස එක වාරං එවං අවජ්ජතොපි පුන දුතිය වාරං රාගාදි වසෙන ජවනං ජවති යෙව, දුතිය වාරාවසානෙ පන "එවං මෙ ජවනං ජවිත"න්ති ආවජ්ජතො ආරම්මණං පරිග්ගහිත මෙව හොති, තතිය වාරෙ තථා න උප්පජ්ජති. [ම. අ. 2/188]

බලව විපස්සකස්ස = නිබ්බිදා ඥාණ ආදිය අතින් සම්පූර්ණ වී බලවත් වූ විපස්සනාව ඇති යෝගීන් හට

චක්ඛු ද්වාරාදිසු	=	චක්ඛු ද්වාර ආදියෙහි
ආරම්මණෙ ආපාථගතෙ	=	අරමුණ ආපාතගත වූ කල්හි
අයොනිසො ආවජ්ජනං	=	අනුවණින් සළකා බැලීම
සචෙ පි උපපජ්ජති	=	ඉදින් සිදුවුනි නම්
වොට්ඨපනං පත්වා *	=	වොත්ථපනයට පත් වී
ඒකං ද්වෙ වාරෙ	=	වරක් දෙවරක්
අසෙවනං ලභිත්වා	=	අසේවනය ලැබ
චිත්තං	=	සිත
භවංගමෙව	=	භවාංගයටම
ඔතරති	=	බැසගනී
රාගාදි වසෙන	=	රාගාදිය වශයෙන්
න උප්පජ්ජති	=	නො උපදී
අයං	=	ඒ පුද්ගලයා
කොටිප්පත්තො තික්ඛ විපස්සකො	=	ඉහළ විපස්සනාව මුදුන් පත් වූ විපස්සකයා
අපරස්ස	=	වෙනත් (මධ්‍යම ලෙස මෙම විපස්සනාව භාවනා කරන) පුද්ගලයෙකුට
රාගාදි වසෙන	=	රාගාදිය වශයෙන්
ජවනං	=	ජවනය
එකං වාරං ජවති	=	වරක් දුවයි
පන	=	නමුත්
මෙ	=	මට
රාගාදි වසෙන ජවනං	=	රාගාදි වශයෙන් ජවනයෝ
එවකං ජවිතනති	=	මෙසේ වන්නේයැ"යි
ආවජ්ජතො	=	ආවර්ජනය කොට

* සිංහල පොතෙහි මෙය වොත්ථපනං යැයි දැක්වේ

තතියවාරෙ = තුන්වන කෙළෙස් වාරයේ

තථා න උපසජ්ජති = එලෙස රාගාදි වශයෙන් පහළ නොවේ.

මේ අට්ඨ කථාහි දක්වන යෝගී පුද්ගලයන් තුන්දෙනා අතරින් වනාහි තුන්වන පුද්ගලයා *මන්ද විපස්සකය*. දෙවැනි පුද්ගලයා *මජ්ඣිම විපස්සකය*. ප්‍රථම පුද්ගලයා *තික්ඛ විපස්සකය*. තවත් ආකාරයකටඃ තෘතිය පුද්ගලයා *මන්ද- බලව* විපස්සනාව අතින් සම්පූර්ණ පුද්ගලයායි. දෙවැනි හා ප්‍රථම පුද්ගලයන් පිළිවෙලින් මධ්‍යම හා උත්කෘෂ්ඨ *බලව විපස්සනාව* අතින් සම්පූර්ණ පුද්ගලයන්ය. ඒ තුළින් *මන්ද විපස්සකයාට* දකින අවස්ථාවේ *චක්ඛු ද්වාර වීථීන්* ආදියෙහි පහළ වන කෙළෙස්, වරක් මෙනෙහි කළේ නමුදු තවදුරටත් නැවත පහළ වේ. ඔහුට දෙවන වර මෙනෙහි කරන විට කෙළෙස් ජවන එසේ පහළ නොවේ. කුසල ජවන, විපස්සනා ජවනයෝ පමණක්ම පහළවේ. දෙවැනි පුද්ගලයනට සිදු වන ආකාරයට පෙරදී දැක්වීය. ප්‍රථම *තික්ඛ විපස්සකයාට* කෙළෙස් පහළ වුනේ නමුත් පෙර පෙර භාවනාවේ ශක්තිය නිසා එම *ආවජ්ජනායන්* බලවත් නොවේ. එමනිසා *පඤ්ච විඤ්ඤාණ, සම්පටිච්ඡන, සනතීරණ* යන මේවාහිද අරමුණ ප්‍රකට ලෙස ගත නොහැක්කේය. එම සිත්වල අරමුණ ප්‍රකටව නොබලන නිසා *වොත්ථපන* නම් වූ *මනොද්වාරාවජ්ජනයද* කැමති- අකමැති වශයෙන් තීරණයකට එලඹිය නොහී විමසීම්, සළකා බැලීම් වශයෙන් දෙ තුන්වරක් පහළ වේ. මෙලෙස පෙර සිත් වල භාවනා ජවය අනුව පසු සිත් පහළ වීම සලකා **ආසෙවනං ලභිත්වා**, නිශ්‍රය ලැබීයයි කියනු ලැබේ. *ආසෙවන පච්චය, පච්චයුප්පන්න* වීම අදහස් නොකරයි. මෙලෙසට දෙ තුන්වරක් සිදුවන්නේය. නමුදු *තීරණයකට* එළඹිය නොහැකි බැවින් ජවනයන් නොදුවා භංගයට වැටේ. *මනොද්වාරයන්හිද* මේ *වොත්ථපන වාර* වීථීන් පහළ විය හැක්කේමය. එම වීථි පහළ වන අවස්ථාවෙහි හොඳින් ප්‍රකට නොවේ. දුටුවාසේ, ඇසුවාසේ, සිතුවාසේ පෙනීයා හැක්කේය. භවාංගයෙන් නැගී සිටි විට හොඳින් ප්‍රකට නොවූ එම දැකීම් ආදිය, භාවනා කොට බලන *මනොද්වාර විපස්සනා වීථි* පහළ වේ. එසේ වූ පුද්ගලයනට *පඤ්චද්වාරයන්හි* කුසල්- අකුසල් ජවන සම්පූර්ණයෙන් සන්සිඳේ. *මනොද්වාර* වීථියෙහි පමණක් *තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව* ප්‍රකට වී භාවනා කරන විපස්සනා ජවන සන්සිඳී යෑම සංඛාර උපෙක්ඛා ඤාණය මේරූ කාලයෙහි බොහෝ විට සිදුවිය හැක්කේය. භාවනා කොට මෙම ඤාණයන්ට පත්වූ කල්හි මෙය තමාම අත් දකිනු ඇත.

එම අවස්ථාවත් හි යෝගාවචරයා තවමත් පෘථග්ජන වන්නේ නමුදු රහතන් වහන්සේ නමක් මෙන් *ඡළඞ්ග උපෙක්ඛාව* අතින් සම්පූර්ණ වේයයි දත යුතුය. එම නිසා *අංගුත්තර නිකායේ තික* වග්ගයේ සතරවන සූත්‍රයෙහි පඤ්චම වාරයෙහි මෙසේ වදාරා ඇත.

"සාධු භික්ඛවේ භික්ඛු කාලෙන කාලං පටිකූලසඤ්ඤ අපටිකූලසඤ්ඤ තදුභයංච අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍ය සතො සම්පජානො" [අං නි. 3/276]

මහණෙනි, කාලයෙන් කාලයට පිළිකුල-අපිළිකුල යන දෙවර්ගයම දැක සතිමත්ව සම්පජඤ්ඤයෙන් යුක්තව උපේක්ෂාවෙන් විසිය යුතුවේ. මෙලෙස විසීම හොඳ යැයි දේශනා කළසේක. එම *අට්ඨකථාවෙහිද*

ඡළඞ්ගුපෙක්ඛා වසෙන පඤ්චමො, ඡළඞ්ගුපෙක්ඛා චෙසා ඛීණාසවස්ස උපෙක්ඛා සදිසා, න පන ඛීණාසවුපෙක්ඛා -පෙ- ඉමස්මිං සුත්තෙ පඤ්චසු ඨානෙසු විපස්සනාව කථිතා, තං ආරද්ධ විපස්සකො කාතුං සක්කොති [අං. අ. 2/623]

පඤ්චම වාරය ඡළඞ්ගුපෙක්ඛා වශයෙන් දේශනා කළ සේක. *ඡළඞ්ගුපෙක්ඛා* යන්නද රහතන් වහන්සේගේ උපේක්ෂාව හා සමාන උපේක්ෂාවයි. නමුත් රහතන් වහන්සේගේ උපේක්ෂාවම නොවේ. මේ සූත්‍රයේ පස් ස්ථානයක විපස්සනාව පමණක්ම දේශනා කළසේක. එම විපස්සනාව (ආරම්භක අවස්ථාව පසු කොට *උදයබ්බය ඤාණය* ආදීය අතින් සම්පූර්ණ වූ) *ආරද්ධ විපස්සක* පුද්ගලයාට කිරීමට හැක්කේයයි ප්‍රකාශ කෙරේ. *මූලපණ්ණාස මහා හත්ථිපදොපම* සූත්‍ර *අට්ඨකථාහි* ද.

"උපෙක්ඛා කුසල නිස්සිතා සණ්ඨාතීති ඉධ ඡළඞ්ගුපෙක්ඛා. සා පනෙසා කිඤ්චාපි ඛීනාසවස්ස ඉට්ඨානිට්ඨෙසු ආරම්මණෙසු අ-රජ්ජනාදිවසෙන පවත්තති, අයං පන භික්ඛු විරිය බලෙන භාවනා සිද්ධියා අත්තනො විපස්සනං ඛීණාසවස්ස ඡළඞ්ගුපෙක්ඛා ඨානෙ ඨපෙතීති විපස්සනාව ඡළඞ්ගුපෙක්ඛානාම ජාතා [ම. අ. 2/189]

උපෙක්ඛා කුසල නිස්සිතා සණ්ඨාති යන මෙහි *උපෙක්ඛා* යන්න *ඡළඞ්ගුපෙක්ඛාව* වේ. මේ *ඡළඞ්ගුපෙක්ඛාව* හොඳ- නරක අරමුණු මත විෂම ලෝභය නැති බව ආදී වශයෙන් රහතන් වහන්සේලාගේ සන්තානයේ විය හැකි නමුදු මේ විපස්සනා යෝගී භික්ෂුවගේ වීර්යය ශක්තියෙන් භාවනාව සමෘධියට පත්කරයි. එම නිසා භාවනා කරන *විපස්සනාවටම ඡළඞ්ගුපෙක්ඛාව* නම් වන්නේ යයි දක්වයි.

දැක්වූ ලෙසට *පඤ්චමවාරයන්හි* ජවනසිත් තෙක් භාවනා කළයුතු යැයි අදහස් කොට තලගොයෙකු ඇල්ලීමේ උපමාවෙන් කුඩා සාමණේර

ස්වාමීන් වහන්සේ විසින් පොඨිල මහ තෙරුන් වහන්සේට කම්සථාන දෙන ලදී.

පොඨිල තෙරුන්ගේ පුවත

බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ පොඨිල නැමති මහාථෙර නමක් වැඩ විසීය. එම මහා ථෙර විපස්සි ආදී කොට ඇති පෙර බුදුරජාණන් වහන්සේලා හය නමක් ජීවමාන කාලයේ දඹදිව ඉපිද පැවිදිව මුළු ත්‍රිපිටකයම කටපාඩමෙන් සිතේ දරාගෙන පරියාප්ති උගැන්වීම කළේය. දැන් මෙම ගෞතම බුදුරජාණන් ජීවමාන කාලයේදීද පරියාප්තිය උගැන්වීමම කරමින් ගත කළ සේක. භාවනාව සඳහා උත්සාහ නොකළ සේක. එම නිසා සංවේගය පහළ කරනු වස් එම මහාථෙර හමුවන හමුවන වාරයේ බුදුරජාණන් වහන්සේ **තුච්ඡ පොඨිල** = (හිස් පොඨිල) යැයි ආමන්ත්‍රණය කළසේක. එම අවස්ථාවේ පොඨිල මහ තෙරුන්ට සංවේගය පහළ විය. " මම *අට්ඨකථා* සහිත ත්‍රිපිටකය සිත්හි දරාගෙන භික්ෂූන් පන්සියයකට අතරක් නොතබා දිනපතා උගන්වන්නෙමි. නමුදු මට 'හිස් පොඨිල' යැයි බුදුරජාණන් වහන්සේ ආමන්ත්‍රණය කරන සේක. මට *ඣාන-විපස්සනා-මග්ග-ඵල* ධර්මයන් නොමැති නිසා මෙලෙස අවමන් කරන්නේ යැයි, සංවේගයට පත්වී භාවනා කිරීමට සිත යොදා යොදුන් 120ක් දුර තිස් නමක් ඇති අරණ්‍යයකට සැපත්වී වැඩිමහල් මහාථෙර ලඟ කමටහන් ඉල්ලා සිටියේය. එවිට *පරියත්ති මාන* තදව ඇති නිසා මහථෙර තෙමේ තමා කමටහන් නොදී දෙවැනි මහාථෙර ළඟට පිටත් කොට හැරියේය. දෙවැනි මහාථෙර නමද තුන්වන මහාථෙර ළඟට පිටත් කොට හැරියේය. මෙලෙස ක්‍රමයෙන් අවසානයේ වසර හතක් වූ රහත් සාමණේර නමක් ළඟට පත්විය.

ප්‍රශංසනීය ගුණයක්

එම අවස්ථාවෙහි පොඨිල තෙරුන්ගේ *පරියත්ති මාන*යද සිඳී ගොස් ළදරු සාමණේර තැන ලඟ උක්කුටියෙන් හිඳ*ඇඳිලි බැඳගෙන *කම්මට්ඨාන යාචනය* කළේය.

---

* සාමණේර ළඟ පසඟ පිහිටුවා වැඳීම නොකළේ නමුදු, ආපත්ති දේශනාකරන අවස්ථාවේ, අනුශාසනා ලබන අවස්ථාවේ, වරදට සමාව ගන්නා අවස්ථාවේ, කම්මට්ඨාන යාචනය කරන අවස්ථාවේ යනාදියේ දී ඇඳිලි බැඳීම් කළ යුතු යැයි අත ශ්‍රැතය

ත්‍රිපිටක ධර පරියත්ති ආචාර්‍යයකු වූ නමුදු මා දන්නා පමණින් වැටහෙන ප්‍රමාණයට භාවනා කරන්නෙමි. අනුන් ළඟ යටත් නොවන්නෙමියි නොසිතා මෙපමණ දුරට ධර්ම ගෞරවය පිහිටුවාගැනීම ප්‍රශංසනීය ලක්‍ෂණයකි. ඉතාමත් නිහතමානී වී නිවාත ගුණයන් ගෙන් සම්පූර්ණතාවයට පත්වීම ප්‍රශංසනීයයි.

එම අවස්ථාවේ ළදරු සාමණේර නම "මම ඉතාමත් ළාමකය. සූතමය ඥාණය අතින් ද ළාමකය. ඔබ වහන්සේ යටතේ ඉගන ගත යුතු තරම් යැයි" කියමින් පැකිළුනු නමුදු පොඨිල මහතෙර විසින් නැවත, නැවතත් ඉතා ඕනෑ කමින් යාචනය කළ නිසා, කියන ආකාරයට ගෞරවයෙන් පිළිපදින්නේ නම් කමටහන් දෙන්නේ යැයි සාමණේර නම පැවසීය. 'පිළිපදින්නෙමි - ගින්නට පනින්නට කියන්නේ නම් පනින්නෙමි'යි මහාථෙර යටත් විය.

සාමණේර නැන පරීක්‍ෂා කිරීමට කැමති වූ සේක් "එසේ නම් මේ වැවට බසින්න යයි" ළඟ තිබූ වැවක් දක්වා පරීක්‍ෂා කලේය. මහා ථෙර නම වටිනා සිවුරත් පොරවාගෙනම කී පමණින්ම වැවට බැස්සේය. සිවුර කෙළවර යාන්තමට පෙඟී ගිය විට නැවත වඩිනු මැනවයි කී කල්හි කී පමණින්ම නැවත ගොඩවිය. එවිට සාමණේර නම පහත සඳහන් ලෙසට කමටහන් දුන්නේය. ස්වාමීන් වහන්ස, යම් වේ තුඹසක මුඛ විවර හයක් ඇත්තේ නම්, එම තුඹසට රිංගාගෙන සිටින තලගොයකු අල්ලා ගතයුතු අවස්ථාවේ එයින් විවර පහක් වැසිය යුතුවේ. ඉතිරි වන විවරය ළඟ නතරවී සිට අල්ලාගත යුතුය. එසේම 'ද්වාර හයෙහි අරමුණු හයක් ප්‍රකට වී නම් ද්වාර පහක් වසා මනෝද්වාරය පමණක් ක්‍රියා කරන්න' යැයි කමටහන් දුන්නේය. මෙහිලා ද්වාර පහ වසා දැමිය යුතු යැයි යනු මෙම ද්වාරයන්හි දුවන ජවන නතර විය යුතු යැයි අදහස් කෙරේ. නොදක්නා පිණිස නොඇසෙනු පිණිස ඇස්-කණ් වසා දැමිය යුතු යැයි නොකිය වේ. එලෙස වසා දැමීමටද නොහැක්කේය. දිව, කය යන මේවා වසා දැමීමට කෙසේවත් නොහැකි බව සළකා ගන්න. වසා දැමීමට හැකි වූ අවස්ථා වලදීද එලෙස වැසීමෙන් අර්ථයක් නොමැති බව දක්වා (ම.නි.) *උපරි පණ්ණාස පාළි*- 3/616 හි *ඉන්‍ද්‍රිය භාවනා* සූත්‍රයෙහිලා බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක, ඒ පහත දැක්වෙන ආකාරයටය. අපධ වූ පමණින් භාවනාව සිදුනොවේ.

එවං සන්තෙ ඛො උත්තර අන්ධො භාවිතින්ද්‍රියො භවිස්සති බධිරො භාවිතින්ද්‍රියො භවිස්සති, යථා පාරාසරියස්ස බ්‍රාහ්මණස්ස වචනං, අන්ධො හි උත්තර චක්ඛුනා රූපං න පස්සති, බධිරො සොතෙන සද්දං න සුණාති. [ම. නි. 3/616]

උත්තරය, රූපයක් ඇසින් නොබලන- නොදකින පමණින් ආදියෙන් *ඉන්ද්‍රිය භාවනා* යැයි කියන තොප ආචාර්ය්‍ය පාරාසරිය බ්‍රාහ්මණයාගේ කථාවට අනුව දක්වතොත් ඇස් නොපෙනන තැනැත්තා ඉන්ද්‍රිය භාවනා සම්පූර්ණ කළ කෙනෙක් වන්නේය. කණ නෑසෙන බිහිරා ඉන්ද්‍රිය භාවනාව සම්පූර්ණ කළ කෙනෙක් වන්නේය. උත්තරය, මක් නිසාදයත්: ඇස් නොපෙනෙන්නා ඇසින් රූපයක් නොදකින, කණ නෑසෙන තැනැත්තා කණින් ශබ්දය නොඅසන බැවිනි. (එම සූත්‍ර පරිවර්තනය)

තව දුරටත්, මේ ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි ද අනෙකුත් *විපස්සනාවට* අදාල සූත්‍රයන්හිද **චක්ඛුනා රූපං දිස්වා සොතෙන සද්දං සුත්වා** ආදි ලෙසට අරමුණු හය දැන ගෙන, මෙනෙහි කොට සංවර කළ යුතු ක්‍රමය දක්වයි. අරමුණු සය කිසිවක් නොදැන සංවර වියහැකි ක්‍රමයක් එහි ලා නොදක්වයි. එම නිසා සියලු ග්‍රන්ථයන්ට අනුව *පඤ්චද්වාරයෙහි* ජවන සංසිඳ වූ විටම එම ද්වාරය වසා දැමුවා නම් වන්නේ යයි සැක නැතිව සළකා ගත යුතුය. *මනොද්වාරයෙන්* පමණක් ක්‍රියා කරන්න යැයි කියමන "එම ද්වාරයෙහි පමණක් මෙනෙහි කරන විපස්සනා ජවන පහළ වේවායි" මෙයින් අදහස් කෙරේ. කෙටියෙන් *ඡළඞ්ගුපෙක්ඛාවට* පත් වන තෙක් වැර දරන්න යැයි මින් කියැවේ.

එම අවස්ථාවෙහිදී පොඨිල මහාතෙර තෙම *අට්ඨකථාවන්* සහිත ත්‍රිපිටකය දැන සිටීමේ ශක්තියෙන් මෙපමනක් කර්මස්ථානය ඇසූ පමණින් අන්ධකාරයේ පහනක් දැල්වූවා සේ ප්‍රකට ලෙස කාරණය වටහා ගත්තේය. එම ක්‍රමයට අනුව වීර්ය්‍ය කරන කල්හි බුදුරජාණන් වහන්සේ යොදුන් 120ක් දුර සිට බුදුරැස් විහිදුවා තම ශ්‍රී ශරීරය දක්වමින් පහත සඳහන් ගාථාව වදාළ සේක.

යොගා වේ ජයතී භූරි - අයොගා භූරි සංඛයො
එතං ද්වෙධා පථං ඤත්වා- භවාය විභවාය ච
තථාත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති [ධ. ප. ගාථා 282]

භූරි = ප්‍රඥාව

වෙ ජායතෙ = ඒකාන්තයෙන් පහළ වේ.

අයොගො = භාවනාවෙහි නොයෙදීම නිසා

භූරි සංඛයො = ප්‍රඥාවේ විනාශය

හොති = වේ

භවාය ච = වර්ධනය ද

විභවාය ච = විනාශ වීම ද

පවත්තං = වන්නාවූ

ඵතං ද්වෙධා පථං = භාවනා කිරීම, භාවනා නොකිරීම යන මේ මාර්ග දෙක

ඤත්වා = දැන- වටහාගෙන

යථා නිවෙසියමාන = යම් ආකාරයකින් තමා වශයෙන් පිළිපදින්නේ

භූරි = විපස්සනා ප්‍රඥා මාර්ග ප්‍රඥා

පවඩ්ඪති = වැඩෙත් නම්,

තථා = එම ආකාරය වශයෙන්

අත්තානං = තමා වශයෙන්

නිවෙසෙය්‍ය = පිළිපැදිය යුතුවේ.

මේ ගාථාවේ අවසානයේ පොඨිල මහාථෙර නම අර්හත්වයට පත්වූ බව එම *අට්ඨකථාවෙහි* දැක්වේ.

මේ වනාහි දකින විට 'දකිනවා' යයි, මෙනෙහි කරන්නාට විශේෂ ඤාණ මෝරා ආ කල්හි *විපස්සනා* භාවනා කරන අතර වාරයේම *ජළඞ්ගුපෙක්ඛාව* තෙක් පත්වී කෙළෙස් දුරුකරන ආකාරය ප්‍රකට කිරීමයි. අසන අවස්ථා ආදියෙහිදීද 'අසනවා-අසනවා'යැයි මෙනෙහි කොට, යම්කිසි ධර්ම කොටසක් ප්‍රධාන කොට දැනගන්නා තැනින් පටන්ගෙන ජළඞ්ගුපෙක්ඛාව පහළ වන තැන තෙක් තේරුම් සවිස්තරව දක්වන අවස්ථාවේ දැක්වූ ක්‍රමයට අනුව දත යුතුයි.

කෙළින්ම දක්වන සාධක

සිත ක්ෂණයක් පාසා පහළ වීමේදී ධර්ම කොටසක් ප්‍රධානකොට දැන ගැනීම මගින් ක්‍රමයෙන් සියල්ල දැනගැනීම සම්පූර්ණ වන බව *පාළි, අට්ඨකථා,*

ටීකා මගින් දත හැකි නමුදු *ධම්ම වවත්ථාන ඤාණය* නොසැලෙන ලෙසට තහවුරු කිරීමේ අර්ථය සළකා, එම අර්ථය කෙළින්ම- ප්‍රකටව දක්වන සමහරක් අට්ඨකථා ටීකා මත්තෙහි දක්වන්නෙමි.

එවං සුවිසුද්ධ රූප පරිග්ගහස්ස පනස්ස අරූප ධම්මා තීහි ආකාරේහි උපට්ඨහන්ති ඵස්ස වසේන වා, වේදනා වසේන වා, විඤ්ඤාණ වසේන වා

[වි. ම. 444]

එවං	=	දක්වූ ක්‍රමයට අනුව
සුවිසුද්ධ රූප පරිග්ගහස්ස	=	රූප පරිග්ගහය පිළිබඳව මනා කොට විසුද්ධියට පත්
අස්ස	=	එම යෝගියාට
අරූප ධම්මා	=	නාම ධර්මයන්
ඵස්ස වසේන වා	=	ස්පර්ශය වශයෙන් හෝ
වේදනා වසේන වා	=	වේදනා වශයෙන් හෝ
විඤ්ඤාණ වසේන වා	=	විඤ්ඤාන වශයෙන් හෝ
තීහි ආකාරේහි	=	කියන මේ තුන් ආකාරයන් මගින්
උපට්ඨහන්ති	=	ප්‍රකටවේ.

අර්ථය වනාහි

රූප පරිග්ගහ කොට, මෙනෙහි කොට මනා ලෙස විසුද්ධියට පත්වූවහුට රූපය මෙනෙහි කරන- මෙනෙහි කරන නාම ධර්ම ඉබේම මෙන් ප්‍රකට වේ. මෙනෙහි කළයුතු රූපය අරමුණු කොට ප්‍රථමයෙන් පහළ වූ හැපීම, දැනීම ආදී *පඤ්චද්වාරික නාම* ධර්මයෝ ඉබේම ප්‍රකටවේ. නමුදු සියල්ල එසේ එක වැරම ප්‍රකට වනවා නොවේ. *ඵස්සය* ප්‍රකට නිසා එය ප්‍රථමයෙන් ප්‍රකට විය හැක්කේය. වේදනා ප්‍රකට නිසා එය ප්‍රථමයෙන් ප්‍රකට විය හැකකේය. ආරම්භක යෝගාවචරයාට මේ *ඵස්ස, වේදනා, විඤ්ඤාණ* යන මේවා අතරින් එක වරක එකක්ම ප්‍රකට වේ. ප්‍රකට වන ආකාරය කර්කශ වූ මෘදුවූ, පඨවි හා හැපෙන විට එම පඨවිය 'හැපීම' හෝ වේවා 'කර්කශ තදබව, මෘදු බව යයි හෝ ' වේවා මෙනෙහි කරන්නේ නම් සමහර පුද්ගලයනට එම තද, බර, කර්කශ, මෘදු බව හා හැපීම වශයෙන්

* පාරාසිවිය (බුරුම අකුරු)

මෙම *ඵස්සය* ප්‍රකට වේ. සමහරකුට එම තද, බර, කර්කශ හෝ මෘදු බව විඳින *වේදනා* ප්‍රකට වේ. සමහරකුට එම තද, බර, කර්කශ හෝ මෘදු බව දැනගන්නා ස්වභාවය නම් වූ *විඤ්ඤාණය* ප්‍රකට වේ. මේ පුද්ගලයන් තුන්දෙනා අතරින් ඵස්සය ප්‍රකට තැනැත්තාට එම *ඵස්සය* පමණක් තත්ත්වාකාරයෙන් *පච්චක්ඛ ඤාණයෙන්* මෙනෙහි කොට දැක ගත හැක්කේය. නමුදු *ඵස්සය* පමණක්ම පහළ වනවා නොවේ. එම ඵස්සය හා බැඳී *වේදනා- සංඥා- චේතනා- සංඛාර- විඤ්ඤාණයෝද* පහළ විය හැක්කේය. *ඵස්සය* පමණක් වෙන්ව ගත නොහැක්කේය. එම නිසා *ඵස්සය* පමණක් ප්‍රකට වී එය වටහා ගන්නේ නම් එකට පහළ වන *වේදනා සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ* යන මේවාද ප්‍රකටවූවාම වන්නේය. ඒවාද දැන ගත්තාම වන්නේය. ප්‍රකට නැතැයි හෝ නොදන්නේ යැයි නොකිය හැක්කේය. උපමාවක්: හොඳින් ගැට ගසා ජලයට දමන ලද ලුණු කැබලි පහකින් හතරක් ජලයේ ගිලී එක ලුණුවක්ම සේ මතුවී පාවෙමින් පවතින්නේය. එම මතුවී ඇති ලුණුව දැක ඇදගත්තේ නම් එම ලුණුව පමණක් නොව ගැටගැසී ඇති ලුණු පහම ඇදී එන්නා සේය. මෙම උපමාවෙහි: මතුවී ඇති ලුණුව ප්‍රකට *ඵස්සය* හා සමානය ගිලී ඇති ලුණු *වේදනාදියට* සමානය. මතුවී ඇති ලුණුව අතින් අල්ලා ඇදගත් කල්හි ගිලී තිබුණ ඉතිරි ලුණුද ඇදී එන්නා සේ ප්‍රකට වූ *ඵස්සය* මෙනෙහි කොට දැනගන්නේ ප්‍රකට නොමැති *වේදනාදිය* ඇතුළත් වන්නා හා සමානය. *වේදනා* හෝ *විඤ්ඤාණ* යන එකක් ප්‍රකට පුද්ගලයන් දැන ගන්නා ආකාරයන්ද මේ ක්‍රමයටම සළකා ගන්න. එම නිසා මහාටීකා හි මෙලෙස ප්‍රකාශ කෙරේ.

තෙනස්ස ඵුසනාකාරෙන සුපාකටභාවෙන උපට්ඨානං දස්සෙති, ඵස්සෙ පන උපට්ඨිතෙ යස්මිං ආරම්මණෙ සො ඵස්සො, තස්ස අනුභවන ලක්ඛණා, සඤ්ජානන ලක්ඛණා සඤ්ඤා, ආයුහන ලක්ඛණා චෙතනා, විජානන ලක්ඛණං විඤ්ඤාණන්ති ඉමෙපි පාකටා හොන්ති [මහා ටී. (බු.) 2/356]

තෙන	= ඵස්ස ප්‍රකට බව දක්වන එම කථාවෙන්
අස්ස	= එම ඵස්සයාගේ
ඵුසනාකාරෙන	= හැපීමේ ආකාරයෙන්
පාකට භාවෙන	= පච්චක්ඛ ඤාණයෙන් දැනගත හැකි ලෙසට හොඳින් ප්‍රකට වීම් වශයෙන්

උපට්ඨානය	=	ප්‍රකටවීම
දීපෙති	=	අට්ඨකථාචාර්‍යයන් වහන්සේ දක්වයි
පන	=	නමුදු
ඵස්සෙ උපට්ඨිතෙ	=	ඵස්සය ප්‍රකට කල්හි
යස්මිං ආරම්මණෙ සො ඵස්සො	=	යම් අරමුණක එම ඵස්සය වෙයිද
තස්ස	=	එම අරමුණ
අනුභවන ලක්ඛණා වේදනා	=	අනුභවන ලක්ෂණය ඇති වේදනාවද
සඤ්ජානන ලක්ඛණා සඤ්ඤා	=	හැඳින ගැනීම් ලක්ෂණය ඇති සඤ්ඤාවද
ආයුහන ලක්ඛණා චේතනා	=	ආයුහන ලක්ෂණය ඇති චේතනාවද
විජානන ලක්ඛණං විඤ්ඤාණං	=	දැන ගැනීම් ලක්ෂණ ඇති විඤ්ඤාණයද
ඉති	=	මෙසේ
ඉමෙපි	=	මේ ධර්මයන්ද
පාකටා	=	ප්‍රකට වීම
හොති	=	වෙත්

අර්ථය

ඵස්සය ප්‍රකට අවස්ථාව දක්වන *අට්ඨකථා* මගින් ස්වභාව ලක්ෂණය භාවනා කළ හැකි වනු පිණිස මෙසේ ඵස්සය හොඳින් ප්‍රකට වීම දක්වයි. නමුදු *ඵස්සය* ප්‍රකට නම් එම අරමුණම විඳින වේදනාව, හැඳින ගන්නා *සඤ්ඤාව*, ආයුහනය(රැස්කිරීම) කරන චේතනාව, දැනගන්නා විඤ්ඤාණය යන මේ එකට බැඳීගත් ධර්මයන්ද ප්‍රකට වන්නේමය, ප්‍රකට වීම වන්නේමය. සම්පූර්ණයෙන් ප්‍රකට වන්නේ යැයි අදහස් කෙරේ. *දීඝ නිකාය සක්ක පඤ්හ* සූත්‍රය, ම. නි. *සතිපට්ඨාන* සූත්‍රය, *අභිධම්ම සතිපට්ඨාන විභංග* යන මේවායේ විස්තර *අට්ඨකථාහි* මෙලෙස ප්‍රකාශ කෙරේ.

යස්ස ඵස්සො පාකටො හොති සොපි "න කෙවලං ඵස්සොව උප්පජ්ජති තෙන සද්ධිං තදෙවාරම්මණං අනුභවමානා වේදනාපි උප්පජ්ජති සඤ්ජානනමානා සඤ්ඤාපි, චෙතයමානා චෙතනාපි, විජානනමානං විඤ්ඤාණම්පි උප්පජ්ජති" ති ඵස්ස පඤ්චමකෙයෙව පරිග්ගණ්හාති.

යස්ස = යමකුට

ඵස්සො පාකටො = ඵස්ස ප්‍රකට වීම

හොති = වේද

සොපි = ඔහුට

(පරිග්ගණ්හාති හා බැඳේ)

කෙවලං ඵස්සො ච = ඵස්සය පමණක්ම

න උප්පජ්ජති = උපදිනවා නොවේ

තෙන සද්ධිං = එම පස්සය හා සමග

තදෙවාරම්මණං = එම ඵස්සය ගත් අරමුණම

අනුභවමානා වෙදනාපි උප්පජ්ජති = විඳින වේදනාවද උපදී

සඤ්ජානමානා සඤ්ඤාපි = හැඳින ගන්නා සඤ්ඥාවද උපදී

චෙතයමානා චෙතනාපි = රැස්කිරීම කරන චේතනාවද උපදී

විජානමානං විඤ්ඤාණම්පි

උප්පජ්ජති = දැන ගන්නා විඤ්ඤාණයද උපදී

ඉති = මෙසේ

ඵස්ස පඤ්චමකෙ යෙව = ඵස්සය පස්වැනි කොට ඇති ධර්මයන්ද

පරිග්ගණ්හාති = පරිග්ගහ කොට භාවනා කළා නම් වේ

සළකා ගතයුතු අදහස

"යමෙකුට ඵස්සය ප්‍රකට වේ. ඔහු ඵස්සයේ පමණක් ස්වභාව ලක්ෂණාදිය වශයෙන් භාවනා කොට බලයි. එ නමුත් මෙපමණකින් *ඵස්ස පඤ්චමක* ධර්මයන් භාවනා කොට බැලුවා නම් වන්නේය. හේතුව වනාහි මෙහිදී *ඵස්සයෙන්* පමණක් නවතිනවා නොවේ. *වේදනා, සඤ්ඤා චේතනා විඤ්ඤාණ* යන මේවාද මෙම *ඵස්සය* හා බැඳී එකටම පහළ වන නිසාය" යන මෙම අර්ථ ඉහත සඳහන් අට්ඨකථාවන්ගෙන් ගතයුතු වන්නේය.

නොගත යුතු අර්ථ

"*එස්සය* ප්‍රකට නමුත් ඔහුට *ඵස්සය* පමණක් පහළ විය නොහැක්කේය. *වේදනාදියද* පහළ වෙත් මැයි. *වේදනාදී* එම අප්‍රකට ධර්මයන් සුතමය ඤාණයෙන් හෝ අනුමානයෙන් කල්පනා කොට *ඵස්ස පඤ්චමක* ධර්මයන් භාවනා කරයි" යන මේ අර්ථය නොගත යුතුය. මක්නිසාද යත්: දක්වූ *පාලි- අට්ඨකථා- ටීකාවන්හි* සුතමය වශයෙන් අනුමාන කොට භාවනා කිරීමක් නොදක්වා ඒ වෙනුවට භාවනාමය පච්චක්ඛ ඤාණය, මගින් බැලීම දක්වන බැවිනි. තවදුරටත් **චන්දො වණ්ණ වසෙන මනුස්සානං පාකටො** - 'සඳ වර්ණය වශයෙන් මනුෂ්‍යයනට ප්‍රකට වේ' යැයි කිවහොත් හඳෙහි ඇති වර්ණයම පමණක් මනුෂ්‍යයනට ප්‍රකටවේ. එම වර්ණය පමණක් මනුෂ්‍යයනට දත හැක්කේය. ඉතිරි ගන්ධ, රස, පොට්ඨබ්බ ආදීන් අප්‍රකට වන්නේය. නමුදු සඳේ වර්ණ රූපය දැක ගතහොත් සඳ විමන සම්පූර්ණයෙන් දැක බලාගත්තා හා සමාන වන්නාසේ, **ඵස්ස වසෙන,** 'ඵස්ස වශයෙන් ප්‍රකට වේ' යයි යන පෙර දක්වූ කථාවෙහි ඵස්සය පමණක් ප්‍රකටව, ඉතිරි ධර්මයන් අප්‍රකටය, නමුදු එම ප්‍රකට ඵස්සය මෙනෙහි කොට දැන ගැනීමේදී අනෙක් අප්‍රකට ඒවාද ඇතුළත්ව, අඩංගුව යන නිසා 'ප්‍රකට ය'යි යන්න දැක්වීම අදහස් කරේ. ඉදින් ඒවා සුතමය වශයෙන් අනුමාන කොට බලන නිසා ප්‍රකට වේයැයි කියන්නේ නම් *ඵස්සය* ප්‍රකට වන්නේ යැයි විශේෂයෙන් කිවයුතු වන්නේ නැත. මක්නිසාදයත්: *ඵස්සය* ප්‍රකට නැතත් 'සුතමය ශක්තියෙන් අනුමාන කොට බැලිය හැකි යැ'යි කියන්නේ නම් එලෙස බලන කල සියල්ලම සමාන ලෙසට ප්‍රකට වන නිසාය. අනුපද සූත්‍ර විස්තරය අනුව බලා නැවත සළකා බලන්න. ප්‍රථම ධ්‍යානයෙහි ධර්ම 16ක්ම පමණක් භාවනා කොට බලන බවත්, ඉතිරි ධර්ම නොබලන බවත්, අප්‍රකට වූ *නෙවසඤ්ඤා නාසඤ්ඤායතන* ධ්‍යානයෙහි එකම ධර්මයක් වත් *අනුපද* ක්‍රමයට බැලිය නොහැකි බවත් දක්වූවා නොවන්නේද? *නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන* ධ්‍යානය බැහැර කොට දක්වන බව විසුද්ධි මග්ගයේ ද දක්වූවා නොවූයේද? එම නිසා ඉහත දක්වූ *අට්ඨකථා* මගින් "ප්‍රකට වූ *ඵස්සය* භාවනා කොට බලන විට ඉතිරි ධර්මයන්ද ඉබේම ඇතුළත් වන බව" දක්වන්නේ යයි සළකා ගතයුතු.

"ඉධ පන චක්ඛු විඤ්ඤාණසම්පයුත්තා තයො ඛන්ධා, තෙ හි චක්ඛු විඤ්ඤාණෙන සහ විඤ්ඤාතබ්බත්තා චක්ඛු විඤ්ඤාණ විඤ්ඤාතබ්බාති. වුත්තා"

මෙහි මුල් සූත්‍රය වන දුතිය අපරිජානන සූත්‍රයෙහි දක්වෙන ලෙසට *චක්ඛු විඤ්ඤාණය* හා යෙදෙන ස්කන්ධයෝ තුනකි. ඇත්තය, එම චෛතසික ස්කන්ධයන්ට *චක්ඛු විඤ්ඤාණය* හා සමග යෙදී දත යුතු දත හැකි බැවින් *චක්ඛු විඤ්ඤාණය විඤ්ඤාතබ්බ* ධර්මයන් යැයි දේශනා කරයි. පාළි පොත බලා ඉතිරිය සම්පූර්ණ කරගන්න. [සං. අ. 3/4]

ඵස්සාහාරෙ තීහි පරිඤ්ඤාහි පරිඤ්ඤාතෙ තිස්සො වේදනා පරිඤ්ඤාතාව හොන්ති. තම්මූලකත්තා තං සම්පයුත්තත්තාච = *ඵස්සාහාරය ඤාත- තීරන- පහාන* යන *පරිඤ්ඤා* තුන මගින් වෙන් වෙන් කොට විසදව දනගත්තේ නම් *වේදනා* තුනද වෙන් වෙන් වශයෙන් දන ගැනීම සම්පූර්ණ වේ. මක් නිසාද යත් එම *වේදනාවට ඵස්සයම* මූල හේතු වීම සහ එම *ඵස්සය* හා සම්ප්‍රයුක්තව පහළ වීම නිසාය. [සං. අ. 2/84]

(*නාම- රූප පරිච්ඡේද ඤාණ, පච්චය පරිග්ගහ ඤාණ* යන මේ දෙක *ඤාත පරිඤ්ඤා* නම් වේ. *සම්මසන, උදයබ්බය* යන මේ ඤාණ දෙක *තීරණ පරිඤ්ඤා* නම් වේ. ඉතිරි විපස්සනා ඤාණයන් හා මාර්ග ඤාණ පහාන පරිඤ්ඤා නම් වේ.)

විඤ්ඤාණස්මිං හි පරිඤ්ඤාතෙ තං පරිඤ්ඤාතමෙව හොති, තම්මූලකත්තා, සහුප්පන්නත්තාච = විඤ්ඤාණය වෙන් කොට විසදව දන ගත්තේ නම් එම නාම- රූපද විසදව දනගත්තා වන්නේය. මක්නිසාද යත්: එම *විඤ්ඤාණයම* ඒවාට මූල හේතුව වීම මෙන්ම ඒවා *විඤ්ඤාණය* හා සම්ප්‍රයුක්තවම පහළ වන නිසාද වන්නේය. [සං. අ. 2/84]

මෙම සංයුක්ත *අට්ඨකථාවන්හි* - සම්ප්‍රයුක්ත චෛතසික නාමයන්- *චක්ඛු විඤ්ඤාණය* සමග එකටම දත යුතු යැයිද, 'ඵස්සය දත්තේ නම්, ඵස්සය නිසා පහළවන *වේදනා, ඵස්සය* හා සම්ප්‍රයුක්ත *වේදනා* දන ගත්තා වන්නේ යැ'යි ද, '*විඤ්ඤාණය* දන්නේ නම් එය නිසා පහළ වන නාම - රූප, *විඤ්ඤාණ* හා එකට පහළ වන නාම - රූප දනගත්තා වන්නේ යැ'යිද කියන නිසා *ඵස්සපඤ්චමකයන්* පමණක්ම නොව, ප්‍රකට ඕනෑම ධර්මයක් මෙනෙහි කොට දන ගන්නේ නම් එම ධර්මය යෙදෙන සම්පූර්ණ චිත්ත විථිය තුළ යෙදෙන චිත්ත- චෛතසික සියල්ලද දන ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වේයයි සැළකිය යුතුය.

මෙපමණකුදු නොවේ. **සහුප්පන්නත්තා** යන පදය පදනම් කොට ප්‍රකට නාම - රූප ධර්මයක් මෙනෙහි කොට දන ගන්නේ නම් ඒ හා සමග

යෙදෙන රූප - නාම සියල්ලමද, දැන ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වේදැයි සැළකිය යුතුය. පහත සදහන් (ම.නි.) උපරි පණ්ණාස බහුධාතුක සූත්‍ර *පාළි, අට්ඨ කථා* මගින්ද මේ අදහස තවදුරටත් තහවුරු කර ගත යුතුවේ.

ඡයිමා ආනන්ද, ධාතුයො: පඨවිධාතු අපො ධාතු තෙජො ධාතු වායො ධාතු ආකාස ධාතු විඤ්ඤාණ ධාතු. ඉමා ඛො ආනන්ද ඡ ධාතුයො යතො ජානාති පස්සති, එත්තාවතාපි ඛො ආනන්ද ධාතු කුසලො භික්ඛු ති අලං වචනාය

ආනන්දය, *පඨවිධාතු අපොධාතු තෙජො ධාතු වායො ධාතු ආකාස ධාතු විඤ්ඤාණ ධාතු* යන මේ ධාතු හය ඇත්තේය. ආනන්දය, මේ ධාතු හය එම විපස්සනා මාර්ග ඥාණ මඟින් දැනගනී, දැක ගනී. ආනන්දය, මෙපමණක් දැන ගැනීමෙන්ද 'ධාතු කුසල භික්ෂුවක් යැ'යි කීමට නිසි වේ.
[පාළි හා පරිවර්තනය ම. නි. 3/196-197]

ජානාති පස්සතීති සහ විපස්සනාය මග්ගො වුත්තො, පඨවී ධාතු ආදයො සවිඤ්ඤාණකකායං සුඤ්ඤතො, නිස්සත්තතො දස්සෙතුං වුත්තා, තාපි පුරිමාහි අට්ඨාරසහි ධාතුහි පූරෙතබ්බා පූරෙන්තෙන විඤ්ඤාණධාතු නීහරිත්වා පූරෙතබ්බා, විඤ්ඤාණ ධාතු හෙසා චක්ඛු විඤ්ඤාණාදි වසෙන ඡබ්බිධා හොති, තත්ථ චක්ඛු විඤ්ඤාණධාතුයා පරිග්ගහිතාය තස්සා වත්ථු චක්ඛු ධාතු ආරම්මණං රූප ධාතූති ද්වෙ ධාතුයො පරිග්ගහිතාව හොන්ති, එස නයො සබ්බත්ථ, මනොවිඤ්ඤාණධාතුයා පන පරිග්ගහිතාය තස්සා පුරිම පච්ඡිම වසෙන මනොධාතු, ආරම්මණ වසෙන ධම්ම ධාතූති ද්වෙ ධාතුයො පරිග්ගහිතාව හොන්ති. ඉති-පෙ-ඉදම්පි එකස්ස භික්ඛුනො නිග්ගමනං මත්ථකං පාපෙත්වා කථිතං හොති, [ම. අ. 4/73]

සිංහලෙන්:

ජානාති පස්සති = දනී- දකීයි යන පදයන් ගෙන් විපස්සනාවද සහිත මාර්ගය අදහස් කරයි. (*සුතමය* දැනීම, *චින්තාමය* දැනීම අදහස් නොකරන අතර විපස්සනා භාවනාමය දැන- දැක ගැනීමත්, මාර්ග ඥාණයෙන් දැන- දැක ගැනීමත් අදහස් කෙරේ යැයි දැක්වේ.) *තම සවිඤ්ඤාණක* කයේ සත්ත්ව, ආත්ම භාවයෙන් යුත් සත්ත්වයෙක් නැතැයි දැක්වීමට *පඨවි ධාතු* ආදිය දේශනා කළ සේක. එම ධාතු හයද පෙර දැක්වූ ධාතු දහඅට මෙන්ම අංග සම්පූර්ණ වේ. සම්පූර්ණ කිරීමට කැමති වන්නේ නම්, *විඤ්ඤාණ ධාතුව* වනාහි *චක්ඛු විඤ්ඤාණ ධාතුව* ආදී වශයෙන් හයාකාරවෙයි. එම හය

තුළින් කෙනෙක් *චක්ඛු විඤ්ඤාණ ධාතුව* පරිග්ගහ කළේ නම් එම *විඤ්ඤාණ ධාතුව* ඇසුරු කරන *චක්ඛු ධාතුව* හා අරමුණු වන *රූප ධාතු* යන ධාතු දෙකද පරිග්‍රහ කළා වන්නේය. අනෙකුත් *ඉතිරි විඤ්ඤාණ ධාතූන්* සියල්ලෙහිමද මේ ක්‍රමයමයි. විශේෂය නම් *මනෝ විඤ්ඤාණ ධාතුව* පරිග්ගහ කළේ නම්, එම *විඤ්ඤාණ ධාතුවට* පෙර *සම්පටිච්ඡනය*, පසුව *පඤ්ච ද්වාරාවජ්ජනය* වශයෙන් *මනෝ ධාතුව හා* අරමුණ වශයෙන් *ධම්ම ධාතුව* යයි කියන ධාතු දෙක වශයෙන්ද පරිග්‍රහ කළා වන්නේය*. එම නිසා -පෙ- මේ ධාතු හය පිළිබඳ දේශනා කථාව ද එක භික්ෂුවකගේ විමුක්ති ප්‍රතිපදාව මස්තකප්‍රාප්ත කරවීමට කරන ලද දේශනාවකි.

පැහැදිලි කිරීම

ධාතූන් හයදෙනා *විපස්සනා ඤාණ- මග්ග ඤාණයන්ගෙන්* දැන-දැක ගන්නේ නම් එම භික්ෂුව ධාතූන් විෂයෙහි කුසලතා ඇති රහතන් වහන්සේ නමක් බවට පත් වී යැයි කීමට සුදුසු බව පාළියෙහි දක්වන ලදී. මෙලෙසට ධාතු හය දන්නා පුද්ගලයා *පොට්ඨබ්බ ධාතු* හා *විඤ්ඤාණ ධාතු* යන ධාතූන් පමණක් සම්පූර්ණ ලෙස දතයුතු වේ. *ධම්ම ධාතූන්* අතරින් *ආපෝ, ආකාස* යන මේ දෙක පමණක් දතයුතු වේ. ඉතිරි ධම්ම ධාතූන් මෙන්ම *චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, රූප, සද්ද, ගන්ධ, රස, ධාතූන්* සම්බන්ධව වනාහි නොදත හැක්කේය. එම නිසා ධාතූන් 18ම දන්නා නැනැත්තා කවරෙක් දැයි පැණයක් වේ. එම ප්‍රශ්ණය, සැකය දුරු කිරීමට අට්ඨ කථාහි **තාපි පුරිමාහි** ආදිය මගින් කරුණු ප්‍රකාශ කෙරේ.

අර්ථය වනාහි

විඤ්ඤාණ ධාතූන් වනාහි *චක්ඛු, සොත, ඝාන, ජිව්හා. කාය, මනෝ විඤ්ඤාණ ධාතු* යයි හයාකාරයක් වේ. ඒවා අතුරින් දකින *චක්ඛු විඤ්ඤාණ ධාතුව* දන්නේ නම් එය ඇසුරු ලබන ඇසේ ඔපය නම් වන *චක්ඛු ධාතුව* හා දකින රූප නම් වන *රූප ධාතුවද* දැනගත්තා වන්නේය. දැනගැනීමේ කෘත්‍යය එමගින් සම්පූර්ණ යයි කියවේ. අසන *සොත විඤ්ඤාණ ධාතු* දන්නේ නම් එය ඇසුරු කරන කණේ ඔපය නම් වූ *සොත ධාතුව* හා අසන *සද්ද ධාතුවද* දැන ගත්තා වන්නේය. ආඝ්‍රාණය කරන *ඝාන විඤ්ඤාණ ධාතුව* දන්නේ නම් එය ඇසුර ලබන නාසයේ ඔපය නම් වූ *ඝාන ධාතුවද*

දැන ගත්තා වන්නේය. රස දැනගන්නා *ජිව්හා විඤ්ඤාණ ධාතුව* දැන ගත්තේ නම් එය ඇසුර ලබන දිවේ ඔපය නම් වන *ජිව්හා ධාතුවද* දැන ගත්තා වන්නේය. පහස ලබන *කාය විඤ්ඤාණ ධාතුව* දත්තේ නම් එය ඇසුර ලබන කයේ ඔපය නම් වූ *කාය ධාතුව* හා පහස දෙන හැපීම නම් වූ *පොට්ඨබ්බ ධාතුවද* දැනගත්තා වන්නේය. මේ *පොට්ඨබ්බ ධාතුව* වනාහි පාළියෙහි කෙළින්ම දේශනා කළ සේක. එම නිසා හැපෙන ක්ෂණයෙහි දී ගොරෝසු, මෘදු, උණුසුම, රස්නය, සිසිල, තදවීම, තෙරපීම, සිනිඳු, සැහැල්ලු බව ආදී පහස් *පච්චක්ඛ ඤාණයෙන්* වෙන් කොට දැනගත්තා ද වන්නේය. කල්පනා කරනා දැනගන්නා *මනො විඤ්ඤාණ ධාතුව* දත්තේ නම් එයට පෙර ඇති **සම්පටිච්ඡනය* පසුව ඇති *පඤ්චද්වාරාවජ්ජනය* යන *මනො ධාතු* හා කල්පනා කොට දැනගත යුතු අරමුණ *ධම්ම ධාතුද* දැන ගත්තාම වන්නේය.

මෙසේ ඉතිරි ධාතුන්ද දැන ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ නිසා 'ධාතු හය පමණක් ප්‍රධාන කොට දැනගත්තේ නම් ධාතු 18ම දන්නා කෙනෙක් යැයි කීමට වටී යැ'යි යන්න අදහසයි.

මේ *පාළි අට්ඨ කථා* මගින් එකම *ඤාණ ධාතුවක්* දත්තේ නම් එය ඇසුර ලබන රූපය, එහි අරමුණු, රූප-නාම, එයට පෙර සිත, පසු සිත වූ නාම නම් වන මේ රූප-නාමයන්ද දැනගන්නේය. දැනගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වූයේ යැයි යන්න පැහැදිළිව දක්වේ. එම නිසා **සභූපපනනතතා** යන හේතුව ඇසුරු කරගෙන "ප්‍රකට වූ රූප-නාම එකක් මෙනෙහි කොට දැනගත්තේ නම් ඒ හා එකට යෙදෙන රූප- නාම සියල්ල දැන ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ වේ යැයි" දැක්වූ අර්ථය තහවුරු ලෙස සිතට ගතයුතුයි.

අසනවිට ආදියෙහි මෙනෙහි කරන ආකාරය

දැන් අසන විට ආදියෙහි මෙනෙහි කරන ආකාරය, ප්‍රකට වන ආකාරය හා දැන ගන්නා ආකාරය යන අනෙකුත් ආකාරයන් සංක්ෂෙපයෙන්

---

*සම්පටිච්ඡනය වනාහි සන්තීරණය වොත්ථපනය ජවන, තදාලම්බන භවංග යන මනො විඤ්ඤාණ ධාතුන්ට ඉදිරියෙන් පහළ වී පඤ්චද්වාරවජ්ජනය ඒවාට පසුව පහළ වන නිසා මෙහිලා සම්පටිච්ඡනය, මනොවිඤ්ඤාණ ධාතුවට පෙර යැයිද පඤ්චද්වාරාවජ්ජනය එම ධාතුන්ට පසුව යයිද කියනු ලැබේ. සම්මොහවිනොදනී අට්ඨකථා හා ධාතු විභංග විවරණයෙ "විඤ්ඤාණධාතුග්ගහණෙ තස්සා පුරෙචාරික පච්ඡාචාරිකත්තා මනොධාතු ගහිතාව හොති" යැයි දක්වා ඇති දේට අනුවද එම අට්ඨ කථාහිද" පඤ්චවිඤ්ඤාණධාතුයා පන පරිග්ගහිතාය තස්සා පුරිම පච්ඡිම වසෙන මනොධාතු මනොවිඤ්ඤාණ ධාතුයාච පරිග්ගහිතාය තස්සා ආරම්මණ වසෙන ධම්මධාතුති ද්වෙ ධාතුයො පරිග්ගහිතාව හොන්ති" ඇති බැවින් අර්ථය වඩා පැහැදිළිව ප්‍රකට වේ.

ලියා දක්වන්නෙමු. අසන අවස්ථාවෙහි "අසනවා - අසනවා" යයි මෙනෙහි කරන්නාට එසේ අසන අවස්ථාවන්හි ප්‍රකට වන්නාවූ ධර්ම පහ තුළින් ආයතනයක ලක්ෂණාදීන් අතරින් එකක්ම ප්‍රකටවේ. එම ධර්මයන් ඒ ප්‍රකට වන ආකාරයෙන්ම දැනගනී. මේ ප්‍රකට වීම දැන ගැනීම *ඤාත පරිඤ්ඤා* වශයෙන් තත්ත්වාකාරයෙන් ප්‍රකටව දැන ගැනීම වේ. *තීරණ - පහාණ - පරිඤ්ඤ* අවස්ථාවන්හි ඇති වීම- නැතිවීම නම් වූ *අනිච්ච ලක්ෂණාදී* වශයෙන් ද තත්ත්වාකාරය ප්‍රකටව දැනගැනීම වේ.

සොත පසාදය

සොත රූපය තත්ත්වාකාරයෙන් දනී නම් සද්දයක් ප්‍රකට තරමට කණේ ඔපය ලෙස වේවා, සොතය (කණය) යැයි කියා හෝ (ලක්ෂණය), ශබ්දය දෙසට යොමුකරවන්නේ යැයි කියා හෝ ඇසීම කරන්නේ යැයි හෝ (රසය), ඇසීමට පිහිටාධාරයක් ලෙස හෝ වේවා, මෙයින් ඇසීම සිදුවේ යයි කියා හෝ (පච්චුපට්ඨානය), "**කම්මජ භූත රූප** - කර්මය නිසා පහළ වන්නා වූ, ප්‍රකට වන්නා වූ ගොරෝසු රූප" යැයි කියන *සොත රූප*ය ඇති බැවින් කණේ පිරිසිදු ඇසීම යැයි කියා හෝ වේවා, (පදට්ඨානය) දැනගනී නම් ඒ මේ "**සොතඤ්ච පජානාති**" යන සතිපට්ඨාන පාළියට අනුව වටහා ගැනීමයි.

සද්දායතනය

සද්ද රූපය තත්ත්වාකාරයෙන් දනී නම් ඇසීම කණේ දී ප්‍රකටව සිදුවන්නේ යැයි කියා හෝ (ලක්ෂණය), ඇසීම සිදුකරයි කියා හෝ වේවා (*රසය*), ඇසීමේ ක්ෂේත්‍රය යැයි කියා හෝ වේවා ඇසීම මෙය වෙතට ළඟාවන්නේ යයි කියා හෝ (*පච්චුපට්ඨාන*) දැනගනී "**සද්දෙ ච පජානාති**" යන්න අනුවයි.

සොත විඤ්ඤාණය

ඇසීම තත්ත්වාකාරයෙන් දනී නම් කණෙන් අසයි හෝ ශබ්දය අසයි යැයිද (ලක්ෂණය), ශබ්දයන් පමණක් අරමුණු කරයි කියා හෝ හුදු ඇසීම පමණක් කරයි යැයි කියා හෝ (රස), ශබ්දය දෙසට අභිමුඛව සිටී කියා (*පච්චුපට්ඨානය*), මනසිකාරය යොදා අසන්නේ යැයි කියා හෝ කණ හා අසන ශබ්ද රූපයන් ඇති විට ඇසීම සිදුවේ කියා හෝ පෙර කළ පිං නිසා අසන්නට ලැබුනේ යැයි කියා හෝ (*පදට්ඨානය*) දැනගනී.

ආඝ්‍රානය කරන, කරන වාරයේ "දැනෙයි-දැනෙයි" යැයි මෙනෙහි කරන්නාට ඒ ඒ ආඝ්‍රානය කරන අවස්ථාවන්හී ප්‍රකටව ඇති ධර්ම පහ තුළින් එකක ලක්‍ෂණාදිය අතුරින් එකක් වශයෙන් ප්‍රකට වේ. එම ධර්මයන් ප්‍රකට වන ආකාරයෙන්ම දැන ගනී. *ඤාත පරිඤ්ඤා* වශයෙන් තත්ත්වාකාරය ප්‍රකටව දැනගැනීම නම් වේ. ඉහළ *පරිඤ්ඤා* අවස්ථාවන් හී ඇති වීම-නැති වීම *අනිච්ච ලක්‍ෂණාදිය* වශයෙන්ද තත්ත්වාකාරයෙන් ප්‍රකටව දැනගනී.

ඝාන පසාදය

ඝාන රූපය තත්ත්වාකාරයෙන් දනී නම් ගන්ධය ප්‍රකට වන්නා වූ *ඝාන ප්‍රසාදය* = ප්‍රකෘති නාසය ඇත්තේ යැයි කියා හෝ (ලක්‍ෂණය), ගන්ධය දෙසට යොමුකරවන ගඳ-සුවඳ දැනගන්නා ස්වභාවය යැයි හෝ (රසය), ආඝ්‍රාණය සඳහා පදනමයි= මෙයින් අඝ්‍රාණය සිදුවේ යැයි හෝ (*පච්චුපට්ඨාන*), කම්මජ භූත රූප යැයි කියන නාසය ඇත්තේය, පිරිසිදුව විඳගැනීමට නාසය තිබේ යැයි කියා හෝ (පදට්ඨානය) දනී, **"ඝානඤ්ච පජානාති"** යන සූත්‍ර පාළියට අනුවය.

ගන්ධායතනය

ගන්ධ රූපය ඇතිසැටියෙන් දන්නේ නම් නාසය කෙරෙහි ප්‍රකට වේයැයි කියා හෝ (ලක්‍ෂණ), ගන්ධය ගෙනදේ යැයි කියා හෝ (රස), ආඝ්‍රානයට ගොචර භූමිය වේ. ආඝ්‍රානය වනාහි මේ දෙසටම ලඟාවේ හෝ (*පච්චුපට්ඨානය*), භූත රූප කියනු ලබන පදනම් රූපයන් මත පිහිටා සිටී යැයි හෝ (*පදට්ඨානය*) දැනගනී **ගන්ධෙ ච පජානාති** යන පාළියට අනුවය.

ඝාන විඤ්ඤාණය

ආඝ්‍රානය කිරීම තත්ත්වාකාරයෙන් දනී නම් නාසයේ ගඳ දැනීම සිදුවේ හෝ ගන්ධයක් ආඝ්‍රානය කරයි යැයි කියා හෝ (ලක්‍ෂණය), ගන්ධයක් අරමුණු කරයි = ගඳ සුවඳ පමණක්ම අරමුණු කරයි යැයි (රස), ගන්ධය දෙසට මුහුණලා සිටී යයි කියා හෝ (*පච්චුපට්ඨාන*), මනසිකාරය යොමු කොට ආඝ්‍රාණය ලබයි හෝ නාසයත් ගන්ධයත් ඇති නිසා අඝ්‍රාණය කරයි. පෙරකළ පිං නිසා ආඝ්‍රාණය ලැබේ යයි කියා (*පදට්ඨානය*) දැන ගනී.

පැණි, ඇඹුල්, සැර. කහට, ලුණු, තිත්ත ආදී රසයන් විඳින ක්‍ෂණයන් රස බලන ක්‍ෂණයන් වේ. එසේ එසේ කෑම කන අවස්ථාවේ "කනවා-

කනවා" යැයි හෝ "පැණි රසය- පැණි රසයි" හෝ වේවා මෙනෙහි කරන්නාට එම කන අවස්ථාවෙහි ප්‍රකට ධර්ම පහ තුළින් එකක ලක්‍ෂණාදිය අතරින් එකක් වශයෙන් ප්‍රකට වේ. එම ධර්ම එසේ ප්‍රකට වන ආකාරයටම දැනගනී. මේ *ඤාත පරිඤ්ඤා* වශයෙන් තත්ත්වාකාරයෙන් ප්‍රකට වීමයි, දැනගැනීමයි. මෙය ඉහළ *පරිඤ්ඤා* අවස්ථාවන් හි වනාහි ඇති වීම- නැති වීම නම් වූ *අනිච්ච ලක්‍ෂණාදිය* වශයෙන් තත්ත්වාකාරයෙන් දැනගනී.

ජිව්හා පසාදය

ජිව්හා රූපය තත්ත්වාකාරයෙන් දනීනම් රසය ප්‍රධාන වන ලෙසට දිවේ ඔපය හොඳයයි කියා හෝ (ලක්‍ෂණ), රසය දෙසට අභිමුඛ කරවන, රසය මතුකරවන ලෙසට හෝ (රසය), රසය දැනීමේ පදනමයි - මෙයින් රසය මතුවේ යයි කියා හෝ *(පච්චුපට්ඨානය)*, කම්මජ භූත රූප යයි කියන *ජිව්හා රූප* ඇති විට දිවේ ඔපය ඇති වේ යයි හෝ වේවා (පදට්ඨාන) දැන ගනී **ජිව්හඤ්ච පජානාති** යන සූත්‍ර පාළියට අනුවයි.

රසායතනය

රස රූපය තත්ත්වාකාරයෙන් දනී නම් දිවෙහි පහළ වී යැයි කියා හෝ (ලක්‍ෂණය), භෝජන රසය දැනගනී යැයි හෝ පැණි රස, ඇඹුල් රස, ආදී වශයෙන් හෝ වේවා (රස), දැනීමේ ගොදුරු බිම යැයි = රසය මෙතැනින් හටගනී යයි කියා හෝ (*පච්චුපට්ඨාන*), *භූත රූප* කියන්නාවූ මුලික වූ රූපයන් මත පිහිටා සිටින්නේ යයි හෝ (*පදට්ඨාන*) දැනගනී "**රසෙ ච පජානාති**" යන සූත්‍ර පාළියට අනුවයි.

ජිව්හා විඤ්ඤාණය

ආහාර රස දැනීම තත්ත්වාකාරයෙන් දනී නම් දිව මතින් දැනගනී, රසය දැනගනී යයි හෝ රසයක් මතුවේ, පැණි රස, ඇඹුල් රස, ආදී රස වශයෙන් හෝ (ලක්‍ෂණය), රසයන් පමණක්ම අරමුණු කරයි. (රස) රසය දැනගැනීම පමණක් කරයි කියා හෝ වේවා (*පච්චුපට්ඨාන*), මනසිකාරයට අනුව රසය පහළ වේ, දිවත් රසයකුත් ඇති නිසා රසය දැනේ යයි, හොඳ කර්මයක් නිසා (මිහිරි) රසය පහළ වී යැයි, නරක කර්මයක් නිසා (කටුක) රසය ප්‍රකට වී යයි හෝ (*පදට්ඨානය*) දැන ගනී.

රස බලන විට බත් ආදිය දැකීම වනාහි දැකීම හා සම්බන්ධය. බත් ආදිය අත, තොල් දිව, උගුර ආදිය මත හැපීම දැනීම වනාහි *පොට්ඨබ්බය* හා සම්බන්ධය. බත් දැකීම, අතින් ඇනීම, මුඛය ඇරීම, වැසීම, හැපීම, දිවෙන් මත් ගැම, ගිලීම ආදිය වනාහි සිතීම්- හැපීම් හා සම්බන්ධය, එම නිසා එම ක්‍රියා කාරකම් මතුවන අවස්ථාවන්හි දක්වූ ආකාරයට මෙනෙහි කොට නියම ස්වභාව දත හැක්කේය. තවදුරටත් ශබ්ද රසය විඳීම, රස බැලීම කරන අවස්ථාවන්හි *ඵස්ස- වේදනා* ලක්‍ෂණාදිය ඒ ඒ වශයෙන් නියමාකාරයෙන් දැන ගන්නා ආකාරයත් වනාහි දකින අවස්ථාවේදී දක්වන ලද නය ක්‍රමයෙන් ප්‍රකට වේ. එම නිසා වෙන වෙනම ලියා නොදක්වනු ලැබේ.

හැපීම (=පහස) මෙනෙහි කරන ආකාරය

හැපීම වනාහි සියලු ශරීරය, ඇතුළත- පිටත පුරා පැතිර පවතී. පා වශයෙන් අත් වශයෙන්, අත හා පය වශයෙන්, පය, අත, කෙස් හා කය දිව හා දත්, උඩු තල්ල, සෙම, කෙළ, ආහාර, ජලය හා උගුර, තල්ල නොදිර වූ ආහාර, දිර වූ ආහාර කුච්ඡිස වාතය, ලේ, වාතය, මස්, නහර ඇට එකින් එක යනාදී ලෙසට අජ්ඣත්ත කය තුළ *පොට්ඨබ්බාරම්මණ* හා ගැටෙමින් පවතී. සිවුරු, කමිස, සරම්, රෙදි, කොට්ට, ඇඳ, කම්බා, පිසින රෙදි, පැදුර, බිම, මහ පොළොව, කුළුනු, බිත්ති, සෙරෙප්පු, කුඩය, සැරයටිය, කටු, ගල්-මුල්, හිරුඑළිය, වාතය, ආපො ධාතුව කළය යනාදි බාහිර විවිධ හැපීම් මාර්ගයෙන්ද ගැටීම් සිදුවේ. සම විදින්නන්, ඩැහැ ලේ බොන්නන් ආදී බාහිර හැපීම් සමගද ගැටෙමින් පවතී. මෙම හැපීම් ප්‍රකට නම්. හැපෙන හැපෙන වාරයේ 'හැපේ - හැපේ' යැයි මෙනෙහි කළ යුතුය.

යම් අරමුණක් දුක්ඛ වේදනා- සුඛ වේදනා යන ලෙසට ප්‍රකට කෙරේ නම් ඒ ඒ අරමුණ ඒ ඒ වේදනාවන්ට අනුව මෙනෙහි කළ යුතුය. විශේෂයෙන් මෙනෙහි කළ යුතු ආකාරය උණුසුම් නම්, "උණුසුම-උණුසුම" යයි, මෙනෙහි කරන්න. සිසිල් නම් "සිසිල- සිසිල" යැයි මෙනෙහි කරන්න. මද රස්නයක් "මඳ රස්නය- මඳ රස්නය" යැයි මෙනෙහි කරන්න. මඳ සිසිල නම් "මඳ සිසිල" යැයි මෙනෙහි කරන්න. වෙහෙස නම් "වෙහෙසයි- වෙහෙසයි" යැයි මෙනෙහි කරන්න. රිදීමක් නම් "රිදෙනව- රිදෙනව" යැයි මෙනෙහි කරන්න. හිරිවැටී ඇත්නම් "හිරිවැටීම- හිරිවැටීම" යැයි

මෙනෙහි කරන්න. කැක්කුමක් නම් 'කැක්කුම- කැක්කුම' යැයි මෙනෙහි කරන්න. කසන්නේ නම් "කැසීමක්- කැසීමක්" යැයි මෙනෙහි කරන්න. ඇඟ රිදීමක් නම් "ඇඟ රිදීමක්- ඇඟ රිදීමක්" යැයි මෙනෙහි කරන්න. මත් ගතියක් දැනේ නම් "මතයක්- මතයක්" යයි මෙනෙහි කරන්න. පහස සැප පහසු නම් "සැපයි- සැපයි" යයි මෙනෙහි කරන්න.

මෙලෙස වූ දිනපතා කටයුතු සාමාන්‍ය (සිංහල) ව්‍යවහාර ප්‍රඥප්තීන් අනුව මතුවන අවස්ථාවේ අරමුණු ස්වභාවය, විඳීම් ස්වභාවයත් ප්‍රකට වනු පිණිස වෙන් වෙන් කොට මෙනෙහි කරන්න.

මේ ක්‍රමයට හැපීම ඇති අවස්ථාවෙහි 'හැපීම' මෙනෙහි කරන්න. එලෙස හැපීම ඇතිවිට ප්‍රකට ධර්මයන් පහ තුළින් එකක ලක්‍ෂණාදිය අතරින් එකක් ස්වභාවික වශයෙන්ම ප්‍රකට වනු ඇත. එම ධර්මයන් එලෙස ප්‍රකට ආකාරයෙන්ම දැනගනී. මේ හැපීම දැනගැනීම *ඤාත පරිඤ්ඤා* වශයෙන් තත්ත්වාකාරයෙන් ප්‍රකට වීමයි. *තීරණ- පහාන පරිඤ්ඤා* අවස්ථාවන්හි ඇතිවීම - නැතිවීම නම් වන *අනිච්ච ලක්‍ෂණ* ආදී වශයෙන් තත්ත්වාකාරය දැනගැනීම සිදුවේ.

කාය පසාදය

කාය පසාදය නියම ආකාරයට දැන ගත්තේ නම්, *පොට්ඨබ්බ ආරම්මණ* ප්‍රකට වනු පිණිස කාය සංවේදීතාව, කයෙහි පැහැදිළි බව හොඳ යැයි කියා හෝ (ලක්‍ෂණ) *පොට්ඨබ්බාරම්මණයට* යොමු කරවයි, හැපීම ලබයි කියා හෝ (රස), හැපීම දැනගැනීමේ ආයතනයයි. මෙය මුල්කරගෙන පහස ලැබේ කියා හෝ (*පච්චුපට්ඨානය*) *කම්මජ භූත රූප* යැයි කියන පාදක කාය රූප වශයෙන් කාය ප්‍රසාදය හෝ වේවා (*පදට්ඨානය*) දනී. **කායඤ්ච පජානාති** යන පාළිය හා බැඳේ.

සාමඤ්ඤ පොට්ඨබ්බායතනය

සාමාන්‍ය ගැටීමක් තත්ත්වාකාරයෙන් දනී නම්, ශරීරයේ ප්‍රකටව පහළවේ යැයි කියා හෝ (ලක්ඛණ), හැපීම ලැබුනේ යැයි කියා හෝ (රස), හැපීමේ ගොචර භූමියයි, හැපීම මෙතැනටම එල්ල වේ යැයි කියා (*පච්චුපට්ඨානය*) හෝ දැන ගනී.

විශේෂ පොට්ඨබ්බායතනය

හොඳින් ප්‍රකට පඨවි ධාතුව තත්ස්වාකාරයෙන් දනී නම් තද, ගොරෝසු, මෘදු බව, සුමුදු බව යැයි හෝ (ලක්ෂණය), එකට පහළ වන රූප වලට මේ පදනම යැයි හෝ - මෙහිලා ඒවා ප්‍රකට වන්නේ යැයි කියා හෝ (රස), එකට පහළ වන රූපයන් දරයි, පවත්වයි, පමුණුවයි කියා හෝ (*පච්චුපට්ඨානය*). ඉතිරි රූප ධාතූන් තුන පදනම් වී තද - ගොරෝසු. මෘදු ආදී ගති ඇති වේ. බන්ධනයවී තද ගතිය වේ. සිසිල් වී තද ගතිය පහළ වේ. වායො ධාතුවේ තෙරපීම අධික වී තද ගතිය පහළ වේ. දියාරු වී මෘදු වේ. උණු වී මෘදු වේ යැයි හෝ සිරිල බව නිසා මෘදු බව වේ කියා සත් ආකාරයකින් (*පදට්ඨානය*) දනී. මේ *පදට්ඨානය* දැන ගන්නා ආකාරයන් තුළ, ප්‍රථම දැන ගන්නා ක්‍රමය වනාහි සාමාන්‍ය දැනගැනීමයි දෙවනි තුන තද පඨවිය ඉතිරි ධාතු තුන මගින් වෙන් කොට වෙනම දැන ගැනීමයි. තුන්වන තුන මෘදු පඨවිය දැන ගැනීමයි.

එයට අමතරව බර ගතිය- සැහැල්ලු ගතිය දැන ගැනීමද, පඨවි ධාතුව දැන ගැනීමයි. *පිය පොට්ඨබ්බාරම්මණය*, *අප්පිය පොට්ඨබ්බ ආරම්මණයි* දැන ගැනීම වනාහි *පඨවි, තෙජො වායො* යන තුනම හා සම්බන්ධය, එම නිසා අට්ඨ සාලිනී අට්ඨකථා (286) හි

එත්ථ ච කක්ඛලං මුදුකං සණ්හං ඵරුසං ගරුකං ලහුකන්ති පදෙහි පඨවිධාතු එව භාජිතා, සුඛ සම්ඵස්සං දුක්ඛ සම්ඵස්සන්ති පද ද්වයෙන පන තීණි මහා භූතානි භාජිතානි යයි ප්‍රකාශ කෙරේ.

එත්ථච	=	පොට්ඨබ්බායතන විස්තර කරන මේ පදයන් හිඳ
කක්ඛලං	=	ගොරෝසු
සණ්හං	=	සිනිඳු
මුදුකං	=	මෘදු
ඵරුසං	=	ඵරුෂ
ගරුකං	=	බර
ලහුකං	=	සැහැල්ලු
ඉති පදෙහි	=	මේ පදයන් මගින්

පඨවි ධාතු එව	-	පඨවි ධාතුවම
භාජිතා	-	බුදුරජාණන් වහන්සේ බෙදා දක්වූ සේක.
සුඛ සමඵසසං	-	සුඛ පහස
දුකඛ සමඵසසං	-	දුක් පහස
ඉති පද ද්වයෙන පන	-	මේ පද දෙකින් වනාහි
තීණි මහා භූතානි	-	තුනක් වූ පොට්ඨබ්බ මහා භූත
භාජිතානි	-	බෙදා දක්වූ සේක.

විශේෂයෙන් ප්‍රකට වූ තෙජො ධාතුව තත්ත්වාකාරයෙන් දනී නම්, රස්නය, මඳ රස්නය, සිසිල යැයි හෝ වේවා (ලක්‍ෂණ), පැසවන ලක්‍ෂණය යැයි හෝ (රස), මෘදු කරවයි කියා හෝ වේවා *(පච්චුපට්ඨානය)*, ඉතිරි ධාතු තුන හෙවත් පාදක රූපයන් අනුව මෙම උණුසුම, මඳ උණුසුම හා සිසිලස, ගොරොසු තද උණුසුම, මඳ උණුසුම- සිසිලස වේ. ආබන්ධිත උණුසුම, මඳ උණුසුම හා සිසිලස වේ. වායො ධාතු නිසා තෙරපන තද උණුසුම, මඳ උණුසුම- සිසිලස ආදිය වන්නේ යැයි කියා හෝ *(පදට්ඨානය)* දනී.

විශේෂයෙන් ප්‍රකට වායො ධාතුව තත්ත්වාකාරයෙන් දනී නම්, දරන, තෙරපන ගති, පාවෙන ගති, සැහැල්ලු ගති හෝ වේවා (ලක්‍ෂණ), සලන - චලන ගති වේවා (රස), ගෙන යෑම, පාවීම, තල්ලු කිරීම, *(පච්චුපට්ඨාන)*, ඉතිරි ධාතු තුන යන පාදක රූප අනුව දැරීම- තෙරපීම, තදගති ඇතිව දරන- තෙරපන ගතිය, ආබන්ධනය වී දරන- තෙරපන ගතිය වීම, උණුසුම් වී දරණ- තෙරපන ගතිය වීමයැයි හෝ වේවා *(පදට්ඨානය)* දනී. **පොට්ඨබ්බව පජානාති** යන *සතිපට්ඨාන පාළියට* අනුවයි. උදරයේ ඇති පිම්බීම - හැකිලීම පිළිබඳ වැටහීමත් මේ පාළියෙහිම ලා විස්තර කෙරේ.

කාය විඤ්ඤාණය

හැපීම- දැනීම තත්ත්වාකාරයෙන් දන්නේ නම් ශරීරයේ සංවේදී බව නිසා මේ හැපීම- දැනීම දැනගත්තේ යැයි කියා හෝ (ලක්‍ෂණ), හැපීම පමණක් අරමුණු කරයි. හුදු හැපීම පමණක්ම වේ යයි (රස), හැපීම-පහස දෙසට නැවෙන ගතිය හෝ වේවා *(පච්චුපට්ඨාන)*, මනසිකාරය යෙදීමෙන් හැපීම දැන ගනී. කය හා හැපෙන වස්තුවක් ඇත්තේ නම් එහි හැපීම දැන

ගනී. පෙර කළ කම් හොඳ නිසා සුව පහස ලැබී යැයි, පෙරකළ නපුරු කම් නිසා කටුක පහස ලැබී යයි හෝ වේවා *(පදට්ඨානය)* දනී. *කාය සම්ඵස්සයෙහි* දැන ගැනීම *චක්ඛු සම්ඵස්සය* සම්බන්ධව දැක්වූ ක්‍රමයටම වටහා ගනිත්වා.

කායික දුක්ඛ

කායික දුක්ඛ වේදනා තත්ත්වාකාරයෙන් දනී නම් *අනිට්ඨ පොට්ඨබ්බාරම්මණයක්* විඳී යයි කියා හෝ වේවා (**අනිට්ඨපොට්ඨබ්බානුභවන ලක්ඛණං දුක්ඛං**) සම්ප්‍රයුක්ත චිත්ත- චෛතසික යයි කියනු ලබන දැන ගන්නා රූප- නාමයන් මැලවී යෑම, දුබලවීම කියා හෝ වේවා (**සම්පයුත්තානං මිලාපන රසං**) ශරීර වේදනාව දැරීමට අපහසුය, දැරීමට නොහැකි යැයි කියා හෝ (**කායිකාබාධ පච්චුපට්ඨානං**) කයේ ප්‍රසාද බව ඇති නිසා වේදනාව වේ. සංවේදීතාව නිසා වේදනාව වේ. *අනිට්ඨ පොට්ඨබ්බාරම්මණයන්* හමුවී වේදනාව ඇති වී යැයි කියා හෝ (**කායින්ද්‍රිය පදට්ඨානං, ඵස්ස පදට්ඨානා වේදනා**) දැන ගනී.

කායික සුඛ

කයේ සුව වේදනා තත්ත්වාකාරයෙන් දනී නම්, *ඉට්ඨ පොට්ඨබ්බ ආරම්මණයන්* විඳී යැයි කියා හෝ (ලක්ෂණ), දැන ගන්නා නාම ධර්මයන් වඩන්නේය. උද්‍යෝගිමත්- උනන්දු කරවන්නේ යැයි කියා හෝ (රස), කයෙහි සුඛය වේ යයි, විඳීම හොඳ යැයි කියා හෝ *(පච්චුපට්ඨාන)*, කාය ප්‍රසාදය හොඳය, කාය සංවේදී බව හොඳය, එම නිසා මනාප *පොට්ඨබ්බාරම්මණයක්* හමුළනා හොඳ යයි *(පදට්ඨාන)* දනී.

ආනාපානය මෙනෙහි කරන ආකාරය

සතොව අස්සසති-සතොව පස්සසති= 'සිහියෙන් යුක්තව ආශ්වාස කරයි - සිහියෙන් යුක්තවම ප්‍රශ්වාස කරයි' යනාදි පාළියට අනුව ආශ්වාස - ප්‍රශ්වාසයන් ඇතුළ්වන - පිටවන වාරයක් පාසා "ඇතුල්වේ - පිටවේ" යයි මෙනෙහි කොට හැපීම ගෙනෙන *වායො පොට්ඨබ්බය*, හා *කාය විඤ්ඤාණයාගේ* දැන ගැනීම මේ හැපීම සිදුවන ක්ෂණය හා සම්බන්ධය. ආශ්වාස- ප්‍රශ්වාස මෙනෙහි කරමින් විපස්සනා භාවනා කළ හැකි බව

පරිච්ඡේද අංක 03 හි විස්තර කරන්නට යෙදූනි. ආශ්වාසය- ප්‍රශ්වාසය මෙනෙහි කරමින් සිටින විට නාසය ඇතුළේ සම ආදියෙහි තෙරෙපෙන- වැදෙන ආකාරයම හැපීම වේ යයි දැන ගැනීම *වායො පොට්ඨබ්බ* රූපයෙහි (විත්ථම්භන ලක්ෂණය) තත්ත්වාකාරයෙන් දැනගැනීම නම් වේ. ටිකෙන් ටික තල්ලු කිරීම, චලනය කිරීම, යෑම්- ඊම් ඒ අවස්ථාවේම තත්ත්වාකාරයෙන් දැනගැනීම වනාහි සමුදීරණ රසය දැන ගැනීම නම් වේ. ඉදිරියට යැවීම, එළවීම ස්වභාවය දැනගැනීම **අභිනිහාර පච්චුපට්ඨාන** තත්ත්වාකාරයෙන් දැන ගැනීමයි.

කයක් ඇත්තේ, නාසයක් ඇත්තේ, හුස්ම ගැනීමේ කැමති සිතද ඇත්තේ, හුස්ම ඇතුළ් කිරීම- පිටකිරීම වශයෙන් චලනය වීම, ටික ටික දිගින් දිගට සිදු වෙමින් පැවතීම **සමුදය- වය ධම්මානු පස්සී වා කායස්මිං විහරති** යන පාළියට අනුව තත්ත්වාකාරයෙන් දැන ගැනීම නම් වේ. එක තැනකින් තව තැනකට නොයා, කොටසින් කොටස ගෙවී- සිඳී යාම විනාශවී යාම යයිද, කය, නාසය ඇත්තේ නමුත් හුස්ම ගැනීමේ කැමති සිත නොමැත්තේ නම් ආශ්වාසය- ප්‍රශ්වාසය සිදු විය නොහැකි බව දැනගැනීම **වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති** යන පාළියට අනුව තත්ත්වාකාරයෙන් දැන ගැනීම වේ. ආශ්වාස- ප්‍රශ්වාස මෙනෙහි කරන කරන වාරයේ පුද්ගලයෙක්, ස්ත්‍රියක්, පුරුෂයෙක්, මම, මගේ දේ යැයි ප්‍රකට නොවී අත් විඳිනා චලන සමූහයන්ම පමණක් ඇත්තේ යයි ප්‍රකට වීම, දැන ගැනීම **අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති** =යැයි දක්වන ආකාරයට, වටහා ගැනීමේ වෙනත් ආකාරයක් වශයෙන් වනාහි 'රූප මිටි පමණක්ම ඇත්තාහු යැයි එළඹ සිටි සතිය එම මෙනෙහි කරන්නාගේ ඥාණ අභිමුඛයෙහි ප්‍රකට වේ' යන වැටහීමයි.

ආශ්වාස - ප්‍රශ්වාසයෙහි වැඩි වීම- අඩුවීම නිසා උදරය, ආදී වූ කයෙහි පිම්බීම- හැකිලීම සිදුවේ. එවැනි ඇතිවීමක් පාසා පිම්බීම- හැකිලීම යයි හෝ වේවා, තෙරපීම- සැහැල්ලු වීම යැයි හෝ වේවා මෙනෙහි කොට තෙරපීම- සැහැල්ලු වීම, චලන- තදවීම ආදිය දනී. ඒ තුළ තෙරපීම, සැහැල්ලු වීම, දැන ගැනීම *වායො පොට්ඨබ්බ රූපයේ* **විත්ථම්භන ලක්ෂණ** තත්ත්වාකාරයෙන් දැන ගැනීම නම් වේ. චලන- තදවීම ආදිය දැන ගැනීම **සමුදීරණ රසා අභිනිහාර පච්චුපට්ඨානාදිය** තත්ත්වාකාරයෙන් දැන ගැනීමයි. පිම්බීම- හැකිලීම එක පියවරකින් තව පියවරකට නොයා ඇතිවී- නැතිවීම

- ගෙවෙමින් පවතින බව දැනගැනීම වායෝ කයෙහි **සමුදය- වය** = ඇතිවීම - නැතිවීම තත්ත්වාකාරයෙන් දැන ගැනීමයි. මේ දැන ගැනීම **යථා යථාවා පනසස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති** = වෙනත් ආකාරයකට වනාහි එම මෙනෙහි කරන්නා 'රූප සමූහ හෙවත් කය ඒ ඒ හැසිරීම් වශයෙන් දැන ගනිමින් සිටි, ඒ ඒ හැසිරීම් වශයෙන් මෙම රූප සමූහ හෙවත් කය දැනගනී' යන මේ පාළිය හා සමානය. *

සැළකිය යුත්තක්

උදරයේ පිම්බීම - හැකිලීම යැයි කියන තදවීම් තෙරපීම්, චලන ආදිය ප්‍රධාන වශයෙන් වායො ධාතු නිසා සිදුවන හෙයින් රූපකඛන්ධා පොට්ඨබ්බායතන පොට්ඨබ්බ ධාතු - දුකඛ සත්‍ය යන මේවායේ ඇතුළත්වේ. එම නිසා එය මෙනෙහි කොට තත්ත්වාකාරයෙන් දැන ගැනීම ඛන්ධ දේශනා, ආයතන - ධාතු - සත්‍යය දේශනා හා අනුව යයි. එම නිසා බුදු පියාණන් වහන්සේගේ අදහස පරිදි විපස්සනා භාවනා කළ යුතු ධර්ම, විපස්සනාවට ගැළපෙන සුද්ධ ධර්ම වන බව ප්‍රකටය. **යථා යථාවා පනසස** ආදි කොට ඇති ඉහත සඳහන් ඉරියා පථ දේශනාවෙහි **යථා තථා, යථා තථා** යන විච්ඡා පද මගින් කයේ හැසිරීම් ඇතිතාක් සියල්ලම ඇතුළත් කෙරෙන බව ප්‍රකටය. එලෙස සළකා බැලීමේ දී ඉවත් කළ යුත්තක් නැති නිසා, බුදු පියාණන් වහන්සේගේ අදහසට අනුව භාවනා කළ යුතු ධම්ම වන නිසා භාවනා කොට විපස්සනා සම්මා දිට්ඨි පහළ වීම, විජ්ජා ඤාණ පහළ වීම, අවිජ්ජාදී කෙළෙස් දුරුකළ හැකි වීම, දුක් කෙළවර අරහත්ත ඵල නිවනට ලඟාවීම, ආදී ආනිශංස බොහෝමයක්ම ඇත්තේය. එමනිසා ඉහත දැක්වූ පාළියෙහි

---

*සැළකිය යුත්තක්

උදරයේ පිම්බීම - හැකිලීම යැයි කියන තදවීම් තෙරපීම්, චලන ආදිය ප්‍රධාන වශයෙන් වායො ධාතු නිසා සිදුවන හෙයින් රූපකඛන්ධා පොට්ඨබ්බායතන පොට්ඨබ්බ ධාතු - දුකඛ සත්‍ය යන මේවායේ ඇතුළත්වේ. එම නිසා එය මෙනෙහි කොට තත්ත්වාකාරයෙන් දැන ගැනීම ඛන්ධ දේශනා, ආයතන - ධාතු - සත්‍යය දේශනා හා අනුව යයි. එම නිසා බුදු පියාණන් වහන්සේගේ අදහස පරිදි විපස්සනා භාවනා කළ යුතු ධර්ම, විපස්සනාවට ගැළපෙන සුද්ධ ධර්ම වන බව ප්‍රකටය. යථා යථාවා පනසස ආදි කොට ඇති ඉහත සඳහන් ඉරියා පථ දේශනාවෙහි යථා තථා, යථා තථා යන විච්ඡා පද මගින් කයේ හැසිරීම් ඇතිතාක් සියල්ලම ඇතුළත් කෙරෙන බව ප්‍රකටය. එලෙස සළකා බැලීමේ දී ඉවත් කළ යුත්තක් නැති නිසා, බුදු පියාණන් වහන්සේගේ අදහසට අනුව භාවනා කළ යුතු ධම්ම වන නිසා භාවනා කොට විපස්සනා සම්මා දිට්ඨි පහළ වීම, විජ්ජා ඤාණ පහළ වීම, අවිජ්ජාදී කෙළෙස් දුරුකළ හැකි වීම, දුක් කෙළවර අරහත්ත ඵල නිවනට ලඟාවීම, ආදී ආනිශංස බොහෝමයක්ම ඇත්තේය. එමනිසා ඉහත දැක්වූ පාළියෙහි ඇතුළත් කොට දැක්වූ ආනාපානය මෙනෙහි කරන ආකාරය හා සමීප කොට දක්වීම වනාහි "පිම්බීම - හැකිලීම, ආශ්වාස - ප්‍රශ්වාසයෙහි සමීප ඵලයක් වශයෙන් ගැළපී යන බැවින්ම කළ දක්වීමකි. ආනාපාන භාවනා ක්‍රමයෙහි ඇතුළත් වේ" යැයි හැඟීමක් දීමේ අදහසින් දක්වූවා නොවේ. ඇත්ත වශයෙන්ම වනාහි "යථා යථා වා පන" මුල් කර ගත් දේශනාව ඉරියා පථ කොටස සම්බන්ධ දේශනාවක් මත බැවින් ද පිම්බීම - හැකිලීම රූපස්කන්ධය ආදියෙහි ඇතුළත් වන නිසාද, ඉරියාපථකායානුපස්සනා ධාතු මනසිකාරානුපස්සනා, ඛන්ධ ධම්මානුපස්සනා, ආයතනානු පස්සනා, අරිය සච්ච ධම්මානුපස්සනා ආදියෙහි පමණක් ඇතුළත් වේ. අදාල සාධක. පාළි දක්වීම් සඳහා මේ ග්‍රන්ථයේ පස් වැනි පරිච්ඡේදයෙහි මුල්ම පාද සටහන් බලනු මැනවි.

ඇතුළත් කොට දක්වූ ආනාපානය මෙනෙහි කරන ආකාරය හා සමීප කොට දක්වීම වනාහි "පිම්බීම - හැකිලීම, ආශ්වාස - ප්‍රශ්වාසයෙහි සමීප ඵලයක් වශයෙන් ගැළපී යන බැවින්ම කළ දක්වීමකි. ආනාපාන භාවනා ක්‍රමයෙහි ඇතුළත් වේ" යැයි හැඟීමක් දීමේ අදහසින් දක්වූවා නොවේ. ඇත්ත වශයෙන්ම වනාහි "**යථා යථා වා පන**" මුල් කර ගත් දේශනාව ඉරියා පථ කොටස සම්බන්ධ දේශනාවක් මත බැවින් ද පිම්බීම - හැකිලීම රූපස්කන්ධය ආදියෙහි ඇතුළත් වන නිසාද, ඉරියාපථ කායානුපස්සනා ධාතු මනසිකාරානුපස්සනා, ඛන්ධ ධම්මානුපස්සනා, ආයතනානු පස්සනා, අරිය සච්ච ධම්මානුපස්සනා ආදියෙහි පමණක් ඇතුළත් වේ. අදාල සාධක. පාළි දක්වීම් සඳහා මේ ග්‍රන්ථයේ පස් වැනි පරිච්ඡේදයෙහි මුල්ම පාද සටහන් බලනු මැනවි.

සතර මහා ධාතූන් මෙනෙහි කරන ආකාරය

පර්‍යංකයේ දී හෝ වේවා සිටගෙන සිටින, යන, හොවින, අවස්ථාවේදී හෝ වේවා කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර ඇට. ආදි දෙසාලිස් කොට්ඨාශ (පඨවි 20, ආපෝ 12, තෙජෝ 04, වායෝ 6 මේ කොටස් 42ට දෙසාලිස් කොට්ඨාශයන් යයි කියනු ලැබේ.) අතරින් වැගිරෙන බව, ගලන බව යැයි දැන ගැනීම ආපෝ ධාතුව **පග්ඝරණ ලක්ඛණා** වශයෙන් තත්ත්වාකාරයෙන්ම දැන ගැනීමයි. දහඩිය, සොටු, කඳුලු ගලන අවස්ථාවෙහි කෙල, සෙම ආදිය පිටකරන, ගිලින, අවස්ථාවෙහිදී, මූත්‍රා කරන අවස්ථාවෙහි ආදියෙහි මේ දැන ගැනීම් බොහෝ සේ පහළ විය හැක්කේය, වැඩෙන- පිපෙන අවස්ථාවේ, බොහෝ ඉස්ම පිරුණු ගතිය, දැනගැනීම එම ආපෝ ධාතුව **බ්‍රෑහන රස** වශයෙන් තත්ත්වාකාරයෙන් දැන ගැනීමයි. මේ දැනගැනීම දියනාන අවස්ථාවේ, දිය බොන අවස්ථාවේ වැනි අවස්ථාවල පහළ විය හැක්කේය. බන්ධන ස්වරූපය, කැටි ගැසෙන බව පිඬුකරන බව දැන ගැනීම එම ආපෝ ධාතුව **සංගහ පච්චුපට්ඨාන** වශයෙන් තත්ත්වාකාරයෙන් දැන ගැනීම නම් වේ. සමහර විටෙක මේ පච්චුපට්ඨානයම **ආබන්ධන ලක්ඛණයයි** අට්ඨකථාහි දක්වයි. දහඩියෙන් තෙත්වූ මුණ ආදිය සළකා බැලීමේදී ගලන, ඇලෙන, සුළු බව දැන ගැනීම, මෘදු ආපෝ ධාතුවෙහි **පග්ඝරණ ලක්ඛණය** දැන ගැනීමයි. මෙම ආපෝ ධාතුව වනාහි පහස ලැබිය හැකි ගොරෝසු ***ඵොට්ඨබ්බ රූපයක්*** නොවේ. නමුදු එම ධාතුවේ ක්‍රියාශක්තීන් අනුව විශේෂයෙන් පෙනී සිටින පඨවි, තේජෝ, වායෝ, ධාතූන්ගේ හැපීමක්

වන අතර එම ආපෝ රූපයේ යථා ස්වභාවය, තත්ත්වාකාරය *මනෝ විඤ්ඤාණයන්* දැන ගත හැක්කේය.

මෙලෙස දැක්වූ නය ක්‍රමයට හැපීම මෙනෙහි කරන කරන වාරයේ ධාතූන් හතරම ඤාණයෙන් ඇස් පනා පිට දැන ගන්නා පුද්ගලයා "තද රළු- ගොරෝසු- මෘදු- සිනිඳු බවේ සමූහ පමණක් ඇත්තාහ. උණුසුම්- සිසිල් බවේ සමූහයෝ පමණක් ඇත්තාහ. තදවීම- තෙරපීම, ආදී සමූහයෝ පමණක් ඇත්තාහ. ගලන බව, දියවී වැගිරී යන බව, තෙත බර බව, බැඳීම, පිඩුකිරීම, බන්ධන කරන බව, අලවන බව ආදී සමූහයන් පමණක් ඇත්තාහ. පුද්ගලයා, සත්ත්වයා, ස්ත්‍රී, පුරුෂයා, මම, මගේ යන මේවා නොමැත්තේය"යි වෙන් වෙන්ව පවතින බව දැනගනී. මෙලෙස දැන ගැනීම **"ඉමමෙව කායං යථා ඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති අත්ථි ඉමස්මිං කායෙ, පඨවිධාතු තෙජො ධාතු, වායො ධාතූති** යන මේ පාළියට අනුව දැනගැනීමයි. උදරයේ පිම්බීම- හැකිලීම දැන ගැනීම මේ පාළි අර්ථයෙහි ඇතුළත්වේ. යෑම නැවීම ආදී වශයෙන් මෙනෙහි කිරීමද මෙම ස්පර්ශය ලබන ක්ෂණය හා සම්බන්ධය, නමුත් යෑමට කැමැත්ත, නැවීමට කැමැත්ත ආදිය මෙනෙහි කිරීමද, සපර්ශය ලබන ක්ෂණය හා සම්බන්ධය, එම නිසා ඉරියාපථ කොටසෙහිද සමපජඤ්ඤ කොටසෙහිද මෙනෙහි කරන ආකාරයන් ස්පර්ශ ලබන අවස්ථාව සම්බන්ධ විස්තර කරන විට දක්වන්නෙමු.

සිතීම මෙනෙහි කරන ආකාරය

සිතීම, කල්පනා කිරීම, අදහස් මාළිගා තැනීම, කල්පිත සළකා බැලීම, මනසිකාරය යෙදීම, යනාදී වූ නම් වලින් දක්වන මනෝ ද්වාර වීථි සිත් සියල්ල සළකා *සිතන සිත* යැයි කලින් දක්වන ලදී. එම සිත් පහළ වන පහළ වන වාරයේ "සිතයි - කල්පනා කරයි - සැලසුම් කරයි - සළකා බලයි - මෙනෙහි කරයි - භාවනා කරයි - මනසිකාරය පවත්වයි - දැන ගනී" යන ලෙසට භාවනා කරන්න. එම ඒ ඒ සිතීම දැන ගන්නා අවස්ථාවෙහි ප්‍රකටව ඇති *මනොද්වාරය, ධම්මාරම්මණය, මනෝ විඤ්ඤාණය, ඵස්ස, වේදනාදී* ධර්මයන් අතරින් එක ධර්මයක ලක්ෂණ ආදී අතරින් එකක් වශයෙන් ප්‍රකට වේ. මෙම ප්‍රකට ධර්ම ඉදිරිපත් වන අවස්ථාවේ දැන ගනී. එලෙස ප්‍රකට වීම වැටහීම *ඤාත පරිඤ්ඤා* අවස්ථාවේ ස්වභාවය වේ. *තීරණ, පහාණ පරිඤ්ඤා* අවස්ථාවන්හි ඇති වීම - නැති වීම යන අනිත්‍ය ලක්ෂණ ආදින් වශයෙන් තත්ත්වාකාරයෙන් ප්‍රකට වීම, දැන ගැනීම සිදුවේ.

ආවජ්ජනං භවංගතො ආමොචෙත්වා මනොති සහාවජ්ජනෙන භවංගං, ධම්මාති ආරම්මණං, මනො විඤ්ඤාණන්ති, ජවන විඤ්ඤාණං [සං: අ:3/4 ආදිය]

කම්මජං ආයතනද්වාරවසෙන පාකටං හොති - පෙ- මනොද්වාර හදය වත්ථු කාය භාව දසක වසෙන චෙව උතුසමුට්ඨානාදි වසෙන ච චතුපඤ්ඤාස මෙව
[වි. ම. 468]

මනොද්වාරං නාම සාවජ්ජනං භවංගං තස්ස නිස්සයභාවතො හදය වත්ථුං සන්ධාය නිස්සිතවොහාරෙන මනොද්වාරෙති වුත්තං යත්ථ මනො ද්වාරුප්පත්ති
[මහා ටී. (බු.) 2/410]

මේ *අට්ඨකථා ටීකාවන්හි* අනුව අරමුණකින් පටන්ගෙන සළකා බලන *මනොද්වාරාවජ්ජන* සිත හා සමග පූර්වභවංග සිත්ද *මනොද්වාරය* නම්වේ. *හදය වත්ථු* යැයි කියන හෘදය රූපයද එම ආවජ්ජන භවාංගයන්ට නිශ්‍රය වන්නක් වන නිසා *ඨානූපචාර* වශයෙන් *මනොද්වාර* නම් වේ.

ප්‍රසාද රූප පහ "*ආපො ධාතු - ඉත්ථි භාව* = ස්ත්‍රී භාවය සඳහා බීජ රූපය, *පුං භාවය* = පුරුෂයකු වීම සඳහා බීජ රූප- *හදය රූප*, හෘදය රූපය- *ජීවිත රූප- ආහාර* = ඕජා රූප" යන යන මේ *සම්මසනුපග සුඛුම රූප* හය, ලොකී චිත්ත- චෛතසික යන මේ රූප, චිත්ත- චෛතසිකයෝ විපස්සනා වැඩිය යුතු *ධම්මාරම්මණ* නම් වේ.

කාම කුසල-අකුසල ජවන සිත් තදාලම්බන සිත් මනො විඤ්ඤාණ නම් වේ. *ඵස්ස, වේදනාවන්* වනාහි එම *ජවන හා තදාලම්බනයන්හි* යෙදෙන *ඵස්ස, වේදනාවෝය.*

මනොද්වාරය දැනගන්නා හැටි

විපස්සනා ඤාණ විශේෂයෙන් මුහුකුරා ගිය විට පෙර මෙනෙහි කිරිම හා පසු මෙනෙහි කිරීම වෙන් වෙන්ව එකින් එක, කැපී පෙනෙන ලෙස ප්‍රකට විය හැක්කේය. උපමාවක් ලෙසඃ අත නවන විට මොහොතින් මොහොත, "නවනවා - නවනවා" යැයි බොහෝ වාරයක් මෙනෙහි කොට දැන ගත යුතුවේ. එලෙස දැන ගැනීමේදී පෙර මෙනෙහි කිරිම හා අනතුරුව නැවීමේ කැමැත්ත හා නැවීම් යන දෙකද දූරින් - දූරින්, ඈතින් - ඈතින් වන්නාක් මෙන් වැටහේ. එම නිසා මෙනෙහි කරන අරමුණු අඩු වී, මෙනෙහි කිරිමට යමක් නැති නොවී ගියාද නොවී, මෙනෙහි කිරිම් දියුණු

වීම නිසා පෙර හා පසු විථීන්හි අතර පහළ වන භවංග සිත්ම ප්‍රකටව පැමිණීම සිදු වේ. එම නිසා එවැනි අවස්ථාවල පෙර හා පසු සිත්වල මෙම දුරස් වී පැනීම දැන ගැනීම *භවංග මනොද්වාරය* දැනගැනීම නම් වේ. *ආවජ්ජනය* හා *මනොද්වාරය* තත්ත්වාකාරයෙන් දැන ගැනීම වනාහිඃ පූර්වංගම වී අරමුණ ගැනීම යයි කියා හෝ (ලක්‍ෂණය), මනසිකාරය යොදා සළකා බැලීමට හැකිවීම යයි හෝ (රසය) එසේ පටන් ගෙන සිත යොදා සළකා බැලීමට හැකියාව යැයි හෝ (*පච්චුපට්ඨාන*) **(ආවජ්ජන රසා, තථාභාව පච්චුපට්ඨාන) භවංග උපච්ඡේදය** = සිඳීයන භවංගය අනුව මනසිකාරය යෙදීම ආරම්භ කරයි යැයි හෝ වේවා (*පදට්ඨානය*) දැනගනී.

උපරිම මනො ද්වාර

හදය රූපය, තත්ත්වාකාර දන්නේ නම් සිතීම කල්පනා කිරිම මෙනෙහි කිරීම භාවනා කිරීම ආදියට නිශ්‍රය වන්නා වූ ස්ථානයයැ. මෙතැනින් කල්පනා කිරීම සිතීම සිද්ධවේ යැයි හෝ (ලක්‍ෂණය), සිතීම- කල්පනා කිරිම- මෙනෙහි කොට භාවනා කිරිම් වලට ආධාර කිරීම හෙවත් දැරීම කරයි යැයි හෝ (රස), සිතන-දැන ගන්න සිත් පවත්වන්නේ යැ. එහි නියුක්ත වන්නේ යැයි හෝ (*පච්චුපට්ඨාන*), නිශ්‍රය රූපයන් නිසා පහළ විය හැකි යයි කියා හෝ (*පදට්ඨාන*) දැනගනී, **මනඤ්ච පජානාති** යන පාළියට අනුවයි.

ධම්මායතනය දැන ගන්නා ආකාරය

ඇස, කණ, නාසය, දිව, කය, යන ප්‍රසාද රූප පහද, ආපෝ , හදය රූප යන මේවා දැනගන්නා ආකාරයන් මේ තාක් දැක්වීය. ස්ත්‍රී පුරුෂයන්ගේ ආවේණික ලක්ෂණ අනුව සිතීම- කල්පනා කිරිම, මද සිනහ, සිනහ ආදිය පහළ කරන අවස්ථාවන් මත භාවනා කොට *භාව රූප තත්ත්වාකාරයෙන්* වටහා ගනී නම් 'ස්ත්‍රියකට ආවේනික ස්වභාවය- පුරුෂයකුට ආවේනික ස්වභාවය' යැයි හෝ *භාව රූප* ඇත්තේ ඒ ඒවාට අනුව ස්ත්‍රී- පුරුෂ වන්නේ යැයි හෝ (ලක්‍ෂණ), ස්ත්‍රියක් සේ සටහන්, හැසිරීම් ආකාර, සිතීම්, රුචිකත්වයන් පහළ කිරිම, කිරිම් හෝ පුරුෂයාගේ සටහන්, හැසිරීම් ආකාර, සිතීම්, රුචිකත්වයන් ඇතිකිරීම, කිරීම් ලෙස හෝ (*පච්චුපට්ඨාන*), නිශ්‍රය රූපයන් නිසා මෙම *භාව රූප* පහළ වේ යයි (*පදට්ඨාන*) දැනගනී.

අතරක් නොතබා පහළ වන දැකීම් ආදිය මෙනෙහි කොට දැනගන්නා තැනැත්තාට ඇස, කණ, නාසය, දිව, ශරීරය, හෘදය, භාව රූපයන් අඛණ්ඩව පැවැත්ම වීම සඳහා ක්‍රියාත්මක වන *ජීවිත රූප* යැයි කියන *ජීවිතින්ද්‍රිය රූපයන්ද* ප්‍රකට විය හැක්කේය. එම *ජීවිත රූප* ඇසේ ඔපය ආදීන් හා එකට ඉපදී එකට නිරුද්ධ වේ. නමුදු එයට තමා වශයෙන් නිරුද්ධ වීමට කලින්, පවතින අවස්ථාවේ ඇස් ඔපය, (චක්ඛු ප්‍රසාදය,) රූප ආදිය, අනුපාලනය කිරීමේ ශක්තිය ඇත්තේය. එම අනුපාලන ක්‍රියාවලිය නිසා පරණ පරණ වන්නා වූ චක්ඛු රූප ආදිය නිරුද්ධ වන්නේ නමුදු ඒවායේ ස්ථානයේ අලුතින් අලුතින් නව චක්ඛු රූප ආදිය පහළ වීමට හැක්කේය. මරණයට පත් වන තෙක් කාලය තුළ අඛණ්ඩව, දිගට අලුත් වෙමින්, පවතින ආකාරයටම මෙන් පැවතිය හැක්කේ යයි කියනු ලැබේ. එම නිසා *ජීවිත* යැයි කියන *ජීවිත රූප* තත්ත්වාකාරයෙන් දන්නේ නම්, එයට එකට යෙදෙන චක්ඛු ප්‍රසාදය ආදිය අනුපාලනය කළ හැක්කේ යැයි හෝ (ලක්‍ෂණ), චක්ඛු ප්‍රසාදය ආදිය නොසිඳ පැවැත් විය හැකි යයි හෝ (රස), එම චක්ඛු ප්‍රසාදය ආදිය නොනැසී පැවැත්වීම වශයෙන් හෝ වේවා (*පච්චුපට්ඨාන*), නිශ්‍රය රූප මතින් පහළ වේ යැයි හෝ (*පදට්ඨාන*) දැනගනී.

කෑම- බීම ලැබී භෝජන ශක්තිය අතින් කය සංතෘප්ත වීම, සිතට ප්‍රබෝධය ඇතිවීමත්, සිත උනන්දු වීමත් ආදිය මෙනෙහි කොට භාවනා කරන්නහුට *ආහාර රූප*, ප්‍රකට විය හැක්කේය. එම *ආහාර රූපයන්* තත්ත්වාකාරයෙන් දනී නම්, මේද, පිජ්ඨ, මාංශ ජනක, වශයෙන් හෝ (ලක්‍ෂණ), රූප පහළ කරවිය හැකි බලය- ශක්තිය වශයෙන් හෝ (රස), දුර්වලව මිලානව යා නොදීම පිණිස උපස්ථම්භනය කරමින් සිටින්නේ යැයි හෝ (*පච්චුපට්ඨාන*) බත්, ව්‍යංජන, අනෙකුත් කෑම ජාතී ආදී රූපයන් ඇසුරු කොට පවතිත් යැයි කියා හෝ (පදට්ඨානය) දැනගනී.

චිත්ත-චෙතසික ධම්මාරම්මණ වනාහි වර්ග වශයෙන් බොහෝය. සමහරක් *චිත්ත-චෙතසිකයන්* දැන ගන්නා ආකාරය පසුගිය පරිච්ඡේද වල දැක්විය. ඉදිරියට පවා දැක්වීමට ඇති දෑ බොහෝය. එම නිසා *චිත්ත-චෙතසික ධම්මාරම්මණ* දැන ගන්නා ආකාරයන් සවිස්තරව මෙහි දක්වනු නොලැබේ. **ධම්මෙච පජානාති** යන පාළියට අනුව දක්වන විස්තරයයි.

මනො විඤ්ඤාණය

සිතන-කල්පනා කරන සිත තත්ත්වාකාරයෙන් දනී නම්, සිතීම්-විතර්කනය කිරීම්- විචාරණය කිරීම්, දැන ගැනීම, පත්වීම්, අනුව හැසිරීම යයි හෝ වේවා (ලක්‍ෂණ), ස්වභාවයන්හි පමණක් එල්බ ගනී,අරමුණු කරයි. අරමුණු ගැනීම පමණක් කරයි, හුදු දැන ගැනීම පමණක්ම යයි හෝ (රස), අරමුණ දිසාවට අභිමුඛ බව හෝ වේවා (*පච්චුපට්ඨාන*), මනසිකාරය ආරම්භ කිරීම අනුව කල්පනා කිරීම , පත්කිරීම කරයි, සිත හා කල්පනාවට සුදුසු අරමුණකුත් ඇති විට කල්පනා කිරිම වේ යැයි හෝ (පදට්ඨාන) දැනගැනීම.

මනො සම්පස්ස

සිතට හැපෙන දෑ තත්ත්වාකාරයෙන් දනී නම් අරමුණ හා සිත හමුවී ස්පර්ෂ කිරිම යයි හෝ (ලක්‍ෂණ), අරමුණ හා ගැටීම, අරමුණ හා එක්වීම වශයෙන් හෝ (රස), ආවර්ජනය කරන, සිතන අරමුණු හමුකරදීම හෝ සංගතිය (*පච්චුපට්ඨාන*) ප්‍රකට වූ අරමුණක් ඇතිවිටම හමුවේ.පහස සිදුවේ. අරමුණ ප්‍රකට වීම නිසා හමුවේ යයි හෝ (පදට්ඨාන) දැනගනී.

සොමනස්ස වේදනා

ප්‍රබෝධයත්, සතුටු සුඛයත් තත්ත්වාකාරයෙන් දනී නම්, හොඳ අරමුණක් විඳියි, සිතිවිලි හා කල්පනා කිරීම් හොඳයි- ප්‍රබෝධයි, සන්තෝසයත් යැයි හෝ (ලක්‍ෂණය), මනාප ලෙස පරිභෝග- සම්භෝග කිරිම වශයෙන් හෝ (රස), සිතෙහි සතුට යැයි, සිතෙහි ආශ්වාදය යැයි කියා හෝ (*පච්චුපට්ඨානය*), සිතට *සොමනස්සය* ලැබේ. සුඛදායකය, සාමකාමීය, සතුටුදායක යැයි, හොඳ අරමුණක් රිසි පරිදි හමුවී සැප එළවයි යැයි, සතුට යැයි හෝ වේවා (*පදට්ඨානය*) දැනගනී.

දොමනස්ස වේදනා

අමනාපයක්- දුකක් තත්ත්වාකාරයෙන් දනී නම්, අනිෂ්ඨ අරමුණක් විඳියි, සිතින් කල්පනා කරන්නට තරම් නරක වූ අප්‍රිය වූවෙක, බලාපොරොත්තු සුන්කරන සුළුයි. සිත දුර්වණී කරයි, සිතට වෙහෙස කරයි. පශ්චාත්තාප කරයි. කණගාටු දායකයි. කුහුල් කරයි. ශෝක කරයි.

අසහන කාරියි කියා හෝ (ලක්‍ෂණය), අනිෂ්ඨ අරමුණක් වශයෙන් හෝ විඳියි, අසතුටින් විඳියි යැයි (රස), චෛතසිකයන්ගේ ආබාධ තත්වය, නොඉවසියහැකි බව හෝ (*පච්චුපට්ඨානය*), ආශ්‍රය ලබන හදය රූපය ඇතිවිට මෙසේ පහළ විය හැක්කේය. අනිෂ්ඨාරම්මණ හමුවීම සිතට දුකක් යැයි හෝ වේවා (පදට්ඨානය) දනී.

උපෙක්ඛා වේදනා

මධ්‍යස්ථ ***(උපෙක්ඛා)*** වේදනාවක් තත්ත්වාකාරයෙන් දනී නම් හොඳත් නැති-නරකත් නැති මධ්‍යස්ථ අරමුණක විඳනයක් ලබයි. හොඳත් නැති-නරකත් නැති සිතක් වන්නේය (ලක්ෂණ). සැප- දුක දුරු වූයේය. උනන්දු නොවී, කුසීත නොවී, සම වීම් වශයෙන් හෝ (රස), ශාන්ත භාව, සුඛුම භාව වශයෙන් හෝ වේවා (*පච්චුපට්ඨාන*) නිවේද සිත නිසා උපේක්ෂා වේදනාව පහළ වේ යැයි, නරකත් නැති, හොඳත් නැති සාමාන්‍ය අරමුණක් හමු වී මෙසේ වන්නේ යයි කියා හෝ (*පදට්ඨානය*) දනී.

සඤ්ඤාක්ඛන්ධය

දකින තරම් අරමුණු අමතක නොවීම සඳහා සළකුණු ගැනීම සඤ්ඤා නම් වේ. එයටම *සඤ්ඤාක්ඛන්ධ* ය යයි කියනු ලැබේ. එම සළකුණු ගැනීම අලුත් අමුතු අරමුණක් හමුවූ කල්හි හෝ විධානයකට ඇහුං කන් දෙන අවස්ථාවෙහි වඩාත් ප්‍රකටවේ. එම *සඤ්ඤාව* තත්ත්වාකාරයෙන් දන්නේ නම්, අමතක නොවනු පිණිස සළකුණු ගැනීම ලෙස හෝ (ලක්‍ෂණය), පෙර හමු වූ දෙයක් නැවත හමු වූ විට එය මතක් වීම පිණිස අරමුණකින් යම් සළකුණක් ගැනීම වශයෙන් හෝ (රස), දන්නා තාක් නිමිති මගින් සිතෙහි තදින් අල්ලාගැනීම වේ. තමා සිතින් සළකුණු ගන්නා තරමට තදින් අල්ලාගැනීම වේ යැයි කියා හෝ (*පච්චුපට්ඨානය*), ප්‍රකට වන තාක් අරමුණු මගින් සඤ්ඤා ගැනීම වන්නේ කියා හෝ (*පදට්ඨානය*) දනී.

සංඛාරක්ඛන්ධා

වේදනා- සඤ්ඤා වන්ගෙන් වෙන්වූ ඉතිරි චෛතසික 50ට *සංඛාරක්ඛන්ධ* යැයි කියනු ලැබේ. දැකීම, ඇසීම ආදිය හා යෑම, සිටීම, හිඳීම, හොවීම, නැවීම, ආදියද කළ හැකි, කරවිය හැකි (=සංස්කාර) යයි

කියනු ලැබේ. එම සංස්කාර ස්කන්ධය (50) තුළ ප්‍රධාන වන චේතනාව පමණක් මෙහිලා දක්වන්නේ නම්, නායක, වඩුරාළ තමා වශයෙන්ද වැඩකරන අතර අතේවාසිකයන්ද වඩු කටයුත්තෙහි යොදවමින් එහි උත්සුක කරන්නාසේ, ගොවියා තමා වශයෙන්ද වෙහෙස වෙමින් අස්වනු නෙලන අතර දෛනික වේතනය ලබන සේවකයන්ද කටයුත්තෙහි යොදවමින් උත්සුක කරවන්නාසේ ද, සම්ප්‍රයුක්ත චිත්ත චෛතසිකයන් අරමුණෙහි යොදවා උත්සුක කරවන්නාවූ ස්වභාවය චේතනා නම් වේ. එම චේතනාව වනාහි වහා සම්පාදනය කළ යුතු, හදිසි කටයුත්තක් සම්බන්ධයෙන් කල්පනා කරන අවස්ථාවෙහි ආදියෙහිදී එම උත්සුක කරවන ආකාරය වශයෙන් ප්‍රකටව පෙනේ. එම නිසා මෙම චේතනාව ඇති සැටියෙන් දනීනම්, අරමුණෙහි යොදවයි, උත්සුක කරවයි කියා හෝ **(චෙතයිත ලකඛණා)**, උත්සාහ කළ හැකි, ක්‍රියා කරවිය හැකි, කළමණාකරනය කළ හැකි යැයි හෝ **(ආයුහන රසා/**සකති රූපං**)**, පර පණ නැසීම කියන තැන 'මරවයි' යනුවෙන් උපදෙස් දෙන්නා සේද, දානය කියන තැන 'ලබත්වා, සුවයට පත්වේවා'යි අනුශාසනා කරන්නා සේද, සංවිධානය කිරීම, සැලසුම් කිරීම, කටයුතු කිරීම ලෙස හෝ වේවා **(සංවිදහන පචචුපටඨාන**/ බ්‍යතති රූපං) දනියි. යෝනිසෝමනසිකාරයට අනුව කුසල කර්‍මයන්හී සිත යොදයි, අයෝනිසෝමනසිකාරයට අනුව අකුසලයන්හී සිත යොදයි වශයෙන් හෝ, නියම සුඛය- නියම දුක පිළිබඳ දැනීම අඩු පාඩු සහිත වීම නිසා හොඳ- නරක දෙකෙහි චේතනා වශයෙන් සිත යෙදීම කරයි යැයි , ඇසුරු කරන වත්ථු රූප හා ආරම්මණ ඇති විට චේතනාව වන්නේ යැයි හෝ, සිත ඇති බැවින්ම චේතනාව වන්නේ යයි හෝ දැන ගනී. **(මනසිකාර පදට්ඨාන, අවිජජා පදට්ඨානා වතථාරමමණ පදට්ඨානා, විඤඤාණ පදට්ඨානා)**

ඉරියාපථ අනුව මෙනෙහි කිරීම

යන විට පියවරක් පියවරක් පාසා "යනවා- යනවා" යැයි හෝ "යවනවා- යවනවා' යැයි කියා හෝ "වම්පය- දකුණු පය' යැයි හෝ එසවීම - යැවීම - තැබීම' කියා හෝ මෙනෙහි කිරීම කළ යුතුවේ. මෙලෙස මෙනෙහි කොට *සති- සමාධි- ඥාණයන්* මුහුකුරා ගියවිට ඔසවන- යවන වාරයක් පාසා එම ඔසවන්නට - යවන්නට කැමති සිත මෙනෙහි කරන්නේ නම් එය දැන ගැනීමට හැකිවනු ඇත. එවිට **ගචඡනෙතාවා ගචඡාමීති පජානාති** යන සතිපට්ඨාන පාළි හා **එම** (දී. නි) අට්ඨකථාවන්ට අනුව **එස එවං**

පජානාති "ගච්ඡාමීති චිත්තං උප්පජ්ජති, තං වායං ජනෙති, වායො විඤ්ඤත්තිං ජනෙති, චිත්ත කිරිය වායොධාතු විප්ඵාරෙන සකල කායසය පුරතො අභිනීහාරො ගමනන්ති" වුච්චති [දී. අ. 2/552]

යෑමට කැමති සිත මුලින් උපදී එම සිත නිසා *වායො විඤ්ඤත්තිය* සමග ක්‍රියාදාමය, පිළිවෙලින් පහළ වේ. එම ක්‍රියා ශරීරය පුරා පහළවන නිසා ශරීරය නම් වූ රූප සියල්ලෙහි මොහොතින් මොහොත වෙනස් වෙමින් ඇති වීම ගමන යැයි කියනු ලැබේ යැයිද වත්මාන වශයෙන් ප්‍රත්‍යක්ෂ ලෙස සවිස්තරව දැනගනු ඇති.

අට්ඨ කථා විවරණයේ අර්ථය

එස	=	යමින් "යනවා- යනවා" යැයි මෙනෙහි කරන යෝගිතෙම
එවං	=	මේ දක්වන්නාවූ ක්‍රමයට
පජානාති	=	විශේෂයෙන් දැනගනී
ගච්ඡාමීති චිත්තං	=	යන්නෙමියි සිතන සිත
උප්පජ්ජති	=	උපදී
තං	=	එම සිත
වායං ජානෙති	=	වෑයම් පහළ කරයි
වායො	=	තදවන හෝ චලන ක්‍රියා
විඤ්ඤත්තිං ජානෙති	=	තෙරපන හෝ චලන ස්වභාවයන් යන විඤ්ඤත්ති පහළ කරවයි
චිත්ත කිරිය වායො ධාතු		
විප්ඵාරෙන	=	සිතින් පහළ කරවන තෙරපීම්, තදවීම් චලන, ස්වභාවයන් හි පැතිරීම නිසා
සකල කායසස	=	සියලු කයෙහි හෙවත් කය යැයි ගැනෙන රූප සියල්ලෙහි
පුරතො අභිනිහාරො	=	කැමති පැත්තට මොහොතින් මොහොත පෙරට යෑම
ගමනන්ති	=	ගමන යැයි කියා
වුච්චති	=	කියනු ලැබේ

බල්ලන් හෝ සාමාන්‍ය මිනිසුන් දැනගන්නාකාරයට නොවේ

මේ ක්‍රමයට *විපසසනා* වශයෙන් මෙනෙහි නොකරන, විශේෂ ඤාණයන්ට පත්නොවූනු ඇත්තන්ට වනාහි, "**ගච්ඡන්තො වා ගච්ඡාමීති පජානාති** = යන්නේ යන බව දනී" යන පාළියෙහි සැක සංකා සඳහා තවමත් ඉඩ ඇති නිසා *අට්ඨකථා* හි වඩා පැහැදිළි කිරීමක්, පිරිසිදු කිරීමක් කරයි. එම *අට්ඨකථාව* මත පිහිටා මෙහිදු පැහැදිළි කරලීම කරන්නෙමි. බල්ලන්- හිවලුන් වැනි තිරිසනුන්ද 'යන්නේ යන බව දන්නවා නොවේද'යි ප්‍රශ්නයක්- සැකයක් ඇත්තේ වී නම්: දන්නා බව නම් සත්‍යයය! නමුදු එවැනි දැනීමක් සළකා ඉහත සඳහන් දේශනය, බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළා නොවේ. මක්නිසාද යත්: බල්ලන්- හිවලුන්- සාමාන්‍ය පුද්ගලයන් වනාහි යෑමට කැමති සිත හා ගමන ක්‍රියාව ඇතිවන, ඇතිවන අවස්ථාවේ නොදන්නාහ. සිත හා රූපයන් වෙන් කොට ගැනීමට නොදනිත්, යෑමට කැමති බවේ අනුපිළිවෙල අනුව ගමන් ක්‍රියාවේ අනුපිළිවෙල ඇතිවන බව නොදනී, කොටසින් කොටස කොටස කැඩී කැඩී නිරෝධ වන බවද නොදන්නාහ.

ඇත්ත වශයෙන්ම බල්ලන්- හිවලුන්- සාමාන්‍ය මිනිසුන් ගමනේ මුල හෝ වේවා, මැද හෝ වේවා, අග හෝ වේවා එක වරක් පමණක් දැනගනී. අනෙක් දෙයකට හෝ තැනකට, සිත පිටතට ගොස් තිබියදී ගමන් කරන අවස්ථා බොහෝය. කලාතුරකින් දැන ගත්තේ නමුදු මම- මාගේ වශයෙන් දැනගනී. ස්ථිර දෙයක් ලෙස, නිත්‍යය දෙයක් වශයෙන් දැනගනී. ගමන් කිරීමට කලින්ද මේ කය මැයි, ගමන් කරන විටද මේ කය මැයි, "සැතපුම් 100ක් ගමන් කළේද ගමන් කිරීමට කලින් තිබූ කයම වන්නේ යැයි", දැන් මෙතැනට පත් වී යැයි යන්න පමණක් විශ්වාස කරයි. පෙර මෙන් සථිරව පිහිටි අවස්ථාවම දිගට පවතී යැයි කල්පනා කරයි. එම නිසා එවැනි දැන්වීම මගින් 'සත්ත්වයා' යැයි ගන්නා විශ්වාස දුරු කළ නොහැක. උදුරා දැමිය නොහැක. එම ගැනීම් දැඩිව අරමුණු වී ඇති බැවින් *විපසසනා* වශයෙන් දැනීමක් පහළ වීමට ඉඩක් නැත්තේය. මේ ආකාර ගැනීම් දිගට දැඩිව පැවැත්වීම නිසාද විපස්සනා කළ නොහැකි වන්නේය. මෙලෙස වන දැඩිව ගැනීම භාවනා කර්මය සිදු වීමට ආධාර නොවේ. පසු පසු, විපස්සනා කටයුත්තෙහිලා ආධාරක හේතු ධර්මයන්ද නොවන නිසා එම දැනීම කමටහනක් නොවේ. සත්‍යය ලැබීමට හේතුවන විපස්සනා

සතිය හා යෙදෙන දැනීමක් නොවන නිසා සතිපට්ඨාන භාවනාවද නොවැඩිමකි. එම නිසා බල්ලන්- හිවලුන්- සාමාන්‍ය පුද්ගලයන් ආදීන්ගේ එම සාමාන්‍ය දැනීම අදහස් කොට ඉහත දැක්වූ දේශනාව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළා නොවන්නේයැයි දත යුතු.

යන යන වාරයේ යෑමට කැමති සිත "යනවා - යනවා" යයි හෝ වේවා මෙනෙහි කරන යෝගී පුද්ගලයාට වනාහි යෑමට කැමති සිතද විශේෂයෙන් ප්‍රකටවේ. යන්නාවූ රූපයන්ද තෙරපීම්- තදවීම්- චලන- හැසිරීම් වශයෙන් ප්‍රකට වේ. එම නිසා එම යෝගි තෙම යෑමට කැමති සිත අදාල රූප සමග කලවම් නොවී පැහැදිළිව දැන ගනී, චලනය වන රූපයන්ද සිත හා කලවම් නොවී වෙනමම දැනගනී. යෑමට කැමැත්ත නිසා තදවීම්, තෙරපීම්, චලන, අනුපිළිවෙලින් සිදුවන්නේ යැයි දැනගනී. යෑමට කැමැති බවේ අනුපිළිවෙල හා චලනයේ අනුපිළිවෙල පමණක් ඇත්තේ යයි දැනගනී. යෑමට කැමැත්ත වනාහි චලනයට පත්වන තෙක් නොපවතී. චලනයන්ද එක් මොහොතකින් තව මොහොතකට යෑමට කලින් කොටසින් කොටස විනාශ වෙමින්, විනාශ වෙමින් නිරුද්ධ වන්නේ යයි දැනගනී. *අට්ඨකථාවන්හී* සක්මන් භාවනාව දැක්වෙන ලෙසට පියවරෙන් පියවර හයාකාරයකට වශයෙන් හෝ වේවා, කෙටි ක්‍රමයකට හෝ වේවා කැපී - කැපී නිරොධ වන්නේ යයි දැන ගනී. එම නිසා එවැනි යොගී "මම යන්නෙමි- ඔහු යනවා" යන කථාව ව්‍යවහාරය සඳහා පමණක් වේ යැයිද , යා හැකි මමෙක්, හෙතෙමෙක් නැත්තේය. යෑමට කැමති සිත හා චලනය වන ප්‍රධාන රූප සමූහයන් පමණක් ඇත්තාහ. ඇස් පිල්ලන් ගහන තරමට වත් කාලයක් පවතින වස්තුවක් නොමැත්තේය. අනිත්‍ය ස්වභාවය පමණක් ඇත්තාහ ය. අතරක් නොතබා බිඳි- බිඳි යන නිසා දුක් ගොඩක්ම පමණකි. හුදු පෙළන සවභාවයක්ම පමණකි යැයි තම ඤාණයෙන්ම තීරණාත්මකව ඒ මොහොතේම දැනගත හැක්කේය. මෙලෙස තීරණය කරණ ඤාණය *සම්පජඤ්ඤ* හතර අතරින් *අසම්මෝහ සම්පජඤ්ඤය* නම් වේ. යෑමට කැමැත්ත, යෑම ආදිය මෙනෙහි කිරීම හා එසේ කොට දැන ගැනීම *ගොචර සම්පජඤ්ඤ* නම් වේ. මේ *සම්පජඤ්ඤ* දෙක අතරින් *ගොචර සම්පජඤ්ඤය* හේතුවයි. *අසම්මෝහ සම්පජඤ්ඤය* ඵලයයි. එම නිසා *ගොචර සම්පජඤ්ඤය*, පමණක් නැවත - නැවතත්, යළි - යළිත් පහළ කළ යුතුවේ. එම

කැමති තැනට තල්ලු කරන ක්‍රියා ශක්තිය සමග ආධාරක චලන පහළ වීම පැහැදිලිව අවබෝධ කරලීම සඳහාම වායො ධාතුව වනාහි විඤ්ඤත්ති පහළ කර දෙයි. පහළ කරවයි යැයි විශේෂයෙන් දක්වයි. විඤ්ඤත්තිය චිත්තජ රූප මුත් වායොජ රූප නම් නොවන්නේය.

සම්පජඤ්ඤයන් මුහුකුරා ගිය විට *අසම්මෝහ සම්පජඤ්ඤයද* ඉබේම මෙන් පහළ වී, සම්පූර්ණ වනු ඇත.

මේකී ලෙසට යෑමට කැමති සිත හා යෑම කරන රූප පහළ වන වන වාරයේ අතරක් නොතබා මෙනෙහි කරන්නාවූ යෝගි පුද්ගලයාගේ ඥාණයේ සත්ත්වයා යයි ගන්නා *දිට්ඨිය* දුරුවිය හැක්කේය. මම යයි වැදරවාගත් *දිට්ඨියද* ඉවත් කළ හැක්කේය. *පටිවිපස්සනාවෙහි* අරමුණ වනවාටත් වඩා පසු පසු විපස්සනා ඥාණයන්ද ප්‍රබලව පහළකර විය හැකි බව ඇති නිසා මෙය කමටහනක් ලෙසටද ගැනේ. මෙනෙහි කරන *විපස්සනා සතිය* හා යොදමින් පහළ වන සුද්ධ ඥාණයක් වන බැවින් *සතිපට්ඨාන භාවනාව* යැයිද නම් කෙරේ. එම නිසා මෙලෙස මෙනෙහි කිරීම සලකා "**ගච්ඡන්තොවා ගච්ඡාමීති පජානාති** - යන්නේ යන බව දැනගනී, යන මේ ගාථාව බුදුරජාණන් වහන්සේ දේශනා කළ බව සැකයකින් තොරව සිත තබා ගන්න.

කමටහන හා සතිපට්ඨාන භාවනාව එකට ලැබීම

ඉමස්ස පන භික්ඛුනො පජානනං සත්තූපලද්ධිං පජහති, අත්ත සඤ්ඤං උග්ඝාටෙති, කම්මට්ඨානඤ්චෙව සතිපට්ඨාන භාවනාච හොති -[දී. අ. 2/552] "මෙම යෝගි භික්ෂුවගේ දැන ගැනීම (ඥාණය) සත්තවයා යැයි සළකාගන්නා වැරදි මතය දුරුකිරීමට සමත්ය. මම යයි සළකාගන්නා දිට්ඨිය උදුරා දැමීමට සමත්ය. කම්මට්ඨානයද වේ. සතිපට්ඨාන භාවනාවද වේ" යැයි *අට්ඨකථාහි* දැක්වෙන නිසා *කම්මට්ඨානය* හා *සතිපට්ඨාන භාවනාවද* මෙහිලා විශේෂයෙන් සමාන වේ. යෑමට කැමති සිත හා යන රූපය යන මේවා මෙනෙහි කර දැන ගන්නා ඥාණය එකක්ම ලෙස දැක්වේ. කමටහනේ ක්ෂේත්‍රය එකකි, සතිපට්ඨාන භාවනා වේ ක්ෂේත්‍රය එකකි යන ලෙසට නොවේ.

නමුදු මෙම නම, එය ලැබීමට හේතුවන දේ වශයෙන් වෙනස්වේ. සමාන වන ආකාරය වනාහි මෙනෙහි කරන සතිය, යෑමට කැමති රූප ආදී අරමුණ වෙතට දිව ගොස් වැද ගන්නා ලෙසට විය හැකි නිසා සති-පට්ඨාන නම් වේ. පූරන, වඩන බැවින් භාවනා නම් ද වේ. මේ කරුණු දෙක නිසා සතිපට්ඨාන භාවනා නම් වේ. භාවනා කොට බහුලීකෘත කොට අරමුණට වැදගෙන තත්ත්වාකාරයෙන් දැන ගැනීම යැයි කියනු ලැබේ.

එලෙස දැනගන්නා ඤාණය පහළ වී නම්, මෙනෙහි කරන මේ සතියද එකටම යෙදී පහළ වේ. සතියෙන් තොර ඤාණ ප්‍රඥාවන් කිසිවක පහළ වීමක් නැත . එම නිසා මෙහිලා සතිය ප්‍රධාන වූ ඤාණයටම *සතිපට්ඨාන භාවනාව* යැයි කියනු ලැබේ. මේ ඤාණයම "**පටි-විපස්සනා**" නම් වූ පසු පසු භාවනා සඳහා අරමුණු වන නිසාද, එයටම පසු පසු විපස්සනා ඤාණ වඩා හොඳින් පහළ කරවිය හැකි බැවින්ද මෙයට *කම්මට්ඨාන* ය යැයි කියනු ලැබේ. ඉදිරි භාවනා කටයුත්තෙහි අරමුණ මෙන්ම හේතුවද වන ආකාරය මෙසේය. යෑමට කැමැත්ත යයි මෙනෙහි කොට දැන ගැනීම මෙනෙහි කිරීම යැයි කියා හෝ දැනගැනීම යැයි කියා හෝ නැවත මෙනෙහි කොට දැන ගන්නේ නම් එය *පටිවිපස්සනා භාවනාවක්* වන්නේය. මේ ක්‍රමයට, භංග ඤාණයේ පටන් ඉදිරි භාවනාවන්ට අරමුණක් වන්නේය. පෙර-පෙර මෙනෙහිකර දැන ගැනීම් නිසා පසු-පසු මෙනෙහි කොට දැන ගැනීම් වැඩෙමින් ක්‍රමයෙන් වඩා තියුණුද, උනන්දුද වන්නේය. එම නිසා යෑමට කැමති සිත, යන්නාවූ රූප ආදිය, මෙනෙහි කරන සතිය ප්‍රධාන වන්නාවූ "දැන ගැනීම" *කම්මට්ඨාන* යද වන්නේය. *සතිපට්ඨාන භාවනාවද* වන්නේ යැයි අට්ඨකථා හි දැක්වේය.

"**අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති**" යන මේ පාළියෙහි විස්තර දැක්වීමේදී *අසම්මෝහ සම්පජඤ්ඤය* පහළ වීම දක්වන තැන "**අට්ඨි සංඝාතො අභික්කමති, ධාතුනං යෙව ගමනං, ධාතුනං ඨානං, ධාතුනං නිසජ්ජා, ධාතුනං සයනං**" යන *අට්ඨකථා* දැකවීම් අනුව **කම්මට්ඨානඤ්චෙව** යන පදය මගින් *සමථ ධාතු කම්මට්ඨාන* ය වන බව දක්වන්නේ යැයි කියැවේ. මේ තැන සංසන්දනය කර බැලීම සඳහා එම අට්ඨකථා දැක්වීම සම්පූර්ණයෙන් මෙසේ උපුටා දක්වන්නෙමි.

අභික්කමාදීසු පන අසම්මුය්හනං අසම්මොහ සම්පජඤ්ඤං: තං එවං වෙදිතබ්බං, ඉධ භික්ඛු අභික්කමන්තො වා පටික්කමන්තො වා "යථා අන්ධ පුථුජ්ජනා අභික්කමාදීසු 'අත්තා අභික්කමති අත්තනා අභික්කමො නිබ්බත්තිතො ති වා අහං අභික්කමාමි මයා අභික්කමො නිබ්බත්තිතොති වා සම්මුය්හන්ති තථා අසම්මුය්හන්තො අභික්කමාමීති චිත්තෙ උප්පජ්ජමානෙ තෙනෙව චිත්තෙන සද්ධිං චිත්තසමුට්ඨානා වායො ධාතු විඤ්ඤත්තිං ජනයමානා උප්පජ්ජති, ඉති චිත්තකිරිය වායො ධාතු විප්ඵාරවසෙන අයං කාය සම්මතො අට්ඨි සංඝාතො (රූප සංඝාතො යන්න මෙහිලා වඩාත් ගැළපේ**) අභික්කමති, තස්සෙවං අභික්කමතො එකෙක පාදුද්ධරණෙ පඨවිධාතු**

ආපො ධාතුති ද්වෙ ධාතුයො ඔමත්තා හොන්ති මන්දාඃ ඉතරා ද්වෙ අධිමත්තා හොන්ති බලවතියොඃ තථා අතිහරණ විතිහරණෙසු. වොසජ්ජනෙ තෙජො වායො ධාතුයො ඔමත්තා හොන්ති මන්දා ඉතරා ද්වෙ අධිමත්තා හොන්ති බලවතියො, තථා අතිහරණ විතිහරණෙසු. වොසජ්ජනෙ තෙජො වායො ධාතුයො ඔමත්තා හොන්ති මන්දාඃ ඉතරා ද්වෙ අධිමත්තා හොන්ති බලවතියො, තථා සන්නික්ඛෙපන සන්නිරුම්භනෙසුඃ තත්ථ උද්ධරණෙ පවත්තා රූපාරූප ධම්මා අතිහරණං න පාපුණන්ති, තථා අතිහරණෙ පවත්තා විතිහරණං, විතිහරණෙ පවත්තා වොසජ්ජනං, වොසජ්ජනෙ පවත්තා සන්නික්ඛෙපනං, සන්නික්ඛෙපනෙ පවත්තා සන්නිරුම්භනං න පාපුණන්ති තත්ථ තත්ථෙව පබ්බ පබ්බං සන්ධි සන්ධිං, ඔධි ඔධිං හුත්වා තත්ත කපාලෙ පක්ඛිත්ත තිලා විය තටතටායන්තා භිජ්ජන්තිඃ තත්ථ කො එකො අභික්කමති, කස්සවා එකස්ස අභික්කමනං, පරමත්ථතො ධාතූනං යෙව ගමනං ධාතූනං ඨානං, ධාතූනං නිසජ්ජා, ධාතූනං සයනං, තස්මිං තස්මිඤ්හි කොට්ඨාසෙ සද්ධිං රූපෙන

අඤ්ඤං උප්පජ්ජතෙ චිත්තං, අඤ්ඤං චිත්තං නිරුජ්ඣති,
අවිචි මනුසම්බන්ධො - නදී සොතොව වත්තතී

එවං අභික්කමාදිසු අසම්මුය්හනං අසම්මොහ සම්පජඤ්ඤං නාම

[දී. අ. 1/134 ම. අ. 1/235]

සිංහල අර්ථය

ඉදිරියට යෑම ආදියෙහි සම්මෝහයෙන් තොරව තත්ත්වාකාරයෙන් දැනගැනීම *අසම්මොහ සම්පජඤ්ඤය* නම්වේ. එය ඉදිරියට විස්තර කරන්නාවූ ක්‍රමයට දැනගත යුතු වේ. මේ ශාසනයෙහි (*විපස්සනා යෝගී*) මහණ තෙම ඉදිරියට යන්නේ හෝ වේවා ආපසු පැමිණෙන්නේ හෝ වේවා (= විරුද්ධාර්ථ උපමාවකට අනුව) යම්සේ *අන්ධපෘථග්ජනයන්* ඉදිරියට යෑම ආදියෙහි (ආත්මය, ජීවය, විඤ්ඤාණය, ආදී වශයෙන් ව්‍යවහාර කරන) මම ඉදිරියට යන්නෙමි. ඉදිරියට යන්නේ මම වෙමි යැයි හෝ වේවා සම්මෝහ වී වරදවා වටහාගනීද එසේ මං මුළා-නොවේ. ඉදිරියට යන්නෙමියි චේතනාව වන්නේ නම් එම සිත හා සමගම සිත නිසා වන්නාවූ චලන ස්වභාව තෙමේ කැමති පැත්තට කය තල්ලු කරමින් පහළ වේ. මෙලෙස සිතින් කරන චලනයන්ගේ පැතිරීම වශයෙන් කය යැයි කිව යුතු මේ අසථි පඤ්ජරය (**රූප සංඝතො** යැයි යෙදේ නම් ඒ මේ රූප සමූහයමය.) වරින් වර පියවර නඟන අවස්ථාවෙහි *පඨවි- ආපො* යන මේ

ධාතූන්හි ශක්තිය දුර්වල වේ. තෙජො- වායො ධාතූන් දෙකෙහි ශක්තිය බලවත් වේ. යැවීමේදීද ඉදිරියට දික්කරන විටද මෙලෙසටමය. ඉදිරියට යැවීමේ ජවය කෙළවර තෙජො- වායො ධාතූන්ගේ ශක්තිය දුර්වලවේ. පඨවි- ආපො ධාතූන්ගේ ශක්තිය බලවත් වේ. තැබීමේදී හා තෙරපීමේ දීද මෙලෙසටම යැයි සළකා ගන්න.

(උද්ධරණ ගතිකා හි තෙජොධාතු, තිරිය ගතිකාය හි වායො ධාතුයා, ගරුතර සභාවා හි ආපො ධාතු" යනාදි කොට ඇති (දී. නි.)ටීකා දැක්වීමට අනුව එසවීමේදී අනුගමනය කරන වායො ධාතුව සහ අධික වූ තෙජො ධාතුවෙන් සම්පූර්ණවේ. ඉදිරියට විහිදුවීම වනාහි අනුව යන තෙජො ධාතුව හා අධිකවූ වායො ධාතුව මඟින් සම්පූර්ණ වේ. *වොස්සජන* ය නම්වූ වේගය මුදා හැරීම වනාහි අනුගත පඨවි ධාතුව හා අධික ආපෝ ධාතුව මඟින් සිද්ධ වේ. අත්ථසාලිනියෙහි පඨවිය ගරු යැයි කියයි. මෙහිලා *ගරුතර සභාව* යැයි කියන නිසා ආපො ධාතුව පඨවි ධාතුවට වඩා ගරු වේ යැයි කියන තැනට පත්වේ. හෙලීම හා තදකිරීම අනුව යන ආපෝ ධාතුව සමග පඨවි ධාතුව අතින් සම්පූර්ණවේ. එම නිසා එසවීම දන්නේ නම්, තෙජො ධාතුව දනී. යැවීම ගෙන යෑම දන්නේ නම් වායො ධාතුව දැනගනී. වොසජ්ජනය දනී නම් ආපො ධාතුව දැනගනී. පය හෙලීම, තද කිරීම දන්නේ නම් පඨවිය දනී" යැයි, යන මේ විශේෂයෙන් සලකා ගතයුතු)

එසවීමේදී එසවීමේ කැමැත්ත හා එසවීමේ ක්‍රියාව වශයෙන් පහළ වන නාම- රූප ධර්ම යැවීමේ අවස්ථාවට නොයයි. (**රූපාරූපා ධම්මාති උද්ධාරණාකාරෙන පවත්තා රූප ධම්මා, තං සමුට්ඨාපකා අරූප ධම්මෙමාච**, = රූප - නාම ධර්මයන් යනු එසවීමේ ක්‍රියාව හා යෙදෙන රූප ධර්මයන් හා එම එසවීමේ රූපයන් ඇති කරවිය හැකි එසවීමට කැමැත්ත නම් වූ නාම ධර්මයන්මය. (එම ටීකා) එලෙසටම යැවීමේදී පහළ වන නාම- රූප විතිහරණ අවස්ථාවට පත්නොවේ. *වොස්සජ්ජනයෙදී* පහළ වන නාම-රූප *සන්නික්ඛෙපයට* පත් නොවේ. *සන්නික්ඛෙපයේදී* පහළ වන නාම රූප *සන්නිරුම්භනයට* පත්නොවේ. මෙලෙස ඒ ඒ අවස්ථාවන්හිම පව්-පව් වශයෙන් සන්ධි-සන්ධි වශයෙන් , කොටස් කොටස් වශයෙන් (පුරුක්- සන්ධි- කොටස් වෙන්, වෙන්ව) ඇතිවෙමින් විනාශ වෙත්. උපමාවක් ලෙසඃ රත්ත තප්ත වූ යකඩ කබලකට දමනලද තල ඇට පට-පට ශබ්දයෙන් බිඳී පිපිරී යන්නා සේය. මෙලෙස විනාශ වෙමින් යන රූප- නාමයන් මිස ඉදිරියට යන කවරෙකු නම් සිටිය හැක්කේද? ඉදිරියට යෑම කවරකුගේ

ක්‍රියාවක් විය හැක්කේද? තමාම වර්‍තමාන වශයෙන් දතයුතු පරමාර්ථය: සාරාර්ථ වශයෙන් සත්ත්වයෙක්, මමෙක් නොවන ධාතු ස්වභාවයන්ගේ ගමනක්ම වේ. ධාතු ස්වභාවයන්ගේ සිටීම, හිඳීම, හොවීමම වෙත්. මෙලෙස යෑම ආදී අවස්ථාවන්හිදී රූප හා සමඟගම: "එක් සිතක් නිරුද්ධවේ. අනෙක් සිතක් පහළ වේ. ගඟ දියක් ලෙස සිත් සන්තතිය අතරක් නොතබා සම්බන්ධ වෙමින් ගලයි" යන ලෙසට දක්වූ ක්‍රමයෙන් ඉදිරියට යෑම ආදියෙහි *අසම්මෝහව* තත්ත්වාකාරයෙන් දැනීම *අසම්මෝහ සම්පජඤ්ඤය* නම් වේ.

ඉහත දැක්වූ අට්ඨකථාහි "ඉදිරියට යන්නෙමියි යන සිත පහළ වන්නේ නම් එම සිත හා සමඟ *චිත්තජ වායො ධාතුව* තෙමේ *විඤ්ඤත්තීන්* පහළ කරමින් පහළ වෙත් " ආදී වූ මෙවැනි කථාවක් *සමථ චතුධාතුවවත්ථාන භාවනාව* හා නොබැඳේ. *විපස්සනා* හා සමග පමණක් සම්බන්ධ වේ. " එසවීමේදී පහළවන රූපයන් යැවීම අවස්ථාවට පත්නොවේ" යනාදී කථාවන් විපස්සනා භාවනාව හා සම්බන්ධ ස්ථානයන් ම ප්‍රකට ලෙස දක්වයි. මක්නිසාද යත්: එවැනි ඥාණයන් සමථ යොගීන්ට පහළ නොවන අතර විපස්සනා යොගීන්ටම පමණක් පහළ වන නිසාය. එම නිසා ඉහත සඳහන් *අට්ඨකථා* දැක්වීම් *ගොචර සම්පජඤ්ඤය'* නම් වූ විපස්සනා ඥාණ මුහුකුරා යෑම නිසා සම්මොහ නොවී තීරණ කරන විශේෂ විපස්සනා ඥාණ පහළ වන ආකාරයන් දක්වන්නේ යැයි සළකා ගත යුතුය. **ධාතූනං ගමනං** ආදියෙහි **ධාතු** ශබ්දයද **අත්ත, සත්ත, ජීව**, යන මේවාට ප්‍රතිපක්ෂ බව දක්වයි. එම නිසා "**නා නා ධාතු විනිබ්භොග**" යැයි කියන තැන මෙන් සාමාන්‍ය රූප-නාමයන් ධාතුන් වශයෙන් ගැනීමද වටී. විපස්සනා වශයෙන් භාවනා කරන යෝගියා යන අවස්ථාවේ ආදියෙහි අධිකවූ පඨවි ධාතු ආදියෙහි ප්‍රකට වීම බහුල නිසා මෙම පඨවී ආදී හතර මහා ධාතුන්ම වැටහේ යැයි ගැනීම ගැළපෙන්නේමය. **අට්ඨි සංඛාතො** යන පදය වනාහි *අට්ඨකථාවන්හි* එක ලෙසටම (සමානව) භාවිතා කරේ. නමුදු"විපස්සනා භාවනා කරන්නාට අට්ඨික ප්‍රඥප්තිය ඉබේ ප්‍රකට වේ. එම ප්‍රඥප්තිය දන්නා ඥාණය පහළ වේ යැ"යි ද නොගැනිය යුත්තකි. *අට්ඨික* යැයි කියා භාවනා කරන සමථ යෝගීන්ට යන්නෙමියි සිතන සිත ආදිය දන්නා ඥාණ පහළ වේ යැයි නොගත යුත්තකි. එම නිසා **රූප සංඛාතො** යන පදය අට්ඨකථාචාර්යයන් වහන්සේලා ලියුවේ නම් මුල් පාළිය හා වඩා ගැළපේ. **අට්ඨි සංඛතො** පදයම මුල් පාළිය සමග යන්නේ නමුත් "අට්ඨිකය ප්‍රකට වේ. අට්ඨිකය දනී" යන තේරුම වනාහි නොගැළපෙන්නේය. ආශ්වාද පක්ෂය ඉක්මවා

ආදීනව ප්‍රකට කිරීමේ අදහසින් 'රූප සමූහයක්' යැයි දැනවීම පිණිස 'අට්ඨි සමූහයක්' යන්න හුදු රූපක ආකාරයෙන් දැක්වීමක් යැයි සළකා ගැනීම වටී.

සමහරෙක් ධාතුවවත්ථාන සමථ කොටසෙහි එන *චුණ්ණ මනසිකාර* ක්‍රමය අනුව යමින් විපස්සනා කොටසෙහිදීද පය යවන අවස්ථාවෙහි ආදියෙහි අංශු අංශු වශයෙන් ගෙන මනසිකාරයට නැංවිය යුතුයි කියත්. එලෙස මනසිකාරයේ නොයෙදිය යුතු බව කලින් පැහැදිළි කර දක්වන්නට යෙදුනි. හේතුව වනාහිඃ පය යවන අවස්ථාවෙහිදී අධිකවූද, ප්‍රධාන වූද වායෝ ධාතුව පමණක් ප්‍රධාන කොට බැලීමම අට්ඨකථා හි දක්වා තිබීමයි. වායෝ ධාතුව යැයි කියන විට **විත්ථම්භන ලක්ඛණා, සමුදීරණ රසා, අභිනීහාර පච්චුපට්ඨානා** යන්න අනුව තෙරපීම, ආතතිය ආදී මූල සවභාවයන් ඇත්තේය. සෙලවිය හැකි ක්‍රියා ශක්තිය ඇත්තේය. කැමති තැනට තල්ලු කරන හැසිරීම් ආකාරයක් ඇත්තේය. එම නිසා යනවිට එයට ආධාර කරන, දරණ බව, චලන, තෙරපීම් ආදී ස්වභාව දත්තේ නම් පමණක් ලක්ඛණ, රස, පච්චුපට්ඨාන වශයෙන් ප්‍රධාන ලෙස ඇති වායො ධාතුව තත්ත්වාකාරයෙන් දැන ගැනීම වන්නේය. අංශු වශයෙන් දැන ගැනීම වනාහි *චුණ්ණ පඤ්ඤත්තිය* පමණක් දැන ගැනීම නම් වන්නේය. එම වායො රූපයම හෝ වේවා වෙනත් රූපයන් හෝ වේවා ලක්ඛණාදිය වශයෙන් තත්ත්වාකාරයෙන් දැනගත්තා නොවන්නේය.

සිටින, හිඳින, හොවින, ඉරියව්වලදී **ඨිතො වා ඨිතොම්හීති පජානාති** ආදී සතිපට්ඨානය පාළියට අනුව "සිටියි, හිඳියි, නිදයි" යයි මෙනෙහි කළ යුතු වේ. සති- සමාධි ඤාණ බලවත් වූ විට සිටීමට කැමති සිත හා සිටින ඉරියව්වට ආධාර කරන, දරන, වායො රූපය, හොවීමට කැමති සිත හා හොවින ඉරියව්ව දරන වායෝ, පඨවි රූපයන් ප්‍රධාන කොට ප්‍රකටව දත හැකිවන්නේය. මෙහිලා මනසිකාරය නොපවත්වන සාමාන්‍ය පුද්ගලයෙකුගේ දැන ගැනීම හා විපස්සනා යොගියාගේ දැනීම විශේෂ වන බව, වෙනස් වන බව *ඣාන විභංග අට්ඨකථාහී* මෙලෙස දක්වයි.

එකො හි භික්ඛු ගච්ඡන්තො අඤ්ඤං චින්තෙන්තො අඤ්ඤං විතක්කෙන්තො ගච්ඡති, එකො කම්මට්ඨානං අවිස්සජ්ජෙත්වා ව ගච්ඡති, තථා එකො තිට්ඨන්තො නිසීදන්තො සයන්තො අඤ්ඤං චින්තෙන්තො අඤ්ඤං විතක්කෙන්තො සයති, එකො කම්මට්ඨානං අවිස්සජ්ජෙත්වා සයති [වි. අ. 256]

එකො භිකඛු = (එක්) භික්ෂුවක්

ගචඡනෙතා = යන්නේ

අඤඤං චිනෙතනෙතා = අනෙකක් සිතමින්

අඤඤං චිනතෙකනෙතා = අනෙකක් විතීකනය කරමින්

ගචඡති = යයි

එකො = (එක්) භික්ෂුවක්

කමමටඨානං අවිසජෙජතවාව = කමටහන අත නැර

ගචඡති = යයි

එකො = (එක්) භික්ෂුවක්

තිටඨනෙතා = සිටින්නේ

නිසීදනෙතා = හිඳින්නේ

සයනෙතා = හොවින්නේ

අඤඤං චිනෙතනෙතා = අනෙකක් සිතමින්

අඤඤං චිනතෙකනෙතා = අනෙකක් විතර්ක කරමින්

තිටඨති = සිටී

නිසීදති = හිඳී

සයති = හොවී

එකො = (එක්) භික්ෂුවක්

කමමටඨානං අවිසසජෙජතවාව = මෙනෙහි කරන කමටහන අතනොහැර

තිටඨති = සිටී

නිසීදති = හිඳී

සයති = හොවියි.

සමපපජඤඤ මෙනෙහි කරන ආකාරය

අභිකකනෙත- පටිකකනෙත සමපජානකාරී හොති- යන පාළියට අනුව ඉදිරියට යන්නේ ඉදිරියට චලනය වන්නේ, නැවත පැමිණෙන්නේ, ආපසු එන්නේ පැත්තට පැද්දෙන්නේ - නවන්නේ, දිග හරින්නේ "යනවා-ඉදිරියට සෙලවේ - එනවා ආපසු එනවා. පැද්දෙනවා නවනවා, දිග හරිනවා යැයි

මෙනෙහි කළ යුතුය. සමාධිය බලවත් වූ කල, යෑමට කැමති සිත සෙල වීමට කැමති සිත, ආදිය සමග යෑම, සෙලවීම, ආදී ඉරියව් වශයෙන් චලනය කරන වායෝ රූපයන් ප්‍රධාන කොට ප්‍රකට වනු ඇත.

ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති

කෙළින් බැලීම, පැත්ත බැලීම, බිම බැලීම, උඩ බැලීම, ආපසු හැරී බැලීම ආදියෙහිදී "බලනවා" යයි මෙනෙහි කළයුතුය, නැතිනම් "දකියි - දකියි" යැයි මෙනෙහි කළ යුතුය. මෙලෙස මෙනෙහි කොට දැන ගැනීමෙන්ම, *විපස්සනා කම්මට්ඨානය* අත නොහැර වැඩීම වන නිසා *ගොචර සම්පජඤ්ඤය* නම් වේ.

කම්මට්ඨානස්ස පන අවිජහන මෙව ගොචර සම්පජඤ්ඤං, තස්මා ඛන්ධ ධාතු ආයතන කම්මට්ඨානිකෙහි අත්තනො කම්මට්ඨාන වසෙනෙව කසිනාදිකම්මට්ඨානිකෙහි වා පන අත්තනො කම්මට්ඨාන සීසෙන වා ආලොකන විලොකනං කාතබ්බං [දී. අ. 1/135]

කම්මට්ඨානස්ස	=	විපස්සනා කර්මස්ථානය සමථ කර්මස්ථානය
අවිජහන මෙව	=	අත නොහැරීමම
ගොචර සම්පජඤ්ඤං	=	ගොචර සම්පජඤ්ඤය නම්වේ.

(සති,සමාධි, ප්‍රඥාවන්ට ගොචර වන අරමුණ දැනගැනීම යැයි කියනු ලැබේ.)

තස්මා	=	එමනිසා
ඛන්ධ ධාතු ආයතන කම්මට්ඨානිකෙහි	=	ස්කන්ධ ධාතු ආයතන මත භාවනා කරන විපස්සනා යෝගී පුද්ගලයා
අත්තනො කම්මට්ඨාන වසෙනෙව	=	තමාගේ කර්මස්ථානය වශයෙන්ම
ආලොකන විලොකනං	=	කෙළින්ම බැලීම, පැත්ත බැලීම
කාතබ්බං	=	කළ යුතුවේ.
කසිනාදි කම්මට්ඨානිකෙහි වා පන	=	කසිනාදි කර්මස්ථානයන්හී යෙදී ඇති සතිය වනාහි

අත්තනො කම්මට්ඨාන සීසෙනෙව	=	තමාගේ සමථ කම්මට්ඨාන ශීර්ෂයෙන්ම (=ගරු කරමින්ම)
ආලොකන විලොකනං	=	කෙළින් බැලීම පැත්ත බැලීම
කාතබ්බං	=	කළයුතුවේ.

සිංහල අර්ථය

සමථ භාවනා කරන්නා යමක් බලන්නට කැමති නම් තම කම්ස්ථානය ඉවතලා ඒ දෙස නොබැලිය යුතුයි. කිරි වස්සකු ඇති දෙන වස්සා වෙත ඇසක් තබාගෙනම තණ කන්නා සේ තමාගේ කමටහනට ගරු කරමින්ම, මනසිකාරය යොදමින්ම බැලිය යුතුය. විපස්සනා යොගී වනාහි කොයි දේත් විපස්සනාවට අරමුණු විය හැකි නිසා, බලන්නේ නම් එම බලන සිත මෙනෙහි කිරීම් වශයෙන් නාම ස්කන්ධ හතර, නාම ආයතන දෙක, නාම ධාතු දෙක දැනගන්නා විපස්සනා ඥාණය පහළ විය හැක්කේය. එම සිත නිසා පහළ වන ඇස ඇරීම. ඇස හැර වීම, හිස යොමු කරවීම ආදී ඉරියව් මෙනෙහි කිරීම වශයෙන්ද රූප ස්කන්ධ, ආයතන, ධාතුන් දැනගන්නා විපස්සනා ඥාණ පහළවිය හැක්කේය. දකින සිත ආදිය මෙනෙහි කිරීම මගින්ද ස්කන්ධ පහ, ආයතන හතර, ධාතු හතර දැනගන්නා විපස්සනා ඥාණ පහළ විය හැක්කේය. දිගට සළකා බැලීම සිදුවන්නේ නම් එම සළකා බැලීම මෙනෙහි කිරීම මගින්ද ස්කන්ධ, ධාතු. ආයතන, දැනගන්නා විපස්සනා ඥාණ පහළ විය හැක්කේය. දැකීමට කැමැත්ත ආදියෙහිදී සමථයෙහිදී මෙන් විපස්සනා අරමුණ විශේෂිත එකක් නොවේ. එම නිසා තමාගේ කමටහන වශයෙන් පමණක් දැකීම කළ යුතුයැයි උපදෙස් දෙයි. සමථ යොගියකු මෙන් තම කම්මට්ඨානයට මනසිකාරය වරක් යොදයි. ඒ අනුව කමටහන වඩයි යන ක්‍රමයට විශේෂ කිරීමක් මෙහි නොමැත. ඒ වෙනුවට මතුවන මතුවන රූප-නාම පුරුදු මෙනෙහි කිරීම අනුව මෙනෙහි කරමින් බැලිය යුතු යැයි කියැවේ. මෙලෙස මෙනෙහි කිරීම මගින් ඥාණය බලවත්වූ විට බැලීමට කැමති සිත හා ඇස ඇරීම හිස හැරවීම ආදිය වශයෙන්ද ඉරියව් වශයෙන් බලන තෙරපීම කරන වායො රූපය ප්‍රධාන කොට දැන ගනු ඇත.

සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති

අත පය ආදිය නවන විට "නවනවා-නවනවා" යයි මෙනෙහි කළයුතුය. දිග හරින්නේ "දිගහරිනවා - දිගහරිනවා" යැයි මෙනෙහි කළ යුතුය. "වනවන්නේ, ගසන්නේ, තල්ලු කරන්නේ, අදින්නේ, සොලවන්නේ" "වනවනවා, ගසනවා, තල්ලු කරනවා, අදිනවා, සොලවනවා" යැයි මෙනෙහි කළයුතුය. ඔසවනවා, ඉහළට තල්ලු කරනවා, පහත් කරනවා නම් ඒ ඒ ක්‍රියා අනුව "ඔසවනවා, ඉහළට තල්ලු කරනවා, පහත් කරනවා" යැයි මෙනෙහි කළ යුතුය. ඤාණය බලවත් වූ විට නැවීමට හෝ දිග හැරීමට කැමති සිත = මනින්ද්‍රිය හා නැවීම්, දිග හැරීම්, ඉරියව් වල චලන, තෙරපන වායෝ රූපයන් ප්‍රධාන කොට ප්‍රකට වනු ඇත. මේ නැවීම් - දිගහැරීම් ආදියෙහි *ගොචර සම්පජඤ්ඤය* සිදුවන ආකාරය සම්බන්ධ සාධක කථාවස්තුන්ද සමග අටුවාකථා හි දක්වයි.

කථා වස්තුන් වනාහි

මහාථෙර නමක් ශිෂ්‍යයන් සමඟ කතාකරමින් සිටින අතර වහාම තම අත නවා, නැවත තිබුණ තැනටම ගෙන සෙමින් සෙමින් නැවත නැමුවේය. එම අවස්ථාවෙහි ශිෂ්‍යයෝ ස්වාමීන් වහන්ස අත කුමක් නිසා තිබුණ තැනට නැවත ගෙන සෙමින් සෙමින් මෙසේ නැමුවේදැයි ප්‍රශ්ණ කළෝය...එවිට එම මහා ථෙර නම , මම භාවනාව ආරම්භ කළ කාලයේ පටන් කමට්ඨානය අතහැර නොදමූ විරූය. කමටහනින් තොරව අත නැමීම නොකළ යුත්තකි. දැන් වනාහි ඔබලා සමග කථා කරමින්ම කමටහනින් තොරව අත නැවුවෙමි. එම නිසා තිබුණු තැනටම අත නැවත ගෙනගොස් සතියෙන් සෙමින් නැවුවෙමියි ප්‍රකාශ කළේය. එවිට ශිෂ්‍යයන් කොච්චර හොඳද? ස්වාමීන් වහන්ස, භික්ෂුවක් නම් මෙලෙස වූ හැසිරීම් ස්වභාව තිබිය යුතුයැයි ප්‍රකාශ කළාහුය.

මේ කථා වස්තුවේ නවන- දිගහරින වතාවේ මෙන් කමටහන අතනොහැර "නවනවා-නවනවා" දිගහරිනවා-දිගහරිනවා" යැයි මෙනෙහි කිරීමෙන්, නවන්නට- දිගහරින්නට කැමති සිත හා නවන, දිග හරින ක්‍රියාව වශයෙන් ක්‍රම- ක්‍රමයෙන් මොහොතින් මොහොත චලනය වන - රූපයන් දැන ගැනීම *ගොචර සම්පජඤ්ඤය* නම් වේ. එම *සම්පජඤ්ඤය* දියුණු වූ විට සන්තානයේ නැවීම කළ හැකි දිගෑරීම කළ හැකි මමෙක් යන්න වනාහි නොමැත්තේය. නැවීමේ- දිග හැරීමේ කැමති සිත අනුව

ක්‍රම ක්‍රමයෙන් ඉරියව්වෙන් ඉරියව්ව පහළ වන චලනයන් පමණක්ම ඇත්තේය. නැවීමට, දිගහැරීමට කැමති සිත වනාහි නැවීම දිග හැරීම ක්‍රියාව තෙක් හෝ නොපැමිණම නිරුද්ධවේ. නැවීම - දිගහැරීම ක්‍රියාවලියන්ද පියවරකින් පියවරකට මාරුනොවී හමාර වන්නාහ. අනිත්‍යය ධම්ම පමණකි. දුක්ඛ ධම්ම පමණකි. අනාත්ම ධම්ම පමණකි. මමෙක් නොමැති හුදු ධම්යම පමණකි යැයි තමාටම විශ්වාස ලෙස වැටහෙන, තීරණය කරන විශේෂ ඤාණ පහළ වේ. මේ ඤාණය *අසම්මොහ සම්පජඤ්ඤය* නම් වේ.

"නවනවා - දිග හරිනවා" යැයි මෙනෙහි කරන්නේ නම් එම නාම ප්‍රඥප්ති හා නවන- දිග හරින අත පය සණ්ඨාන ප්‍රඥප්තීන් දැනගැනීම පමණක් නොවන්නේද? ඇත්තය.

භාවනාරම්භයේදී නම් නාම ප්‍රඥප්ති- සණ්ඨාන ප්‍රඥප්තීන් අනුව මෙනෙහි කරයි. චලනය වන වායෝ ධාතුවද දැනගනී. මෙලෙස සියලු ආකාර දැනගැනීම වන්නේය. නමුදු සති- සමාධි ඤාණ බලවත් වූ විට වනාහි එම ප්‍රඥප්තීන්ට අනුව සිත නොයොදා නැවීම - දිග හැරීමට කැමති සිත හා චලන ක්‍රියාවලිය පියවරෙන් පියවර මතුවෙමින් නැතිවෙමින් යෑම දැන ගනිමින් තනිකර විපස්සනා ඤාණයම පිරිසිදුව පහළ විය හැක්කේය. මෙවැනි වූ අර්ථයක් මේ පරිච්ඡේදයේ මුලදීද සඳහන් කළේය.

සංඝාටි, පත්ත, චීවර ධාරණෙ සම්පජානකාරි හොති

ඇඳුම්, සිවුරු ආදිය හඳින, පොරවන අවසථාවෙහිදී "හඳිනවා - පොරවනවා" යනාදි ලෙසට මෙනෙහි කළයුතුයි. පාත්‍රය, කෝප්පය, පිඟාන, හැඳි ආදි පරිභෝග කරන වස්තු යමක් ගැනීමක්, ඇල්ලීමක්, පාවිච්චි කිරීමක් කරන්නේ නම් "අල්ලනවා- ගන්නවා- දමනවා" යන ලෙසට මෙනෙහි කළ යුතුවේ. ඤාණය බලවත් වූ කල, හැඳීමට, පැළඳීමට, ගැනීමට කැමති සිත ආදිය හා එම සිත් නිසා පහළ වන චලන වායෝ රූපයන් ද හැපෙන පොට්ඨබ්බ රූප, හා හැපීම දැනීම නම්වන *කාය විඤ්ඤාණ* ආදියද ප්‍රධාන වී ප්‍රකටව පැනෙනු ඇත.

අසිතෙ, පීතෙ, ඛායිතෙ, සායිතෙ සම්පජානකාරි හොති

අනුභව කරන්නේ, බොන්නේ, හපන්නේ, ලෙවකන්නේ, ගිලින්නේ, "කනවා- බොනවා- හපනවා- ලෙවකනවා- ගිලිනවා" යැයි මෙනෙහි කළ යුතුය. ඤාණය බලවත්වූ කල කෑමට කැමති සිත ආදිය හා කැමති

කුඩා ඉරියව් ආදී වශයෙන් චලනය කරන, තෙරපන. වායෝ රූපයන්ද රස රූප, රස දැනීම නම් වූ ජිවහා විඤ්ඤාණය ආදිය ප්‍රධාන කොට නිසැක වනු ඇත. සමහරෙක් වනාහි *අසම්මොහ සම්පජඤ්ඤය* පහළ වන ආකාරය දක්වන අට්ඨකථා ක්‍රමයටම මෙනෙහි කොට සළකා බැලීම් මඟින් පමණින් විපස්සනාව සිදුවේ යැයි කියත්. එම කථාව ආහාරෙ පටික්කූල සංඥාව මගින් *අසම්මොහ සම්පජඤ්ඤය* පහළ වන ආකාරය දක්වන අට්ඨකථා සමග ගළපා බැලිය යුතු. ආහාර සඳහා යෑම, සොයා යෑම, පරිභොග කිරීම, පිත, සෙම, සැරව, ලේ, යන දේවල් සහිත ස්ථානයන් හී මිශ්‍රවී ආහාර පිහිටීම ආදි දස ආකාරයට ආහාරයෙහි පටික්කූල බව සළකා බැලීම සමථ *අසම්මොහ සම්පජඤ්ඤයම* වේ මැයි.

තවත් ආකාරයකට දක්වතොත් අනුභව කරන කරන වාරයේ හපනවා- විකනවා - ගිළිනවා - දනෙනවා" ආදී වශයෙන් මෙනෙහි කරන *ගොචර සම්පජඤ්ඤය*, දියුණුව ආවිට ආහාරයෙහි ප්‍රිය මනාප නැති බව, පිළිකුල් බවක්, සමහර පුද්ගලයන්ට මතුවේ. කෑම- බීම පිළියෙල කරන අවස්ථාවේ පටන් මෙනෙහි කොට කෑම- බීම ගන්නා විට, ආහාරයෙහි පිළිකුල් බව ප්‍රකට වී එයි. මහ දුකක් ලෙසට ප්‍රකටවේ. එලෙස වූ ඇත්තන් කෑම ගන්නා විට බඩ පිරෙනතාක් නොගෙන අතර මග නතර කොට මෙනෙහි කරමින්ම සිටී. මෙලෙස වන්නාවූ පුද්ගලයන් අද කාලයේද දැක ඇත්තෙමු. සමහර ඇත්තන්ට භාවනාව මෝරා නොමැති නමුදු මෙනෙහි කරමින්, මෙනෙහි කරමින් අනුභව කරමින් සිටින විට ආහාරයේ පිළිකුල් බව පහළ වේ. එම නිසා ආහාර ගැනීමට අකමැත්තක්ද පහළ කරයි. (මෙහිලා ආහාරය අසුචි ලෙස පිළිකුල් කොට සැලකීම *සම්පජඤ්ඤය* නොවේ. *දෝමනස්සයම* වේ) මෙලෙස ගෝචර සම්පජඤ්ඤව බලවත් වූ කල ඉබේම මෙන් ආහාරයෙහි පිළිකුල් සංඥාව පහළ විය හැකි නිසා අට්ඨකථාචාර්යන් වහන්සේලා එයද එසේ *අසම්මොහ සම්පජඤ්ඤයෙහි* ඇතුළත් කොට දක්වීම ගැළපේ.

උච්චාර පස්සාව කම්මෙ සම්පජානකාරී හොති

මළ- මූත්‍ර පිටකිරීමේදී "පහකිරීම්" වශයෙන් මෙනෙහි කළ යුතුය. *විපස්සනා* යන්න උසස් පහත් ලෙස නොතේරිය යුතුවේ. පහළ විය හැකි රූප- නාමයන් සියල්ල අත නොහැර මෙනෙහි කොට භාවනා කළ යුතු වේමය. ඤාණය මුහුකුරා ගිය කළ පහකරණ සිත- පිටවන රූප, එහි පහස ලබන විඤ්ඤාණය, දුක්ඛ වේදනා ආදිය ප්‍රධාන කොට ප්‍රකට වනු ඇත.

ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවේ සම්පජාන කාරී හොති.

යෑමේ, සිටීමේ, හිඳීමේ, ආදියෙහි අමුතුවෙන් කිවයුත්තක් නැත. නිදාගැනීමට කැමති නම් "නිඳුට කැමැත්ත - ඇස් බරයි - හිස බරයි - නිදි බරයි" ආදි ලෙසට මෙනෙහි කළ යුතුවේ. තදින් නිඳ කැමති අවස්ථාවේ. "ඇලවේ - හිඳියි - නිදයි" ආදි ලෙසට ප්‍රකට රූප -නාමයන් මෙනෙහි කරන්න. මෙනෙහි කිරීම අත නොහැරිය යුතුය. මෙනෙහි කරමින්ම නිඳුට යායුතුය. අවධි වූ විට පහළ වන ප්‍රථම සළකා බලන සිත පටන් "අවදි විය" යැයි මෙනෙහි කළ යුතුවේ. ආධුනිකයන්ට වනාහි මෙසේ මෙනෙහි කිරීම දුෂ්කරය. එලෙස මෙනෙහි කළ නොහැකි නම් සතිමත් වූ තැන පටන් අතරක් නොතබා මෙනෙහි කරන්න. ඥාණය බලවත් වූ කළ අවදි වූ තැන පටන් මෙනෙහි කොට දැනගත හැකි වන්නේය. එම අවස්ථාවේ නිඳුට පෙර නාම- රූපයන් නිඳ අවස්ථාවට නොගොස් විනාශ වන්නේය. මෙනෙහි කරන සළකා බලන, දකින, හැපීම ලබන ආදිය, කළ නොහැකි සිත් පහළ වීම නිඳ යැයි කියනු ලැබේ. එලෙස, නිදා සිටින විට ඇති නාම- රූපයන් ද අවදි වන තෙක් නොසිට විනාශ වේ. සිතන, මෙනෙහි කරනාදි වන තෙක් ක්‍රියා කළ හැකි සිත් පහළ වූ තැන් පටන් අවදි වී යැයි කියනු ලැබේ. නිදාගත හැකි හෝ අවදි විය හැකි මමෙක් හෝ සත්ත්වයෙක් හෝ නොමැත. නිච්ච- සුඛ බවක් නොමැති යැයි තමාටම වැටහෙන ඥාණය පහළ වේ. මේ ඥාණය *අසම්මෝහ සම්පජඤ්ඤය* නම් වේ.

කථා කරන විට "කථාවට කැමැත්ත - කථාව"යයි මෙනෙහි කළ යුතුය. එලෙස මෙනෙහි කිරීම පහසු නැත. එම නිසා වැදගත් යමක් නැති විට කථා නොකරම සිටීම වඩා හොඳය. ඥාණය මෝරා ආ විට කථා කිරීමට කැමති සිත එම සිත නිසා චලනය වන වායෝ රූප, පහර දෙන පඨවි රූප ප්‍රධාන කොට ප්‍රකට වනු ඇත. කථා කිරීම නතර කොට නිශ්ශබ්දව සිටින විට "නතර කිරීමට කැමැත්ත - නතර කිරීමට කැමැත්ත, නතර විය - නතර විය" යැයි මෙනෙහි කරන්නේ යට ප්‍රකට වූ රූප - නාමයන් මෙනෙහි කළ ලෙසටම මෙනෙහි කරන්න. ඥාණය මුහුකුරා ගියවිට කථාකරන විට ඇති රූප-නාමයන් කථාව නතර කරනා අවස්ථාවට පත්නොවී විනාශ වෙත්. නතර කිරීමට කැමති සිත හා- නිශ්ශබ්ද වූ රූපයෝද එම ක්ෂණයෙහි ක්ෂණයෙහිම විනාශ වේ යැයි තමාටම තහවුරු කරමින් ඥාණය පහළ වේ. මෙය *අසම්මෝහ සම්පජඤ්ඤයම* වේ.

බහිද්ධාව භාවනා කරන ආකාරය

යැමට කැමැත්ත - යැම ආදී මෙනෙහි කොට දැනගන්නා *ගොචර සම්පජඤ්ඤය* බලවත්ව මෝරා ආවිට යැමට කැමති සිත හා මොහොතින් මොහොත චලනය වන රූප සමූහයන් වෙන් වෙන්වම වන්නාහ. යැමට හැකි මමෙක්- සත්ත්වයෙක් නොමැත. "මම යන්නෙමි" යන කථාවද ව්‍යවහාර වශයෙන් කියන කථාවක් පමණි. ලොකයෙහි ඤාති නොවන නමුදු මාගේ බෑනා, මාගේ මුණුබුරා, මාමා, සීයා යැයි හුදු හැඳිනුම් කම සළකා සදාචාරාත්මකව කරන කථාවට සමානයැයි පැහැදිලි කරන *අසම්මොහ සම්පජඤ්ඤය* පහළ වී නම් "ඔහු යයි, ස්ත්‍රිය යයි" යනාදි කථාද හුදු කථා ව්‍යවහාර පමණකි. "යා හැකි සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් නොමැත්තේය. යැමට කැමති සිත, ක්‍රම ක්‍රමයෙන් චලනය වන රූප සමූහ පමණක් ඇත" යනාදි ලෙසට අනුන්ගේ සන්තානයන්හි ඇති රූප සමූහයන්ද තම සන්තානයේ ඇති රූප සමූහ මෙන්ම වටහා ගත හැකිය. සළකා බැලිය හැකිද වන්නේය. මෙලෙස බැලිම **බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති** යන්න හා සමවේ. අනුන්ගේ සන්තානයන්හි ඇති ධම් සන්තති එක එකක් වශයෙන් වෙන් වෙන්ව බැලීම අනවශ්‍ය බව පරිචෙඡද අංක 3හි 'විපස්සනාවේ අරමුණ' දක්වන තැන විස්තර කළේය.

අජ්ඣත්ත බහිද්ධා භාවනා කරන ආකාරය

සමහර විටක තම සන්තානයේ "යැමට කැමැත්ත- යැම" යැයි මෙනෙහි කොට තීරණය කරන්නාවූ ඤාණය හොඳින් පහළ වූ කල්හී එසේ පහළ වන පහළ වන අවස්ථාවේ අනුන්ගේ සන්තානයෙහිද මේ සවභාවයම යැයි තීරණය කරමින් තීරණය කරමින් භාවනා කරයි. එම අවස්ථාවෙහි අජ්ඣත්ත යෙහි වරක්, බහිද්ධා හි වරක් යන ලෙසට භාවනා කරමින් පවතින නිසා *අජ්ඣත්ත- බහිද්ධා* යන දෙකම එකට ගෙන මෙනෙහි කරනවා නම් වන්නේය. **"අජ්ඣත්ත බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති"** යන්න අනුවය.

සමුදය හා වය භාවනා කරන ආකාරය

යැමට කැමති සිත ආදිය හා යැමේ චලන ආදිය, ක්ෂණිකව ක්ෂණිකව ඇති වෙමින්- නැතිවෙයි. විනාශ වන ආකාරය මෙනෙහි කරන - කරන වාරයක් පාසා එසේ වටහා ගැනීම වනාහි *සමුදය* නම් වූ ඇතිවීමත්, *වය*

යන නැතිවීමත් වර්තමානව දැනගන්නා ඥාණයයි. භාවනා කරන අතර වාරයේ "හේතු ඇතිව මෙම රූප සමූහයන් පහළ වෙත්. නැති නම් පහළ නොවෙත් "යැයිද සිත ඇති විට පහළ වේ, නැති නම් පහළ නොවේ යැයිද "පෙර කම් ශක්තිය ඇතිනිසා පහළවේ. නැතිනම් පහළ නොවිය හැක්කේ "යැයි ද "නොදැනීම නම් වූ අවිද්‍යාව නොනිමි බැවින් පහළ වේ. නිම වූවිට පහළ විය නොහැක්කේ" යැයි ද "කැමැත්ත, ආසාව නොනිමි නාක් පහළ වේ. නිම වූ කළ පහළ නොවිය හැකි" යැයි ද "දැන් අනුභව කරන ආහාර නිසා පහළ වේ. නැති නම්, පහළ විය නොහැකි"යැයිද යන ආකාරයට දිට්ඨිය හා සූතය මිශ්‍රකොට මනා ලෙස වටහා ගැනීමද සමුදය-පහළ කරන්නාවූ ධර්මය, *වය*- බිඳි-බිඳි යන ධර්මය දැනගන්නා ඥාණය නම් වේ. **සමුදය ධම්මානු පස්සීවා වය ධම්මානු පස්සීවා කායස්මිං විහරති** යන පාළිය හා අනුකූල වේමය.

නියමාකාරයෙන් සතිය පහළ වීම

යැමට කැමැත්ත, යැම ක්‍රියාව ආදී වශයෙන් මෙනෙහි කරන වාරයක් වාරයක් පාසා පුද්ගලයෙක්- සත්ත්වයෙක් නැත, මමෙක් නැත, ස්ත්‍රියක්-පුරුෂයෙක් නැත, යන්නාවූ ඉරියව්ව ආදි වශයෙන් පහළ වන රූප සමූහයන් පමණක් ඇත්තේ යයි මෙනෙහි වන සතිය පහළ වේ. සංඛාර, ඝන, නිමිති, සංඛ්‍යාත, සණ්ඨාන, පඤ්ඤත්තිය ට නොගොස්, යැමට කැමති සිත ආදිය හා යැමේ ඉරියව්ව ආදී වශයෙන් ඇති රූප සවභාවයන් පමණක්ම මන, අතරක් නොතබා සතිය, ප්‍රකටව පවතී යැයි කියනු ලැබේ. එතරම් බලවත් වූ ඥාණය ඇතිවීමට පටන් ගත්තැන් පටන් සමහර ඇත්තන්, කය, හිස, අත, පය ආදිය ඇත්තටම ඇත්තේ දැයි පරීක්ෂා කර බලන්නේය. සළකා බලන්නේය. මෙලෙස තත්ත්වාකාරයෙන් දැන ගන්නා සතිය නිසා පසු පසු මෙනෙහි කිරීමේදී ඥාණය හා සතිය පියවරෙන් පියවර දියුණු භාවයට පත්වේ. බලවත් වේ. මෙනෙහි කරන කරන වාරයක් වාරයක් පාසා වරදවා වටහා ගැනීම දුරුවේ. **අත්ථි කායොති වා සති පච්චුපට්ඨිතා හොති** යන්න හා අනුකූල වේ.

කායානුපස්සනා කොටස නිමියේ යැ

වේදනානුපස්සනා

සුඛ වේදනා

සුඛං වා වේදනං වේදියමානො සුඛං වේදනං වේදයාමීති පජානාති යන්න අනුව කායික- චෛතසික සුඛය පහළ වී නම් "සුඛ යැයි, වින්දනය හොඳයයි, සැපයි, හොඳයි" යනාදි ලෙසට මෙනෙහි කළ යුතුවේ. වින්දනය හොඳ වශයෙන් ඇති සුඛ වේදනාව තත්ත්වාකාරයෙන් වටහාගනු ඇත. වටහා ගන්නා ආකාරය වනාහි දකින විට, හැපෙන විට, කල්පනා කරන විට මෙනෙහි කරන ආකාරය වශයෙන් යට සවිස්තර ලෙස දක්වන්නට යෙදුනි. සැප නම්, හොඳ නම්, "සැප - හොඳ" ලෙස දනී, යන මේ කථාව විපස්සනා ඤාණය නොමේරූ පුද්ගලයා විසින් වරදවා වටහා ගැන්මට ඇති ඉඩ සළකා අට්ඨකථා හි විශේෂයෙන් පැහැදිළි කරන්නට යෙදුනි. එම අට්ඨකථාව අනුව යමින් මේ පොතෙහි ද මෙසේ පැහැදිළි කරන්නෙමු.

උඩුකුරුව හොවින ළදරුවකු නමුත් කිරි උරණ අවස්ථාව ආදියේදී සැප විඳී නම් සැප බව දැනගන්නවා නොවේදැයි ප්‍රශ්ණයක් වන්නේ නම්: දන්නා බව නම් ඇත්තය. නමුදු එම දැනීම සළකා ඉහත සදහන් පාළිය බුදුපියාණන් වහන්සේ දේශනා කළා නොවේ. හේතුව වනාහි: එම ළදරුවාද, මෙනෙහි නොකරන සාමාන්‍ය පුද්ගලයකු ද සැපයක් පහළ වන පහළ වන වාරයේ කෙළින්ම නොදනිත්, අනෙකුත් දේවල් කල්පනා කරමින් කාලය නාස්ති වීම වැඩිය. වරින් වර දැනගන්නේ නමුත් ස්වභාව ධර්මයන් වශයෙන් නොදනිත්. "මට සැපයි, හොඳයි" යන ලෙසට තමා හා බැඳී දැනගනී. ක්ෂණික ක්ෂණික වශයෙන් ඒ ඒ අවස්ථාවේ දැනගන්නවා නොවේ. දිගින් දිගට වින්දනය ප්‍රකටවම ඇති විට පමණක් දැන ගනී. එම නිසා එම දැනීමට සත්වයා යන දිට්ඨිය නිම කළ නොහැක්කේය. තමා කල්පනා කරමින් සිටින බවක් දැන ගත නොහැක්කේය. එම දැනීම අරමුණු කොට ඔවුන්ගේ සන්තානයෙහි යළිත් (නැවත) දැනගන්නා විපස්සනාවද පහළ නොවේ.

එම දැනීම දිගට ඉදිරියට යෑමෙන් විපස්සනාව පහළ නොවේ. මේ ලෙසට විපස්සනා භාවනාවේ අරමුණක් ද විය නොහැක්කේය. හේතු ධර්මයන්ද නොවන නිසා කර්මස්ථානයක්ද නොවේ. විපස්සනාව හා සතිය ප්‍රධාන කරගත් දැනීමක් නොවන නිසා සතිපට්ඨාන භාවනාවද සම්පූර්ණ

නොවේ. එම නිසා ළදරුවකුගේ හෝ සාමාන්‍ය පුද්ගලයන්ගේ දැනීම් ප්‍රමාණ සළකා ඉහත සඳහන් දේශනාව දේශනා කළා නොවේ. අතරක් නොතබා මෙනෙහි කරමින් භාවනා කරන යෝගී තෙමේ වනාහී සැපයක් පහළ වූ පහළ වූ අවස්ථාවේ දැනගනී. පෙර දැක්වූ ක්‍රමයට ලක්‍ෂණ ආදිය වශයෙන් සවභාව ධර්‍මයන් පමණක් යයි දනී. පෙර පෙර සුඛයන් පසු පසු සුඛයන් සම්බන්ධ නොවී වෙන- වෙනමම, වෙන්- වෙන්ව නිරෝධ වන බවද දැනගනී. එම අවස්ථාවේ එකදිගට පැවැත්මක්, එක ඝනයක් යැයි වරදවා ගන්නා සන්තති ප්‍රඥප්තියට වනාහි වසාලීමට නොහැකි බැවින්, ආවරණය කිරීමට නොහැකි බැවින් අනිච්ච. දුක්ඛ, අනත්ත, වශයෙන් දැනගනී. එවැනි වූ ඤාණයට වනාහි සත්‍වයා යැයි වරදවා ගන්නා දිට්ඨිය බැහැර කළ හැක්කේය. මම යයි වරදවා වටහා ගැනීමද උදුරා දැමිය හැක්කේය. ඉරියාපථ මෙනෙහි කරන ආකාරය දැක්වූ තැන පැහැදිළි කළ ක්‍රමයට කම්මට්ඨානයක්ද වේ. සතිපට්ඨාන භාවනාවද වේ. එම නිසා එවැනි ඤාණයක්ම අදහස් කොට **සුඛං වා වේදනං** ආදී ඉහත සඳහන් දේශනාව බුදුපියාණන් වහන්සේ දේශනා කළ සේක. ඤාණය මුහුකුරා ගිය කල ඉහත දැක්වූ ආකාරයට දැනගන්නා නිසා "මට සැපයි-හොඳයි-සතුටුයි" ආදී කථාවන් ව්‍යවහාර යෙදුම් පමණකි, සැප විඳිය හැකි, හොඳ විය හැකි, සතුට ලැබිය හැකි මමෙක්, සත්ත්වයෙක් නොමැත්තේය. හොඳ අරමුණක් අරමුණු කොට එම මොහොතෙහි පහළ වූ සැප, හොඳ හෝ සතුට පමණක් ඇත්තේ යැයි දැන ගනී. නිශ්චය කරයි. එම නිසා

[දී. අ. 2/558]

වත්‍ථුං ආරම්මණං කත්‍වා වෙදනා වෙදියතීති සල්ලක්ඛෙන්තො එස 'සුඛං වෙදනං වෙදියාමීති'පජානාති තී වේදිතබ්බො යැයි අනුශාසනා කරයි.

වත්‍ථුං	=	සුඛය පහළවීම සඳහා සුදුසු අරමුණක්
ආරම්මණං කත්‍වා	=	අරමුණු කොට
වෙදනා	=	වින්දනය පමණක්
වෙදයතීති	=	විඳින්නේ යැයි
සල්ලක්ඛෙන්තො	=	මෙනෙහි කරන්නේ
එසො	=	මේ පුද්ගලයා

සුඛං වේදනං වේදයාමීති

පජානාතීති = සුඛ විඳැනයක් විඳී යැයි දැන ගන්නා තැනැත්තකු යයි

වේදිතබ්බා = දත යුතු

(මේ දැනගැනීම ලක්ඛණ..පෙ.. පදට්ඨානාදි සියල්ල අනුව සම්පූර්ණ දැනගැනීමකට වැටේ)

දුක්ඛ වේදනා

රිදුම්, කැක්කුම්, හිස තෝන්තු ගති, උණුසුම්- සිසිල් ගති, හිරි වැටීම්, වේදනා, කැසීම්, වෙහෙස ගති, ආදිය නොඉවසිය හැකි තාක් ශාරීරික දුෂ්කරතා, කායික දුක් යයි කියනු ලැබේ. එවන් කයෙහි දුක් වෙත් නම් එම වේදනාවන් හැපෙන අවස්ථාවේ මෙනෙහි කරන ආකාරය දක්වූ තැන පැහැදිළි කළ ලෙසටම "රිදුමක්-රිදුමක්" ආදි ලෙස වෙන වෙනම මෙනෙහි කළ යුතුය. සිත අසතුට, සිත අපහැදිළිකම, සිත් බර ගතිය, දෝමනස්සය, අසහනය, කනගාටුව, ශෝකය, බිය ආදී සිතෙහි නොඉවසිය හැකි තත්වයන් සියල්ල චෛතසික දුක්, දොම්ණස් සංඛ්‍යාත චිත්ත දුක්ඛයෝම වෙත්. ඒවාද සිත අසතුට, සිත අපහැදිළි කම, ආදී ලෙසට ව්‍යවහාරයේ පවතින ආකාරයට (වචනයක් යොදා) මෙනෙහි කළ යුතු වේ. සිතේ ප්‍රකට වීම, දැනගැනීම ආදිය, දැකීම- සිතීම ආදිය මෙනෙහි කරන ආකාරය දක්වන තැන මේ ගැන සවිස්තර ලෙස දක්වන ලදි. සමහරෙක් වනාහී රූප- නාම, පඨවි ධාතු, ආපො ධාතු, ඵස්ස, වෙදනා, සුඛ, දුක්ඛ, සොමනස් ආදි වශයෙන් බර පාළි වචන භාවිත කරමින්ම මෙනෙහි කරන්නේ නම් පමණක් පරමාර්ථ රූප- නාමයන් දත හැක්කේ යැයි වරදවා අදහාගනී. එය වැරැද්දකි. හේතුව වනාහි: ඇත්තටම ඇතිවෙන- නැතිවෙන ආකාරයෙන් මෙනෙහි කිරීම මෙහිලා වැදගති. ප්‍රඥප්තිය දැන ගැනීම වැදගත් දේ නොවේ. පැහැදිළි කොට දක්වතොත් පාළි ලියවිල්ලක් නම්, පාළි භාෂාව හොඳින් දන්නා තැනැත්තාට හොඳින් වැටහේ. නොදන්නහුට එතරම් ඵලයක් දිය නොහැක්කේය. තම මවු භාෂාව පමණක් වැටහෙන පුද්ගලයනට මවු බස භාවිතා කිරීමෙන් ප්‍රතිඵල අධිකය, සිතා බලන්න! රිදුමක් ඇති විට එම වේදනාවට සිත යොදා "රිදෙනවා-රිදෙනවා" යැයි මෙනෙහි කරන්නේ නම්, නොවිඳිය හැකි රිදුම හැපීම මෙනෙහි කරන ආකාරය දක්වන තැන

පැහැදිළි කළ ලෙසට ස්වභාව ලක්‍ෂණ ආදිය වශයෙන් තත්ත්වාකාරයෙන්ම දැනගන්නා තැනැත්තාට 'දුක්‍ඛා වෙදනා' යන, පාළි වචනයම මෙනෙහි කිරීමේදී නොයොදන්නේ නමුත් කුමණ පාඩුවක් සිදුවේද? පහළ වූ ඥාණය විනාශ වේද? විනාශ නොවේමය. මෙලෙස තත්ත්වාකාරයෙන් වටහා ගත දේ පාළි නමම යොදා දැනගැනීම අනුව ඥාණය විශේෂයෙන් හෝ දියුණු වේද? දියුණු නොවේමය. විපස්සනා ඥාණයන් මුහුකුරාගිය කල කුමන නාමක් හෝ භාවිතා නොකර ඉතා ප්‍රකට ලෙස ඇතිවෙමින්- නැතිවෙමින් පවතින රූප- නාමයන් දැන ගැනීම් මාත්‍රය අනුව යමින් වටහා ගතහැක්කේය. මෙලෙස, දැන ගැනීමෙන් විපස්සනා ඥාණය දියුණුවටම ගමන් කරයි. නොපිරිහේ. එම නිසා පාළි වචන කියවමින් මෙනෙහි කළ විට පමණක් පරමාර්ථ රූප - නාමයන් හොඳින් දත හැක්කේ යැයි සළකා ගැනීම සම්පූර්ණයෙන්ම වැරදි බව තදින් සළකා ගත යුතුවේ.

උපෙක්‍ඛා වේදනා

දුක්‍ඛ = හොඳැරිය හැකි දුකක් හෝ, **සුඛ** = සුඛයක් හෝ නොවී පවතින බැවින්, **අදුක්‍ඛම සුඛ** = 'දුකත් නොවූ සුඛත් නොවූ' යයි කියනු ලබන උපෙක්‍ඛා වෙදනාව වනාහි ප්‍රත්‍යක්‍ෂ ලෙස ඥාණයෙන් දැනගැනීමට පහසු නැත. අපහසුය. ප්‍රකට කර ගැනීමට අපහසුය. අවිජ්ජාව මෙන් ඇති දුෂ්කරම බව ම. නි. මූල පණ්ණාස චූල වෙදලල සුතත පාළි, අට්ඨකථාහිද දී. නි. පාථික වග්ග සංගිති සුතන පාළි අට්ඨකථාහි දක්වයි. උපරිපණ්ණාස බහු ධාතුක සුතන අට්ඨකථාහිදී උපේක්‍ෂාව අප්‍රකට බවද අවිද්‍යාව හා සමාන බවද කියයි. මෙහිලා සුතමය ඥාණයෙන් සලකා බලන්නා හට වනාහි උපෙක්‍ඛා, අවිජ්ජා යන දෙකම ප්‍රකට යැ, දැන ගැනීම පහසුවේ, යැයි කල්පනා කරයි. අප්‍රකටය. දැන ගැනීමට දුෂ්කර යැයි විශේෂයෙන් කිව යුත්තක් නැත. නමුදු තම සන්තානයේ ඇත්තටම පහළවෙමින් පවතින අවිජ්ජා උපේක්‍ෂා දෙක පච්චක්‍ඛ ඥාණයෙන් මෙනෙහි කරමින් භාවනා කරන යෝගීහට වනාහී අප්‍රකටය. දැන ගැනීම දුෂ්කරය. අවිද්‍යාව වනාහි ලෝභය, දෝෂය, මෙන් ප්‍රකට නැත, දැන ගැනීමට පහසු නැත. උපෙක්‍ඛාව වනාහි සුඛ, දුක්‍ඛ වශයෙන් ප්‍රකට නැති නිසා දැන ගැනීමට පහසු නැත. මෙය භාවනාමය පච්චක්ඛ ඥාණයෙන් දැන ගැනීමට අපහසු බැවින් එම ඥාණයේ අප්‍රකට බව සලකා පාළි- අට්ඨකථාවන්හි උපෙක්ඛා , අවිද්‍යා යන දෙක දැන ගැනීමට දුෂ්කරය, අප්‍රකට යැයි දක්වයි. එම නිසාම මහා

වග්ග සක්ක පඤ්හ සුත්ත අට්ඨකථා (දී. අ.2/518) මූල පණ්ණාස පතිපට්ඨාන සුත්ත අට්ඨකථා (ම. අ. 1/250) හි පහත සඳහන් ලෙසට දක්වයි.

අදුක්ඛම සුඛා පන දුද්දීපනා, අන්ධකාරාව අවිභූතා, සා සුඛදුක්ඛානං අපගමෙ, සාතාසාතාපටික්ඛෙපවසෙන මජ්ඣත්තාකාරභූතා අදුක්ඛම සුඛ වෙදනාති නයතො ගණ්හන්තස්ස පාකටා හොති.

අදුක්ඛම සුඛං පන = හොඳත් නැති නරකත් නැති මධ්‍යස්ථ උපේක්ෂා වේදනාව වනාහි.

දුද්දීපනා = මෙනෙහි කර භාවනා කරන ඤාණයෙන් ප්‍රකට කර ගැනීම දුෂ්කරය, දැනගැනීම අපහසු ය.

අන්ධකාර ඉව = අන්ධකාරය මෙන්, අඳුරේ ඇති වස්තු මෙන් (අන්ධකාරගත සදිසි - ටීකා)

අවිභූතා = මෙනෙහි කරන්නාට අප්‍රකටය

සුඛ දුක්ඛානං = සැප- දුක කෙරෙන්

අපගමෙ = දුරුවූ විට

සාතාසාතපපටික්ඛෙපවසෙන = සැප දුක් විඳීම් ප්‍රතික්ෂේප කිරීම් වශයෙන්,

වා = හොඳ නරක දෙකින් තොරවීම් වශයෙන්

මජ්ඣත්තාකාරභූතා = මධ්‍යස්ථ හැසිරීම් ස්වභාවය

අදුක්ඛමසුඛා වෙදනාති = උපෙක්ඛා වේදනාවම යැයි

නයතො = **මිගපද වලඤ්ජන** - මුව පාද අනුව යන ක්‍රමයෙන්

ගණ්හන්තස්ස = ගෙන මනසිකාරය යෙදෙන යෝගීහට

සා = එම උපේක්ෂාව

පාකටා = ප්‍රකට

හොති = වේ

දුද්දීපනාති ඤාණෙන දීපෙතුං අසක්කුණෙය්‍යා, දුබ්බිඤ්ඤෙය්‍යාති අත්ථො තෙනාහ අන්ධකාරාව අවිභූතා ති [දී. ටී. 472]

දුද්දීපනාති = දුද්දීපනා යන්න වනාහි

ඤාණෙන = භාවනා පච්චක්ඛ ඤාණයෙන්

දීපෙතුං = ප්‍රකට කොට දක්වීමට

අසක්කුණෙය්‍යතා = නොහැකිබව

දුබ්බිඤ්ඤෙය්‍යතා = දැන ගැනීමට දුෂ්කරය

ඉති = යන මෙය වනාහි

අත්ථො = දුද්දීපන පදයේ මතු කරදීමට කැමති අර්ථයයි

තෙන = එම නිසා

අන්ධකාරාව අවිභූතාති = (අන්ධකාරාව අවිභූතා යැයි)

ආහ = අට්ඨකථාහි දක්වයි. *

අට්ඨකථාහි දක්වන අර්ථය වනාහි සුඛ- දුක්ඛ වේදනාවෝ ප්‍රකටය. එය ප්‍රත්‍යක්ෂ වශයෙන්, ප්‍රකට ලෙස මෙනෙහි කොට දැනගත හැක්කේය. උපේක්ෂා වේදනාව වනාහි අන්ධකාරය මෙන්, අඳුරේ ඇති වස්තුමෙන් ප්‍රකට නොමැත. එය ප්‍රත්‍යක්ෂ ඤාණ වශයෙන් ප්‍රකට කරගැනීම පහසු නැත. දැන ගැනීම පහසු නැත. නමුදු සැපත් දුරුව දුකත් පහව ගිය කල, දුරුව ගිය එම සැප- දුක් ස්වභාවයන්ගෙන් ඈත්වූ මධ්‍යස්ථ ස්වභාවය උපෙක්ඛා වේදනාව යයි මිග පද වලඤ්ජන ක්‍රමයට අනුමාන වශයෙන් ගන්නා යෝගීහට එම උපෙක්ෂාව ප්‍රකට වේයැයි කියනු ලැබේ.

නිදසුනකට අනුව දැනගැනීම

මුව දඩයම්කරු මහ ගල්තලාවක එක පැත්තක මුවකුගේ එන පා සටහන්ද අනෙක් පැත්තෙහි යන පා සටහන්ද දැකීම මගින් මැද ගල්තලාව මත, පා සටහන් හමු නොවූ නමුත් "ගල්මත පා සටහන් නොපිහිටන බැවින් මෙහි මැද ගල්තලාව මත පා සටහන් හමුනොවූ නමුත් මුවා වනාහි දෙපැත්තේ දක්වෙන සටහන් අතර මැද මේ ගල් තලාවේම පා තබා හරහා ගමන් කළේයැ" යයි අනුමාන කොට දැනගන්නා ලෙසට යෝගී පුද්ගලයාද, වේදනා ආදී දුක් වේදනාවක් ඇති විට "වේදනාවක් -

* මෙ ටීකාව මගින් දුද්දීපන පදය 'දක්වීමට දුෂ්කරය', 'දැන ගැනීමට පහසුය' යන මේ අර්ථය නොගත යුතුය. භාවනාමය ඤාණයෙන් දක්වීමට පහසු නොවේ. දැන ගැනීමට පහසු නොවේ යන අර්ථය ගතයුතුයි දක්වයි.

වේදනාවක් " යයි මෙනෙහි කර මෙම දුක ප්‍රකටව දැනගනී. මෙනෙහි කොට වටහා ගන්නා අවසථාවෙහිම වේදනාදී දුක් වේදනා ක්‍රම ක්‍රමයෙන් සියුම් වී දුරුවීමද සිදුවේ. එවිට තිබුනු දුක් වේදනාවද අප්‍රකටය.සුඛ වේදනාවක්ද තවම මතු නොවීය.නමුත් අනෙකුත් චිත්ත චෛතසික ස්වභාවයන් වනාහි එකින් එක ප්‍රකට වෙයි. යෝගාවචරයා එලෙස ප්‍රකට ධම්යම මෙනෙහි කරමින් සිටී. ටික වේලාවකට පසු නැවතත් දුක් වූ වේදනාවක් වේවා, සුඛ වේදනාවක් වේවා ප්‍රකටවෙයි. එවිට, ප්‍රකට වූ එම සුඛ- දුක් වේදනා ඒ අනුව මෙනෙහි කරයි. එලෙස මෙනෙහි කරන්නහු වේදනාදී පෙර වූ දුක දුරුවූ පසු, නැවතත් දුක් හෝ සැප වේදනාවක් පහළ වීමට පෙර අතරවාරයේ මෙනෙහි කොට දත් චිත්ත- චෛතසිකයන්හි විඳනය වනාහි අප්‍රකට වන්නේ නමුත්, "සියුම් බැවින්ම එලෙස අප්‍රකට විය. යම් සේ ඉෂ්ඨ- අනිෂ්ඨ අරමුණු සුඛ- දුක් වශයෙන් විඳගන්නේද එලෙසින්ම මධ්‍යස්ථ අරමුණෙහි මධ්‍යස්ථ විඳනයක් දෙන වේදනා ඇත්තේමය. අරමුණු කරන ධම්ය වනාහි විඳනයකින් තොර නොවන බැවින් නිසා මධ්‍යස්ථ අරමුණක් අරමුණු කරන අවස්ථාවක් නිසා අප්‍රකටව පවතින එම වේදනාව උපේක්‍ෂාව යැයි වත්මානව ප්‍රකටව දැනගත යුතු හෙයින් සුඛ-දුකඛ වේදනාවන්ට සමානව දැනගනි. මෙලෙස මෙනෙහි කොට දැන ගැනීම මුවාගේ පියවර ලකුණු අනුව යමින් වටහා ගන්නා ක්‍රමය හා සමාන නිසා **මිග පද වළඤ්ජන නය** ක්‍රමයට අනුව දැනගැනීම යැයි අට්ඨකථා හි දැක්වේ. විපස්සනා භාවනා කරන විට වනාහි මෙහිදී "උපේක්‍ෂාව වනාහි අප්‍රකට නිසා දැනගැනීමට දුෂ්කරය" යන කථාව ආදිකම්මික යොගාවචර පුද්ගලයා අදහස් කොට කියන ලද කථාවක් වන්නේය. එසේ වතුදු තිකඛ පඤ්ඤ පුද්ගලයා හා බලව විපස්සනාවේ යෙදෙන පුද්ගලයනට මෙම උපේක්‍ෂාව ප්‍රකට විය හැක්කේය. එවිට මෙම උපේක්‍ෂාව ප්‍රත්‍යක්‍ෂ ඤාණයෙන්ම දැන ගත හැක්කේය. ප්‍රකට වන ආකාරය, දැන ගන්නා ආකාරය, දකින- සිතන අවස්ථා විස්තර කරන තැන දක්වන්ට යෙදුනි.

සාමිස සුඛ

ආසා කරන, මනාප වූ යුවති-පති, දූ- දරු, ඇඳුම්- කෑම- ගේ-දොර- වතු- මීහරක්- එලහරක්, එළු- අස්ස- රන්- රිදී යනාදියද තමාගේ රූපය, ඇස්, දැකීමේ සුඛය, දක්‍ෂභාව, යනාදියද හේතු කොට ගෙන සතුටු වීම

සාමිස සුවය යැයි කියනු ලැබේ. කාම ගුණ ආදිය සම්බන්ධ සුඛය යැයි කියනු ලැබේ. එයටම **ගෙහසිත සොමනසස** යැයිද කියනු ලැබේ. කාම ගුණ හෙවත් ගෘහාශ්‍රිත දේ මූලික කර ගත් සතුට යැයි කියනු ලැබේ. මේ සුඛය ලස්සන රූපයක් හේතු කොට ගෙන, යුවති- පති ආදී කාම ගුණ වස්තු අරමුණු කොට සතුටු වන අවස්ථාවෙහි 'රූපා රමමණයක් මුල්කර ගෙන'යයි කියනු ලැබේ. මිහිරි කට හඬක් ආදිය හේතු කොට ගෙන යුවති- පති ආදී කාම ගුණ වස්තු විෂයෙහි සතුටු වන අවස්ථාවෙහි 'සද්දාරමමණාදිය මුල්කරගෙන' යයි කියනු ලැබේ. එවැනි කාම ගුණ වස්තූන් වර්තමානව සමෘධ වීම අනුව සතුටු වීම සිදු විය හැක්කේය. පෙර අවස්ථාවක මුදුන් පත් වූ වින්දනයක් කල්පනා කොට, සිහිපත් කොටද සතුටු විය හැක්කේය. එම සතුටුවීම් පහළ වන අවස්ථාවෙහි "සතුටක් - සතුටක්" යයි මෙනෙහිකොට දැනගත යුතුයි. **සාමිසං වා සුඛං වෙදනං වෙදියමානො සාමිසං සුඛං වෙදනං වෙදියාමීති පජානාති** යන පාළිය හා සමවේ.

නිරාමිස සුඛ

දොරටු හයෙහි මතුවන අරමුණු හය අඛණ්ඩව මෙනෙහි කරන්නා ඥාණය බලවත් වූ කල එම අරමුණු සිතෙහි ඇති වීම- නැතිවීම වර්තමානව දැනගනිමින් සිටී. අනිත්‍ය ස්වභාවයද දැන දැකගනී. එම අවස්ථාවෙහි වර්තමානව දකින අරමුණ හා ගළපා ඒ අනුව දුටු පැරණි අරමුණු හයද, දැන් ලබන අරමුණුද අනිච්ච, දුකඛ, විපරිනාම ධම්යෝම යැයි දැක- දැන තීරණය කරයි. මෙලෙස දැක දැන ගන්නා තැනැත්තා මෙනෙහි කරන කරන වාරයේ සතුටට පත්විය හැක්කේය. මේ සතුට නිරාමිස සුඛය යැයි කියනු ලැබේ. කාම ගුණ ආදිය හා සම්බන්ධ නැති සුඛයක් යයි කියනු ලැබේ. එයම නෙකඛමම සිත සෝමනස්ස යැයි කියනු ලැබේ. උපරි පණ්ණාස සළායතන විභංග සූත්‍රයෙහි [ම. නි. 3/460] මෙලෙස දේශනාකොට ඇත්තේය.

රූපානං ත්වෙව. අනිච්චතං විදිත්වා විපරිණාමං විරාගං නිරොධං, පුබෙබ චෙව රූපා එතරහි ච, සබෙබ තෙ රූපා අනිච්චා දුකඛා විපරිනාම ධමමාති එවං මෙතං යථා භූතං සමමපපඤ‍ඤාය පසසතො උපපජ්ජති සොමනසසං, යං එවරූපං සොමනසසං ඉදං වුච්චති නෙකඛමමසිතං සොමනසසං

රූපානං = දකින පච්චුප්පනන වර්ණ රූපයන්ගේ

අනිච්චතං = අනිච්චතාවය,

විදිත්වාතු එව = දැන ගත්තෙහි නම්

විපරිණාමං = ප්‍රකෘති ආකාරයට නොවී, විපරිණාම වීම

විරාගං = නොපෙනී යෑම දුරුවී යෑම

නිරොධං = නිරෝධ වීම

විදිතවාතු එව = දැන ගත්තෙහිනම්

පුබ්බෙච එවරූපා = පෙරත් මෙසේම වී යැයිද

එතරහි ච රූපා = දැන් වර්තමානයේත් මෙසේම වේ යැයිද

සබ්බෙ තෙ රූපා = සියළු රූපයන්

අනිච්චා = නිත්‍යය නොවේ.

දුක්ඛා = දුක් වේ

චා = හොඳ නැතිය,

විපරිනාම ධම්මා = විපරිණාම වන ස්වභාවය ඇත්තේය

ඉති එව = මෙසේම

එතං = මෙම වර්ණ රූපයන්ගේ ස්වභාවය

සම්මප්පඤ්ඤාය = තත්ත්වාකාරයන් දැනගන්නා විපස්සනා ප්‍රඥාවෙන්

යථාභූතං පස්සතො = තත්ත්වාකාරයේ දැනගන්නා පුද්ගලයාට

සොමනස්සං = සොම්නසක්

උපපජ්ජති = උපදී

එව රූපං = මේ ස්වභාව ඇති

යං සොමනස්සං = යම් සොම්නසක්

අත්ථි = ඇත්තේද

එතං = එම සොම්නස

නෙක්ඛම්මස්සිතං

සොමනස්සං = විපස්සනාව මත පිහිටි සොම්නසයැයි

වුච්චති = කියනු ලැබේ.

(ඉතිරි අරමුණු පහ භාවනා කරන අවස්ථාවන්හි **නෙක්ඛම්මසිත සොමනස්ස** පහළ වන ආකාරය මේ ක්‍රමයටම දේශනා කරන ලදි)

මේ සතුට සොම්නස, උදයබ්බය ඤාණයට පත්වූ මුල්කාලයේ නතර කළ නොහැකි ලෙසට ඉතා ප්‍රබලව පැන නඟී. එය පහළ වන වාරයේ " සතුට-සොම්නස" යැයි මෙනෙහි කරන්න.

නිරාමිසංවා සුඛං වෙදනං වෙදියමානො නිරාමිසං සුඛං වෙදනං වෙදියාමීති පජානාති යන්න හා සමවේ.

සාමිස දුක්ඛ

කැමති වන්නාවූ ඇතුළත- පිටත කාමගුණ වස්තූන් සම්බන්ධයෙන් වර්තමානව සතුටට පත්නොවූ බව කල්පනා කරන්නහුට "මගේ මොන නරක කර්මයක් දැයි" කණගාටුවට පත්විය හැක්කේය. දුක්ඛ වේදනාවක් වර්තමානව ඉදිරි පත් වී පහළ වන කණගාටුවද මේ කථාවටම ඇතුළත්වේ. පෙර සමෘධ නොවූවක් කල්පනා කරන විටද පශ්චාත්තාපය පහළවිය හැක්කේ මෙලෙස කම්පනයක් ආවත්, සමෘධ නොවීම හේතු කොට පහළ වන කනගාටුවක්, අසතුටක්, සිත නරක් වීමක් , යන සියල්ල සාමිස දුකඛ නම් වේ. *ගෙහසිත දොමනස්ස* යැයි කියනු ලැබේ. මේ දෝමනස්ස පහළ වන වාරයක් වාරයක් පාසා සිත නරක් වීමක් යන සියල්ල සාමිස දුකඛ නම් වේ. *ගෙහසිත දොමනස්ස* යැයි කියනු ලැබේ. මේ දොම්නස පහළවන වාරයක්, වාරයක් පාසා "කණගාටුවක් - කණගාටුවක්" යයි මෙනෙහි කළ යුතුවේ. **සාමිසං වා දුකඛං වෙදනං -පෙ-පජානාති** යන්න හා සමවේ.

නිරාමිස දුකඛ

උදයබබය ඤාණ ආදී විශේෂ විපස්සනා ඤාණයන්ට පත්වූ පුද්ගලයා භාවනා කාලය දිග්ගැස්සෙන විට "ආර්යයන් වහන්සේලා විසින් දතයුතු මාර්ග- ඵලධර්ම කවදා නම් දැනගත හැකි වේ දැයි" කල්පනා කරයි. බලාපොරොත්තු සඵල නොවූ කල මාර්ග- ඵලයන් මේ භවයේදී ලබාගත නොහැක්කේ යයි කල්පනා කොට සිත දුර්වල කරගනී. ශෝක කරයි. කාලයක් භාවනා කොට විශේෂ විපස්සනා ඤාණ නොලද ඇත්තන්ටද පහළ වන මේ කණගාටුව නිරාමිස දුකඛ නම් වේ. **නෙකඛම්මසිත දොමනස්සය** නම්වේ. මෙය පහළ වන පහළ වන වාරයේ "කණගාටුවක්-කණගාටුවක්" යැයි මෙනෙහි කළ යුතුවේ. **නිරාමිසං වා දුකඛං -පෙ- පජානාති** යන්න අනුවයි. මේ නිරාමිස දුකඛය පහළ වන ආකාරය සකක පඤ්හ සූත්‍ර අටඨකථාහී මහාසිව ථෙර වස්තුව මගින් දක්වා ඇත. සංක්ෂේපයෙන් දක්වන්නෙමු.

මහාසිව ථෙර වස්තුව

මේ මහාථෙර වනාහි පන්ති 15 කට පරියත්ති ග්‍රන්ථයන් උගන්වමින් සිටින්නෙකි. මේ තෙරුන් වහන්සේ ගේ උපදෙස් අනුව භාවනා කොට රහත් භාවයට පත්වූ ශිෂයයන් තිස් දහසකට අධික විය. එම රහතන් වහන්සේලා අතරින් එක නමක් තමාගේ ගුණයන් සළකා බලා, මගේ ගුණයන් නම් අප්‍රමාණව කෙළවරක් නැතිව ඇත්තේය. මගේ ගුරුවරයාගේ ගුණයන් මොනවා දැයි සළකා බලන කල තවමත් පෘථග්ජන තත්ත්වයම වන බව දැක ගෙන අා! අපේ ගුරුවරයා අනුන්ට උදව් උපකාරකයකු වී නමුත් තමාට උපකාර කර ගැනීමට අසමත් වී සිටී යැයි, දකී. ඔහුට උපදේශයක් දෙන්නැමයි සිතා වහාම එතැනින් අහසට පැන ගුරුවරයා වෙතට වැඩියේය. ස්ථානයට සමීප තැනකින් අහසින් බැස තම ගුරුවර තෙරුන් වෙතට පැමිණි සේක. කුමක් සඳහා පැමිණියේ දැයි මහාසිව මහාථෙර ඇසූ කල අනුමෝදනා ධර්මයක් අසා ගැනීමට පැමිණ සිටිමියි ප්‍රකාශ කළ සේක. විවේක වේලාවක් නැතැයි මහාථෙර විසින් කියනු ලැබූ කල, පිණ්ඩපාතයට ටිකකට කලින් ප්‍රශ්ණ කරන්නෙමියි පිළිතුරු දුන්සේක. එම අවස්ථාවේ ද වෙනත් භික්ෂුවක් ප්‍රශ්ණ කරන්නට සිටී යැයි කී කල, පිණ්ඩපාත අතර මගදී ප්‍රශ්ණ කරන්නෙමියි නැවත ප්‍රකාශ කළසේක. එම මගෙහිද ප්‍රශ්ණ කරන්නන් ඇති බව කී කළ, සිවුරු පොරවන අවස්ථාවෙහි, පාත්‍රය ථවිකයට දමන විට, උදේ කැඳ වැළඳූ විට, ප්‍රශ්ණ කරන්නෙමියි ප්‍රකාශ කළ සේක. නමුත් අටථකථා ඉගෙන ගන්නා මහථෙර වරුන් ඒ අවස්ථා වන්හිදීද ප්‍රශ්ණ කරන්නේ යැයි ප්‍රකාශ කළේය. මේ ක්‍රමයෙන් වේලාවක් ඉල්ලන්නේ, පිඩුසිගා පෙරලා වඩින අවස්ථාවේ, ආපසු ස්ථානයට වඩින අවස්ථාවේ, ආහාර වැළඳූ අවස්ථාවේ, දිවා විහරණ කරන අවස්ථාවේ, නිදාගැනීමට කලින් අවස්ථාව, පාන්දර ඇඳෙන් නැගිට මුණ සෝදන අවස්ථාව, මූණ සෝදා ගත් විට කාමරයේ මොහොතක් ඉඳගෙන සිටින කාලය යන මේ අවස්ථාවෙහිද කවුරුන්ට නමුත් වෙන් කොට ගෙන ඇති බව කී කල "ස්වාමීන් වහන්ස, මූණ සොදාගත් කල කාමරයට ඇතුල් වී ඉඳගෙන සිටින විටදී ආසනය රත්වන තරමට තුන් හතර මොහොත පර්‍යංකයක හිඳ ගැනීමට තරම් ඉස්පාසුවක් යමෙකුට තිබිය යුත්තේය. දැන් කියන විදියට ස්වාමීන් වහන්සේට මැරෙන්නවත් කාලයක් නැත. ඔබ වහන්සේ හාන්සි පුටුවක් වගේය. අනුන්ගේ පහසුව බලන්නේ නමුත් තමාගේ පහසුව නොබලයි. ඔබ වහන්සේගේ අනුමෝදනා

බණීන් මට කමක් නැත"යි කියා අහසට පැන ආපසු වැඩිසේක. එවිට මහාථෙර නම "එම භික්ෂුව පැමිණියේ උගෙන ගැනීමට නොවේ. මට මතක් කිරීමක් කිරීමටයැ"යි දැනගෙන සංවේගයට පත්ව පසු දින පාන්දරම තුන්සිවුරු හා පාත්‍රයගෙන භාවනා කිරීම සඳහා ස්ථානයක් සොයා පිටත්විය. "මා වැනි කෙනෙකුට රහත් ඵලය ලැබීම එතරම් දුෂ්කර නැත. දින දෙක තුනකින් රහත් වී නැවත පැමිණෙන්නෙමි"යි සිතූ නිසා තම ශිෂ්‍යයන්ටද නොදැන්වීය. වස් එළඹීමට දින දෙකකට කලින් පටන්ගෙන, ගමකට ආසන්න බෑවුම් ප්‍රදේශයකට වී භාවනා කොට පසළොස්වක දිනක් වන තෙක්ම රහත් වී ගත නොහුනු බැවින් මෙසේ සිතිය "ආ ! මම දින 2-3 කින් රහත් වීමට සිතාගෙන පැමිණියෙමි. නමුත් නිවන් ලබා ගත නොහැකි විය. මේ වස් මාස තුන දින තුනක් සේ සලකා වීර්‍යයෙන් භාවනා කරන්නේ නම් පවාරණය වන විට නිවන සාර්ථක කරගත හැකිවේවි. මනසිකාරය පවත්වන්නෙමි යැයි සිතා එහිම වස් විසීය. වස් ගෙවී ගියත් තවම මාර්ග ඵලයන් නොලද බැවින් මෙසේ කල්පනා කළේය. "ආ! දින 2-3ක් ඇතුලත කෘත්‍යය නිම කරන්නේමියි සිතාගෙන පැමිණී නමුත් දැනටමත් තුන් මසක් ගතවුවද කෘත්‍යය නිම නැත. සබ්‍රහමචාරීන් වහන්සේලා වනාහි "රහතන් වහන්සේලා වශයෙන් මහා පවාරණයෙන් පවාරණය කරනු ඇතයි" කල්පනා කරන මහා සිව ස්වාමීන් වහන්සේට තමාගේ තත්‍වය අනුව කඳුළු පහළ විය. අනතුරුව නිදිබරව නිඳට යනවිට ඇඳ කැමති වෙයි. වැතිර නිදන නිසා මාර්ග ඵලයන් ලඟාවිය නොහැක්කේයයි සිතා තම ඇඳ අකුලා දැම්මේය. එතැන් පටන් සිටීම, හිඳීම, යෑම යන ඉරියාපථ අනුව සිත පවත්වමින් භාවනා කළේය. වස් 29ක් ගත වුයේ නමුත් මාර්ග- ඵල, නොලද හැකි විය. එම 29 වසර පුරා පවාරණ දිනයක් පාසා කදුළු හැලීය, වසර 30ක් ගතවී නමුත් මාර්ගඵල නිවන් නොලද බැවින් මෙලෙස සිතිය. මේ භාවනා කාලය වසර 30ක් ගතවූ නමුත් අර්හත් ඵලයට තවම නොපත්වීය. ඇත්තටම මට මේ භවයේදී නිවන් පසක් කළ නොහැක. සබ්‍රහමචාරීන් වහන්සේලා සමග මහා පවාරණයෙන් පවාරණය කළ නොහැක්කේයැයි ඉතාමත් දුකට පත්වී, මහත් සේ කඳුළු සැලීය. මෙවිට දිව්‍යාංගනාවක් සමීපයට පැමිණ ඉඟියක් වශයෙන් පෙනෙන්නට සිටගෙන අඬන්නට විය. මේ අඬ අඬා සිටින්නේ කවුදැයි මහාථෙර නම ප්‍රශ්ණ කළවිට 'මම ස්වාමීන් වහන්ස! දිව්‍යාංගනාවකි' යැයි සැළකළාය. කුමක් නිසා හඬන්නේදැයි, ප්‍රශ්ණකළ විට, ඔබ වහන්සේ අඬ අඬා සිටිනවා දැක, අඬලා

මාර්ග - ඵල ලැබිය හැකියයි සිතා මාර්ග- ඵල දෙක තුනක් ලැබීම සඳහා මමද හයියෙන් අඬන්නෙමියි, පැවසුවාය. එවිට සිහි එළවා ගත් මහාථෙර මෙලෙස අනුශාසනා කරගත්තේය. අනේ! මහා සිව, බලාපන් දිව්‍යංගනාවකුදු උඹට විහිලු කරයි. මේ හැසිරීම උඹට ගැළපෙන්නේදැයි සිතා කල්පනාකොට කණගාටුව දුරු කොට විපස්සනාව ක්‍රමයෙන් වඩා අර්හත් ඵලයට පත්විය.

සංලක්ෂ්‍යයඃ මෙ මහාථෙර දිගු කාලයක් මෙලෙස භාවනා කිරීම වනාහී සුතමයඥාණය බොහෝ වීමේ හේතුවෙන් විත්ථාර ක්‍රමයම සම්මසනය කළ නිසා යැයි හඟිමු. මොග්ගල්ලාන ස්වාමීන් වහන්සේට වඩා දිග කාලයක් සාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ භාවනා කළාක් මෙන්යැ. **එතතකං කාලං විපසසනාය සුචිණණ භාවතො ඤාණසස පරිපාකං ගතතතා.** මෙලෙස තිස් වසරක් පමණ කලක් විපස්සනාව හොඳින් භාවනා කළ බැවින් ඥාණය මුහුකුරායැම නිසා (අර්හත් ඵලයට පත්වියැ)යි ටීකාචාර්‍යයන් වහන්සේද දක්වන ලෙසට විස්තාර ක්‍රමයට වැඩූ විපස්සනා ඥාණයන්ගේ බලවත් බවම පිළි ගත යුතුය. රහත් බවට පත්වීමට සංක්ෂිප්ත ක්‍රමයට වඩන විපස්සනා ඥාණයේ හුදු බලවත්ව මේරීම පමණක් ප්‍රමාණවත් යැයි නොපිළිගත යුතු හේතුව වනාහී සංක්ෂිප්ත ක්‍රමයට මාර්ග ඵලයන්ට ලඟාවීමට තරම් ප්‍රමාණවත් පාරමී ඥාණයන්, ත්‍රිපිටකයෙහි මෙතරම් දක්ෂ වන විශේෂ පුද්ගලයන්ට වනාහි, විපස්සනා භාවනා කිරීමට කලින්මද සම්පූර්ණ වී තිබිය හැකි වීමයි. අසම්පූර්ණ යැයි කීම නොගැළපේ. මහා බොධිසත්වයන් වහන්සේ සුමේධ තාපසයව මාර්ග ඵලයන්ට ළඟාවීමට තරම් ශ්‍රාවක පාරමී ඥාණ සම්පූර්ණව තිබුණු ආකාරය මෙහිලා සැළකිය යුතු.

සාමිස අදුකඛම - සුඛ

විපස්සනාවෙන් තොර වූ අන්ධ පුථුජ්ජනයන්ට අජ්ඣත්ත - බහිද්ධා දෙක්හි ඇති විශේෂ නරකක් හෝ හොඳක් නැති සාමාන්‍ය කාම ගුණ වස්තු ආදිය දකින කල සතුටක්ද ප්‍රකට නැත. අසතුටක්ද නැත. එවන් අරමුණු වස්තුව වටහා ගැනීමටද නොහැකිය. ඇත්ත වශයෙන් එම අරමුණු වස්තුව මත බැඳෙන- ආසා කරන ලෝභය හෝ හොඳ - නරක දෙකම නැති සාමාන්‍ය වින්දන හෝ පහළ වෙමින් පවතී. මේ මධ්‍යස්ථ වින්දනය සාමිස අදුක්ඛම සුඛය නම්වේ. ගෙහසිත උපෙකඛාව යයි කියනු ලැබේ. අඥාණ උපේක්ෂාව යැයිද කියනු ලැබේ. මෝහය සමග පහළ වන සැළකිලි

බැවින් තොර හුදු උදාසීන බවකැයි කියනු ලැබේ. මේ උපේක්‍ෂාව විපසසනා යෝගින්ටද මෙනෙහි කරන අතර වාරයේ පහළ විය හැක්කේය. පහළ වූයේ නමුදු යට දක්වූ ආකාරයට අප්‍රකටවම පහළවේ. එය දන ගැනීමට අපහසුය. ප්‍රකට වූ අවස්ථාවෙහි එම උපේක්‍ෂාව මෙනෙහි කොට දන ගැනීම **ආමිසංවා අදුකඛම සුඛං වෙදනං -පො- පජානාති** යන්න හා සමවේ.

නිරාමිස අදුකඛම සුඛ

විපස්සනා උපක්කිලෙස අනතුර පහව ගිය විට ප්‍රකටව ආ අරමුණු හය මෙනෙහි කරන කරන වාරයේ ඒවා දනගන්නා විපසසනා ඤාණය හා යෙදී මධ්‍යස්ථ විඳන ප්‍රකට ලෙස පහළ විය හැක්කේය. භංග ඤාණය බලවත් වීමේ තැන් පටන් මෙය විශේෂයෙන් ප්‍රකටවේ. සංඛාර උපෙක්ඛා ඤාණ අවස්ථවේදී මෙය ඉතාමත් ප්‍රකටය. මේ මධ්‍යස්ථ විඳනය නිරාමිස අදුකඛම සුඛය නම්වේ. නෙකඛමම සිත උපෙක්ඛාව යයිද කියනු ලැබේ. මෙය නැවත මෙනෙහි කොට භාවනා කිරීම නම් වූ පටිවිපසසනා වශයෙන් මෙනෙහි කොට දන ගත යුතුය. (**නිරාමිසං වා අදුකඛම සුඛං වෙදනං වෙදියමානො නිරාමිසං අදුකඛම සුඛං වෙදනං වෙදියාමීති පජානාති** යන පාළියට අනුරූපවයි.

සමුදය හා වය දැන ගැනීම

බහිද්ධාව හා අජ්ඣතත බහිද්ධාව දන ගැනීම කායානුපස්සනාහි දක්වූ නය ක්‍රමයටමය. විඳින වේදනාව මෙනෙහි කරන කරන වාරයේ එම වේදනාව වහ වහාම මතුවෙමින් පවතිනවා දක දන ගැනීම සමුදය වෙදනා හා වය වෙදනා දන ගැනීම නම් වේ. 'සිතෙහි මනාප අරමුණක් හමුවී හොඳ යයිද, හමුනොවී නම් මෙලෙස හොඳ විය නොහැක්කේ යයිද, අමනාප අරමුණක් හමුවී දුකට පත්වීමද, එසේ හමු නොවී නම් දුකක් පහළ විය නොහැක්කේ යයිද, හොඳත් නැති නරකත් නැති සාමාන්‍යය අරමුණක් දන ගැනීමෙන් මධ්‍යස්ථ වේදනා ඇත්තේ යැයිද, එසේ හමු නොවීනම් මධ්‍යස්ථ වේදනාවක් ඇතිවිය නොහැක්කේ යැයිද, පෙර හේතු නිසා විඳන පහළ වේ, එසේ නැත්නම් පහළ නොවේ යැයිද, නොදනීම නම් වූ අවිද්‍යාව නොනිමීතාක් විඳන පවතී, අවිද්‍යාව දුරුවී නම් විඳන පහළ නොවිය හැකි යැයිද, තණ්හා- රාග නොනිමී තාක් විඳන පහළවේ, දුරුවී නම් පහළ විය නොහැකි යැයි'ද මෙලෙසට දිටධීය හා සූතය එකතු

කොට දැන ගනී. මෙලෙස දැනගැනීම සමුදය හෙවත් වේදනා පහළ වීමට හේතු ධර්මය , වය හෙවත් වේදනාව දුරුවීමට හේතු ධර්මය දැන ගැනීම වේ.

සමුදය ධම්මානුපස්සී වා වේදනාසු විහරති යන්න හා අනුරූප වේ.

සති පච්චුපට්ඨිතා හොති

වේදනා ස්වභාව මෙනෙහි කරන කරන වාරයේ පුද්ගල, සත්ත්ව, මම, මගේ දේ, ස්ත්‍රිය, පුරුෂයා, යැයි දෙයක් නොමැත්තේය. හොඳ වේදනා, නරක වේදනා. මධ්‍යස්ථ වේදනා යන වේදනා සමූහ පමණක් ඇත්තේ යයි එළඹ සිටින සතිය පහළවේ. මෙලෙස ඇතිතාක් සංඛාර, සන, නිමිති, සටහන්, ප්‍රඥප්ති වෙතට නොපැමිණ විඳන ධර්මතාවයන් පමණක් වශයෙන් ප්‍රකට කරන සතිය ඇති නිසා පසු පසු සති ඤාණයන් ක්‍රම ක්‍රමයෙන් දියුණු වී බලවත්ව පහළ වේ. දෘෂ්ටිලෙස අල්ලා ගැනීමද නිමවේ. **අත්ථි වේදනාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති** යනාදිය අනුරූප වේ.

වේදනානුපස්සනාව නිමියේ යැ.

චිත්තානුපස්සනාව

යමෙක්, යමකට කැමති වන සිත, සතුටු වන සිත යනාදියට සරාග සිත් යයි කියනු ලැබේ. එම සිත් පහළ වී ආයේ නම් පහළ වූ විට "ආසාවක් කැමැත්තක්" ආදී වශයෙන් මෙනෙහි කළ යුතුය. මෙලෙස වරක් පමණක් මෙනෙහි කිරීම නිසාද එම සිත් දුරුවිය හැක්කේය. දුරු නොවී නම් මතුවන මතුවන වාරයේ මෙනෙහි කළ යුතුය. අවසානයේ සියල්ල දුරුවී ශාන්ත වී යනු ඇත. කැමති බව හෝ සතුටු සිත් දුරුවී පැහැදිළි සිත් පහළ වනු ඇති. එම සිත් වීතරාග සිත් නම් වේ. මේ සිත්ද පහළවන අවස්ථාවේ පහළවන ආකාරයට මෙනෙහි කළ යුතු **සරාගංවා චිත්තං සරාගං චිත්තංති පජානාති, වීතරාගංවා චිත්තං වීතරාගං චිත්තනති පජානාති.**

නොරුස්සනා සිත, බලාපොරොත්තු යුත් වූ සිත, තරහ සිත හිංසක සිත, විනාශක සිත, යන මේවා සදෝස සිත් නම් වේ. මේවා පහළ වී නම් "නොරුස්සනා සිත" ආදී ලෙසට මෙනෙහි කළයුතුය. වරක් පමණ මෙනෙහි කිරීමෙන්ද දුරුවී යා හැක්කේය. එසේ දුරුනොවී නම්, පහළ වන ආකාරයට අනුව නැවත නැවතත් මෙනෙහි කළ යුතුය. අවසානයේ සදොස් සිත් සාන්ත විය හැක්කේය. එම අවස්ථාවේදී පිරිසිදුවූ විට එම සිත් වලට වීතදෝස සිත් යැයි කියනු ලැබේ. මේ සිත්ද පහළ වන පහළ වන ආකාරයට මෙනෙහි කළ යුතු. **සදොසංවා - පෙ- චිත්තං පජානාති** යන්න අනුරූපවයි. සැකයෙන් යුත් සිත් හා විසිරීගිය සිත් යන මේවා සමෝහ සිත් නම් වේ. සිතේ සොම්නසක් නැතිව කාමාවචර වස්තුව ගැන කල්පනා කරන සිත, පුරසාරම් දොඩවන සිත, පුරාජේරු කියන සිත, මමෙක් ඇතැයි සිතන සිත්, ආදිය ලෝභමූල සමෙමාහ සිත්වේ. බියවන සිත, සැලෙන සිත, දුක්වන සිත, අසතුටු සිත, අප්‍රසන්න සිත, ඉරිසියා සිත, මසුරු සිත, කුකුස් සහිත සිත, යන මේවා දෝස මූලක සමෙමාහ සිත්ය. (ලොභ මූල සියලු සිත් සරාග සිත්, දොස මූල සිත් සියල්ල සදොස සිත්, අකුසල් සිත් සියල්ල සමෙමාහ සිත් යැයි අටඨකථාහි බෙදා දක්වත්. මේ වනාහි සිත තබාගැනීමට කටපාඩම් කිරීමට පහසු වනු පිණිස ප්‍රකට ලෙසට වෙන් කොට දැක්වීමකි.)

නොදැනීම හා සමග පහළ වන මෙම සිත් පහළ වූයේ නම්, ඒවා පහළ වන ආකාරයට අනුව මෙනෙහි කළ යුතුවේ. එම සිත් දුරුවී ගිය විට පහළවන පැහැදිලි සිත් වීත මෝහ සිත් නම් වේ. මේවාද පහළ වන අවස්ථාවේ පහළ වන ආකාරයට අනුව මෙනෙහි කළයුතුවේ. **සමොහං වා චිත්තං-පෙ-පජානාති** යන්න අනුව යේ.

කම්මැලි, පසුබාන, කුසීත සිත් **සංඛිත්ත සිත** නම්වේ. විසිර ගිය සිත **වික්ඛිත්ත සිත** නම් වේ. තැන්පත් සිත **සමාහිත සිත** නම්වේ. තැන්පත් නැති සිත **අසමාහිත සිත** නම්වේ. මෙනෙහි කරන සිත කෙලෙස් වලින් තදංග විමුක්ති වශයෙන් මිදෙන බැවින් **විමුක්ත සිත** නම්වේ. සිතන, කල්පනා කරන දවල් සිහින මවන සිත් කෙළෙස් වලින් තොර නොවන නිසා අවිමුත්ත සිත් නම්වේ. **මහග්ගත, අමහග්ගත,ස උත්තර. අනුත්තර** ආදී සිත් වෙන් වෙන්ව දැන ගැනීම ධ්‍යාන ලාභි පුද්ගලයන්ගේ විෂය ක්ෂෙත්‍රයයි. එම පුද්ගලයන්ට ධ්‍යානයන්ට පෙර පසු ඇති, **අමහග්ගත සිත- ස උත්තර** සිත් යැයිද ධ්‍යායෙන් නැගී සිටි වහාම ඇති, ධ්‍යාන සිත, **මහග්ගත සිත - අනුත්තර සිත** යැයිද රූප ධ්‍යානයෙන් අරූප ධ්‍යානයට මාරු වී සමවැදී අවස්ථාවෙහි රූප ධ්‍යාන සිත් **සඋත්තර -** අරූප ධ්‍යාන සිත් **අනුත්තර සිත** යැයිද වෙන් වෙන් කොට භාවනා කළ හැකි, දැන ගත හැකි වන්නේය. එම නිසා ධ්‍යාන ලාභී යෝගීනට දැක්වූ ක්‍රමයටම පහළ වන, පහළ වන අවස්ථාවෙහි ඒ ඒ ආකාරයට මෙනෙහි කළයුතු වේ. **සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තංති පජානාති** යන්න අනුවයි.

දැක්වූ නය ක්‍රමයට පහළවන, පහළවන සිත් මෙනෙහි කරමින් යථා ස්වභාවයට අනුව වටහා ගැනීමම චිත්තානුපස්සනා නම්වේ. ලොභ මුල වූ සිත් අට **සරාග සිත** යැයි කියනු ලැබේ. මේ ආකාරයට "**ලොභ මුල සිත**", "**සරාග සිත**" ආදී නම් සමඟ "අටයි" ආදි ගණන් සංඛ්‍යා ප්‍රඥප්තීන් සිතින් සැළකීම, ගණන් බැලීම, සැලසුම් කිරිම ආදිය චිත්තානුපස්සනා නොවන්නේමය. එම නිසා අට්ඨකථාහි චිත්තානුපස්සනා පහළවන ආකාරය **යස්මිං ඛණෙ යං යං චිත්තං පවත්තති තං තං සල්ලක්ඛෙන්තො අත්තනොවා චිත්තෙ පරස්සවා චිත්තෙ, කාලෙන වා අත්තනො කාලෙන වා පරස්ස චිත්තෙ, චිත්තානුපස්සී විහරති** යැයි දක්වා ඇත්තේය. මේ පාළියෙහි අර්ථය තුන්වන පරිච්ඡේදයෙහි විපස්සනාවෙහි අරමුණ යන තැන (45) දක්වන ලදි. නැවත කියවා බලන්න.

සිත ලක්ෂණාදිය වශයෙන් දැනගැනීම

සිත පහළ වන පහළ වන අවස්ථාවෙහි මෙනෙහි කරන තැනැත්තා, "අරමුණ දනී, සිතයි, අරමුණ ගනියි, අරමුණු කරයි, දනී, අසයි, ආඝ්‍රාණය කරයි, රස බලයි, ස්පර්ශ කරයි" යැයි දනගනී (**විජානන ලක්ඛණං**) සම්ප්‍රයුක්ත නාම ධර්මයන්ට පෙරටුව ගමන් කරයි (**පුබ්බංගම රසං**), අරමුණ පැහැදිළි වීම සඳහා පෙරටුව ගමන් කරන්නා සේ ඇති නිසා මෙලෙස කියනු ලැබේ. සම්ප්‍රයුක්ත නාම ධර්මයන් හා එකට පහළ වේ. එක එකක් අතරක් නොතබා සම්බන්ධව පවතින්නේ යයි දනගනී (**සනදහන පච්චුපට්ඨානං, පටිසන්ධි පච්චුපට්ඨානං**) නිශ්‍රය රූප ඇතිවිට පහළ වේ. අරමුණ ඇති නිසා පහළ වේ. අරමුණ හා ගැටීම, අරමුණ විඳගැනීම ආදී නාමයන් ඇති වීමට පහළ වේ යැයි දැනගනී (**වත්ථාරම්මණ පදට්ඨානං, නාම-රූප පදට්ඨානං**).

සමුදය - වය දැනගැනීම

බහිද්ධා හා අජ්ඣත්ත-බහිද්ධාහි සිතක දන ගැනීම ඉහත කායානුපස්සනා හි දක්වූ ක්‍රමයටම වේ. මෙනෙහි කරන කරන වාරයේ පහළ වූ සිත් වහ වහා පහළ වී විනාශ වී යෑම දන ගැනීම සමුදය = පහළ වීම, වය = විනාශ වීම දන ගැනීම නම් වේ. "වත්ථාරම්මණ හා සම්ප්‍රයුක්ත නාම ඇතිවම සිතක් පහළ වේ. නාම- රූප නොමැතිව පහළ විය නොහැක්කේය. පෙර හේතු (කර්ම) ඇති විටම සිත් පහළ වේ. නොමැති විට පහළ නොවිය හැක්කේය. අවිද්‍යාව දුරු නොවී අඛණ්ඩව පැවැත්ම නිසා සිත පහළ වේ. දුරුවී නම් පහළ විය නොහැක්කේයැ"යිද කැමැත්ත- ආසාව අනුව සිත් පහළ වේ. කැමැත්ත- ආසාව දුරුවී නම් පහළ විය නොහැක්කේ යැයිද, මෙලෙස දිට්ඨි- සූත එකට යොදා සළකාබලා දන ගැනීමද **සමුදය** = පහළ වීමට හේතුධර්ම, **වය** = විනාශය සඳහා ධර්ම දන ගැනීම නම් වේ. **සමුදය ධම්මානුපස්සීවා චිත්තස්මිං විහරති** යන්න හා අනුව වේ.

තත්ත්වාකාරයෙන් සතිය පහළ වන ආකාරය

පහළ වන සිත මෙනෙහි කරන කරන වාරයේ "පුද්ගල සත්ව, මම, මනුෂ්‍ය, දේව, ස්ත්‍රී, පුරුෂ යැයි කිවහැකි යමක් නොමැත. අරමුණ දන

ගැනීම, සිතීම පමණක්ම ඇත්තේ යයි" සතිමත් වන සතිය පහළ වේ. මෙලෙස සංස්කාර සන, නිමිති දූන ගන්නා සිත් යම්තාක්ද ඒවාට නොයා, අරමුණ දැනගන්නා සිත් මත පමණක්ම ප්‍රකට වන සතිය ඇති නිසා පසු පසු ඥාණයන් ක්‍රමයෙන් දියුණු වී බලවත්ව පහළ වේ. උපාදාන දුරුවේ. **අතථි චිතතං ති වා පනසස සති පචචුපටඨිතා හොති** ආදියට අනුරූපවයි.

චිතතානුපසසනාව නිමි යේ යැ

ධම්මානුපස්සනා

නීවරණයන් දැන ගැනීම

කාමාරම්මණ වස්තු කෙරෙහි ඇති කැමැත්ත, ආසාව, මනාපය, බැඳීම, තද බැඳීම, කාමච්ඡන්ද නීවරණය නම් වේ. ධ්‍යාන, විපස්සනා, මාර්ග- ඵල, නිවන් ආදිය පිළිබඳ කැමැත්ත, ආසාවද කාමච්ඡන්දයම වන්නේය. මාර්ග- ඵල, නිවන් කැමති වී කාමච්ඡන්දය පහළ විය හැකි බව පරිච්ඡේද අංක, දෙකෙහි (2) ප්‍රථම නියාමනාවරණ දක්වන තැන සාධක සහිතව දක්වන්නට යෙදුනි. මෙම කාමච්ඡන්දය පහළ වන පහළ වන අවස්ථාවේ "කැමැත්ත - කැමැත්ත" යයි මෙනෙහි කළ යුතුයි. **සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං අත්ථි මේ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති** යන්න අනුවයයි.

සිතේ තරහ, බලාපොරොත්තු සුන්වීම, වෛරය, ක්‍රෑරකම, වැනසීමේ කැමැත්ත ආදිය **ව්‍යාපාද නීවරණ** නම් වේ. මෙය පහළ වන පහළ වන විට "තරහව- තරහව" යයි හෝ මෙනෙහි කළ යුතුයි. චිත්ත චෛතසිකයන්ගේ කුසීතකම, දුබල බව ආදිය **ථීනමිද්ධ නීවරණ** නම් වේ. එයද පහළ වන පහළ වන වාරයේ "කුසීත බව - දුබල බව" වශයෙන් මෙනෙහි කොට දැනගත යුතුවේ. සිත විසිරී යෑම **උද්ධච්චය** නම් වේ. පසුව කණගාටු වීම **කුක්කුච්ච** නම්වේ. එවාද පහළ වන පහළ වන අවස්ථාවේ "සිත විසිරේ" යයි "කුකුස් කරයි" ආදී ලෙසට අදාලව මෙනෙහි කළ යුතුවේ. **සන්තං වා අජ්ඣත්තං ව්‍යාපදං - ථීන මිද්ධං - උද්ධච්ච කුක්කුච්චං - පෙ- පජානාති** යන්න අනුවයි.

ඇතිතාක් ධර්ම සියල්ල දන්නා බුදුරජාණන් වහන්සේ වනාහි ඇත්තටම ඇත්තේද? නැද්ද? මාර්ග- ඵල නිවන් ඇත්තටම ඇත්තද? නැද්ද? මාර්ග- ඵල නිවන් ලැබූ සංඝයා වහන්සේලා ඇත්තේද? "ඇත්තද? නැද්ද? අවිජ්ජා ආදීය නිසා පහළ වන සංඛාරාදී ඵල ධර්මයන් පමණක්ම ඇත්තේය. පුද්ගලයෙක් සත්ත්වයෙක් මමෙක් යන්න නැත" යයි යන්න, ඇත්තමද? නැද්ද? මේ අනුශාසනා කරන ධර්ම මාර්ගය සත්‍යයද? අසත්‍යයද? "මෙලෙස හුදු මෙනෙහි කිරීමෙන් පමණක් විපස්සනාව පහළ වී මාර්ග- ඵලයන්ට පත්විය හැකිය" යන්න සත්‍යද? නැද්ද? ගුරුවරයා විසින් දේශනා කරන, දේ ඇත්තද? නැද්ද? මෙලෙස මෙනෙහි කොට මාර්ග- ඵල නිවන් ලබාගත්තා යැයි කියන ඇත්තන් නියම ක්‍රමයට ලබාගත්තෝය යන්න ඇත්තද?, නැද්ද?,

මෙලෙසට සැක කිරීම කල්පනා කිරීම **විචිකිච්ඡා** නම් වේ. එය පහළවන වාරයක් වාරයක් පාසා "සැකය - සැකය" යයි මෙනෙහි කොට වටහා ගතයුතුයි. **සන්තංවා අජ්ඣත්තං විචිකිච්ඡං අත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති** යන්න අනුරූප වේ.

මේ කාමච්ඡන්ද ආදිය වරක් මෙනෙහි කිරීම පමණකින්ද දුරුවිය හැක්කේය. බොහෝ වාරයක් මෙනෙහි කිරීමෙන්ද දුරුවිය හැක්කේය. දුරුවී සංසිඳී ගිය විට එම කාමච්ඡන්ද ආදිය තමා තුළ නැතැයි වටහාගනී. **අසන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං නත්ථි මේ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති යන්න අනුරූප වේ.**

නීවරණ ඇතිවීමට හා නැතිවීමට හේතු දැනගන්නා ආකාරය

කාමච්ඡන්ද ආදිය ඇති කරලීමේ මනාප භාව ආදිය පහළ වනු පිණිස යෙදෙන මනසිකාරය හෙවත් අයෝනිසෝමනසිකාරය ප්‍රථමයෙන් පහළ වේ. ඤාණය මුහුකුරා ගිය කළ මෙලෙස ඤුවණින් මනසිකාරය යෙදීමද මෙනෙහි කොට දූනගත හැක්කේය. මෙනෙහි කොට දූනගන්නා එම අයෝනිසෝමනසිකාරය නිසා කෙළෙස් මළ දුරුවීයෑම වර්තමාන වශයෙන්ම ඇස්පනා පිටම දත හැක්කේය. සමහර විට අඥාන මනසිකාරය පහළ වන මුල් අවස්ථාව සමගම මෙනෙහි කොට අල්ලාගත හැකි නිසා, කාමච්ඡන්ද ආදියට සාර්ථකව පහළ විය නොහැකිවීමද, දූනගනී. නිදිබර ගතිය = ථීන මිද්ධය මෙනෙහි කොට දූන ගත හැකි බැවින් නිදිබර සිත දුරුවී දිවා- රාත්‍රි දෙකම පැහැදිළි මනසකින් යුත්තව සිටිය හැක්කේය. එම නිසා පහළ වන රූප- නාමයන් අඛණ්ඩව මෙනෙහි කරන යොගී තෙමේ "කැමැත්ත ඇති වන ආකාරයට මනසිකාරය යෙදෙන නිසා කැමති බව පහළ වේ. එය මෙනෙහි කොට දන ගන්නා නිසා කැමති භාව දුරු විය" යැයි නීවරණ ඇතිවීම පිණිස හා දුරුවීම පිණිස හේතුවන ධර්මයන් ඇස් පනා පිට දූක- දූන ගනී.

යෝනිසෝමනසිකාරය

කුසල් පහළ වනු පිණිස වන මනසිකාරයන් ඇතිතාක් සියල්ල යෝනිසෝමනසිකාරයම යයි පරිච්ඡේද අංක එකෙහි ඉන්ද්‍රිය සංවර කොටසෙහි සාමාන්‍ය ලෙසට දක්වන්නට යෙදුනි. මෙහිලා විපස්සනා හා

යෙදෙන යෝනිසෝමනසිකාරය දක්වන්නෙමු. පහළ වන රූප- නාමයන්ගේ ස්වභාවය ලක්‍ෂණ ආදී වශයෙන්ද ඇතිවන- නැතිවන අනිත්‍ය ලක්‍ෂණාදිය වශයෙන්ද මනසිකාරය යෙදීම, මෙනෙහි කිරීම, භාවනා කිරීම, දැනගැනීම යෝනිසෝමනසිකාරය නම්වේ. පච්චක්ඛ ඤාණය බලවත් වූ විට වර්තමානව නොදකින රූප- නාමයන් මතද දකින රූප නාමයන්ට අනුරූපව සළකා බැලීම, භාවනා කිරීම, තීරණය කිරීමද යෝනිසෝමනසිකාරය නම් වේ. " පසු පසු විපස්සනා ඤාණ හා මාර්ග- ඵල ඤාණ යන අස්වැන්න ලබාගැනීමටද නියම ක්‍රමය, මාර්ගය වන්නාවූ මනසිකාරය ක්‍රමය යැයි කියවේ. එම නිසා අට්ඨකථාව පහත සඳහන් ලෙසට දක්වයි.

යොනිසොමනසිකාරො නාම උපාය මනසිකාරො පථ මනසිකාරො, අනිච්චෙ අනිච්චන්ති වා දුක්ඛෙ දුක්ඛන්ති වා අනත්තනි අනත්තාති වා අසුභෙ අසුභන්ති වා මනසිකාරො [දී. අ. 2/455/2/561]

යොනිසොමනසිකාරො නාම	=	යොග්‍ය නිසි මනසිකාරය නම් වනාහි
උපාය මනසිකාරො	=	කැමති ප්‍රතිලාභ ලැබීමට නියම උපාය, නියම ක්‍රමය වන මනසිකාරයයි
පථ මනසිකාරො	=	නියම මාර්ගයෙන් මනසිකාරයයි.
අනිච්චෙ	=	අනිත්‍ය ධර්ම මත
අනිච්චන්ති වා	=	නිත්‍ය නැතැයි කියා හෝ
දුක්ඛෙ	=	පෙළෙන ධර්ම මත
දුක්ඛන්තිවා	=	පෙළන්නේ යැයිද
අනත්තනි	=	ආත්මයක් නැති ධර්ම මත
අනත්තාතිවා	=	ආත්මයක් නැත්තේ යැයිද
අසුභෙ	=	සුභ නොවන ධර්ම මත
අසුභන්ති	=	සුභනොවන්නේ යැයිද
මනසිකාරො	=	මනසිකාරය පැවැත්වීමයි.

විශේෂ විපස්සනා ඤාණයන් හා මාර්ග- ඵලයන් වනාහි විපස්සනා භාවනා කරන්නා බලාපොරොත්තු වන ප්‍රතිලාභයයි. ඒවා සඵල කරවිය හැකි මනසිකාර ක්‍රමය යෝනිසෝමනසිකාරය නම්වේ. අට්ඨකථාහි පධාන, අවිනාභාව නය ක්‍රමයට දක්වන ලද අනිත්‍යාදී මනසිකාරය මගින් ලක්ඛණාදී

මනසිකාරයද යෝනිසෝමනසිකාරය ලෙසටම සළකාගත යුතුය. විපස්සනා භාවනා කරන පුද්ගලයා තතුසේ ප්‍රකටව ඇති රූප- නාමයන් පමණක් දැක දැන ගැනීමට කැමති විය යුතුය. පුද්ගල, සත්ත්ව, මම, ඔබ, ස්ත්‍රී, පුරුෂ, ආදීන් දැකීමට කැමති නොවිය යුතුය. කෙලෙස් නිවීමට හේතුවන ඇතිවීම්- නැතිවීම් සහිත අනිත්‍යාදී ලක්‍ෂණාදිය පමණක් දැන දැක ගැනීමට කැමති වියයුතුය. කෙළෙස් වැඩෙන නිච්ච සංඥා- සුඛ සංඥා- අත්ත සංඥා- සුභ සංඥා තත්වයන් දැකීමට කැමති නොවිය යුතුය. එම නිසා එවැන්නකට ද්වාර හය මතින් අරමුණු හය ප්‍රකට කල්හි රූප- නාම පමණක්ද, ඇතිවීම්- නැතිවීම් ස්වභාවය පමණක්ද, අනිච්ච ස්‍වභාවය පමණක්ද යනාදි ලෙසට සලකා බලන පඤ්ච ද්වාරාවජ්ජන, මනොද්වාරාවජ්ජන සිත් නියම ක්‍රමයට නිසි උපාය අනුව මනසිකාරය යොදමින් ප්‍රථමයෙන් පහළ වේ. මෙලෙස මනසිකාරය පවත්වන විට පමණක් මනෝද්වාරවිපස්‍සනා ජවනයන් ද මෙනෙහි කොට මනසිකාරය සිදුවේ. මේ විපස්‍සනා ජවන සමූහය රූප- නාම සවභාවයන් තත්ත්වාකාරයෙන් දැනගන්නා නිසාද, පසු පසු විශේෂ විපස්‍සනාවන් හා මාර්ග- ඵලයන් පහළ කරවන නියම ධර්මය වන නිසාද යෝනිසෝමනසිකාරය නම්වේ. ප්‍රථමයෙන් සළකා බැලූ ආවජ්ජනයන්ද එම විපස්‍සනා ජවනයන් හා සමාන නිසා යෝනිසෝමනසිකාරයම වේ. එම නිසා සතිපට්ඨාන සූත්‍ර ටීකාවෙහි මෙසේ දක්වත්.

යොනිසොමනසිකාරො නාම කුසලාදීනං තං තං සභාවරසලක්ඛණාදි- කස්‍ස යාථාවතො අවබුජ්ඣනවසෙන උප්පන්නො ඤාණ සම්පයුත්ත චිත්තුප්පාදො , සොහි අවිපරීත මනසිකාරතාය යොනිසොමනසිකාරොති වුත්තො, තදාභොගතාය ආවජ්ජනාපි තග්ගතිකා එව [දී. ටී. 517]

යොනිසොමනසිකාරොනාම	=	යෝනිසෝමනසිකාරය නම්
කුසලාදීනං	=	කුසල් ආදියෙහි
තං තං සභාවරසලක්ඛණාදිස්‍ස	=	ඒ ඒ සභාව ලක්‍ෂණ, රස, අනිච්ච, දුක්ඛ අනාත්ම ආදිය
යාථාවතො අවබුජ්ඣනවසෙන	=	තත්වාකාරයෙන් දැනීම් වශයෙන්
උප්පන්නො	=	පහළ වූ
ඤාණ සම්පයුත්ත චිත්තුප්පාදො	=	ඤාණය හා යෙදෙන චිත්තුප්පාදයයි (තත්ත්වාකාරයෙන් දන්නා චිත්තුප්පාදයයි කියනු ලැබේ)

හි	=	ඇත්තය.
සො	=	එම චිත්තුප්පාදය
අවිපරීත මනසිකාරතාය	=	අවිපරීතව, තත්වාකාරයෙන් මනසිකාරය යොදන බැවින්
යොනිසොමනසිකාරොති	=	යෝනිසෝමනසිකාරය යැයි
වුච්චති	=	කියනු ලැබේ.
තදාභොගතාය	=	එම ජවන චිත්තුප්පාදයන්ට මනසිකාරය යොදන බැවින්
ආවජ්ජනාපි	=	ආවර්ජන සිතද
තග්ගතිකා එව	=	එම ජවනය හා සමාන වේ.

මේ ටීකා දැක්වීමට අනුව පෙර පෙර වීථීන් හි ඇති ආවජ්ජනයන් හා විපස්සනා ජවනයන් "පසු පසු වීථීන්හි කුසල්වලට හේතු වන්නාවූ යෝනිසෝමනසිකාරය යැයි" ගතයුතුය. බොහෝ සේ අට්ඨකථා ටීකාවන් එකම වීථියක්තුල පහළ වන කුසල් අකුසල් වල හේතුව ලෙස සළකා ආවර්ජනයම යෝනිසෝමනසිකාරය/ අයෝනිසෝමනසිකාරය යැයි දක්වත්. මෙය වනාහි අවස්ථාවට සුදුසු සේ, ගැළපෙන සේ සළකා ගත යුතු දැක්වීමකි.

අයෝනිසෝමනසිකාරය

අයොනිසොමනසිකාරො නාම අනුපාය මනසිකාරො උප්පථමනසිකාරො, අනිච්චෙ නිච්චන්ති වා, දුක්ඛෙ සුඛන්ති වා අනත්තනි අත්තාති වා, අසුභෙ සුභන්ති වා මනසිකාරො [දී. අ. 2/561]

පරිවර්තනය

අයෝනිසෝමනසිකාරය යන්න කැමති වන ප්‍රතිලාභ ලබාගැනීමට සුදුසු නොවන ක්‍රමයට මනසිකාරය පැවැත්වීමයි (**ආකඞ්ඛතස්ස හිත සුඛස්ස පත්තියා අනුපාය භූතො මනසිකාරො** යනු ටීකා දැක්වීමකි) අදක්ෂ ක්‍රමයට මනසිකාරය පැවැත්වීමයි. අනිත්‍ය ධර්ම මත නිත්‍ය යයි හෝ වේවා, දුක්ඛ ධර්ම මත සැපයයි කියා හෝ, අනාත්ම ධර්ම මත ආත්මයැයි කියා හෝ, අසුභ ධර්ම මත සුභ යැයි කියා හෝ මනසිකාර පැවැත්වීමයි.

ද්වාර හයෙහි ප්‍රකට වූ රූප- නාමයන් නිච්ච සංඥාවෙන්, සුඛ සංඥාවෙන්. තම වසඟයේ පැවැත්විය හැකි ආත්ම ස්වරූපයක් යන සංඥාවෙන් හෝ සුභ සංඥාවෙන් යුක්තව මනසිකාරය පැවැත්වීම අයෝනිසෝමනසිකාරය නම්වේ. නිච්ච වශයෙන් මනසිකාරය පැවැත්වීම ප්‍රකට නොවුනත් ද්වාර හයෙහි ප්‍රකට වන රූප නාමයන් මෙනෙහි නොකොට සිතින් කරන සළකා බැලීම් ආදිය විපස්සනා ක්ෂේත්‍රයෙහි බොහෝ සේ අයෝනිසෝමනසිකාරයම වේ. මක්නිසාද යත්, අමාර්ගයෙන් මෙලෙස සිත යෙදීමෙන් පසුව එයම නැවත සළකා සිතා බලන කල්හි නිත්‍යභාව වශයෙන්ම සිතට ප්‍රකට විය හැකි බැවිනි. තවත් පැහැදිළි කර දක්වතොත්:

දකින මොහොතෙහි 'දකිනවා' යැයි මෙනෙහි නොකරන බැවින් හුදු දැකීමෙන් නතර නොවන්නේ නම්, එවිට 'කවරෙක් දක්කාද, ඔහු කලිනුත් දක ඇත, මේ වනතාක් දකිමින් සිටි' යයි ද දුටු පසු කාලයෙහිද 'ඔහු කොහි ගියේද, දැන් ඔහු කොතනක වෙයිද, දුටු මම ම දැන් කල්පනා කරමින් සිටින්නෙමි' යනාදි ලෙසටද සිත යෙදීම සිදුවිය හැක්කේය. නිත්‍ය සංඥාවෙන්ම සිත යෙදීමකි. 'මම ස්ත්‍රියක දුටුවෙමි, පුරුෂයකු දුටුවෙමි, ඔහු පොහොසත්ය, දක්කා හොඳයි' යනාදි ලෙසට සුභ සංඥාවෙන්ම සළකා බැලීම සිදුවිය හැක්කේය. දුටු වස්තුව හා දැකීම පුද්ගල, සත්ත්ව, ආත්ම යනාදි වශයෙන් සළකා සිත යෙදීම සිදුවිය හැක්කේය. ලස්සනය, හැඩය, හොඳය යන ලෙසට සිත යෙදීම සිදුවිය හැක්කේය. අනිත්‍යාදි වශයෙන් මනසිකාරය යෙදීමක් සිදුනොවේ. එම අවස්ථාවේ අනිත්‍යාදි වශයෙන් සිත යෙදුවද හොඳින් එලෙස ප්‍රකට නොවේ. මාර්ග- ඵල ප්‍රකට නොවීම සම්බන්ධයෙන් විශේෂයෙන් කිවයුතු නොවේ. එම නිසා මෙනෙහි කිරීමෙන් තොරව, එල්ලයකින් තොරව. රූචි පරිදි නිදහසේ සිතයෙදීම් මගින් කැමති වන්නාවූ නියම ප්‍රතිලාභය වන විදර්ශනා ඥාන, මාර්ග-ඵලයන් පහළ විය නොහැක්කේය. අනිෂ්ඨ ඵලයන්ම ගෙන දෙන නිසා අයෝනිසෝමනසිකාරයම වේ. අකුසල් ඇතිතාක් මේ අයෝනිසෝ-මනසිකාරය හේතුවෙන්ම පහළ වේ. මෙහිදීද ඊට පසු පසු වීථි සම්බන්ධ අකුසල් ජවන සමූහයේද අයෝනිසෝමනසිකාරයම යෙදේ යැයි දත යුතුය.

එකම චිත්ත වීථියක් තුළ අකුසල් පහළවීමට හේතුව දක්වන තැන ආවජ්ජනයම අයෝනිසෝමනසිකාරය යයි සැළකිය යුතුය. පෘථග්ජනයෝ බොහොසේ අකුසල් සඳහා හේතුවන අරමුණුම අපේක්‍ෂාකරති. එම නිසා ද්වාර හයෙහි අරමුණු පහළ වනවාත් සමගම ආදරවන්තද, මනාපද, අමනාපද, වෛරක්කාරද ආදී වශයෙන් සිතා සළකා බලන්නා සේ, ආවජ්ජන සිතම වැරදි ක්‍රමයට සිත යොදමින් ප්‍රථමයෙන් පහළ වේ. හොල්මන් වලට බිය තැනැත්තා රාත්‍රියට යන්තම් ශබ්දයක් ඇසෙන විට හොල්මන් දැයි සිතන බව හා සමානය. අතිප්‍රිය මිත්‍රයෙකු දැකීමට කැමැත්තෙන් පමාවන පුද්ගලයා ඉස්සරහට දකින්නාවූ කවුරු නමුත් තම අති මිත්‍රයා දැයි සිතන්නා හා සම වේ. පඤ්චද්වාරයන්හි එම ආවජ්ජනය නිසා සම්පටිච්ඡන, සන්තීරණ සිත් පහළ වී නම්, වොත්ථපන සිත් වනාහි මනාප- අමනාප බව ආදි වශයෙන් තීරණය කරයි. එම නිසා ලෝභ - දෝෂ - මෝහ ජවනයන් දුවත්, මනෝද්වාරයෙහිද්‍ද මනාප - අමනාප වශයෙන්, ආවජ්ජන සිතෙහි මනසිකාරයට අනුව අකුසල ජවන දුවත්. මෙය වනාහි අයෝනිසෝ-මනසිකාර නිසා අකුසල් ජවන පහළ වන අකාරයයි.

සංක්‍ෂෙපයෙන්

විපස්සනා කොටසේදී මෙනෙහි කරමින් බැලීම යෝනිසෝ-මනසිකාරය නම්වේ. මෙම මෙනෙහි කිරීමට උපකාර කළ හැකි මනසිකාරයටද යෝනිසෝමනසිකාරයම යැයි කිවහැකි බව සළකා ගත යුතුය. මෙනෙහි කිරීමෙ කටයුත්තට අනුග්‍රහ නොකර කුමක් හෝ වේවා අරමුණකට රුචියට අනුව සිත යෑම අයෝනිසෝමනසිකාරය නම් වේ. නීවරණ මතුවන අවස්ථාවෙහිදීද වනාහි නීවරණයන් පහළ කරවීම සම්බන්ධ ආරම්භක සිත යෙදීම අයෝනිසෝමනසිකාරය නම්වේ. මේ මනසිකාර වර්‍ග දෙක පහළ වන අවස්ථාවෙහි මෙනෙහි කොට දැනගැනීම **යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානං හොති තඤ්ච පජානාති" යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති** යන්න අනුරූපවයයි.

යථාච පහීනස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති" යන්න අනුව වටහා ගැනීම වනාහී විචිකිච්ඡාව සෝතාපත්ති මග්ගය මගින් නිරවශේෂව දුරුවේ. සංසිද්දේ. බ්‍යාපාද- කුක්කුච්චයන් අනාගාමී මග්ගය මගින් නිරවශේෂව දුරුවේ. සංසිඳේ. කාමච්ඡන්ද, ථීන-මිද්ධ, උද්ධච්ච යනාදීය අර්හත් මාර්‍ගයෙන් නිරවශේෂව දුරුවේ. සංසිඳේ. නීවරණ එක එකක්

සංසිඳුවන්නාවූ මාර්ග ඤාණයන් එනාහි ඒ ඒ මාර්ගයට පත්වූ අවස්ථාවෙහිම පච්චවෙක්ඛන ඤාණය මගින් ඇස් පනාපිට ප්‍රත්‍යක්‍ෂව දැනගත හැක්කේය. මුලින් දැක්වූ ආකාරයට සුතමය ඤාණයෙන් දැන ගතයුතුය. එම සුතමය ලෙස දැනීම වනාහි ඒ ඒ නීවරණයන් පහළ වූ අවස්ථාවෙහි (නිරවශේෂව දුරුකළ හැකි මාර්ග ඤාණයට පත් වීමට පෙරාතුව) මෙවන් නීවරණයන් පහළ වී යයි ඒත්තු ගැන්වීම මගින් ඒ ඒ මාර්ග ඤාණයන් ලබාගැනීමට උනන්දු කරලීම් වශයෙන් ප්‍රයෝජන ඇත්තේය.

ස්කන්ධයන් ආදීන් මත වනාහි මෙනෙහි කරන ක්‍රම වෙනම නැත. පෙර දැක්වූ ආකාරයට "දකිනවා - අසනවා" ආදී ලෙසට මෙනෙහි කරන්නේ නම් ස්කන්ධ දේශනාවන් හා සැසඳෙන - ගැළපෙන පුද්ගලයන්ට ස්කන්ධ පහ වශයෙන් වෙන වෙනම දැනගත හැක්කේය. ආයතන- ධාතු ආදීන් හා සැසඳෙන- ගැළපෙන පුද්ගලයන්ට ආයතන- ධාතු ආදී වශයෙන් පරිච්ඡේද කොට (වෙන වෙනම) දත හැක්කේය. නාම- රූප දේශනාවන් හා ගැළපෙන- සැසඳෙන පුද්ගලයන් රූප - නාම දෙක වශයෙන් වෙන වෙනම දත හැක්කේය.

ස්කන්ධ වශයෙන් වටහා ගන්නා ආකාරය

දක්නා අවස්ථාවේ "දකිනවා" යැයි මෙනෙහි කරන්නා ඇසේ ඔපය, දකින වර්ණ රූපය යන මේවායින් එකක් ප්‍රධාන කොට දැනගනී නම්, රූපස්කන්ධය වටහාගත්තා වන්නේය. දැක හොඳ- නරක බව, මධ්‍යස්ථ බව ප්‍රධාන කොට දැනගන්නේ නම් වේදනාස්කන්ධය දැනගත්තා වන්නේය. දැනගත් වර්ණ රූපය අනුව හැඳින ගන්නා ස්වභාවය දැනගන්නේ නම් සඤ්ඤාස්කන්ධය දැනගත්තා සඤ්ඤාස්කන්දය වටහා ගත්තා නම් වන්නේය. සිතෙහි රූපය ගැටීම = ඵස්සය, දැකීම සඳහා සිත උනන්දු කරවන චේතනාව, ප්‍රියමනාප බව නම් වන ලෝභය, ප්‍රසාදභාවය නම්වන ශ්‍රද්ධාව, ආදීය දැන ගන්නේ නම් සංස්කාරස්කන්ධය වටහා ගත්තා වන්නේය. දකින සිතම ප්‍රධාන කොට දැන ගන්නේ නම් විඤ්ඤාණස්කන්ධය දැනගත්තා වන්නේය. මෙලෙස රූප ස්වභාවය, වේදනා ස්වභාවය, ආදිය දැනගැනීම වටහාගැනීම **ඉති රූපං ඉති වේදනා ඉති සඤ්ඤා ඉති සංඛාරා ඉති විඤ්ඤාණං** යන දේශනාවට අනුරූප වෙයි. අසන විට ආදියෙහි ද මේ ලෙසටමය. නවන අවස්ථාවෙහිදී "නවනු කැමැත්ත - නැවීම" යයි මෙනෙහි කරන්න. මෙලෙස නැවීමේ ඉරියව්ව අනුව චලනය වන රූපස්කන්ධය දැනගනී. වේදනා, සංඥා යන

මේවා බොහෝ විට අප්‍රකටව තිබිය හැක්කේය. ප්‍රකට අවස්ථාවෙහිදීද නමනු කැමැත්තෙහි හොඳ - නරක සවභාවය නම් වූ වේදනා ස්කන්ධය වටහා ගනී. නවනවා යැයි මෙනෙහි කරන සඤ්ඤාඝකන්ධය ද දැනගනී. දිග හරින විට, යන විට ආදියෙහිද මේ ක්‍රමයටමය. මෙලෙස දන ගැනීම නාම- රූප පරිච්ඡේද ඤාණයට ලඟාවූ කල්හි "රූපපන සභාව ඇති රූප නම් මේයයි. විඳිය හැකි වේදනාව නම් මෙයයි. මෙනෙහි කළහැකි, හඳුනා ගතහැකි සංඥාව නම් මෙයයි. අරමුණක් දැනගන්නා විඤ්ඤාණය නම් මේයයි" යන ලෙසට පරිච්ඡේද වශයෙන් දැනගැනීම ගණන් සංඛ්‍යා වශයෙන් ගණනය කොට දැන ගැනීමක් නොවේ. මෙනෙහි කොට බලන ඤාණය පස් ආකාරයකට ප්‍රකට වන ලෙසින් එම ධර්ම සියල්ලම පහළ වන පහළ වන වාරයේ මෙනෙහි කොට වටහා ගත් බැවින් "සියල්ලම මෙනෙහි කොට වටහාගන්නේය. දැනගන්නේය. තම ශරීරයේ මෙනෙහි නොකළ, නොදුටු රූප නම් නැත්තේමය යයි " ඒත්තු ගත් ආකාරයට අනුව සහතික කොට දැනගැනීමයි. මෙලෙස තීරණය කොට දැන ගැනීමද **ඉති රූපං ඉති වෙදනා** ආදිය හා අනුව ගැළපේ. එම නිසා අට්ඨ කථාහි "**ඉති රූපනති ඉදං රූපං එතතකං රූපං න ඉතො පරං රූපං අත්ථීති සභාවතො රූපං පජානාති, වෙදනාදිසුපි එසෙව නයො. ඉති රූපං** යන තැන මේ රූපයයි, රූපය යනු මෙයයි. මෙයට වඩා රූප නැත. ස්වභාව ලක්‍ෂණය වශයෙන් රූපය දැනගනී. වේදනා ආදී තැන්හිද මේ ලෙසටම යයි" දක්වයි.

රූපයන්ගේ සමුදය - වය වටහාගන්නා ආකාරය

දකින - නවන ආදී අවස්ථාවන් හි "දකිනවා - නවනවා" ආදි ලෙසට මෙනෙහි කරන වාරයේ ඇසේ ඔපය, දකින වර්ණ රූපය, චලන රූප ආදීන් වහා වහා මතුවී චිත් වහා වහා බිඳී යයි යැයි දැන ගනී. මෙලෙස දැන ගැනීම **සමුදය** = නිබ්බත්ති ලක්ඛණ යයි කියන්නාවූ පහළ වීම , **වය** = විපරිනාම ලක්ඛණ යයි කියන්නාවූ බිඳී යෑම යන දෙක ඇස්පනාපිට දැකීම නම්වූ උදයබ්බය ඤාණය වේ. *බාල පුථුජ්ජනයන්* වනාහි රූප- නාමයන් සුඛය, හොඳය, සුභය යැයිම සිතත්. දුකක්, නරකක්, අසුභයක් වශයෙන් නොදකියි. නොසිතයි. පහළ වීමට ඇති රූප- නාමයන් කිසිත් පහළ නොවී නිරෝධ වීම්, නිවීම් සවභාවයන්ද සුභ යැයි හොඳ යැයි නොදනියි. නොසිතයි. මේ නොදැනීමද අවිද්‍යා නම් වේ. පෙර භවයේදී කර්ම සිදුකරන විට මේ නොදැනීම නොනිමිව තිබූ නිසා රූප- නාමයන් මත බැඳීම, එහි ගැලීමද වේ. එම

නිසා එසේ බැඳෙන ගැලෙන රූප- නාමයන් මත බැඳීම, එහි ගැලීම දැනුදූ වේ. එම නිසා එසේ බැඳෙන ගැලෙන රූප-නාමයන් මනාසේ ලැබීමට යම් අතීත කර්මයන් කළේය. මේ කර්මයන්, කුසල කර්මයන්ම වන්නාහ. මේ භවය සඳහා හේතු ධර්ම ගැන සැළකීමේදී කුසල කර්ම පමණක් ගත යුතුවේ.

විපස්සනා භාවනා කරන්නාට පෙර කාලයේදී ද **දිට්ඨි ච උජුකා** යන ලෙසට "කර්මය අනුව හොඳ- නරක විපාක පහළ කරයි" යැයි ශ්‍රුතමය වශයෙන් පිළිගැනීම, දැන දැකගැනීම පැවතුනේ වේ. විපස්සනා භාවනා කරන විට රූප- නාමයන් හේතු ධර්මයන්ද සහිතව පහළ වීම, බිඳීයාම වර්තමානව පච්චක්ඛ වශයෙන් දැනගත හැක්කේය. එම නිසා දිට්ඨි- ශ්‍රුත යන දෙක එකට යොදා මේ දක්වන්නා වූ ක්‍රමයද ඒත්තු ගැනීමට දැන ගැනීමට හැක්කේය. පෙර ආත්මයෙහි චනාහි අවිද්‍යාව නොනැසී පැවතීම නිසා මේ රූප පහළ වේ. අවිද්‍යාව නිම වූයේ නම් පහළ විය නොහැක්කේ යැයිද, රාගය නිශ්‍රිත, ආසා නිශ්‍රිත තණ්හාව නොනිමිව පැවතීම අනුව මේ රූප පහළ වේ. නිමවී නම් පහළ විය නොහැකි බවද, සිදුකළ කර්මයන් ඇති බැවින් රූප පහළ වේ. කර්ම නොමැත්තේ නම් එසේ පහළ විය නොහැකි බවත්, මේ භවයේදී ආහාරයට ගන්නා ආහාරයන් නිසා මෙම රූපයන් පහළ වෙති. එසේ නැත්නම් පහළ විය නොහැකි බවත් නුවණින් සළකා බලා දැනගනී. මේ දැන ගැනීම **අවිජ්ජා සමුදයා රූප සමුදයො අවිජ්ජා නිරොධා රූප නිරෝධො** ආදී පටිසම්භිදා මග්ගයට අනූව **සමුදය** = හේතු ධර්මය **වය**- නිරෝධය - ගෙවීයෑම, නැතිව යෑම, ශාන්ත වී යෑම නම් වූ ධර්මයන් අනුමාන වශයෙන් දැනගන්නා උදයබ්බය ඤාණයමය. නැවීමට කැමති සිත නිසා නැවීම - සෙලවීම සිදුවේ. නොකැමැත්තේ නම් පහළ විය නොහැක්කේය. මේ ලෙසට දැනගැනීමටද, සීතල- උණුසුම නම් වූ තේජෝ ධාතුව නිසා සීතල රූප, උණුසුම් රූප පහළ වෙත්, නැතිනම් පහළ විය නොහැක්කේ යැයි දැන ගැනීමද, මේ භවයට හේතුන් දැන ගැනීම වශයෙන් සමාන වන නිසා **ආහාර සමුදයො රූප සමුදයො ආහාර නිරෝධා රූප නිරෝධො** යන පාළිය මගින් මහාටීකා හි දක්වයි. දක්වන්නට යෙදුණු ක්‍රමයට අනුව රූපයන්ගේ ඇතිවීම - නැතිවීම පහළ වන බව දැන ගැනීම **ඉති රූපස්ස සමුදයො රූප සමුදයො, ආහාර නිරෝධා රූප නිරෝධො** යන පාළිය මගින් මහාටීකා හි දක්වයි. දක්වන්නට යෙදුනු ක්‍රමයට අනුව රූපයන් ගේ ඇතිවීම- නැතිවීම පහළ වන බව දැන ගැනීම **ඉති රූපස්ස සමුදයො ඉති රූපස්ස අත්ථංගමො** යන පාළියට අනුකූල වේ.

වේදනාවේ සමුදය - වය වටහාගන්නා ආකාරය

කායික, චෛතසික සුඛය, හොඳ සතුටු වන බව, **සුඛ වේදනා** ද දුක්බව, නොහොඳ, අසතුටු වූ දොම්නස් වූ **දුකඛ වේදනා** ද හොඳ නරක යන දෙක නැති **උපෙක්ඛා වේදනා** යන මේවාද "සුඛය - හොඳ" යැයි මෙනෙහි කරන කරන වාරයේ එම විඳිනයන් වහ- වහා ඇති වී වහ වහා බිඳී යන ආකාරයට දැන ගනී. මෙලෙස දැන ගැනීම **සමුදය** = *නිබ්බතනි ලක්ඛණා* යැයි කියන ඉපැද්ම, **වය** = *විපරිනාම ලක්ඛණා* යැයි කියන බිඳී යෑම ඇස් පනා පිට දැනගන්නා උදයබ්බය ඤාණය නම් වේ. පෙර භවයේදී නොදැනීම තිබූ නිසා මෙම විඳින පහළ වේ. නොතිබුනේ නම් පහළ විය නොහැක්කේ යැයිද, තණ්හා ආසා නොනිමිව පවත්නා නිසා මෙම වින්දන පවතී, දුරු වූයේ නම් පහළ විය නොහැක්කේ යයිද කරන ලද පෙර කම් ඇති හෙයින් මෙම වින්දන පහළ වේ. නොමැත්තේ නම් පහළ විය නොහැකකේ යැයිද, දැන් වර්තමාන වශයෙන් ඵස්සය ඇති නිසා මෙම විඳිනය පහළ වේ. නොමැත්තේ නම් පහළ විය නොහැක්කේ යැයිද සළකා බලා දැනගනී. මේ දැන ගැනීම වනාහි **සමුදය** නම් වූ පහළ වීමට හේතු ධර්මයන් **වය** වියෝ වීමට, නිරුද්ධ වීමට හේතු ධර්මයන් අනුමාන වශයෙන් නය ක්‍රමයට දැන ගන්නා උදයබ්බය ඤාණය වන්නේය. ඇසුර ලබන වස්තු රූප ඇති නිසා මේ වින්දනය පහළ වේ. නොමැත්තේ නම් විය නොහැක්කේය. මෙලෙසට ඵස්සය හැර පච්චුප්පනන හෙතු ධර්ම දැන ගැනීම **ඵසස සමුදයො වේදනා සමුදයො, ඵසස නිරොධා වේදනා නිරොධො** යන පාළියෙහි ඇතුළත් වේ. සඤ්ඤා සංඛාර යන මේවායේ උදය-වය දැන ගැනීම මෙම වේදනාවෙහි උදය-වය වටහා ගන්නා ආකාරය හා සමවේ. **ඉති වේදනාය සමුදයො ඉති වේදනාය අත්ථංගමො, ඉති සඤ්ඤාය සමුදයො...** යනාදිය අනුකූලවේ.

විඤ්ඤාණයේ සමුදය - වය වටහා ගන්නා ආකාරය

දකින, නවන, සිතන, අවස්ථා ආදියෙහි "දකිනවා - අසනවා - නවන්නට කැමැත්ත- දිග හරින්නට කැමැත්ත- සිතනවා- මෙනෙහි කරනවා- දැනගන්නවා" යනාදී ලෙසට මෙනෙහි කරන කරන වාරයේ දකින සිත ආදිය වහ වහා මතුවී ක්ෂණයකින් බිඳී යන්නේ යයි දැන ගනීද, මෙලෙස දැන ගැනීම **සමුදය** = නිබ්බතනි ලක්ඛණා යැයි කියන නිපැද්ම, **වය** = විපරිනාම

ලක්ඛණා යයි කියන බිඳී යෑම වර්තමානව දැනගන්නා උදයබ්බය ඤාණය නම් වේ. පෙර පෙර භවයේදී නොදැනීම හෙවත් අවිද්‍යාව පැවති නිසා මේ සිත පහළ වන්නේය. නැතිවූයේ නම් පහළ විය නොහැක්කේය. පෙර කළ කර්ම ඇති නිසා මෙම සිත වන්නේය. කර්ම නැත්නම් නොවන්නේය. *වත්ථු රූප- ඵස්ස- වේදනා,* ආදී නාම-රූප ඇති නිසා සිත පහළ වන්නේය. නැතිනම් නොවන්නේය යැයිද සළකා බලා දැන ගනී. මේ දැන ගැනීම **සමුදය** = පහළවීමට හේතු ධර්මයන්, **වය** නිරෝධය හෙවත් නිරුද්ධ වීමට හේතු ධර්මයන් යන මේවා අනුමාන වශයෙන් නය ක්‍රමයට දැනගන්නා උදයබ්බය ඤාණය වේ. අරමුණ ඇති වීමෙන් මේ සිත පහළ වේ. පෙර පෙර සිත් නිසා පසු පසු සිත් පහළ වේ. නොමැති නම් පහළ විය නොහැක්කේ යයි දැන ගැනීම **නාම-රූප සමුදයා විඤ්ඤාණ සමුදයො නාම රූප නිරොධා විඤ්ඤාණ නිරොධො** යන පාළියෙහිලා ගැනේ. "**ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථංගමො**" යන පාළියට අනුරූපවයි. මේ දැක්වූ ක්‍රමය මගින් ස්කන්ධ එක එකක පහළ වීම දැනගැනීම එකකි. බිඳීම දැන ගැනීම එකකි. වීමට හේතු දැන ගැනීම් හතරකි. බිඳීමට හේතු දැන ගැනීම් හතරකි. යන ලෙසට සියල්ල ඤාණයන් 50ක් වන්නේය. මේ ඤාණ 50ට 'ලක්ෂණ 50 දැනගන්නා උදයබ්බය ඤාණය' යි අට්ඨකථා හී දක්වයි. එම ඤාණයන් අතරින් ඇති වීම - නැතිවීම දැනගන්නා ඤාණ 10 පමණක් වැදගත් වේ. අත්‍යවශ්‍ය වේ.

ආයතන - ධාතු, නාම-රූප වටහා ගන්නා ආකාරය

දකින අවස්ථාවේ ඇති ඇසේ ඔපය චක්ඛායතන, චක්ඛු ධාතු නම් වේ. දකින වර්ණ රූපය රූපායතන, රූප ධාතු නම් වේ. දකින සිත් සියල්ල මනායතන නම් වේ. ඒවා තුළ හුදු දකින සිත, චක්ඛු විඤ්ඤාණ වන්නේය. එම සිතට ආසන්නයේ ඉදිරියේ "ඇත්තේ කුමක් දැයි සිතන්නාසේ " පහළ වන ආවජ්ජන සිත හා ආසන්නයේ පසු පස ඇති "දකින රූපය පිළිගන්නාක් සේ එය අරමුණු කරමින් " පහළ වන සම්පටිච්ඡන සිත යන මේවා මනෝධාතු වන්නේය. දැක ගන්නා වර්ණ රූපය සළකා බලන සන්තීරණ සිත, හොඳයැයි ආදී ලෙසට ඒත්තු ගන්නා වොට්ඨපන සිත, වර්ණ රූපය වෙතට එල්ලවී දිව යන්නාක් සේ වන්නාවූ ජවන සිත්, එම ජවනයට පසුව දිගට සියුම් ලෙස අරමුණු කරමින් පහළ වන්නාවූ තදාලම්බන සිත යන මේ සමූහය මනෝ විඤ්ඤාණ ධාතු නම් වේ. වර්ණ රූපය හා ගැටෙන

ඵස්ස වින්දනය ලබන වෙදනා සළකුණු ගන්නා සඤ්ඤා, උනන්දු කරවන චෙතනා, කැමති වන ලෝභ, ප්‍රසාද බව නම් වන සද්ධා යනාදී චෛතසික සමූහය ධම්මායතනය, ධම්ම ධාතු නම් වේ. චිත්ත- චෛතසික සියල්ල අරමුණ වෙතට යාහැකි මෙන්ම නැමෙන සුළු බැවින් යුක්ත නිසා නාම නම් වේ. ඇසේ ඔපය හා දකින රූපය යන මේවා අරමුණක් දෙසට ගමන් කිරීමේ හැකියාවෙන් යුක්ත නොවන අතර ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් හමුවේ විපරිනාමයට පත්විය හැකි බැවින්, පෙරළෙන සුළු බැවින් රූප නම් වේ. දකින දකින වාරයේ "දකිනවා - දකිනවා" යැයි මෙනෙහි කරන්නා එම දකින ක්ෂණය තුළ පැනෙන ආයතන හතර, ධාතු හය, රූප- නාම දෙක යන මේවා අවස්ථාවට සුදුසු පරිදි දැනගනී.

අසන වේලාවේදී කණේ ඔපය සොතායතන - සොත ධාතු රූප ධම් නම් වේ. අසනු ලබන ශබ්දය, සද්දායතනය, සද්ද ධාතු = රූප ධම් නම් වේ. අසන මනායතනය, සොත විඤ්ඤාණ ධාතු මනොධාතු මනොවිඤ්ඤාණ ධාතු ධම්මායතන, ධම්ම ධාතු යන මේවා නාම ධම් නම් වේ. ආඝ්‍රාණය කරන අවස්ථාවේ, නාසයේ ඔපය ඝානායතන, ඝාන ධාතු රූප ධම් නම් වේ. ආඝ්‍රාණය කරන ගන්ධය, ගන්ධායතනය, ගන්ධ ධාතු, රූප ධම් නම් වේ. අඝ්‍රාණය දැනීම, මනායතනය, ඝාන විඤ්ඤාණ ධාතු, මනොධාතු, මනොවිඤ්ඤාණ ධාතු, ධම්මායතන, ධම්ම ධාතු නාම ධම් නම් වේ. රස බලන අවස්ථාවේදී දිවේ ඔපය ජිව්හායතන ජිව්හා ධාතු රූප ධම් නම්. මෙම රස බලන ආහාරය රසායතනය, රසධාතු රූප ධම් නම් වේ. රසය දැනීම මනායතනය, ජිව්හා විඤ්ඤාණ ධාතු මනොධාතු මනොවිඤ්ඤාණ ධාතු, ධම්මායතන, ධම්ම ධාතු යන මේවා නාම ධම් නම් වේ. හැපීම සිදුවන විට කයේ ඔපය කායායතන, කාය ධාතු රූප ධම් නම් වේ. හැපෙන වස්තුව ඵොට්ඨබ්බායතන පොට්ඨබ්බ ධාතු රූප ධම් නම් වේ. හැපීම දැන ගැනීම මනායතනය කාය විඤ්ඤාණ මනොධාතු, විඤ්ඤාණ ධාතු, ධම්මායතන, ධම්ම ධාතු යන මේවා නාම ධම් නම් වේ. එම නිසා අසන අවස්ථාවේදී "අසනවා - අසනවා" යැයි මෙනෙහි කරන්නා ඒ ඒ ක්ෂණයෙහි ප්‍රකට වන්නා වූ ආයතන හතර, ධාතු හය, නාම-රූප දෙක යන මේවායින් අවස්ථාවට ගැළපෙන පරිදි ප්‍රකට දේ දැනගනී.

සිතන අවස්ථාවෙහි හුදු සිතීම = අරමුණු ගැනීම්, අරමුණු ලැබීම්, ස්වභාවය ඇති සිත් සමූහ මනායතනය, මනො විඤ්ඤාණ ධාතු නාම ධම්

නම් වේ. සිතෙහි ඒ ඒ අරමුණු හා ගැටීම = **ඵස්ස**, විඳීනය =**වේදනා**, සලකුණු ගැනීම = **සඤ්ඤා**, උනන්දු කරවන = **චේතනා**, තැන්පත් කම = සමාධි, සිත යෙදීම = **විතක්ක**, සලකා බැලීම= **විචාර**, තීරණය කිරීම= **අධිමොක්ඛ**, උත්සාහය = **විරිය**, සතුට = **පීති**, කැමැත්ත = **ඡන්ද**, ලැබීමට ආසාව= **ලොභ**, තරහව = **දොස** , වරදවා වටහා ගැනීම = වැරදි දෘෂ්ඨිය = **දිට්ඨි**, තමා උසස් කොට සැලකීම = **මාන**, ඉර්ෂියාව = **ඉස්සා** මසුරුකම = **මච්ඡරිය**, කළ වරදට තැවීම = **කුක්කුච්ච**, කුසීත කම = **ථීන මිද්ධ** = සිත විසිරී යෑම = **උද්ධච්ච** , සැකය= **විචිකිච්ඡා**, ආසාවක් නැතිකම= **අලොභ**, සැප කැමති වීම = **අදොස**, = අනුකම්පාව= **කරුණා**, මුදිතාව = **මුදිතා**, ඇදහීම සහිත = සිත ප්‍රසාදය = **සද්ධා**, මතක් වීම = **සති**, අකුසලයට බය ලජ්ජාව = **හිරි ඔත්තප්ප**, ඇති සැටිය දැන ගැනීම= **ප්‍රඥාව**, සැහැල්ලුබව = **ලහුතා**. යනාදි වූ චෛතසික සියල්ල **ධම්මායතනය, ධම්ම ධාතු** නම් වූ නාම ධර්මයෝය. සිත ඇසුර ලබන හදය රූපය= **හදය වත්ථු**, ස්ත්‍රී සණ්ඨාන, ස්ත්‍රී ලීලා, ආකල්ප=ක්‍රියාකලාප සියල්ල පහළ වීම සඳහා වන බීජ රූපය =**ඉත්ථින්ද්‍රිය**, පුරුෂ සණ්ඨාන, පුරුෂ ඉරියව්, ආකල්ප-ක්‍රියාකලාප සියල්ල පහළ වීම සඳහා වන බීජ රූපය=**පුරිසින්ද්‍රිය** යන මේ ධර්ම රූප නම් වේ. **ධම්මායතනය, ධම්ම ධාතුන්ම** වෙත්. එම නිසා සිතන විට "නැවීමට කැමැත්ත - දිගහැරීමට කැමැත්ත - සිතයි - දකියි - කල්පනා කරයි - සැලසුම් කරයි - සළකා බලයි - මෙනෙහි කරයි - දැනගනී" ආදී වශයෙන් මෙනෙහි කරන්නා එම ක්ෂණයෙහි ප්‍රකට ආයතන දෙක, ධාතු දෙක, නාම- රූප දෙක, ඒ ඒ අවස්ථාවට ගැළපෙන පරිදි දැනගනී. මෙසේ සිතන අවස්ථාවේ අරමුණ, ප්‍රඥප්ති පැත්තෙහිද පරමාර්ථ පැත්තෙහිද යන දෙපැත්තෙහිම වන්නේය. පරමාර්ථ පැත්තේ වන්නේ නම් එසේ අරමුණු වන්නාවූ ආයතන, ධාතු, නාම- රූප දැන ගත හැක්කේය.

සංයෝජන වටහා ගන්නා ආකාරය

අජ්ඣත්ත- බහිද්ධා වශයෙන් ඇති කාමාරම්මණ වස්තූන් සමග බැඳීම, ඒ කැමති වීම කාමරාග නම් වේ. සිත නරක් වීම, බලාපොරොත්තු සුන්වීම, හිංසක සිත පටිඝ නම්වේ. තමා උසස් කොට සළකා අනුන් සමග ගළපා බැලීම, ඉහළින් සිතීම මාන නම් වේ. මමෙක්, සත්ත්වයෙක්, විඤ්ඤාණයක්, ආත්මයක් ඇත්තේය, එම ආත්මය විනාශ නොවී- නොමැරී සදාකාලිකව ඇත්තේ යැයිද, එසේ නැතහොත් එම ආත්මය මරණයේදී

විනාශ වී, උච්ඡේද වී යන්නේ යයි ද සැළකීම, පිළිගැනීම **දිට්ඨි** නම් වේ. සැක කිරීම **විචිකිච්ඡා** නම් වේ. "හරකුන් බල්ලන් ආදීන් ගේ හැසිරීම් ආකාර-ව්‍රත රැකීම මගින් සුඛවත් වී, වඩා හොඳ වී, සංසාර දුකින් මිදේ" යන ලෙසට පිළිගැනීම **සීලබ්බතපරාමාස** නම් වේ. හොඳ භවයක්, නව භවයක් පැතීම **භවරාග** නම් වේ. අනුන්ගේ සැප, ඉසුරු නොඉවසීම ඊර්ෂ්‍යාව **ඉස්සා** නම්වේ. තම වස්තු- තම සැප අනුන් සමඟ සාධාරණ වනවා දැකීමට කැමති නැති වීම **මච්ඡරිය** නම් වේ. රූප-නාමයන්ගේ තත්ත්වාකාර වරදවා දැනගැනීම **අවිජ්ජා** නම් වේ. මේ අවිද්‍යාව වනාහි **කාමරාග** ආදී සංයෝජන හා බැඳී එකට පහළ වේ. මේ ධර්ම දහය පහළ වන්නා වූ පුද්ගලයා මේ භවයේ මරණයෙන් පසු නව භවයකට සම්බන්ධ වන්නේය. සංසාර වට්ට දුකින් නොමිදේ. එම නිසා මේ ධර්මයන්ට සංයෝජන ධර්ම යැයි කියනු ලැබේ. ඇසුර ලබන පුද්ගලයා නොමිදිය හැකි ලෙස සංසාර වට්ට දුකෙහි බැඳ තැබීමට සමත්වූ ධර්මයන් යැයි මින් අදහස් කරේ.

අසන- දකින අවස්ථාවන් හි ප්‍රකටව ඇති ඇසේ ඔපය දකින වර්ණ රූපය, දැකීම, කණේ ඔපය, ශබ්ද රූපය, ඇසීම ආදී ආයතනයන් "ඇසීම - දැකීම" වශයෙන් මෙනෙහි නොකරන නිසා තත්ත්වාකාරයෙන් නොදන්නා පුද්ගලයාට මේ සංයෝජන දසය හේතු ධර්මයන්ගේ සම්පූර්ණ වීම වශයෙන් පහළ වේ. පහළ වුයේ නම් එම "කාමරාග ආදිය පහළ වීම සඳහා උපදවා කරවන මූලික වැරදි මනසිකාරය - අයෝනිසෝමනසිකාරයද" වටහා ගනී. "මෙනෙහි කොට දැනගන්නා අවස්ථාවන්හි මෙනෙහි කිරීම නිසා කාමරාග ආදී දුරුවූයේ යැයි" සංයෝජන සංසිඳවීම කරන්නාවූ යෝනිසෝමනසිකාරයද දැනගනී. මෙනෙහි කිරීම අතින් සූර වූ කල "කාමරාගාදිය පහළ වීමට වැරදි මනසිකාරය යෙදීමක් සමගම මෙනෙහි කොට දැනගන්නා නිසා" කාමරාගාදිය බලවත් නොවී, සමනයකට පත්වීම සිදුවිය හැක්කේය. **යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං, තඤ්ච පජානාති. යථා ච අනුප්පන්නස්ස සංයොජනස්ස උප්පාදො හොති තඤ්ච පජානාති, යථා ච උප්පන්නස්ස සංයොජනස්ස පහානං හොති, තඤ්ච පජානාති** යන පාළියට අනුරූපවයි.

යථා ච පහීනස්ස සංයොජනස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති යන්න අනුව සංයෝජනයන් ඉතිරි නැතිව සංසිඳවන්නා වූ මගය ස්වකීය ඥාණයෙන් දැන ගැනීම වනාහි පච්චවෙක්ඛණ ඥාණයට පත්වූ

විට සිදුවේ. සූතමය වශයෙන් දැනගැනීම වනාහි මෙලෙසටයඃ සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, ඉස්සා, මච්චරිය ආදිය, සෝතාපත්ති මග්ගයෙන් ඉතිරියක් නොතබා සංසිඳේ. පහවේ. සියුම් වූද කාමරාග හා පටිඝ අනාගාමී මග්ගයෙන් පහවේ. මාන, භවරාග ආවිජ්ජාදිය අරහත්ත මග්ගයෙන් පහවේ.

දන් පිණිස නොදෙන වාරයක් පාසා මසුරුකම නොයෙදේ

මෙහිලා "මච්ඡරිය සෝතාපත්ති මග්ගයෙන් දුරුවේ" යැයි දක්වන නිසා "සොතාපන්නයා තමාගේ වස්තුව ඉල්ලන වාරයක් පාසා දන් දීම කරයි. ප්‍රත්‍යයන් රැස්කිරීමක් නැතැයි" යන අදහස නොගත යුතුය. හේතුව වනාහිඃ ප්‍රත්‍යය රැස්කිරීම, තම වස්තුව අනුනට නොදීම, ඇලී ගැලී විසීම ලෝභයම වේ. මච්චරිය නොවේ. තම වස්තුව අනුන්ගේ අයිතියට යෑම, අනුන් හා සාධාරණ වීම කෙරෙහි නොඉවසන ගතිය, අසතුටු ගතිය, මසුරු කම මච්ඡරිය නම්වේ. එම නිසා දානය නොදීම මච්ඡරිය හා සම්බන්ධ නැත. ලෝභය හා සම්බන්ධය. සෝතාපන්න භාවයට පත් වූ කල මච්ඡරිය දුරුකරන නමුත් ලෝභය දුරුනොවේ. මෙහිලා බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ සොතාපන්න, සකදාගාමී වූ ලක්‍ෂපතියන් සිටු වරු, සිටු දියණී වරු, රජ රජබිසෝවරු සම්බන්ධව සළකා බලනු වටී. එම කාලයේ සොරුන්ද බොහෝ වූහ. ශාසන විරොධී මිත්‍යා දිට්ඨිකයන්ද ඔවුන්ගේ ශ්‍රාවකයන්ද සිටියෝය. එසේම ඉතාමත් බැගෑපත් හිඟන්නන් බොහෝ විය. එම පුද්ගලයන් ඉල්ලන ප්‍රමාණයට දෙන්නේ නම් එම ආර්ය භාවයට පත් රජ- සිටුවරු වස්තු හංගත්වයට පත් වන්නට ඉඩ තිබුණි. තව දුරටත් අනාථපිණ්ඩික සිටු මැදුරට සොරු කඩා වැදුනු කථා පුවත සළකා බලනු වටී. ඉල්ලන පමණින් ලැබෙනවා නම්, බරපතල වරදක් වන සොරකම සොරුන් විසින් නොකරනු ඇති. එම නිසා අනුන්ගේ අයිතියට තම වස්තුව නතුවේවි, ඔවුන් ඒවා පරිහරණය කරාවි යැයි එයට අකමැති වීම මසුරුකම, මච්ඡරිය නම් වේ." යැයි සළකා ගන්න. අනුන් තම වස්තු සතු කරගෙන පරිභෝග කිරීම අනුව සිත නරක් වීමක් නැති නමුත් තමා ආසා කරන වස්තුවක් අනුනට දීමට අකමැති වීම ලෝභය නම් වේ. නොදිය යුතු වස්තුවක් ඉල්ලන්නකුට නොදීම ලොභ- මච්ඡරිය යන දෙකින්ම නිදහස් බව සළකා ගන්න. එම නිසා තමා ඇඳගෙන සිටි අඳනය ඉල්ලා සිටි උදායි තෙරුන්ට උප්පලවණ්ණා තෙරණිය **මයං ඛො භන්තෙ මාතුගාමා නාම කිච්ඡලාභා,**

ඉදඤදව මෙ අනතිමං පඤ්චමං චීවරං නාහං දසසාමි = 'ස්වාමීන් වහන්ස, මාගමුන් වන අපට ප්‍රත්‍යලාභය දුෂ්කරය. මේ මාගේ අන්තිම පස් වන අඳනයයි. එය මට දිය නොහැකි යැ'යි ප්‍රතික්ෂේප කළාය. එම ථෙරණිය ලොභ - මච්ඡරිය පමණක් නොව සියලු කෙළෙස් දුරුකළ රහත් ථෙරණින් වහන්සේ නමක් වූවාය. එම නිසා අඳනය නොදී ප්‍රතික්ෂේප කොට ලීම කුමන කාරණයන් නිසා වීද? නොදිය යුතු ප්‍රත්‍යයක් ඉල්ලීම නිසා නොවේද? එම නිසා ඉල්ලා නමුත් නොලද අවස්ථාවක් අවස්ථාවක් පාසා නොදෙන පුද්ගලයාට මච්ඡරිය ඇත්තෙකැයි චොදනා නොකළ යුතුය.

බොජ්ඣංගයන් වටහා ගන්නා ආකාරය

උදයබ්බය ඤාණයෙන් පටන් ගෙන මෙනෙහි කිරීම පැහැදිළිවූ අවස්ථාවෙහි මෙනෙහි කරන, කරන වාරයේ මෙනෙහි කළයුතු අරමුණට ඇලී සමීපව සිටින්නාක් සේ ප්‍රකට වන සතිය ප්‍රබලව ප්‍රසිද්ධව පහළවේ. එම අවස්ථාවෙහි ඇතිවන නැතිවන රූප- නාම අරමුණ මෙනෙහි කරන සිතට ඉබේම මෙන් එල්ල වන්නාක් සේ වන්නේය. අරමුණක් මෙනෙහි කොට දැනගන්නවාත් හා සමගම තවත් අරමුණක් ප්‍රකට වීම වන්නේය. මෙනෙහි කරන සිත අරමුණෙහි නිමග්නව සිටින්නාක් සේ පිහිටයි. මෙනෙහි කොට දතයුතු අරමුණද මෙනෙහි කරන සිතෙහි ගිලීගන්නාසේ පිහිටයි. එම නිසාම මෙම සතිය "**අපිලාපන ලකඛණා - සම්ප්‍රයුක්ත ධම්** අරමුණෙහි මතුපිට පානොවෙන සවභාවය ඇත්තේ යැයි" අට්ඨකථා හී දක්වයි. මෙලෙස ප්‍රකට වූ බලවත් වූ සතියට මගග ඤාණ පහළ කළ හැකි නිසා **සති සමෙබාජඣඞග** නම් වේ.

මෙනෙහි කරන කරන අවස්ථාවෙහි මෙනෙහි කළ යුතු අරමුණෙහි, විශේෂයෙන් ප්‍රකට රූප- නාම එකක නියම සවභාවයද දැන ගනී. මෙනෙහි කරන සිත විනිවිද වැදගන්නා සේ එන රූප - නාමයන්ගේ එකෙනෙහි පහළ වීමද විසදව දැනගනී. තියුණු ලෙස බිඳීයන්නා සේ දුරුවීම, විනාශ වීම- භංගයද විසදව දැනගනී. නිත්‍ය නොවන ස්වභාවය නම් වූ අනිච්ච ලකඛණ, දුකඛිත- නරක ස්වභාව හෙවත් අමනාප සවභාව නම් වූ දුකඛ ලකඛණ, කැමති සේ නොපවතින බව,තමාගේ වශයෙහි පැවැත්විය නොහැකිබව නම් වූ අනතත ලකඛණ යන මේ ලක්ෂණයන්ද පැහැදිළිව දැනගනී. මේ දැන ගන්නා ඤාණය **ධමමවිචය සමෙබාජඣඞගයයි.**

මෙනෙහි කරන කරන අවස්ථාවේ, වරෙක මධ්‍යස්ථවූ භාවනා වීරිය ප්‍රකට ලෙස පහළ වේ. සමහර විටක, එක්තරා ඉරියා පථයක ආරම්භයේ පටන්ම මේ භාවනා වීරිය අධික භාවය පැවතිය හැක්කේය. එවන් අවස්ථාවන්හී දී සිත විසිරීයෑම දිගටම සිදුවන බැවින් මෙනෙහි කිරීමද අපේක්ෂිත ප්‍රමාණයට සාර්ථක නොවනු ඇත. සමහර විටෙක පටන් ගැනීමේ පටන්ම මඳ වීරිය යොදන බැවින් ඉන් පසුවටද කුසීත දුර්වල සිත පහළ විය හැක්කේය. එවිට නිදිබර කම නොසිඳ පවතින නිසා මෙනෙහි කිරීම අදක්ෂව ආකාංක්ෂමව පවතින්නේය. පටන් ගැනීමේ පටන් අඩු වැඩි නොවී යථා පරිදි භාවනා කරන්නේ වී නම්, අධික භාවය මදක් සැහැල්ලු කිරීමෙන් හෝ වේවා, සැහැල්ලු වී ගිය විටදීද ටිකක් වෙර දැරීමෙන් හෝ වේවා භාවනා වීරිය සම කරන්නාවූ කාලයෙහි දී දැඩිසේ වීරිය නොකරන නිසා සිත විසිරී යෑමද නතර වෙයි. මනසිකාරය සම්පූර්ණයෙන් බහා නොතැබූ නිසා කුසීත කම, නිදිබර බව ද අසලක නැත. පහළ වන පහළ වන අවස්ථාවේම, අතරක් නොතබා අරමුණ මෙනෙහි කරමින් කරමින්ම සිටී. මෙලෙස සමව භාවනා කිරීම **විරිය සමොබාජකධඞග** නම්වේ.

මෙනෙහි කරන මෙනෙහි කරන සිතෙහි සොම්නස, පිරුනු බව, ප්‍රමෝදය **පීති සමොබාජකධඞග** නම් වේ. මෙනෙහි කොට භාවනා කරන විට අනවශ්‍ය අතිරේක ව්‍යාපාර නොමැතිව සිතෙහි ශාන්ත බව **පසසද්ධි සමොබාජකධඞග** නම්වේ. මෙම පීති - පස්සද්ධි වනාහි උදයබ්බය ඤාණය ප්‍රකට වීමට පටන් ගත් තැන පටන් ඉතාමත් ප්‍රකටව පහළ වේ. එම අවසථාවේදී පෙර නොවූ විරූ ප්‍රීති-ප්‍රශබ්ධීන් හමුවීමට ලැබෙන බැවින් ප්‍රීතිය කෙළවරක් නැතිව පහළ විය හැක්කේය. **සබබ රතිං ධම්මරති ජිනාති** = 'සියලු රතීන් අතර ධම්ම රතිය දිනයි' යන දේශනාව ඇත්ත යයි අනුමත කරනු ඇත්තේය. යෑම, සිටීම, හිඳීම, හොවීම, නැවීම, දිගහැරීම මෙනෙහි කිරීම ආදී කාය-චිත්ත ක්‍රියාකාරකම් සියල්ලෙහි සුඛ වේදනා දිගටම පවතින නිසා දිගටම හොඳ බවම අත්දකියි. ප්‍රීති ශක්තිය අධික නිසා තොටිල්ලක පැද්දෙන්නා සේද පැවතිය හැක්කේය. පසසද්ධි ශක්තිය නිසා කිසිවක් මෙනෙහි නොකර ඔහේ බලාගෙන සිටින්නා සේ විය හැක්කේය. භංග ඤාණය ආදියෙහි මේ ප්‍රීති- ප්‍රශබ්ධි සමහර විට ප්‍රකට ලෙස පහළ වේ. නමුදු සංඛාර උපෙකඛා ඤාණ අවස්ථාවේදී වරින් වර දිගු කාලයක් පහළ විය හැක්කේය.

මෙනෙහි කරන මෙනෙහි කරන අවස්ථාවේ මෙනෙහි කළ යුතු අරමුණෙහිම නැවත, නැවත සාමකාමීව වැටීයන්නා සේ සමීප සමීපවෙමින් පවතින්නාසේ සිත නොවිසිරී සන්සුන්ව පැවතීම ප්‍රකට ලෙස සිදුවිය හැක්කේය. මේ සන්සුන් බව දූත් මුහුකුරා ගොස් ඇති නිසා මෙනෙහි කළ යුතු වූ රූප- නාමයන්ගේ ස්වභාව ලක්‍ෂණ ආදියද, ඇතිවීම -නැතිවීම නම් අනිච්ච ලක්ෂණය ආදියද තත්ත්වාකාරයෙන් විසදව දූනගත හැක්කේය. මෙනෙහි කරන වාරයක් වාරයක් පාසා යෙදෙන ප්‍රබලවූ මේ ඛණික සමාධිය **සමාධි සම්බොජ්ඣඞ්ග** නම්වේ.

මේ මෙනෙහි කර බැලීමෙහි අඩු වැඩියක් නොවී පවතින සමතාවය, මෙනෙහි කරන වාරයක් වාරයක් පාසා ප්‍රකටව පැවතිය හැක්කේය. තත්‍රමජ්ඣත්තතා නම් වූ මේ සමතාව **උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග** නම් වේ. මේ උපෙක්ඛාව, උපේක්‍ෂාව වශයෙන්ම දූන අවබෝධ කිරීමද දුෂ්කරය. අනුනට වැටහී යන ලෙස දක්විමද අපහසුය. නමුදු උදයබ්බය ආදී ඤාණයන්ට පත්වූ පුද්ගලයන්ට තම සන්තාන යෙහි ප්‍රකටව පවතින නිසා මෙය පහසුවෙන් දූන ගත හැක්කේය.

සමතුලනය කිරීම

පහළ වන පහළ වන වාරයේ මෙනෙහි කරන රූප- නාමයන්ගේ ඇති වීම- නැතිවීම පමණක් ප්‍රසිද්ධ වූ විට, ශ්‍රද්ධාව අධික පුද්ගලයා අධික ලෙස අදහන්නාවූ ස්වභාවයට පත්වී නැවත නැවතත් කල්පනාවට වැටී සිතමින් සිටීමට ඉඩ ඇත්තේය. කල්පනා කරන ආකාරය වනාහි "රූප- නාමයන්ම පමණක් ඇත්තාහ, පුද්ගල- සත්ත්ව- ආත්ම ස්වරූප නැතැයි යන්න ඇත්තය. ඇස් පිල්ලං ගසන වාරයක් තරම්වත් කාලයක් පවතින්නාවූ ධර්මයක් නැත්තේය. 'පහළ වී නම් වහාම බිඳීයන්නාවූ ධර්මයන් පමණකි ඇත්තේ'' යයි කියන කියමන ඇත්තය. අනිච්ච, දුක්ඛ, අනත්ත, අනත්තභාව නැතිබව ඇත්තය. ධර්මයන් සියල්ල දන්නේ සම්මා සම්බුදු රජාණන් වහන්සේය යන්න ඇත්තමයි. බුද්ධ දේශනාව සත්‍යය, යනාදි ලෙසට පිළිගන්නා බව, සතුටු වන බව කෙළවරක් නොමැතිව නැවත, නැවතත් සිතමින් සළකමින්ම සිටිය හැක්කේය. අනෙකුත් රූප- නාම පහළ වන පහළ වන ආකාරයට සම්බන්ධ කරමින් අඛණ්ඩව එයම බහුල කරමින් සිටින නිසා මෙනෙහි කරන දේද ප්‍රකට ලෙස පිරිසිදුව දූනගත

නොහැක්කේය. මේ වනාහි ශ්‍රද්ධාව අධිකවී මෙනෙහි කිරීම දුර්වල වීමේ අඩුපාඩුවයි.

ප්‍රඥාව අධික පුද්ගලයාද වරින් වර සිතමින්- කල්පනා කරමින් සිටිය හැක්කේය. මෙනෙහි කිරීම් අතර වාරයේ රූපද- නාමද, ඵස්සද - වේදනාද යැයි වශයෙන්ද, හොඳින් ප්‍රකටද නැද්ද දැයි, ලක්ෂණ- රසාදිය ප්‍රකට දැයි යනාදි ලෙසට සිතමින් කල්පනා කරමින් සිටිය හැක්කේය. මෙනෙහි කොට පැහැදිළිව දැනගන්නා වාරයක් පාසා සිත්ගත් සූතමය කරුණු සිහි කරමින්, චින්තාමය වශයෙන් ලත් දෑ උපමා හා ගළපමින්ද සිතමින්ද, සළකා බලමින්ද සිටිය හැක්කේය. එවිට කල්පනා කරන බවෙහි අඩු පාඩුව හොඳින් වටහා ගැනීමට අපොහොසත් වේ. අනෙකුත් රූප- නාමයන්ද දිගින් දිගට අඛණ්ඩව මෙනෙහි කරමින් දැනගත නොහැක්කේය. මෙනෙහි කරන වාරයක් පාසා සිතා බලන, සොයා බලන ප්‍රඥාව අධික බව නිසා මෙනෙහි කළ දෑයෙහි ද ප්‍රකටව පැහැදිළි දැනගැනීමක් ලබාගත නොහැක්කේය. මෙය වනාහි ප්‍රඥාව අධික වීම නිසා මෙනෙහි කිරීම අසාර්ථක වන ආකාරයයි.

මධ්‍යස්ථ ස්වභාව ඇති උපෙකඛාවෙහි ශක්තිය නිසා ශ්‍රද්ධා - ප්‍රඥා සමවූ අවස්ථාවෙහි, ඇදහීමේ ශක්තියද අධික නොවී කල්පනා කිරිමද අධික නොවී, පහළ වන පහළ වන තාක් අරමුණු හුදු මෙනෙහි කිරීමෙන් වටහා ගැනීම පමණක් සිදුවේ. අදහා පිළිගෙන නැවත නැවතත් කල්පනා කරමින්ද නොසිටී. මෙනෙහි කොට දැනගෙන නැවතත් කල්පනා කිරීමද සිදුනොවේ. එම නිසා පහළ වන ආකාරයට රූප- නාමයන් ක්‍රමානුකූලව හොඳින් මෙනෙහි කොට දැනගත හැක්කේය.

විරිය අධික වූ විට ව්‍යාපාර කිරීම බහුල වේ. මෙනෙහි කළ යුතු අරමුණු විෂයෙහි අධික බලාපොරොත්තු ප්‍රාර්ථනා ඇතිවේ. මෙනෙහි කළාද නැද්ද යැයි වරින් වර නැවත නැවතත් සළකා බැලීමට සිදුවේ. සකියේ ලිස්සා යෑමක්, අතරක් කොතැන තිබුනේ දැයි වරින් වර සළකා බැලීමට සිදුවේ. නැවත වඩා හොඳින් මෙනෙහි කළේ නමුත් සිතුවිලිම පහළ වේ. මෙලෙස අධික ලෙස සිතන නිසා සිත ද මනා කොට තැන්පත් නොවේ. විසිරී යෑමද සිදුවේ. සිත විසිරී යෑම නිසා ද පහළ වන රූප- නාමයන් දිගින් දිගට අඛණ්ඩව මෙනෙහි කළ නොහැක්කේය. මෙනෙහි කරන වාරයේ විරිය අධික වී, බලාපොරොත්තු අධික වී, ශාන්ත බව නැති වීම නිසා, මෙනෙහි කරන ලද්දේ නමුත් ප්‍රකටව දැන ගැනීමක් කළ

නොහැක්කේය. මේ වනාහි විරිය අධික වී මෙනෙහි කොට ගැනීම අසාර්ථක වන අකාරයයි.

සමාධිය අධික වූ අවස්ථාවෙහිද එකම වර්ගයක අරමුණු පමණක් දිගු කලක් මෙනෙහි කරමින් සිටිය හැක්කේය. අනෙකුත් බාහිර අරමුණු ප්‍රකට නොවන නිසා එම අරමුණෙහි විශේෂ අවධානයකින් යුක්තව මෙනෙහි කිරීම කෙරෙහි උනන්දු නැතිව යයි. මෙලෙස නිසි අවධානය යොමු නොකොට මෙනෙහි කිරීම බහුල කරන නිසා, පහසුවෙන් මෙනෙහි කරමින් සිටින නිසා, වීර්ය අතින් දුර්වල වේ. කටපාඩම් කරන ලද ගාථා අනුව බුද්ධ වන්දනාවේ යෙදී සිටින විට, පිරිත් කීම කරන කල්හි එහි උනන්දුව බැස යන්නා සේය. එම නිසා අරමුණ හා මෙනෙහි කිරීම වරින් වර දුර්වලව අප්‍රකටව යා හැක්කේය. මෙනෙහි කිරීම් ශක්තිය දුර්වල වී සිත කුසීත වී ථීන- මිද්ධ පැත්තට නැමේ. පහළ වන්නාවූ රූප- නාම ධර්ම අඛණ්ඩව මෙනෙහි කළ නොහැක්කේය. වීර්ය අඩු වී මෙනෙහි කිරීම් අතර වාරයේ ථීන- මිද්ධ යෙදෙන බැවින් මෙනෙහි කරන ලද්දද ප්‍රකට ලෙස සවිස්තරව දැකිය නොහැක්කේය. මේ වනාහි සමාධිය අධික වී මෙනෙහි කිරීමට බාධා සිදුවන ආකාරයයි.

සමතාවය ඇති උපෙක්ඛා ශක්තිය නිසා විරිය, සමාධි දෙක සම වූ විට අධික බලාපොරොත්තු තැබීමද අධික නොවේ. සමාධි ගත වීමද අධික නොවේ. විශේෂ ව්‍යාපාර නොකර පහළ වන්නාවූ රූප- නාම ප්‍රකටවද විසදවද වටහාගනී. ප්‍රකට වූ අරමුණු ප්‍රමාණය බොහෝ නිසා සිත විසිරි යාමක්ද නැත. ප්‍රකට රූප- නාමයන් ඉබේම ඉබේම මෙනෙහි වෙමින් මෙනෙහි වෙමින් පවතී. දතයුතු අරමුණු මත සමාධි ශක්තියද ප්‍රකට වේ. එවැනි අවස්ථාවන් හි යොගී හට මෙනෙහි නොවී අතහැරෙන අරමුණක් නැති තරම්ය. සියල්ලම මෙන් දැනගනී" යයි වටහාගනී.

මේ දක්වන ලද ක්‍රමය මගින් ශ්‍රද්ධා හා ප්‍රඥා- වීර්යා හා සමාධි යන ධර්මයන් සම බර ලෙස සිටීම් සවභාවය, ඒවායේ සම බව ඇති කරන සවභාවය, උපෙක්ඛා සම්බොජ්ඣංගය නම් වේ. මේ උපෙක්ඛා සම්බොජ්ඣංගය බලවත් වූ කල සතිය ආදී ධර්මයන්ද සම බරව බලවත්ව ද ප්‍රකටවද පහළ වේ. එවැනි අවස්ථාවේ මෙනෙහි කළයුතු අරමුණු සොයා යායුතු නැත. එක මෙනෙහි කිරීමක නිමාවත් සමගම ඊ ළඟ අරමුණ ඉබේම පහළ වී එයි. මෙනෙහි කිරීම සඳහා විශේෂ ආයාසයක් අවශ්‍ය

නොවේ. ස්වයංක්‍රීයව, ඉබේම මෙන් මෙනෙහි කරමින් අවබෝධ කරමින් සිටින්නා සේය. මෙනෙහි කළ යුතු අරමුණක් අපේක්ෂා නොකරන නිසා සිත යෙදෙන යෙදෙන අරමුණ මත සිත පිරිසිදුවේ. ශාන්ත වේ, තැන්පත්වේ. මෙනෙහි කළ අරමුණු වල රූප- නාම ධම්යන්ගේ ඇතිවීම - නැතිවීම ස්වභාව, අනිච්ච, දුක්ඛ, අනත්ත ස්වභාව විශේෂයෙන් කල්පනා නොකරම මෙනෙහි කළ පමණින් පිරිසිදුව වටහා ගනිමින් පවතී. දැනගත් දේද වහා පිළිගෙන ඒත්තු ගනියි. නැවත නැවතත් කල්පනා නොකරයි. මෙලෙස මෙනෙහි කර වටහා ගැනීම සමාකාර වූ විට අධිකව විරිය නොකරයි. සැහැල්ලු වීමක්ද සිදුනොවේ. අධික වීර්‍ය නිසා සිත විසිරී යා හැක. සැහැල්ලු ලෙස භාවනා කිරීමෙන්ද වීර්‍ය අඩු වී භාවනාව කැඩී යා හැක. මේ නිසා මුලින් මෙනෙහි කළ ආකාරයට, පදනම බිඳ නොගනිමින් භාවනා කළ යුතු. දැනගනිමින්, දැකගනිමින් ඇති එම විපස්සනා සිතම නැවත භාවනා කිරීම = පටිවිපස්සනා මගින් පහළවෙන්නාවූ මෙම බොජ්ඣංග හත තත්වාකාරයෙන් දැනගනී. **සන්තං වා අජ්ඣත්තං සති සම්බොජ්ඣංගං අත්ථි මෙ අජ්ජත්තං සති සම්බොජ්ඣංගාති පජානාති** යන්න හා ගැළපේ.

මේ බොජ්ඣංග ධම් ප්‍රකට වී, මෙනෙහි කිරීම හොඳින් සාර්ථක වූ අවස්ථාවක වීරිය අධික වීම නිසා මෙනෙහි කිරීම බාදා වූ අවස්ථාවක වේවා, මෙනෙහි නොකොට නැවීම, දිගහැරීම, සිතීම ආදී පහළ වූ අවස්ථාවක හෝ වේවා, "මෙනෙහි කිරීම දුර්වලයි. අමතක වෙනවා - සිතනවා" ආදිලෙස මෙනෙහි කොට බොජ්ඣංග ධම් නැති අවස්ථාවන්ද දැනගනී. **"අසන්තංවා අජ්ඣත්තං සති සංම්බොජ්ඣංගං නත්ථි මෙ අජ්ඣත්තං සති සම්බොජ්ඣංගොති පජානාති**" යන්න අනුකූලවේ.

මේ බොජ්ඣංග ධම්යෝද, පෙර පෙර මෙනෙහි කිරීම්-සතිය ආදිය පහළ කරවන්නෙම් යැයි මනසිකාරය යෙදවීම "මූල කම්ස්ථාන අරමුණ ආදියට මනසිකාරය යෙදවීම යන යෝනිසෝමනසිකාරය නිසා ප්‍රකට ලෙස පහළ වේ. නියම ක්‍රමානුකූල වූ එම මනසිකාරයද "කෙසේ මනසිකාරය පැවැත්වීමෙන් මෙම බොජ්ඣංග පහළ වෙත් දැයි යන්න ද බොජ්ඣංග මෙනෙහි කොට දැනගන්නා තැනැත්තා දනී. **යථා ච අනුප්පන්නස්ස සති සම්බොජ්ඣංගස්ස උප්පාදොති තඤ්ච පජානාති** යන්න අනුව ගැළපේ.

යථා ච උප්පන්නස්ස සති සම්බොජ්ඣංගස්ස භාවනාය පාරිපූරි හොති තඤ්ච පජානාති යන්න අනුව වටහා ගැනීම වනාහිः මේ බොජ්ඣංගයන් වැඩීම අර්හත් මාර්ගයෙන්ම අංග සම්පූර්ණවන නිසා රහත් බවට පත්වූ අවස්ථාවෙහි පමණක් පච්චවෙක්ඛණ ඥාණයෙන් සම්පූර්ණ වනු ඇත.

ආර්ය සත්‍යය සතර

දුක්ඛ අරිය සච්ච වූ = ආර්යයන් විසින් දත යුතු නියම සත්‍ය දුක, **දුක්ඛ සමුදය අරිය සච්ච** = ආර්යයන් විසින් දතයුතු දුක සඳහා නියම සත්‍ය වූ හේතුව, **දුක්ඛ නිරොධ අරිය සච්ච** = ආර්යයන් විසින් දතයුතු දුකෙහි සංසිඳීම නම් වූ නියම සුඛය, **දුක්ඛ නිරොධ ගාමිනි පටිපදා ආරිය සච්ච** = දුකෙහි සංසිඳීම නම් වූ නියම සුඛයට පත්වීමට හේතු වන්නා වූ ආර්යයන් විසින් දතයුතු නියම මාර්ගය යන මේ සතර වනාහි ආර්යයන් විසින් දතයුතු නියම ධර්මය වන නිසා ආර්යය සත්‍යය නම් වේ. මේවා සංක්ෂේප වශයෙන් **"දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග"** යැයිද කියනු ලැබේ.

දුක්ඛ සත්‍යය

යම් භවයක රූප- නාම ස්කන්ධයන් ප්‍රථමයෙන් පටන්ගැනීම **ජාති** නම් වේ. නැවත නැවතත් දිගට පහළ වන එම ස්කන්ධයන්හි මේරීම, දිරීම **ජරා** නම් වේ. එම ස්කන්ධයන්ගේ කෙළවර වීම **මරණ** නම් වේ. භවයක් භවයක් හා ගළපන මේ ඉපදීම, වයසට යෑම, මරණාදිය වනාහි කායික දුක, චෛතසික දුක ආදිය පහළ කළ හැකි නිසා දුක්ඛ සත්‍යය නම් වේ. දුක්ඛ ධර්මය = නරක ධර්මය = ප්‍රිය මනාප නොමැති ධර්මය = ප්‍රතිකූල ධර්මය පිළිබඳ නියම සත්‍යය යැයි කියනු ලැබේ. **ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා මරණම්පි දුක්ඛං**

දුක් හත

වේදනා- කැක්කුම ආදී විවිධ කායික දුෂ්කරතා, අමනාපකම්- කණගාටු ආදී විවිධ චෛතසික දුක්ද **"දුක්ඛ- දුක්ඛ"** නම් වේ. අනිත්‍යය බැවින්ද, පහළ වන අවස්ථාවේ දරාගත නොහැකි තරම් වන නිසාද ඉතා දුක්ඛිත, ඉතා නරක ධර්මයැයි කියනු ලැබේ.

මනාප වීම, සතුටු වීම ආදි ලෙසට කියන කායික හා චෛතසික සතුට, විවිධ වූ සුඛ වේදනා **"විපරිණාම දුක්ඛ"** නම් වේ. මෙය පහළ වන අවස්ථාවෙහි සතුටු මනාප බවෙක් වේ නම් එය දුරුව ගිය විට ඉඳුම්-

හිටුම් පහසුව නැතිවී වෙහෙසට පත්කරවන ධර්මයක් යැයි කියනු ලැබේ. මේ සතුට දුර්වලව පහළ වන්නේ නම් එය දුරුව ගිය විට දුර්වලවූ දුකක් පහළ වේ. උස නැති තැනකින් වැටුනු විට එතරම් වේදනා ගෙන නොදෙන්නාක් මෙනි. සතුට ප්‍රබලව පහළ වී පසුව එය දුරුව ගිය විට ඉතා අධිකව දුකට පත්වේ. උස් තැනකින් වැටුන විට ඇටකටු බිඳී මරණාසන්න දුකක් හෝ ගෙන දෙන්නේය. උමතු භාවයට හෝ මරණයට ද පත්විය හැකිය. සැප- සුඛ වේදනා ඇතිතාක් මේ ක්‍රමයමය. එම විපරිණාම දුක්ඛ පහළ වන අවස්ථාවේ ඇතිතාක් හොඳ සුඛ වේදනාදිය නිසා ඒවා නැති වී යන විට දුකක් වෙහෙසක්ම ගෙන දිය හැක්කේය. ප්‍රිය මනාප පුද්ගලයන්, වස්තුවක් නැතිව- වෙන්ව ගිය විට ඉඳුම් -හිටුම් පහසුවක් නොලබා වෙහෙසට පත්විය හැක්කේය. උක්ත පුද්ගලයන් හා වස්තු ලැබීමත් සමඟ පහළ වූ සුඛ වේදනා- සැපය නිසා ඇතිවේ. මේ දුක වේදනාව එම නිසා සුඛ වේදනා වනාහි විවිධ අරමුණු කරා සිත මෙහෙයවන මායා හා සමානය. තත්ත්වාකාරයෙන් දැන ගත හොත් යක්ෂණිය හෝ මෝහිණිය බිය ජනකය, ත්‍රාසජනකය. එම නිසා මෙම සුඛ වේදනාවටද විපරිණාම දුක්ඛ යැයි කියනු ලැබේ.

ප්‍රිය- මනාප වූ තණ්හාව හැර උපේක්ෂා වේදනාව හා ඉතිරි ලෞකික රූප- නාම සමූහ ඇති වීම- නැතිවීම වශයෙන් නිත්‍යය නොවන බැවින් **සංඛාර දුක්ඛ** නම් වේ. මේ දුක සමස්ථයක් ලෙස දුක්ඛ සත්‍යය ධර්මයන්හි පැතිර පවතී. සුඛ- දුක්ඛ වේදනාවෝද මේ සංඛාර දුකින් බාහිර නොවේ. එම නිසාම සළායතන වගග වෙදනා සංයුතතයෙහි,

තං ඛො පනෙතං භිකඛු මයා 'සංඛාරානං යෙව අනිච්චතං සන්ධාය' භාසිතං "යං කිඤ්චි වෙදයිතං තං දුකඛසම්නති"

මහණෙනි යම්තාක් වේදනා ඇත්තේද එම වේදනා සියල්ල දුක්ම යැයි යන මේ කථාව "සංඛාරයන්ගේ අනිච්චතාවම සළකා මවිසින් දේශනා කළේ " යැයි දේශනා කරන ලදී. නමුත් සුඛ වේදනාව තෙමේ සාමාන්‍යය. සංඛාර දුක්ඛයට වඩාත් සමානය. එය දුරුවූ විට නැවත ප්‍රාර්ථනා කරන මුත් ප්‍රකෘති ස්වභාවයෙන් වෙනතකට පෙරළී ගොස් දුකට පත්විය හැකි බැවින්, තත්ත්වාකාරයෙන් දකී නම් සාමාන්‍ය සංඛාර දුක්ඛයකට වඩා බියජනකය. දුක්ඛ වේදනාව වනාහි පහළ වූ විට වර්තමානවද නොඉවසන සවභාවය ඇති බැවින් සාමාන්‍යය. සංඛාර දුක්ඛ වනාහි විපරිනාම

දුකඛයන්ට වඩා බිය ජනක, ත්‍රාසජනක බව ඇත්තේය. අන්තිම දුකක් වන්නේය. මේ නිසා මේවා සංඛාර දුක්ඛයෙන් වෙන් කොට ගෙනහැර පාමින් විපරිණාම දුක්ඛ, යන ලෙසට අට්ඨකථාචාර්‍යයන් වහන්සේලා ප්‍රකාශ කරත්. අජඣත්ත - බහිද්ධා අරමුණු- වස්තූන් කෙරෙහි ඇලී බැඳී වෙලී ගනු ලබන්නේ රූප- නාම සංඛාරයන් නිත්‍ය යැයි වරදවා වටහා ගන්නා නිසාය. "අඛණ්ඩව ඇති- නැතිවෙමින් තිබේ, සතුට සඳහා නිතරම අලුත් වැඩියා කළ යුතු වේ" යැයි තත්ත්වාකාරයෙන් දැනගත් කල්හි නිත්‍යය- සුඛ- සුභ යයි, හොඳ යැයි සැළකිය නොහැක්කේය. බිය ජනක, ත්‍රාසජනක යැයිම සළකයි. එම නිසා එම සංස්කාරයන් කෙරෙහි තවදුරටත් නොඇලී නොබැඳී ගනී. එම නිසා විපස්සනාව සම්බන්ධයෙන් දුකඛ සත්‍යය දක්වන ස්ථානයෙහි මේ **සංඛාර දුකඛය** අදහස් කරන බව පැහැදිළි ලෙස දැන ගත යුතුවේ.

හිසරදය, ඇස් අමාරුව, දත් කැක්කුම ආදීය කායික දුක්ය. රාග නිසා සිත සැලීම, දොස නිසා සිත තැවීම, බලාපොරොත්තු කඩ වීම- කණගාටුව ආදීය චෛතසික දුක වේ. මේ කායික දුකක් විඳින්නා එය අනුනට කීමෙන්ම, අනුනට දැනගත හැක්කේය. නොකියන කල්හී දැනගත නොහැක්කේය. එම නිසා එවැනි දුකක් **පටිච්ඡන්න දුකඛ** = සැඟවුන දුක් යැයි කියනු ලැබේ. **අපාකට දුකඛ** = අප්‍රකට දුක යැයි ද කියන ලදි. දණ්ඩ, කඩුව, පොල්ල ආදිය නිසා පහළ වන තුවාල හෙවත් කායික දුක **අපටිච්ඡන්න දුකඛ** = සැඟවිය නොහැකි දුකක් යයි කියනු ලැබේ. **පාකට දුකඛ** = ප්‍රකට දුක යැයි කියනු ලැබේ.

දුක් වේදනාව **නිප්පරියාය දුකඛ** නම් වේ. මුඛ්‍ය වූ දුකකැයි කියනු ලැබේ. එයින් පරවූ ජාති දුකඛ ආදිය **පරියාය දුකඛ** නම් වේ. මුල් සවභාව වශයෙන් නොදැරිය හැකි නොවන නමුත් කායික දුක් චෛතසික දුක් විවිධ ලෙස පහළ කරවිය හැකි හෙයින් පරියාය ලෙස දුක් = නරක ධර්ම යැයි කියනු ලැබේ.

මේ හත් ආකාර දුක් අතරින් **පරියාය දුකඛ** වශයෙන් දක්වන ලද ජාති, ජරා, මරණාදිය දුක්ඛ සත්‍යය නම් වේ.

ඥාති ව්‍යසන, භෝග ව්‍යසන, රෝග ව්‍යසන, සීල ව්‍යසන, දිට්ඨි ව්‍යසන යන මේ ව්‍යසනයන් පහ හමුවේ වේවා, හිරිහැර- දඬුවම් ලැබීම, දඟ ගෙහි ලැම් ආදී දුක්දෙන හේතුවක් හමුවේ වේවා, "මේවා වේවි යැයි"

සිතා හෝ වේවා කණගාටු වීම, සිත දුක් ගැනීම්, තැවීම්, ආදිය **සොක** නම් වේ. ඖලාරික, අධික ශෝකය නිසා ඇඬීම, වැළපීම, **පරිදෙව** නම් වේ. අඬා වැළපීම් වලින් නතර නොවී තව තවත් ශෝකවීම, නොදැරිය හැකි ශෝක වීම **උපායාසය** නම් වේ. කායික දුක් සියල්ල **දුක** නම් වේ. හුදු සිත නරක් වීම **දොමනසස** නම් වේ. මේ කුළ ශෝක, දුකඛ, දොමනසස යන මේ තුන **දුකඛ දුකඛ** වන බැවින්ද තව දුටත් කායික චෛතසික දුක ඇති කරවිය හැකි බැවින්ද දුක්ඛ සත්‍යය නම් වේ. පරිදෙව, උපායාස, යන මේ ධර්ම දෙක වනාහි කායික, චෛතසික දුක් ගෙන දිය හැකි පරියාය දුකඛ වන බැවින්ම දුක්ඛ සත්‍යය නම් වේ. අප්‍රිය පුද්ගලයන්, අරමුණු, වස්තු හමු වී අමනාප වීම, ප්‍රිය පුද්ගලයන්ගෙන් වෙන් වීම, හමුනොවීම, නොලැබිය හැකි යමක් කැමති වීම, යන මේ තුන් ආකාරයන්ද කායික, චෛතසික, දුක් ආදිය ඇති කරවිය හැකි බැවින් දුක්ඛ සත්‍යය නම් වේ.

දකින අසන අවස්ථාවේදී මෙනෙහි නොකරන පුද්ගලයා ඒ ඒ අවස්ථාවන්හි ප්‍රකටව ඇති රූප- වේදනා- සඤ්ඤා- සංඛාර- විඤ්ඤාණ මත තණ්හා- දිට්ඨි වශයෙන් වරදවා ගන්නා ආකාරය තුන්වන පරිච්ඡේදයෙහි හදෙදකරතත සූත්‍රයෙහිලා දක්වන ලදි. මෙලෙස මෙනෙහි නොකරන වාරයක් පාසා වරදවා වටහා ගැනීම සිදු වන නිසා එම රූප- වේදනා- සඤ්ඤා- සංඛාර- විඤ්ඤාණ මේවා උපාදානකඛනධ නම් වෙත්. මෙම උපාදානකඛනධ ඇත්තේ නම් ජාති ආදී එකොලොස් ආකාර දුක් පහළ විය හැක්කේය. එම නිසා කෙටියෙන් දක්වන කල්හි දකින, අසන අවස්ථාවක් පාසා ප්‍රකටව ඇති උපාදානස්කන්ධ පහ දුක්ඛ සත්‍යය නම් වේ. ඇති වීම්- නැති වීම් සහිත අනිත්‍යය සංඛාර දුකඛ වීම නිසාද ජාති දුකඛ ආදී විවිධ දුක්වල ඇති වීමට ස්ථානය වන බැවින්ද දුක් වූ ධර්ම = නරක ධර්ම = ප්‍රිය මනාප බැවින් තොර ධර්ම = නියම ප්‍රතික්කුල වූ බිය ජනක වූ ධර්ම යැයි කියනු ලැබේ. එම නිසා **"සංඛිතෙතන පඤචු- පාදානඛනධා දුකඛා"** යැයි දේශනා කරන ලදි.

සංඛිතෙතන = සංක්ෂිප්ත වශයෙන්

පඤචුපාදානකඛනධා = වරදවා ගතහැකිවූ, තණ්හා-දිට්ඨි වශයෙන් වරදවා ගැනීමට ගොදුරුවන්නාවූ පඤ්චස්කන්ධය.

දුකඛා = දුක්වේ.

ච = නරක ධම්යෝමය.

සමුදය සත්‍යය

දකින විට ආදියෙහිදී ප්‍රකටව ඇති උපාදාන ස්කන්ධ දුක්ඛ සත්‍යය ධම්යෝය. හොඳ- උතුම් යයි මනාප වී, ප්‍රිය වී අල්ලා බඳා ගැනීම තණ්හාව වේ. මේ තණ්හා දුරු නොකළ තැනැත්තා වර්තමාන සැප, සුඛ සඳහා හෝ පසු සැප, සුඛ සඳහා බලාපොරොත්තුවෙන් පිරිසිදු සිතින් සිතා කථා කරන- කටයුතු කරන වාරයක් පාසා කුසල ක්‍රියා (වරදි නැති ක්‍රියා) සිදුවේ. අපිරිසිදු අප්‍රසන්න සිතින් සිතා කථාකරන- ක්‍රියාකරන වාරයක් පාසා අකුසල කර්ම (වරද සහිත ක්‍රියා) සිදුවේ. එක් භවයකදී මේ කුසල, අකුසල කම්යෝ ගණන් කළ නොහැකි තරම් අධිකව සිදුවේ. නමුදු කරන ලද එම බොහෝ කර්ම තුළින් අවස්ථාවක් ලැබෙන පරිදි එක්තරා කර්මයක් හෝ වේවා එම කර්මය සිදුකරන විට වූ අරමුණ හෝ වේවා මරණාසන්න මොහොතෙහි සිතේ පහළ වේ. නැතිනම් ජනිත වන්නාවූ නව ස්ථානය, ස්වභාවය, අරමුණ එම කර්මය හේතුකොට සිතෙහි පහළ වේ. සිහිනයක් දක්නා සේය. මේ අරමුණු තුන් වර්ගය තුළින් එකක් අල්ලාගත හොත් මැරෙන්නාවූ පුද්ගලයාගේ අවසාන රූප- නාම නිරෝධ වීම හා සමගම උක්ත අරමුණම අල්ලාගෙන, එම කර්මය නිසාම නව භව ස්ථානයෙහි උපාදානස්කන්ධ පහ පහළ වෙත්. මෙහිලා අල්ලා ගන්නා ලද ආකාරය වනාහි බිය ජනක සිහිනයක් දකින්නාට අවදි වීමෙන් අනතුරුවද එම බිය පහ නොවී පවතින්නා සේය. පෙර හා පසු සම්බන්ධ වන ආකාරය වනාහි දුටු අවස්ථාවෙහි සිතිවිලි දිගට පහළ වෙමින් පවතිනවා හා සමාන වේ. (යෝගින්ට පහසුවෙන් වටහා ගත හැකි උපමාවන්ය)

මෙය, අලුතින් පහළ වූ එම ශරීරයෙහි දිගින් දිගට, එම නව භවයෙහි මරණය තෙක්, නැවත- නැවතත් උපාදානස්කන්ධයන් සම්බන්ධ වෙමින් පවතී. මේ භවයෙහිදී දුටු දෙයක් නැවත එසේම දැකීම, දුටු පසු කල්පනා කිරීම, දුටු පසු ඒ ගැන ඇසීම ආදි ලෙසට උපාදානස්කන්ධ පහ අඛණ්ඩව පහළවෙමින් පවතින්නා හා සමාන වේ. මෙලෙස වන උපාදන ස්කන්ධයන්ගේ ප්‍රථම පහළ වීම ජාතිදුක්ඛ නම් වේ. නැවත, නැවතත් පහළ වෙමින් මෙම ස්කන්ධයන්ගේ මේරීම ජරාදුක්ඛ නම් වේ. මිය යැමට කලින්ද විවිධ හේතූන් නිසා පහළ වන්නාවූ සොක- පරිදෙව ආදියද දුක්ම වේ. මේ

දුක්ඛ සත්‍යය ධම්යෝ කුමක් නිසා පහළ වන්නේද යත්: කම්ය නිසා පහළ වේ. කම්ය කුමක් නිසා එලගෙන දිය හැක්කේද යත්, උපාදානස්කන්ධයන් මත ඇලී බැඳී ගන්නා තණ්හාව නිසාම වේ. මේ තණ්හාව දුරුකළ පුද්ගලයාට අලුත් කම්යෝද සිදුකළ නොහැක්කේය. මේ නිසා භවයක් භවයක් පාසා ප්‍රථමයෙන් පහළ වන උපාදානස්කන්ධය ආදී කොට ඇති දුක් සියල්ලෙහි මූල හේතුව තණ්හාවම වේ. එම නිසා දකින අවස්ථාවෙහි ආදියේ ඇති උපාදානස්කන්ධයන් හොඳය, උතුම් යැයි සිතාගෙන මනාප වීම, ඇලී බැඳී ගැනීම සිදු කරන තණ්හාව සමුදය සත්‍යය නම් වේ. **යායං තණ්හා පොණොභවිකා නන්දි රාග සහගතා** යන්න අනුකූලවේ.

නිරෝධ සත්‍යය

ශාන්තවූ නිවන, මාග් ඥානයෙන් දැක, දැනගත් කල්හී ඇති- නැතිවන රූප- නාමස්කන්ධයන් ඇතිතාක් සියල්ල දුක යැයි ඇත්තටම විනිශ්චය කළ හැක්කේය. එම නිසා, රූප- නාම ස්කන්ධයන් කෙරෙහි ඇලී- බැඳී ගන්නා බව දුරුවූ නිසා, අලුත් භවයක් සඳහා රූප- නාම ස්කන්ධයන් කෙරෙහී ඇලී- බැඳී ගන්නා බව දුරුවූ නිසා අලුත් භවයක් සඳහා රූප- නාම ස්කන්ධයන් පහළ නොවීම වනාහි **අනුපාදිසෙ ස නිබ්බාන** යයි කියන දුකෙහි කෙළවර වීමයි. මෙහිලා නිරෝධය යනු පහළ විය යුතු ස්කන්ධයන්ගේ පහළ නොවීමයි. එම නිසා අට්ඨකථාහි **අනුප්පාද නිරොධ** යැයි දක්වයි. එම නිසා සමුදය සත්‍ය නම් වූ තණ්හාව හා දුක්ඛ සත්‍යය නම් වූ රූප- නාම ස්කන්ධයන්ගේ පහළ නොවීම- ක්‍ෂය වීම වන්නාවූ මාග් ඥාණයෙහි අරමුණ වන්නාවූ නිවන නිරොධ සත්‍යයි. "**යො තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො**" යන්නට අනුකූලවයි.

මාග් සත්‍යය

මෙම නිවන අරමුණු කොට ඇස් පනාපිට දැනගන්නා සමමා දිට්ඨි ආදිකොට ඇති මාගීංග අට මාර්ග සත්‍යය නම් වේ.

සුතමය ඥාණ අඩු පුද්ගලයාට

පෘථග්ජනයන්ගේ සන්තානයේ ඇතිව නැති වන තාක් රූප- නාම දුක්ඛ හා සමුදය සත්‍යයෝම වෙත්. ඒ දෙක තුළින් ආසාව- කැමති බව

වනාහි සමුදය සත්‍යයම වේ. ඉතිරි රූප- නාම ඇතිතාක් සියල්ල දුක්ඛ සත්‍යයම වේ. මෙනෙහි කළ යුතු අරමුණු සහ මෙනෙහි කොට දැනගන්නා දේහි ක්‍ෂය වීම- ගෙවී යෑම නිරෝධ සත්‍යය නම් වේ. එම නිරෝධ වීම-ගෙවී යාම වර්තමානව ඇස්පනාපිට දැනගන්නා ධර්මය මාර්ග සත්‍යය නම්වේ.

සත්‍යය සතර මෙනෙහි කරන ආකාරය

මේ සත්‍යය සතර තුළ දුකඛ- සමුදය යන වට්ට සත්‍යයන් දෙක මත පමණක් මනසිකාරය යොදා භාවනා කළ යුතු වේ. නිරෝධ හා මග්ග යන මේ විවට්ට සත්‍යයන් දෙක වනාහි හොඳයයි උතුම් යැයි සුතමය වශයෙන් දැන ඒ සඳහා සිත නතු කිරීම පමණක් අවශ්‍ය වේ. එම නිසා චතුරාර්‍ය්‍ය සත්‍යය කර්මස්ථානය සම්බන්ධ අට්ඨකථා විවරණය මෙසේ දක්වයි.

තත්‍ථ පුරිමානි ද්වෙ සච්චානි වට්ටං, පච්ඡිමානි විවට්ටං තෙසු භික්ඛුනො වට්ටෙ කම්මට්ඨානාභිනිවෙසො හොති, විවට්ටෙ නත්‍ථි අභිනිවෙසො, පුරිමානි හි ද්වෙ සච්චානි පඤ්චක්ඛන්‍ධා දුක්ඛං, තණ්හා සමුදයොති එවං සංඛෙපෙන ච කතමෙ පඤ්චක්ඛන්‍ධා රූපක්ඛන්‍ධොති ආදිනා නයෙන විත්‍ථාරෙන ච, ආචරියස්ස සන්තිකෙ උග්ගණ්හිත්‍වා වාචාය පුනප්පුනං පරිවත්තෙන්තො යොගාවචරො කම්මං කරොති. ඉතරෙසු පන ද්වීසු සච්චෙසු "නිරොධ සච්චං ඉට්ඨං කන්තං මනාපං, මග්ග සච්චං ඉට්ඨං කන්තං මනාපන්ති" එවං සවනෙනෙව කම්මං කරොති. සො එවං කරොන්තො චත්තාරි සච්චානි එකප්පටිවෙධෙනෙව පටිවිජ්ඣති. එකාභිසමයෙන අභිසමෙති, දුක්ඛං පරිඤ්ඤා පටිවේධෙන පටිවිජ්ඣති, සමුදයං පහාන පටිවෙධෙන පටිවිජ්ඣති, නිරොධං සච්ඡිකිරියා පටිවෙධෙන පටිවිජ්ඣ මග්ගං භාවනා පටිවෙධෙන පටිවිජ්ඣති, දුක්ඛං පරිඤ්ඤාභිසමෙයෙන අභිසමෙති සමුදයං පහානාභි-සමයෙන, නිරොධං සච්ඡිකිරියාභිසමයෙන මග්ගං භාවනාභිසමෙන අභිසමෙති. එවමස්ස පුබ්බභාගෙ ද්වීසු සච්චෙසු උග්ගහ පරිපුච්ඡා සවන ධාරණ සම්මසන පටිවෙධො හොති, ද්වීසු පන සවනප්පටිවෙධොයෙව, අපරභාගෙතිසු කිච්චතො පටිවෙධො හොති. නිරොධො අරම්මණප්පටිවෙධො [දී. අ. 2/580]

තත්‍ථ	=	එම සත්‍යය සතර අතරින්
පුරිමානි ද්වෙ සච්චානි	=	පෙර සත්‍යයන් දෙක
වට්ටං	=	වට්ට සත්‍යය නම් වේ.
පච්ඡිමානි	=	පසු සත්‍යය දෙක

විවටටං	=	වටට දුකින් තොරවූ විවට්ට සත්‍ය නම් වේ.
තෙසු	=	එම සත්‍ය සතර තුළින්
වටෙට	=	වට්ට සත්‍ය දෙකෙහි
භිකඛුනො	=	භික්ෂුවකගේ
කමමටඨානාභිනිවෙසො	=	කම්මට්ඨානයට බැසීම, මනසිකාරය යෙදීම
හොති	=	වෙයි.
විවටෙට	=	එම විවට්ට සත්‍යයන්හී
අභිනිවෙසො	=	(එසේ) මනසිකාරය පැවැත්වීමක්
නත්ථි	=	නැත
හි	=	විස්තර වශයෙන් වනාහි
පඤචකඛනධා	=	ස්කන්ධ පහ
දුකඛං	=	දුක්ය
තණහා	=	තණ්හාව
සමුදයො	=	දුක පිණිස හේතු වේ.
ඉති එවං	=	මෙසේ
සංඛෙපෙනෙව	=	සංක්ෂෙපයෙන්(උගගණ්හිත්වා යන්න හා බැඳේ)
පඤචකඛනධා	=	ස්කන්ධ පහ (=පඤ්චකය)
කතමෙ	=	මොනවාද?
රූපකඛනධො	=	රූප සමූහ
ඉති ආදිනයෙන	=	මේ ආදී ක්‍රමයට
විත්ථාරෙත්වා	=	විස්ථාර ක්‍රමයටද වශයෙන්
පුරිමානි ද්වෙ සච්චානි	=	පෙර සත්‍යයන් දෙක
ආචරියසස සනතිකෙ	=	ආචාර්යවරයාගේ සමීපයේ
උගගණහිත්වා	=	උගෙන
වාචාය	=	කට පාඩම්කොට

පුනප්පුනං පරිවත්තෙන්තො	=	නැවත නැවතත් පෙරළමින්
යොගාවචරො	=	යෝගි පුද්ගලයා
කම්මං	=	විපස්සනා කර්මය
කරොති	=	සිද්ධ කරයි
ඉතරෙසු පන ද්වීසු සච්චෙසු	=	මේ හැර ඉතිරි සත්‍යයන් දෙක අතරින්
නිරොධ සච්චං	=	නිරෝධ සත්‍යය
ඉට්ඨං	=	ඉෂ්ට වූ, හොඳ වූ
කන්තං	=	කාන්ත වූ, සිත්ගත්
මනාපං	=	මනාප ධර්මයකි
මග්ග සච්චං	=	මාර්ග සත්‍යය
ඉට්ඨං	=	ඉෂ්ටය
කන්තං	=	කාන්තය
මනාපං	=	මනාපය
ඉති එවං	=	මෙලෙස
සවනෙනෙව	=	ඇසීමෙන්ම
කම්මං	=	විපස්සනා කර්මය කෙරේ
සො	=	එම යෝගි තෙම
එවං	=	මේ දැක්වූ ක්‍රමයට
කරොන්තො	=	භාවනා කරන කල්හි
චත්තාරි සච්චානි	=	සත්‍යය සතර
එකප්පටිවෙධෙනෙව	=	එකවැරම විනිවිද දැක දැන ගැනීමෙන්
පටිවිජ්ඣති	=	මාර්ග ක්ෂණයෙහි ප්‍රතිවේධ කරයි.
එකාභිසමයෙන	=	එකවැරම, කෙළින්ම දැන ගැන්මෙන්ම
අභිසමෙති	=	මාර්ග ක්ෂණයෙහි, සෘජුවම දැනගනී.
දුක්ඛන්ති	=	දුක්ඛ සත්‍යය යැයි
පරිඤ්ඤා පටිවෙධෙන	=	පිරිසිඳ දැන ගැනීම නම් වූ ප්‍රතිවේධයෙන්
පටිවිජ්ඣති	=	විනිවිද දැක දැනගනී

සමුදයං = සමුදය සත්‍යය
පහානපපටිවෙධෙන = ප්‍රහාණය නම්වූ විනිවිද ගැනීමෙන්
පටිවිජ්ඣති = විනිවිද දැන, දැකගනී
නිරොධං = නිරොධ සත්‍යය
සච්ඡිකිරියා පටිවෙධෙන = සාක්ෂාත් කිරීම නම් වූ ප්‍රතිවේධයෙන්
පටිවිජ්ඣති = විනිවිද දැක- දැනගනී
මගගං = මාර්ග සත්‍යය
භාවනා පටිවෙධෙන = භාවනා කිරීම නම් වූ විනිවිද ගැනීමෙන්
පටිවිජ්ඣති = විනිවිද දැක-දැන ගනී
දුකඛං = දුකඛ සත්‍යය
පරිඤ්ඤාභිසමයෙන = පිරිසිඳ දැනගැනීම නම් වූ ප්‍රතිවේධයෙන්
අභිසමෙති = කෙළින්ම දැනගනී
සමුදයං = සමුදය සත්‍යය
මගගං = මාර්ග සත්‍යය
භාවනාභිසමයෙන = භාවනා නම් වූ දැනගැනීමෙන්
අභිසමෙති = සෘජුවම දැනගනී.
එවං = මේ දක්වූ ක්‍රමයට
අසස = එම යෝගාවචරයාට
පුබ්බභාගෙ = පූර්ව භාගයෙහි
ද්විසු සචෙචසු = ලෞකික සත්‍යය දෙක
උගගහ පරිපුචඡා සවන ධාරණ
සමමසන පටිවෙධො [1] = උද්ග්‍රහණය, විමසීම, අසා දැනගැනීම, සිත්හි දරා ගැනීම හා සම්මසනය යන ප්‍රතිවේධ
හොති = වේ
පහානාභිසමයෙන = ප්‍රහාණය නම්වූ සෘජු දැනගැනීමෙන්
හොති = වේ
ද්විසුපන = නිරොධ-මගග යන සත්‍යයන් දෙක වනාහි
සවනපපටිවෙධොයෙව = අසා දැනගැනීමෙන්ම

හොති	=	වේ
අපරභාගෙ	=	පසුව සිදුවන මාර්ගක්ෂණයෙහි
තීසු	=	දුකඛ- සමුදය-මග්ග යන සත්‍යයන් තුනෙහි
කිච්චතො	=	දැන ගැනීමේ කෘත්‍ය වශයෙන්
පටිවෙධො	=	ප්‍රතිවේධය සිදුවේ
නිරොධො	=	නිරෝධ සත්‍යයෙහි
ආරම්මණ පටිවෙධො	=	අරමුණු කොට දැන ගැනීම
හොති	=	වේ.[2]

පුථුජ්ජනයන්ට සුදුධ ලෝකෝත්තර ධර්ම අරමුණු කළ නොහැකි බැවින්ද, ආර්යන් වහනසේලාට වනාහි අරමුණු කළ හැකි නමුදු ලොකුත්තර ධර්මයන් හුදු සළකා බැලීම් මාත්‍රයකින් පමණක් කෙළෙස් දුරුකිරීම නම් වූ ප්‍රතිඵලය නොලබන නිසා ද නිරෝධ- මගග සත්‍යයන් සළකා බලමින් භාවනා කිරීම නොකළ යුතුය. **ඉට්ඨං කන්තං** ආදී අට්ඨකථා මාර්ගයෙන් ලෝකුත්තර සත්‍යයන්ට සිත නැවීම දක්වයි. "**අද්ධා ඉමාය පටිපත්තියා ජරාමරණම්හා පරිමුඤ්චිස්සාමි** = මේ ප්‍රතිපත්ති මගින් ජරා- මරණයන්ගෙන් ඒකාන්තයෙන් මිදෙන්නෙමි"යි සිතා ඒ දෙසට නතු කරන්නා සේ "නිර්වාන ධර්මය- මාර්ග ධර්මය යන මේවා හොඳය. මේවා දැන ගැනීමට- ලබාගැනීමට උත්සාහ කළ යුතුය" යි පෙරාතුවම සිත නවන්නේ නම් එම සත්‍යයන් දෙක කෙරෙහි කළ යුත්ත කළා නම් වන්නේය. නමුදු අධික ලෙස කැමති වී නැවත නැවතත් නිතර නිතර සිත යොදනවා නොවේ. භාවනා කරන කාලයේ මෙලෙස කරන්නේ නම් තණ්හා- දිට්ඨි පහළ වී විපස්සනාව පිරිහී යා හැක්කේය. පිරිහෙන ආකාරය දෙවන පරිච්ඡේදයෙහි පඨම නියන්‍යානාවරණයෙහි ලා දක්වන ලදි. එම නිසා ටීකාහී මෙලෙස දක්වයි.

---

1 (උග්ගහ පරිපුච්ඡා සවන ධාරණ වශයෙන් දැනගැනීම පරියත්ති ඥානම වේ. විපස්සනා ප්‍රතිපත්ති දූනාද නොවේ. සම්මසන වශයෙන් දැනීමයි විපස්සනා දැනීම වේ. මෙහිලා විපස්සනා සියල්ල සම්මසන පරිච්ඡේද යැයි කියනු ලැබේ. සම්මසන ඥාණය යයි කියනවා නොවේ.)

2 නිරෝධයත් මග්ග ඥාණයෙන් අරමුණු කොට දැනගනී. ඉතිරි සත්‍යයන් තුන වනාහි පරිඤ්ඤා- පහාන- භාවනා කෘත්‍යය සම්පූර්ණ නිසා දන්නේ ඇයි කිය යුතු වේ. මේ ඉතිරි සත්‍යයන් අරමුණු කොට දැනගන්නවා නොවේ යන්න ලෙගයයි

වටෙට කමමටඨානාභිනිවෙසො, සරූපතො පරිගගහසබභාවතො. විවටට නත්ථි, අවිසයතතා, විසයතෙතපිච පයොජනාභාවතො - පෙ- ඉටඨං කනතනති නිරොධ මගෙගසු නිනනභාවං දසෙසති, න අභිනනදනං, තනනිනන භාවො යෙව ච තතථ කමමකරණං දටඨබබං [දී. අ. 2/530]

2 නිරෝධයම මගග ඥාණයෙන් අරමුණු කොට දැනගනී. ඉතිරි සත්‍යයන් තුන වනාහි පරිඥාඥා- පහානා- භාවනා කෘත්‍යය සම්පූර්ණ නිසා දන්නේ යැයි කිය යුතු වේ. මේ ඉතිරි සත්‍යයන් අරමුණු කොට දැනගන්නවා නොවේ යන්න අදහසයි.

සරූපතො = ස්වරූප වශයෙන්

පරිගගහසබභාවතො = පරිගගහ කොට භාවනා කිරීම කරන බැවින්

වටෙට = වට්ට සත්‍ය දෙකෙහි

කමමටඨානාභිනිවෙසො = කමටහනට සිත යෙදීම

හොති = වේ

අවිසයතතාව = පුථුජ්ජනයන්ට ස්වරූප වශයෙන් පරිග්‍රහ කොට භාවනා කළ හැකි අරමුණු නොවන බැවින්ද,

විසයෙතෙතපි = ආර්යයන් විසින් පරිග්‍රහ කළ හැකි අරමුණක් වන නමුදු

පයොජනාභාවතො ච = අර්ථයක් ප්‍රයෝජනයක් නැති නිසාද

විවටෙට = විවට්ට සත්‍ය දෙකහි

කමමටඨානාභිනිවෙසො = කමටහනට සිත යෙදීමක්

නත්ථි = නැත

-පෙ-

ඉටඨං කනතං = ආදී වශයෙන්

නිරොධ මගෙගසු = නිරෝධ- මගග සත්‍යයන් කෙරෙහි

නිනනභාවං = නැමෙන බව

දසෙසති = දක්වයි

අභිනනදනං = තණ්හා දිට්ඨි වශයෙන් ඇලී බැඳීම

න දසෙසති	=	දක්වනවා නොවේ.
ච	=	තවදුරටත් කරුණු දක්වතොත්
තං නිනනභාවොයෙව	=	එම නිර්වාණය, මාර්ගය යන මේවා කෙරෙහි සිත නැවීම් මාත්‍රයෙන්
තතථ කමම කරණං	=	එම නිරෝධ, මග්ග සත්‍යයන් කෙරෙහි කළ යුත්ත කිරීම වේ යැයි,
දටඨබබං	=	දත යුතුයි.

දුක වටහා ගන්නා ආකාරය

පහළ වන නාම- රූප මෙනෙහි කරන්නා දකින අවස්ථාවේ ආදියෙහි ප්‍රකටව ඇති රූප- නාමයන්ගේ සුවිශේෂ ස්වභාව ලක්‍ෂණාදිය දැනගනී. **රුපපන ලකඛණා** = විකාරයට පත්වන සවභාව, පෙරළෙන සවභාව, **නමන ලකඛණා**= ඇතිවීම- නැති වීම දෙකෙන් පෙළෙන බව, තමා දරන පුද්ගලයා පෙළෙන බව, කායික චෛතසික දුක් ඇතිකරමින් පෙළන සවභාවය, දැරිය නොහැකි තරමට පත්කොට පෙළෙන දුකඛ වෙදනා සවභාවයද දැනගනී. මේ බාධක ලක්‍ෂණය දක්නා නිසාම **සුතමය ඤාණ** නැත්තකු වුවද ඤාණය ප්‍රබලව නැගී ආකල මෙලෙසට අවලාද මැසිවිලි කියමින්, චෝදනා බහුලව සිටිනවා විය හැක්කේය. දිගින් දිගට"ඇති වෙමින්- නැති වෙමින් තිබෙන හුදු ධම් පමණක්ය. විනාශ වෙමින්ම පවතින්නේය. මෙනෙහි කරන තාක් නරක දේමය, මේවා සංසිඳෙන තාක් සැනසීමක් කැළම නැත. මේවා ඇති නිසා දුකට පත්වී සිටින්නෙමි. කෙලෙස සන්සිඳවන්නද" යනාදි ලෙස නිතරම අවලාද කරමින් සිටිය හැක්කේය. මෙලෙස ස්වභාව ලක්‍ෂණ ආදිය **රුප්පන- නමන-බාධන ලක්‍ෂණ** වශයෙන්ද මෙනෙහි කරන කරන වතාවේ තත්ත්වාකාරයෙන් දැනගැනීම:-

ඉදං දුකඛනති යථාභූතං පජානාති යන පාළිය

ඨපෙතවා තණහං තෙභූමකධමෙම ඉදං දුකඛනති යථා සභාවතො පජානාති - යන අට්ඨකථා [දී. අ. 2/576]

යථාසභාවතොති අවිපරිත සභාවතො, බාධන ලකඛණතො, යො යො සභාවො යථා සභාවො, තතො රුපපනාදි කකඛලතනාදි සභාවතො

[දී. ටී. 2/525] යන ටීකාවක්ට අනුව විපස්සනා භාවනාවෙන් දුකඛ සත්‍යය පිරිසිඳ දැන ගැනීමයි.

ඉහත අට්ඨකථාහී අර්ථය.

ඨපෙත්වා තණ්හං = තණ්හාව හැර

තෙභූමක ධම්මෙ = භව තුන්තලයෙහි වන්නාවූ ධර්මයන්

ඉදං දුක්ඛන්ති = මේ දුකයැයි

යථා සභාවතො = තත්ත්වාකාරයෙන්

පජානාති = දැනගනී.

ඨීකාහි අර්ථය

යථාසභාවතොති - "**යථාසභාවතොති**"යන්න

අවිපරීත සභාවතො = විපරීත නොවන්නාවූ තත්ත්වාකාර, ස්වභාව වශයෙන්

බාධන ලක්ඛණතො = නොඉවසිය හැකි දුක්ඛ වේදනා ඇතිවීමෙන් පෙළීම, කායික චෛතසික දුක් පහළ කරවමින් පෙළීම, ඇතිවීම - නැතිවීම දෙකින් පෙළීම, ඇතිවීම- නැතිවීම වශයෙන් පුද්ගලයා පෙළීම් ස්වභාව වශයෙන් (**බාධන ලක්ඛණන්ති එතථ දුක්ඛ දුක්ඛතං නිමිත්තභාවො, උදයබ්බය පටිපීළිත භාවොවා** - මහා ටීකා)

වා = වෙනත් ආකාරයකට දක්වතොත් වනාහි

යො යො සභාවො = ඒ ඒ ස්වභාවයන්

යථා සභාවො = යථා සභාව නම් වේ.

තතො රුප්පනාදි කක්ඛලත්ථාදි සභාව තො

= එම විපරීත ලක්ෂණාදී ස්වභාව, ගොරෝසු බව ආදී සභාව වශයෙන් (**පජානාති** - දැනගනී.)

අනින්ද්‍රිය බද්ධ රූප දුක්ඛ සත්‍යය නොවේ

ඉහත දැක්වූ අට්ඨ කථාහි **තෙභූමක ධම්මෙ** යන තැන සත්ත්වයන්ගේ සන්තානයන්හි ඇති කාම-රූප- අරූප ධර්මයෝම පමණක් ආර්ය දුක්ඛ සත්‍යයි සළකා ගත යුතුවේ. සත්ත්වයන්ගේ ආත්මභාවයට ඇතුළත් නොවන්නා වූ අනින්ද්‍රිය බද්ධ රූප ආර්ය දුක්ඛ සත්‍යයට ඇතුළත් කොට

නොගත යුතු හේතුව වනාහිඃ අනින්ද්‍රිය බද්ධ රූපයන්ට වනාහි ඇති වීම් - නැතිවීම් සහිත අනිච්ච- දුක්ඛ භාව ඇති බව සත්‍යය නමුත් ඒවා සමුදය හේතුවෙන් පහළ වුනා නොවේ. තව දුරටත් මාර්ග සත්‍යය මගින් සංසිඳවිය හැකි ධර්මයන්ද නොවන්නාහ. එම නිසා වස්ත්‍ර ආදී බාහිර වස්තු අරමුණු කොට ඉබේ කෙලෙස් පහළ නොවීම නිසාද අනිච්ච-අනත්ත වශයෙන් ප්‍රකට එම බහිද්ධා රූප සමග සසඳා අජ්ඣත්තයෙහිද ලෙහෙසියෙන් ප්‍රකට කරගැනීම පහසු වීම ද නිසා ද්වාර හයෙහි ඉබේ පහළ වන බහිද්ධා රූපයන් මත විපස්සනා භාවනා කළ යුතු නමුදු ඇති තාක් අනින්ද්‍රිය බද්ධ බහිද්ධා රූපයන් **පරිඤ්ඤෙය්‍ය අරිය දුක්ඛ සත්‍යය** නොවන බව සළකා ගතයුතු

අධ්‍යාත්මික සත්‍යය පමණක් දතයුතුවේ

සත්ත්වයන්ගේ සන්තානයන්හි පහළ වන ධර්මයන් අතරින්ද තම සන්තානයෙහි පහළ වන සත්‍යය සතර පමණක් වටහා ගැනීම මූලික වූද වැදගත්වූ ද කාරණාවයි. හේතුව වනාහිඃ තමාගේ තණ්හා- සමුදය හේතුවෙන් දුක්ඛ සත්‍යය පහළ වන්නේ නම් තම සන්තානයෙහිම පහළ වේ. අනුන්ගේ සන්තානයන්හී වනාහි පහළ විය නොහැක්කේය. අනුන්ගේ සමුදය නිසා දුකක් පහළ වී නම් ඒ අනුන්ගේ සන්තානයන්හිම පහළ වේ. තම සන්තානයෙහි පහළ නොවේ. තව දුරටත් තමාගේ මාර්ග සත්‍යය තම දුක්ඛ- සමුදය පමණක් නිවාලීමට සමත්වේ. අනුන්ගේ දුක්ඛ- සමුදය නිවාලීමට සමත් නොවේ. අනුන්ගේ මාර්ගයද අනුන්ගේ දුක්ඛ- සමුදය පමණක් නිවීමට සමත්වේ. තමාගේ දුක්ඛ- සමුදය නිවීමට සමත් නොවේ. තවදුරටත් එක් එක් ආර්යයන් වහන්සේ නමකගේ සන්තානය හා බැඳී සමුදය- දුක්ඛ යන ධර්මයන්ගේ නිවීම නම් වූ නිරෝධ සත්‍යය එම ආර්යයන්ගේ අජ්ඣත්ත ධර්මයන් ලෙස පාළි- අට්ඨ කථාහී දක්වා ඇත. අනුන්ගේ සත්‍යය සතර තමා ඇස්පනාපිට දැන ගන්නවාද නොවේ. තමාගේ සත්‍යය සතර දැනගත් විට අනුන්ගේ සත්‍යය සතරද අනුමාන වශයෙන් දැන ගත හැක්කේය. එම නිසා බහිද්ධාහි විපසසනා භාවනා කිරීමෙන් මග්ග- ඵලයන්ට යාගත හැකි නමුදු 'අජ්ඣත්ත සත්‍යය සතර දැකීමම මූලික කාරණය බව' සළකා ගත යුතුවේ. එම නිසාම සතිපට්ඨාන ආදී පාළියෙහි **අජ්ඣත්තං වා කායෙ..., අත්‍ථි ඉමස්මිං කායෙ...,** ආදී වශයෙන් අජ්ඣත්ත බැලීම ප්‍රථම මෙන්ම ප්‍රධාන කොටද දේශනා කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් පාළි- අට්ඨකථා- ටීකාවන් සාධක වේ.

යතථ ඛො ආවුසො නා ජායතී න ජියයති න මියයති චවති න උපපජජති, නාහං "තං ගමනෙන ලොකසස අනතං ඤාතෙයයං, දිටෙඨයයං, පතෙතයයනති" වදාමි. න ඛො පනාහං ආවුසො අපපතවා ලොකසස අනතං දුකඛසස අනතකිරියං වදාමි, අපි ච ඛවාහං ආවුසො ඉමසමිංඤෙව බයාමමතෙත කලෙබරෙ සසඤඤිමහි සමනකෙ ලොකඤච පඤඤාපෙම, ලොකසමුදයඤච, ලොක නිරොධඤච, ලොක නිරොධ ගාමිණිංච පටිපදං [සං. නි. 1/118 අං. නි. 2/94]

ආවුසො	=	ඇවැත්නි, රොහිතස්ස බ්‍රහමය!
යතථ ඛො	=	යම් ස්ථානයක
නජායති	=	පහළ නොවන්නේද නොඋපදින්නේ ද
න ජීයයති	=	නොදිරන්නේ ද
න මියයති	=	නොමියන්නේ ද
න චවති	=	නැවත නැවතත් මිය නොයන්නේ ද
න උපපජ්ජති	=	නැවත නැවතත් නොඋපදින්නේ ද
ලොකසස අනතං	=	සංඛාර ලෝකයේ කෙළවර වන්නා වූ
තං	=	එම නිවන් ස්ථානය
ගමනෙන	=	පයින්යෑම, යාන වාහන පිහිටකොට යෑම මඟින්
ඤදාතෙයයං, දිටෙඨයයං, පතෙතයයං	=	දැනගතහැකි, හමුවියහැකි, ළඟාවියහැකි යැයි
අහං	=	තමන් වහන්සේ (විසින්)
න වදාමි	=	නොකියන්නේය
ආවුසො	=	රොහිතස්ස,
පන	=	නමුදු
ලොකසස අනතං අපපතවා	=	සංඛාර ලෝකයෙහි අන්තයට නොගොස්
දුකඛඅනත කිරියං	=	දුකෙහි කෙළවර කිරීමක්
අහං	=	තමන් වහන්සේ (මම)
න ඛො වදාමි	=	දේශනා නොකරමි.
අපිච ඛො	=	ඇත්ත වශයෙන් වනාහි
ස සඤඤිමහි	=	සඤ්ඤා ඇත්තා වූ

සමනකෙ = සිත ඇති

ඛ්‍යාමමත්තෙකලෙවරෙ = බඹයක් පමණ වන්නාවූ මේ කයෙහිම

ලොකඤ්ච = විනාශ විය හැකි බැවින් ලෝකය යැයි කියනු ලබන දුක්ඛ සත්‍යයද

අහං = මම

පඤ්ඤපෙමි = පනවන්නෙමි

ලොක සමුදයඤ්ච = ලෝකය නම් වූ දුක් පහළ වීම පිණිස වන්නා වූ සමුදය සත්‍යයද පනවන්නෙමි

ලොක නිරොධඤ්ච = ලෝකය නම්වූ දුකෙහි නිරෝධය පිණිස වන්නාවූ නිරෝධ සත්‍යය පනවන්නෙමි

ලොක නිරොධ ගාමිනි පටිපදඤ්ච = ලෝකය නම් වූ දුකෙහි නිරෝධයට ලඟාවීමට හැකි ප්‍රතිපදා මාර්ග සත්‍යයද පනවා වදාරන්නෙමි.

ලොකනති දුකඛ සච්චං, ලොක සමුදයනති සමුදය සච්චං, ලොක නිරොධනති නිරොධ සච්චං, පටිපදනති මගග සච්චං, ඉති "නාහං ආවුසො ඉමානි චත්තාරි සච්චානි තිණකට්ඨාදීසු පඤ්ඤපෙමි ඉමස්මිං පන චාතුමහාභූතිකෙ කායස්මිං යෙව පඤ්ඤපෙමී"ති දසෙසති [සං. අ. 1/93 ; අං. අ. 2/511]

ලොකනති - '**ලොකං**' යනු

දුකඛ සච්චං = දුක්ඛ සත්‍යයය

ලොක සමුදයනති = ලෝක සමුදය යන්න

සමුදය සච්චං = සමුදය සත්‍යයය

ලොක නිරොධනති = ලෝක නිරෝධය යන්න

නිරොධ සච්චං = නිරෝධ සත්‍යයය

පටිපදනති = පටිපදං යන්න

මගග සච්චං = මාර්ගය සත්‍යයය

ඉති, "ආපිච ඛවාහං - පෙ- පටිපදං" යන මේ කථාව මගින් (**දසෙසනති** හා බැඳේ)

ආවුසො = රොහිතස්සයෙනි,

අහං	=	තමන් වහන්සේ
ඉමනි චත්තාරි සච්චානි	=	මේ සත්‍යය සතර
තිණ කට්ඨාදීසු	=	තෘණ දඬු, ගස් ආදි කොට ඇති අනින්ද්‍රිය බද්ධ රූපයන්හි
න පඤ්ඤාපෙමි	=	නොපනවන්නෙමි
පන	=	ඇත්ත වශයෙන් වනාහි
චතුමහාභූතිකෙ	=	සතර මහා භූතයන් පිහිට කොට ඇති
ඉමස්මිං කායස්මිං යෙව	=	මේ කයතුළම
පඤ්ඤාපෙමි	=	පනවන්නෙමි
ඉති	=	මෙසේ
දස්සෙති	=	දක්වයි.

ස-සන්තති පරියාපන්නානං දුක්ඛ සමුදයානං අප්පවත්ති භාවෙන පරිග්ගයහමනො නිරොධොපි ස-සන්තති - පරියාපන්නො විය හොති" ති කත්වා වුත්තං අත්තනොවා චත්තාරි සච්චානීති. පරස්සවාති එත්ථාපි එසෙව නයො [දී. ටී. 2/534]

ස-සන්තති පරියාපන්නානං	=	ස්ව සන්තානයෙහි අඩංගු
දුක්ඛ සමුදයානං	=	දුක්ඛ හා සමුදයේ
අප්පවත්ති භාවෙන	=	නැවත නැවතත් පහළ නොවන ස්වභාව වශයෙන්
පරිග්ගයහමානො	=	පරිග්‍රහ කරන, මනසිකාරය යොමුකරවීම කරන කල්හී
නිරොධොපි	=	නිරෝධ සත්‍යය ද
ස-සන්තති පරියාපන්නො විය	=	ස්ව සන්තානයේ ඇතුළත්වූවාක් සේ
හොති	=	වේ
ඉති කත්වා	=	මෙලෙස මනසිකාරය යොමු කොට
අත්තනො වා චත්තාරි සච්චානීති	=	තමාගේ සත්‍යය සතරද යැයි
වුත්තං	=	අට්ඨ කථාහි දක්වයි
පරස්සවාති එත්ථාපි	=	අනුන්ගේ සත්‍යය සතර යයි කියන ලද තැනද
එසෙව නයො	=	මේ ක්‍රමය මැයි

විනිශ්චය

අනිඤ්ජිය බද්ධ රූප දුක්ඛ ආර්ය සත්‍යය නොවේ. "වෙන වෙනම සත්ත්වයන්ගේ සන්තානයන්හි සත්‍යය සතර ඇත්තේ යැයි" යන මේ අර්ථය පාළි- අට්ඨ කථාහි සෘජුවම දක්වයි. නිරෝධ සත්‍යය ඇත්තටම බාහිරයෙහි පහළ වන්නේ නමුදු, එයද ඇතුල් කොට ස්වකීය සත්‍යය සතර අනුන්ගේ සත්‍යය සතර යැයි කීමට සුදුසු බව වනාහි ප්‍රකටව දක්වයි. මෙලෙස එක එක සන්තානයක සත්‍යය සතරම ලබාගත හැකි නමුදු ස්වකීය සමුදය පමණක් බැහැර කළ හැක්කේය. මේ බැහැර කිරීමම පහාන පටිවෙධ අභිසමයයි. තමාගේ සමුදය- දුකඛ යන මේවා පමණක් නිවා දමා ලිය හැක්කේය. එම නිවා දැමීම වත්මානව සිදුවීමම සච්ඡකිරිය පටිවේධ අභිසමයයි. තම සන්තානයෙහිම මාර්ගාංග අට වැඩිය හැක්කේය. මෙලෙස වැඩීමම භාවනා පටිවේධ අභිසමය යයි. අනුන්ගේ සන්තානයන්හි වනාහි සමුදය, නිරෝධ, මග්ගයන් තමාට දුරුකළ නොහැක්කේය. ඇස්පනා පිට භාවනා කළ නොහැක්කේය. වැඩිය නොහැක්කේය. එම නිසා අනුන්ගේ සමුදය, නිරෝධ, මග්ගයන් සම්බන්ධකොට තමාගේ පහාන පටිවෙධ ආදීන් පහළ නොවේ. මෙසේ හෙයින් දතයුතු වූ සත්‍යය සතර පමණක් දැනගැනීම ප්‍රධාන කටයුත්ත යැයි තදින් සිතට ගතයුතු.

සමුදය වටහා ගැනීම

පහළවන ආකාරයට රූප- නාම මෙනෙහි කරන්නා දකින අවස්ථාව ආදියෙහි ප්‍රකට වන්නා වූ මනාප බව, කැමති බව ආදිය පහළ වන අවස්ථාවෙහිම මෙනෙහි කොට දැන ගනී. මෙලෙස දැන ගැනීම වනාහි පච්චුප්පන්න සමුදය ඇස් පනා පිට තත්ත්වාකාරයෙන් දැන ගැනීමයි. නමුදු මේ ප්‍රත්‍යුත්පන්න සමුදය, මේ භවයෙහි සිදුකළ කර්මයේ විපාක නිසා පහළ වන්නා වූ පසු භවයෙහි නාම- රූප දුක්ඛ සත්‍යයන්ට පමණක් හේතු වේ. මේ භවයෙහි දුකෙහි හේතු හෙවත් සමුදය නොවේ. මේ භවයෙහි දුකට හේතු වන තණ්හාව වනාහි පෙර කම්ම භව කාලයෙහි සිදු කොට හමාරය. සිදු කළ ආකාරය වනාහිඃ ස්ව සන්තානයට ද, තම භවයට ද, කාම අරමුණු වස්තූන්ටද ප්‍රිය මනාප බව නම් වන තණ්හාව ඇති නිසා, ඒවා අතින් සන්තෘප්ත වී හොඳින් සුඛවත් වීමට, මේ භවයෙහි අභිවෘද්ධිය කල්පනා කොට ධාර්මිකව වේවා, අධාර්මිකව වේවා, වීර්යය කරන්නාසේ පෙර භවයකද තණ්හාව ඇති නිසාම කුසල කර්ම ඉටු කළේය. එම කර්ම නිසාම

පටිසන්ධියේ පටන් රූප- නාම දුකඛ සත්‍යයන් දූන් මෙලෙස පහළ වෙමින් පවතී. පෙර භවයෙහි සම්පූර්ණ වූ එම තණ්හාව වර්තමානව දූන ගත නොහැක්කේය. නමුදු වර්තමානව ඇස් පනා පිට දත හැකි ප්‍රත්‍යුත්පන්න තණ්හාව වනාහි අතීත තණ්හාවට කාලය වශයෙන් පමණක් වෙනස් වේ. සවභාව ලක්ෂණ වශයෙන් වනාහි සමානය. එක් කෙනෙකුගේ සන්තානයේ පහළ වන නිසා සමුද්‍රයෙහි එක් ප්‍රදේශයක් දූනගත්තේ නමුත් "සමුද්‍රය දුටු වේය. දන්නේ යැයි" කිව හැකි ලෙසටද, කන්දක කොටසක් පෙදෙසක් පමණක් දූක ගන්නේ නමුත් "කන්ද දුටුවේය. දන්නේ යැයි කිව හැකි ලෙසටද, පච්චුප්පන්න සමුදය දූනගැනීමෙන්ද "සමුදය සත්‍යය දන්නේ යැයි" කිව හැකි වන්නේමය. නමුදු මෙනෙහි කරන්නා වූ තැනැත්තා පච්චුප්පන්න තණ්හාව දූන ගන්නවා පමණක් නොවේ. නාම- රූප පරිච්ඡේද ඤාණය, මුහුකුරා ගිය තැන් පටන් අතීත තණ්හාව ද අනුමාන ලෙස දනී.

දැනගන්නා ආකාරය

නැවීම ආදිය පහළ වූ විට, නැවෙන රූප ආදිය පහළවිය හැකි වීමද, සිසිලස ආදිය නිසා සිසිල් රූප ජේළි ජේළි ආදිය පහළ විය හැකි වීමද, පෙනෙන වර්ණ රූප, දකින ඇස ආදිය ඇති විටම දූකීම ආදිය පහළ විය හැකි වීමද, යනාදි ලෙසට රූප- නාමයන් හේතු- ඵල, සම්බන්ධ වෙමින් පහළ වීම, විපස්සනා භාවනා කරන්නා ඇස් පනා පිට දකී. මෙලෙස දූකීම ඉහළ ඉහළ ඤාණයන්හීදි වඩ වඩාත් ප්‍රකට වේ. පැහැදිළි වේ. ඉහළ මාර්ග විපස්සනාවෙහිදී වඩ වඩාත් පැහැදිළි වේ. මේ ලෙස දූක ගත් විට, දූන් මෙනෙහි කරන රූප- නාමයන්ටද හේතු ඇත්තේමය. කුමක් නිසා පහළ වුවාදූයි කියා මෙනෙහි කිරීම් අතර වාරයේ කල්පනා කරන කල්හි"පෙර භවයෙහි සිදුකල කුසල කර්ම නිසා පහළ වේ" යැයි පහසු වෙන්ම තීරණය කොට දූනගනී. කුමක් නිසා මෙලෙස දූන ගත හැක්කේ දූයි කිවහොත්: භාවනාව සඳහා උත්සාහ කරන කෙනෙක් පාසා **දිට්ඨි ච උජුකා** යන්න අනුව කර්මය හා කර්ම විපාක පිළිගෙන දැක දූන ගත් කෙනෙකු වන නිසා වන්නේය. කම්මස්සකතා සම්මාදිට්ඨිය කලින්ම විශුද්ධියට පත් වී ඇත්තේය. එසේ සුතමය - චින්තාමය වශයෙන් පිළිගත් පුද්ගලයාට පච්චක්ඛ ඤාණය වනාහි තව දුරටත් ආධාර උපකාර හේතුවක් වේ. තව දුරටත් ආසාවෙන් ඇලී- බැඳී ගන්නා බැව් නිසා අභිවෘද්ධිය කල්පනා කොට, උත්සාහ කිරීම

ප්‍රායෝගිකව දැක- දැන ගත් නිසා "එම කර්මය ද තණ්හාව ඇතිවම පහළ විය. එම නිසා ඇලී - බැඳී ගන්නා තණ්හාවම මේ භවයේ රූප- නාමයන්ට හේතුව වන්නේ යයි" ද අනුමාන කොට දැන ගනී.

පහළ වූ නමුදු දැනගැනීම දුෂ්කරය

මේ දුක හා දුකඛසමුදය ස්ව සන්තානයේ ප්‍රකටව පහළ වී ඇති නිසා, පහළ වීම් වශයෙන් ප්‍රකටද, නොගැඹුරුද, ඉස්මතුව පෙනෙන සුළුද වේ. නමුදු දුකක්ය, නරක ධර්මයක්ය, දුක අපේක්ෂාකරන්නක් බැවින් දුකට හේතු ස්වභාවයක්ය කියා දැන ගැනීමට දුෂ්කරය. ගැඹුරුය, ප්‍රකට නැත. මෙසේ ප්‍රසිද්ධ නමුත් වටහා ගැනීම දුෂ්කර වීමට හේතුව අසතිමත් වීම, මනසිකාරය නොයෙදීම, හොඳින් නොබැලීමම වේ. භාවනා මනසිකාරය යෙදීමෙන් හා විපස්සනා ඤාණයෙන්ද දතයුතු තාක් මෙවන් දෑ දත හැක්කේය. එම ඤාණය පූර්ණභාවයට පත්වූ කල්හි පහළ වන මග්ග ඤාණයෙන් වනාහි ආපසු නැති නොවන ලෙසට ස්ථිරව දැන ගත හැක්කේය.

දුක්ඛ සච්චඤ්හි උප්පත්තිතො පාකටං ඛාණු කණ්ටකප්පහාරාදීසු අහො දුක්ඛන්ති වත්තබ්බතම්පි ආපජ්ජති. සමුදයම්පි ඛාදිතුකාමතා භුඤ්ජිතුකාමතාදී වසෙන උප්පත්තිතො පාකටං ලක්ඛණප්පටිවෙධතො පන උභයම්පි තං ගම්භීරං. ඉති තානි දුද්දසසනා ගම්භීරානි [දී. අ. 2/581]

දුක්ඛ සච්චං = දුක්ඛ සත්‍යය

උප්පත්තිතො = පහළ වීම් වශයෙන්

පාකටං = ප්‍රකට වේ (දැකීම්, නැවීම ආදී දුකඛ සත්‍යය ඇති තාක් ප්‍රකට වේයනුයි අදහසයි.)

ඛාණු කණ්ටකප්පහාරාදීසු = උල්, කටු ආදිය ඇනෙන විට ආදියෙහි

අහො දුක්ඛන්ති වත්තබ්බම්පි = අහෝ දුකයි විලාප කියන තැනටද

ආපජ්ජති = පත්වේ (දුක්ඛ සත්‍යය තුළ දුක වේදනා ප්‍රකටව දැනගැනීමට පහසු බව හුවාදක්වීමකි)

සමුදයම්පි = සමුදය සත්‍යයද

ඛාදිතුකාමතා- භුඤ්ජිතුකාමතාදී වසෙන

= කෑමට බුදීමට ඇති කැමැත්ත ආදී වශයෙන්

උප්පත්තිතො = පහළ වීම් වශයෙන්

පාකටං = ප්‍රකට වේ.

ලක්ඛණප්පටිවෙධතො පන = ස්වභාව ලක්ෂණයන් දැක දැන ගැනීම් වශයෙන් වනාහි

තං උභයම්පි = එම සත්‍යයන් දෙකම

ගම්භීරං = ගැඹුරුය

ඉති දුද්දසත්තා = මෙලෙස බැලීම, දැකීම දුෂ්කර මෙන්ම ගැඹුරු බැවින්

තානි = ඒ සත්‍යය දෙක

ගම්භීරානි = ගැඹුරු වෙත්.

දුක්ඛසච්චානි අත්තනො පවත්තික්ඛණවසෙන පාකටානිපි පකතිඤාණෙන සභාවරසතො දට්ඨුං අසක්කුණෙය්‍යත්තා, ගම්භීරෙනෙව ච භාවනාඤාණෙන, තත්ථාපි මත්ථකප්පත්තෙන අරියමග්ගඤාණෙනෙව යථාවතො පස්සිතබ්බත්තා ගම්භීරානි

[දී. ටී 2/531]

දුක්ඛසච්චානි = **දුක්ඛසච්චා** යන්න වනාහි,

තානි = ඒ දුක්ඛ-සමුදය සත්‍යයෝ

අත්තනො පවත්තික්ඛණවසෙන = තමා පහළ වන ක්ෂණය වශයෙන්

පාකටාපි = ප්‍රකට වුණේ වී නමුත්

පකති ඤාණෙන = භාවනාවෙන් තොර ප්‍රකෘති ඤාණයෙන්

සභාවරසතො දට්ඨුං = සවභාව ලක්ෂණ කෘත්‍යය වශයෙන් දැකීමට

අසක්කුණෙය්‍යත්තා = නොහැකි බැවින්ද

ගම්භීරෙනෙව = දැනගැනීමට අපහසු නිසාම ගැඹුරුම වූ

භාවනා ඤාණෙන = මෙනෙහි කරමින් වැඩිය යුතු විපස්සනා ඤාණ මග්ග ඤාණ මගින්

පස්සිතබ්බත්තා ච = දැක ගැනීමට හැකි බැවින්ද

තත්ථාපි = එම භාවනා ඤාණයන්හිද

මත්ථකප්පත්තෙන = මුදුන් පත්වූ

අරිය මගගඤාණෙනෙව = අරිය මාර්ග ඥාණයෙන්ම

යථාවතො පසසිතබබතතා ච = යථා පරිදි, නොවෙනස්වන ලෙස දැන ගත හැකි බැවින්ද

ගමභිරානි = ගැඹුරුවේ.

නිරොධ-මගග දැන ගැනීම

දෙව ගමභිරතතා දුදදසසාති යන අටඨකථාවට අනුව නිරෝධ-මගග සත්‍යයන් පුථුජ්ජන සන්තානයන්හී පෙර පහළ නොවූ විරූ බැවින් ඉතා ගැඹුරුය. පච්චකඛ වශයෙන් දැන- දැක ගත නොහැක්කේය. එම නිසා භාවනාරම්භක පුද්ගලයනට යට දැක්වූ ආකාරයටම 'හොඳය-උතුම්යැ' යි අසා සිත නතු කිරීම් මාත්‍රය පමණක් අවශ්‍යය. සිතා- කල්පනා කොට දැනගැනීම අවශ්‍යය නොවේ. නමුදු ක්‍රමානුකූලව භාවනා කොට උදයබබය ඥාණයට පත්වූ අවස්ථාවේ '**අවිජජා, තණහා, කමම, ආහාර. එසස, නාම- රූප** යන මේවා නැතිනම් පඤ්චස්කන්‍ධය පහළ විය නොහැකි බව' ඉබේම සළකා බලා දැන ගැනීම සිදුවිය හැක්කේය. භය ඥාණය ආදී පහළ වීම ආරම්භයේදී **උපපාදො භයං අනුපපාදො ඛෙමං** යන පටිසම්භිදා මගග දැක්වීමට අනුව 'දැකීම, ඇසීම, පහස ලැබීම, කල්පනා කිරීම, මෙනෙහි කිරීම ආදී වූ සියල්ල සංසිඳීමෙන් තොරය. ඒවා නැතිවීමම සංසිඳීමක් වන්නේය. ඒවා නැති වීම හොඳ යයි' ඉබේම කල්පනාවට වැටී වැටහී යා හැක්කේය. මේ වැටහීම් ආකාර දෙක වනාහි, විපසසනා භාවනා කරන විට නිරෝධය අනුමාන කොට දැනගන්නා ආකාරය යයි. මුඤ්චිතුකම්‍යතා ඥාණය පහළ වන අවස්ථාවේ මෙනෙහි කරන කරන වාරයේ නරක ධර්මයන්ම හමුවන නිසා මෙනෙහි නොකිරීමට කැමති සිත පහළ විය හැක්කේය. සමහරෙකුට මෙනෙහි නොකර නතර කොට සිටීමද විය හැක්කේය. නතර කළේ නමුත් පෙර පෙර විපසසනා ජවය නිසා නාම- රූප ප්‍රකටව පැනෙන්නේමය. මේවා මෙනෙහි කිරීමට උත්සහා නොකරන්නේ නමුත් වැටහීම සිදුවෙමින් පවතී. එලෙස වූ ඇත්තන්ට වේවා, මෙනෙහි නොකරන්නට කැමති සිත පහළ වූ ඇත්තන්ට වේවා, මෙනෙහි නොකර සිටීම අනුව මේ නාම- රූප නිරෝධ නොවේ. මෙනෙහි කොට ශාන්ත වූ නිවන් දැක දැනගැනීමෙන්ම සංසිඳවිය හැක්කේ යයි අවබෝධය පහළ විය හැක්කේය. මේ ඥාණය විපසසනා භාවනා කරන අවස්ථාවේ මාර්ගය අනුමාන වශයෙන් දැන ගන්නා

ඥාණයයි. මෙය වනාහි විපස්සනා භාවනා කරන විට සත්‍යය සතරම අරමුණු කොට දන ගන්නා ආකාරයෝය.

නමුදු මේ සත්‍යය සතර තුළින් දුක්ඛ සත්‍යයම පමණක් පැහැදිළිව (හාත්පසින්) දන ගතයුතු පරිඥෙයාඥයා ධර්මයයි. ඉතිරි සත්‍යයන් වනාහි වෙන් වෙන් වශයෙන් (හාත් පසින්) දන ගත යුතු පරිඥෙයාඥයා ධර්ම නොවන්නාහ. එම සත්‍යයන් අතරින් සමුදය සත්‍යය බැහැර කළ යුතු පහාතබ්බ ධර්මයයි. නිරොධය ඇස් පනා පිට සාක්ෂාත් කළ යුතු සච්ඡිකාතබ්බ ධර්මයයි. මාර්ගය ස්ව සන්තානයේ වඩා ගතයුතු වූ භාවෙතබ්බ ධර්මයයි. මේ නිසා සමුදය දුරුකළේ නම්, සාත්ක්ෂාත් කළේ නම් නිරොධය, මාර්ගය වඩාගත්තේ නම්, එම සත්‍යයන් දනගත්තා වන්නේමය. මෙනෙහි කරන වාරයක් වාරයක් පාසා වෙන් වෙන්ව දන ගැනීම, දුරුකිරීම, සාත්ක්ෂාත් කිරීම, වැඩීම, නම් වූ මේ කෘත්‍යය සතරම එකවැරම සම්පූර්ණ වූවා වන්නේය. එම නිසා මෙනෙහි කරන වාරයක් පාසා සත්‍යය සතර වටහා ගන්නේ යයි දත යුතුය.

දැනගන්නා ආකාරය

මෙනෙහි කොට වටහා ගත යුතු රූප- නාම සියල්ල ඇතිවීම- නැතිවීම මගින් වනාහි අඛණ්ඩව පෙළෙන බැවින් සංඛාර දුක්ඛ වශයෙන් දුක්ඛ සත්‍යම වේ. එම රූප- නාම සවභාව ලක්ෂණය ආදී වශයෙන්ද ඇතිවීම- නැතිවීම නම් වූ අනිත්‍ය ලක්ෂණය ආදී වශයෙන්ද ඥාණය මුහුකුරා මෙනෙහි කරන වාරයක් පාසා දක්ෂ ලෙස පිරිසිඳ දනගනී. එම නිසා පරිඥාඥා කෘත්‍යයද සම්පූර්ණ වේ.

මෙලෙස දත යුතු රූප- නාමයන් නිච්ච, සුඛ, අත්ත යයි වරදවා වටහා ගෙන ඇලීම්- බැඳීම් නම් වූ තණ්හා පහළ විය නොහැක්කේය. මේ තණ්හාව පහළ නොවිය හැකි ලෙසට වටහා ගැනීම තණ්හාව දුරුකිරීම නම් වේ. එමගින් ප්‍රහාන කෘත්‍යයද සම්පූර්ණ වේ. එම දත යුතු රූප- නාමයන් මත තණ්හාව කැළම් පහළ නොවන නිසා තද බැඳීම නම් වූ උපාදාන, සැපවත් වීම සඳහා උත්සාහ කිරීම නම් වූ කර්මය, එම කර්මයේ ඵලය වන නව භවයේ රූප- නාම ධර්ම පහළ විය නොහැක්කේය. තණ්හාවෙන් පටන්ගෙන විවිධ භවයන්හි පහළ නොවීම, සංසිඳීම විපස්සනා භූමියේ තදංග නිරෝධ සත්‍යය නම් වේ. මේ මෙනෙහි කිරීම නම් වූ එකම

හේතුව නිසා සමුදය හා දුකඛ නිරෝධ සිදුවේ යයි කියනු ලැබේ. මේ නිරෝධයට මෙනෙහි කිරීමක් පාසා ලඟා වෙමින් පවතින නිසා සාක්‍ෂාත් කෘත්‍යද සම්පූර්ණ වේ. මාර්ග ඥාණ අවස්ථාවේදී නිවන අරමුණු කොට වටහා ගැනීම වනාහී සාක්‍ෂාත් කිරීම නම් වේ. විපස්සනා අවස්ථාවේ ද නිරෝධ කෘත්‍යය තාවකාලිකව සම්පූර්ණ වේ. නිරෝධය අරමුණු කොට පූර්ණ වටහා ගැනීමක් සිදු නොවේ.

මෙනෙහි කළ යුතු රූප- නාම ස්වභාව ලක්‍ෂණ ආදී වශයෙන්ද ඇතිවීම නැතිවීම නම් වූ අනිච්ච ලක්‍ෂණාදි වශයෙන්ද, තත්ත්වාකාරයෙන් දැන ගැනීම සම්මා දිට්ඨී නම් වේ. සම්‍යක් ලෙස යහපත් ලෙස සිතීම, වීර්‍ය කිරීම, සතිමත් වීම, සිත එකඟ වීම ආදිය සම්මා සංකප්ප, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වේ. මේ රූප- නාම කෙරෙහි බැඳී දුෂ්චරිත, දුරාජීව පහළ නොකරන සුළු, එම දුෂ්චරිත- දුරාජීවයන්ගේ විරුද්ධ පැත්ත වූ මෙනෙහි කිරීම නම් වූ චිත්තුප්පාදයෙහි සම්මාවාචා වද වේ. සම්මා සංකප්පයද වේ. සම්මා ආජීවයද වේ. (මෙහි අර්ථය පසුව පැහැදිළි කරන්නෙමු.) මේ සම්මා දිට්ඨී ආදී මාර්ගාංග, ලෞකික සත්‍යයන් නම් වේ. මෙනෙහි කිරීමක් පාසා මේ මාර්ග සත්‍යය, තම සන්තානයේ පහළ වන නිසා භාවනා කෘත්‍යද සම්පූර්ණ වේ. එම නිසා විශුද්ධි මාර්ගයේ (474) හි මෙලෙස දක්වයි.

යඤ්චස්ස උදයබ්බය දස්සනං, මග්ගො වායං ලොකි තොති මග්ග සච්චං පාතුභවං හොති [දී. අ. 2/539]

අස්ස	=	එම උදයබ්බය ඥාණය සම්පූර්ණ කරගත් යෝගී හට
යඤ්ච උදයබ්බය දස්සනං	=	එම ඇතිව නැතිව යන බව දැකීම
අත්ථි	=	ඇත්තේය.
අයං	=	මෙම දර්ශනය
ලොකිකො මග්ගො	=	ලෞකික මාර්ගය වේ
ඉති	=	එම නිසා
මග්ග සච්චං-	=	මාර්ග සත්‍යය

අසස	=	ඔහුට
පාකටං හොති	=	ප්‍රකටය.

මෙම දක්වන ලද ක්‍රමයට අනුව වරක් දෙවරක් මෙනෙහි කිරීමෙන් කෘත්‍යය තුනම සහිතව පූර්ණත්වයට පත්වන නිසා පහළ වන කෂණයෙහි නාම- රූප මෙනෙහි කරන කරන වාරයේ සත්‍යය සතරම දැනගත යුතු ආකාරයට දැනගනිමින් සිටිනවා නම් වේ. එම නිසා කෘත්‍ය හතර එකවරම සමාධ කරන මෙනෙහි කිරීම -සතිපට්ඨාන භාවනාව වඩන්නා ක්‍රම ක්‍රමයෙන් නගිමින් විපස්සනා ඤාණ මුහුකුරුවා ගත් අවස්ථාවෙහි **ලොකුතතර මගගසච්ච** එම අවස්ථාවෙහි ආර්‍ය සත්‍යය හතර මාර්ග ඥානයෙන් දතයුතු ආකාරයෙන් එකවරම දැක දැන ගනී. එබැවින් **ඤායසස අධිගමාය** යන පාළියට අට්ඨකතා දක්වන තැන මෙසේ සඳහන් වේ.

ඤායො වුච්චති අරියො අටඨංගිකො මගෙගා, තසස අධිගමාය පතතියාති වුතතං හොති, අයංහි පුබබභාගෙ ලොකියො සතිපටඨාන මගෙගා භාවිතො ලොකුතතරමගගසස අධිගමාය සංවතතති. [දී. අ. 2/539]

අරියො අටඨංගිකො මගෙගා	=	අංග අටක් ඇති ආර්‍ය මාර්ගය
ඤායො	=	න්‍යාය යැයි
වුචචති	=	කියනු ලැබේ
තසස	=	'ඤාය'නම් වූ එම ආර්‍ය මාර්ගය
අධිගමාය	=	ලබා ගැනීමට
පතතියාති වුතතං හොති	=	පත්වූයේ යැයි කියනු ලැබේ.
හි	=	ඇත්තය
පුබබ භාගෙ	=	මගග ඤාණයට පත්වීමට පෙර
ලොකියො	=	ලෞකික පමණක් වන්නාවූ
අයං සතිපටඨාන මගෙගා	=	මේ මෙනෙහි කිරීම නම් වූ සතිපට්ඨාන මාර්ගය
භාවිතො	=	වඩන ලද බැවින්
ලොකුතතර මගගසස	=	ලෝකෝත්තර මාර්ගයට
අධිගමාය	=	පත්වීම
සංවතතනති	=	සිදුවේ.

මග්ග ඤාණයෙන් සත්‍යය සතර වටහා ගන්නා ආකාරය

සංස්කාරයෙන්ගේ නිවීම නම් වූ නිවන මග්ග ඤාණයෙන් සාක්ෂාත් කළ කල්හි මෙනෙහි කොට වටහා ගත් රූප- නාමයන් හා එම වටහාගැනීම් සියල්ලද, එසේම රූප- නාමයන්ද "ඇතිවීම් - නැතිවීම් වන නිසා දුකය - නරකමය, නිවීමක් නැත්තේමය, නිත්‍යය භාවය, සුඛ භාවය, ආත්ම භාවය, ස්වකීය භාවයක් ගෙනහැර පාමින් ඇත්තටම පෙළමින්ම පවතී" යයි නිසැකවම දැන ගත හැක්කේය. එම නිසා මාර්ග ක්ෂණයෙන් දුක්ඛ සත්‍යය අරමුණු නොකළේ නමුත් "මාර්ග ඤාණයෙන් දුක්ඛ සත්‍යද දැක- දැන ගන්නේ" යැයි කිව හැක්කේමය. උපමාවක් වශයෙන් කොතැනක නගරය හෝ ගම ඇත්තේද? කොයි පැත්ත නැගෙනහිරද බටහිරද? ආදී ලෙසට කාරණා නොදැන හැකි ලෙසට සිහි විකල් වූ තැනැත්තා යළි සිහි එලවා ගන්නවාත් සමගම කොතැනක නගරය- ගම ඇත්තේ දැයි ආදී ලෙසට දැන ගැනීමට කැමති දේ මුළාවකින් තොරව දැනගත හැකි වීම හා සමාන වන්නේය. තවත් උපමාවක්: ඉතා උෂ්ණ තැනකින් මද උණුසුම් තැනකට ගියේ නම් හිටපු තැන උණුසුම් විය දැන් මෙතැන සිසිල් යයි වටහා ගනී. නැවත ඊටත් වඩා ටිකක් සිසිල් තැනකට ගියේ නම් මේ තැන වනාහි වඩාත් සිසිල් යැයි වටහා ගනී. ඉතාමත් සිසිල් තැනකට ගිය විට මේ තැන ඉතාමත් සිසිල් යැයි තත්ත්වාකාරයෙන් දැන ගෙන, පෙර සිටි ස්ථාන තුනම වඩා උණුසුම් යැයි පිරිසිඳ දැන ගත හැකිවන්නේය. මේ උපමාවලට අනුව විපස්සනාවෙන් තොර පුද්ගලයා "දුකඛ වේදනාවෙන් තොර සියලු රූප- නාමයන් හොඳයයි සළකා ගැනීම තද උණුසුම් තැනක් 'සිසිල් ' යැයි සළකා ගැනීම හා සමවේ. විපස්සනා යෝගී තෙම මෙනෙහි කළ යුතු රූප- නාමයන් හොඳ නැතැයි දන්නේ නමුත් මෙනෙහි කරන විපස්සනාව හොඳයැයි සළකා ගැනීම ටිකක් සිසිල් තැනකට ගොස් එතැන සුවදායක යයි සළකා ගැනීම හා සමාන වේ. මාර්ග ක්ෂණයෙහි - නියම නිවන ලබා, රූප- නාම, සංස්කාර සියල්ල "සාන්ත නොවුනු ධර්ම" යයි දැන ගැනීම ඉතා සිසිල් ස්ථානය තත්ත්වාකාරයෙන් දැන ගෙන අනෙක් ස්ථානයන් සාපේක්ෂ වශයෙන් උෂ්ණ යැයි නිශ්චය වශයෙන් තීන්දු කරන්නා හා සමවේ. මෙලෙසට සසඳා බැලිය යුතු. ඉතා ලස්සන රූපයක් ඉතා සුවඳවත් ආඝ්‍රාණයක් ඉතා මිහිරි සද්දයක්, රසයක්, පහසක්, හොඳම යහලුවා, හොඳම මාර්ගය, නගරය, ස්ථානය, දැනගැනීම හා සමඟම අනෙකුත් රූප ආදිය හොඳ නැතැයි තීරණය කිරීම හා සම වන්නේය. දුක්ඛ සත්‍යය අරමුණු නොකොට දැන

ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ කිරීම් වශයෙන් මේ මාර්ග ඥාණ දැන ගැනීම **පරිඤ්ඤා පටිවේධ, පරිඤ්ඤාභිසමය** නම් වේ. දුක වශයෙන් පිරිසිඳීම නම් වූ බාධක රහිතව, විනිවිද දැක දැන ගැනීම, දුකෙහි යථා ස්වරූපය පිරිසිඳ දැන ගැනීම නම් වූ තහවුරු ලෙස, සෘජුවම දැන දැක ගැනීම යැයි යන්න මෙහි අදහසයි.

පෘථජ්ජන හා ආර්ය පුද්ගලයාගේ අවබෝධයේ වෙනස

භාවනා ඥාණයෙන් තොර පෘථජ්ජනයන්ට ඉහත සඳහන් මගග පරිඤ්ඤා නොමැති බැවින් සුතමය - චිනතාමය වශයෙන් සළකා බලා රූප හා නාමයන්, අනිච්චා දුක්ඛා අනත්තා යයි නිශ්චිත ලෙසට තීරණය කළ නොහැක්කේය. විචිකිච්ඡාව නිසා වරදවා වටහා ගැනීම අතනොහැර පවතී. කල්පනා කිරීම, සළකා බැලීම අධික වන්න, වන්න විචිකිච්ඡාව බහුල විය හැක. සොතාපන්න ආදී ආර්‍යයන් වහන්සේලා වනාහි ඉහත සඳහන් මග්ග පරිඤ්ඤා ඥාණ ලැබූ බැවින් සිතින් සිතා ගන්නා වූ පෘථග්ජන ආදීන් මෙන් රූප- නාමයන් නිච්ච - සුඛ - අත්ත යැයි පිළිගත නොහැක්කේය. දෘඪිව අල්ලා ගත නොහැක්කේය. අනිච්ච, දුක්ඛ අනත්ත යැයිම නිශ්චිත ලෙසටම තීරණය කිරීමට හැකිය. නැවත නැවතත් කල්පනා කරන්නේ නමුත් අනිච්ච දුක්ඛ අනාත්ම වශයෙන් පැහැදිලි ලෙස වටහා ගැනීම බහුල වන්නේය. එම නිසාම අඩුම තරමින් සෝතාපන්නයා ද "මේ රූප- නාමයන් කෙරෙහි ප්‍රියමනාප වී මුසපත්වී, සැපවත්වීම සඳහා ඒවා ලබා ගැනීමට කැමැත්ත, උත්සහා කිරීම" තවම නොනිමී පවතින්නේ නමුදු, අපායගාමී අකුසල කර්ම සිදු නොකිරීමේ කැමැත්ත ඇත්තේමය. මේ වනාහි දුක දැනගන්නා ආකාරයයි.

පැවසූ ආකාරයට නිරවුල් ලෙස දැන ගැනීමට හැකි නිසාම රූප- නාම කෙරෙහි ලොල් බව ඇතිකරවන තණ්හාව පහළ විය නොහැක්කේය. පහළ නොවන ආකාරය වනාහිඃ අපාය ගාමී වන අකුසල ධර්ම කරවිය හැකි බලවත් වූ තණ්හාව ද සුගති භවයෙහි නමුත් උපරිම සත් වාරයක් ඉක්මවිය හැකි තණ්හාවද ප්‍රථම මාර්ගය නිසා පහළ විය නොහැකි තත්ත්වයට පත් කරවන නිසාය. ඕලාරික කාම රාග හා උපරිමය භව දෙකකට වඩා උපැත්ම ලබාදිය හැකි තණ්හාව දෙවැනි මාර්ග ඥාණය නිසා පහළ විය නොහැක්කේය. ඉතා සියුම් කාම රාග, කාම තණ්හා තතිය මාර්ග ඥාණය නිසා පහළ විය නොහැක්කේය. රූප, අරූප භවයන්හි ඇලෙන බැඳෙන තණ්හාව චතුර්ථ මගග ඥාණය නිසා පහළ විය නොහැක්කේය. උපමාවකට අනුව මුලින්

දුප්පත්ව සිට සිටු තනතුරු, කුමාර තනතුරු ලැබ සැපවත් වූ පුද්ගලයා දූන් නැවත දුප්පත් තත්ත්වයට නොඇලෙන්නා නොවැදෙන්නා සේය.

තවත් උපමාවකට අනුව චරිතය නරක වරද බහුල ස්ත්‍රිය සමඟ විසූ පුද්ගලයෙකු කුලකාන්තාවක් ලැබුවේ නම් එම නව භාර්‍යාවගේ ගුණ දූන ගන්නවාත් හා සමඟම පැරණි අඹුවගේ වැරදි හොඳින් දූනගත හැකිවන බැවින් එම අවස්ථාවේ පටන් පැරණි අඹුව අප්‍රිය කරන්නා හා සමානය. මාර්ග ඥාන නිසා මේ ඇලෙන බැඳෙන බවට අකමැති වීම **පහාන පටිවේද- පහාන අභිසමය** නම් වේ. තණ්හාව දුරුකිරීම නම් වූ මෙය විනිවිද දූක දූන ගැනීම, ඍජුව දූනගැනීම යැයි අදහස් කෙරේ. මේ සමුදය ද මගග ඥාණයෙන් වනාහි අරමුණු කොට දූන ගැනීම නොවේ. දූන ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ නිසා දුරු කිරීම, නැවත පහළ නොවීමම *පටිවේද, අභිසමය* යැයි කියනු ලැබේ. එම නිසා ටීකාවන් හී "**පහානමෙව වුත්තනයෙන පටිවෙධොති පහාන පටිවෙධො** ආදි ලෙස පැහැදිලි කරත්, මාර්ග ක්ෂණයෙහිම මේ පහාන පටිවෙදය සම්පූර්ණ වන නිසා සෝතාපන්න ආදි ආර්‍යයයන් වහන්සේලා සළකා, කල්පනා කොට බැලුව හොත් රූප- නාමයන් කෙරෙහි ඇලෙන බැඳෙන තණ්හාව දුක ඇතිකර වීමට හේතු ධර්මයම වටහා ගනී. පුථජ්ජන ආදීන් මෙන් සුබ- සුබ ධර්මයැයි නොසිතයි. උපමාවක් ලෙසට දුම් බීම මනාලෙස බැහැර කළ පුද්ගලයාට දුම් බීමේ ක්‍රියාව හොඳයැයි කලින් සිතුලෙස නොසිතා අනවශ්‍ය දුක් ගෙන දෙන්නක්ම යැයි දූන ගත හැකිවන ලෙස වන්නේය. මෙය වනාහි සමුදය වටහා ගන්නා ආකාරයයි. විපසසනා වඩන විට මෙනෙහි කොට දත යුතු රූප-නාම සංස්කාරයන්ද ප්‍රකටය. මෙනෙහි කිරීම නම් වූ සංස්කාරයන්ද ප්‍රකටය. ඇතිවීම - නැතිවීම වශයෙන් එම සංස්කාරයන්හි පෙරළීම- බිඳීමද ප්‍රකටය. එම සංස්කාරයන් සුවිශේෂිත කෘත්‍යයන් වශයෙන් විවිධ සටහන්- නිමිති ඇති ලෙසටද ප්‍රකට වේ. මගග - ඵල පහළ වන අවස්ථාවේ එම සංස්කාර දුක් නිරෝධ වී ශාන්ත වන ස්වභාවයද ප්‍රකට වේ. රූපාකාර, හැඩ නිල, සටහන්, නිමිති අතින් තොර වශයෙන් ද ප්‍රකට වේ. එම නිසා මාර්ග ඥාණයේදී නිරෝධ සත්‍යය නම් වූ නිවන **සනති ලක්ඛණ, අච්චුති රස, අනිමිත්තපච්චුපට්ඨාන** වශයෙන් ඇස් පනා පිට අරමුණු කොටම දූන ගනී. මේ වටහා ගැනීම **සච්ඡකිරිය පටිවේද, සච්ඡිකිරිය අභිසමය** නම් වේ. සාත්ෂාත් කිරීම නම් වූ නිරවුල්ව විනිවිද දූක දූන ගැනීම, ඍජුව දූක- දූන ගැනීම යයි අදහස් වේ. අනුමාන වශයෙන් දූනගැනීමක් නොවේ. අත්ලෙහි ඇති මැණිකක් සේ සහතික

ලෙස දැක- දැන ගන්නා සේම සංස්කාර දුක් නිරෝධ ස්වභාවයට පත්වීම දැක දැන ගැනීම, සාක්ෂාත් කිරීම නම් වේ.

මෙලෙස මාර්ග ක්‍ෂණයෙහි සාක්ෂාත් කළ බැවින් පච්චවෙක්ඛණ ඤාණයෙන් පෙරළා සළකා බලන විට මෙම නිවන "සංඛාරයන් ගෙන් තොර සාන්ත වූ ධර්මය" යයිද, "ඇතිවීම්- නැතිවීම් දෙකින් තොරවූ පෙරළි- බැඳීම් වලින් තොර නිත්‍යය ධර්මය" යැයිද, "ස්වකීය රූපාකාර සටහන් නිමිති වලින් තොර ධර්මය" යැයිද ආර්යයන් වහන්සේලා දැන ගනිත්, ඉර අව්ව සැර තැනක සිට සෙවන ඇති තැනට පත්වූ තැනැත්තා එම ස්ථානය සිසිල් යැයි දැනගන්නා සේද, බොහෝ කාලයක් විඳිමින් සිටි රෝගයකින් සුවය ලද්දකු එම රෝගය සුවවීම හොඳ යැයි දැනගන්නාසේද වන්නේය. මේ වනාහි නිරෝධය දැනගන්නා ආකාරයයි.

මාර්ග සත්‍යය නම් වූ මාර්ගාංග ධර්ම පහළ වනු පිණිස විපස්සනා භාවනා කළ බැවින් එම මාර්ගාංගයෝ නිවන අරමුණු කොට තම සන්තානයේ පහළ වීයැ. මෙලෙසට පහළ වීමම **භාවනා පටිවේද = භාවනාභිසමය** නම් වේ. තම සන්තානයේ පහළ වීම නම් වූ, විනිවිද ගෙන කෙළින්ම දැන දැක ගැනීම, ඍජුව දැක දැන ගැනීම යැයි කියනු ලැබේ. මේ දැන ගැනීමද "දබරඟිල්ලේ ඇඟිලි බිත්තරයෙන් එම ඇඟිලි බිත්තරයම ඇල්ලීමට අසමත් වන්නාසේ මාර්ග ඤාණය මගින් එම මාර්ග ඤාණයම දැන ගැනීමට අසමත් වන බැවින්, අරමුණු කොට දැනගන්නවා නොවේ. දැන ගැනීම ඒ වන විටත් නිමවූනා වන්නේය. උපමාවක් දක්වතොත්: ගැඹුරු අර්ථයක් ආදිය කල්පනා කරන්නකු එය වටහා ගන්නා තේරුම් ගන්නා ඤාණය පහළ වනවාත් සමගම "ඤාණය ලැබුවෙමි. වටහා ගත්තෙමි" යයි කියන්නා හා සමාන වේ. මෙලෙස වටහා ගැනීම නිම වූ බැවින් එය පෙරළා සළකා බලන කළ ශාන්ත වූ නිවන දැනගැනීමට, පහළ වීමට කලින් ඇතිවීම්- නැතිවීම් සහිත සංස්කාරයෝ සන්සිඳුනේ යැයි දැන ගැනීම සම්පූර්ණ වීමෙන්ම එම දුක නිවීගියේය. එම නිසා "මේ දැන ගැනීම සංස්කාර දුක් නිවීමට පත් කරන්නේය. එසේ පත්කිරීමට මේ ශික්‍ෂා මාර්ගය නිවැරදි"යැයි ආර්යයන් වහන්සේලා දැනගනිත්. මේ වනාහි මාර්ග සත්‍යය වටහා ගන්නා ආකාරයයි.

මේ දැක්වූ ලෙසට නිරෝධ සත්‍යය අරමුණු කිරීම් වශයෙන්ද, ඉතිරි සත්‍යයන් තුන දැනගැනීමේ කෘත්‍යය සාක්ෂාත් කිරීම් වශයෙන්ද, දැනගන්නා

මාර්ග ඥාණයම් "සත්‍ය සතර එක පහරින්ම පිරිසිඳ දැනගනී" යි අට්ඨකථාහි දක්වන්නට යෙදුනී. අදාළ අට්ඨකථා නැවතත් කියවා බලන්න.

මාර්ගාංග අට වඩන ආකාරය

සත්‍ය සතර එකවැරම දැනගෙන ආර්‍යයන් වහන්සේ නමක් වීමට කැමති වන්නේ නම් මාර්ග සත්‍යය තම සන්තානයේ වඩා ගත යුත්තේය. මේ ලෝකෝත්තර මාර්ගය වඩා ගැනීමට කැමතිනම් දැක්වූ ආකාරයට පහළ වන්නාවූ අවස්ථාවේම රූප- නාමයන් මෙනෙහි කොට සම්මාදිට්ඨි ආදි කොට ඇත්තා වූ ලෞකික විදර්ශනා මාර්ගය වැඩිය යුතුවේ. හේතුව වනාහිඃ විදර්ශනා මාර්ගය නම් වූ උපනිශ්‍රය ප්‍රත්‍යය නිසා ලොකෝත්තර මාර්ග උපනිශ්‍රය පච්චුප්පන්න ධර්මය වන්නේය. මේ නිසා විපස්සනා මාර්ගය සම්පූර්ණ නොකළ හොත් ලෝකොත්තර මාර්ගය පහළ විය නොහැක්කේය. විදර්ශනා මාර්ගය අනුලොම ඥාණය තෙක් සම්පූර්ණ ලෙස වැඩුවේ නම් ඒ සඳහා විශේෂයෙන් උත්සහා නොකළද ලොකුතතර මගගය ඉබේම මෙන් පහළ වේ. එම නිසා විසුද්ධි මාර්ගයේ මෙලෙස දැක්විය.

තත්‍ථ පඨම මග්ග ඤාණං තාව සම්පාදෙතුකාමෙන අඤ්ඤං කිඤ්චි කාතබ්බං නාම නත්‍ථි, යඤ්හි අනෙනකාතබ්බං තං අනුලොමවසානං විපස්සනං උප්පාදෙතෙන කතමෙව [වි. ම. 504]

තත්‍ථ	=	එම මාර්ග ඥාණ හතර අතරින්
තාව	=	ප්‍රථමයෙන්
පඨම මග්ග ඤාණං		
සම්පාදෙතුකාමෙන	=	ප්‍රථම මාර්ග ඥාණය සම්පූර්ණ කර ගැනීමට කැමති තැනැත්තා
අඤ්ඤං	=	විපස්සනා භාවනා කිරීම හැර වෙනත්
කිඤ්චි කාතබ්බං නාම	=	කිසියම් කළයුත්තක් නම්
නත්‍ථි	=	නැත
හි	=	හේතුව වනාහි
අනෙන	=	මේ විපස්සනා යෝගී තෙම
යං	=	මාර්ග ඥාණය පහළ වීමට හේතු වන යම්
කාතබ්බං සියා	=	කළයුතු වූ කිසියම් දෙයක් ඇත්තේද

තං = එම මාර්ගීය ඥාණය පහළවීම සඳහා කළ යුතු සියල්ල

අනුලොමාවසානං විපස්සනා උප්පාදෙන්තෙන

= අනුලෝම ඥාණය අවසාන කොට ඇති විපස්සනා ඥාණ සාධනය කිරීමෙන්

කතමෙව = සම්පූර්ණ කරන ලද්දේම වේ.

මාර්ග ඥාණය වඩා ගැනීමට කැමති නම්, විපස්සනා වැඩිය යුතුම බැවින්, විපස්සනා මාර්ගයද **භාවෙතබ්බ මග්ග** සත්‍යය තුළ ඇතුල්වන බව සම්මොහ විනොදනි [වි. අ. 84] හි මෙලෙස ප්‍රකාශ කරයි.

"**එස ලොකුත්තරො අරියො අට්ඨංගිකො මග්ගො, යො සහ ලොකියෙන මග්ගෙන දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාති සංඛ්‍යාගතො**"

එස = මෙය වනාහි

අට්ඨංගිකො = අංග අටක් ඇති

අරියො මග්ගො = ආර්ය මාර්ගය යයි

යො = එම අරිය මාර්ගය

සහ ලොකියෙන මග්ගෙන = ලෝකීය විපස්සනා මග්ග හා සමඟ

දුක්ඛ නිරොධ ගාමිණීපටිපදාති සංඛං

= දුක් නිරෝධයට පත් වීමට වැඩිය යුතු පටිපදාව යැයි යන සංඛ්‍යාවට

ගතො = ගියේවෙයි.

මග්ග චිත්තුප්පාදයෙහි යෙදෙන මග්ගංග අට **ලොකුත්තර මග්ග** නම් වේ. මේ මාර්ගීය හේතුකාරක විදර්ශනාවෙන් තොරව නිරෝධ ගාමිනී විය නොහැක්කේය. විපස්සනා නොවඩා නිවන් අරමුණු කරන්නේ නමුත් එපමණකින් එය ඉෂ්ඨ නොවන්නේ යයි අදහස් කෙරේ. එම නිසා ලොකි විපස්සනා මග්ගයද ඇතුලත් කොට දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව දත යුතු මාර්ග සත්‍යයයි. එම නිසා මහා ටීකාහි

"**නානාන්තරියභාවෙන පනෙත්ථ ලොකියාපි ගහිතාව හොන්ති, ලොකිය සමථ විපස්සනාය විනා තද භාවතො**" යැයි දක්වයි [මහා ටී. (සී.)1/13]

අර්ථය

පන = ලෝකුත්තර සමාධි ප්‍රඥාවම උත්කෘෂ්ඨ නිර්දේශ (අති උත්තම දෙය දැක්වීම) වශයෙන් භාවෙතබ්බ යැයි කියන නමුදු

නානානතරියභාවෙන = වෙන වෙනම පහළ වන්නේ වී නමුත් එකකට ඇතුළත් වීම වශයෙන් (**අනතරෙ භාවා , නනා ච තා අනතරියා ච, තාසං භාවො,තෙනහු** යන වචනඅර්ථය ගෙනදෙයි)

ලොකියාපි = ලෝකී සමාධි ප්‍රඥාවන්ද

එතථ = චිත්තං පඤ්ඤඤ්ච භාවං යන මේ පාළියෙහි

ගහිතාව = භාවෙතබ්බ වශයෙන් ගතයුතුම

හොනති = වෙත්

කසමා = කුමක් නිසාද යත්,

ලොකීය, සමථ විපසසනාය විනා

= ලෝකීය සමාධි ප්‍රඥා වලින් තොරව

තදභාවතො = එම ලෝකුතතර සමාධි ප්‍රඥා පහළ විය නොහැකි නිසාය.

තේරුම

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤෙ- චිත්තං පඤ්ඤඤ්ච භාවයං"

යන ගාථාවෙහි වැඩිය යුතු සමාධි ප්‍රඥා යන්න, උත්කෘෂ්ඨ වශයෙන් ලෝකුත්තරයම වේ. නමුදු ලෞකික සමාධි- ප්‍රඥාවන් නොවඩා එම ලෝකෝත්තර තත්වයන් පහළ විය නොහැකි බැවින් ලෝකෝත්තර සමාධි ප්‍රඥාවන් වැඩීම කියන තැන 'ලෞකික සමාධි ප්‍රඥාවන්ද වඩන ලද්දේය' යන අර්ථය ඇතුළත් වන්නේය. එම නිසා ලෞකික සමාධි ප්‍රඥාවන් ලෝකුත්තර ක්ෂෙත්‍රයෙහි විශේෂයෙන් පහළ වන නමුත් **චිත්තං පඤ්ඤඤ්ච භාවයං** යන පාළියෙහි **භාවෙතබ්බ** ධර්ම නම් වෙත්. ඒවාද වැඩිය යුතු යැයි අදහස්වේ.

(චත්තාලීස නයපපකරණයෙහි ධ්‍යාන - හෙතු කියන තැන ධ්‍යානි එලයන්ද ගැනීම නානානතරික නය ක්‍රමය යැයි කියනු ලැබේ. මේ ටීකාවෙහි

වනාහි මෙවැනි අර්ථයක් ගැනීමට නොහැක්කේය. මාර්ග සමාධි- ප්‍රඥාවද **ඣාන - හේතු** නොවන අතර ලෝකී සමාධි ප්‍රඥාවද **ඣානී - ඵල** නොවන බැවින්ය. එම නිසා එම ග්‍රන්ථයෙහි දක්වන ලද "**ඝාතන්තිකස්ස ඣාමානය**" යන තැනද ගිතෙල් යනු මුට්ටිය නොවේ. මුට්ටියද ගිතෙල් නොවේ. මෙලෙස වෙන් වෙන්ව ඇත්තේ නමුත් ගිතෙල් කැමති පුද්ගලයා සඳහා "ගිතෙල් මුට්ටිය ගනුවයි" කී කල්හි මුට්ටිය පමණක් ගැනීමට කෙළින්ම කී නමුදු මුට්ටියේ අඩංගු ගිතෙල්ද ගනුවයි යන අදහස දැක්වේ, යන අර්ථය පමණක් ගතහොත් එය මේ ටීකාව හා සම්පූර්ණයෙන් සම වේ. සමගාමී වේ. සූක්ෂම ඥාණය වර්ධනය සඳහා මෙලෙස විවරණය කරන ලදී.)

මාර්ගාංග භාවනා

ඉධානන්ද භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං සම්මා සංකප්පං භාවෙති -පෙ- සම්මාවාචං -පෙ- සම්මාකම්මන්තං -පෙ-සම්මා ආජීවං -පෙ- සම්මාවායාමං -පෙ-සම්මා සති -සම්මා සමාධි භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ග පරිනාමිං එවං ඛො ආනන්ද භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවංකො අරියං අට්ඨංගිකං මග්ගං භාවෙති අරියං අට්ඨංගිකං මග්ගං බහුලීකරොති. [සං. නි. 1/162]

ආනන්ද = ආනන්දය

ඉධ = මේ සාසනයෙහි

භික්ඛු = භික්ෂුව

විවෙක නිස්සිතං = කෙළෙස් සංසුන් කිරීමද පිහිට කොටගෙන

විරාග නිස්සිතං = කෙළෙස් දුරු කිරීමද පිහිට කොටගෙන

නිරොධ නිස්සිතං = කෙළෙස් සංසිඳවීමද පිහිට කොටගෙන

වොස්සග්ග පරිණාමිං = කෙළෙස් බැහැර කිරීමට තමා නිවන දෙසට යොමු කිරීමට මෝරවමින් සිටින, මෝරන ලද සම්මා දිට්ඨිය, විපස්සනා ඤාණ, මග්ග ඤාණ යන සම්මා දිට්ඨිය.

භාවෙති = වඩයි

සම්මා සංකප්පං = විපස්සනා සිත් මග්ග සිත් හා යෙදෙන සම්‍යක් ලෙස කල්පනා කරන සම්මා සංකප්ප ය

සම්මා වාචං = සම්‍යක් ලෙස කථා කරන සම්මා වාචා

(විපස්සනා භාවනා කරන විට මග්ග ඥාණය පහළ වන විට කථා කරන්නේ යැයි, අදහස් නොකෙරේ. වචී දුශ්චරිත පහළ කරන අනුසය පරියුට්ඨාන වීතික්කම ක්ලේශ යන්ගේ ප්‍රතිපක්ෂය වන, ඒවා බැහැර කළ හැකි- සංසිඳ විය හැකි ස්වභාවය පමණක් අදහස් කෙරේ. සම්මා කම්මන්ත- ආජීව යන මේවාද මේ ක්‍රමයටම වේ)

සම්මා කම්මන්තං = සම්‍යක් ලෙස කටයුතු කිරීම

සම්මා ආජීව = සම්‍යක් ලෙස ජීවිකා වෘත්තිය කිරීම

සම්මා වායාමං = සම්‍යක් ලෙස වීර්‍යය කිරීම

සම්මා සති = සම්‍යක් ලෙස සිහිය පැවැත්වීම

සම්මා සමාධිං = සම්‍යක් ලෙස සිත සමාධිගත කිරීම

භාවේති = වඩයි

ආනන්ද = ආනන්ද,

කල්‍යාණමිත්තො = බුදුරජාණන් වහන්සේ මුල් කොට ඇත්තාවූ මිත්‍රයන් ලැබීම අතින් සමන්විත

කල්‍යාණසහායො = බුදුරජාණන් වහන්සේ මුල් කොට ඇත්තාවූ සහායකන් ලැබීම අතින් සමන්විත

කල්‍යාණ සම්පවංකො = බුදු පියාණන් වහන්සේ මුල් කොට ඇත්තාවූ කල්‍යාණ පුද්ගලයන් වෙතම නතුවූ සිත් ඇති.

භික්ඛු = භික්ෂුව

අරියං අට්ඨංගිකං මග්ගං

= අංග අටක් ඇති ආර්ය මාර්ගය

එවං ඛො = මේ කියන ලද ක්‍රමයට

භාවේති = වඩයි

බහුලී කරොති = බහුල බවට පත්කරයි

වා = වඩයි

විවෙකනිස්සිතන්ති තදංග විවෙක නිස්සිතං, සමුච්ඡෙද විවෙක නිස්සිතං නිස්සරණ විවෙකං නිස්සිතඤ්ච සම්මා දිට්ඨිං භාවෙතීති අයමත්ථො වෙදිතබ්බො, තථා හි අයං අරිය මග්ග භාවනානුයුත්තො යොගී විපස්සනක්ඛණෙ කිච්චතො තදංග විවෙකනිස්සිතං, අජ්ඣාසයතො නිස්සරණ විවෙක නිස්සිතං, මග්ග කාලෙ පන කිච්චතො සමුච්ඡෙද විවෙකනිස්සිතං, ආරම්මණතො නිස්සරණ විවෙක නිස්සිතං, සම්මා දිට්ඨිං භාවෙති, එස නයො විරාග නිස්සිතාදීසු විවෙකත්ථා එවං හි විරාගාදයො. කෙවලංඤ්චෙත්ථ වොසග්ගො දුවිධො පරිච්චාග වොසග්ගො ච පක්ඛන්දන වොසග්ගොචාති, තත්ථ පරිච්චාග වොසග්ගොති විපස්සනාක්ඛණෙ ච තදංග වසෙන, මග්ගක්ඛණෙ ච සමුච්ඡෙද වසෙන කිලෙස පහානං පක්ඛන්දන වොසග්ගොති විපස්සනාක්ඛණෙ තන්නින්න භාවෙන, මග්ගක්ඛණෙ පන ආරම්මණ කරණෙන නිබ්බාන පක්ඛන්දනං, තදුභයම්පි ඉමස්මිං ලොකිය ලොකුත්තර මිස්සකෙ අත්ථසංවණ්ණනානයෙ වට්ටති. තථාහි අයං සම්මා දිට්ඨී යථා වුත්තෙන පකාරෙන කිලෙසෙ ච පරිච්චජති, නිබ්බානඤ්ච පක්ඛන්දති. වොසග්ගත්ථං පරිණාමෙන්තං පරිණතඤ්ච, පරිපච්චන්තං පරිපක්කඤ්චාති. ඉදං වුත්තං හොති, අයං හි අරිය මග්ග භාවනානුයුත්තො භික්ඛු යථා සම්මා දිට්ඨී කිලෙස පරිච්චාග වොසග්ගත්ථං නිබ්බාන පක්ඛන්දන වොසග්ගත්ථඤ්ච පරිපච්චති. යථා ච පරිපක්කා හොති තථානං භාවෙතීති. එස නයො සෙස මග්ගංගෙසු [සං.අ.1/125]

තේරුම

විවෙක නිස්සිතං යන තැන 'විපස්සනාව හේතුකොටගෙන සිතක් පාසා කෙළෙස් සංසුන් කිරීම නම් වූ තදංග විවේකයද, අදාල මග්ග ඤාණයෙන් කෙළෙස් ඉතිරි නොකට දුරු කරන සමුච්ඡේද විවේකයද, අපේක්ෂා කරන නිවන නම්වූ නිස්සරණ විවේකයද, අදාල විපස්සනා ඤාණ- මග්ග ඤාණ නම් වූ සම්මා දිට්ඨියද වඩයි' යන මේ අර්ථ දත යුතුවේ. මේ කථාව විස්තර කොට දක්වතොත්: ආර්ය මාර්ගය වැඩීමෙහිලා වීර්‍ය කරන යෝගී තෙම විපස්සනා වඩන අවස්ථාවෙහි "කෙළෙස් සංසිඳවීමේ කෘත්‍යය සම්පූර්ණ කිරීම් වශයෙන් තදංග විවේකයට ආධාරක වූ අපේක්ෂිත විපස්සනා සමාධිය වඩයි. කැමති වීම් වශයෙන් නිස්සරණ විවේකය පතා, විපස්සනා සම්මා දිට්ඨිය වඩයි. මාර්ගය පහළ වන කාලයෙහි කෙළෙස් දුරුකිරීමේ කෘත්‍යය සම්පූර්ණ කිරීම වශයෙන් සමුච්ඡේද විවේකය අපේක්ෂාවෙන් මග්ග සම්මා දිට්ඨිය වඩයි "අරමුණු කිරීම් වශයෙන් නිස්සරණ විවේකය සඳහා විපස්සනා සම්මා දිට්ඨිය වඩයි.

විරාග නිස්සිත විවේක නිස්සිත ආදිය සිදුවන ආකාරය

විවේකය වනාහි තදංග විවෙක, වික්ඛම්භන විවෙක, සමුච්ඡේද විවෙක, නිස්සරණ විවෙක, පටිප්පස්සද්ධි විවෙක යැයි, පස් ආකාරයකට දක්වා ඇත. විරාග, නිරෝධ ආදියද තදංග විරාග, තදංග නිරෝධ...යන ලෙසටම පස් ආකාරයකට දක්වා ඇත. මේවා තුළ භංග ඤාණ ආදිය පහළ වන විට මෙනෙහි කළ යුතු අරමුණෙහි ආරම්මණ අනුසය ඉතිරිව නොපවතින බැවින් එම අරමුණ හා බැඳී පරියුට්ඨාන වීතික්කම ආදියද පහළ විය නොහැක්කේය. මේ කෙළෙස් තුන් ආකාරයන් පහළ විය නොහැකි වීම වනාහි විපස්සනා යැයි කියන එකම හේතුව මගින් කෙළෙස් සන්සුන් වීම හෙවත් තදංග විවෙක නම් වේ. කෙළෙස්වල විරංජනය සිදුවන නිසා තදංග විරාග නම්ද වේ. කෙළෙස් නිරුද්ධ වන බැවින් තදංග නිරෝධ යැයිද කියනු ලැබේ. මෙනෙහි කරන වාරයේ මෙනෙහි කළයුතු රූප-නාම තත්ත්වාකාරයෙන් දැන ගැනීම විපස්සනා සම්මා දිට්ඨි නම් වේ. එය හා යෙදී එකට පහළ වන සම්‍යක් කල්පනාවන් සම්‍යක් වීර්‍ය, සම්‍යක් සිහිය, සම්‍යයක් තැන්පත් බවද පිළිවෙලින් විපස්සනා සම්මා සංකප්පය, සම්මා වායාම, සම්මා සතිය සම්මා සමාධි නම් වේ. මෙනෙහි කොට දැනගත හැකි වනු පිණිස උනන්දු කරවීම නම් වූ චෙතනාව සහ ඉතිරි චිත්තුප්පාදයෝ සිකඛා පද විභංග ආදියෙහි දේශනා කරන ලද, පරියාය වශයෙන් සම්මා වාචා නම් වේ. සම්මා කම්මන්ත, සම්මා ආජීව යැයිද නම් කෙරේ. මේ වනාහි මෙනෙහි කිරීමක් පාසා එකට පහළ වන්නාවූ විපස්සනා මාර්ගාංග අට වේ. කියන ලද තදංග විවෙක, විරාග, නිරොධයන් ඇසුරු කරන බැවින් විවෙක නිස්සිත විරාග නිස්සිත නිරොධ නිස්සිත නම් වේ. මෙහිලා 'ඇසුර ලබනවා' යන මේ කථාව මෙනෙහි කිරීමක් පාසා කෙළෙස් තුන් වර්ගයන් සන්සුන්වීම- විචණීවීම සම්පූර්ණ වීම නම් වේ. විවෙක-විරාග-නිරෝධ යන මේවා අරමුණු කොට දැන ගන්නවා නොවේ. එම නිසාම අට්ඨකථාහි **ආරම්මණතො** යැයි නොකියා **කිච්චතො** යැයි කියා ඇත.

නිවන වනාහි කිලෙස, කම්, විපාක, ස්කන්ධ සංඛ්‍යාත වට්ට දුකින් තොරවූ බැවින් නිස්සරණ නම් වේ. "වට්ට දුකින් මිදීම හෙවත් නිදහස් වීම සමෘධ වන තැනක් බැවින්ද නිස්සරණ යැයි කියනු ලැබේ. එම නිවනද කෙළෙස් සන්සුන් කිරීම, දුරු කිරීම, සංසිඳීම සහිත තැනක් බැවින් *නිස්සරණ, විවෙක, විරාග, නිරෝධ* නම් වේ. කියන ලද විදර්ශනා මාර්ගාංගයෝ

නිවනට යෑමට කැමති, නිවන දැන ගැනීමට කැමැති අජ්ඣාසය ඇතිව පහළ වන මොහොතෙහි රූප- නාම මෙනෙහි කරන්නාට පමණක් පහළ වේ. නිවනට අකමැතිව, භවයෙහිම ආශ්වාද කරමින් සිටින්නාට එනාගී මෙනෙහි කිරීමක් පමණකුදු නොමැති නිසා මෙම විදශ්නා මාර්ගාංග පහළ නොවෙත්. එබැවින් මෙනෙහි කරන කරන වාරයේ පහළ වන එම මාර්ගාංගයෝ පෙරාතුවම කැමති වීම හෙවත් අජ්ඣාසය වශයෙන් "නිවන් ඇසුරු කරන්නේ" යැයි දත යුතුය. උපමාවකට අනුව: නිවන් පතාගෙන දානය දෙන්නා දාන අවස්ථාවේ පවතින මුඤ්චන චේතනා දාන වස්තුව පමණක් අරමුණු කරයි. නිවන් අරමුණු නොකරයි. එසේ නමුදු පෙරාතුවම නිවන් අරමුණු කරගෙන සිදුකරන නිසා විවට්ට නිසසිත = වටට දුකින් තොර වූ නිවන අරමුණු කරන කුසල් වන්නා සේම, මතුවන මොහොතේ රූප- නාමයන්ම අරමුණු කරන කල්හිද පෙරාතුවම නිවන පතන අජ්ඣාසය ඇතිව භාවනා කරන නිසා, විපස්සනාව නිවන අපේක්ෂා කරන්නේ යැයි කියනු ලැබේ. එම නිසා අට්ඨකථාහි **අජ්ඣාසයතො** යැයි කියන ලද්දේමය. එම නිසා විපස්සනා යෝගී තෙම පහළ වන රූප- නාමයන් මෙනෙහි කරන කරන වාරයේ *තදංග විවෙක, විරාග, නිරෝධ, නිස්සරණ විවෙක විරාග, නිරෝධ* යන මේවා ඇසුරු කරන විපස්සනා වඩන්නේ යැයි කියනු ලැබේ. මෙහිදී දැක්විය යුතු තදංග නිරෝධයම විපස්සනාව මගින් සාක්ෂාත් කළ යුතු තදංග නිරොධ සත්‍ය යැයි කලින් කියන ලද්දේය.

ලෝකුත්තර මග්ග සතර මගින් අදාල කෙලෙස් ඉතිරි නොකොට දුරුකිරීම් සංඛ්‍යාත සන්සුන්කිරීම, බැහැරකිරීම හා සංසිඳීම *සමුච්ඡේද විවෙක, විරාග, නිරෝධ* නම් වේ. ලෝකුත්තර මග්ගංගයෝ අදාළ කෙලෙස් ඉතිරි නොකොට සන්සුන් කිරීම, දුරුකිරීම හා සංසිඳවීම සමෘධ කරන නිසා විවේක නිස්සිත, විරාග නිස්සිත, නිරෝධ නිස්සිත නම් වෙත්, තවදුරටත් නිස්සරන විවේක, විරාග, නිරෝධ නම් වූ නිවන අරමුණු කරන නිසාද විවේක නිසසිත, විරාග නිසසිත, නිරෝධ නිසසිත නම් වෙත්. මාර්ගස්ථ පුද්ගලයා එලෙසවූ අරිය මග්ගංග වඩන්නේ නම් වේ.

වොසග්ග පරිණාමි වන ආකාරය

විපස්සනා මග්ගංගයෝ තදංග පහාණ වශයෙන් කෙලෙස් දුරු කරමින් වැඩෙන්නේය. නිවන පතන්නාහටම පහළ වන්නක් නිසා නතුවීම් වශයෙන්

නිවන දෙසට තමා මුදාහැරීමේ = වැදගැනීමේ කැමැත්ත මෝරමින් පවතිත්. එම නිසා *වොසගග පරිණාමී* නම් වෙත්. යෝගි තෙම පහළ වන මොහොතේ රූප- නාම මෙනෙහි කරන කරන වාරයේ එලෙස වූ මාර්ගාංග වඩන්නේ වේ. අරිය මගගංගයෝද අදාළ කෙලෙස් ඉතිරියක් නොතබා දුරුකිරීමේ අදහසින් මෝරන්නේය. අරමුණු කිරීම් වශයෙන් නිවන වෙතට තමා මුදාහැරීමට, නිවනට වැදගැනීමට කැමැත්ත මේරීමද වන්නේය. මේ නිසා වොසගග පරිණාමී නම් වේ. මාර්ගස්ථ පුද්ගලයා වනාහි මෙලෙස වූ මාර්ගාංග වඩමින් සිටිනවා වන්නේය. මෙහිලා "මේරුවා" යන්නෙන් අනුලෝම, ගොත්‍රභූ ඤාණ තෙක් පුබ්බභාග විපසසනා මගගය වැඩීම- මේරීම සිදුවන බැවින් එම මගග ඤාණයෙන් නිවන අරමුණු කිරීමද ආයාසයකින් තොරවම ලබයි. කෙළෙස් දුරු කිරීමද ආයාසයකින් තොරවම ලබයි. පුබබාභාග මගගයේ බලවත් නිශ්‍රය ශක්තියෙන් ඉබේම මෙන් නිවන අරමුණු කිරීම සිදුවේ. කෙළෙස් ද දුරුකරයි. මෙලෙස වූ මේරීමක් මෙහි අදහස් කෙරේ. උපමාවකට අනුව කුඩා දිය ඇලක් හරහා පනින කෙනෙක් මද දුරක් දුවගෙනවිත් මෙතෙර ඉමෙන් පැන්නේ නම් එතරට ආයාසයකින් තොරව, අනායාසයෙන්ම ඇදීගොස් වැටී ගන්නාසේය. වටහා ගැනීමට පහසුනොවේ. අටඨකථාහි දක්වූ අර්ථයන් නැවත නැවතත් සළකා බලා වටහා ගත හැකි වේවා.

විදර්ශනාවෙහිලා ශීල මාර්ගාංගය ඇතුළත් වන බව

විපසසනා භාවනා කරන විට විරති මගගංගයන් සම්පූර්ණ වීම උපුටා දක්වීමේ මූලාශ්‍රයන් වනාහි සිකඛාපද විභංගය හා පටිසම්භිදා මගග පාළියයි. උදාන පාළියේ බාහිර සූත්‍ර අටඨ කථා වේ, **"එස නයො සෙස මගගංගෙසු** යැයිද **සමමා වචාදයො තයො විරතියොපි හොනති චෙතනාදයොපි, මගගකඛණෙ පන විරතියොව"** යැයිද දක් වෙන්නේ මේ සූත්‍රයන්ගේ විස්තර අටඨකථාම වන්නේය.

මේ අටඨකථාවේ අර්ථය **සමමා වාචාදයො** = සමමා වාචා ආදිකොට ඇති **තයො** = තුනක් වූ මගගංගයෝ **විරතියො පි** = විරතියෝද, **හොනති** = වෙත්, **චෙතනාදයොපි** = චේතනා ආදී ධර්මයන්ද, **වා** = චේතනාව හැර ඉතිරි කුසල චිතතුපපාද යෝද, **හොනති,** වෙත් **මගගකඛණෙ පන** = මාර්ගය පහළවන ක්‍ෂණයෙහි, **විරතියොව** = විරතීන්ද **හොනති**= පහළ වෙත්.

ආදියෙහිද මේ ක්‍රමයමැයි. ඇත්තය, **විරාග** ආදි පදයන් **විවේක** සද්දයෙහි පරියාය පදයන්ය. (**විවේක**- සිත සන්සුන් බව, **විරාග** - දුරුකිරීම, **නිරොධ**- නිරුද්ධ වීම යන මේ පදයන් ව්‍යවහාර වශයෙන් සමානය. සාරාර්ථය අතින් නම් සමාන නැතැයි කියවේ.සම වන ආකාරය දක්වතොත්: **වොසගග** පදයේ අර්ථය 01.පරිත්‍යාග කිරීම හෙවත් බැහැර කිරීම, 02.වැද ගැනීම= තමා වශයෙන් මෙහයවීම මගින් බැහැර කිරීම යැයි ආකාරය දෙකකින් දක්වේ. එයින් 01.පරිච්චාග වොසගග- පරිත්‍යාග කිරීම යන්න වනාහි මෙනෙහි කරන අවස්ථාවේදී තදංග පහාන වශයෙන් කෙළෙස් බැහැර කිරීමයි. 02.පකඛන්‍දන වොසගග = වැදගැනීම- මුදා හැරීම යන්න මෙනෙහි කරන අවස්ථාවේ එම නිවන කැමතිව, ඒ දෙසට නැවීම් වශයෙන්ද මාර්ග ඥාණයෙහි අරමුණු කිරීම් වශයෙන්ද නිවනට වැද ගැනීමයි. ලෝකීය ලෝකුත්තර යන දෙකම මිශ්‍රව මෙසේ අදහස විවරණය කිරීමේදී ඉහත දක්වූ මේ අර්ථ දෙකම ගැළපෙන්නේය. එම කථාව යෝග්‍යය. මේ විපසසනා සමමා දිටඨි, මගග සමමා දිටඨි "තදංග-සමුච්ඡේද පහාන වශයෙන් බැහැර කිරීම, නතුවීම- අරමුණු කිරීම වශයෙන් වැද ගැනීම යැයි දක්වන ලද විවරණ ක්‍රමයට අනුව කෙළෙස් දුරු කළ හැක්කේය, නිවනටද වැදගත හැක්කේය. ඊට අමතරව වොසගග පරිනාමි යන මේ පදයෙන් (සංයුක්ත අටඨ කථා ග්‍රන්ථයෙහි **සංඛෙපවචනෙන** යැයි දක්වා ඇත. 'මෙම සමාස පද වශයෙන් ' යැයිද අර්ථ යෝජනා කළ හැක්කේය) පරිත්‍යාග කිරීම, වැද ගැනීම, අපේක්ෂාව මෝරමින් පවතින්නාවූ විපසසනා සමමා දිටඨිය මෝරා ඇති මගග සමමා දිටඨිය යන මේ අර්ථය ගත යුත්තේය.

අර්ථ වශයෙන් වනාහි ආර්ය මාර්ගය වැඩීමේදී උත්සාහ කරන මේ භික්ෂුවගේ (වැඩීම හා බැඳේ) "සංස්කාර අරමුණ මෙනෙහි කොට දැන ගන්නා ස්වභාවය වශයෙන් භාවනා වඩන්නේ නම්, මෙම සමමා දිටඨිය තදංග වශයෙන් කෙළෙස් දුරු කිරීමද , නිවනට නතුවීම් වශයෙන්- යොමු වීම් වශයෙන් වැදගැනීම හෙවත් තමා මුදා හැරීමද, මෝරමින් පවතින්නේය. සංඛාරයන්ගේ සංසිඳීම නම් වූ නිවන් අරමුණු කිරීමේ ස්වභාවය වශයෙන් වඩන්නේ නම්, මෙම සමමා දිටඨිය කෙළෙස් සමුච්ඡෙද වශයෙන් බැහැර කිරීමද, නිවන අරමුණු කොට වැදගනීම හෙවත් මුදා හැරීමද මෝරමින් පවත්නේය. මේ ආකාර දෙක වශයෙන් මේ විපසසනා සමමා දිටඨි, මගග සමමාදිටඨි වඩන්නේ යැයි මෙහිලා අදහස් කෙරේ. ඉතිරි මාර්ගාංග හතද මේ දක්වන ලද ක්‍රමය මය.

මෙහි අර්ථය

වචී දුෂ්චරිත, කාය දුෂ්චරිත, මිථ්‍යා ජීවාදියෙන් විරමණ අවස්ථාවේ සීල චිත්තුප්පාද, සම්මා වාචා යෙහි යෙදෙන කම්මන්ත, ආජීව, යනාදිය විරති චෛතසික යෝමය. වචී, කාය, මනො සුචරිත සිදු වන අවස්ථාවේ චෙතනා ද ඉතිරි චිත්තුප්පාදයොද සම්මා වාචා ආදී නම් වේ. මාර්ග ඥාණයෙහි වනාහි විරති චෛතසිකයෝ පමණක්ම සම්මා වාචා ආදී නම් වේ යැයි කියනු ලැබේ. එම නිසා මනොසුචරිතමය වූ විපස්සනා කියන තැන චේතනාව සහ ඉතිරි කුසල චිත්තුප්පාදය සම්මා වාචා ආදී නම් වේ. විවෙක නිස්සිතය උපදිනාකාරාදිය විපස්සනා ඥාණයෙහි හා මග්ග ඥාණයෙහි දක්වන ලද බැවින්ද, සම්මා දිට්ඨි මෙන්ම ඉතිරි මග්ගංගයන් දැනගැනීම සඳහා යොමුව පවතින නිසාද සීල චිත්තුප්පාදයෙහිම යෙදෙන විරති චෛතසිකයන් වනාහි මේ කළ්‍යාණ මිත්ත සූත්‍රයෙහිලා නොගත යුතු.

සික්ඛා පද විභංගෙ"විරති, චෙතනා, සම්පයුත්ත ධම්මාච, සික්ඛා පදානී"ති වුත්තාති තත්‍ථ,පධානානං විරතිචෙතනාං වසෙන "විරතියොපි හොන්ති චෙතනායොපී" ති ආහ, මුසාවාදාදීහි විරමනකාලෙ වා විරතියො, සුභාසිතාදී වාචා භාසනාදිකාලෙ ච චෙතනායො යොජෙතබ්බා [මූල. ටී. (බු.) 2/71]

සික්ඛා පද විභංගෙ	=	සික්ඛාපද විභංගයෙහි
විරති ච	=	විරති ද
චෙතනා ච	=	චේතනාවද
සබ්බෙ සම්පයුත්ත ධම්මාච	=	සියලු සම්ප්‍රයුක්ත ධර්මයන්ද
සික්ඛාපදානිති	=	සික්ෂාපද යැයි
වුත්තා	=	දේශනා කළසේක
ඉති	=	එම නිසා
තත්‍ථ	=	එම තුන් ආකාරයන් තුළ
පධානානං	=	ප්‍රධාන වූ
විරති චෙතනානං වසෙන	=	විරති හා චේතනාවන්ගේ වශයෙන්

"විරතතොපි හොන්ති චෙතනායොපී"ති යයි

ආහ	=	අට්ඨකථාචාර්‍යයින් වහන්සේ කියයි.

(මේ ආදී ලෙසට **චෙතනාදයොපි** යැයි ඇති සංයුත්ත අට්ඨකථාවේ **ආදි** සද්දය අමතර ලෙසට ඇත්තේය. නමුදු **ආදි** සද්දය අඩංගු පාළිය සික්ඛා පද විභංග පාළි හා සමගාමී වන නිසා ද **ආදි** ශබ්දය ගැනීම නොගැළපෙන්නේ නොවේ. එසේ යුක්ති සහගතද වන බැවින් ටීකා ආචාර්යයන් වහන්සේ විසින් බලන ලද අට්ඨකථා පුස්කොළ පොත්වල ඇති ආකාරයටම මුල් පෙළ නිවැරදි යැයි ඒකාන්ත ලෙස තීරණය කළ නොහැකි නිසාද සංයුත්ත අට්ඨකථා පොතේ සීලක්ඛන්ධ අට්ඨකථා හි හමුවන ආකාරයටම උද්ධෘත කොට මෙසේ දක්වා ඇත.)

වා = වෙනත් ආකාරයකට දක්වතොත්

මුසාවාදාදීහි විරමණ කාලෙ = මුසාවාද ආදියෙන් වෙන්වන කාලයෙහි

විරතියො = විරතීන්

යොජෙතබ්බා = යෙදිය යුතුවේ.

සුභාසිතාදි වචා භාසනාදි කාලෙ ච

= සුභාෂිතයන් කියන්නාවූ කාල ආදිය මුල් කොට ගත් අවස්ථාවන්හිද

චෙතනායො = චෙතනාවෝ

යොජෙතබ්බා = යෙදිය යුතුය.

මේ ටීකාවන් හි **භාසනාදි** යන තැන **ආදි** ශබ්දයෙන් කාය සුචරිත මනො සුචරිත පහළ වන කාලයන්ද ගණන් ගතයුතුවේ. එම නිසා අනුටීකාහි **සුභාසිතාදීති අසම්ඵප්පලාදි ආදි සඞ්ගණ්හ අපිසුණාදි සංගහිතා, භාසනාදීති එතෙථ පන කාය සුචරිත හාදි"** යැයි පැහැදිළි කරයි. මේ අනුටීකාහි - **කායසුචරිතාදි** පදයෙහි **ආදි** ශබ්දයෙන් වනාහි ඉතිරි මනොසුචරිත ආදිය පමණක් ගතයුතුයි. විපස්සනා භාවනා මනො සුචරිතයෙහි ලා ගැනේ. එම නිසා විපස්සනා චිත්තුප්පාදයෙහි චෙතනා හා ඉතිරි චිත්තුප්පාදයන්ම වනාහි පරියාය වශයෙන් සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව මග්ගංගයෝ යැයි සැළකියයුතු.

චතුසච්ච කම්මට්ඨානං

සත්‍යය සතර භාවනා කරන ආකාරය දක්වන අවස්ථාවෙහි උපුටා

දක්වන ලද **තත්ථ පුරිමානි දෙව සච්චානි වට්ටං** ආදී අට්ඨකථා අනුව 'නිර්වාන ධර්මය, මාර්ග ධර්මය ඉෂ්ඨය, කාන්තය, මනාපයැ'යි අසා ඇති සුතමය ඥාණයෙන් සිත එදෙසට නමා -එය කැමති වී, දුක්ඛ සත්‍යය හා සමුදය සත්‍යයට අනුව යන ධර්මයන් මත පමණක් මෙනෙහි කර විපස්සනා භාවනා කිරීම වනාහි සත්‍යය සතර දැනගන්නා මග්ග ඥාණය පහළ කරවිය හැකි බැවින්ද, සත්‍යය සතර දැනගැනීම කැමැත්තෙන් වැඩිය යුතු භාවනාවට අමතරව සුවිශේෂ වන මග්ග- ඵල සුඛයන්ට හේතුව වන බැවින්ද **චතුසච්ච කම්මට්ඨානයැ**යි නම් කෙරේ.

චතුසච්ච පටිවේධාවහං කම්මට්ඨානං චතුසච්ච කම්මට්ඨානං. චතු සච්චං වා උද්දිස්ස පවත්තං භාවනා කම්මං යොගිනො සුඛ විසෙසනං ඨාන භූතන්ති චතුසච්ච කම්මට්ඨානං [දී. ටී. 2/530]

චතුසච්ච පටිවේධාවහං	=	සත්‍ය සතර දැන ගන්නා මාර්ග ඥාණයට ගෙනයා හැකි, පත්කළ හැකි.
කම්මට්ඨානං	=	විපස්සනා කම්මට්ඨානය
චතුසච්ච කම්මට්ඨානං	=	චතු සච්ච කම්මට්ඨාන නම් වේ.
වා	=	වෙනත් ආකාරයකට කිව හොත්
චතු සච්චං	=	සත්‍යය හතර
උද්දිස්ස	=	දුක දැනගැනීම උදෙසා
පවත්ත	=	පවතින්නා වූ
භාවනා කම්මං	=	විපස්සනා භාවනා කටයුත්ත
යොගිනො සුඛ විසසනං	=	යෝගීගේ සුවිශේෂ මාර්ග-ඵල සැපයන්ට
ඨාන භූතං	=	හේතු වශයෙන් පහළ වේ
ඉති	=	මේ නිසා
චතු සච්ච කම්මට්ඨානං	=	චතු සච්ච කම්මට්ඨානය නම් වේ.

සතිපට්ඨාන සූත්‍රයේ දේශනා කරන ලද විසි එක්ආකාරයන් අතරින් එක එකකට අදාල දේශනාවන්ට අනුව භාවනා කරන්නාට එය **චතු සච්ච කම්මට්ඨාන** වී අරහත්ත ඵල තෙක් යා හැකි ආකාරය අට්ඨකථාහි දක්වන ලදී. පහත දැක්වෙන්නේ ආනාපාන පබ්බය දක්වන අට්ඨකථාවයි.

තත්‍ථ අස්සාස- පස්සාස පරිග්ගහිකා සති දුක්ඛසච්චං තස්සා සමුට්ඨාපිකා පුරිම තණ්හා සමුදයසච්චං, උභින්නං අප්පවත්ති නිරොධ සච්චං, දුක්ඛ පරිජානනො සමුදයපජ්ජහනො නිරොධාරම්මණො අරියමග්ගො මග්ග සච්චං, එවං චතුසච්චවසෙන උස්සක්කිත්වා නිබ්බුතිං පාපුණාතීති ඉදමෙකස්ස අස්සාස පස්සාස වසෙන අභිනිවිට්ඨස්ස භික්ඛුනො යාව අරහත්තා නියයාය මුඛං [දී. අ. 2/552]

තත්‍ථ = එම ආනාපාන පව්වෙහි

අසාසපස්සාස පරිග්ගහිකා සති = ආශ්වාස ප්‍රශ්වාස පරිග්‍රහ කොට මනසිකාරය පවත්වන සතිය

දුක්ඛ සච්චං = දුක්ඛ සත්‍යයයි

තස්සා සමුට්ඨාපිකා = එම සතිය සමුත්පාදනය කළහැකි වූ

පුරිම තණ්හා = පෙර භවයේදී කුසල කර්ම කිරීමේදී පහළ වූ තණ්හාව

සමුදය සච්චං = සමුදය සත්‍යයි

උභින්නං අප්පවත්ති = දුක්ඛ, සමුදය, දෙකම නොපැවැත්ම, නිවීයෑම නම් වූ නිවන

නිරොධ සච්චං = නිරෝධ සත්‍යයයි

දුක්ඛ පරිජානතො = දුකද හාත් පසින් දැනගන්නා

සමුදය පජහනො = සමුදයද දුරුකල

නිරොධාරම්මණො = නිවන අරමුණු කළ

අරිය මග්ගො = තම සන්තානයේ පහළ වූ අරිය මාර්ගය

මග්ග සච්චං = මාර්ග සත්‍යයි

එවං = මෙසේ

චතුසච්ච වසෙන = චතු සච්ච කම්මට්ඨාන වශයෙන් (**චතු සච්ච වසෙනාති චතු සච්ච කම්මට්ඨාන වසෙන** ටීකා දක්වීමයි)

උස්සක්කිත්වා = විසුද්ධි අනුපිළිවෙලින් නැග

නිබ්බුතිං = කෙළෙස් නිවීමට

පාපුනාති = පත්වේ.

ඉති = මෙසේ පත්විය හැකි බැවින්

ඉදං = මේ ආනාපාන කම්මට්ඨානය

අස්සාස පස්සාස වසෙන අභිනිවිට්ඨස්ස

= මෙලෙස ආනාපාන සති කම්මට්ඨාන ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් මනසිකාරය පවත්වන්නහුට (ආනාපානය අනුව මෙනෙහි කොට භාවනා කිරීම මින් කියැවේ)

එකස්ස භික්ඛුනො = මහණකුට

යාව අරහත්ත = *අරහත්ත ඵලය තෙක්*

නියයාන මුඛං = වට්ට දුකින් මිදීම සඳහා දොරටුවක් වේ

අදහස:-

ආනාපාන පබ්බ දේශනාවට අනුව භාවනා කරන විපස්සනා යෝගීහට ආශ්වාස- ප්‍රශ්වාසය අනුව ඇතුල් වීම- පිට වීම යැයි මෙනෙහි කරන කරන වාරයේ වායො පොට්ඨබ්බ රූපයන් හැඳින ගන්නා ස්මෘතිය පහළ වේ. මේ ස්මෘතිය පුබ්බ භාග විපස්සනා මග්ගය වන බැවින් නානාන්තරික නය ක්‍රමයට අනුව භාවෙතබ්බ මග්ග සච්චය ම වේ. නමුදු අරිය මග්ග හා යොදන ලෝකුත්තර සතිය නොවන බැවින් මුඛ්‍ය වශයෙන් අරිය මග්ග සච්ච නම් නොවේ. ලෝකී ධර්මයක් වන බැවින් දුක්ඛ ආර්ය සත්‍යයයෙහිම ලා ගැනේ. චතු සච්ච කම්මට්ඨානය යන තැනද මුඛ්‍ය ආර්ය සත්‍යය පමණක් පරමාර්ථකොට භාවනා කළ යුතු විපස්සනාව ගැනේ. එම නිසා මේ චතුසච්ච කම්මට්ඨානය පහළ වන ආකාරය දක්වන තැන මෙම ස්මෘතිය හුදු දුක්ඛ සත්‍යය යැයි අට්ඨකථාචාර්යයන් වහන්සේ දක්වයි. ස්මෘතියම දුක්ඛ සත්‍යය යැයි දැක්වීම පධාන නය ක්‍රමයට දක්වනවා වන්නේය. එම නිසා "මෙම සති හා යෙදෙන චිත්ත- චෛතසිකද, මේ සතිය ඇසුරු කරන රූපද, අරමුණ වන්නාවූ ආශ්වාස- ප්‍රශ්වාස වායො පොට්ඨබ්බ රූප යන මේ ප්‍රධාන ධර්මයන්ද දුක්ඛ සත්‍යය යැයි දතයුතු වේ. එම නිසා ස්මෘතිය පමණක් ප්‍රධාන කොට ගෙන කියන **සති දුක්ඛසච්චන්ති** යන කථාවෙන් මෙහි මෙසේ දක්වයි. චතු සච්ච කම්මට්ඨාන නම් වූ විපස්සනාව, ආනාපාන පර්වයෙහි දේශනාවට අනුව භාවනා කරන යෝගී

තෙම ආශ්වාස- ප්‍රශ්වාසයන්ද එහි යෙදෙන සතියද, එම සතිය හා යෙදෙන චිත්ත චෛතසිකයන්ද, මෙම සතිය ඇසුරු ලබන රූපයන්ද, යන මේ දුක්ඛ සත්‍යය ධර්‍ම පෙරාතුවම භාවනාවට නැංවූ බැවින් පසුභාගයේ මාර්‍ගක්ෂණයෙහිදී මේ ධර්‍මයන් දුක්ඛ සත්‍යය වශයෙන් අවිද්‍යාවෙන් තොරව නිශ්චිත ලෙස දැනගනී යැයි දක්වයි. ඒ තුළ සති සමග යෙදෙන චිත්ත චෛතසිකයන් පෙරාතුවම මනසිකාරයට නැංවීම විපස්සනා පටි විපස්සනා නම් වේ. මෙනෙහි කරන විපස්සනාවම නැවත මෙනෙහි කොට විපස්සනා කිරීම යැයි කියනු ලැබේ.

සා පන සති යස්මිං අත්තභාවෙ, තස්ස සමුට්ඨාපිකා තණ්හා තස්සාපි සමුට්ඨාපිතා එව නාම හොති, තදභාවො අභාවතොති ආහ "තස්සා සමුට්ඨාපිකා පුරිම තණ්හාති" යථා සංඛාර පච්චයා විඤ්ඤාණන්ති තං විඤ්ඤාණබීජතං සන්තති සමුහතො සබ්බාපි ලොකියො විඤ්ඤාණ- පපබන්ධො සංඛාර පච්චයා විඤ්ඤාණන්තෙ ව වුච්චති සුත්තන්ත නයෙන [දී. ටී. 2/50]

සා පන සති	=	ආශ්වාස- ප්‍රශ්වාස මෙනෙහි කරන එම සතිය
යස්මිං අත්ත භාවෙ	=	යම් ආත්මයක් වේද.
තස්සා සමුට්ඨාපිකා තණ්හා	=	එම ආත්මය පහළ කරවන තණ්හාව
තස්සාපි සමුට්ඨාපිකා එව නාම	=	එම මෙනෙහි කරන සතියද පහළ කළාම
හොති	=	වෙයි
කස්මා	=	කුමක් නිසාද යත්
තදභාවො	=	එම තණ්හාව නොමැති විට
අභාවතො	=	පදනම් වූ ආත්ම භාවයද සමග මෙනෙහි කරන සතියද නොමැති වන බැවින්ය.
ඉති	=	මෙලෙස මෙනෙහි කරන සතියද පහළ කරවිය හැකි බැවින්
තස්සා සමුට්ඨාපිකා පුරිම තණ්හා	=	තස්සා සමුට්ඨාපිකා පුරිමතණ්හා යැයි
ආහ	=	අට්ඨකථාචාර්‍යයන් වහන්සේ කියයි.
කිං යථා	=	කුමන ක්‍රමයටද යත්

සංඛාර පච්චයා විඤ්ඤාණන්ති - සංඛාර හේතුවෙන් විඥාණය පහළ වේ යැයි කියන තැන.

තං විඤ්ඤාණ බීජං තං සනතති සමභූතො-

= එම විඥාණ සංඛ්‍යාත බීජයක් වී එම විඥාණ සංඛ්‍යාත සන්තතියෙහි පහළ වූ

සබ්බාපි ලොකියෙ

විඤ්ඤාණපපබන්ධො = ලෝකී විඥාණ සන්තති සියල්ලම

සංඛාර පච්චයා විඤ්ඤාණ

නෙතව ච = සංඛාර හේතුවෙන් පහළ වන විඥාණ යැයිම

සුතතනත නයෙන = සූත්‍රාන්ත ක්‍රමයට

වුච්චති යථා = කිවයුතු වන්නා සේය.

ප්‍රතිසන්ධියේ පටන් මේ භවයේ රූප- නාම සියල්ල පෙර භවයක සිදුකරන ලද කුසල කර්ම හේතුවක් නිසා පහළ වේ. එම කර්මයටද "භවය හා කර්ම ඵල කෙරෙහි ආසාව ඇති නිසාම" ඉපදීමද සිදුකොට ඵලයන්ද පහළ කරවිය හැක්කේය. එම නිසා මෙම භවයේ රූප- නාම සියල්ල සඳහා මුල් හේතුව එම තණ්හාව වේ. මෙනෙහි කිරිම කරන සතියද මෙම තණ්හාව මඟින්ම පහළ කළා නම් වේ. උපමාවකට අනුවඃ සංස්කාර නිසා විඥාණ පහළ වී යයි කියන තැන විපාක සිත්ම මුඛ්‍ය ලෙස සංස්කාර නිසා පහළ වෙත්. කුසල්- අකුසල්- ක්‍රියා සිත් යන මේවාද මුඛ්‍ය වශයෙන් සංඛාරයන් හී ඵලයන් නොවේ. එසේ නමුදු එම සිත් විපාක සිත් හා සම්බන්ධ වී පහළ වන නිසා විපාක සිත් වල ඒවායේ හේතු- බීජයන් ඇත්තාහ. විපාක සිත් සන්තතීන්හි පමණක් පහළ වෙත්. එම නිසා ලෞකීය සිත් ඇතිතාක්, සූත්‍රාන්ත ක්‍රමයට අනුව සංස්කාර හේතුවෙන් පහළ වන විඤ්ඤාණ යැයිම කියන්නා සේ පෙරභවයෙහි සිදුකළ තණ්හාව නිසා මේ වර්තමාන භවයෙහි කර්ම, ඵල, රූප-නාම සන්තතිය පහළ වේ. එම රූප-නාම සන්තතියේ පහළ වන්නාවූ මෙනෙහි කරන සතියද එම තණ්හාව මඟින්ම පහළ කරවන්නේ නම් වේ. එම නිසා දුක්ඛ සත්‍යය නම් වූ

සතියෙහි මුල හේතු වන්නාවූ එම පෙර භවයේ තණ්හාව සමුදය සත්‍යය නම් වේ යැයි කියනු ලැබේ. පෙර භවයක වූ මේ සමුදය වනාහි ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් දැන ගත නොහැක්කේය. ඥාණය බලවත් වූ කල දැන් වර්තමානව පහළ වන තණ්හාව පච්චවෙක්ඛ ඥාණයෙන් මෙනෙහි කොට දැනගෙන අනුමාන ඥාණයෙන් පමණක්ම එම අතීත තණ්හාව විපස්සනා කළ හැක්කේය. එසේම අතීත තණ්හාව ප්‍රත්‍යුත්පන්න තණ්හාව සවභාව වශයෙන් සමාන වනවා මෙන්ම එක් කෙනෙකුගේ සන්තානයේ පහළ වන බැවින් **එකතත නය** ක්‍රමයට එකක්ම වේ. එම නිසා පච්චුප්පන්න තණ්හාව මෙනෙහි කරන කරන වාරයේ සමුදය සත්‍යය වර්තමානව ඇස්පනාපිට දැක දැනගත්තා හා සමාන වේ.

සති ආදී දුක්ඛ සත්‍යය හා සමුදය තණ්හාවගේ නිවීම නම් වූ නිවන නිරෝධ සත්‍යය නම් වේ. එම නිවන අරමුණු කොට සති ආදී වූ දුක්ඛ සත්‍යය ධර්මයන් දුකක් යැයි දැනගන්නා කෘත්‍යයද සම්පූර්ණ කරන, සමුදය තණ්හාව ද නිමකරන අරිය මගගංග අට මාර්ග සත්‍යය නම් වේ. මේ නිරෝධ- මගග සත්‍යයන් වනාහි "ඉෂ්ඨය, කාන්තය, මනාපයැ"යි ආසා සිත නතු කිරීම- කැමති වීම අවශ්‍යය බව පෙරාතුවම දක්වන්නට යෙදුනි. එම නිසා **"අද්ධා ඉමාය පටිපදාය ජරා මරණමහා පරිමුඤ්චිස්සාමි"** යන විසුද්ධි මාර්ග දැක්වීමට අනුව "විපස්සනා ප්‍රතිපත්තියෙන් ජරාව මරණය යන මේවායින් ඒකාන්තයෙන්ම මිදෙන්නෙමියි, ඇතිතාක් දුක් සියල්ල දුරුකරන්නෙමියි, මාර්ග- ඵල- නිර්වාන එකාන්තයෙන් දැක දැන ගන්නෙමියි" යැයි නිරොධ මග්ගයට පෙරාතුවම සිත නතුකොට, එය අපේක්ෂා කොට අශ්වාස - ප්‍රශ්වාස ආදී පහළ වන රූප- නාම දුක්ඛ සත්‍යය- සමුදය සත්‍යයන් මෙනෙහි කරන්නාවූ පුද්ගලයා චතුසච්ච කම්මට්ඨාන යැයි කියන විපස්සනා භාවනා උනන්දුවන් වඩමින් සිටිනවා නම් වේ. එවැන්නන් දිට්ඨි විසුද්ධි ආදී වූ විසුද්ධි පරම්පරාව වශයෙන්ද ප්‍රථම මගග ඥාණ ආදීවූ ඥාණ දස්සන විසුද්ධි සතර අනුපිළිවෙලින් ක්‍රමයෙන් ප්‍රගතියට ගොස් කෙළෙස් නිවීම කරන්නේ යැයි අදහස් කොට අට්ඨකථාහි **"එවං චතුසච්ච වසෙන උස්සුක්කිත්වා නිබ්බුතිං පාපුණාති"** යැයි ප්‍රකාශ කරයි. ටීකාවෙහිද **"චතු සච්ච වසෙනාති චතුසච්ච කම්මට්ඨාන වසෙන උස්සුක්කිත්වාති විසුද්ධි පරම්පරාය ආරූහිත්වා, භාවනං උපරි නෙත්වාති අත්ථො"** යයි පැහැදිළි කරයි.

ඤාණ දසසන විසුද්ධි නම් වූ මගග ඤාණ හතරට පත්වන ක්‍ෂණයන්හි සත්‍ය සතර එක වැරම දූක- දූනගනී. දූනගන්නා ආකාරය කලින් දූක්වූ නමුදු ටිකක් විශේෂ නිසා සංක්‍ෂපයෙන් දක්වන්නෙමු.

දුක දැනගන්නා ආකාරය

ඇතිවීම්- නැතිවීම් සහිත ආශ්වාස- ප්‍රශ්වාසය හා මෙනෙහි කරන්නා වූ සති ආදී සංස්කාරයන් ගේ නිවීම්- දුරුවීම් ස්වභාවය ඇති නිවන මාගී ඤාණය මඟින් සාක්ෂාත් කොට දූනගන්නා බැවින්, මෙනෙහි කොට දතයුතු ආශ්වාස- ප්‍රශ්වාස රූපයන්ද, මෙනෙහි කරන සති ආදී විපසසනාද, ඇසුර ලබන රූපයන්ද, ඇතිවීම්- නැතිවීම් දෙකින් තොර නොවූ බැවින්, එලෙස පහළ වන රූප- නාම සංස්කාරයන් ද දුක්ඛ ධම් වේ. අශාන්ත ධම් යයි අවිද්‍යාවෙන් තොරව දූන ගැනීම වේ.

සමුදය දැන ගන්නා ආකාරය

එම සංස්කාරයන් දුක් යැයි අවිද්‍යාවෙන් තොරව දූනගත් බැවින් ආශ්වාස- ප්‍රශ්වාස සමග මෙනෙහි කරන සති ආදී රූප- නාම සංස්කාර කෙරෙහි ඇලෙන- බැඳෙන බව නැවත පහළ නොවන තැනට පත්විය. මේ නැවත පහළ නොවන ලෙසට දුරු කිරීම **පහනපපටිවෙධ, පහානාභිසමය** නම් වේ.

නිරෝධ - මගග දැන ගන්නා ආකාරය

මෙනෙහි කළ යුතු ආශ්වාස - ප්‍රශ්වාසය හා මෙනෙහි කරන සති ආදී සංස්කාරයන්ගේ නිරෝධය හෙවත් දුරුවීම් ස්වභාව = නිවන අරමුණු කොට තත්ත්වාකාරයෙන් දූනගත් සම්මා දිට්ඨි ආදී මාගීංග ධම්යන් තම සන්තානයේ ප්‍රකටව පහළ විය. මෙලෙස සිදුවීමේදී නිවන සාක්ෂාත් කිරීම **සච්චිකිරියා පටිවෙධ, අභිසමය** නම් වේ. තම සන්තානයේ මාගීංගයන් පහළ වීම සඳහා ආශ්වාස - ප්‍රශ්වාස ආදිය පෙරාතුවම මෙනෙහි කළ නිසා නිවන අරමුණු කොට මෙම මාගීංගයන් පහළ වීම **භාවනා පටිවේධ අභිසමය** නම් වේ. විස්තර යට දූක්වූ අතර නැවත කියවා බලන්න.

මේ දක්වූ යේ ආශ්වාස - ප්‍රශ්වාසය පදනම් කොට මෙනෙහි කරන විපස්සනා යෝගියා අරහත් ඵලය තෙක් ලඟාවන ආකාරයේ සංක්ෂේපයයි. ඉරියාපථ ආදී ඉතිරි පව් විස්සද චතුසච්ච කම්මට්ඨාන වන අතර අරහත්ත ඵලය තෙක් ලඟාවන ආකාරය අට්ඨකථාහි මෙම ක්‍රමයටම දැක්වෙයි. ස්මෘතියේ අරමුණු පමණක් වෙනස් වේ. එම වෙනස්කම් පමණක් උපුටා දක්වන්නෙමු.

ඉරියාපථ පබ්බයෙහි

ගමන, සිටීම, හිඳීම. හොවීම යැයි කියා ඉරියා-පථ රූපයන් මෙනෙහි කරන සතිය දුක්ඛ සත්‍යය නම් වේ. සම්පජඤ්ඤ පව්යේ ඉදිරියට යෑම-ආපසු ඒම, නැවීම, දිගහැරීම ආදී ව්‍යවහාර කරන රූපයන් මෙනෙහි කරන සතිය දුක්ඛ සත්‍යය නම් වේ.

පටික්කුල මනසිකාර පව්යේ කෙස්, ලොම්, අත්-නිය, පා-නිය, දත්, සම් ආදී දෙතිසක් කොටස් මෙනෙහි කරන්නාවූ සතිය දුක්ඛ සත්‍යය නම් වේ. මේ සතිය සමථය හා පමණක් යෙදෙන සතියයි. විපස්සනා සතිය නොවේ. කෙස් ආදි අරමුණුද පරමාර්ථ නොවේ. ප්‍රඥප්තීන්ම වේ. එම නිසා මෙම කොටසෙහිලා ගැනෙන සතියෙහි අරමුණ දුක්ඛ සත්‍යයයෙහි ඇතුළත් නොකළ යුතුය.

ධාතු මනසිකාර පව්යෙහි මහා ධාතු සතර මෙනෙහි කරන සතිය දුකඛ සත්‍යය නම් වේ.

නවසීවථික පබ්බයෙහි ඉදිමුනාවූ මිනියක් ආදියේ ප්‍රකට වන රූප සමූහයන් මෙනෙහි කරන සතිය දුක්ඛ සත්‍යය නම් වේ.

වෙදනානුපස්සනා පව්යෙහි වේදනා මෙනෙහි කරන සතිය දුක්ඛ සත්‍යය නම්වේ.

චිත්තානුපස්සනා කොටසෙහි - සිත් මෙනෙහි කරන සතිය දුක්ඛ සත්‍යය නම් වේ.

නිවරණ පව්යෙහි නිවරණයන් මෙනෙහි කරන්නාවූ සතිය දුක්ඛ සත්‍යය නම් වේ.

උපාදනස්කන්ධයෙහි ස්කන්ධයන් මෙනෙහි කරන්නාවූ සතිය දුක්ඛ සත්‍යය නම් වේ.

ආයතන පබ්බයෙහි ආයතන සංයෝජන මෙනෙහි කරන සතිය දුක්ඛ සත්‍යය නම් වේ.

බොජ්ඣංග පබ්බයෙහි දුක්ඛ සත්‍යය- සමුදය සත්‍යය මෙනෙහි කරන සතියද නිරෝධ- මග්ගයන්ට නැමුනු සතියද දුක්ඛ සත්‍යය නම්වේ. මේ පව් විස්සෙහිම සතිය වනාහි දුක් යයි කීම ප්‍රධාන නය ක්‍රමයට දක්වන්නක්ම වේ. එම නිසා සතිය සමඟ යෙදෙන චිතත-චෛතසිකයන් අරමුණු කරන්නාවූ රූප-නාම, ඇසුර ලබන රූප යන මේ ධම්යන්ද" විපස්සනා ඤාණ මග්ග ඤාණ මගින් විසද ලෙස දත යුතු දුක්ඛ සත්‍යය" යැයි පමණක් සළකා ගතයුතු. එම නිසා මාගී ධම් හා නිවන උතුම් යැයි අසා ඇති බැවින් එම *මග්ග - නිබ්බානයන්ට* නැමෙන්නාවූ කැමැත්ත ඇත්තාවූ ඉරියාපථ පව් ආදී ඒ ඒ පව්දේශනාවන්ට අනුව විපස්සනා භාවනා කිරීමට කැමති වන්නා විසින් පාළියෙහි කෙළින්ම දක්වන ඉරියාපථ ආදියද මෙනෙහි කළ යුතුය. මෙනෙහි කරන සතිය හා සම්ප්‍රයුක්ත චිත්ත - චෛතසිකයන්ද මෙනෙහි කළ යුතුය. ඉදින් ප්‍රකට නම් ඒවා ඇසුර ලබන රූපයන්ද මෙනෙහි කළ යුතුය. සතියේ හේතුව වූ අතීත තණ්හාව ඒ හා සමාන වගීයේ වූ වතීමාන ඇලීම්-බැඳීම්ද මෙනෙහි කළ යුතුය. අතීත සමුදය අනුමාන කොට භාවනා කිරිම වනාහි ඤාණය මුහුකුරා ගිය කල ඉබේම මෙන් සිදු වන්නේය. විශේෂයෙන් කළ යුත්තක් එහි නොමැත. මේ දක්වූ ක්‍රමයට අනුව *නිරෝධ - මග්ග* ආදියට සිත නැවීම හෙවත් කැමැත්ත ඇතිව පවත්නා ඉරියා පථ ආදී දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය ධම්යන් මෙනෙහි කරන පුද්ගලයා චතු සච්ච කම්මට්ඨාන නම් වූ විපස්සනා භාවනාව වඩමින් සිටිනවා වන්නේය. එවැන්නකු විසුද්ධි පරම්පරාව අනුව ක්‍රමානුකූලව ප්‍රගතියට ගොස් කෙළෙස් දුරැකිරීමෙන් රහත් බවට පත්වන්නේය. මෙය වනාහි සතිපට්ඨාන සූත්‍රයෙහි දේශනා කළ පව් 21 තුළින් එක එක පව්යක් අනුව භාවනා කරන්නා චතුසච්ච කම්මට්ඨානය සිදු කොට අරහත්ත ඵලය තෙක් ලඟාවන ආකාරය අට්ඨකථාවන්ට අනුව සංක්ෂෙපයෙන් දැක්වීමයි.

සතිපට්ඨාන ගුණ

සතිපට්ඨාන දේශනාවට අනුව භාවනා කොට මාර්ග සතරට හා ඵල සතරට පත්වූ පුද්ගලයා රාග, දෝස, මෝහ ආදිකොට ඇති කෙළෙස් කසට වලින් ඇතිතාක් පිරිසිදු වෙයි. චිත්ත සන්තාප, කණගාටු නම් වූ **සොක**, විලාප හැඬුම් නම් වූ **පරිදෙව** ඉක්මවයි. කයෙහි වෙහෙස- පෙළීම නම් වූ **දුකඛ,** සිතෙහි වෙහෙස- පෙළීම නම් වූ **දොමනසස** අස්ථයට යයි. '**පරිනිබබාන චුතියට** පසු කායික දුක පහළ වීමක් එහිදී නොගැළපේ. එසේම අරහත්ත ඵලයට පත්වූ තැන් පටන් සිතේ දුක පහළ වීමක්ද නොගැළපේ 'යන්න මෙහි අදහසයි. **ඤාය** නම් වූ මගග ඤාණ හතරද දැක - දැන ගනී. ලබා ගනී. ඇතිතාක් දුකින් මිදීම නම් වූ නිවන් ධම්යද ඇස් පනාපිට ප්‍රකටව දැක- දැන ගන්නේය. එම නිසා බුදුරජාණන් වහන්සේ සතිපට්ඨාන සතර පහත සඳහන් ලෙසට වණ්නා කළ සේක.

එකායනො අයං භිකඛවෙ මගෙගා සතතානං විසුද්ධියා, සොක පරිදෙවානං සමතිකකමාය දුකඛ දොමනසසානං අතථංගමාය, ඤායසස අධිගමාය නිබබානසස සචඡිකිරියාය යදිදං චතතාරො සතිපට්ඨානා [ම. නි. 1/134]

භිකඛවෙ = මහණෙනි,

යදිදං යෙ ඉමෙ චතතාරො සතිපට්ඨානා

= මෙම සතරාකාර සතිපට්ඨානයෝ

සතති = ඇත්තාහ

අයං මගෙගා = සතිපට්ඨාන යයි කියනු ලබන මේ මාර්ගය

සතතානං = බුද්ධ, පචෙචක බුද්ධ, සාවක බුද්ධ බෝධීන් පුරණ සියලු බෝධිසත්තවයන් වහන්සේලාගේ

විසුද්ධියා = සිත් කෙළසන කෙළෙස් වලින් පිරිසිදු කිරීමට

එකායනො = එකම මාර්ගයයි. ඍජුමාර්ගයයි.

සොක පරිදෙවානං = සන්තාප, කණගාටු, ඇඬීම්, වැළපීම්

සමතිකකමාය = ඉක්ම වීමට, බැහැර කිරීමට

ඒකායනො = ඒකම මාර්ගයයි, ඍජු මාර්ගයයි.

දුකඛ දොමනසසානං = කායික හා චෛතසික දුකෙහි

අතථංගමාය = අස්ථයට යෑමට, නිවීමට

ඒකායනො = ඒකම මාර්ගයයි ඍජුමාර්ගයයි

ඤායසස අධිගමාය = හතරක් වූ මාර්ග ඥාණයන් දැනගැනීමට

නිබබානසස සචජි කිරියාය= නිවන සාත්ක්ෂාත් කිරීමට

ඒකායනො = ඒකම මාර්ගයයි, ඍජු මාර්ගයයි.

මේ අනුශාසනාවෙන් **සතිපට්ඨාන භාවනා** "කෙළෙස් වලින් පිරිසිදු වීමට-පෙ- නිවන දැක- දැන ගැනීමට ඒකම මාර්ගය යැයි" යැයි කෙළින්ම දක්වන ලදී. එම නිසා නියම පරමාර්ථ වන්නාවූ කාය, වෙදනා, චිත්ත, ධම්ම යන මෙනෙහි කොට දැනගෙන වැඩිය යුතු සතිපට්ඨාන භාවනා " **චතු සච්ච කම්මට්ඨාන** යැයි ද **විපසසනා භාවනා** යැයි ද (**ඒකායනො**

මගෙගා වුච්චති පුබ්බ භාග සතිපට්ඨාන මගෙගා මේ පාළියට අනුව **පුබ්බ මග්ග** යැයිද) කියනු ලැබේ" යයි සැකයකින් තොරව සළකා ගත යුතුවේ. තව දුරටත් **සම්මප්පධාන භාවනා, ඉන්‍ද්‍රිය භාවනා, බොජ්ඣංග භාවනා, මග්ගංග භාවනා,** යනාදි වූ - නිවනට ලඟාවීමට ඇති භාවනා සියල්ල මේ සතිපට්ඨාන භාවනාවටම ඇතුළත් බව සළකා ගතයුතු වේ. කාය, වෙදනා, චිත්ත ධම්ම යන ධර්මයන් හැර නිවනට යෑම සඳහා අනෙකුත් භාවනාවක් ඇතැයි නොසිතිය යුතු වන්නේමය. එම නිසා අට්ඨකථා මෙලෙස පැහැදිළි කරයි.

ඒකායනො අයං භිකඛවේ මගෙගාති එතථ ඒක මගෙගා අයං භිකඛවේගෙගා, න ද්වීධා පථභූතොති, එවමෙතතථා දට්ඨබ්බො. [දී. අ. 2/534]

ඒකායනො අයං භිකඛවෙ මගෙගාති එතථ

= මග්ගො යන මේ කථාවෙහි

භිකඛවෙ = මහණෙනි,

අයං මගෙගා = මේ සතිපට්ඨාන මාර්ගය

ඒක මගෙගා = ඒකම මාර්ගයයි, ඍජුමාර්ග යයි.

න ද්වීධා පථභූතො = දෙකට බෙදනු, දෙයාකාර වූ මාර්ග නොවේ.

ඉති එවං = මෙලෙස වූ

අත්ථො = අර්ථය

දට්ඨබ්බො = සළකා ගතයුතුයි.

එක මග්ගොති එකො එව මග්ගො, න හි නිබ්බානගාමිමග්ගො අඤ්ඤො අත්ථීති, නනු සතිපට්ඨානං ඉධ මග්ගොති අධිප්පෙතං,තදඤ්ඤෙ ච බහු මග්ග ධම්මා අත්ථීති, සච්චං අත්ථි, තෙ පන සතිපට්ඨානග්ගහණෙනෙව ගහිතා තදවිනාභාවතො. තථා හි ඤාණ විරියාදයො නිද්දෙසෙ ගහිතා උද්දෙසෙ පන සතියා එව ගහණං වෙනෙය්‍යජ්ඣාසවසෙනාති දට්ඨබ්බං, න ද්විධා පථභූතොති ඉමිනා ඉමස්ස මග්ගස්ස අනෙකමග්ගභාවාභාවං විය අනිබ්බාන ගාමිභාවාභාවඤ්ච දස්සෙති

[දී. ටී. 2/485]

එක මග්ගොති = එක මග්ගො යන්න

එකො එව = එකමවූ සෘජු වූ

මග්ගො = මාර්ගය යයි

හි සච්චං = ඇත්තය!

අඤ්ඤො = සතිපට්ඨානයෙන් තොර

නිබ්බාන ගාමිමග්ගො = නිවනට යෑම සඳහා මාර්ගයක්

න අත්ථි = නැත්තේය.

ඉති = මෙසේ කියයි.

නනු = චෝදනා වශයෙන්

ඉධ = මේ සූත්‍රයෙහි

සතිපට්ඨානං = සතිපට්ඨානය

මග්ගොති = මාර්ගයයි

අධිප්පෙතං = අදහස් කෙරේ.

තදඤ්ඤෙ = එම සතියත් හැර

බහු මග්ග ධම්මා ච = බොහෝ මාර්ග ධර්මයෝද

අත්ථි නනු = ඇත්තේ නොවේද?

ඉති = මෙසේ චෝදනා ඇත්තේ නම්

සච්චං අත්ථි = ඇති බව සත්‍යය

පන = නමුදු

තදවිනා භාවතො	=	එම සතියෙන් තොරව සිදුනොවන බැවින්
තෙ	=	එම අනෙකුත් මාර්ග ධර්මයන්
සතිපට්ඨාන ගහණෙනෙව	=	සතිපට්ඨානය යැයි කීමෙන්ම (ගැනීමෙන්ම)
ගහිතං	=	ගන්නා ලදි
තථාහි	=	එම සතියැයයි කියන තැන ඇතුළත් වන බැවින්ම
නිද්දෙස	=	විස්තර වශයෙන් බෙදා දක්වන පාලියෙහි
ඤාණ විරියාදයො	=	ඤාණය වීරිය ආදී මාර්ග ධර්මයන්
ගහිතා	=	ගන්නා ලදි. දක්වන ලදි
උද්දෙසෙ	=	සංක්ෂෙපයෙන් දක්වන පාළියෙහි
සතියා එව ගහනං පන	=	සතිය පමණක් දේශනා කිරීම වනාහි
වෙනෙය්‍යජ්ඣාසය වසෙනාති	=	විනෙය්‍ය ජනතාවගේ කැමැත්ත අනුව දේශනා කිරීම යැයි
දට්ඨබ්බා	=	සළකා ගතයුතුයි.
න ද්විධා පථභූතොති ඉමිනා	=	න ද්විධා යථාභූතො යන මේ ව්‍යතිරේක සංවණ්ණ කථාවෙන්
ඉමස්ස මග්ගස්ස	=	මේ සතිපට්ඨාන මාර්ගයට
අනෙක මග්ගභාවාභාවං විය	=	එකක් නොව, බොහෝ වූ මාර්ග ස්වභාවයක් නැති බව දක්වන්නා සේ
අනිබ්බානගාමි භාවාභාවඤ්ච	=	නිවනට නොපත් කරවන බවක් නැති බවද

(නිවනට යෑමට හේතුවන මාර්ගය සතිපට්ඨානයම පමණක් වේ. එම සතිපට්ඨාන මාර්ගය නිවනට ඒකාන්තයෙන්ම පත්කිරීමට සමත්ය. පත් කිරීමට නොසමත් යැයි නොකියනු ලැබේ.)

මෙයට අමතරව " සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් තුළ බුද්ධත්වයට පත්වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේලා සියලු දෙනා, සිය ගණන් පසේ බුදුරජාණන් වහන්සේලා, ගණන් කළ නොහැකි තරම් බොහෝ වූ ආරිය ශ්‍රාවකයන් වහන්සේලා යන මේ ආර්ය පුද්ගලයන් සියලු දේනාම කෙලෙස් කසට සතිපට්ඨාන මාර්ගයෙන්ම පිරිසිදු කොට, නියම පිවිතුරු බවට පත්විය.

එසේම කාය- වේදනා- චිත්ත- ධම්ම යන මේවායින් එකක් හෝ භාවනා නොකොට ප්‍රඥා භාවනාවක් සිදුවිය නොහැක්කේය. එම නිසා "එක ගාථා පදයක් අසන්නට ලැබී මග- ඵල වලට පත්වූ පුද්ගලයාද සතිපට්ඨාන මාර්ගයෙන්ම අරිය ඵලයට පත් වී සොක-පරිදෙවයන්ගෙන් මිදුනේ යැයිද" අට්ඨකථාහි ප්‍රකාශ කරයි. එම නිසා මාර්ග- ඵල යන්ට පත්වීමට හේතු වන විපස්සනා භාවනාව යන්න සතිපට්ඨාන දේශනාවට අනුව නියම පරමාර්ථය වන්නාවූ *කාය-වේදනා - චිත්ත- ධම්ම* යන මේවා මත භාවනා කොට වැඩිය යුතු සතිපට්ඨාන භාවනාවම වේ. මේ සතිපට්ඨාන භාවනාව හැර නිශ්චිත ලෙස මාර්ග- ඵල- නිර්වාන ලබාගැනීමට වෙනත් විපස්සනා භාවනා නම් කිසිවක් නැති බව තරයේ සිතට ගතයුතු.

මෙම සතිපට්ඨාන භාවනා ක්‍රම විසිඑක තුළින් එක් පර්වදේශනාවක් අනුව භාවනා වඩන්නේ නම් මජ්ඣිම නෙය්‍ය පුද්ගලයකු අඩුම තරමින් දින හතකින් හෝ වැඩි තරමින් සත් වසරකින් අනාගාමී අරහත් බවට පත්විය හැකි යැයි බුදුපියාණන් වහන්සේ සහතික කළ සේක. පහත සඳහන් වන්නේ ඉතාමත් ඉක්මනින් සිදු විය හැකි ආකාරය සහතික කරන දේශනාවයි.

සහතිකය

යොගී කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්තාහං, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකංඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සතවා උපාදිසෙසෙ අනාගාමිතා. [ම. නි. 1/152]

භික්ඛවෙ	=	මහණෙනි,
යෙහි කොචි	=	විශේෂයකින් තොරව, ඕනෑම භික්ෂු, සාමණේර, ගිහි, පුරුෂ ස්ත්‍රී පුද්ගලයකු
ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ	=	මේ සතරාකාරවූ සතිපට්ඨානයන්
එවං	=	ආනාපාන පර්වය ආදී පර්ව විසි එකකින් දේශනා කරන ලද මේ ක්‍රමය අනුව
සත්තාහං	=	සත්දිනක් පුරා
භාවෙය්‍ය	=	වඩන්නේ නම්
තස්ස	=	එලෙස වඩන්නාට

දිට්ඨෙව ධම්මෙ = මේ භවයේදීම

අඤ්ඤා වා = අරහත්ත ඵලය හෝ වේවා

සති උපාදිසෙසෙ = උපාදාන ඉතිරිව ඇත්නම්

අනාගාමිතාවා = අනාගාමී ඵලය හෝ වේවා

ද්වින්නං ඵලානං = දෙකක් වූ ඵලයන් අතරින්

අඤ්ඤතරං ඵලං = එක් ඵලයක්

පාටිකඞ්ඛං = බලාපොරොත්තු විය යුතු

වා = ඒකාන්ත යැයි පිළිගත යුතු

ම.නි. මජ්ඣිම පණ්ණාස බොධිරාජ කුමාර සූත්‍රයෙහි වනාහි **තික්ඛපඤ්ඤ නෙය්‍ය** පුද්ගලයෙකු අරමුණු කොට එකම රාත්‍රියක් තුළ, එකම දිවා කාලයක් තුල ධර්මය සාක්ෂාත් කළ හැකි යැයිද සහතික කොට වදාල සේක. සහතික කරන ආකාරය පහත සඳහන් ආකාරයටයි.

ඉමෙහි පඤ්චහි පධානියංගෙහි සමන්නාගතො භික්ඛූ තථාගතං නායකං ලභමානො සායමනුසිට්ඨො පාතො විසෙසං අධිගමිස්සති පාතො අනුසිට්ඨො සායං විසෙං අධිගමිස්සති [ම. නි. 2/514]

ඉමෙහි පඤ්චහි පධානියංගෙහි සමන්නාගතො භික්ඛු

= මේ පහක් වූ පධානියංගයන් අතින් සම්පූර්ණ වූ භික්ෂුව

තථාගතං නායකං = තථාගතයන් වහන්සේ වැනි ක්‍රමය කියාදෙන, යොමුකරවන ගුරුවරයෙකු

ලභමානො = ලබන්නේ

සායමනුසිට්ඨො = සවස උපදෙස් ලබා භාවනා කරන්නේ නම්

පාතො = පාන්දර

විසෙසං = මාර්ග-ඵල-නිර්වාන ධර්ම

අධිගමිස්සති = දැන ගනී, අධිගමය කරයි.

පතො අනුසිට්ඨො = පාන්දර උපදෙස් ලබා භාවනා කරන්නේ නම්

සායං = සවස කාලය වන විට

විසෙසං = මග- ඵල- නිවන් ධම්

අධිගම්සසති = දැනගනී, අධිගමය කරයි.

පධානියංග පහ

1. බුද්ධ- ධම්ම- සංඝ- කම්මට්ඨානාචාරින් වහන්සේ, භාවනා ක්‍රමය හොඳින් අදහාගෙන පිළිගන්නා ශ්‍රද්ධාව
2. කන බොන භෝජන සමලෙස දිරවිය හැකි පාචක තෙජෝ ධාතුව නම් වූ ජඨරාගණිය සම්පූර්ණ වී හොඳින් සෞඛ්‍යය සම්පන්න වීම.
3. තමා තුළ නොමැති ගුණ හුවා නොදක්විය හැකි බව, තමා තුළ ඇති වරද නොසඟවා ඇති සැටියෙන් තත්ත්වාකාරයෙන් ගුරුවරුන්ට හා බ්‍රහ්ම චාරීන්ට හෙළි කළ හැකි බව.
4. 'මස්- ලේ වියළෙන්නේ වියළෙත්වා, සම්- නහර- ඇට ඉතිරි වන්නේ ඉතිරි වේවා, විශේෂ ධම් නොලබනතාක් අතරක් නොතබා භාවනා කරන්නෙමි යැ'යි තහවුරු ලෙස, *චතුරංග සමන්නාගත වීරියෙන්* යුක්තව දැඩිව භාවනා කිරීම.
5. රූප- නාම ස්කන්ධයන්හි ඇතිවීම- නැතිවීම් දක්නා උදයබබ්‍ය ඥාණ පහළ වීම යන මේ අංග පහ

'වර්ෂ හතක් ආදි කාලයක් තුළ, දින හතක් තුළ, රාත්‍රියක් තුළ, දිනක් තුළ මග-ඵල-නිබ්බාන යන විශේෂ ධම්යන් ලබාගත හැකිය' යන කථාවන් සාමාන්‍ය පුද්ගලයන්ගේ කථා නොවේ. ධම් සියල්ල **සවයං භූ ඥාණයෙන්** තත්ත්වාකාරයෙන් වටහාගත් බැවින් සම්මා සම්බුද්ධ නම් වූ බුදුපියාණන් වහන්සේගේ උතුම් කථාවක් වන්නේය. සත්‍ය වූත්, ප්‍රතිඵල දායී වූත් කථා පමණක් දේශනා කරන බැවින් **සුගත** නම් වන බුදුපියාණන් වහන්සේගේම කථාවක් වේ. එම නිසා ඇදහීම නම් වූ සද්ධා ධම්ය අතින් සම්පූර්ණ, සංසාර වට්ට දුකින් මිදීමට කැමති කුසලච්ඡන්දය අතින් සම්පූර්ණ වූ සත්පුරුෂයන්

"අද්වෙජ්ඣ වචනා බුද්ධා: අමොඝ වචනා ජිනා

"බුදුපියාණන් වහන්සේලා

අද්වෙජ්ඣ වචනා	=	දෙබිඩි කථා නැත්තේමය.
වා	=	දෙකට බෙදීම් නැතිව ඒකාන්තයෙන්ම ඵලදායි කථා පමණක් දේශනා කරන සේක.
ජිනා	=	පස්මරුන් දිනූ බුදුපියාණන් වහන්සේට
අමොඝ වචනා	=	හිස්වචන නැත්තේමය
වා	=	හිස් නැති, ඒකාන්තයෙන් ප්‍රයෝජනවත් වචන පමණක් දේශනා කරන සේක"

යන මේ බුද්ධ වංශ පාළියට අනුව දක්වන ලද, බුදුපියාණන් වහන්සේ විසින් ප්‍රතිඥා කරන ලද කථා දෙක ඒකාන්තයෙන් සත්‍ය කථා, ඒකාන්තයෙන් ඵලදායී කථා යැයි අදහාගෙන,

'මම වනාහි **තික්ඛ පඤ්ඤා නෙය්‍ය** පුද්ගලයකු වන්නේ නම් එක රාත්‍රියක් තුළ, එක් දිනයක් තුළම විශේෂ ධර්ම අවබෝධ කරනු ඇත, **මජ්ඣිම පඤ්ඤා නෙය්‍ය** පුද්ගලයෙකු වන්නේ නම් උඩත් පිරිසෙයින් වර්ෂ හතක් තුළ, මධ්‍යස්ථ ලෙස දින පහලොවක් ආදිය තුළ, අඩුම වශයෙන් දින හතක් තුළ, උතුම් ධර්ම අවබෝධ කරනු ඇතැයි' බලාපොරොත්තු තබා සතිපට්ඨාන භාවනා විෂයෙහි වියර්‍ය කළ හැක්කේය.

විශේෂ සංලක්ෂය

සතිපට්ඨාන පාළි අට්ඨකථා හි ආනාපාන පර්වය ආදී පර්ව විසිඑක තුළ එක එක පර්වයකින්ම අරහත්ත ඵලය තෙක් යාගත හැකි බව දක්වයි. නමුදු "පර්ව එකක් පමණක් වීර්‍ය කොට මාර්ග- ඵලයන්ට ලඟා විය හැක්කේය. පර්ව කීපයක් එකට ගෙන භාවනා කරන කල්හි මාර්ග - ඵලයන්ට පත්විය නොහැක්කේ යැයි යන්න අදහස් නොකෙරෙත්මයි, නොකියන ලද නිසාම *කම්මට්ඨාන* ඉල්ලා සිටින උත්තිය භික්ෂුව ආදීන්ට බුදුපියාණන් වහන්සේ **චත්තාරො සතිපට්ඨානෙ භාවෙය්‍යාසි** ආදි වශයෙන් සතිපට්ඨාන හතරම සංග්‍රහකොට කමටහන් දුන් සේක. දුන් ආකාරයට භාවනා කොටද රහත් භාවයට පත්වූ සේක. තව දුරටත් "එකම වූ පර්වයක් මගින් අරහත්ත ඵලයට ලඟාවිය හැකි" යැයි කියන තැනද එම පර්වය අතරක් නොතබා මනසිකාරය යොදවන මූල කර්මස්ථානය ලෙස ගැනීම අදහස් කරන ලදි. "වෙනත් පර්වයක් හා සම්බන්ධ රූප- නාමයන් ප්‍රකට වන්නේ නම් එම රූප- නාමයන්

මෙනෙහි නොකළ යුතු" යැයි ඉන් අදහස් නොකෙරේ. ඉදින් ප්‍රකට වූ රූප- නාමයන් නොබලන්නේ නම් ඒ මත නිච්ච, සුඛ, අත්ත, සුභ වශයෙන් වරදවා වටහා ගෙන කෙලෙස් පහළ වන්නේය.

තවදුරටත් වර්තමාන කාලයේ භාවනා කරන්නා වූ පුද්ගලයන්ට "කවරකුට කවර පර්වයක් ගැළපේද යැයි ඒකාන්ත ලෙස ඍජුවම තීරණය කළ නොහැක්කේය. නමුදු ප්‍රායෝගික ලෙස කායානුපස්සනාවෙන් පටන් ගෙන භාවනා කරන්නේ නම්, වර්තමාන කාලයේ පුද්ගලයන්ට බොහෝ සේ ගැළපෙන බව නම් අත්දුටුවකි. එම නිසා මෙම විපස්සනා භාවනා පොතේ පස්වන පරිච්ඡේදයෙහි පටිකකුල මනසිකාර පර්වය හා සිවථික පර්වය යන සමථ කර්මස්ථාන හා බැඳුනු අමතර පර්වයන් බැහැර කොට කායානුපස්සනාවම පදනම් කොට සතිපට්ඨාන හතරම හා විසිඑක් පර්වයන්ම සම්බන්ධ භාවනා ක්‍රම, දේශනා ක්‍රමයද බැහැර නොකොට ප්‍රතිපදාව පමණක් වශයෙන් ගෙනහැර දක්වන්නේය. මෙලෙසට දක්වන්නක් බැවින්, මෙහි දක්වන ලද ක්‍රමය අනුගමනය කරමින් භාවනා කරන යෝගීන් තමා ස්වකීය අජ්ඣාසයට හෝ චරිතයට අනුව කිසියම් අනුපස්සනා කොටසකට අනුව පහළ වන අදාල රූප- නාමයන් හොඳින් භාවනා කිරීමට හැකි වී, දැනගැනීම සිදුවී, විපස්සනා ඥාණ පරම්පරාවට අනුව මාර්ග- ඵල පිළිවෙලින් නිර්වාණයට වහ වහා ලඟාවීමට හැකි වේවායි ආශිංසනය කරමු

පරිච්ඡේද අංක හතර නිමියේ යැ.

ප්‍රථම භාගයෙ දෙවන කොටස මෙපමණකින් සමාප්ත වේ.

මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීමට දායක වූ පිංවතුන්ගේ නාම ලේඛනය

පී. එච්. හෙයියන්තුඩුව ගුරුමාතාව
ඇතුළු පවුලේ සියළු දෙනා

ඩී. ප්‍රේමදාස මහත්මිය

නිර්මලා වැලිකල මෙනවිය

කේ. බෝධිපාල මහත්මා
ඇතුළු පවුලේ සියළු දෙනා

තිලක් රුද්‍රිගු මහත්මා,

අනුර නාරංගම්මන මහත්මා

ලිහිර